විද්‍යාචක්‍රවර්තීන් විසින් විරචිත

දහම් සරණ

රත්නපුර - මාරපණ

ඥානෝදය පරිවෙණාධිපති

පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිරයන්

වහන්සේ විසින්

කරණ ලද සංශොධනයෙන් හා ලියන ලද

ප්‍රස්තාවනාවකින් යුක්තයි.

කොළඹ

මරදානේ අනුල මුද්‍රණාලයයේ

කළමනාකාර

ඩබ්ලිව්. ඩී. ජේ. රත්නායක අප්පුහාමි

විසින්

මුද්‍රණයකර ප්‍රසිද්ධ කරණ ලදී.

1955

මිල රු. 5.50 සි.

ප්‍රස්තාවනා

සිද්ධාර්ථ ගෞතම මහබෝසතානන් වහන්සේ චතුරඞ්ග සම්භාවනත වීර්‍යාධිෂ්ඨානයෙන් යුක්තව අශ්වත්ථ බෝධිදුම මූලයෙහි වැඩහිඳ ඝෝර මාර වීර වීර්‍යය නිජපරාක්‍රමයෙන් උන්මූලනය කොට යාමත්‍රියාධිගත ඥනත්‍රය ඇතිව සවාසනා සකල කෙලෙස කල්මෂ ප්‍රක්ෂාලනයෙන් පරම විසුද්ධ වැ, සම්බුද්ධරාජ්‍යයට පත් තැන් පටන් කුශිනාරානුවර උපවර්තන නම් ශාලවනොද්‍යානයෙහි වූ යමක ශාලවෘක්ෂාන්තරයෙහි වැඩහිඳ අනුපධිශෙෂ පරිනිර්වාණ ධාතුවෙන් පරිනිර්වීම දක්වා පන්සාළිස් වසක් මුළුල්ලෙහි සකල ලෝකවාසීන්ගේ දෙලෝ අභිවෘද්ධිය පිණිස වදාළා වූ ශ්‍රීමුඛපාඨ සමූහය බුදු (දහම්) නම්.

එය පරම ප්‍රතිෂ්ඨාකොට ගැන්ම **දහම් සරණ** යාමයි එබඳු සාද්‍රෘෂ්ටිකාදී ඔහුගේ ගුණදෘෂ්ඨ සද්ධර්මය ශරණ යාමෙන් සත්වයන්ගේ මෙලෝ-පරලෝ අභිවෘද්ධි සාධනය වූ අවස්ථා නොයෙක් තන්හිදී උන්වහන්සේ වදාළ ඒ ධර්මයෙන්ම ගෙතහැර පා සවභාෂා විඥ යන්ගේ ඉමහත් ප්‍රයෝජනය පිණිස ලියන ලද මේ ග්‍රන්ථය ද **දහම් සරණ** නාමයෙන් හැඳින්වේ.

ඒමයි පිටු 382 ක්වූ මේ ග්‍රන්ථය අප මහබෝසතානන් වහන්සේ දීපඞ්කර පාදමූලයෙහි නියතවිවරණ ශ්‍රී ලත් තැන් පටන් **කාශ්‍යප** නම් සම්මාසම්බුදුරජානන් වහන්සේ අවසන් කොට ඇති සුවිසි බුදුවරයන් වහන්සේලා හමුවෙහි මහානුභාවසම්පන්න අනේක ආත්ම භාවවල ඉපැද සර්ව්ඥතාඥානාවබෝධය පිණිස නියත විවරණ ශ්‍රී ලැබගත් පරිදි විස්තරවත විවරණ කථා 24 කින්ද, බෝධිසම්භාර ධර්මයන් පුරණාවස්ථාවන්හි දී කුශලා'කුශල කර්මයන්ගේ ඵල-විපාක මේයයි ලෝකයා හමුවෙහි විදහා පෑමෙහි දර්ශනතලයක් බදු සංසාර දෝෂය නිසා අනේක සත්වකොට්ඨාසවල පිළිසිඳ ගත් තමුන් තමා නියත විවරණ ශ්‍රී ලත් බුද්ධාඞ්කුර මහොත්තමයෙකු නිසා ඒ හැම අවස්ථාවන්හිදී ම ධර්ම බලයෙන් - ධර්මානුධර්මප්‍රතිපත්තියෙන් සවාර්ථ පරාර්ථ සාධාලීම් පිළිබඳ කරුණු ඇතුළත් ජාතක ධර්ම සංග්‍රහ කථාවස්තු 523 ක සාරාංශයන්ගෙන්ද, තථාගත ප්‍රකීර්ණක ධර්මදෙශනාවන්හි බුද්ධවංශය හා සම්බන්ධකම් ඇති විවිධ සද්ධර්ම සංග්‍රහ කථාවස්තු 26 කින්ද යුත් කාණ්ඩ තුනකින් මෙය නිමවී ඇත.

II

ග්‍රන්ථ කර්තෘ හා භාෂාවිලාසය.

මේ ග්‍රන්ථයෙහි රචනාවිලාසය දෙස බලන කල මෙය ත්‍රිපිටක ධර්මයෙහි හා සංස්කෘත භාෂාවෙහි හසල බුද්ධිමත් ශ්‍රද්ධාසම්පන්න පණ්ඩිතවරෙණ්‍යයෙකුගේ කෘතියක් බැව් ඉඳුරාම කිවහැක

පුස්කොළවල ලියන ලද පැරණි හම සරණ පොත් තුන බොහෝ පුස්තකාලයන්හි තිබෙන්නේ එක ම ග්‍රන්ථයක් වශයෙනි. ඒවායින් සමහර පොත්වල බුත්සරණ අවසානයෙහි පමණක් විදූචක්‍රවර්තීන් විසින් කළ අමාත්‍යවහ නම් බුද්ධචරිතය හිමි යන වාක්‍යය ඇති නමුත් ඉතිරි දෙසරණ අවසන්හි කර්තෘන්ගේ සඳහන් සඳහන් පුස්කොළ පොත් මේතාක් අප හමුවෙහි නැත.

එහෙයින් බුත්සරණට ගැළපෙන පරිදි මැන භාගයෙහි විසූ කිසියම් පඬිවරයකු විසින් දහම් සරණත්, ඒ දෙසරණට ම අනුරූපවන පරිදි ඉන් මැතක විසූ අන්‍යතම පඬිවරයකු විසින් සඟ සරණත් ලියා තෙසරණ සම්පූර්ණ කිරීමෙන් පසු පාඨකයන්ගේ පහසුව සඳහා ලෙඛකයන් විසින් එකම පොතක් වශයෙන් ලියා තබන්ට ඇත"යි මතයක් ද තිබේ.

මේබදු මතයක් පහළවූයේ සරණත්‍රයෙහි පෙනෙන අසමාන භාෂාවිලාසය හා බුත් සරණයෙහි සේ ඉතිරි දෙසරණයෙහි ද කර්තෘ නාමසඳහනක් දක්නට නැතිවීමත් සළකා ගෙණ ය.

එමෙන්ම මේබදු එකම ගාථාධර්මයක් මාතෘකා වශයෙන් ගෙණ එකව බැඳි පවත්නා රතනත්‍රයක් එකම පඬිවරයකු විසින් රචිත ග්‍රන්ථත්‍රයක වෙන් වෙන් වශයෙන් කර්තෘනාම සඳහන ගෝ එසේ නැති නම් විශෙෂ වශයෙන් ම අවසාන ග්‍රන්ථයෙහි ගෝ එය සඳහන් විය යුතුම ය.

කරුණු මෙසේ තිබියදී ප්‍රථම ග්‍රන්ථයෙහි පමණක් කර්තෘ නාම සඳහනය දැක්වීම ප්‍රමාණවත් යයි ග්‍රන්ථකර්තෘ තුළ පහළ වූ අධ්‍යාශයක් ද නැතහොත් කාලානන්තරයක් තිස්සේ මේ පොත් විවිධ අදහස් ඇති ලෙඛකයන් අතින් පිටපත්වීමේදී පහළ වූ අඩුපාඩුවක් දැයි කිව නොහැක.

එහෙත් මේ ග්‍රන්ථ කර්තෘවරයා මතභෙද-වාදභෙද වලට භාජන වීමෙන් තමාගෙන් සිදු වූ අගතා සේවය පළදු වී නොනැසෙන සේ සවහන්කර තිබෙන බැව් දහම් සරණෙහි 136 පිටේ දැක්වෙන 181 වැනි ශ්ලෝකාංශ ජාතක කථාවෙන් පෙනේ.

III

බුත්සරණ කතා විදූ චක්‍රවර්ති බැව් බුත්සරණ අවසානයෙහිම ලියා තිබෙන අතර තෙසරණම ලියුයේ තමා බැව් දහම් සරණෙහි සඳහන්ව තිබෙන විට වෙනත් කතා නාම සඳහනයන්ගෙන් ඇති ඵලය කිම?

මොහු බුද්ධධර්මය ඇතුලු භාෂාශාස්ත්‍ර විෂයෙහි හසළ බුද්ධියක් ඇති නිසාගී ලෙඛකයෙකි. ඉතා සුළු කරුණක් අති විස්තර ලෙස රචනයෙහි මෙන්ම ඉතා විස්තර ලෙස දැක්වෙන ධර්මකථා වස්තු ආදිය පවා කියිදු ඥානනාවයක් සිදු නොවන පරිදි සංක්ෂිප්තලෙසත් රචනයෙහි ලා දක්වා නිබෙන්නේ අනුපම සූරතාවකි.

සිංහල ගද්‍ය රචනයෙහි ලා දෙළොස්වැනි දහතුන් වැනි ශත වර්ෂයන්හි ප්‍රසිද්ධ ගුරුළුගෝමි - මයුරපාද - ධර්මසේන ආදි මහාව්‍යක්තා ලේඛකයන් අතර මේ පඬිවරයා ද ඉහළම තැනෙක වැජඹෙන්නාව ඇති බැවි,

තෙසරණෙහි වෙන් වෙන්ව පෙණෙන අසමාන වාක්විලාසය මෙන් ම ඒ ඒ සරණයන්හි ඇතුළත් පරිවෙජදවල පවා දක්වෙන විවිධ රචන ලීලාවන් අනුව නිශ්චය කළ හැක.

සංක්ෂිප්තව කිවයුතු දෑය විස්තර ලෙස කීවත් විස්තර වශයෙන් කිවයුතු දෑය සංක්ෂිප්තකොට කිවත් කිදේ ම පුන පුනා කිවත් මොහුගේ රචනාවන් සාහිත්‍ය ප්‍රේමීන්ගේ චිත්තසන්තාන ඕජෝ ගුණ භූයිෂ්ඨ මාධුර්‍ය්‍ය වාක්‍ය රසාස්වාදයෙන් ප්‍රබෝධවන අතර, බෞද්ධයන්ගේ චිත්තසන්තාන රත්නත්‍රය විෂයෙහි ශ්‍රද්ධා භක්තියෙන් ඉපිළී ප්‍රශාද සංවේගයෙන් රෝමෝද ගමනය වන සුළුවිම විෂමය ජනකය.

ගුරුළුගෝමි - මයුරපාද - ශ්‍රී රාහුල යන මහා ව්‍යක්ත ලෙඛකයන්ගේ අමාවතුර - ධර්මප්‍රදීපිකාව - පූජාවලිය - යොගාණ්ණවය - ප්‍රයෝගරත්නාවලිය - පරවිසඳෙහය - සැළලිහිණිසඳෙහය - කාව්‍යශේඛරය යන පොත් වල පවා ග්‍රන්ථ රචනය පිළිබඳ එකිනෙකට උසස්ව නැග ගිය පරිවිතභාවයක් පැහැදිළිවම පෙනෙන නමුත් මේ පඬිවරයා ගේ හැම ග්‍රන්ථයකම උස්පහත් නොවූ පරිපූර්ණ රසාවහ වාක්‍ය සම්ප්‍රදායක් විම මොහු තුළ පිහිටි නිසාගී කවිඩිය විදහා පාන්නක් විය හැක.

එසේ ම සරණ තුන එක ම ග්‍රන්ථ කතෘවරයෙකුගේ කෘති ලෙස සැළැකීමට ප්‍රමාණවත්වන මූහුණුවර වෙනස් නොවන සේ රචනා කිරීමද මෙහි ලා පෙනෙන තවත් විශෙෂ ලක්ෂණයකි.

බුත්සරණාරම්භයෙහි මාතෘකාව වශයෙන් තබන ලද

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා,
සචිත්ත පරියොදපනං - එතං බුද්ධාන සාසනං.

යන මේ ගයෙහි **සබ්බ පාපස්ස අකරණං** යන පදය ගෙණ සපිඳ ගුණ වතා බුත්සරණ ත්, එහි **කුසලස්ස උපසම්පදා** යන දෙවැනි පදය ගෙණ සද්ධම්මයෙහි ගුණ වතා **දහම්සරණ** ත්, **සචිත්ත පරියොදපනං** යන තුන්වැනි පදය ගෙණ සඞ්ඝරත්නයෙහි ගුණ වතා **සඟසරණ** ත් රචනා කිරීම ඒ ලක්ෂණය යි.

එමෙන් ම බුත්සරණෙහි බොහෝ තන්හි **බුද්ධං සරණං ගච්ඡාමි - බුදුන් සරණ යෙමි - බුත්සරණ යා සුතු යි** දැක්වෙන වක්‍ය ය-

දහම්සරණෙහි ද ධම්මං සරණං ගච්ඡාමි - දහම්සරණ යෙමි - දහම් සරණ යා සුතු යි කියා ද,

සඟසරණෙහි - සඞ්ඝං සරණං ගච්ඡාමි - සඟසරණ යෙමි - සඟසරණ යා සුතු යි කියා ද ඒකාකාර ව යොදා තිබේ.

රචනා කාලය.

නිකාය සංග්‍රහ (21 පිට) සද්ධම්රත්නාකර (307 පිට) යන පොත්වල සඳහන් පණ්ඩිත කාමාවලිය හා රචනා විලාශය අනුව සලකන විට පොළොන්නරු - දඹදෙණි රාජ්‍යකාල අතර දහතුන් වැනි ශතවර්ෂයේ ප්‍රථමභාගයෙහි දී විද්‍යාචක්‍රවර්තීන් විසින් මේ තෙසරණ ම රචනා කරණ ලද බව පෙනේ.

සිංහල සාහිත්‍යය දියුණුවේවා.

මෙයට,

පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිර.

1955 අප්‍රියෙල් මස 13 වැනි දින
මාරපණ ශාසනෝදය පිරුවන්හිදීය.

පටුන

1. සුචිසි විවරණ කථා 1 - 91

පිට

1.	දීපඞ්කර	(1. සුමේධ)	සම්බුද්ධ විවරණය	1 - 41
2.	කොණ්ඩඤ්ඤ	(2. විජිතාවී)	,, ,,	41 - 43
3.	මඞ්ගල	(3. සුරුචි බ්‍රාහ්මණ)	,, ,,	43 - 46
4.	සුමන	(4. අතුල නාගරාජ)	,, ,,	47 - 49
5.	රෙවත	(5. අතිදේව බ්‍රාහ්මණ)	,, ,,	49 - 51
6.	සෝභිත	(6. සුජාත [අජිත])	,, ,,	51 - 53
7.	අනෝමදර්ශි	(7. යක්ෂසේනාධිපති)	,, ,,	53 - 55
8.	පදුම	(8. සිංහරාජ)	,, ,,	55 - 58
9.	නාරද	(9. තාපස)	,, ,,	58 - 61
10.	පද්මෝත්තර	(10. ජටිකමහාරාෂ්ට්‍රික)	,, ,,	61 - 63
11.	සුමේධ	(11. උත්තර මානවක)	,, ,,	63 - 65
12.	සුජාත	(12. චක්‍රවර්තිරාජ)	,, ,,	65 - 67
13.	ප්‍රියදර්ශි	(13. කාශ්‍යප බ්‍රාහ්මණ)	,, ,,	67 - 69
14.	අර්ථදර්ශි	(14. සුසීම බ්‍රාහ්මණ)	,, ,,	69 - 72
15.	ධම්මදර්ශි	(15. ශක්‍රදේවේන්ද්‍ර)	,, ,,	72 - 74
16.	සිද්ධාර්ථ	(16. මඞ්ගල බ්‍රාහ්මණ)	,, ,,	74 - 76
17.	තිෂ්‍ය	(17. සුජාත මහාරාජ)	,, ,,	76 - 78
18.	පුෂ්‍ය	(18. අරින්දම මහාරාජ)	,, ,,	78 - 80
19.	විදර්ශි	(19. නාගරාජ)	,, ,,	80 - 81
20.	සිඛී	(20. අරින්දම රාජ)	,, ,,	81 - 83
21.	විශ්වභූ	(21. සුදර්ශන මහාරාජ	,, ,,	83 - 85
22.	කකුසන්ධ	(22. ක්ෂේම මහාරාජ)	,, ,,	85 - 88
23.	කොණාගමන	(23. පර්වත මහාරාජ)	,, ,,	88 - 89
24.	කාශ්‍යප	(24. ජෝතිපාල මානවක)	,, ,,	89 - 91

2. ජාතක ධර්මසංග්‍රහ කථා (ජාතක 1 - 523) 92 - 194.

3. සඳහම් වර්ණනා කථා 195 - 382 පිට

1. උත්තරා කුමාරි කථා 195 - 200
2. බෝධිසත්ව කථා 200 - 202
3. සංකිච්ච සාමණේර කථා 202 - 203
4. මහාකප්පින රාජ කථා 203 - 213
5. උදෙන රාජ කථා 213 - 219
6. සෝණක උත්පත්ති කථා 219 - 231
7. වාසුලදත්තා උත්පත්ති කථ 232 - 235
8. මාගන්දි උත්පත්ති කථා 235 - 238
9. තාපස කථා 238 - 241
10. මාගන්දි - සාමාවති කථා 241 - 247
11. සාමාවති කථා 247 - 248
12. කුමුදුප්පලානිත දුග්ගතසෙවක කථා 249 - 255
13. කොණ්ඩඤ්ඤ සථවිර කථා 255 - 259
14. මඤ්ඤමානවක කථා 259 - 277
15. සක්කපඤ්හ කථා 278 - 284
16. පුනබ්බසු මාතා කථා 284 - 292
17. සස ජාතක කථා 292 - 299
18. සඞ්ඛබ්‍රාහ්මණ කථා 299 - 305
19. වට්ටක ජාතක කථා 305 - 307
20. මත්ස්‍ය ජාතක කථා 307 - 310
21. සිවිරාජ ජාතක කථා 310 - 321
22. සීලානිසංස ජාතක කථා 322 - 324
23. මහා ධම්පාල චරිත කථා 324 - 327
24. මහාපදුම ජාතක කථා 327 - 332
25. ඛදිරඞ්ගාර ජාතක කථා 333 - 335
26. වෙස්සන්තර ජාතක කථා 335 - 382

දහම් සරණ පවුන නිම්.

දහම් සරණ

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1. සූවිසි විවරණ කථා

ධම්මං සරණං ගච්ඡාමි
දහම් සරණ යෙමි

කෙබඳු වූ දහඬ් සරණ ද යත්:-

අප ත්‍රිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ සාරා සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සොයා වෙහෙසී අන්‍යයෙහි බෝ මැඩැ වප්‍රාසනයෙහි වැඩ හිඳ සව් නේ ගෙවා දත් කෙණෙහි පසක් කළා වූ දහම් සරණ යෙමි යි **දහම් සරණ** යා යුතු.

මේ හැන්හි සත්පුරුෂයන්ට සන්තොෂ සඳහා, ඇසුවනට සවර්ග මෝක්ෂ සම්පත්හි සඳහා, අප බුදුරජාණන් වහන්සේගේ ගුණ වියත් අවියත් මුළු ලෝ වැසියන් සිත් සතහා අමෘත පරිමෙකයක් සේ ගල්වනු සඳහා ම හිමි වූ **ගෞතම නොත්‍රයෙහි** උපන් මුළු ලොවට අගමැණි[1] වූ ශාක්‍යසිංහ වූ **සම්බුදුන්වහන්සේ** ගේ චරිතය මූල ප්‍රණිධානයෙහි[2] පවත් ඒක දෙශයෙකින් දක්වම්. කණ හුණු දහම් අකුරෙන් අකුරකට **අමාමහ නිවන්** ම මිළ කොටැ දක්වන්නා වූ ඒ විසමය සහිත වූ චරිතය සිතෙහැතිවැ ඇසිය යුතු.

මෙයට සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයකින් යවැ අප බුදු රජාණන් වහන්සේ සම්පත්හින් අනූන වූ, විපත්හින් ක්ෂීණ වූ, අමරවර ශරීර සෞන්දර්‍ය්‍ය සාර සංග්‍රහා'හිරාම වූ ශරීර කාන්තීන් හොබනා විවිධ විදග්ධ මුග්ධ නරනාරී ගණාකීර්ණ වූ, **සුමෙධ සෘෂිහු** "හසතිශබ්ද ය - අශ්වශබ්ද ය - රථශබ්ද ය - මෘදඞ්ගශබ්ද ය - වීණාශබ්ද ය - ගීතශබ්ද ය - ශඞ්ඛශබ්ද ය - සම්මශබ්ද ය - තාලශබ්දය ය - 'තාව! බොව! යන ශබ්ද ය" යන මේ දශවිධ වූ ශබ්දයෙන් සමන්විත වූ දුර්භික්ෂ යක්ෂ ප්‍රලයයෙන් අනු'පක්ෂීණ වූ, සුභික්ෂතාව හෙතු කොට ගෙණැ නිරූපහතා'න්‍යාපාන සම්පත්හින් සා පිපාසායෙහි රස නො දන්නා වූ

1. මෙණ - මිණ 2. ප්‍රණිධියෙහි - ඇතැම්

නිහ්‍යයෙන් භාෂා ශිෂ්ට ජන සංසෙවිත වූ, විනෂ්ට දුෂ්ට ජනා ව්‍යාහත වූ, විවිධ වූ පරිඛා ප්‍රාකාර ප්‍රතොලි ආදී නගර රක්ෂාඞ්ග යෙන්[1] සම්පූර්ණ වූ සාමි ය, අමාත්‍ය ය, රාෂ්ට්‍ර ය, දුර්ග ය, ඛනි ය, මිත්‍ර ය, සෙනාව ය යන සප්තාඞ්ගයන්ගේ සමෘඞ්ධි විරූඪතා වූ, "ඛම්"ථ කාමමොක්ෂ ලක්ෂණ පුරුෂා"ථ සම්පන්න වූ සප්ත සූක්ෂම වූ කර්මාන්ත සම්පාදන ව්‍යග්‍ර සමග්‍ර කාරු ශිල්ප කුල කෞශල්‍යයෙන් නිෂ්පාද්‍යමාන වූ අසමාන වූ කර්මාන්ත සන්තාන යෙන් සමාකීර්ණ වූ රූප - ශබ්ද - ගන්ධ - රස - ස්පර්ශ ය යන පඤ්චකාමයන්ගේ සම්වාඝයෙන් පඤ්චේන්ද්‍රිය සන්තර්පණයට විනාකා වූ, විෂය විශෙෂයෙන් පරම මනොහර වූ, විමල සප්තලා"නි සප්ත මුක්තාඵලාදි විවිධ රත්නයෙන් සමුද්ගත වූ, ප්‍රභා සාකල්‍ය යෙන් වර්ණ භෙද සම්බන්ධයට පමුණුවනලද පුර ත්‍රිසන්ධා"කාශ දෙශයෙන් හෙබි සදී කාලිකා වූ සෞභාග්‍ය ඇති .....

කර්ණාට - ලාට - කාසම්ර - කිර - කාම්බොජ - යවන - චීන - ශබර - බබ්බර - ගුජ්ජරාදි - නානා දෙශ වාස කවිජන සමූහ සන්දර්ශිත විවිධ දෙසොච්චිත දෙශ භාෂා විශෙෂ සංයොගයෙන් සුන්දර වූ, "ශික්ෂා - කල්ප - ව්‍යාකරණ - නිරුක්ත-ඡන්ද-ජ්‍යොතිෂ ය" යන ෂඩඞ්ගයෙන් යුක්තා වූ "සෘග් - යජුස්සාමන"ථර්වණ ය[2]" යන සතර වෙදයන් ප්‍රධාන කොට ඇති අවෙද්‍ය විද්‍යාස්ථාන සම්බන්ධයෙන් අග්‍රාම්‍ය වූ, තත්තද්විද්‍යෙ"ප ජීවින් විසින් නිරන්තර වූ "සන්ධි - විග්‍රහ - යානා"සන - සංශ්‍රය - ද්වෛධීභාව - ලක්ෂණ වූ ෂාඞ්ගුණ්‍යයන්ගේ කාලොචිත සථානොචිත ප්‍රයොගයෙහි ප්‍රවීණ වූ, රාජා රාජ ව්‍යශන විනාශයෙන් ශ්‍රවධර්ම කර්මයෙහි අනුදර්ශින වූ, සත්‍ය ශෞචාචරණ වූ සාමි කුලයාගේ සම්‍යක් පාලන සංවර්ධිත වූ පෞර ජනයන් විසින් සතතොද්ගීය මාන වූ, ජයශබ්ද සාධුවාද ශත සහස්‍ර යෙන් සම්මිශ්‍ර වූ —

අධර්මයට 'නැත' යන බස කියන්නා වූ, සම්පත්තියෙහි 'නැත' යන්නක් නො කියන්නා වූ, අන්‍යොන්‍ය සහයොග වැ පවත්නා ශුද්ධාෂ්ටකය සේ ඔවුනොවුන් නො හැර වසන මිත්‍ර පුත්‍ර කලත්‍රාදින් විසින් සමාකීර්ණ වූ, නිඝණ්ටට විවෙක විහාරයක් බඳු වූ, නාගරිකයන්ට ශෘඞ්ගාරශාලාවක් වැනි වූ, ශිල්පයට විද්‍යාශාලාවක් බඳු වූ, අධර්මයට වෙන වෙන වධ්‍යභූමියක් බඳු වූ, ධර්මාධිකරණ ප්‍රවෘත්තීන් විනිවර්තිත වූ මාන්සභ්‍ය ඇති, මුඛ බෝ මැඩෙහි ගන්නා සම්බුද්ධඥාන නැමැති කල්පවෘක්ෂයෙහි පළමු බිජුවට හිදු වූ තෝනාන්න බඳු වූ

1. රක්ෂාඞ්ගයෙන් 2. යජුස්සාමාථර්වණය - ඇතැම්

බඳු වූ, අමර පුරවරසපර්ධතවූ **අමරවති** නම් රාජධානියෙහි; නිරූපදෙශයෙන් නිවන් ඇති බව සිතාගත්තා වූ මෙධා සම්පන්නින් යුක්ත වූ වයෝ මූර්තිධර **සුමෙධ** නම් බ්‍රාහ්මණ **කුමාර** වැ සප්ත කුල පරම්පරායෙහි පවත් ගෙණැ උදිතොදිත වූ **"අධ්‍යාෂනා ධ්‍යාපන, යජන, යාජන, දන, ප්‍රතිග්‍රහණ,"** ලක්ෂණ සඞ්ගත කර්මාභිරත වූ සුජාත මවු පිය පක්ෂ ඇති බැවින් ජාතිවාදයෙන් අකලිඞ්ගත වූ මතු ඇතිවන **දෙනිස් මහාපුරුෂ ලක්ෂණයෙන් අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් කෙතුමාලායෙන් බ්‍යාමප්‍රභායෙන්** මනොහර වූ බුද්ධිවිලාශ වෛචිත්‍රයට හත් වැටිසතක් බඳු වූ අවයව සම්පත්තින් මනොහර වූ කුණ්ඩලිනී චන්ද්‍රිකා කුමුදෝන්දි වරාදී වූ සියලු මධුර වසතුන්ගේ සථානොචිත විත්‍යාසයෙන් මනොඥසරීරාභාසයෙන් නිෂ්පන්න වූ රූපයක් සේ ජන නයන මනොරඤ්ජක රසායන වැ අනන්‍ය සාමාන්‍ය වූ සෞභාග්‍ය භාග්‍ය දෙදෙනාණන් යමක ප්‍රසවයක් සේ ලොකොත්තර වූ පවිත්‍ර චිත්‍ර චාරිත්‍ර විශෙෂ පාත්‍ර වැ —

සෘග් - යජුස්සාම'මන්, - යන වෙදත්‍රය විශුද්ධ බුද්ධි ප්‍රභාව භාවිත වූ චිත්තොත්පාදමාත්‍රයෙකින් ශ්‍රී හස්තතල කලිත කොමලාමල බාල පල්ලවාදී විලාසයෙන් නිෂ්තුෂ කොටැ නිශඤඛක වැ දැනැ වදුරා විශිෂට ශිෂට ගොවර වූ **චතුෂ්ෂෂ්ඨි කලා** හා **අෂ්ටාදශ විද්‍ය** ස්ථානයන්ගේ ග්‍රන්ථිසථාන නැමැති ජීර්ණ පණ්ඩුර සමාන්‍ති නාරාව නිපාතයෙන් විදූ කොවිදූ කොටැ දැනැ ඒ ඒ විද්‍යාවිෂයයෙහි අවිවාය්‍යී වූ ආචාය්‍යී භාවයට පැමිණැ උන්නත වූ කුලයෙන් විමල වූ ශීලයෙන් නව යුවති ජන මනොහරෙක හෙෂජායමාන වූ සමාන නවයෞවන සම්පත්තීන් ලොකොත්තර වැ **අමරවති** නැමැති පියුම් විල්හි විරාජමාන රාජහංසයක්හු සේ **අමරවති** නැමැති විශද ශරදභ්‍රකාශ ගර්භයෙහි දෙදීප්‍යමාන වූ ශාරද චන්ද්‍රමණ්ඩලය සේ ලොකොත්තරයෙක කාරණ වැ —

අමරවති නැමැති විකශිත කමල ගර්භයෙහි සුජාත වූකර්ණිකාවක් සේ නිසඟී ශොභා විශෙෂ සංසර්ගයෙන් පරම මධුර වැ **අමරවති** නැමැති මඤ්ජර ලතායෙහි සඤ්ජාත වූ සාම්ප්‍රබුද්ධ[1] වූ අමන[2] **මකරන්ද** සුගන්ධ සම්බන්ධ බන්ධුර වූ කුසුම්සංචයයක් සේ සකල ලොක ලොචනාහ්ලාදක වැ **අමරවති** නැමැති අප්‍රතිමල්ල **වෙපුල්ල පර්වතොදරයෙහි** ප්‍රවර්තමාන වූ වර්ධිෂ්ණු රොචිෂ්ණු සම්භාවනීෂ්ණු මරීචි මාලා සමාකුල වූ ලොකානිවර්ත්‍යි **චක්‍රවර්ති නරවර** භොග්‍ය වූ **මහා මණ්ඩරත්න** යක් සේ ලොක බහුමාන භාජන වැ අමරවති නැමැති ගන්ධ ගජ

1 සාම ප්‍රබුද්ධ වූ, 2. අමර - අමරණ - ඇතැම් -

කුසියෙහි සඤ්ඤාත වූ සතරදෙන විනිර්මුක්ත මුඛතා ඵලයක් සේ නිරුපයි මධුර ලක්ෂ්මී නිවාස වැ සතලොක සම්භාවනා භාජන වැ වෙසෙමින් තමන් වයසින් බාලව ද ඥානයෙන් වෘද්ධාවස්ථායෙහි, මිදි පිය දෙ පක්ෂයෙහි ඇත්තවුන් ප්‍රලය සමය දිවසකර කරෝපලුපා තුහිර බිහු ඇයයක් සේ දුර්ගර මාරාභඞ්කාර ගොචර වැ සථාශෙෂ වූ කල්හි, නානා ද්‍රව්‍ය ගණ සම්පූර්ණ කොෂ්ඨාගාර රක්ෂණ ලක්ෂණ ව්‍යාපාර නිරතාමාත්‍යාධිෂ්ඨා අවුත් සිටිවැ භක්ති භාරාවනත හස්ත ඇති වැ නිජ මස්තක වින්‍යස්ත ශ්‍රී පාදෙත්තමංසයෙන් සථලී කෘත ප්‍රාණලාභ ඇති වැ වැඳැ නැගි සිටිවැ පරමාදර දක්වා,

"ස්වාමිනි! ස්වාමි දරුවන්ගේ මවු පිය දෙ පක්ෂයෙහි ඇත්ත වුන් වහන්සේ සවගීසථ වූ බැවින් ස්වාමි දරුවන් විසින් මේ කුලක්‍රමානුගත වූ මහාවස්තු සමන්වා පිළිගත මනා ඒවි ද?" යි අම්ශ්‍ර සප්ත රත්නාදී නානාවිධ ද්‍රව්‍ය සමූහයෙන් සම්පූර්ණ වූ භාණ්ඩාගාරයෙහි දෙර හරවා "මේ ස්වාමින්ගේ මැණියන් වහන්සේගේ පක්ෂයෙන් තිබී ආ ධන ය, මේ පියානන් වහන්සේගේ පක්ෂයෙන් තිබී ආ ධන ය, මේ ධන සමූහය වූ නියා ස්වාමින් සේ වූ ව්‍යවස්ථිත අය වියදම් සවරූප දන්නා කෙණෙකුන් තබා අනවස්ථිත වූ කෙණෙකුනුදු කැමැති ලෙස වියදම් කරත් එක් පුරුෂායුෂයෙකින් නිමවාගත නො හැක්ක. එහෙයින් ස්වාමින් විසින් මෙබඳු මහා ධන රාශිය ගෙණ "ධර්මාර්ථ - කාම - මොක්ෂ -" යන චතුර්විධ පුරුෂාර්ථයෙන් අභිමත පුරුෂාර්ථයක් සාධා වදාළ මැනවැ" යි දැන් වූ කල්හි —

"යහපතැ" යි පිළිගෙණ දානාදී වූ කුසල් කෙරෙමින් කල් යවා එක් දවසක් අප වැන්නනුදු නිවන් දකුම්හ" යි සිතුව මනාකල්හි, සසර වැනි මහා විෂයකට දහම් පිළියමක් පැවැත්වුව මනා කල්හි, සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් අමා මහ නිවන් වැද සැනහුන මනා කල්හි, ත්‍රිභුවන මධ්‍යයෙහි නිරන්තර තත්පර වූ වසවර්තිමාරයා අවශවර්ති වැ සවන් බිමින් පැරුදු පිට හඹ හඹා දිවුව[1] මනා කල්හි, කෘෂ්ණා ය - අරති ය - රගා ය යන මාර සත්‍රින් තුන්දෙනා මුහුණ දෑලි ගැවුණ මනා කල්හි, මෙ කපැ තමන් ඇතුළු වූ පස් බුදු කෙණකුන් වහන්සේ විසින් හෙබැවි භද්‍රකල්පය යන නම් ලද මනා කල්හි, පිය වූ සුදොවුන් මහරජාණන් සේසත් යටැ හෙවැ රහත් වැ පිරිනිවන් පැ අමාමහ නිවන් දුටුව මනා කල්හි, වැදූ මැණියන් වහන්සේ සත් දවසෙකින් මියැ දෙව්ලොහි දිව්‍ය

1. දිවිවනා සාල්සි - ඇතැම්

පුත්‍ර වැ ඉපි දැ යමාමහ පෙළහර කොටැ තුන් පියවරකින් **නව්** නිසා වැඩැ පණ්ඩුකම්බල සිලාසනයෙහි වැඩහිදැ වදරන්නා වූ[1] විජම් අසා අමාමහ නිවන් සෙවු මනා කල්හි, මූළු ලොවට වූ මරණ භය නසන තුනුරුවන් රැක වරණ පස්වා දහසකට පැවත මනා කල්හි —

පිළිසිඳැ ගත් නුවර ය, උපන් උයන ය, සත් පියවර එබූ තැන ය, වැඩසිටැ කළ සිංහනාද ය, කාළදේවලයා මුදුණෙහි තුබූ පය ය, වප් මහලෙහි වැඩහොත් තැන ය, නො හැරැ ගිය දඹ සේය ය, එකුත් කිස් හවුරුද්දක් හිදු වූ ඇඹේණියයෝ ය, ලද[2] පුතනුවෝ ය, සෙළි උයන ය, දුටු පුළිනිමිති ය, නැගි අසා ය, නික්මුණු සඳිය ය, සහිතව ම හැරැණු දෙර ය, රැ ගිය හමන ය, පෙරළා බාලූ නුවර ය, පිනූ ගඟ ය, වැඩසිටි වැල්ල ය, කැපූ හිස නොගඟ ය, ඇළ සළු ය,[3] පිළිගත් අව පිරිකර ය, සිහාවන් ගම ය, සාමුරැද්දෙක් කළ මහා විහාර ය, මේහෙ කළ **පඤ්චඟ** මහණ හ, කිරි පිඬු පිළිගැන් වූ **සුජාතාවෝ** ස, වැඩහිඳැ පිළිගත් නුග ගස ය, පිළිගෙණැ වැඩැ පැන් සැනහූ තොට ය, වැඩහිඳැ වැළඳූ කිරිපිඬු ය, ගඔහාගෙහි හළ පාත්‍රය ය, දහවල් විසූ සල් වනය ය, බුදුවන ද, පිට දුන් බෝ රුක ය, වැඩහුන් වජ්‍රාසනය ය, පත පත ගෙළා ලුහුබැඳ වූ මර ය, මහුල් මෙහෙ කළ දිව්‍ය බ්‍රහ්මයෝ ය, තුන් යම්හි ලද තුන් විදැව ය, අරුණෝදයයෙහි ලද සම්බුද්ධරාජ්‍ය ය—

වැඳැ ගෙණැ හොත් ඇතා ය, සක්මන් කළ සක්මණ ය, දෙව් ලොවින් බට හිණ ය, උපස්ථාන කළ මතැතා ය, ඕහි පිළි ගැන් වූ වඳුරා ය, දරණ ගැබැ වඩා හිදු වූ නඟා ය, දකුණත් සව්වන් වහන්සේ ය, වමත් සව්වන් වහන්සේ ය, වැදූ මැණියන් වහන්සේ ය, සවගීසථ වූ කල පිරිමැසූ බාල මැණියන් වහන්සේ ය, සෙනසුන් හැමදි වහන්සේ ය, වෙනෙර කරවූ සිටානෝ ය, උපස්ථාන කළ උපාසිකාවෝ ය, වැඩ හෙවැ පිරිනිවන් පෑ සල් වනය ය, ශරීරයෙන් විසිර ගිය ධාතු ය, වැළඳූ පාත්‍ර ය, පියවර එබූ තැන ය, යකාදියෙහි තම් පමණක් එක විටෙක ද සැදුහැ-යෙන් තුබැ වකාපුවන් එකහෙලා තමන් වන් අමා මහ නිවනට ම වන මනා කල්හි, "මෙවැනි යක් බිමෙක අප වැන්නන් පවා

---

1. වදරන්නාහු - ඇතැම්, 2. ලද - ඇතැම්,
3. හළමළ සළය - ඇතැම්.

සිද්ධාර්ථ කුමාරයන්ගේ ගැන්තම්හ" යි නො බා සුව සේ විසුව මනා කල, සතර අපාය හිස් වුව මනාකල, දෙව් බඹලෝ පිරුණ මනා කල, යහන්හි වැඩ හිඳ මෙ බදු සිතක් සිතා වදලෝ ලු!

ඔහු[1] එක් දවසක් සකල සම්පත්හින් ප්‍රසාදකර වූ ප්‍රාසාදයෙහි අතුල වූ මහානොලෙහි පළක් බැඳ වැඩහිඳ "මේ සංසාරයෙහි සිටි සත්ත්වයාහට ජාතියෙන් ජාතියෙහි පිළිසිඳ

ඒ සඩ්ගම් දරුවානන් සිතූ පරිදි කියම්

පෙරළීම් නම් ඉතා දුක. ජාතයහට වන්නා වූ ජරාව ද ඉතා දුක. ජීර්ණයහට වන්නා වූ මරණ නම් ඉතා දුක. මම ද ජාති ජරා ව්‍යාධි මරණ දුඃඛයෙන් අමුක්තා වැ සිටියෙමි: එසේ වූ මා විසින් අජර වූ අමර වූ ක්ෂෙම වූ ඛානති පුරයට වැද නිවී සැනහෙනු මැනව, මේ මා උපුළන මනුෂ්‍ය ශරීරය මොහයෙන් ඔබොගර වැ වැවහෙන බව මුත් අසුවියෙන් අසුචි වදනේ ය. අසුචියෙහි පිහිටි අසුචි ඇත්තේ ය. ඇතුළෙහි පිරි ඉතිරෙන අසුචි ම නික් මෙන්නට නියතවැ තුබූ නවදොරක් ඇත්තේ ය. නො එක් කුලෙහි පණුවන්ගේ ඉපදීමට නිඛ්ඛිගෙය ය. අසුචියට මඩෝර ගෙය ය. මරණයට මිනිගෙය ය. සැවයට අමුසොහොණ ය.

තමාගේ ශරීරයෙන් හළ නො සකස් තමා ම බලාත් නෙමේ තමහට පිළිකුල් එළවන්නේ ය. මෙසේ අසුචි වුව නෙමේ දුඃඛ කාරණය නොවෙයි යත් :- එසේ ද නො වේ මැයි; සියලු දුක් පිරූ නිධානය වැ සිටියේ ය, මරහට එක ගොදුරු වැ සිටියේ ය. නුවණ වැඩි වැඩි සේ වඩ වඩා ම පිළිකුල් වැ පැනෙන බව මුත් කිසි ගතයුතු දෑයක් නැත්තේ ය. මෙසේ වූ මේ ශරීර භාරය උපුළා ඇවිදුනා සෙසු අඥන සත්ත්වයන් සේ මම ද මේ බරු'පුළා ගෙණ ඇවිදිම් නම් ඒ මා වැනි වියතක්හට සුදුසු නො වෙයි.

මේ ලොවෙහි දුක් නම් දෙයක් ඇති කල්හි, එයට ප්‍රතිපක්ෂ වූ සුව නම් දෙයෙක් පැණෙයි. අකුසලයට ප්‍රතිපක්ෂ වූ කුසල නම් දෙයෙක් පැණෙයි. ශරීර සන්තාප කර වූ හුණක් පැණෙන කල එයට ප්‍රතිපක්ෂ වූ සීතලයෙක් ප්‍රත්‍යක්ෂයෙන් ම පැණෙයි. මේ අනුමානයෙන් ම මෙසේ මහත් වූ සංසාර දුඃඛයක් ඇති කල්හි එයට ප්‍රතිපක්ෂ වූ නිර්‍වාණ සුවයක් නම් අවශ්‍ය යෙන් ම ඇත මැනව, අසුචි වළෙක්හි හුණු පුරුෂයක්හු මේ අසුචි සෝධන්නට සුදුසු වූ සුගන්ධ සීතල ජල හරිත වූ මහ විලක් බල බලා තමාගේ ශරීරය ශුද්ධ කොට නො ගණුත්

1. එවුනු - ඇතැම්

හොත් ඒ පුරුෂයාගේ අපරාධ බව මුත් විල්හි අපරාධයෙන් නො වෙයි. තව ද විවිධායුධ හස්ත වූ සතුරන් විසින් පිරිවරණ ලද පුරුෂයෙක් තමා ගැළවී යන්නට සුදුසු ක්ෂෙම මාර්ගයක් බල බලා ගැළවී නො යේ නම් හේ පුරුෂයාගේ අපරාධ බව මුත් මාර්ගයෙහි අපරාධයෙක් නොවෙයි.

තව ද – මහා ව්‍යාධින් ආතුරවූ පුරුෂයෙක් ඒ ව්‍යාධි ශාන්තියට සුදුසු වූ අෂ්ටාඞ්ගායුර්වේදයෙහි දක්ෂ වූ වෙදක්හු ඇති බව දැනැ දැනැ ඔහු කරා එළඹැ තමාගේ ව්‍යාධියට ප්‍රතිකාර කරවා නො ගණී නම් ඒ ආතුරයාගේ බ්‍යාමෝහ බව මුත් වෛද්‍යයාගේ බ්‍යාමෝහ බවෙක් නො වෙයි; එසේ ම මම ද මෙබඳු වූ මහා සංසාර ව්‍යසනයට ඒකාන්ත ප්‍රතිපක්ෂ වූ අමෘතාධිගම නිර්වාණයක් ඇති බව දැනැ දැනැ සුදුසු වූ මාර්ගයෙහියි එහි වැද නො සැතපිනිම් නම් මාගේ ම දෙෂ බව මුත් ඒ අමෘතාධිගම නිර්වාණයෙහි දෙෂ නො වෙයි.

එ යෙසින්ම මා විසින් සුවිකාමී වූ පුරුෂයන්හු තමා ගෙලෙහි බැඳි සර්ප කුණපයක් කඩා හැර සුව සේ යන්නා සේ මේ කුණු ශරීරය[1] හැර සුව සේ අමාමහ නිවන් සැපිය යුතුය. තව ද – මහා සමුද්‍රයෙහි යාත්‍රාකරණු කැමැත්තවුන් දුදුරු වූ නැවක් හැර අනිතව නැවක් ගන්නා සේ මේ සංසාර සාගර යෙහි ගැලෙන්නා වූ තවවිදුර වූ ශරීර නැමැති නැව හැර අමාමහ නිවන් කැමැති ක්ෂෙම තෙෘකාව ආශ්‍රය කරණ බව සුදුසු ය. මහඇඟි බඩුවක් ගෙණැ සොරුන් හා එක්වැ යන පුරුෂයක්හු සොරුන් විසින් ඒ බඩුවට අනතුරුයෙක් වේදෝ හෝ සි යන භයින් සොරුන් කෙරෙන් දුරුවැ යන්නා සේ මා විසිනුදු සසර පමණින් ලුහු බැඳ ගෙණැ දුවන්නා වූ මේ ශරීර නමැති මහ සොර භට වැළැඳී අමාමහ නිවන් මගින් ගැළවෙනු සුදුසු ය: මේ මා විසින් අනුභව කරන්නාවූ ධන රාශිය රැස්කළා වූ මවු පිය දෙ පක්ෂයෙහි ඇත්තෝ පරලොවට උපකරණ පිණිස සි එක් කාවණුවකුදු[2] නො ගෙණැ අනාථ ගමනින් ගියහ.

ඔවුන්ගේ මහා අඥත විජෘම්භනය ය මා විසින් වූ කලී මේ ධන රාශිය ශත සහස්‍ර ගුණයෙන් වඩා අමෘතමහා නිර්වාණාධිගමය කොටැ ජාතියෙන් ජාතිය ගෙණැ යන බව ම සුදුසුය" යි

1. කුණප ශරීරය - ඇතැම්.
2. කහවණුවකුදු - ඇතැම්.

මෙසේ කිසි උපදෙශයක් නැති වැ සර්ඥතාඥනය හවගත් අඬකුරයක් බදු වූ අසාධාරණ ඥන මහිමයෙන් සංසාරයාගේ අසාරථිය ද, ශරීරයාගේ පිළිකුල් බව ද, නිවන් මිහිරි බව ද, නිවනට මාර්ගයක් ඇති බව ද, 'ධන' නම් දෙය පසු පස්සෙහි ජාතියෙන් ජාතියට නො ගෙණෑ යායුතු බව ද, එසේ ගෙණ යාම ද දුනයෙහි යෙදීමෙන් සිද්ධවන බව ද, දුනැ වදුරා 'කරම්හ' යි නිශ්චය[1] කළ කවයුත්තෙහි තමන් වහන්සේ මුත් අනික් තත්පර වැ කරන්නට සුදුසු උත්සාහ සමපත්තියක් පරාක්‍රම සමපත්තියක් ඇත්තවුන් නැති හෙයින් ඒ වේලෙහි ම අතිමහා වූ සර්ව පරාර්ථ සිද්ධිය පිණිස, එ කල්හි රජකරන්නාවූ රජ්ජුරුවන් කරා එළඹැ: -

"මහරජ! මේ භවය නම්:- **රාගය, දෝෂය,** මෝහය, යන අජල[1] නිර්‍යාපණීය වූ, අමනාප ශමණීය වූ[3] අනෞෂධ සාධ්‍ය වූ **මහා වන්නි ත්‍රයය** කින් ආදීපතවැ සිටියේය. අඥය වූ මේ සත්ත්වයෝ මුත්හරෙක යන බුදුන් සොරවිෂ වූ සර්පයකු ගන්නට උත්සාහ කරන්නවුන් සේ සකල දුඃඛ නිධාන වූ පඤ්චකාම ගුණයන්ගේ අනුභව කිරීමෙහි තත්පරයහ, මිරිඟුයෙන් සිතල සලිල පානයට දෙහොත් දික් කරන්නවුන් සේ සුඛ ශූන්‍ය වූ සංසාරයෙන් සුව අනුභව කරම්හ යි සිත් දී සිටිය හ. අමිශ්‍ර වූ දුඃඛය ම සුඛ ය යි කියා කල්පනාකොවැ අස්ථිර වූ වස්තුයෙහි ම ස්ථිර වූ බුද්ධියෙන් පෙළී අසුචියෙහි සුචි සංඥාවෙන් ආතුර වැ අනවරතයෙන් පීඩිතයහ. මේ සංසාරයෙහි සවරූප නිරූපණය කරණ ප්‍රඥාසම්පන්නයහට අනික් එසේ වූ චිත්ත භෙද කාරණයෙක් නො පෙණෙන්නේ ය. මෙලොව වැස්සා අනුභව කරණ සුඛයෙක් ඇත් නම් හෙ ද **විපරිනාම දුඃඛය,** උපෙක්ෂා වෙදනාව, **සංස්කාර දුඃඛය,** දුඃඛ වෙදනාව, **දුඃඛ** හෙයින් ම දුඃඛ ය.

මෙසේ කල්හි තත්ව විචාර ලොලයහට අසුචියෙහි වඳන සඬකායෙක් නැත්තා සේ මේ සංසාරයෙහි සුචි සඬකායෙක් තෙම නැත. **අවිද්‍ය, භාවිත** චිත්ත සන්තාන ඇති **සත්ත්වයාගේ** 'මූ අපගේ අඹුවෝ ය, මූ අපගේ දරුවෝ ය," යන ය්ම් තෘෂ්ණාවක් ඇත් නම් හෙ ද සත්ත්වයා සසරින් ගැලවී යා නො දෙන මහාපාසයෙක. මෝහ මධුර වූ මේ නව යෞවන ශ්‍රී තොමෝ ජරාව හා **කෙසාකෙසි සුඛයෙහි** පරාජයට පැමිණෑ ආ බව මුත් ජයක් නො ලත් විරූ වැ, ප්‍රයත්න ඝන ගුප්ත වූ ජීවිතය ද මරහට කබල නොවැ නො ගැලවුණු විරී ය.

---

1. විනිඟවය - ඇතැම් 2 අවල - ඇතැම්
3. කෙළණීය වූ - සමණීය වූ - ඇතැම්.

කිසිකලෙක්හි මතැතුත් කුඛුපලා මුතු පිරා ඝන මේදස් අනුභව කළ **කේශර සිංහරාජයෝ** කාලානන්තරයෙක්හි ග්‍රාමාන්තර පරිඛායෙහි අශුචි ද්‍රව පානයෙහි තත්පර වැ සච්ලොක පරිභූත වූ ක්‍රියායෙන් ගර්හාසපද වන්නාහ.

දසගිල්ලක් තැගීමෙන් දසදහසක් සක්වළ එසාලොක කළ දෙලොස් යොදුන් ශරීර ඇති **මහාබ්‍රහ්මයෝ** කිසිකලෙක්හි ගුඤ්ජාඵලමාත්‍ර වූ ශරීර ප්‍රදෙශයෙහි සඤ්ජාත වූ වියතක් පමණ තැන්හිදු ආලොක නො පවත්වන්නා වූ පරිත්ත ප්‍රභා සංයොගයෙන් සකල ලෝක පරිහාස්‍ය වන්නාහ.

කිසි කලෙක්හි වාසුරක බාසු'තන්ද සඤ්ඤ නිදන වූ **නන්දා පුෂ්කරණියෙහි** ස්නාන කෘත්‍ය පවිත්‍ර වූ **ශක්‍රදෙවෙන්ද්‍ර තෙම** කිසි කලෙක්හි වණ්ඩාල කුල ශරීර මල හරිත වූ පූති ගර්තයෙහි ඒ ඓශ්වර්‍යය ත්‍රිඛාසියොග ව්‍යාවෘත වැ තමා සුඛිතයන් කෙරෙහි ඇතුළත් කොටැ සිතන්නේ ය.

කිසිකලෙක්හි විශද ශරදාකාශයෙහි විප්‍රකීර්ණ තාරාගණ පරිවාරයෙන් යුක්තවැ සම්පූර්ණ වූ චන්ද්‍රමණ්ඩල ගතවැ විවිධ විදඟ මූඟි විබුධ වධූ ගාඪාලිඞ්ගන මනොා මහොත්සව පාත්‍රවැ ව්‍යොම යාත්‍රා කළ **චන්ද්‍ර දිව්‍යපුත්‍රයා ද** පවා කිසි කලෙක්හි තළා ම තමාහට බැඳි කෝටු මිටියට පණුවැ ඉපැද හොත් තැනින් සෙල්වී ගත නොහී අනය ව්‍යසනයට පැමිණෙන්නේ ය. —

කිසි කලෙක්හි උදය ශිඛර නිරොධාන විමුක්ති සමිසමයැ සම්බුද්ධීර්ණ සෘණි ශ්‍රෙණි විශකලිත තමස්තොමසාහස ඇති චක්‍රවාලාන්තරාලෝද්‍ය' පූරිත සහස්‍ර රශ්මි ඇති **සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රයා ද** පවා කිසි කලෙක්හි පූතිමාංසයෙහි කෘමිවැ ඉපද ඒ මාංසය වියලෙන පිණිස දෙරෙහි වැනූ කල්හි අනික් සූර්‍යයන්ගේ රශ්මින් වියලී ප්‍රාණ විනාශයට යන්නේය.

තව ද - දහසක් යොදුන් ආත්මභාවයෙන් සුවාසූ දහසක් යොදුන් ගැඹුරු සාගරයෙහි ජලක්‍රීඩා කළ **ආනන්ද මහාමත්ස්‍යයා** සේ වූ මහාමත්ස්‍ය රාජයෝ පවා කිසිකලෙක්හි ඉෝකුරයෙහි වටැ වැසි දියත්තක් නිසා ජීවත් වැ එ දිය වියලෙන කල්හි ඒ හා කැටිවැ වියලී ප්‍රාණ විනාශයට පැමිණෙන්නා වූ ක්ෂුද්‍ර ප්‍රාණී ඥාතීන්ව ත් ඇතුළත් වැ මහදුක් අනුභව කරන්නාහ.

තව ද - පන්සියක් යොදුන් මහ හිඹුල් රුකින් නැඟී ප්‍රබල පක්ෂවාත ප්‍රහාරයෙන්[1] සාගර ජල සඤ්ඣය දෙ බේ කොවැ තා ගොදුරු[2] ගත් ගුරුළු රජහු කිසිකලෙක්හි තත්‍රතර ශරීර ප්‍රමාණ වූ නිලමැසිවැ පූති ගාත්‍රයෙහි හොත්තා වූ ගැඹුල් ආදිතුදු හොත් තැනින් සොල්වා ගත නොහි ඒ වළෙහි ගඩ ඟඩා අමේධ්‍ය ගොවර ග්‍රහණයෙන් චරිතාර්ථි[3] වන්නාහ.

තව ද - කිසිකලෙක්හි සතර මහාවීපයෙහි ඒකාත පත්‍ර රාජ්‍යය කරණ පිණිස මෙහෙකරු රජදරුවන් විසින් ශීඝ්‍රවව වැඩූ මිණි වොටුණු ඇති රජ දරුවෝ කිසිකලෙක්හි සඬ්ගති දූරවන් විසින් විලුම් පහරින් තලා හිසට තහන ලද දරම්වි ඇදූ මහදුක් අනුභව කරන්නාහ.

තව ද- කිසිකලෙක්හි රජනීකර කර නිකර සංයොග විශ්‍රණීත ශ්වෙත කානති ප්‍රකත විසාල වඳූ ශාලායෙහි ආසන්නී ඔකතා ශයනයෙහි යෙහෙන් නිදූ පුබුදුනා මහාභාග්‍ය ඇත්තෝ ද කිසි කලෙක්හි අනල්ප කල්ප කාලසම්භූත මහොඝම[4] විසමය වූ ඝුණුහළු නරකයෙහි හළුයෙහි හී පැළඟී දුක් සහ වෙදනා සහසු භාජන වන්නාහ

තව ද- කිසිකලෙක්හි උත්සව ශෘඞ්ගාර පිණිස ලෙහි ලූ මදූර කුසුම භාරය පොවා ක්ෂමා කොවැ ගත නොහෙන්නා වූ කොමල වූ දිව්‍ය පුත්‍රයෝ කිසිකලෙක්හි තුන්ගව් පමණ යමපලුන් වෙර හී තඹා හෙළාලිය නො හෙන ගිනි හෙන දිලියෙන යපොරෝ පහරින් කිළිල් කඩක් සේ දෙපලු කරණ ලද හදවත් ඇත්තාහු කර්ම බලයෙන් නො මියා මහදුක් අනුභව කරන්නාහ.

තව ද - කිසිකලෙක්හි දනක් පමණ සත් රුවන් හිණෑ කිප පෙති ගණනක් මැඬැගෙණැ තමන්ගේ ප්‍රාසාදයට නැඟීමෙහි බැස්මෙහි විඩාවත මහ ඉසුරෝ කිසිකලෙක්හි මහා නරකයෙහි ශතයොජන ප්‍රමාණ අඞ්ගාර පර්වතය මැඬැගෙණැ යමපලුන්ගේ නියොගයෙන් අනෙක ලක්ෂ කොටි වශී සඞ්ඛ්‍යායෙන් නැඟී බැසැ නො විඩා වන්නාහ.

තව ද - කිසිකලෙක්හි කැටූ වැ දිය කෙළියට බවුවා වූ දිව්‍ය සත්‍රීන්ගේ රකෙතාත්පල ගහි සේ කොමල වූ අතින් විදුනාලද ජලධාරාව පවා තමන්ගේ ශරීරයට කැණිස කොවැ සිතන දිව්‍ය

1. ප්‍රහරණයෙන් — ඇතැම්. 2. ගොදුරු — ඇතැම්
3. චරිමාත්ම — චරිතාත්ම — ඇතැම් 4. මහොඝ්න — ඇතැම්

පුත්‍රයෝ කිසිකලෙක්හි ක්‍රෑර වූ යමපලුන් බැරහී ගෙණැ කපක් දවස් තැවී තුබූ තාඹතල්[1] කඳ සා ලොහොදිය ධාරා ඉසැ සිටැ දෙපල්ලට නමත්දමින් විරෙමින් බැගැ හඬින් හඬමින් මහා දුක් ගන්නාහ. එහෙයින් මහරජ! මෙ සසර ඉතා අව්‍යවසපිතය.[2] ඉතා භයඞ්කර ය; ඉතා සාදීනව ය; ඉතා අසාර ය, ඉතා ව්‍යාකූල ය; ඉතා දිග ය, ඉතා එතරව් ය නො හැක්කේ ය.

තව ද - මෙ සසරෙහි කිසි කලෙක්හි ගෞරව පාත්‍ර වූ මවු වූවෝ කිසි කලෙක් හි නිලීජරා වූ ශෘඞ්ගාර වෙෂ්ටාවට පාත්‍ර වූ අඹු වන්නාහ.

තව ද - කිසි කලෙක් හි සත්කාර භාජන වැ වැඳැ පිදුවන්ට ආම මහ නිවැසි දෙක පරිද්දෙන් පිය වූවෝ කිසි කලෙක්හි පුත් වන්නාහ කිසි කලෙක්හි පසින් පැවා හිසින් කරණ ගැතිවූවෝ සම්භර කලෙක් හි තමන් හුන් පත හිසින් දම්වන සවාමිදරු වන්නාහ. මෙ සසරෙහි සිටි සියලු සත්ත්වයා "ලාභ ය - අලාභ ය - අයශ ය - යශ ය - නින්ද ය - ප්‍රශංසා ය - සුඛ ය - දුඃඛ ය" යන අෂ්ටලෝක ධම්මයෙන් හෝ විනෝදමාන ගම්දරුවන් අත හුණු කෙළි පෙදක් සේ සසර පමණින් ව්‍යාකූල කරණ ලද්දහ.

එහෙයින් ම මෙ සසරෙහි ආදීනව දුටු මම අසුරක් ගසන කලුදු එහි සිටිනා නො කැමැත්තෙම්. එහෙයින් මා විසින් මෙ කී සකල දුඃඛයෙන් අසම්මිශ්‍ර වූ ශාන්ත වූ ප්‍රණීත වූ අමෘත මහානිර්වාණයට වැදූ නිවී සැනහී සවාර්ථය සිද්ධ කොටැ සුවපත් වනු සුදුසු ය එහෙයින් මහරජ! මා සතු වූ අනෙක කොටි සඞ්ඛ්‍යාතවූ ධන ඇති. දෙවයන්වහන්ස! ඒ පිළිගත මැන වැ"යි දන්වා:-

ඒ අසා විසමය ප්‍රාප්ත වූ රජ්ජුරුවන් විසින් "තොපගේ ධනයෙන් අපට ප්‍රයොජන නැති. "තොපි ම තොපට අභිමතයක් කරව" යි කී කල්හි 'යහපත දෙවයිනි"! යි ගිවිසැ නුවරෙහි බෙර ලවා අනෙක දිග්භාගයෙන් ආ යාචක - වානක සමූහයා සඞ්කිය ධන ධාරා නිපාතයෙන් සනාතුෂ්ට කොටැ සකලාර්ථී ජන නීයමාන ධන සඤ්චයාගේ අති බහුත්වය හෙතු කොටැ ගෙණැ අක්ෂය බලා, 'ධනක්ෂයයෙහි මහණ වෙම් නම් ආයුෂ්කල්පය ක්ෂය වන බව මුත් ධනක්ෂය නොවෙයි, සිතා "කැමැති යාචක කෙණෙකුන්

1. නාඹුතල් - නාඟතල් - ඇතැම්
2. අවසථිතය - ඇතැම්

මේ ධන ධාන්‍ය රාශිය කැමැති පරිද්දෙන් ගත මැනවැ" යි නිරර්ගල යඥ ඝෝෂ කරවා නානා ප්‍රකාර ද්‍රව්‍ය ගණ සම්පූර්ණ භාණ්ඩාගාර චාර විවෘත කරවා, තමන් වහන්සේ ප්‍රබල දවානල සරහ සම්පාතයෙන්[1] සංදහ්‍යමාන වූ වෘක්ෂ වල්ලි ගුල්මාදී සංකීර්ණ වූ වන ගහණයෙකින් දුහැතිරෙකය ක්ෂමා කොටැ ගත නො හි ක්ෂෙම ස්ථානයට නික්මුණා වූ මත්තමානඩගයකු සේ ද-

විවිධ ශරීරමල සම්පූර්ණ'සුවිගතීයෙක හි එයින් කැති පවිත්‍ර ස්ථානයකට නික්මැ ගත්තාවූ සුවිකාමී වූ පුරුෂයන්හු සේ ද, වණ්ඩ වූ සිංහ ශාර්දූලාදීන් විසින් සමාකීර්ණ වූ වන ප්‍රදෙශයෙකින් අභයස්ථානයකට නික්මැ ගත් ප්‍රාණරක්ෂණාර්ථී වූ භරුණ වාතරයන්හු සේ ද, සමෘර්ධි වූ පඤ්චකාමයෙන් සාදීනව වූ තමන්ගේ මහාප්‍රාසාදය හැර "පැවිදි වෙමි' යන අදහසින් විහාරාභිමුඛවැ නික්මුණාවූ ඒ මහා පුරුෂයානන්ගේ ව්‍රතය ඉතා ආශ්චර්‍ය්‍ය සේ හා, උදරවූ අදහස් ඇත්තවුන් විසින් ලොව අශුභ්‍ය බව ඉතා ආශ්චර්‍ය්‍ය සේ හා, මහතුන් විසින් සිතුයෙක්හි තත්පර කම් ඉතා ආශ්චර්‍ය්‍ය සේ හා, පැතිය යුතු වස්තුයෙහි දු නුවණැත්තවුන්ගේ නිරපෙක්ෂතාව ඉතා ම ආශ්චර්‍ය්‍ය සේ හා, මෙතැන් පටන් සාරාසඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි සුදුසු සුදුසු ජාතියෙහි කරණ මහ නිනික්මණට පටන් ගත් මොහොතක් ඉතා ශුභ සේ හා ලොවට වූ අස්වසක් ඉතා මහත් සේ හා—

පඤ්චකාමයෙන් ම කළ පරිහව ඉතා මහත් සේ හා, තො වළකා ගත හැකි පඤ්චේන්‍ද්‍රියයන්ට හෙළූ අකුලක් ඉතා, කොසෙල්විය හැකි සේ හා, උද්දීපන වූ යෞවනයෙහිදු මදයක් නැති වූ බැව් ඉතා අපූර්ව සේ හා, එබඳු වූ සෞන්දර්‍ය්‍යයෙහිදු අහඞ්කාරයක් නො කළ බව ඉතා අචින්ත්‍ය සේ හා ගෘහස්ථයන්ට වුවමනා සම්පත්තියෙහි කළ ජුගුප්සාවක් ඉතා අචින්ත්‍ය සේ හා, සංසාරයෙහි දෙම දුටු පරිද්දෙන් ඉතා අතුල්‍ය සේ හා, සත්පුරුෂ ධර්මයෙහි කළ පක්ෂපාතයක් ඉතා ලොකොත්තර සේ හා, පටන් ගත් කටයුත්තෙක බුදු බැවින් වන නිමාවක් ඉතා මනොහර සේ හා, මුළු ලෝවැසියන් එකහෙලා කළ කුසල් උදා දුන් පරිදි ඉතා විචිත්‍ර සේ හා, එබඳු වූ සම්පත්තියක් හැර හුදකලාව වනයට නික්මුණාහ.

එ සමයෙහි ශක්‍ර දිව්‍යරාජතෙම මහාපුරුෂයානන් වහන්සේ මෙසේ වූ උදාරාධ්‍යාශයෙකින් මහනික්මන් කළ බැව් දැනැ විගසකම් දිව්‍යප්‍රභාවා කැඳවා "සුමේධ පණ්ඩිතයෝ සකල

1. සරහස සම්පාතයෙන් — ඇතැම්

සමාර්ධි සාරය හැර පැවිදිවෙමි යි යන අදහසින් හිමාලාගිමුඛවැ නික්මුණාහ. තෝ එතැන්හි ගොස් ඒ මහා පුරුෂයන් වසන්නට සුදුසු පණ්ණශාලාදිය මවා එව"යි සමු දුන. විශ්වකර්මතෙමේ ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ නියෝගය මුදුනෙන් පිළිගෙණ හිමාලයෙහි ඛාර්මිකා නම් පර්වතයට නුදුරු තැන්හි පණ්ණශාලාදිය මවා දිව්‍යලෝකයට ම ගියේ ය.

මහා පුරුෂයාණෝ ද ක්‍රමයෙන් වැඩ ආශ්‍රමය දුක එහි ද **"බරවිෂමතා** ය, **ඇතුළන්හි ගස් ඇති බව** ය, **ගහණයෙන් මුවා බව** ය, **ඉතා හැඟ බව** ය, **ඉතා මහන් බව** ය, **යන** පඤ්චදෝෂවර්ජිත වූ සක්මන දුක් සෙසු පැවිදිවන්නට සුදුසු පිරිකර ද දුක් වදුරා නියතයෙන් මා සේ වූ ශ්‍රමණ භාවයෙහි නිබඳ වූ අභිලාෂය ඇති මහා පුරුෂයන්හු නිසා මැවුයේ ය යි සතුටුවැ පණ්ණශාලාවට වැද **"මහ ඇඟි බව පළමුවන දෝෂ** ය, **පරා පිළිබඳ බව දෙවන දෝෂ** ය, **අනුභව කල්හි වහා කිළිටිවන බව** හා **බොළඳ යි සිය කල්හි ඇපිල්විය යුතු බව තුන්වන දෝෂ** ය **අනුභවයෙන් දිරාවන බව** හා **දිරාගිය කල්හි නැවත නිවිම් හා ගෙන්නම් නොහැකි බව** හා **සතරවන දෝෂ** ය; **නැවත සොයා ගන්නට නුපුළුවන් බව පස්වන දෝෂ** ය, **පැවිද්දනට නුසුදුසු බව සවන දෝෂ** ය, **සතුරන්ට සාධාරණ බව සත්වන දෝෂ** ය, හැඳගත් කල්හි **විභූෂන වැ තිබෙන බව** අටවන **දෝෂ** ය, ගෙණ ඇවිදිනා තැනැත්තහු **'අපිස්' නම් නොවැ 'මහෙස්' වනබව** නව වන **දෝෂ** ය යි මෙතෙක් දෝෂයන්ගෙන් යුක්ත වූ හන්සළුව හැර —

"මනා මිලක් වටනාබව ය, **අනුන් සතු නොවන බව** ය, **තමා අතින් නොමැ ගතහැකි බව** ය, පරිභෝගයෙන් **වහා නොකෙලෙසෙන බව** ය, පරිභෝගයෙන් **දිරාගිය කල්හි ගෙන්නම් නොහකටයුතු බව** ය, **සුවසේ සොයාගතහැකි බව** ය, **සොරභය නැති බව** ය, **පැවිද්දනට සරුප් බව** ය, පොරෝණ තැනැත්තවුව **විභූෂණ නොවන බව** ය, **චිවරප්‍රත්‍යයෙහි අපිස් බව** ය, පරිභෝගයට **සුව බව** ය, **ගොතාගන්නා වැහැරි සුලභ බව** ය, **නවකල්හි නිරපෙක්ෂ බව** ය" යන දෙළොස් ගුණයෙන් යුක්ත වූ වාකචීවරය පෙරවැ ප්‍රව්‍රජ්‍යා ස්වීකාර කොට යෙහෙන් පණ්ණශාලායෙහි වැසැ ප්‍රත්‍යූෂ වෙලායෙහි නැගී සිටැ තමන් වහන්සේ මහනික්මන් කළ පරිදි ප්‍රත්‍යවෙක්ෂා කොට වදරණ සේයෙක්:-

"මම පුරාණයුෂ මාත්‍රයකිනුදු ක්ෂය කොටැ ගත නො හැක්කා වූ බොහෝ ධනයෙන් යුක්ත වූ අනුරක්ත වූ ශුචි වූ දක්ෂ වූ ක්‍රමාගත වූ පරිවාර සමෘර්ධීන් යුක්ත වූ දුර්භික්ෂ නො වදනට කළාවූ මහා ශෛලදුර්ග බදුවූ බොහෝ ධන ධාන්‍යයෙන් පිරුණු කොටු ගෙවල් සියදහස් ගණනින් යුක්ත වූ නානාප්‍රකාරවූ සූක්ෂ්මවූ සුව පහස් දෙන්නාවූ සියලු ආභරණයන්ගෙන් අග්‍රාභරණය සි ප්‍රසිද්ධවූ ඒ ඒ සෘතු පරිද්දෙන් අනුභවකරන්නට සුදුසුවූ විචිත්‍ර වස්ත්‍ර විශෙෂයෙන් පිරී තිබෙන්නාවූ නොයෙක් නාණාගාරයෙන් අනූනවූ ඒ ඒ කාලයට අනුරූප කොටැ කරණු ලබන්නාවූ ගෙයි දණ්ඩකර්මානතයෙන් සිද්ධවන නානාවිධ ප්‍රයොජන විශෙෂයෙන් පරම මනොහර වූ —

නො දුරු දුරු තැන්හි[1] කරණලද විචිත්‍රවූ යානයිත් හා, ලතාමණ්ඩපයෙන් හා, වැලිමළුයෙන් හා, තන්හි තන්හි හෙන හැලි[2] සියදහසින් හා, විශෙෂ නාදයෙන් මධුරවූ කොකිලාදීන්ගේ කුලගෘහ බදුවූ මයූරයන්ගේ නෘත්‍යශාලා බදු වූ නොයෙක් ජාතියෙහි විචිත්‍ර මෘගයන්ගේ ක්‍රීඩා මණ්ඩප බදුවූ හංස චක්‍රවාක චකොර කොකඋව ජීවඤ්ජීවක කපොත පාරාපත කිර ශාරිකාදී නානාප්‍රකාර සථලචර,[3] ජලචර, පක්ෂිජාතීන්ට සැමනුම් ගන්නා තැනක් බදුවූ චම්පක ශොකාම්‍ර ගඤ්ජනී සීත ගඤ්ජ කර්ණිකාර සහකාර සාල තාල තමාල එකුල ක්‍රමුක කුරවක නාළිකෙර සන්නීර පනස ‘සන සජ්ජ’ර්ජුනාදි විවිධ තරුවර සමාකීර්ණ වූ නො එක් උසනින් මනොහර වූ පදමගහියෙන් උතුපලගහියට උතුපලගහියෙන් පදමගහියට අනවරතයෙන් දිවන්නාවූ මධුර මධු පාන මත්තවූ බමරුන්ගේ මධුර නාදයෙන් පරම රමණීය වූ

තෙරෙහි ලිය මඬුලුයෙන් දියකොල වැලිතලායෙන් රාත්‍රිඳිවයෙහි නයනොතසවාවහවූ ගෘහ දීර්ඝිකායෙන් මනොහර වූ මිහිරි කෙළිනළුයෙන් සිත්ගන්නා වූ නො වෙනස් වූ යහළු යෙහෙළියන් ගේ අනවරත සඤ්චරණයෙන් හෘදයඞ්ගම වූ සමාන කුලසීල යෞවනාභිරාම වූ පිරුණු තනහාර සෙනහයෙහි මහත් වූ පිරුණු වූ වලහ සේ අවගුණයෙහි තුනු වූ දික් වූ ඇස් සේ පුරුදු කම්හි දික් වූ රත් වූ අධර සේ අනුරාගයෙහි රකතවූ පාදයෙහි හඬන නුරාවලාහි මිහිරි රුව් සේ බස්හි මධුර වූ උකුලෙහි දුන් මණිමෙඛලා බන්ධනයෙන් සින්බඳු වූ, රුවින් ඇසට මිහරි, ගුණයෙන් සිතට මිහිරි —

---

1. නොදුරු තන්හි - ඇතැම්. 2. හෙන ඇලි - ඇතැම්.
3. ථලචර — ඇතැම්

ශරීරයෙන් ම වෙන් වූ ජීවිතයෙන් එක් වූ ඇසිපිය හිමි පමණක් කප් සියදහසක් කොටැ සිතන පැගත් අත ලිහිල් වූ පමණෙකින් ම ජීවිතයෙහි ආසාද ලිහිල් කරණ එක්වැ වසන රාත්‍රිය එක් පැයක් සේ සිතා වෙන් වූ රාත්‍රිය මූදක් සේ පිනා එතරවැ ගත නොහෙන බොළඳ කමට ම බැවෙන විදඞ්කමට ම නියැලෙන ඩබරකොටැද්ද බොහෝකලක් දුඞ්කමක් සිරකොට ගත නො හී ලැගෙන උපායක් තමන් ම සිතා ලැහි කල ඩබර මිහිරි කොටැ ලද දිවියෙහි අගහස් දී අනුභව මිහිරි කරණ අඹුවන් සියදහසින් ගැවසී ගත්තාවූ දිව්‍ය භවනයක් සේ වූ ගෙන් නික්මෙන්නෙම් දෙර හැරී ගිය අවීචිමහා නරකයෙන් නික්මෙන නරක සත්ත්වයාගේ එහි අපෙක්ෂා නැතිවැ ගියා සේ නිරපෙක්ෂවැ නැඟී ආමි.

එසේ වූ මම් දැනුත් පර්ණශාලායෙහි විසීම් තම් හේ මට දෙවැනි ගිහිගෙයි විසීමක් හා සමයැ යි සිතා "**මහාසමභාරයෙන් භවයුතු බව ය, නාණපත ය මැටි ය යන මේ ආදීන් දවස දවස පරිහරණ කළයුතු බව ය**, සෙනසුන් තම් දැය වැඩිමාල්ලන්ට පැමිණෙන බැවින් නො වේලෙහි සෙනස්නෙන් නැඟි කල්හි සිත එකඟ නොවන හෙයින් **උපසාපනීයභාව ය**, සීතොෂ්ණ දෙක ඇඟ නොගතදී **ශරීරය සියුමැලි කරවනබව ය**, **කරන්නාවූ පාපයක් ඇත මුවහ කරණ බව ය**, මාගේ මේ පර්ණ ශාලාව ය යි **මමත්වය උපදනා බව ය**, **සඤ්චිතීය භාව ය**, **සුහුණු මකුළු ආදි බොහෝ සතුන්ට සාධාරණ බව ය**" යන මෙතෙක් දෙෂයෙන් යුකත වූ පර්ණශාලාව හැර — .

මද යන්නයකින් කොටැගත හැකි බව ය, **සුලභ බව ය**, ගසින් ගිලිහී එන පරඬලා බල බලා **සුව සේ අනිත්‍ය සංඥාව මෙණෙහිකොටැ ගත හැකි බව ය**, **සයනාසන මාන්සයෑයෙන් දුරු බව ය**, **පවිකිරීමෙහි රහසක් නොවන බව ය**, **දෙවතාවන් හා එක්වැ වසන බව ය**, **මුවා හරණ බව ය**, **අනුභවයට සුව බව ය**, ගිය ගිය තැනෙක්හි ම රුක් මූලක් ලැබෙන හෙයින් **එහි තෘෂ්ණාවක් නො උපදනා බව ය**" යන දස ගුණයෙන් යුකත වූ ගස්මූලට එළඹැ මා ආහාරයක් අරුම හෙයින් මහණ වෙස් පැ සිහා අහරක් ලද මැනවැ යි පැවිදි වූ එකක්හු නොවත් ආහාරපයෙෂණ දුඃඛය ද ඉතා බොහෝ වුවා.

එහෙයින් මට අනික් අහරකින් ප්‍රයොජන නැතැ යි එ දුරු කොටැ තමාම තමහට වැටී හුණු ඵලාඵල ම ආහාර කොටැ, භිඳිනා – සිවිනා – සක්මන් කරණ – තුන් ඉරියව්වෙහි ම වීර්‍යය

අත් නොහැරී පැවිදිවූ සත්දවසක් ඇතුළත ම පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ආනාසවර[1] බ්‍රහ්මලොකයෙහි උපදනාවූ බ්‍රහ්මකුමාරයෙකු සේ ධ්‍යාන සුඛයෙන් දවස් ගෙවන සේක.

එසමයෙහි පූරිත පාරමිතාබල ප්‍රතිලබ්ධවූ ප්‍රඥා පරිණාම ඇති බුදුවන ආත්මභාවයට තුන්වන ආත්මභාවයෙහි තමන් සැළ ආශ්චර්‍ය විශෙෂයක් හෙතුකොටැගෙණ සකල මහිතලය කම්පාකරවා බොධිසත්ත්වාවස්ථායෙහි සිටි කළමනා **දිපඞ්කර** බුදුහු කවයුත්තෙහි මසතක ප්‍රාප්තවැ එසිත් සැවැ **තුසිතභවනයෙහි** ඉපිද[2] එහි ආයු වූ පරිද්දෙන් අපමණවූ පඤ්චකාම රසාස්වාදය කොටැ මතු දිව්‍යලොකයට යනු කැමැතිවැ එකල්හි රැස්වූ දසදහසක් සක්වළැ දිව්‍යබ්‍රහ්ම යන් විසින් මනුෂ්‍යලොකයට අවුත් බුදුවන පිණිස ආරාධනා කරණ ලදුවැ **පඤ්චමහාවිලොකනය** කොටැ එසිත් සැවැ මවු කුසැ පිළිසිඳැ ගෙණැ —

අද්භූතපූර්වූ[3] ලොකොත්තර පවත්වමින් දසමසක් මුළුල්ලෙහි මව්කුස්හි වැසැ දසමස් ඇවැමෙහි ප්‍රසවවැ ප්‍රතිසන්ධියෙහි වූ ලොකොත්තරවයන් පුනරුක්ත කොටැ ක්‍රමයෙන් වැඩි නවයුවති තයත මධුකර නිපෙය වූ යෙවන මකරන්ද සම්පූර්ණවූ ප්‍රභාත සමය ප්‍රබුද්ධ වූ පද්මයක් සේ ලොකානන්ද කරවැ, "**ඉම ය - ඝම් ය - වසනන ය**" යන තුන් ඍතුවට සුදුසු කොටැ කරවන ලද තුන් ප්‍රාසාදයෙහි වෙසෙමින් සන්නද්ධ නව යෙවන ඇති විදග්ධ විලාසිනින්ගේ මුඛාම්බු'ජයෙහි **රාජ හංස** වැ, ඔවුන්ගේ ම ප්‍රණය සුධා රසයට පවිත්‍ර පාත්‍රවැ ඔවුන්ගේ ම ප්‍රණය මධුර කථාඤ්ඤ නිස්සෙපත්‍රමරාවලියට විකසිත සහකාරසනාවක වැ, ඔවුන්ගේ ම බාහුලතා ශ්ලෙෂයට සුජාත පාරිජාතද්‍රුම වැ, ඔවුන්ගේ ම මන්දස්මිත කාන්ති නිමෙකයට චන්ද්‍රකාන්තපාෂාණ වැ —

ඔවුන්ගේ ම පිතසතත රාජහංසයන්ගේ සෛවර ක්‍රීඩාවට තමන්ගේ විශාල වක්ෂස ම රුචිර සරස් කොටැ බොහෝ කලක් වැසැ, අනුක්‍රමයෙන් උද්ගත යාත්‍රාගමනයෙහි බ්‍රහ්මාපණිත **ජරා - ව්‍යාධි - මෘත** නිර්මත්ත සන්දර්ශනයෙන් සඤ්ජාත උද්වෙග ඇතිවැ, ප්‍රව්‍රජිත රූප සන්දර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යායෙහි සෞතස්‍යාග වැ, **ව්‍යවකර්ණියා විසින්** සදන ලද ඔසතිසකඤ්චාධිරූඪවැ, සුවාසූදහසක් ඇතුන් විසින් පිරිවරණ ලදු වැ ප්‍රවර කුඤ්ජර සඤ්චාරොහණ චාතුරන්ත සන්දර්ශන විසම්මත විශවලොකයා **විසින්** පවත්වනලද ජය ශබ්ද සතසහස්‍රයෙන් රැව් පිළිරැව් දෙවනලද දික්චක්‍රවාල ඇති වැ උසන් වැඩැ —

1. ආනඤ්ඤර — ඇතැම් 2. ඉපදී — ඇතැම් 3. අභූත — ඇතැම්

සියලු දිවාභාගයෙහි සෙවර ක්‍රීඩා විහාරයෙන් උද්‍යානයෙහි වැසැ, සවස්වේලෙහි මහල් සලවවැ වැඩෙහිඳැ ප්‍රව්‍රජ්‍යා'නිවුඩ වූ චිත්ත ඇතිවැ, බ්‍රහ්මාපණිත **අෂ්ටපරිෂ්කාර** සඳහනයෙන් සන්තුෂ්ට වූ සිත් ඇති වැ, සම්භරණ ගළවා මහල් කඩුවෙන් ඉසකේ බහා රාජවෙශොචිත වූ හත්සළු සහළ ගළවා ශ්‍රමණවෙශොචිත වූ කාෂාය වස්ත්‍රාදි අෂ්ටපරිෂ්කාර ධරා, තමන් අනුවැ පැවිදි වූ පුරුෂ කොටියක් විසින් පිරිවරණ ලදු වැ දසමසක් මහාවීර්‍ය කොවැ සකල සම්බුදුවර ඥානාධිගම මහොත්සව නිධානවූ **වෙසක් මසැ** මැදි **පොහෝ දවස්** එළඹැ සිටි කල්හි-

භික්ෂාර්ථි වැ නගරාභ්‍යන්තරයකට වැදූ එ නුවර වැස්සන් විසින් දෙවතාවන්ට බලිකර්මාදිනත පිණිස සැසි සපයන ලද අසමහිත්‍ය **ක්ෂෙරෙය**[1] භොජනය කොටිමාත්‍ර වූ පරිවාර ශ්‍රමණයන් හා සමග පිළිගෙණැ, දෙවතාවන් විසින් ප්‍රක්ෂිප්ත ඔජස් ඇති ඒ ආහාරය එකුන් පණස් පිඬක් කොවැ වළඳා, බොධිද්‍රැම ප්‍රාන්තයෙහි විසාල වූ සාල වනයෙහි දිවාවිහාර කොවැ, සවස් වේලෙහි ගණයෙන් දුරැ වැ, සානන්ද වූ **සුනන්දයා** විසින් දෙන ලද අට මිටක් තණ ගෙණැ, පියුම්ලිබොධිද්‍රැම සම්පයට එළඹැ තණ ඇතිරිය අතුරත් ම පොළොව පළා පැනැ නැහි **වජ්‍රාසනයෙහි** අසූ රියන්[2] පමණ බොධි සකාඛයට පිට දී වැඩැ හිඳැ හිරු හස්තයට යන්නාට පළමුකොට ම ඝොර මාර විර වීර්‍යයෙන්[3] නිජ පරාක්‍රමයෙන් උන්මූලනයට පමුණුවා යාමත්‍රයා'ධිගත ඥානත්‍රය ඇතිවැ, වාසනා සහිත සකල කෙලෙශ කල්මෂ ප්‍රක්ෂාලනයෙන් විසුද්ධ වූ බුද්ධි ඇති-

සකල ලොක ඥානනිකර වූ, කරුණාකර වූ, මොහාන්ධකාර දිවාකර වූ, සුකනි සුධා නිෂේක නිසාකර වූ, ක්ෂේමඞ්කර වූ, මාර භයඞ්කර වූ **දීපඞ්කර නම් සම්‍යක්සම්බුදුවෝ** ක්‍රමයෙන් පවත්වන ලද උත්තම වූ ධම්චක්‍ර ඇති වැ, ක්‍රමයෙන් තෘෂ්ණාදාස වූ ලොව නිදාස කෙරෙමින් සියලු **සත්ත්වයාගේ** සිත්හි සද්ධර්මාඞ්කුර උන්වමින්[4] ධම් නැමැති අභය හෙරිය ලවමින් මාර විජයෝ'ත්සව ප්‍රතිලබ්ධ සද්ධර්මධවජ සම්‍යක්සම්බුදුවෝ අපගේ නුවරට වැඩිසේක" යනු අසා තත්කාලෝ'ද්භූත හර්ෂ සම්භ්‍රම ඇති උපචිත රුචිර ප්‍රවුරොප'හාර පරිගත හස්තාසම් ව ඇති වැ, ඒ සම්‍යක්සම්බුදුවන් කරා එළඹැ තත් පූර්ව'පූර්ව සම්බුරූප **සඳහනයෙන්** නිවි හිය ඇස් ඇති වැ ශකති පමණින් පූජා කොටැ, එකත්පස්වැ වැඩැ හිඳැ, අඥාත

1. ක්ෂීරභොජනය - ඇතැම්. 2. අනූරියන්.
3. ඝොරමාරවීර්‍ය ය - ඇතැම්. 4. ඉදුවමින්- ඇතැම්.

පූර්ව වූ ශ්‍රවණ නිමිත්තෙණ්ය වූ සද්ධර්ම ශ්‍රවණයෙන් නිවීගියා වූ කෙත් ඇති වැ, තමන්ගේ මනොරථයෙහි අඩු පුරා සෙට වැනි දවසට සවාමි දරුවන් පවරා නුවර ගොස්:—

උදුසනක් සේ ම නැඟී සිටැ මහාසාගරය අලළන්නවුන් සේ මහපොළොව පෙරළන්නවුන් සේ සප්තකුලපර්වතයන් එක තැනට කැටිකරන්නවුන් සේ දිව්‍යලොකයෙහි සම්පත්තිය හයා, මනුෂ්‍ය ලොකයෙහි පුරන්නවුන් සේ නාග ලොක සම්පත්තිය උපුරා තමන්ගේ නුවරෙහි නිධාන කරන්නවුන් සේ මහදන් සපයා ප්‍රබුද්ධ වූ නිලොත්පල පත්‍රයෙන් සොඅන ලද්දාවූ සුගන්ධි වූ වන්දනා'ගරු කල්කයෙන් පිරිබඳ ගන්නාලද භූමිභාග ඇති ඉස්නාලද පස්මලින් මනොහර වූ සථානා'සථානයෙහි විත්‍යාසන වූ පූර්ණඝටපඞ්ක්ති ඇති;-

සවර්ණරජතමය තාරකා විත්‍යාස මනොහර වූ යෞවන විතාන යෙන් හොබනා වූ ඒ ඒ තන්හි එල්වන ලද මුතුලැල් හා මහමල් දම් ඇති ආකාශය මැඩැ ගෙණැ නැගෙන්නා වූ කර්පූර කාලාගරු ධූපයෙන් සුවඳ වූ සහ පිරිවර බුදුරුවන වැඩැ හිඳිනට සුදුසු වූ අඛණ්ඩ ලක්ෂ්මී මණ්ඩිත වූ මණ්ඩපයක් කරවා-

ඉක්බිති අසුරයන් දැනැ තව්තිසා දෙව්නුවර වදනා **ශක්‍ර දෙවෙන්ද්‍රයා** එන පෙරමහ සඳන්නට පටන්ගත් දෙවතාවන් සේ තැන්හි තැන්හි කෙහෙල් තොරණ[1] හා පුණ්කුම්භ යොදමින් පඤ්චවර්ණ වූ ධවජ පතාකා බඳවමින් විහාරයෙහි සිටැ නුවර දක්වා වඩනා දෙ මැදහි පිළි තොරණ ලමින් ගොඩ වළ සමකෙරෙමින් සුණු කොවැ පී මුතු බදු වූ පයට සුව එළවන්නා වූ සුදු වැලි අතුරමින් වැලි මත්තෙහි පස්වණක් පැහැයෙන් හොබනා සුවඳ මල් ඉස්වමින් මහ සඳන්නට පටන් ගත්හ.

නියත විවරණ ලැබීම.

එ සමයෙහි අපගේ බුද්ධාඞ්කුරවූ **සුමෙධ තාපස සවාමි දරුවෝ** තමන් වහන්සේගේ ආශ්‍රම පදයෙන් නික්මැ සෘද්ධි බලයෙන් ආකාශයට නැඟී තාපස වෙශධර වැ සුසපිර වැ මැවී හිය විදුලියක් සේ ද බ්‍රහ්මවර්‍යාව ගෙණැ අවයව සහිතවැ හොබනා වූ දෙව් දුනු කලඹක් සේ ද සථානොචිත විත්‍යාසයෙන් එක් තැන් වැ රැස්වැ ගත් සප්තරත්නයන්ගේ ප්‍රභාසාරයක් සේ ද කාලා 'කාල විභාගයක් නො කොටැ එක් වැ හැනී ආකාශයෙන්

1, කෙහෙල් තොරණ — රඹතොරණ — ඇතැම්.

නික්මුණු විචිත්‍රවූ කුසුම කාන්ති සන්තානයක් සේ ද, කනක විචිත්‍රවූ සන්තානයෙන් සන්තානිවූ, ආකාශයෙන් නික්මුණු මෙරු වත නම් දිව්‍යගස්හු සේ ද, වෙසෙසින් දිලියෙමින් තමන්ගේ රූපශ්‍රී සඳෑනයෙන් මත්වූ ආකාශස්ථ - භූමිස්ථ දෙවතාවන්ගේ තෙත් සිත් එක පැහැර තමන් කරා හැරෙමින් —

රම්‍ය නගරවාසීන්ගේ පුරමස්තකා'කාශයෙන් වඩිමින් එනුවරැ වැස්සන් ඒ සා මහත් උත්සාහයකින් මාර්ග සංස්කරණයෙහි තත්පර වූවන් දැක්ක යුගාන්ත වාත ප්‍රහාරයෙන් ගිළිහී බස්නාවූ චන්ද්‍රමණ්ඩලයක් යේ ආකාශයෙන් බැස්ස "මේ සා මහත් උත්සාහයකින් තොස මේ මහ සඳන්නේ කාටදැ?", යි විචාරා ඔවුන් විසින්, "සුමේධපණ්ඩිතා භවිස්සති? නුඹවහන්සේ නව නොදුන වදරණ සේක් ද? අපා බැඹදෙනාගේ දෙව බලයෙන් මාර්ග ඥන සලිලධාරාසෘෂ්ටිය බී කෙලෙස පඞ්ක ඇති දීපඞ්කර නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොකයෙහි පහළ වැ අනන්‍ය සාධාරණ වූ ධර්මචක්‍ර ප්‍රවර්ත්තයෙන් විශ්ව ලොක මනස්සන්තර්පණය කෙරෙමින් පරාර්ථ සම්පාදන ව්‍යග්‍ර වැ[1] වාරිකායෙන් වඩනා සෙයෙක් අපගේ නුවරට පැමිණේසේක.

අපි ඒ සවාමි දරුවන්ගේ අනිරූපිත පූජී රූපා'මෘතා'සඞ්ගයෙන් නිවීගිය ඇස් ඇති වැ, අශ්‍රැත පූජී සද්ධර්මා'මෘත පානයෙන් සැනහී ගිය සිත් ඇති වැ, අද දවස් දන් දෙමි හ යි පවරා ඒ සවාමීන් අපගේ නුවරට වඩා එන පිණිස මේ මඟ ඉදිකරමි හ"යි දැන්වූ කල්හි 'බුදුන් වහන්සේ' ය යි යන නම ඇසුවිට ම දැන් මෙදවස් තමන් වහන්සේගේ නම ඇසූ මුළු ලොවට වත සියලු සතෙනාඟ තාක් එදවස් තමන්වහන්සේගේ ලෙහි පුරන්නාක් මෙන් නිවී සැනහී —

"මාගේ භාග්‍යයක් ඉතා මහත් සේ ය. අද මා නික්මුණු ගමනක් ඉතා යහපත් සේ ය. කන් ලද්දෙහි ඵල අද මා ලද පරිදි ඉතා සම්පූර්ණ සේ ය. ජන්මලාභ අද මා මස්තකප්‍රාප්ත කළ සේ ය, බොහෝ කලක් ජීවත්වීමෙහි අනුසස් අද මට නිශ්ශෙෂයෙන් සිද්ධ වූ සේ ය. සංසාරයෙහි නපුරු වූ බස් අසා කණට වූ බැගැහැ අද මේ එක නම ඇසීමෙන් ම නැතිවැ ගිය පරිදි ඉතා ආශ්චර්‍ය්‍ය සේ ය. බොහෝ කලක් සැඟවී සිටි දෛවය එකවිට ඉෂ්ට ඵල දෙන පිණිස සන්තානිවැ ගත් පරිදි ඉතා අපූර්‍ව සේ ය.

1. සම්පාදනාග්‍රවැ — ඇතැම්

බොහෝ කලක් පෙළඹි ආ පාපයන් කිම් හැපිලියා වැ ගිය පරිදි ඉතා විසමය සේ ය. බසෙක මිහිරෙක් මෙහොකින් වඩා කොසින් වේ ද? මෙයට වැඩි ඇසිය හැකි බසක් කොයින් සොයමෝ ද? කප් කෙළ සුවහසිනුදු 'බුද්ධ' ය යන ශබ්දය පවා දුර්ලභ ය. 'ඔහු උපන්හ. බණ වදරමින් සිටියහ. මෙතෙනට වඩිමින් සිටියහ' යනාදී වූ බස් වූකලි දුර්ලභ බව කියනු ම කිම් ද? එබදුවූ සර්වාම්-දරුවෝ අප බදුවූ දුසයන් විසින් උපස්ථාන කටයුත්තය හ.

එහෙයින් මා විසිනුදු ඔවුන් වඩනා මහ පිරිසිදු කරණ බව සුදුසු යැ"යි සිතා ඒ මනුෂ්‍යයන්ට "ඉදින් තෙපි සම්බුදු වූ සර්වාම්දරු කෙණෙකුන් වඩනා මහක් ඉදිකරහු නම් ඒ මෙහෙයට මම ත් ඇතුළත්මි. මම ද බොහෝ සමපත් හැර සසරට බිය බිල්වන් එකෙක්මි. මට ද එක් තැනක් දෙව"යි වදරා ඒ ත්‍රිපිටකයෙහි විසින් "සුමේධ පණ්ඩිතයෝ සිතූ තම් මේ සියලු ජම්බුදඹිසඟ සිතෙනාත් පාද මාත්‍රයකින් ම එක මල'ස්තක් සේ සඳ, ලන්තට පොහොසත් හ. එහෙයින් ඔවුන්ට අනුන් ඉදිකොටැ ගත නො හැකි තැනක් දෙම්හ"යි සිතා සලිල ප්‍රවාහයෙන් බිඳී වළවැ ගිය බොහෝ මඬින් පිරුණු කඳුරක් පැලා 'මෙතැන ඉදිකළ මැනැවැ'යි කි කල්හි: –

එ තැන බලා "මම මෙ තැන දිව්‍ය මඤ්ජූර කුසුම ය, සිඤ්ජූ වාර කුසුම ය, සහකාර කුසුම ය, කර්ණිකාර කුසුම ය, චන්දන චූර්ණ ය, අගරුචූර්ණ ය, යනාදීවූ විසිතුරු වසතුයෙන් පුරම් නම් ඒ මාහේ ඒක චිත්තොත්පාද මාත්‍රයකින් ම සිද්ධ වන්නේය. එතකුදු උවත් එසේ වූ සර්වාම්දරුවනට අයතනයෙන් ලඝු කොටැ මෙහෙ කරණ බව සුදුසු නො වෙයි. එසේ හෙයින් මා විසින් මාහේ ශරීරය ඔවුන්ට පුදු දුක් ගෙණැ මෙහෙ කරණ බව සුදුසුයැ"යි සිතා වදරා නිරන්තර සන්තොෂයෙන් **'මාගේ දිපඞ්කරස්වාමි ය, මාගේ දිපඞ්කර සම්බුදු ස්වාමි ය!'** යන තම අනවරතයෙන් ශ්‍රී මුඛයෙහි වක වක්‍රා[1] විදැ විදැ සිත සිතා සියලු ශරීරය පුලුන් පෙදක් සේ ආකාශයට නගා පියන පමණ මහත් වූ ප්‍රීතින් පිණ පිණා දෙ අතින් පස් හැර නෙණැ මරහු ඇසැ වැලි ගසන්නා සේ වළහි පස් ලන්නට පටන් ගත් සෙයෙක.

ඔවුන් ඒ මෙසෙ කොටැ නො නිමවන තුරු නුවර වැස්ස වුන් අතර වළඳන කල් දැන්වූ කල්හි **ප්‍රවාල සාගරයෙහි** කුළ දක්වා ගැලී ගිය සත් **රුවන්** මනමෙර සේ කර දක්වා වසා

---

1. වහ වහා — ඇතැම් — වැකි වැකි ඇතැම්

සිටි රනිඳු ගොඩවන් පැහැ බදු පැහැ ඇති තථාගතොචිත වූ වර චිවරය පෙරවැ, ශ්‍රීමත් වූ ධීමත් වූ ඥානත වූ දැනත වූ සතතුෂ්ට වූ ශිෂ්ට වූ විනීත වූ ශීලයම්පන්න වූ සමාධිසම්පන්න වූ චතුරා'ශ්‍රව ප්‍රතිපක්ෂ වූ ශීලසකඛාදී පරම මහාගුණ ගණා'න්වෙ ඡණයෙහි ප්‍රවිණ වූ අනුගීත නිජකිත්ති ශ්‍රවණ ව්‍යග්‍ර ත්‍රිභුවත ජනොපජත්‍යමාන සාධුකාර ශත සහස්‍ර ඇති ප්‍රතිසිද්ධ වූ[1] පුනර්භව ප්‍රතිසන්ධි ඇති සතර ලක්ෂයක් සඛිණාශ්‍රවයන් විසින් පිරිවරණ ලද දීපඞ්කර නම් සම්මිදරුවෝ.-

තුමූ භීතරාගී වැ විතරාගී වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ අවෙෂී වැ අවෙෂී වූ පරිවාරයෙන් යුකත වැ තුමූ අමොහී වැ අමොහී වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ ඥානත වැ ඥානත වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ දැනත වැ දැන්නතවූ පරිවාරයෙන් යුකත වැ, තුමූ විමුකත වැ විමුකත වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ එතර වැ එතර වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ ශුද්ධ වැ ශුද්ධ වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ ඵිර වැ ඵිර වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ ධිර වැ ධිර වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ කාරුණිත වැ කාරුණික වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ දකඛිණෙය්‍ය වැ දකඛිණෙය්‍ය වූ පරිවාරයෙන් යුකත වැ.-

තුමූ ආරාධනීය වැ ආරාධනීය වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ මානනීය වැ මානනීය වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ වන්දනීය වැ වන්දනීය වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ අමානී වැ අමානී වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ භාවනීය වැ භාවනීය වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ ශරණාගී වැ ශරණාගී වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ ගමභීර වැ ගමභීර වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ සමරණීය වැ සමරණීය වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ ශ්‍රමණීය වැ ශ්‍රමණීය වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ රමණීය වැ රමණීය වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ අවිසංවාද වැ අවිසංවාද වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ සුප්‍රතිපන්න වැ, සුප්‍රතිපන්න වූ පරිවාරයෙන් යුකත වැ, තුමූ සම්පූර්ණ වූ මනොරථ ඇති වැ සම්පූර්ණ වූ මනොරථ ඇති පරිවාරයෙන් යුකත වැ:-

සමුද්‍ර කුකුසියෙන් සපතරත්න උකහා මුළු ලොව ඉස්නා සේ ෂට්වර්ණ බුදුරශ්මි තාක් දශ දිග්භාගයෙහි ඉසැ ඉසැ සමසත ලොක සතනොෂ ප්‍රසව කෙරෙමින් ඉතා යුහු සුලු කොවූ, ඉහා මද නොවූ, මනොහර වූ ගමනින් 'ශ්‍රීපාදය ඔබම්හ' සි සිතා වදුළ ක්ෂණයෙහි ම වළ තැන් උස් වැ උස් තැන් සම වැ කටු පහණ

1. ප්‍රසිද්ධ වූ — ඇතැම්

හතුරු ආදී දුරු වෑ, සමතල වැ සින්කලු වන්නා වූ භූමි ප්‍රදේශ යෙන් තමාට තමා මේ නවුයෙන් ගැළවී වඩනා මග සදන්නා වූ නානා ප්‍රකාර වූ කුසුමයෙන් සියලු ලොවට විසමය එළවමින්-

මනුෂ්‍යයන්ට පැණී පැණී සිටැ පූජා කරන්නා වූ දිව්‍ය බ්‍රහ්මයන් විසින් බුද්ධානුභාවයෙන් වෙනසක් නො පැණෙන පරිද්දෙන් සම වූ මිහිරි වූ දිව්‍ය නෘත්‍ය - ගීත වාද්‍යයෙන් හා මනුෂ්‍ය නෘත්‍ය - ගීත - වාද්‍යයෙන් ද දිව්‍යලොක කුසුමයෙන් හා මනුෂ්‍ය ලොක කුසුමයෙන් ද වඩනා මාර්ගය ලොකොත්තර වූ විලාසයට පමුණුවමින් පොළොව පළාගෙණ නැගෙන්නා වූ පියුම් ගැබින් නැගී අකනිට්ඨ බඹලොව දක්වා සුවඳ සොඬා ගෙණ දිවන්නාවූ පද්ම මකරන්දයෙන් මුළු ලොව එකපාරාත් සුවඳ ගන්වමින්, නො ඇසූ විරූ නො දුටු විරූ විසමය දැක්මෙන් එකවට ම වඳනට පුදන්නට බලන්නට සිතන්නා වූ සියලු සත්ත්වයාගේ බණ්ඩයක් නැති වැ පවත්නා වූ නොයෙක් ආදර සහිත වූ පූජා විශෙෂයෙන් නිරන්තර වෙමින් සියලු සක්වළ ගැබ මැඩැ ගෙණ දිවන්නා වූ ඝට්වර්ණ වූ බුද්ධරශ්මීන් සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් සක්වළ ගැබ එකහෙලා සිත්තම් කරන්නාක් මෙන් සදමින් වඩනට පටන් ගත් සෙයෙක.

එ සමයෙහි තමන් වහන්සේට මෙහෙ කරන්නට නියම කළ තැන්හි මෙහෙ කෙරෙමින් සිටි **සුමෙධ තාපසයන්**[1] **වහන්සේ** අනිමුඛයෙහි අපරිමිත වූ බුද්ධ විලාසයෙන් අසාධාරණ වූ ලොකොත්තරවයෙන් අද්භූත වූ ප්‍රාතිහාර්‍යයෙන් අවිනන්‍ය වූ මහිමයෙන් උදාරවූ තෙජසින් අශ්‍රාන්තවූ කීර්තීන් යුක්ත වැ පෙළෙහි වඩනා සාර ලක්ෂණයක් ක්ෂීණාශ්‍රව පුත්‍රයන්ට පළමු වැ[2] සම්සා ලොක වාසින්ගේ නෙත්‍ර නැමැති නාටකයන් නටන්නා වූ රඟ මඩලක් බඳු වූ,

ඒසිතුරු රුවින් තමන් වහන්සේ පවා 'මා ත් මතු මෙසේ වූව මැනවැ' සි සිතා ලොභ කරණ පරිද්දෙන් මනොහර වූ රුවින් යුක්ත වැ වඩනා **දීපඞ්කර නම් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ** කොනාත්තයෙහි පවත් කඛාන්තය දක්වා මේ දෙ අතුරෙහි[3] හිවී ගැවසී සැරහී සිටැ ගත්තා වූ **දෙනිස් මහාපුරුෂ ලක්ෂණයෙන්** හා අසීත්‍යනුව්‍යඤ්ජනයෙන් රුවිරතර බ්‍යාම **ප්‍රභා කෙතු මාලා විලාසයෙන් ද** වෙන වෙන ම ප්‍රකාශ කරණ ලද්දා වූ අව්‍යාජ වූ

1. සුමේධ පණ්ඩිතයන් වහන්සේ, — ඇතැම්, 2. පළට වැ — ඇතැම්,
3 මෙදු තුරෙහි — ඇතැම්,

සඤ්ඤ විභ්‍රමයෙන් හොඛනා වූ වාක් විෂයාතික්‍රාන්ත වූ, උපමා විෂයා'තික්‍රාන්ත වූ, මනෝ විෂයා'තික්‍රාන්ත වූ, ලෝක විෂයා'තික්‍රාන්ත වූ, හුදෙක් බුද්ධ විෂයට ම සාධාරණ වූ සමතිස් පැරැ මන්ගේ අත් මෙහෙයට ම සුදුසු වූ දිව්‍ය බ්‍රහ්මයන්ගේ සාධුකාර යට ම සුදුසු වූ රූපය බලා වදාරා —

අහස් පොළෝ සිදුරු දෙක වසා සිටිා සතුති කරණ මල් ඉස්නා කළුවැල් දුම් ලන මල් ගත්, දද ගත්, පතාකා ගත්, නටන, වයන, හි කියන, දිව්‍ය සෙනාව මධ්‍යයෙහි ආකාශ ගඞ්ගායෙහි පඤ්චවර්ණ පද්ම මධ්‍යයෙහි පිපි සිටි සත් බුමු වූ මහා කනකා පද්මයන් සේ විශිෂ්ට ශොභා ප්‍රාප්ත වැ, මිහිකත සොල්වමින්, ඛඞ්ගඛර නටවමින්, සප්තකුට පර්වතයන් ඔවුතොවුන් හා සොර හස්වමින් **සක්වල ගල**[1] ඉපිළී හෙළවමින් මුළු ලොවට බුදු රැ පළවැ පාමින් සතුටු කළුළු උපදෙස දෙමින් ලොමු දැහැ හැපෙන්ට එකාවාර්ජ්‍ය වෙමින්,—

එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් **මහමෙර** ඉපිරෙන කොලාහලයක් සේ මහපොළොව එපිටින් එපිටට පෙරළෙන කෝලාහලයක් සේ මඩනා මහැ ඒක කොලාහල කරවමින් යොදුන් දෙ යොදුන් තුන් යොදුන් ආදී පමණ ඇති ශ්වෙතච්ඡත්‍ර හා, ශ්වෙත චාමර හා, සත්රුවන් තල්වැට හා, රන් පැන රිදී පැන හා, රන් කලස රිදී කලස හා, රන් කෙණ්ඩි රිදී කෙණ්ඩි හා, රන් කොතලා රිදී කොතලා ආදී වඩනා මඟ යොදුන් ගණන් වසා ගෙණැ යන්නා වූ දිව්‍ය මනුෂ්‍යයන් ගත්තාවූ නානා ප්‍රකාරවූ පූජොපකරණ මදාහැගෙහි නික්මැ ගත්තාවූ විසිතුරක් බලා වදාරා —

'සඤ්ඤ' යයි මා ඇසූ නමට සුදුස්සක් මා දුටු සේ ඉතා යහපත් සේ ය. ඉතා ආශ්චර්ය්‍ය සේ ය, අසාධාරණවූ සත්හුන් කමක් ඉතා ආශ්චර්ය්‍ය සේ ය. මහා සාගරය ගෝකුරක් සේ උතැහි[2] කොවැ පි ගැබුරු කමක් ඉතා ආශ්චර්ය්‍ය සේ ය. මහ මෙර පුලුන් පෙදක් සේ ලඝුකළ ගුරුත්වයක් ඉතා ආශ්චර්ය්‍ය සේ ය. දිව්‍ය බ්‍රහ්මයන් වෙරැ මල් වැසි කළ මහානුභාවකමක් ඉතා ආශ්චර්ය්‍ය සේ ය. ශක්‍ර සුයාම සන්තුසිතාදීන්ගේ සෞභාග්‍යය ඇසට අරුචි උපදවන පරිද්දෙන් සැරහි සිටි සෞන්දර්ය්‍යයක් ඉතා ආශ්චර්ය්‍ය සේ ය. මුළු තුන් ලොවක් ම මැඬැ පියා සිටි භාග්‍යයක් ඉතා මහත් සේ ය. මේ කවර කුශලයක්හුගේ ඵල ද? මෙබඳු වූ මහත්හු ලෙව්හි කී දෙනෙක් වෙද්ද? මෙසේ වූ සැනහුමෙක්

1. සක්වළ ගැබ — ඇතැම්, 2. උලැහි — උත්තානි — ඇතැම්,

ඇසට අනික් කොතැනෙක්හි ලැබේ ද? මේ කෙබඳු වූ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ප්‍රේමයෙක් භකතියෙක් පක්ෂපාත කමෙක්ද? මේ කවර අද්භූතයකට වැඩි අද්භූතයෙක් ද? මේ කෙබඳු උපමා වස්තූන්ට වැඩි උපමා වස්තුයෙක් ද? මෙබඳු වූවන්ට සුදුසු පූජා නම් කොයි ඇද්ද?

එහෙයින් මෙසේ වූ බුදුරුවනකට පූජා කරන් මාගේ ජීවිතයට වැඩි අනික් වස්තුවක් නො දකිමි. මෙබඳු වූ මේ ශ්‍රීපාදය මා පිට ගහා මේ සවාමි වැඩි දැ නම් මාගේ ජන්මය සේ සඵල වූ ජන්මයක් ලද සත්ත්වයෙණෙක් මුළු ලොවිහි නැත.

එහෙයින් මේ බදු හිම්යාණන් වඩනා පෙර මහට මාගේ ප්‍රාණයන් ම පුෂ්පාඤ්ජලි කොට බහාලා මේ මඩ අතුරෙහි මුහුණින් නැමෙන හේ වැ, සතර ලක්ෂයක්[1] කල්පාග්‍රවයන් හා මේ බුදුරජාණන් හා මා පිටින් වඩනා පරිදිදෙන් හා එයින් ම මාගේ මනොරථය මසුනක ප්‍රාප්ත කිරීමෙන් සම්පූර්ණ වූ ජන්ම ලාභ ඇතිවු වැ මැනවැ'යි සිතා වදාරා,

සළුණි පවිත මසුනකයෙහි විදු හි වැනි ගිය ඝන නීල වූ මෙඝ පටලයක් සේ නිල් වූ හිසකේ කළඹ උනා මඩ මත්තට දමා ලා අදුන් දිවි සම් වාකච්චරා'දී මඩ පිටට දමා මුහුණින් මඩෙහි හෙවැ "දැන් දැන් බුදුන්ට දිවි පුදමි" යන අදහසින් ආකාශයෙහි පියා හඬා විඩා වැ ආකාශ ගඩහායෙහි රළ මත්තෙහි නිවී සැනහි හොත් **රාජහංසයක්හු** සේ නිවී සැන හී වැදූ හොත් සේයෙක.

එදා ඒ පැ පිට සාරා සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සසරට පැ පිට ම ය. එ මඩෙහි ගැලුණු ගැල්ම සමතිස් පැරැම්හි ගැලුණු ගැල්ම ය. එබදු වූ බුදුවන්තවුන් බුදුකෙණෙකුන්ට එ වැනි පූජා නොකරත්:- අනික් කවුරු එසේ වූ පූජාවක් කෙරෙද්ද? බුදු කෙණෙකුන් ඒ පූජා පිළි නොගණුත්:- අනික් කවුරු එසේ වූ පූජාවක් පිළිගණිද්ද? මා පිණැති කල මා තුඩෙහි බුදු ගුණ වැකුණු මතා කල, මා සිතට ද මේ නියා සැනහුමක් වූවමනා කල, මා කියන බණ ඇසුවනුදු මා දිසාවට වැඳැ වැඳැ ඇසුව මනා කල, තමන්ගේ ගුණ හි පමණින් මාසේ වූවනුදු **ඛීණාසවභික්ෂූන්** කෙරෙහි ඇතුළත් වූව මනා කල, ඔහු එසේ වැඩහොත් වූ ල බුදුනට දිවි පුදු ලය බිම් ගහා:-

1. සාර ලක්ෂයක් — ඇත.ම්

මුහුණින් හොත්තවුන් තමා ළඟ බිම ගහා වැදූ කොසැන හෙනු ළ දැඩි කමෙහි නිමාමෙක. එබදු වූවන් සිහි කරන් දුකෙක් නම් ලගේ ද? සුවයෙක් නම් දුරු වේ ද? සතුරෝ නම් ඇති වෙද් ද? මිතුරෝ නම් නැති වෙත් ද? ඒ දවස් දිව්‍ය ලොකයෙහි හා උතුරුකුරු දිවැ ඇති වූ සියලු කප්රුක් ඔහුගේ ගෙදොරැ නො වෙද්ද? ඔවුන් වඳිම්! ඔහු පෙරළා වැන්දේ තුමූ අමාමහ නිවන් නො දකිද්ද? සසර පමණකට මෙතෙක් පිටිවහල් මද ද? නිවන් යක්නට මෙතෙක් පලාඛත් නො හැමීමේ ද?

ඒ හෙයින් මා සිත ඇති පක්ෂපාතයෙන් – මා සිත ඇති සෙනහයෙන් – මා සිත ඇති භක්තින් – ඒ දවස් ඒ කළල් පිටැ වැදූ හොත් ඒ මාගේ සුමෙධ කාපස සඞ්ඝරාජයන්ගේ ශ්‍රී පාද පදම මා මුදුනෙහි තබා දුදු වඳිම්. මෙ මා කළ භකති සෙනහයෙන් ම කළ සහනාකාබිඛි භාගය වී නම් එයින් ම මා හා, මේ දුක් ගන්නා සත්ත්වයන් හා, මාගේ සඞ්ගයන් හා, අනන්නා'පරිමාණ සක්වළ සත්ත්වයන් තුමූ[1] නිදුක් නිරෝගි සුවපත් වමෝ ව සි!

එදා, ඒ ඔඬැපිටැ වැදූ හොත් දවස් පටන්ගෙණ පිරිනිවන් පානට කුසිනාරා යමහලැ[2] වැඩ හෝතා දවස් දක්වා මෙ අතුරෙහි ඔවුන් කළා වූ අචින්ත්‍ය වූ සඳ්ධම් කම්යෙහි අනුභසින් මේ භඬන සත්ත්වයා තුබැ තුබැ සාධුකාර වැකෙන්නා අසම්ව සි! ඔවුන් ඇසින් වැහෙන දළ සෝ කදුළු සතුටු කදුළු බවට පෙරළෙන්නා මා ඇස් පුරා දකිම්ව සි! ඒ බුදුරුවම දුටු ඒ සුමෙධ කාපසයන්ට වූ සතුටෘ තමන්ගේ ගෙදොරැ මිදුල නැදුයන් යෙහෙන් දුටු සත්ත්වයන්ට ද වාසනා වේව සි! මම ද කලඛකයක් නැත්තා වූ මේ බුද්ධ ඥන ප්‍රසාදයෙන් මෙ කෙණෙහි පටන් නිවන් දක්නා ක්ෂණය දක්වා ඔවුන්ගේ තම ම සිහි කිරීමෙන් නිවී සැනහී සියලු ඉෂ්ටාර්ථ සිදුසියට පැමිණෙම්වා!!

එසේ බුදු රැවනාව දිවි පුදා වැදූ හොත්තාවූ ඒ සඞ්ඝ දරුවානෝ "ඉදින් මම සිතුයෙම් විම් නම් මෙතැනින් ම රාග වෙෂාදී වූ පාප ධර්මයන් නසා ක්ෂීණාශ්‍රව වැ මේ සවිඤ්ඤයන් වහන්සේ පිරිවරා වඩිනා සාර ලක්ෂයක් ක්ෂීණාශ්‍රවයන්ට සඞ්ඝ නවකවැ අග්‍ර දක්ෂිණෙය්‍ය වැ ඒ භික්ෂූන් වහන්සේ හා කැටිවැ ම රම්‍ය නම් නුවරට වදනට සමර්ථයෙමි. මේ නිවනට මෙසේ සොරා වදනා බව මා සේ වූ එකක්හට සුදුසු නොවෙසි.

---

1. මූ — ඇතැම්. 2. යමඛසලැ — ඇතැම්.
3. සතුටු — ඇතැම්.

මම හුදකලාවෑ සසරින් ගැලවී මෙතෙක් සතුන් දුක් ගද්දී අමාමහ නිවනට වනිම් නම් මා සේ නිෂ්කාරුණිකයෝ ඇද්ද? මා සේ ළඳුන්යෝ ඇද්ද? මා සේ පරාර්ථයෙහි පිරිමි[1] වියෝ ඇද්ද? මා සේ ආත්ම සෙහෙයට ගැනිවූවෝ ඇද්ද? මා සේ දීඝී දර්ශී නොවන්නෝ ඇද්ද? මා සේ තමා දරුවන්ට වළහා අමා වළඳනෝ ඇද්ද? මා සේ ලෝවැස්සා විඳින දුකට නොදත්වත්වූවෝ ඇද්ද? මා සේ ගිනිගත් ගෙයි දන දරුවන් නො බලා තමා ම ගළවා ගෙණෑ[2] දිවන මවුපියෝ ඇද්ද? මා සේ තමා කුස රක්නා පිණිස මහසෑයෙහි දරුවන් මස් කැවෝ ඇද්ද?

"නිවන් වැනි මිහිරෙක් ල! සසර වැනි දුක් පත් කැනෙක් ල! මා වැනි වීර පුරුෂයෙක් ල! මෙබඳු වූ මම එසේ මිහිරි නිවන් මේ දුක් පත් සතුන් හැර හුදකලාව වළඳම් ල! මෙ බඳු නො වියත් කමෙක් මෙබඳු අවිරත්‍යෙයෙක් මෙබඳු අගුරුබ්‍යෙයෙක් ම බඳු වූවක් හට සුදුසු නො වෙයි. එහෙයින් මා ඕඝිතුදු මේ සම්බුදුන් සේ ම සම්බුදුභාවයට පැමිණෑ ව්‍යසන මහාසාගරයෙහි නිමග්නවූ මේ සත්ත්ව ලොකයා ගළවා ගෙණෑ ඔවුන් හා කැටිවෑ ම මේ නිවන් රස විඳිනා බව සුදුසුයැ"යි සිතා —

"මිනිස් බව ය, පිරිමිබව ය - පෙරමෝ රහත්වන්නට කුසල් ඇති බව ය, බුදුන්ගේ දැක්ම ය, පැවිදිවීම ය, ඛ්‍යානා'භිඥාදි ගුණ සම්පත්තිය ය, බුදුන්ට දිවි පිදූ බව ය, බුද්ධත්වයෙහි අද හස ය" යන අෂ්ට ධර්ම සමොධානයෙන් සංසිද්ධ වන්නාවූ මනොරථ ඇති වෑ "ලෝ මුදම්" යන අභිප්‍රායයෙන් "බුදු වෙම්" යන දළහ ගහණින් - එදා තමන් වැඳ ඔත් - ඒ උදුර අධ්‍යාශය අද මා ලවා මෙසේ කියවා පියන රිස්සෙන් මෙන් මා කෙරෙහි ම කළ අනුග්‍රහයෙන් සාරාසඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි තිබී මුහුකුරණ මහාකරුණාව තමන් සිත්හි පිළිසිඳෑ ගණුත් බුදු බැව් වැනි මිහිරකට දෙළ ගෙණෑ වැදුහොත් මාගේ සුමෙධ තාපස සැමියනි! ලෝකයෙහි පිරිමි නම් තෙපි ම ය.

පරාර්ථයෙහි සන්නද්ධවූවා නමුත් තෙපි ම ය. සසර නො බැවූවා නමුත් තෙපි ම ය. කරුණා ඇත්තන්ට අගතැන් පත්වූවා නමුත් තෙපි ම ය. පරදුඃඛයෙහි දුඃඛිතවූවා නමුත් තෙපි ම ය. නිෂ්කාරුණයෙහි කරුණා ඇත්තා නමුත් තෙපි ම ය. ආත්ම සුඛයෙහි අරුචි කළා නමුත් තෙපි ම ය. මුළුලොවට ආභරණ වූවා නමුත් තෙපි ම ය. සද්ධර්මයට ජය ඛවජවූවා නමුත් තෙපි

1. පිරිවම්යෝ — පිරිම්යෝ — පිරිමි බුවෝ — ඇතැම්.
2 ගැලවී ගෙණ — ඇතැම් 3. පොරවම — ඇතැම්

ම ය. මුළුලොව තමහට ගැනීකළ තෘෂ්ණාව තොපට ගැනීකළා කමුත් තෙපි ම ය. නිර්වාණයට මහවත් හසන්නට[1] පටන් ගත්තාත් තෙපි ම ය.

සසර සයුරෙහි එලෙන්නට පටන් ගත්තා ත් තෙපි ම ය. සමනිස් පැරැමට කුල දෙවි වූවා ත් තෙපි ම ය. දෙසැට දෘෂ්ටියට විෂලන්නට පටන් ගත්තා ත් තෙපි ම ය. මාරසේනාවට හකුල් හෙළන්නට පටන් ගත්තා ත් තෙපි ම ය. මරහු මුහුණ දැලිහාන්නට පටන් ගත්තා ත් තෙපි ම ය. තෘෂ්ණාවට ගබ්සා බෙහෙත් දෙන්නට පටන් ගත්තා ත් තෙපි ම ය. සත්ත්වානුග්‍රහ විද්‍යාවට ආචාර්‍ය්‍ය කමට පටන් ගත්තා ත් තෙපි ම ය. බුද්ධ පරම්පරාව පිරි නො හෙළන්නට පටන් ගත්තා ත් තෙපි ම ය.

ලෝකයෙහි සත්පුරුෂයන් හා එක්වූවෝ නම් තොප හා එක්වූවෝ ම ය. ලෝකයෙහි සවාමිදරුවන් ලද්දේ නම් තොපට ගැනිවූවෝ ම ය. අප සේ තොප වැනි පියන් ලද්දේ නැත. අප සේ තොප වැනි මව්වුන් ලද්දේ නැත. තොප සේ කටයුත්තක් කරම්හ යි සිතුවෝ නැත. තොප සේ මරහු ලන ඉන්ද්‍රජාලය බොරුබව දුටුවෝ නැත. තොප සේ ලෝ වැස්සන් ඇසැ වැකුණු දළ සෝ කඳුළු පිස්නට නො හැකිලී පටන් ගත්තෝ නැත. තොප සේ සසර මහගිම්න් නැවුතු ලොව ශ්‍රීපාද සෙවන ලා සතපන්නට සිතුවෝ නැත. තොප සේ මුළුලොවට මිහිරක් දෙන්නට පටන් ගත්තෝ නැත. තොප සේ නිරා දුකට පොවා සිහිල්වැ සිටි හෙල්මැලි කළඹෙක් නැත. තොප සේ ලෝ වැස්සාගේ සිත්හි වූ කෙලෙශ නැමැති අසුවි සෝධන්නට පටන් ගත්තෝ නැත.

කප් දහසක් ජීවත් වන්නමෝ නමුදු තොප සිහි නො කරමෝ නම් ඒ ජීවිතය අපට ව්‍යර්ථ ය. අපට අසුරක් ගසන කලුදු තොප සිහි නොකොටැ ජීවත්වමෝ නම් ඒ අපට කප් ලක්ෂයක් හා සම ය. බස් නම් තොපගේ ගුණ කී බස. සිත් නම් තොප සිතූ සිත. සසරට සැක නැත්තෝ නම් තොප ගැත්තෝය. යෙහෙන් නිදන්නෝ නම් තොප නම කණ හෙළ හෙළා නිදන්නෝය. ලොව නුමුළා වූවෝ නම් තොප ගේ ශිෂ්‍යයෝ ම ය.

තොපගේ මේ චරිත සිහිකළ විට ම ලෙහි සෝක නිවී ගියේය. අවීචි මහානරකයෙන් ගිලිහි සවන පරනිර්මිත වස වර්ති දිව්‍ය ලොකයෙහි ඉපිදූ ගිය සත්ත්වයාට වත සතුටට වඩා තොප නම සිහි කළ මට වත සතුට ශත සහස්‍ර ගුණයෙන් වඩනේය. මේ සත්ත්වලොකය[2] තොපගේ ගුණයෙන් වඩනේය.

1. ගසන්නට — ඇතැම්. 2. මේ සත්ව ලෝකයෙහි — ඇතැම්

මේ සත්ත්ව ලොකයා සෙසු නොපමේ ගුණ සිහි කරන්නා තබා මේ එක ගුණය ම සිහිකොට අමාමහ නිවන් දකිත්වයි! නිවන් දක්නා දෙ අතුරෙහි නිදුක් නිරෝගි සුවපත් වෙත්වයි! නොපමේ ගුණයෙහි අනුසසින් ම මා පැතූ මේ ප්‍රාර්ථනාව සිද්ධවේවා!

ඉක්බිති මෙසේ මේ සවාමිදරුවන් බුදුබවට පතා හොත් සමයෙහි අද දක්වා තමන් සිහි කළ මා සිත අමා නමමින් වඩනා **දීපඞ්කර නම්වූ සවාමිදරුවෝ** ක්‍රමයෙන් වැඩෑ කළල් පිවෑ වැඩෑ හොත් **මහාපුරුෂයාණන්** දුටහ. **මහාපුරුෂයා නෝ ද** ඔවුන් දුටහ. බුදු කෙණෙකුන් සිවෑ බොධිසත්ත්ව කෙණෙකුන් බලත්-බොධිසත්ත්ව කෙණෙකුන් හෙවෑ බුදු කෙණෙකුන් බලත්-දෙදෙනාට වූ සොම්නස් කෙපැලැහිවි[1] හා?

හිස් දෙරැ වැඩෑ සිටි ඒ සවාමිදරුවෝ බුදු බෑඹි පතා හොත්තාවූ **ඒ සවාමිදරුවානන්ගේ** මනොරථය සිද්ධවහා පරිදි දූකෑ පස්සෙහි වඩනා පරිවාර භික්ෂූන් වහන්සේ කැඳවා, වැඩෑ හොත් සවාමිදරුවන් පැලා අසා සිටි මුළු තුන්ලොව සත්ත්වයන් කන්හි අමා නමමින්, "මහණෙනි! මේ කළල් පිවෑ හොත් මහා පුරුෂතෙම සාධාරණ එකෙකෑ යි නොසිතව්! මුළු සත්ලොව **එකහෙළා රස විඳෑ නො නිමා ගත හැකි අමා පිඬෙකි. ජාති** හෙදයෙන් අනන්තවූ සත්ත්වයන්ව එකහෙළා මවුපිය තනතුරෙහි සිටි **මහාත්මයෙකෑ,** මුළු ලෝවැසියන් තමන් තමන්ගේ නුවණ පමණින් ගණුත් නො අඩුවන ගුණ රුවන් පිරුණු **මහානිධාන යෙකෑ.** තුන් ලොවට එකහෙළා සැරහී සිටි **භූෂණ කාරක** වූ **ආභරණයෙකෑ.** තුන් ලොවට දහම් අමා මහ ගඟ හෙළන **තපස්වි වෙශධාරිවූ පවිතරාජයෙකෑ.**

"අනුවාත-ප්‍රතිවාත විභාග නොකොටෑ මුළුලෙව්හි අමා බස්නාවූ දසබල ගුණ නැමැති දසවිධ සුගන්ධයෙන් යුක්තවන **ජඹතම ගන්ධමාදන පවිතයෙකෑ.** නාලොව දක්වා මුල් බස්නා අකනිටා බඹලොව දක්වා දලු ලත සසර මුළුල්ලෙහි පතල අතුපතර ඇති සත් ගුණ නැමැති මහාකල්පවෘක්ෂය හට ගන්නට මේ මඬෙහිදු උන්දෑලූ බිම්වමෙකෑ. සාරාසඞ්ඛ්‍ය **කල්පලක්ෂයක්** මුළුල්ලෙහි අද මෙ පිපි වණින් ම නොමලා ගුණ සුවඳ පවත්වන **බොධිසත්ත්ව කුසුමයෙකෑ.** අද අපට මේ පෑ පිවින් ම තමාට වැඩක් කරම්හ යි සිතව පෑ හොත් **මහාකාරුණ්ණයෙකෑ.** අද මේ කළල ගැළී නිළුටු වූ මේ ශරීරය මතු දෙනිස් මහාපුරුෂ ලක්ෂණයෙහි ගැළී අසාධාරණශ්‍රියට නිධාන වන්නේ ය."

1. සෙ පැළඹිවිය — ඇතැම්.

"අද මේ සසර නැමැති විෂවෘක්ෂය පල කොඟන්නට ගැසූ මඩු **කඩුමඩිඤ්ඤෑ**. අද අප මේ මඬින් එතර කරන්නට හොත් මේ මහපුරුෂයා මුළුලොව සංසාර නැමැති පඬික දුර්ගයෙන් එතර කරන්ට ලූ **මහෘහඤ්ඤෑ**. අද මේ බුදුන් දිසාවට ලා හොත් හිස මතු අන්ලෝ[1] මුදුන් වන්නට **පෙහෙඬ්ගෙණෑ** හොත් හිසෙඤ්ඤෑ. අද මේ බුදුන්ට කළ මේ **ජීවිත පරිත්‍යාගය** සසර පමණින් කරණ **පඤ්චමහාපරිත්‍යාගයට ප්‍රඥාඩිනා** වෙඤ්ඤෑ; අද මේ ගත් තාපස වෙශය මතු ගන්නාවූ බුද්ධවෙශ යට බැඳලූ **සැරයමෙඤ්ඤෑ**.[2] අද අප පාමුල්හි වැදි වැදීම මතු මුළුලොව තමන් පා මුල වඳනට ශ්‍රමකරවා උගන්වන්නට වැදි වැඳිමෙඤ්ඤෑ."

"මුළුකලඬිනි මෙවැන්නෝ නො ලැබෙති. මුළුලොවක් සකාථ කරත් මෙබඳුවූවෝ එක්කෙණෙක් ම පමණය හ. මතු තමන්ගේ ආශවසඬ්යෙහි සැලී විඛාවන මහපොළොව අදම නිවා සනහා සිප ගෙණ හොත් යෙණෙකුන් වැන්නහ. එහෙයින් මොහු සාරසඬ්ඛ්‍ය කල්ප ලක්ෂයක්හි මත්තෙහි සකල වසතු විපුල වූ **කපිලවඤතු** නම් මහානුවර ගැරැ පිත පයොධරවූ ශ්‍රොණිධරවූ **යසොධරාදෙවින්** කෙරෙහි නිරපෙක්ෂවැ ප්‍රෙම බහුලවූ **රාහුල කුමාරයන්** කෙරෙහි නිඃසඬහවැ රුචිර ගති කනතා' මඬර **කඤඤා'හිඛාන** හයවරා'ඛිරුඪවැ අවඡන්න පක්ෂපාත **ජනනා'මාත්‍ය** සහාය වැ **මහාභිනිඃක්‍රමණය** කොටැ නොපව **සක්විති** රජය ලැබෙයි නො යව"යි කියා වළකන මරහු හැ කුවි කුවිල **කවාක්ෂ** නික්ෂෙප මාත්‍රයකින් ම නිර්භාෂිත[3] කොටැ ජාත්‍යනතරයෙහි සහවර වූ විතිවතන චිතන විකාර ඇති **සවිකාර මහාබ්‍රහෙමා'පණ්ඩිත** විශිෂටා'**ෂටපරිෂකාර** සවිකාර පූජීඞ්ගම වැ මහණ වැ සාවුරුද්දක් **මහාවියඃයය** කොටැ.

අනතයෙහි ප්‍රවල බාල ප්‍රවාලා'**ජපාලමූල** ගතවැ උභය කුල **සුජාත සුජාතාභිඛාන** වනිතා කර කමලොපණීතා'සමඞ්ගත පාඨාසා'නන්න ප්‍රතිග්‍රහණ පූජිකවැ ජලාවගාහා'යාත නව යුවති පිතසනත මර්දන ජර්ජරිත **නෙරඤ්ජරා** නදී තීරයට පැමිණැ සෙවරාවගාහණාගත ශරීර කලමථ ඇති වැ නැගී එකුන් පණස් පිඬක් වළඳ පාත්‍රය ගඞ්ගාවෙහි හැරැ උඩු හොයව යන පාත්‍රයෙන් ම තමනුදු තෘෂණා ප්‍රවාහයව අනුනොවැ එදවස් ම උඩු හෝ බලා යන බව නියත කොටැ.

---

1. අනවලෝ — ඇතැම්
2. සැරඤ්ඤමඞ්ඛ — ඇතැම්
3. නිර්භාසිත — ඇතැම්,

කුසුමා'මොද මුදිත මඤ්ජු සිඤ්ජිත[1] මධුකර නිකර නිරන්තර පාවන සාලවනෑ ප්‍රවිෂටවැ ඒ සාල වෘක්ෂයන් විසින් විකසිත කුසුම තෙත්‍ර දල්වා බලන ලද්දක් මෙන් දිවා විහාර කොටැ සවසැ දෙවි යන් සැදූ මඤ්ඩපයට එළඹැ ප්‍රදක්ෂිණා කොටැ වජ්‍ර සනයෙහි වැඩැ හිඳැ ප්‍රබලා'හඞ්කාර පුරස්සරවැ විජිගීෂා සමුප සහිතවූ **වසවර්තිමාරයා** අවසවර්ති කොටැ ලුහු බඳවා විදූන්‍ර යා'ධිගමයෙන් යාමත්‍රය ය සනාථ කොටැ ඛාදඝාඛග **ප්‍රතිත්‍ය සමුත්පාද** ප්‍රත්‍යවෙක්ෂා ක්ෂණයෙහි තමන් එකී එකී අඞ්ගය ප්‍රත්‍යවෙක්ෂා කළ විසමයට දෙළොස් විවෙක මහපොළොව ලවා සාධුකාර දෙවා අරුණොදය හා කැවිව ම **සච්ඡ** ඤාණොදයෙන් බුදුවෙති.''

''ඒ ජාතියෙහි මොවුන් වදන මැණියෝ – නම්හි මුත්, සිත්හි මායාවක් නැති **මහාමායා** නම් බිසෝ කෙණෙකැ. පියාතෝ සකල ලොක දුඃඛ විනොදනය කරණ **සුදොධාදන** නම් මහාරජාන කෙණෙකැ. තුමූ නම්න් ලොකොත්තර වූ **ගොතම** නම් වන්නාහ. කෙලෙශ විකාරයෙන් අවලිතවූ සංසාර ව්‍යසනයෙහි අනාකුලවූ **කොලිත** නම් එක් අගසව් කෙණෙකැ. ජින ශාසනාකාශයෙහි උදාකළ ප්‍රභාසවරවූ **පුෂ්‍ය** නම් නක්ෂත්‍ර තාරකාව වැනි **උපතිෂ්‍ය** නම් එක් අගසව් කෙණෙකැ. සමරණ මාත්‍රයකින්ම ලෝකා'නන්ද එළවන **ආනන්ද** නම් උපසථායක කෙණෙකැ. සකල ලොක ක්ෂෙමඞ්කාර වූ **ක්ෂෙමා** නම් එක් අගසව් මෙහෙණනී කෙණෙකැ. රාග වෙෂාදී පාප ධම්යෙන් අවිවණ්වූ සිත් ඇති **උත්පල වණ්ණා** නම් එක් අගසව් මෙහෙණනි කෙණෙකැ.''

''හිදැ බුදුවන්නේ – සියලු ලෝකයාගේ අවසථාව දුරුකරණ **අඤ්ඤ** වෘක්ෂ මූලයෙකැ. එහෙයින් ම මේ **මහා පුරුෂ** තෙම අපගේ පයින් මැඩැ හැකි පිටක් ඇති එකෙක් නොවෙයි. හුදෙක් අප ඇවැමෙන් මුළුලෝ රක්නෝ **කවුරුදෝහෝ** යි සිතන්නාවූ අපගේ මනොරථය මසනක ප්‍රාප්ත කළ **මහාපුරුෂයාට** අපත් පූජා කරණ බව සුදුසු ය'' යි මතු උන් ලබන අඤා'ඞ්ග මානියේ ගණනින් ම අට මිටක් මල් පුදා මතු ඔවුන් ඒ බෝ රුක පැදකුණු කරණ පරිදිදෙන් ම තමන් වහන්සේ ද ඒ **මහා පුරුෂ** යානන් පැදකුණු කොටැ නික්මුණු සෙයෙක.

බුදුබව නම් මෙසේ මාහැගි දෙයක් වත්[2] නව සමනිස් පෙරැම් නො සොයා **පඤ්චමහාපරිත්‍යාගයෙහි** නම් නොදුනා, **නිර්ඛ අප්‍රමෙයඃය** යන ඔසකුත් මුවෙහි නොවකා, 'බුදුවෙමි'

1. මඤ්ජු සිඤ්ජිත — ඇතැම්. 2. වත — ඇතැම්.

ඔත සිත සිතූ මාත්‍රයෙකින් ම තුන් ලොවින් පූජා ලබන්නෝ තුමූ සඞඝස්‍යාගෙන් මල් පුදූ පැදකුණු කොටැ වසිත්ල. එදා පොවා බුදුන් අතින් අට මිටක් මලින් පූජා ලද්දවුන්ට අද බුදුවූ සමයෙහි තමා අතින් එක මිටක් මල් පුදූ සංසාර ව්‍යසනයෙන් ගැලවී නිවී සැනහෙනු සත්පුරුෂයන්ට උතුම් ධර්මයෙකැ.

එහෙයින් මේ බුදුහු ඔවුන්ට කළ පූජාව අනවරතයෙන් ම සිහිකොටැ මා විසින් ඒ සවාමිදරුවානන්ට කළ සතුති හා පූජාවෙහි අනුසසින් ඒ බුදුන්ගේ මුහුණ දුටු බොධිසත්ත්වයන්ගේ මුහුණ සේ ද, ඒ බොධිසත්ත්වයන්ගේ මුහුණ දුටු ඒ බුදුන්ගේ මුහුණ සේ ද, ඔවුනොවුන් දුටු සියලු සත්ත්වයාගේ ද මුහුණ සතුටු වේවයි! ඒ බුදුන් වහන්සේගේ අයින් විවරණ පතුල් ලද ඒ බොධිසත්ත්වයන්ගේ මනොරථය ඉක්‍යාය ප්‍රාප්ත වූවා සේ ම මා ඇතුළුවූ අනන්නා'පරිමාණ සියලු සත්ත්වයන්ගේ මනොරථය මසාකප්‍රාප්ත වේව යි!

මෙසේ ඒ දීපඞ්කර සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් මල් පුදූ වැඩිකල්හි පස්සෙහි වඩනා සතර ලක්ෂයක් ක්ෂීණාශ්‍රවයන්වහන්සේ වෙන වෙන ම තමන් වහන්සේ අතින් මල් පුදූ පැදකුණු කොටැ වැඩිසෙයෙක. එ තැනට රැස්වූ සියලු දිව්‍ය බ්‍රහ්මයෝ ද, නානාප්‍රකාරවූ පූජා පැවැත්වූහ. මෙසේ වඩනා සළිඳුයන් දශීත විෂය ඉක්ම ගිය කල්හි වැඩැහොත් මහාපුරුෂයානන්වහන්සේ බුදුන් වහන්සේ ඇතුළු වූ සියලු සත්ත්වයා තමන් වහන්සේට පූජා පිණිස දැමූ මල් ඇතිරිය මත්තෙහි පලක් බැඳැ වැඩහුන් සෙයෙක.

දෙවියන්ගේ සතුති. මෙසේ මහාබොධි සත්ත්වයන් පළක් බැඳැ වැඩැ හිදිනා ක්ෂණයෙහි ම සවාමිනි! තෙපි එකානතයෙන් බුදුවව! පෙර බොධිසත්ත්වයන් පළක් බඳැ වැඩ හිදිනා වේලෙහි යම් යම් ශුභ නිමිත්තයෙක් පැණේ නම් ඒ හැම දැන් එක පැහැරැ පැමිණෙන්නට වන් පරිදි බලාවදරණුව.

නුඹවහන්සේගේ ගුණානුභාවයෙන් දස දහසක් සක්වළ මුළුල්ල අතිසීත නොවැ අත්‍යුෂ්ණ නොවැ වසනත සමයෙහි ප්‍රභාත වේලාව සේ සත්ත්වයාගේ ශරීරයට හා සිතට සුව දෙන සම සෘතු ඇතිවූ පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේ බුදුවන සමයෙහි බණ වදාරණ කල්හි දස දහසක් සක්වළ සත්ත්වයන් නිශ්ශබ්ද වැ නිරාකුල වැ අසන බවට පූර්ව නිමිත්ත පාණා සේ දැනුදු එක පැහැරැ නිශ්ශබ්ද වැ නිරාකුල වැ සිටි පරිදි බලා වදාළ මැනව."

මතු බුඩ වහන්සේ බුදුවන දවස් එ වේලෙහි රාග චෙෂා' දිවූ පාප ධර්මයන් ප්‍රවණඩ වැ නො පවත්නා සේ දැන් බුඩ-මේ විවරණ පතුල් ලන් මඩගලයෙහි ප්‍රවණඩ වාත නො හමන පරිදි බලා වදුළ මැනව. බුඩ වහන්සේගේ බුදොනපාදයෙහි තාෂණා ශ්‍රොතස සහාවයාගේ චිතත තැමැති සාගරයට නො වදින පරිද්දව පූර්ව නිමිතත පාණා සේ මේ මහා ගඩගාවන් මහා සමුද්‍රයට යන ගමන් හැරැ පියා නො සෙල්වී සිටිනා සේ බලා වදුළ මැනව. මතු බුඩ වහන්සේගේ සියලු දවස්හි දියෙහි ද ගොඩෙහි ද ශ්‍රී ශරීර රශ්මීන් විදහි යන්නා සේ දියෙහි ගොඩෙහි අතුරු සිදුරු නැතිවැ නානා ප්‍රකාර කුසුමයන් පිපී වැනී ගිය පරිදි බලා වදුළ මැනව. බුඩ වහන්සේගේ දවස්හි කෘතා'ධිකාර සත්ත්වයන්ගේ සිත්හි ලොකොතතර මාර්ග ඵල ගන්නට පූර්ව නිමිතතා පාණා සේ සියලු ඵල ගන්නාවූ වෘෂයන් නො වැළකී ඵල ගන් පරිදි බලා වදුළ මැනව."

"මතු බුඩ වහන්සේගේ ප්‍රාදුර්භාවයෙහි සපතබොදධ්‍ය'ඩග රන්නයන්ගේ උප්පලවීම මෙසේ වන්නේයැ යි දක්වන්නා සේ ආකාෂසථ භූමිසථ සකල රතනයන් එක පැහැරැ උපන වූ පරිදි බලා වදුළ මැනව. බුඩ වහන්සේ බුදු වැ එක පැහැරැ දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි ධර්ම විජය හෙරි ලවන බවට පූර්ව නිමිතත පාණා සේ එක පැහැරැ දිව්‍ය ලොකයෙහි දිව්‍යහෙරි හා මනුෂ්‍ය ලොකයෙහි මනුෂ්‍ය හෙරි තමා ම තමහට ශබ්ද පවත්වන පරිදි බලා වදුළ මැනව. සඟමින්ගේ බුදධ මඩගලයෙහි වස්තව අද ම ශ්‍රමකරන්නා සේ ආකාශයෙන් දිව්‍ය කුසුමයන් වස්නා පරිදි බලා වදුළ මැනව. බුඩ වහන්සේගේ ජාතිමහොනෂවයෙහි විසමයයෙන් මුළුලෝ වැසියන් සිත් ඉපිළහෙන පරිද්දට පූර්ව නිමිතත පාණා සේ දස දහසක් සක්වළ එක පැහැරැ වෙවුල්වන පරිදි බලා වදුළ මැනව."

"බුඩ වහන්සේ පහළවන ක්‍ෂණයෙහි මිථ්‍යාදෘෂටි ගත්තවුන් උඩුතවැ සැලෙන සැලුම් හැරැ පියා විනීත වන්නා සේ මහා සාගරය තරඩග විකෂොභයෙන් උඩුතවැ සැලෙන සැලුම් හැරැ පියා නිශ්චලවැ තුබූ පරිදි බලා වදුළ මැනව. බුඩ වහන්සේගේ ධර්මය අසූ සත්ත්වයන්ගේ චිතත සනතානයෙහි රාග චෙෂාදී පාප ධර්ම නැමැති වහ්නි සකඛයන් නිවෙන බවට පූර්ව නිමිතත පාණා සේ දස දහසක් සක්වළ සියලු නරකයෙහි ගිනි එක පැහැරැ නිවී ගිය පරිදි බලා වදුළ මැනව. බුඩ වහන්සේගේ මෛතී බලයෙන් අනෙයා'නය විරුද්ධවූ සත්ත්වයන් විරා'නුගත

විරොධය හැරැ එක් තැන්හි පෙළඹෙන බවට පූර්ව නිමිත්ත පාණා සේ උජාලවැ දිලියෙන සූර්යීමණ්ඩලය හා එක්ව ම අතෂ්ට වූ ප්‍රභා ඇතිවැ දිලියෙන තරු කැල බලා වදළ මැනව."

"නුඹ වහන්සේගේ බුද්ධ මඞ්ගලයෙහි සියලු සත්ත්වයන්ගේ සිත්හි අඛණ්ඩ ප්‍රසාදෝදයට පූර්ව නිමිත්ත පාණා සේ වැසි නැති ව ම මහිතලය පලාගෙණැ තාලසතඞ්ඛ ප්‍රමාණයෙන් ආකාශයට නැඟෙන්නාවූ නුඹ වහන්සේගේ ම ආකාශය වසා නැඟෙන්නා වූ කීර්ති නැමැති වෘක්ෂ පරම්පරායෙහි දළුවැ සුනුඹුල්වැ හටගත් කඳ වෙළපයක් බඳුවූ ජල ධාරා ශත සහස්‍ර බලා වදළ මැනව. නුඹ වහන්සේගේ බුද්ධ මඞ්ගලයෙහි සත්පුරුෂයන්ගේ පැළඹීම් පාණා සේ නක්ෂත්‍ර තාරකාවන් සවිශෙෂවැ දිලියෙන පරිදි බලා වදළ මැනව මීතු දශ දිඞ්මණ්ඩලයෙහි නුඹ වහන්සේගේ කීර්තිපුඤ්ජය හා එක්වැ දිවන මහා කරුණාව සේ සම්පූර්ණ වූ චන්ද්‍රමණ්ඩලය හා එක්වැ ආකාශයෙහි පවත්නා විසා නකත බලා වදළ මැනව."

"මතු නුඹ වහන්සේගේ බුද්ධ රාජ්‍යයෙහි සැහවී තුබූ ධර්ම තත්ත්වය එකහෙළා ප්‍රකාශවන්නට පූර්ව නිමිත්ත පාණා සේ නො එක් බිලයෙහි සැහවී හොත්තාවූ ප්‍රාණීන් එක පැහැරැ නික්මැ ප්‍රකාශවන පරිදි බලා වදළ මැනව. මතු නුඹ වහන්සේගේ ධර්මයෙහි සියලු සත්ත්වයාහට අරුචියක් නො උපදනව පූර්ව නිමිත්ත පාණා සේ දැනුදු සියලු සත්ත්වයනව කිසි අප්‍රීතියක් නැතිවැ එක පැහැරැ සන්තොෂ වූ පරිදි බලා වදළ මැනව.

"මතු නුඹ වහන්සේගේ බුද්ධ මඞ්ගලයෙහි ප්‍රෙතයන්ට නිශ්ශෙෂයෙන් සා දුක නැතිවන්නා සේ සියලු සත්ත්වයන්ට නිශ්ශෙෂයෙන් නැතිවන්නාවූ රාග ය. ෙෂ ය, මොහ ය, භය ය යන මොවුන් අද මතු නුවූ පරිදි බලා වදළ මැනව. මතු නුඹ වහන්සේගේ ධම්මානුභාවයෙන් මානාති මාන සඤ්ඤා සාරම්භාදි පාප ධම් නැමැති රජසුන් සංසිඳෙන බවට පූර්ව නිමිත්ත පාණා සේ අද සියලු දස දහසක් සක්වළ මහපොළොව රජස් එක පැහැරැ සංසිඳුනු පරිදි බලා වදළ මැනව."

"මතු නුඹ වහන්සේගේ බුද්ධ මඞ්ගලයෙහි අධම්මතාක් දුරැ වැ සද්ධම්මය ම පැළඹෙන බවට පූර්ව නිමිත්ත පාණා සේ සියලු අනිෂ්ට ගන්ධතාක් පහවැ දස දහසක් සක්වළ කුසුම් එක පියුම් ගබක් සේ එක පැහැරැ සුවඳ කරමින් විචිත්‍ර වූ සුවඳ පවන් හමන්නට වන් පරිදි බලා වදළ මැනව. මතු නුඹ වහන්සේගේ

ධම් දෙසනා බලයෙන් කැති විසතුවක් ම නො පැණෙන බව මුත් ඇතිතෑක් වසතුන්ගේ තත්වයන් එක හෙළා පැණෙන්නා සේ අරුතලෙහි සත්වයන් හැර සෙසු දිව්‍ය බ්‍රහ්මයන් එක පැහැර පැණෙන්නට වත් පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ **මඟඵල ධර්ම දෙශනාවෙහි** සියලු සත්වයා විඳිනාවූ ජාති ආදිවූ දුඃඛ නම් මේ වනැ සි සියලු ලොවට පැමිණෙන්නා සේ සියලු නරක තෑක් එක පැහැර පැණ් නිය පරිදි බලා වදාළ මැනව."

"මතු නුඹ වහන්සේගේ අවවාදයෙහි සිටි සත්වයානට සවර්ගා'වරණයක්-මාර්ගා'වරණයක් නො වන්නා සේ ම දැනුදු මේ දස දහසක් සක්වළ ගලෙකැ සෙලෙකැ යනාදීන් කිසි මුවාවක් නැති වැ එකා'ඔගණ වූ පරිදි බලා වදාළ මැනව. විශ්‍ව නුඹ වහන්සේගේ අවවාදයෙහි සිටැ **නිරුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන්** පිරිනිවි සත්වයන්ට කිසි ජාති දුකක් වත් මරණ දුකක් වත් නැතිවන්නා සේ මෙ කෙණෙහි මේ සත්වයන්ට ජාතියක් වත් මරණයක් වත් නැති වූ පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේසේගේ **උපපත්ති මඟඵලයෙහි** නැති වන ව්‍යාධි දුඃඛය අද දවස් ම නැතිවැ නික්මුණු සේ බලා වදාළ මැනව. එසේ හෙයින් නුඹ වහන්සේ එකාන්තයෙන් බුදුවන සෙයෙක. නුඹ ගැනි වූ ඇපි එකාන්තයෙන් කාතපුණ්‍යයම්හ. ඉදින් ඇපි මේ සම්බුදුන්ගේ ශාසනයෙහි සසරින් නො ගැළවුනුමෝ නම් මේ අද අප ගැනි වූ ගැතිකම්න් ම මතු නුඹ ගේ ශාසනයෙහි සියලු දුක් ගෙවා අමාමහ නිවන් දැකැ සැනෙමි හ" යනාදීන් නානා ප්‍රකාර වූ **සතුති කෙරෙමින්** සිටිය හ.

ඉක්බිති මාගේ ළඟට සිනිල් දෙන හෙල් මැලි කළඹක් වැනි වූ **සුමෙධ තාපසයන් වහන්සේ** "**සම්බුදුයෝ** නම් අනික් පරිද්දකට නොයන්නාවූ බස් ඇත්තාහ. ආකාශයට දමා ලූ කැට බිම මුත් නො නැවත්නා සේ **සම්බුදුයන් පාරමී සම්මර්ශනය.** වහන්සේ වදාළ අර්ථයෙක් ඇත් නම් සිදු වැ මුත් නො නැවත්නී. උපන් සත්වයානට මරණය ඒකාන්තයෙන් සිදු ව මුත් නො නැවැත්නා සේ ද, පහන් වේලෙහි සූයස්සියා උදා කොටැ මුත් නො නැවත්නා සේ ද, ගුහා යෙන් නික්මුණු සිංහයාගේ සිංහ නාදය අවශ්‍යයෙන් ම වන්නා සේ ද, ලොක සවාමි වූ සම්බුදුයන්ගේ වචනය වදාළ පරිද්දෙන් ම ඵල සිද්ධිය කොටැ මුත් නොනැවත්නේය එහෙයින් මම ඒකාන්තයෙන් ම සැම ලොකඥානතිකර වූ **සම්බුදුඵලයට** පැමිණැ මේ දුඃඛිත වූ ලොවට ශාන්ති **කෙරෙම් ම ය.**"

"අධර්ම ඝර්ම සන්තප්ත වූ මේ සඞ්ඝ ලොකයා මාගේ පා මූලට වැදී නිවී සැනහී මුත් නො නවත්නා හ. මම ද මෙහත් පවතිනි[1] **වජ්‍රාසනාරූඪවැ,** මාර වීර තිමිර නිකර දිවාකර වැ පූරිත පාරමිතා ලතා මඤ්ජරී භූත **සර්ව්ඥ ඥාන** ලීලා විලාස විශෙෂ පරමා'ධාරවැ **ධර්මචක්‍ර** ප්‍රවර්තා'ක්‍රාන්ත විනෙය බන්ධු කෙලාස බන්ධන ඇති වැ කාල දෙශ සථා'නො'විතා'දීන්ත බුදඬ විභූම ප්‍රකටන ප්‍රභාෂට ත්‍රෛලොක්‍ය ප්‍රණියමාන සාධුවාද ශත සහස්‍ර සමුච්ඡරිත දිඟ් වක්‍රවාට ඇතිවැ නිරා'ලොක ලොකා'ලොක කරණ යෙන් මහත්ක ප්‍රාප්ත මනොරථ ඇතිවැ මුත් නො නැවැත්මි."

"ඒ බුද්ධත්වය ද බුදඬකාරක **ධර්ම** කෙණෙකුන් ඇති වැ මුත් සිදු නො වන්නේනේය. ඒ බුදඬකාරක ධර්මයෝ ද කොතැනෙක්හි වෙද්දෝ නෝ"යි පරීක්ෂා කොවැ වදරණ සෙයෙක් ජලමු ඛොඤ්ඤ බුදු සර්ව්ඥ ප්‍රවරෝ'පසෙවිත වූ සර්ව්ඥ ලක්ෂණී කාවිකා ප්‍රාඥා'විභා ඕධි කුශල වූ ප්‍රකට තරී විභ්‍රම'හිරාම වූ යාවක – වාතක මිතා නිර්‍ීපණේ'ක ධාරාධර ප්‍රථමාරම්භාය මාන වූ දෘඪ සාර්ථිකාව දැකැ වදරා තමන් වහන්සේ ම තමන් වහන්සේට:-

"**ඉමෙඛ බුද්ධාඞ්කුරයානෙනි,** තොප විසින් සකල දශබල නිසෙවිත වූ ශ්‍රී ඝන වවන විලාශයට අවිෂය වූ අත්‍රුප්ත් ඇති **සර්ව්ඥ** යන්ගේ ම **වජ්‍රාසනාවරොහණයට** පියවර ඔබා ගන්නා වෙදිකා සථානයෙහි සිටියා වූ සියලු ලොකයාහට දැහැකෑ ප්‍රිය කරන්නා වූ වශ්‍යාකෘෂ්ටාඤමාන වූ **දැන පාරමිතාව** දක්නා ලදී. ඒ දැන පාරමිතා තොමෝ ම තොපව ඉෂටා'ර්‍ථ පූජට කරන්නා වූ **මාතෘ සථානයෙහි** සිටි ය. සර්ව්ඥ ලක්ෂමි ය ගෙණැ අවුත් තොප හා එක් කරන්නා වූ **සඛීසථානයෙහි** සිටි ය.

හෝ ම තොපට **කාමොඤාදී** චතුරොඝ නිසාරණයට **සෙතු සථානයෙහි** සිටි ය. හෝ ම තොපට සකල දස බල ගුණ සමූහයාගේ ආහවානයෙහි මහා හවුදුවැ[2] සිටි ය. හෝ ම තොපට මේ ජීවිතයට වඩා අවශ්‍යයෙන් රක්ෂණීය වූ **ජීවිත සථානයෙහි** සිටි ය. එහෙයින් ඒ දැනපාරමිතා නැමැති ජීවිතයට අනන්තරා යෙක් පැණේ නම් මේ සර්ව්ඥ සත්ත්ව සාධාරණ ජීවිතය බලි කොටැ දී ත් ඒ ම අවශ්‍යයෙන් තොප විසින් රක්ෂා කටයුත්තේය.

"එහෙයින් පැන් පිරුණු කලසක් මුහුණින් තමා පී කලැ මට මෙතෙක් පැන් තබමි; මේතෙක් පැන් වම්වම්'යි නොසිතා, නිරවශෙෂයෙන් ම ඇතුළත්හි තුබූ ජලය වම්වා ද එසේම මා

1. පතනින්—ඇතැම්. 2 මහා සමුද්‍රවැ—ඇතැම්

විසිහුදු මා සතු වූ ඇස ය, හිස ය, මස ය, යනාදී වූ අධ්‍යාත්මික වස්තූන් අතුරෙන් ද ඇතුන් අස්සන් මුතුතාමණි වෛඩූර්‍යාදි වූ බාහ්‍ය වස්තූන් අතුරෙන් ද මෙතෙක් මට තබමි.

මෙතෙක් යාචකයන්ට දෙමි'යි නො සිතා සම්ප්‍රාප්තවූ යාචක යන්ට ප්‍රාණය සහිත වූ සියලු වස්තූන් ඔවුන්ගේ මනොරථය පුරා දිය යුත්තේය. මෙතැන් පටන් **චක්ඛුදානය** දක්වා මේ සසර කතර ගෙවා යන්නට පටන්ගත්තාවූ තොප විසින් මේ **දාන පාරමිතා අවලම්බන යඤ්ඤය** නො හැර ගත යුත්තේය''යි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙක.

මහතුන් 'කරම්හ'යි කියා ප්‍රතිඥා කළ දෙයෙක්හි සමීර පරිදි ඉතා ආශ්චර්‍ය්‍ය සේ ය. දැන් මේ කළ ප්‍රතිඥාවට භඛ්‍යයෝ නො කෙරෙමි යි **සිවිරජවැ** අඛ්වෙසින් ඇස් ඉල්වා ආ **ශක්‍ර බ්‍රාහ්මණයාහට** පස් පැ දිස්නා ඇස් උදුරා දී ලූහ 'සාමි'යි ආ බමුණාහට කුසැ පුරා මස් දෙමි යි **සහවැ** ගිනි වැත්හ. ගැත්තන් සොයා ආ **ජූජකයා** වැනි බමුණු වෙස් ගත් යකඇත්හු අතැ **ජාලිය-කණ්හාජිනා** දෙදෙන තබා ලූහ. **මද්‍රිදෙවිත්** ඉල්වා ආ **ශක්‍ර බ්‍රාහ්මණයා** මුහුණ සසින් කිරි ඉල්වා ආ පුතැත්හු මුහුණ බලන මවකට වඩා සිනෙහැතිවැ බලා ඔහුගේ මනොරථය මසනක ප්‍රාප්ත කළහ.

මෙසේ **පළමුවනුදු** දාන පරමිතාව දැකැ වදාරා 'තවද-ලොකයෙහි **බුද්ධ කාරකධර්මයෝ** නම් මෙතෙක් මතු නො වෙති යි සිතමි. එහෙයින් මා විසින් තව ද ඔහු සෙවිය යුත්තාහ'යි පරීක්ෂා කොටැ වදාරණ සෙයෙක්:-

සකල මනො මල ප්‍රක්ෂාලනයෙ'ක සලිල සෙකාඝමාන වූ සකල දශ බල බලා'ධාර ඤාණාඝමාන වූ අනුවාත ප්‍රතිවාත යන විභාගයක් නො කොටැ මුළු ලෙවිහි ව්‍යාපනවැ පවත්නාවූ ගුණ සුගන්ධයෙන් යුක්ත වූ වසන්ත මාරුතාණ්ඩිත මනුකිනී ජලබිඳු සන්‍නෙහයෙනුදු අනිෂ්පණ්ඩිය වූ කෙලඟ සන්තාපඝ නිවන්නා වූ චතුස්සාගර වාරිධාරා පරිෂෙකයෙනුදු අසමණ්ඩිය වූ රාග රජස් සංඝිදුවන්නා වූ දෙවනු වූ **ශීලපාරමිතාව** දැකැ වදාරා තදදර්‍ශනෝ'ද්-භූත වූ වසන්ත මාරුත සන්නොඝ කොඝ නිර්හරිත හෘදය ඇතිවැ තමන් වහන්සේ ම තමන් වහන්සේට:-

''**සුමේධ පණ්ඩිතයෙනි**, තොප විසින් සකල බුද්ධ කාරක ධර්ම ගණ ශිඛාමණි වූ **ශීලපාරමිතාව** දක්නා ලදැ. ඒ පාරමිතාව තොප විසින් එක ඇසක් රක්නා **පුරුෂයන්හු** සේ ද, ප්‍රිය පුත්‍රයන්හු

රක්නා මවක සේ ද, බිජුවට රක්නා කිරලකු සේ ද, වාලධිය රක්නා සෙමරකු සේ ද බිය පත්වැ රක්ෂා කට යුත්තේ ය යි අධිෂ්ඨාන කොටැ වදළ සෙයෙක.

ඔවුන් ඒ කළ අධිෂ්ඨානයෙහි තත්පරකම් කෙසේ කියා නිම වම්ද? ශ්‍වාස මාත්‍රයකින් මහාමේරු පර්වතය දවා පියන්නට සමර්ථ වූ සඞ්ඛපාල නාගරාජයා තමන් සමාදන් වූ අෂ්ට'ඞ්ග ශීලයට හෙදයෙක් වේ දෝ හෝ යි යන භයින් තමන්ගේ ශරීරයෙහි අට තැනක් හුලින් ඇනැ විද්ද නිසණ වූ කණුවක ඇති වේරැණ ඒ සිද්‍රවෙන් ඔවා ගැවලා දණෙඩනි ලා බැඳවූ නොජපුත්‍රයන් මුහුණ රාජා'භිෂෙකයෙහි තමන් නළල උණ්හීෂ පටයෙ බඳිනවුන් බලවත්නා සේ වෙෂ විකාරයක් නැතිවැ බැලූහ.

මෙසේ සිඩි ඉතෙණකුන්ගේ උපදෙශයක් නැතිවැ තමන්ගේ විශුද්ධවූ බුද්ධීන් යළමුවන දාන පාරමිතාව හා දෙවන ශීල පාරමිතාව දුටු මහා පුරුෂයානන් වහන්සේගේ ශ්‍රීපාද වන්දන මා මුදුනෙහි තබා පුදා වැඳැ එවැනි කුසලින් සියලු සතුබයාගේ සතුටු මුහුණු බැලිය හෙම්ව සි! මාගේ සතුටු මුහුණ සියලු සත්ත්වයා බැලිය හෙත්ව සි!

මෙසේ දෙවන ශීල පාරමිතාව දුටුවා වූ නිරවධි නිරුපධි ගුණ ගණ නිධාන වූ සුමෙධ තාපස සොම්දරුවානන් වහන්සේ :- තව ද බුද්ධ කාරක ධර්මයන් සොයා වදාරණ සෙයෙක් තුන් වනු වූ සතල බොධි සත්ත්ව වික්‍රමෝ'ක සාධ්‍ය නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දැකැ වදාරා තමන් වහන්සේ ම තමන් වහන්සේට :-

"සුමෙධ පණ්ඩිතයෙනි, තොප විසින් සම්‍ය බොධි සත්ත්ව සන්දෘෂ්ට මහා බොධි සත්ත්ව ප්‍රසව සාමර්ථ්‍ය විශෙෂ ඇති සකල ප්‍රව්‍රජ්‍යා ගුණ ගණ මාණික්‍ය මහා නිධාන වූ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දක්නා ලද එහෙයින් තොප විසින් භවාශාව හැරැ නිරන්තරා බභ්‍යාසිත විභවා'භිප්‍රායයෙන් අඞ්ග වාතඞ්ග රොඟ උපදුත ජනපදයෙන් තමාගේ ගෙයි භික්ෂාව බිදා ගෙණැ යන්නා වූ පුරුෂයක්හු නිරපෙක්ෂවැ ම ක්ෂෙම ස්ථානයකට නික්මෙන්නා සේ අනවරතයෙන් පඤ්චකාමා'භුභවයෙහි සඤ්ඡාතවූ සංවෙගයෙන් මහාභිනිෂ්ක්‍රමණය කටයුතුයැ 'යි අධිෂ්ඨාන කොටැ වදළ සෙයෙක.

හිසැ එක නරයක් දැකැ සුවාසූදහසක් හවුරුදු විදිනා චක්‍රවර්තී සම්පත්ති හා සමාන සමාපත්ති හැරැ ගත්තාවූ තපස්වි වෙෂය මේ කළ අධිෂ්ඨානයට ම සුදුසුයැ. මෙසේ තුන් වන නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දුටු මහාපුරුෂයානෝ -

තව ද- බුද්ධ කාරක ධර්මයන් සොයා වදාරණ සේක් **සත්‍ය වතු** වූ **ප්‍රඥා පාරමිතාව** දැකැ වදාරා- සර්ව්ඥතාඥාන සම්භාවෙක' ඛිජාඝමාන වූ නෙත්‍රයට වඩා අතිතෙත්‍ර වූ **සකලා'කුශල** ප්‍රවෙශ ප්‍රතිඝෙපක ප්‍රතිහාරී ධුරන්ධර වූ සර්ව බොධි සතඥා'නු ජාත වූ **ප්‍රඥා පාරමිතාව** දැකැ වදාරා ආතම චිනිය කොටැ :-

"සුමේධ පණ්ඩිතයෙනි, තොප විසින් සර්ව ගුණ පවිත්‍ර නිෂ්පාද නෙක සුවර්ණ තුලිකායමාන වූ සතර වතු වූ ප්‍රඥා පාරමිතාව දක්නා ලද. හෝ තොම තොප විසින් ශරීරය හැර නො පවත්නා ඡායාව සේ චිත්තය හැර නොපවත්නා පරිද්දෙන් ප්‍රගෘහ්‍යකොටැ වැඩිය යුත්තියැ"යි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙකැ. **සුමනාව කුමාරවැ** කෙළනට අතින් ගත් වැලි දමා පියා අතුරු ජීවියෙහි වැලි කෙළනා අවස්ථාවෙහි සියලු **ජම්බු ච්පයෙහි** විසඳුවන් විසින් නො කියාගත හුණු ප්‍රශ්න බුද්ධ විලාශයෙන් විසඳූ බව් මෙසේ කළ අධිෂ්ඨානයට ම සුදුසුමැ නු සි.

මෙසේ සතරවන **ප්‍රඥා පාරමිතාව** දුටු නිපිඩ්‍ය ජාඛ්‍ය නිගඩ බඤ්ඣ විවේජදන විදුබුධකඤ්ඤවූ **සුමේධ තාපස** ඤාණී දරුවෝ

තව ද- බුද්ධකාරක ධර්මයන් සොයා වදාරණ සෙයෙක් සකල බුද්ධකාරක ධර්ම ධුරන්ධරවූ **වීර්‍ය්‍ය පාරමිතාව** දැකැ වදාරා තමන් වහන්සේ ම තමන් වහන්සේට :-

"සුමේධ පණ්ඩිතයෙනි! තොප විසින් **පස්වනු** වූ මේ **වීර්‍ය්‍ය පාරමිතාව** දක්නා ලද. හෙතෙම තොප විසින් දිවස භාගය හා අවිනාභාවී වූ සූර්‍ය්‍යාභා සේ තොපගේ චිත්තය හා අවිනාභාවී කොටැ නිබිය යුත්තේයැ"යි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙක. සොළොස් හැවිරිදි කුමාරවැ මහාසමුද්‍රයෙහි හී අක්‍රම විවර්ත මානා'නික්‍රාන්ත නක්‍ර වක්‍රා'කුල වූ සාගර කුක්ෂියෙහි පොවා පඤ්ච වර්ණ පද්මයෙන් සාදුම් ගත්තා වූ ගෙදික් විලෙක දිය කෙළණා තරුණ රාජ කුමාරයක්හු සේ සත් දවසක් මුළුල්ලෙහි පිහිනූ පිහිනුම් මෙසේ කොටැ වදාළ අධිෂ්ඨානයට ම සුදුසු මැ යැ.

මෙසේ පස්වනු වූ **වීර්‍ය්‍ය පාරමිතාව** දැකැ තව ද බුද්ධකාරක ධර්මයන් සොයා වදාරන්නාවූ ප්‍රඥා'විරොධ නිරොධ නිෂ්ප්‍රත්‍යූහ ප්‍රබොධ ඇති සුමේධ තාපසයන් වහන්සේ **සවනු** වූ **ක්ෂාන්ති පාරමිතාව** දැකැ වදාරා :-

"සුමේධ පණ්ඩිතයෙනි! තොප විසින් දක්නා ලද්ද වූ සර්ව ගුණවත් සකල සාධු ජන කාන්ත වූ **ක්ෂාන්ති** පාරමිතා තොම බුද්ධත්වයෙන් මනොරථය පිරෙණ තුරු ත් නො හැර ඉරිය

යුත්තියැ"යි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙක. සත් මැසි කුමාරවැ සුකුමාල වූ ගසන පාදයෙහි තීක්ෂ්ණ වූ ධාරා ඇති පොරොව හෙළන් නාවූ රජ්ජුරුවන් මුහුණෙහි අශ්‍රූන්[1] මෛත්‍රී ධාරාසෙන් ආර්ද්‍ර වූ තෙත්‍රෝ'තපල පත්‍ර හෙළා ලීම මෙසේ කළා වූ ප්‍රතිඥවට සුදුසු මැ ඝ.

මෙසේ සවන **ක්ෂාන්ති පාරමිතාව** දුටු සඞ්ඝාම්දරුවාතෝ තව ද බුද්ධකාරක ධර්මයන් සොයා වදාරණ සෙයෙක් සකල සර්ව්ඥවරයන්ගේ ඒකාරාය්‍යතා ප්‍රතිවෙධයට මහා කාරණ වූ සත්ගුණා'සිරෝධ නීත වූ **සත්‍ය පාරමිතාව** දැකැ වදාරා මේ තොප විසින් දුටුමං වූ **සත්වන පාරමිතාව** තමන්ගේ ප්‍රාණය ම ඒ සත්‍යය රක්ෂා සත්කාර කොටැ සිතා ඒ ප්‍රාණය තසා ද තෙමේ හෙ කැස්ස යුත්තේයැ"යි ඉටා වදාළ සෙයෙක. **පොදි සාදයා** අත්හි නත්නා ජීවිතයට නො සිතා බමුණාට කළ ප්‍රතිඥව බොරු වේ දෝහෝ යි සිතා දෙමිනසට පැමිණැ 'කැවත එම්'සි ඕ හට ප්‍රතිඥ කොටැ රාජ්‍යයට ගොස් බ්‍රාහ්මණයාට ධන දී කැවත එම් කියලා අවුත් නො ගියෙම් නම් හෙ ද මාගේ **සත්‍යයම** නුසුදුසු ය යි ජීවිතයෙහි ආශා නො කොටැ පොරිසාදයාට බත් වන්නට කැඟි ගිය ගමන මෙසේ කළ ප්‍රතිඥවට ම සුදුසු ඝ.

මෙසේ සත්වන **සත්‍ය පාරමිතාව** දුටු සඞ්ඝාම්දරුවෝ තව ද-බුද්ධකාරක ධර්මයන් සොයා වදාරණ සෙයෙක් සකල බොධි පාක්ෂික ධර්ම'ධිෂ්ඨාන වූ අටවනු වූ **අධිෂ්ඨාන පාරමිතාව** දැකැ වදාරා, "සකල ලොක දුඃඛ ව්‍යුපසමයෙහි එක දීක්ෂිත වූ **සුමෙධ පණ්ඩිත යෙනි!** තොප විසින් සර්ව තථාගත මනොරථ නිෂ්ඨා නිර්දේෂට පරාක්‍රම ඇති මේ අට වනු වූ අධිෂ්ඨානය වජ්‍රාසනා'රොහණය දක්වා අඛණ්ඩ කොටැ පිරිය යුත්තේය"යි ප්‍රතිඥ කොටැ වදාළ සෙයෙක. **තේමිය කුමාර** වැ සොළොස් හවුරුද්දක් මුළුල්ලෙහි ගලෙහි කොටා ලූ රුවක් සේ ඉන්ද්‍රිය විකාරයක් නැතිවැ වැඩෙනොත් ඔව මෙසේ කළ ප්‍රතිඥවට ම සුදුසු ඝ.

මෙසේ අටවනු **අධිෂ්ඨාන පාරමිතාව** දුටු මහා පුරුෂයාතන් වහන්සේ තව ද බුද්ධකාරක ධර්මයන් සොයා වදාරණ සෙයෙක් සමසත බුද්ධාඞ්කුරෝ'කම්ත්‍ර වූ නවවනුවූ **මෛත්‍රී පාරමිතාව** දැකැ වදාරා "**සුමෙධ පණ්ඩිතයෙනි!** තොප විසින් සකල මහාසත්ත්ව මනොරථ නිෂ්පාදනෙ'ක චරිත්‍ර පවිත්‍රවූ නවවනු වූ මෛත්‍රීපාරමිතානොම දක්නා ලද. හෝ තොමෝ නිජතෙත්‍ර

1. අශ්‍රාවක—ඇතැම්,

නිර්විශෙෂ කොටැ අසාධාරණෝ'ත්සාහයෙන් රක්ෂා කටයුත්තියැ''යි ප්‍රතිඥකොටැ වදළ සෙයෙක. සතුරු රජුනුදු අවුදින් සමෘද්ධ වූ සියලු රාජ්‍යය හැරැ ගෙණැ මහාවාරයෙහි ය සාල්ලෙහි බැඳැ එල්වූ කල්හි පවා ඔවුන් කෙරෙහි මෛත්‍රී කොටැ සහල්ලෙන් ගැලවී ආකාශයෙහි පළක් බැඳැ ගෙණැ වැඩහුන් වැඩැ හිඳීම මෙසේ කළාවූ ප්‍රතිඥාවට මේ සුදුසු ය.

මෙසේ තවවනු වූ **මෛත්‍රී පාරමිතාව** දුටුවා වූ මහාපුරුෂ ඥානන් වහන්සේ තව ද මත්තෙහි දු බුද්ධකාරක ධර්මයන් සොයා වදරණ සෙයෙක් සකල බුද්ධ සිංහ සමන්ත චක්ෂුස් ප්‍රතිලාභයට නිරපෙක්ෂේ'ක කාරණා වූ **දසවනු** වූ **උපෙක්ෂා පාරමිතාව** දැකැ වදරා ''**සුමේධ පණ්ඩිතයෙනි!** තොප විසින් ත්‍රිභුවන සාක්ෂි කොටැ දුටුවා වූ මේ **උපෙක්ෂා පාරමිතා** තොමෝ ජීවිත නිරපෙක්ෂවැ ද විශෙෂයෙන් රැක්ක යුත්තියැ''යි ප්‍රතිඥ කොටැ වදළ සෙයෙකැ. ශ්‍රී ශරීරයෙහි එක් භාගයෙක්හි සඳුන් ගල්වයන්නන් කෙරෙහි ද එක් භාගයෙක්හි බොල් කෙළ ඉස්නවුන් කෙරෙහි ද එකසේ වූ සිත් ලත් බව මෙසේ කළා වූ ප්‍රතිඥවට මේ සුදුසු ය.

මෙසේ උතකාලිතොතකලිත භව කලමෂ දුලීබ්බි ලාසිත ඇති සුවරිත්‍රා'දුලීලිත වූ මහාසත්ත්ව වූ බොධිසත්ත්වයන් විසින් අනුමාර්ගණීය වූ සවීකරණීය සම්බොධි සංසිද්ධි සිද්ධත්තෙතා'පදෙශා' සම්‍යාවාය්‍ය සථානිය වූ **දස පැරැමන්** දැකැ වදරා ඔවුන් ම අනුලොමයෙන් ප්‍රතිලොමයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරත් සියලු සවීඥතා ඥනයට බුර පැමිණැ සිටි මහාපුරුෂයානන් පළමු විවරණ පතුල් ලත් දවස් නිරුපදෙශයෙන් බුද්ධකාරක ධර්මයන් සොයා දුටු පරිද්දෙන් ම නුඹ වහන්සේ ද ඔවුන් සොයා දුටු පරිදි ඉතා ආශ්චය්‍ය ය සි සාධුකාර දෙන්නාක්මෙන් දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝන බහළ මහාපෘථිවි තොමෝ එක පැහැරැ ගුගුරන්නට පවන් ගත.

මේ ගත් පවන[1] ඔවුන්ගේ ආශ්චය්‍යයෙහි ජාති ජාතියෙහි හඬා නො විඩාවන්ට ගත් පවනැ.[1] අනුපම බොධිසත්ත්ව ගුණ සඤ්ඤිතයෙන් සන්තුෂ්ට වූ **මෙරැපව්තය** අධික වූ සුරා පානයෙන් මත් වූ පුතඤ්ඤු සේ සප්පාකුලා'වලයන් හා එක් වැ අනවසථිත වැ නවන්නට පවන් ගත. මේ ආදී ලොකොා'තසව පවත්නට පටන්ගත් ක්ෂණයෙහි සකල නරා'මර බ්‍රහ්ම ගණයා විසින් නානා ප්‍රකාර සතුති ගීති පූජාඩහම කොටැ නමසකාර කරමින් සිටිය දී බොධි

1 ඉතඃ — ඇතැම්.

සතඞ්ගයන් වහන්සේ ව්‍යාකරණ ප්‍රතිලාභයෙන් සම්පූර්ණ වූ මනොරථ ඇති වැ යෙවන පද්මවනයකින් පියා පැහැරි ආකාශයට නැඟි සවර්ණවර්ණ ඛෘතරාෂ්ට්‍ර හංස රාජයකු සේ ප්‍රභාභාසයෙන් ආකාශයට නැඟී හිමාලය වනයට වැඩි සෙයෙක.

මෙසේ මාගේ සවාමිදරු වූ ශාක්‍යසිංහ වූ ෂඩභිඥ වූ ධර්ම රාජ වූ සමන්ත භද්‍ර වූ සවාමි දරුවානන් වහන්සේ දීපඞ්කර පාදමූලයෙහි තමන් වහන්සේගේ ප්‍රාණ පරිත්‍යාග කොටැ සොයා ලද්ද වූ ශාන්ත වූ ප්‍රණීත වූ ඉෂ්ටාර්ථ සිද්ධිකර වූ සම්බෝධිඥාන නිදන වූ මා ඇතුළු සියලු සත්ත්වයා කෙරෙන් සියලු දුක් දුරු කොටැ සියලු අභීෂ්ට සම්පත්ති ඵලවන්නා වූ අනුපම වූ ආදි මධ්‍යා'න්ත කල්‍යාණ වූ ධර්මරත්නය සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

1. දීපඞ්කර සම්බුද්ධ විවරණ කථා.

මෙසේ ගාම්භීර්‍ය මකරා'කර වූ විශ්වලොක ප්‍රියඞ්කර වූ දීපඞ්කර ශ්‍රී ෂන ශ්‍රී පාදමූල ප්‍රතිලබ්ධ වූ ව්‍යාකරණ ඇති සුමේධ තාපසයන් වහන්සේ සම්‍යක්‍සම්බෝධීන් පාරමිතා පූරණා'භිප්‍රායයෙන් දුස්තර සංසාර සාගරා'වතීර්ණ වැ සවකිය විචිත්‍ර

2. කොණ්ඩඤ්ඤ සම්බුද්ධ විවරණ කථා

පවිත්‍ර චරිත්‍ර සම්බන්ධයෙන් ත්‍රිභුවන පාවනය කෙරෙමින් භව යොනි ගති විඥානස්ථිති සත්ත්වා'වාසයෙහිකරුණා වෘත පරිනයනයෙන් ලොකාර්‍ථ පාණ්ඩිත්‍යයෙන් විවිධා'ශ්වය්‍ර්‍ය සාහිත්‍යයෙන් අඥාන රාහිත්‍යයෙන් බොධිපාක්ෂික ධර්ම සාඞ්ඝත්‍ය යෙන් ලොකෝ'ත්තර ප්‍රසවය කොටැ වදරණ කල්හි දීපඞ්කර සවාමීන් පිරිනිවි පසු එක් අසඞ්ඛ්‍යයක් සර්‍වඥා'ලොක විරහයෙන් එකා'ණිකාර වූ ජගත්හි සර්‍ව සත්ත්වයන්ගේ අතල්ප සංකල්ප සිද්ධි කාරණා වූ එක් කපෙක්හි :-

ආලොක සාමාන්‍ය වූ සර්‍වඥමාන්‍ය වූ නිර'තිශයප්‍රාධාන්‍ය ධන්‍ය තාය සම්බන්ධ බන්ධුර වූ පරම සෞජන්‍ය සම්භාවිත වූ කොණ්ඩඤ්ඤ නම් සවාමි දරුවානන් වහන්සේ සොළඝාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා පූරා දෙවර්මකන්‍යය සම්බන්ධයෙන් අකලුෂිත වූ රුචිරා'මර වාමර ග්‍රාහිණී විභ්‍රම විභූෂිත වූ තුෂිත පුරයෙන් චුතවැ සම්‍යක්සම්බෝධි වසතු සාඞ්ඝත්‍යයෙන් පරම රම්‍ය වූ රම්‍යවතී නම් රාජධානියෙහි සකලා'ද්භූත ප්‍රසූති නන්‍ද වූ සුනන්‍ද නම් රජ්ජුරුවන් හිසා අතිවිශිෂ්ට

සමපත් ප්‍රභූවින් සව්ලොක පූජිත වූ රාජ වංශයෙහි සුජාත වූ **සුජාතා** නම් දේවිත්ගේ කුසමැයෙහි පිළිසිඳැ ගෙණැ ක්‍රමයෙන් වූ ප්‍රසවයෙන් සම්‍ය'ද්භූත ප්‍රසවය කොටැ ක්‍රමයෙන් වැඩී තවයුවනි නැත වූලුක නිපෙය තව යෙවන ශ්‍රී මදිරායෙන් ජන නයන මොහනය කරණ අවස්ථායෙහි :-

ශාරද චන්ද්‍ර කාන්තින් සුන්දරවූ නිජ දෙහ රුචිර ඇති **සුරුචි** නම් අග්‍ර මහිෂින් වහන්සේ කුසින් සකල ලොක විදිතවූ **විජිත** නම් **කුමාරයා** උපන් කල්හි **ශුද්ධාවාස** බ්‍රහ්මායුෂ්‍ය නිමිත්ත සන්දර්ශිතයෙන් සංසාරයෙහි උද්විග්නවැ ප්‍රව්‍රජ්‍යායෙහි සාභිලාෂ වැ **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ දස කෙළක් **පමණ** මහර්ත්‍යා කැවිවැ මහණවැ දස මසක් **මහාවියූහ** කොටැ වෙසක් **පුසැ මැදි පොහෝදා** සුරෙන්ද්‍ර සමාන වූ ආඪ්‍ය ජනයා විසින් ආකීර්ණවූ සුරෙන්ද්‍ර නම් ගම්හි චාරු බිම්බාධර වූ පීන පයෝධර වූ **ශාරශාඛරාවන්** දුන් කිරි පිවූ පිළිගෙණැ වළඳා සාල වනයෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි ගණයා හැරැ **සුවඳුන** නම් ආජීවකයා දුන්නා වූ අට මිටක් තණ පිළිගෙණැ සකල ලොක කල්‍යාණ වූ **සාලකල්‍යාණ** වෘක්ෂමූලයෙහි අට **පණස්** රියන් **වජ්‍රාසනයෙහි** චතුරඹ **විය්‍යා'ධිෂ්ඨාන** පූර්ණඝම වැ වැඩැ භිදැ මාරා'හඞ්කාර නීහාර සංහාර දිවාකර වැ ප්‍රත්‍යූෂකාලයෙහි සම්බිගත සර්ව්ඥතාඥානය ඇතිවැ ක්‍රමයෙන් **ධම්මඤ්** පවත්වා ග්‍රාම නිගම රාජධානියෙහි සැරිසරා වඩනා සෙයෙක් **චන්ද්‍රවති** නම් රාජධානියට පැමිණි සෙයෙක.

එ සමයෙහි අප සම්මාසම්බුදු රජානන් වහන්සේ එ නුවරෙහි ධර්‍මා,නුවර්තී වූ විනයානුවර්තී වූ **චක්‍රවර්ත්තිවූ මහරජ** වැ නමින් **විජිතාවී** නම් වැ **කෞණ්ඩිණ්‍ය සර්ව්ඥයන් වහන්සේ** තමන් වහන්සේගේ නුවරට වැඩිබව **අසා** නහෝ'දිත[1] චන්ද්‍ර මණ්ඩලා'භිමුඛවැ ගමන් ගත්තාවූ පියුෂ පාන රසික වූ **චකෝර** සාඛකයක්හු සේ සර්ව්ඥයන් වහන්සේට පෙර ගමන් කොටැ බුද්ධ ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා වහන්සේට මනොහර වූ ආහාර විහාරයෙන් තුන් මසක් උපස්ථාන කොටැ වදාළ සේක. එ බදු වූ **ඒ මහා පරිත්‍යාගය** දුටු ඒ සර්ව්ඥයන් වහන්සේ මේ මහාපුරුෂ තෙම මේ මහා දානයෙහි අනුසසින් අනාගතයෙහි **ගෞතම** නම් සම්‍යක් සම්බුද්ධ වෙ යි නිසා දීපඞ්කර සර්ව්ඥයන් වහන්සේ වදාළ පරිද්දෙන් ම තමන් වහන්සේ ද විවරණ පතුල් දී වදාළ සේයෙක.

---

1 නහොද්ගත—නාවොදිත—ඇඩෑම්.

එබස් ඇසූ ඒ මහාපුරුෂයානන් වහන්සේ 'මම අනාගත යෙහි ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙම් ලැ! එසේ වූ මට මේ අසීර වූ චක්‍රවර්ති රාජ්‍යයෙන් ප්‍රයෝජන නැතැ' සි රාජ්‍යත්ව යෙහි නිරහිලාෂවැ බුද්ධ ශාසනයෙහි මහණවැ පිටකත්‍රය ය ඉගෙණැ පසුවා'හිඳ අෂ්ට සමාපත්ති උපදවා ජීවිත පර්‍යවසාන යෙහි බ්‍රහ්මලොකයෙහි උපන් සෙයෙක.

මේ මාගේ සවාමි දරුවූ සම්බුදුයන් වහන්සේ විසින් සප්ත රත්න සමලඞ්කෘතවූ ඝනවර ඝණ්ඩියකින් යුක්තවූ සතිස් යොදනෙක්හි පැතිරී ගෙණැ සිටියා මහාපරිවාර ඇති චක්‍රවර්ති රාජ්‍යය නානාවිධ ශුභ ශුභ නිවිත වූ අමුසොහොනක් සේ හැරී පියා බුද්ධ ශාසනයෙහි විහරණවැ නොයෙක් ලෙස බොධිසම්භාර ධර්මයන් පුරා ඇතැය මුදුන්ගුරුවා අනන්තයෙහි වර්‍ත්‍රාසනයෙහි වැඩ හිඳ සවයම්භූඥානයෙන් සසක් කළා වූ ධර්මරත්නය සරණ යෙමි සි දහම් සරණ ගියා සුකු.

2. කොණ්ඩඤ්ඤ සම්බුද්ධ විවරණ කථා.

මෙසේ අසඛල දසබල ගුණපූරණ මණ්ඩිත කොණ්ඩඤ්ඤ නම් ශ්‍රී ඝන ශාසනා'නන්තරීයතයෙහි පටන් එක් අසඞ්ඛ්‍යයක් මුළුල්ලෙහි ශ්‍රීඝන ඝනාඝන ප්‍රවචනා'මෘත ධාරා'භිෂෙකයෙන් ලොක නිර්‍ව්‍යෘතියක් කෙ වූ කල්හි

3. මඞ්ගල සම්බුද්ධ විවරණ කථා

පරම දුඃඛා'ක්‍රාන්ත වූ සත්ත්ව වර්‍ගයා සඛීා'පවර්‍ග මාර්‍ග රසානභිඥ තවැ අඥාත මහා සාගරයෙහි නිමග්න වූ කල්හි නිර්‍වික්‍රම ධර්ම සඞ්කල්ප නිරන්තරවූ එක් කල්පා'නන්තරයෙක්හි සවාම්දරුවෝ සතර දෙනෙක් ලොකයෙහි පහළවූහ.

එහි ආවිර්භාවිත විශ්වලෝ'කෙක මඞ්ගවූ මඞ්ගල නම් සවාම්දරු කෙණෙක. සවදෙශනා වසන්ත ශ්‍රී සම්පාත විකසිත කෘතා'ධිකාර සුමනසුන් ඇති ධර්මාමෘත රස්‍ය'සවාද සුමනස්වූ සුමන නම් එක් සවාමි දරුකෙණෙක. නිර්ජා'ද්භූත විශෙෂ විරාජිත වසුන්ධරා මණ්ඩල ඇති රෙවත නම් එක් සවාමි දරු කෙණෙක නිර්‍ව්‍යාජ ධර්මරාජ ලක්ෂ්මී ශොභිතවූ ශොභිත නම් එක් සවාම්දරු කෙණෙක.

මෙහි පළමුවනු වූ නිරස්ත සමස්තා'මඞ්ගලවූ මඞ්ගල නම් සවාමි දරුවානෝ සොළසා'සඞ්ඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි පාරමිතා පුරා තුන්වන ආත්මභාවයයන් චුතවැ විවිධ මණිමරිචි

රුචිර **තුෂිත** පුරවරා'ධිරූඪවැ එහි ආයු පමණින් ශ්‍රී වළඳ දෙවතාවස්ගේ ආරාධනා ගිවිසැ **පඤ්ච මහා විලෝකනය** කොටැ **තුෂිත** කායයෙන් චුතවැ සකල සම්පත්තීන් නිරූත්තරවූ **උත්තර** නම් නුවරෙහි ලොකොත්තර ගුණ ගණා'නිරාම වූ **උත්තර** නම් මහ රජානන් වහන්සේ නිසා සෞභාග්‍ය ලක්ෂ්මීන් සුන්දරතරවූ **උත්තරා** නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ක්‍රමයෙන් ප්‍රසව ශ්‍රියෙන් සකල ලොකා'නන්ද සන්ධාන නිදානවැ ක්‍රමයෙන් වැඩි වයසට පැමිණැ පඤ්චේන්ද්‍රිය මධුකර බාල සන්තාපී' ණෙක මධු රසික පඤ්චකාම නුණෙක නිධාන වූ ශීලවති වූ රූපවතී වූ ගුණවති වූ කුලවති වූ **යශස්වති**[1] නම් දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති දාසක් අඹුවන්ගේ මදන දහ නිවීපනයෙහි අනිනව **කර්පූරහාර** වැ ප්‍රිය ශිලී වූ **සීලවන් කුමාර** මඤ්ජරී ග්‍රාහණයෙන් **යශස්වති දෙවි**[1] ලතාව සතාථවූ කල්හි සකල පුෂ්පිත නිර්මිත්‍රා දකැ පුජිත ශරදභ්‍ර පිණ්ඩ පාණ්ඩුර වූ **පාණ්ඩර** නම් අශ්වරාජයා පිටින් **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ තුන් කෙළක් මිනිසුන් හා කැටිවැ මහණවැ අට මසක් **මහාවියූළ** කොටැ **වෙසක්** මඬැ **මැදි පොහෝ දවස්** :-

උත්තරා නම් නුවර **උත්තර** නම් සිටානන්ගේ **උත්තරා** නම් දියනිය විසින් පිළිගන්වන ලද කිරි පිඬු වළඳ සල්වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි **උත්තර** නම් ආජීවකයා විසින් දෙන ලද්දවූ අට මිටක් තණ ගෙණැ සකල ලොක භාගධෙයේ'කවූ බොධිසත්ව රාග ක්ෂය කර වූ විඡ්‍යන්දමාන ඝනපරාගධාරා සුරභිභූත වූ නිපරූප ලක්ෂ්මී දිදෘක්ෂා'න්මිලිත මත්ත මධුකර කාමණ්ඩලොප'ශොභිත කුසුම කලාප ඇති ඒ බොධිවෘක්ෂ රාජයා විසින් බොහු ලබන්නාවූ රූප කාන්ති ඇත්තාක්හු මෙන් **නාගබොධි** මූලයට එළඹැ අට **පණස්** රියන් වප්‍රාසනයෙහි **චතුරඞ්ග වීර්‍යාධි'ෂ්ඨානයෙන්** වැඩැ භිදැ බර තබර ප්‍රකර ප්‍රතිම ප්‍රමථන දුර්ධර කෙශරී කිශොරී හුංකාර ශ්‍රවණ කාතරීභූත කලහා' කුල ලීලායෙන් මාර බල ප්‍රලය කොටැ යාමත්‍රයෙහි ඥානත්‍රය'ධිගම කොටැ අරුණෝදය හා සමධිගත සර්ව්ඥ ඥන විලාසයෙන් විසව ඥෙය මණ්ඩලය ප්‍රතිවිඡ්දක මෝහ සෙනාම විඝතන කොටැ සම්‍යක් සම්බුද්ධ වැ නමන් වහන්සේ බොධි සත්ව භූමියෙහිදී දරුවන් දන් ගත් සකු නමන් වහන්සේ බල බලා සිටියදී ම මූලපලා අලයක් කන්නා සේ ම දරුවන් කන වේලෙහි දෙ තොලින් වැගිරෙණ ලේ බල බලා මදකුදු දෙම්නසක් නො කොටැ මෙහි අනුඝසින් 'මා බුදුවූ කල්හි මාගේ ශරීර ප්‍රභා දස දහසක් සක්වළ එක පහැරි

1. යඝවති—ඇතැම්

පැතිරේවා!'යි කියා පැතූ ප්‍රාර්ථනාවට සුදුසුවූ අනූදසක් අවුරුදු මුළුල්ලෙහි විරූවාපී රන් රසඟෙන් පිරුණු තුත්තක් සේ දස දසක් සක්වළ ගබ රැ දහවල[1] යන විභාගයක් නොවන පරිදිදෙන් තමන් වහන්සේගේ ශරීරයෙහි සඛණීකාන්තීන් පිරෙණා පරිදිදෙන් අනූපම වූ ශරීර ප්‍රභා ලදින් සත් සතියක් යවා බුදුමාරාධනාව ගිවිසෑ ක්‍රමයෙන් ධර්මසක් පවත්වා ලොකඇ බුද්ධ ශ්‍රී වෛචිත්‍රයඇට චිත්‍රපට කෙරෙමින් ග්‍රාම නිගම රාජධානියෙහි ලොකාර්ථ සම්පාදන ව්‍යාවෘතවූ වසන සෙයෙක.

එ සමයෙහි අපගේ සවාමිදරුවෝ බුදු මුඛයෙන් තමන් ලද්දවූ විවරණ පතුලට වැදූ 'සමතිස් පෙරුම් පුරම්'යි කළ අධිෂ්ඨාන යට- හළ ආත්ම ප්‍රේමයට ද, කළ සබ කරුණාවට ද එක චිත්තෝත්පාද මාත්‍රයක් කලු දු විරොධයක් නො කෙරෙම් යි භවයෙන් භවයෙහි බොධිසම්භාර ධර්ම'ජිතයෙහි[2] තත්පරවූ ඇවිදිනා සෙයෙක් එසමයෙහි සුරුවි නම් වූ එක් බ්‍රාහ්මණ ග්‍රාමයෙක්හි සද්ධාමේඝකරුවි වූ සුරුවි නම් බ්‍රාහ්මණොත්තම යෙක් වැ සුගන්ධ සම්බන්ධ බන්ධුර පද්මෝ'දර නිපාත ශිලිවැ දිව ගත්තාවූ භාඛ්‍යයක්හු සේ සද්ධර්මරස ලොලවැ සම්බුදයන් වහන්සේ කරා එළඹැ මඞ්ගල සම්බුද්ධ චන්ද්‍ර මණ්ඩලයෙන් වැහෙන් නාවූ සද්ධර්ම කෞමුදි චන්ද්‍රකානනීය හෙත් හෙත් තමන්ගේ ළය චන්ද්‍රකානන පාෂාණයක් සේ ද්‍රව කෙරෙමින් මඞ්ගල සම්බුද්ධ දිවා කරයාගේ නානා රස මධුර වචන කර නිකර සඵශීයෙන් තමන්ගේ මනොරථ කෞමුදි පද්මය විකාශයට පමුණුවමින් විකසිත දශබල මඞ්ගල කමලෝ'දරයෙහි නිරන්තර සම්පූර්ණවූ ධර්ම මකරන්ද සන්තෙහයට තමන් ශ්‍රවණ මත්ත භ්‍රමර විභ්‍රමයන් යොමූ කෙරෙමින් හිඳැ බණ අසා වදාරා-

කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ ප්‍රධාන කොටැ ඇත්තා වූ සම්බුදයන් වහන්සේට දන් දෙමි යි පවරා 'මම වූ කලි මාගේ සම්පත්තිය අධික හෙයින් දන් දෙම් ම ය; මෙතෙක් පරිවාරයෙන් යුක්ත වූ සම්බුදයන් වහන්සේ වැඩැ හිඳිනට සුදුසු ස්ථානයෙක් මට දුර්ලභයැ'යි සිතා වදාළ කල්හි ඒ සිත දන්නා වූ ශක්‍රදෙවෙන්ද්‍රයා වඩු වෙසින් අවුදින් දෙලොස් යොදුන් ප්‍රදෙශයෙක්හි සම්බුදයන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහි සඛණී කාන්තිය ම වැජඹැ ගොනැස ය, පේකඩ ය, දූව කඩ ය යනාදි ලෙසින් සිවැ ගත්තා සේ මනොහර වූ නානා ස්ථානයෙහි විලම්බමාන වූ කුසුමදාම කිංකිණික ජාලා

1. දවහල—ඇතැම්. 2. බුද්ධාවජිතයෙහි—ඇතැම්.

සමාකුල වූ බුදුන් වහන්සේ හා කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ හා වැඩ හිඳිනට සුදුසු සප්තා රත්නමය ආසනයෙන් යුකත මණ්ඩප යක් මවා දෙව් ලෝ යිය කල්හි:-

ඒ මණ්ඩපයෙහි කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ හා සම්බුදු යන් වහන්සේ වඩා හිදුවා සතර මහා සාගරයෙහි ජලසකාඤ්ඣය එක තැනකට හයන්නා සේ වතු මධුරයෙන් යුක්ත වූ මහදන් සත් දවසක් මුළුල්ලෙහි දී අනන්ත දවස් කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේගේ පාත්‍රා පුරා ගෙළ හිතෙල්, වෙඩරු, මී, සකුරු, පැණි, දී හා එතෙක් දෙනා වහන්සේට තුන්සිවුරු දුන් සේකැ. ඒ සිවුරෙහි මාහැඟිකම් කෙසේ කියම් ද? හැම දෙනා වහන්සේ ගොරෙන් පස්සේ වහන්සේ ලද සිවුර කෙළ ලක්ෂයක් අගනේ ය. මෙසේ මහදන් දුන් සවාමිදරුවෝ ද 'මෙහි පෙලෙන් මම ද මේ බුදුවැ නවලොකොත්තර සඩ්ඛ්‍යයන් ප්‍රත්‍යක්ෂ කෙරෙම්ව'සි හිතූ ධම්ය ම පතා වදළ සෙයෙක.

මෙසේ මහදන් දුන්නා වූ මහාපුරුෂයානන් වහන්සේගේ උදරාධ්‍යාශය දුටු ඒ **මඞ්ගල සම්බුදුයන් වහන්සේ** ද 'මේ මහා පුරුෂ තෙමේ මේ දානයෙහි අනුසසින් මතු **ගෞතම** නම් බුදු වෙයි' යනාදින් **දීපඞ්කර සම්බුදුයන් වහන්සේ** වදළ පරිදිදෙන් විවරණ පතුල් දී වදළ සෙයෙක. ඒ ඇසූ මහාපුරුෂයාණන් වහන්සේ සම්බුදුඥානයෙහි නිබඳ්ධවූ මහොත්සාහයෙන් තමන් වහන්සේගේ ඇති වසතුව මුළුල්ල බුදු පාමොක් මහා සඞ්ඝයා වහන්සේට සිවු පසයට දී ඔවුන් වහන්සේගේ ශාසනයෙහි මහණවැ පිටකත්‍රයය ඉගෙණැ සතර ධ්‍යානවිහාර වඩා පඤ්චා'භිඥා අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්මලොකය සදා වදළ සෙයෙක.

මෙසේ මහදන් දුන්නා වූ ද එසේ වූ මහාපුරුෂයානන් විසිනුදු අනික් වසතුවෙක්හි[1] ආසා නැතිවැ පැතුයේ ධම්ය ම පසක් කරන්නට ම ය. එහෙයින් 'මහතුන් විසින් මේ සා මහත් යත්න යකින් පතනලද සඩ්ඛ්‍යය අප විසින් අයතනයෙන් පැමිණෙන ලදා, එසේ වූ ධම්ය සරණ ගොසින් සියලු අභිමතාර්ථය සැදිය යුත්තේයැ' යි සත්පුරුෂයන් විසින් දහම් සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

3. මඞ්ගල සම්බුද්ධ විවරණ කථා.

---

1. වසතුවඤ්ච—දාතෘම්,

මෙසේ සුවශරීර ජෙෘෂ්ත සථිරා විරජ්ජෙත විලසිත විහනුත ලොකාඛිකාර පවල ඇති මඛඟල සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ තමන් වහන්සේගේ අනන්තර්ධානයෙන් සියලු වසතුන් කරා තමන් වහන්සේගේ වර්ණ ප්‍රත්‍යා-

4. සුමණ සම්බුද්ධ විවරණ කථා පත්ති[1] කරවා පිරිනිවන් පෑ කල්හි අතුරෙහි එක් බුද්ධාන්තර යක් ගිය කල්හි සවයං වරණ සවාභිලාෂ විරචිත විශවලොකාඛි ඛමක ඇති සුමඟ නම් සවාමිදරුවෝ සමතිස් පැරුමෙන් මතු පත්වැ තුන්වන අත් බැවින් සැවැ තුෂිනපුරයෙහි පිළිසිඳ ගෙණැ එහි ආයු පමාණින් කාමාවෙශ විවශ ලලිත වනිතා වදන පද්මවත රාජඟැවැ අන්‍යතයෙහි දෙවතාරාධනා පිළිගෙණැ පසුව මහා විලොකිතාභිෂ යොවැ තුෂිත කායයෙන් චුත වැ :-

ක්ෂෙමකාර වූ ඇයාණි නම් නුවර අක්ෂිණ විත්ත වූ සුවිනිත විත්ත වූ, සුදුසුකා කම් රාජ්‍යුරුවන්ගේ කුලෙහි අක්ෂිණවූ යෞවන ශ්‍රී ඇති ශ්‍රීමති කම් මහාදේවීන් වහන්සේගේ කුසැ පිළිසිඳ ගෙණැ සම්පූර්ණ වූ දශමාසාන්ත්‍යයෙහි[2] ප්‍රශව ශ්‍රීන් දශසහස්‍රලොක ධාතුව සද, කුමයෙන් යෞවනයට පැමිණැ දසදසක් කාවක සත්‍රීන්ගේ විදඟ මුඛ සරස මධුර කවාක්ෂ නිකෙ'පෙක පාත්‍රවැ වන්‍දෝ'පවනෝ'පගමන සෙවරවාරි විහාර සංගීත ප්‍රසඩාදී විවිධ නුභාව විශෙෂයෙන් කල් යවා:-

සකල යුවති ජනා'වතංසක වූ **වතංසිකා** නම් දේවීන් වහන්සේගේ කුක්ෂියෙන් සෞන්දර්‍ය්‍ය සාගරයෙන් අනුපම වූ **අනූපමණ** නම් කුමාර රත්නය ප්‍රසව වූ කල්හි බ්‍රහ්මාපණීත **චතුෂටය නිමිත්ත** සන්දර්ශිතයෙන් ප්‍රව්‍රජ්‍යායෙහි සාභිලාෂවැ විවිත්‍ර සජ්ජා විශෙෂ බහුල සිඛුර වරා'ධිරූඪවැ **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ මනුෂ්‍යයන් නිස් කෙළක් හා කැවිවැ මහණවැ දසමසක් **මහාවීර්‍ය්‍ය** කොටැ **වෙසක් මස** මැදිපොහෝ දවස් විශඛ විහවා' නවම වූ **අනවම** නම් නුවර සමපත්තීන් නිරූපම වූ **නිරූපම** නම් සිවානන්ගේ චීතෝ'පම වූ[3] **අනූපම** නම් දියණියන් විසින් පිළිගන්වන ලද කිරිපිඩු වළඳා සල් වෙතෙ හිඳිවා විහාර කොටැ-

සවස්වේලෙහි **අනූපම** නම් ආජීවකයා විසින් දෙන ලද්දා වූ අවමිටක් තණ ගෙණැ මන්‍ද මථර නාග විභ්‍රමයෙන් **නාග බොධි** මූලයට එළඹැ, තිස් රියනක් පමණ වප්‍රාසනයෙහි **චතුරඛණ විශ්‍රාධිඛ්‍යාන** කොටැ වැඩැහිඳ මාරසෙනා'භිමාන මර්දන ප්‍රඛ්‍යාත

1. වර්ණ ප්‍රාප්තිය—ඇතැම්. 2. දශමාසාන්ත්‍යයෙහි—ඇතැම්.
3. ඒගතොපම්වූ—ඇතැම්.

කිර්ති පිණ්ඩ පාණ්ඩුරිත භූවතා'භොග ඇතිවැ යාමත්‍රයයෙහි විද්‍යුත්‍රයා'ධිගම කොටැ බ්‍රහ්ම මුහුනී ප්‍රාදුර්භාව සමයා'විර්භූත බ්‍රහ්මාති බ්‍රහ්ම භාවවිභාවිත සම්බුද්ධ විලාස ඇතිවැ ක්‍රමයෙන් සත්සති යවා බ්‍රහ්මාරාධකාව පිළිගෙණැ ධර්මචක්‍ර පවත්වා සකල ජගද්'තන්දය කෙරෙමින් ග්‍රාමනිගම රාජධානියෙහි චාරිකායෙහි වඩිමින් කෘතාධි කාරයන්ගේ සන්හි සන්හි ධර්මාමෘත තමමින් වසන සේක.

එ සමයෙහි අපගේ බොධිසත්ත්වයන් වහන්සේ නිජවාද නිහිත සමත්‍රිංශත් පාරමිතා පූරණා'ශායෙන් විවශවැ කරුණායෙන් අශූන්‍යවැ ප්‍රඥායෙන් මතු පත්වැ ධර්මයට බැහැවී පාපයට ප්‍රතිපක්ෂවැ ජාති ජාතියෙහි සමරණීය රමණීය ගුණයෙන් යුක්තවැ භවයෙහි ඇවිදිනා සෙයෙක් නාග භවනයෙහි ප්‍රබලවූ තුලඝාතික්‍රාන්ත වූ අතුල නම් නාගරාජ වැ 'අඥ' ලෝක ප්‍රඥා' ලෝක දුඃඛ වූ සුමන නම් සම්බුදුන් වහන්සේ ලෝකයෙහි උපන් සෙයෙක' යනු අසා බුද්ධාලම්බණ ප්‍රීති සන්තති ප්‍රාදුර්භාව නිඛිරිතා'තමභාව ඇතිවැ එබදු මහා පුරුෂයානන්ට මා විසිනුදු පූජාවක් කළ මැනවැ යි සිතා-

නාග භවනයෙන් නික්මැ සියලු මාර්ගය බුදු පුදයට ගත්තාවූ කඹුපුල් මලින් වසමින් කාලාගරු ධූප ද්‍රව්‍ය සම්පූර්ණ වූ කරණ්ඩක සන්තතින් නිරන්තර කෙරෙමින් දිව්‍ය කාර්පූර චන්දනාදී සෞරභ්‍ය ප්‍රබන්ධ බන්ධුර කෙරෙමින් නාගවල්ලි දළයෙන් හරිත වූ නානා ප්‍රකාර විතාන විභ්‍යාසවිශෙෂයෙන් මනොහර වූ පූජොපකරණ විශෙෂයෙන් සකලා'කාශය නිරවකාශ කෙරෙමින් අතින් ගත් මිණිදඬුවැට පහන්හි හා පරිවාර නාගයන්ගේ ගෙළෙහි බඳ කණ්ඨමණී ආලොකයෙන් සියලු මාර්ගය රුචිරතර තාරකා නිකරා'වතීර්ණ වූ ගගනාඞ්ගණය සේ මනොහර කෙරෙමින් අමිත වල්ලිතා'වලිත කෙතු පතාකා විභ්‍රාජනයෙන් සම්භූත වූ නෙත්‍රොත්සව ඇති නාග භවනයෙන් නික්මැ :-

'සද්ධර්මය අසමි' යන රිස්සෙන් අදනා ලබන්නක්හුමෙන් බුද්ධ රූපය දක්නා රිස්සෙන් මෙහෙයන ලබන්නක්හු මෙන් අවුත් කොළඹ සෙයක් නිසුන් වහන්සේ පිරිවර කොටැ ඇති සම්බුදුන් වහන්සේ දැකැ වඳිමින් පැදකුණු කෙරෙමින් එකත් පස්වැ හිඳ ධර්මා'මෘතයෙහි කන් ගලා රූපා'මෘතයෙහි ඇස් ගලා රමණීය වූ සම්බුද්ධ ගුණානුස්මරණය කෙරෙමින් නිරවද්‍ය වූ වාද්‍යයෙන් හා විවිධ ලාසාඛ්‍යවර්ති නාට්‍යයෙන් හා රස නිර්හරිත ගීතයෙන් හා-

සුහෘදය ගරණ ප්‍රවිණ වාරු වාණියෙන් හා රස විශෙෂ නිරංශ වංශ නාදයෙන් හා ආවිර්භාවිත හෘදයා'නන්ද කන්දල මර්දල නාදයෙන් හා මෙයින් පිටත් නානා ප්‍රකාර වූ සංගීත විද්‍යෝ'පයොගී වූ වාද්‍ය විශෙෂයෙන් හා බුද්ධ පූජා කොටැ වදුරමින් තුන් සිවුරු ඇතුළු වූ මහදන් දෙමින් එසේ වූ පූජාවක් කොටැ ඒ සා මහත් දානයක් දී ද අනික් සම්පත්තියක් නො පතා මෙහි පෙලෙන් මම ද නිරුපදෙශයෙන් නාව ලොවුතුරා දහම් පසක් කට හෙම්ව[1] යි කියා සද්ධර්මා'ධිගමය ම පතා වදුළ සෙයෙක.

සමීඥයන් වහන්සේ ද මේ මහාතමයාට මේ දානයෙහි මේ පූජායෙහි බලයෙන් ඔහු කවර සිද්ධියක් වේ ද්‍රෝ යි සිතා වදුරණ සෙයෙන් ඔහු හමන් වහන්සේ සේ ම බුදුවන බව දැනැ සිවු වණක් පිටින් වැඳ 'මේ මහාපුරුෂ තෙම අනාගතයෙහි ගෞතම නාම සම්‍යක් සම්බුද්ධ වෙයි" යනාදින් දීපංකර සඞ්ඝාමින් වහන්සේ වදුළ සිද්දෙන් ම විවරණ පතුල් දී වදුළ සෙයෙක.

එ බස් ඇසූ සඞ්ඝාමිදරුවෝ මම අනාගතයෙහි බුදු වෙම්ල! යි එම සමතිස් පැරුම් පිරීමෙහි දැස ග්‍රහණය කොටැ වදුළ සෙයෙක. මෙසේ මාගේ සඞ්ඝාමිදරුවන් නාගා'ත්මභාවයෙහි සිටැ පොවා බුද්ධ ශාසනයෙහි මහාපරිත්‍යාග කොටැ මෙම ධර්මය ම පැතූ පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් මෙසේ මහතුන් විසින් පතන ලද්දාවූ සම්බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ නිසෙවිත වූ චිත්ත ශුද්ධි කාරණ වූ සද්ධර්මය ම සරණයෙමෝව යි **දහම් සරණ යා යුතු.**

4. සුමන සම්බුද්ධ විවරණ කථා.

මෙසේ **සුමන සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ** ත්‍රෛලොක්‍ය ශිඛා මණි විලාශ දක්වා පරිනිෂ්පන්න වූ බුද්ධ කෘත්‍යය ඇතිවැ-පිරිනිවන් පැ කල්හි ශාසනය ද ක්‍රමයෙන් අනන්තඛ්‍යයට පැමිණි කල්හි ක්‍රමයෙන් එක් බුද්ධාන්තරයක් ඉක්මුණු කල්හි සම්භ්‍රිංශත් පාරමිතා පූරණ ප්‍රාවිණ්‍ය ප්‍රතිලබ්ධ ප්‍රඥ ප්‍රකෘති ඇති ලොකාර්ථ නිරත වූ **රෙවත නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ** තුෂිත පුරයෙහි ඉපිද ලලිතා'ම්බ දෙවතා වනිතා කටාක්ෂ ශූලකොටි සමූන්මූලිත මානාබන්ධ ඇතිවැ මධුපාන කෙලි රසික වැ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය,

5. රෙවත සම්බුද්ධ විවරණ කථා,

1. කොට හෙම්වසි. — ඇකැම්.

සව්‍යපෙක්ෂ පඤ්චවිධා'ක්ෂ සන්තති'තෙක සාපෙක්ෂවැ ආයු පමණින් එහි සිටිවැ දෙවතාවන්ගේ ආරාධනායෙන් **පඤ්චමහා විලොකනය** කොටැ :-

අමිත ධනාවිත[1] **ධනධාන්‍යාභිධාන** නගරවරයෙහි ත්‍යාග, සත්‍ය, ශෞය්‍ය, විපුල වූ **විපුල** නම් මහරජානන් වහන්සේගේ කුලෙහි **විපුලා** නම් අග්‍ර මහිෂීන් වහන්සේගේ කුසයෙහි පිළිසිඳැගෙණැ දසමාසා'නන්තයෙන් ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩි ප්‍රණය රස මධුර දශින වූ **සුදර්ශනා** දෙවින් **වහන්සේ** ප්‍රධාන කොටැ ඇති දෙනිස් දහස් නාටක සත්‍රීන්ගේ කුව කැලැඹ සෛවර සඤ්චාරයට භවතෝ'පාන්ත සරසිවැ **සුදර්ශනා** දෙවියන් **වහන්සේ** කුසින් හෘදයහරණ[2] වූ **වරුණ** නම් කුමාරයන් වහන්සේ ප්‍රස වූ කල්හි:-

බ්‍රහ්මා'පණීත නිමිත්ත විශෙෂ සන්දර්ශනයෙන් සඤ්ජාත සංසාර විරාග ප්‍රව්‍රජ්‍යා රාග ඇතිවැ මහා පරිවාරයෙන් **ආජානිය** රථයෙන් **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ කොටිප්‍රමාණ පුරුෂයන් හා එක්වැ මහණවැ සත්මසක් **මහාවීර්‍ය** කොටැ පෙරුන් **මස** මැදි **පොහෝ දවස්** අකලඞ්ක යශොධර **යශොධරාභිධාන** වනිතොප'ණීත පායාසාන්නභව පුර්‍වාඞ්ගම කොටැ සල්වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි **වරුණ්ණිනා** නම්වූ ආජීවකයා විසින් දෙන ලද අට මිටක් තණ පිළිගෙණැ,

විකව කුසුමොදර[3] ප්‍රස්‍යන්දමාන මන්ද මකරන්ද බින්දු සම්බන්ධ සුරභි භූත **නාගබොධි** ද්‍රුමෝ'පසර්පණය කොටැ පසලොස් රියන් **වජ්‍රාසනයෙහි** වැඩැ භිදැ මාරවාරණ මාන විදුරණෝ'ක **පඤ්ඤා නන**වැ සර්‍වඥතාඥාන සම්ධිගමයෙන් සම්පූර්‍ණ වූ මනොරථ ඇතිවැ සප්ත සප්තා'හානික්‍රමණයෙන් **බ්‍රහ්මාරාධනා** පිළිගෙණැ **අනන්‍ය** ප්‍රවර්තනීය **ධර්මචක්‍ර ප්‍රවර්තනයෙන්** විනිවර්තිත සංසාර දෙෂ වෛෂම්‍ය ඇතිවැ එතැන් පටන් අමා ගඟක් බහන්නක්හු මෙන් හෘදයා'නන්දයට බිඳුවට වපුරන්නාක්හු මෙන් ලොකා'සාදයෙහි අස් බිඳුනක්හු මෙන් ශීලයට ජයසනාමහ භිදුවමින් සමාධියට අනිෂෙක කරවමින් ප්‍රඥාවගේ ආඥාවෙහි මුළු ලොව පවත්වමින් ලොකාර්‍ථයෙහි තත්පරවැ වසන සෙයෙක.

එසමයෙහි අපගේ සවාමිදරුවෝ සමතිස් පැරැමෙහි අඩු පුරමින් සෞඛ්‍යයෙහි කුළු ගන්වමින් පරාක්‍රමයෙහි නිමාම් දක්වමින් බොධිසත්ත්වව්‍රතයෙහි මුල් බස්වමින් කාරුණ්‍යයෙහි

1. ධාන්‍ය විලිත. — ඇතැම්. 2. හෘදයාහරණ වූ — අනැම්
3. කුසුමොදර — ඇතැම්

තාරුණ්‍ය ය දුරු කෙරෙමින් ජාතියෙන් ජාතියෙහි සංසරණය කෙරෙමින් රම්‍යවති නම් නුවර අතිදෙව නම් බ්‍රාහ්මණවැ චාතුවේද විද්‍යාස්ථාන මහා සාගර පාරගතවැ නානානුභාවයෙන් වෙසෙමින් බුදුන් ලොකයෙහි උපන් බව අසා හකනි ප්‍රසාද පුරස්සරවැ සවීඥයන් වහන්සේ කරා එළඹැ රූප නිරූපණයෙන් හා කරුණාමෘත ප්‍රවචනා'කර්ණයෙන් හා සඤ්ජාත වූ ප්‍රීති සෞමනස්‍යය ලෙන් උතුරවන්නාක්හු මෙන් **සොළෝ දහසකින්** සතුති කොවැ වඳුළසේක.

මෙසේ සතුති කොවැ වඳුරා අන්තයෙහි තමන් වහන්සේගේ දසරුවෙහි හුවූ ඇසුන් බවතා උතුරු සළුවෙන් පූජා කොටැ වඳුළ සේක. මේතුවූ ශාසනීයක් කොවැ පූජාවක් කොවැ ද අනිකක් නො පතා සබ්බඤ්ඤුතඤාණයෙන් මේ බුදුන් වහන්සේ විසින් පසක් කරණ ලද සද්ධම්ම ම පතා කෙරෙමි ව යි කියා සද්ධම්ම ම පතා වඳුළ සේක. ඒ සවීඥයන් වහන්සේ ද ඔබගේ චිත්තාචාරය දැනැ "මේ **මහාපුරුෂ** යාණන් මෙහි තමා කළ සතුතියෙහි හා පූජායෙහි අනු සසින් මතු යටි ලොකොත්තම වූ **ගෞතම** නම් බුදුවෙයි" යනාදින් **දීපඞ්කර** ආදීන් වඳුළ පරිද්දෙන් විවරණ පතුල් දී වඳුළ සේක.

මාගේ බොධිසත්ත්වයන් වහන්සේ ද සවීඥයන් වහන්සේගේ බස් අසා මතු බුදුවෙමි යි යන අදහසින් පාරමිතා පුරණයෙහි ම තත්පරවැ වඳුළ සෙයෙක. මෙසේ මාගේ සවාමි දරුවූ **ගෞතම සම්‍යක් සම්බුද්ධ** වූ සවාමි දරුවන් විසින් නොයෙක් යතන කොවැ සංසාරයෙහි මහා දුක් ගෙණැ අන්තයෙහි බෝ මැඩැ වැඩැ හිඳැ පසක් කොවැ වඳුරා මහා කරුණාවෙන් ලොවට ප්‍රකාශ කළා වූ ශාන්ත වූ ප්‍රණීත වූ අමාමහ නිවන් දෙවන්නා වූ සද්ධම්ම ම සරණ යෙමි යි **දහම් සරණ** යා යුතු.

5. රෙවත සම්බුද්ධ විවරණ කථා.

මෙසේ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ **රෙවත** නම් සවාමි දරුවන් පිරිනිවි කල්හි ශාසනය ද ක්‍රමයෙන් අන්තර්ධාන වූ කල්හි එක් බුද්ධා'න්තරයක් ඉක්මුණු කල්හි සාරාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් පිරූ පාරමිතා

6. සොභිත සම්බුදු විවරණ කථා.

ඇති ආකාරණ[1] කරුණා පලොහිතවූ චිත්ත ඇති **සොභිත** නම්

1. අකාරණ—ඇත්.

සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දෙවතාවන්ගේ ආරාධනාව පිළි ගෙණ නුසිත භවනයෙන් චුතවෑ පරම ධර්මිෂ්ඨවූ සුධම්ම නම් මහ රජාණන් වහන්සේ නිසා පතිව්‍රතා ධම්ම පර සුධම්මා නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳෑ ගෙණ;

ප්‍රසවවෑ ක්‍රමයෙන් වැඩි විවකිල දශීත වූ අඛිල ගුණ ගණාභි රාම වූ අඛිල දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇත්තා වූ සැත්තෑ දහසක් නාටක ස්ත්‍රීන්ගේ රති කෙළි ශ්‍රාන්ත කුවා'න්ත නිර්‍ශාන්ත සෙවද'බ්බධාරා නිර්‍ශාර රති කුලමථු ඇතිවෑ කල් යමා දසදසක් හවුරුදු ගිය කල්හි පුරුෂ සිංහ වූ සිංහ නම් කුඛාරාජයන් උපන් කල්හි බ්‍රහ්මාප'ණීත චතුර්විධ පූජී නිමිත්ත සඳහාගතාවිභාවයෙහි දී ප්‍රාසාදයෙහිදී ම මහණවෑ සද්දවසක් මහාවියහි කොටි වෙසක් මසැ මැදි පොහෝ දා අඛිල මහාදෙවින් විසින් දෙන ලද කිරිපිඬු වළඳා ප්‍රාසාදයෙන් බැසැ නාගබොධි මූලයට නිස්ක්‍රමණ ක්‍රමයෙන් වප්‍රාඝනාරූඪවෑ පශ්චිමයාම සමනන්තර සම්බොධිඥාන සම්‍යක් සම්බොධි ඇතිවෑ ක්‍රමයෙන් සත් සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙණ ධම්මක් පවත්වා ලොකාභි කොටැ වදාරණ සේක.

එ සමයෙහි අපගේ බොධි සත්ත්වයන් වහන්සේ රම්‍යවති නම් රාජධානියෙහි ප්‍රවර වූ රූපධෙය ඇති රූප ගත වූ භාග්‍යධෙය ඇති සම්භෘ ඥානධෙය ඇති ශ්‍රද්ධෙය වූ කරුණාවිධෙය වූ සකල ලොකානිධෙය වූ හෘදය සන්නිධෙය වූ සුජාත[1] නාමධෙය වූ බ්‍රාහ්මණවෑ සම්භෘයන් වහන්සේ කරා එළඹැ සද්ධම්ම රසාස්වාදය කොටැ දැන් මෙ දවස් තුන් ලොව ම තමන් සරණ යන්නා සේ ද තුමූ ද එ දවස් තුණුරුවන් සරණ ගොස් බුදුන් වහන්සේ පවරා පසුව මහා ගඞ්ගා ප්‍රවාහය එක තැනට තමන්නා සේ නානාවිධ වූ මහදන් පවත්වා ඒ දන් කෙළවරෙහි ලොකයෙහි පැතිය යුතු සියලු වස්තූන් අතුරෙන් එක ද වසතුවකුත් නො පතා මෙහි පෙළෙන් මම අනාගතයෙහි මේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පසක් කොටැ වදාළ සද්ධම් ය ම පසක් කට හෙම්ව සි කියා ප්‍රාර්‍ථනා කළ සේක.

ඒ සම්භෘසෝ ද අනාගතාංශ ඥානයෙන් මහා පුරුෂයානන්ගේ මනොරථය සිද්ධවන බව දැන "මෙහි පෙළෙන් මහා පුරුෂ තෙම අනාගතයෙහි ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙයි" යනාදීන් විවරණ පතුල් දී වදාළ සෙයෙක. ඒ ඇසූ මහා පුරුෂයානන් වහන්සේ මම අනාගතයෙහි මේ බුදුන් වහන්සේ ම පසක් කළ සද්ධම්ය ම පසක් කෙරෙම්ල! යන අදහසින් එම සමනිස් පැරැම්

1. අජිත—ජාතකට්ඨකථා

පිරීමෙහි දැසග්‍රහණය කොටැ වදාළසේකැ. මෙසේ ම,ගේ සම්බුද්ධි යන් වහන්සේ විසින් ඒ ඒ ජාතියෙහි ඒ ඒ බුදුන් හමුයෙහි පතා ලද සඳහිමිය ම සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

6. සොගින සම්බුද්ධ විවරණ කථා.

මෙසේ එකාලොඑ කෘත විසව ලොකි වූ **සොගින නම්** වූ සම්මා සම්බුදුන් වහන්සේ විරිතිවි කල්හි එතැන් පටන් එක් අසඞ්ඛ්‍ය යක් කප් මුළුල්ලෙහි කිසි බුදොා'තපාද

7. අනවමදස්සි සම්බුද්ධ විවරණ කථා.

ඔහොතසවයෙක් ලෝකයෙහි නො වී ය. එහෙයින්ම මේ කතිව්‍යය,මේ අකතිව්‍යය, මේ මාගීය, මේ අමාගීය, මේ සාවද්‍යය, මේ නිරවද්‍යය, මේ දුරවරිතය, මේ දුශ්චරිතය යි විභාගයක් නො දැන්වේක් අදහා මූ ලොවට බුද්ධාදිත්‍ය විගමයෙන් මොහාන්ධකාර විජෘම්භනය ම වී ය.

එසේ එක් අසඞ්ඛ්‍යයක් ගිය කල්හි සකල ලොක මනොරථෝ'ක නිෂ්පාදනෝ'ක කලපවෘක්ෂ වූ[1] එක් කලපයෙක්හි පරමාර්ථ දර්ශී වූ **අනවමදර්ශි** නම් සවාම්දරුවෝ ය, ශ්‍රමණ පද්ම වූ **පදුම** නම් සවාම්දරුවෝ ය, අතවරාග්‍ර සංසාර දැවූ **නාරද** නම් සවාම් දරුවෝ යැ' යි මෙසේ සම්‍යක් සම්බුද්ධයෝ තුන්දෙනෙක් ලෝකයෙහි පහළ වූහ.

එහි අනොම නිර්මාණ දර්ශිවූ **අනොමදර්ශි නම්** සොදරුවෝ සමතිස් පැරැම් පුරා තුසි පුරයෙන් චුතවැ සමපතති සාන්ද්‍ර වූ **චන්ද්‍රවති** නම් රාජධානියෙහි දුරවගාහ ප්‍රතාප භාසවත් වූ **යශවත්** නම් වූ මහරජානන් වහන්සේ නිසා අප්‍රතිහත යශොධර වූ **යසොධරා** නම් දෙවින් වහන්සේගේ කුසියෙහි පිළිසිඳ ගෙණැ පිළිසිඳ ගත් දවස් පටන් ගෙණැ අසූරියනක් තන්හි රැ දවල් මුළුල්ලෙහි සඳ දහස් හිරු දහස් නැංගා සේ ආලොක පවත්වමින් මවු කුසැ වැසැ දස මසෙකින් ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී තයතෝ'න්මාද ඉෙවන ශ්‍රීමත් වූ ශ්‍රීමති නම් දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇත්තා වූ සත්‍රින් ලක්ෂයක් දෙනාගේ වදන වනජ විකාශ භාසකරවැ දස දසක් හවුරුදු ගිහිගෙයි වැසැ ශ්‍රීමති දෙවින් වහන්සේගේ කුසියෙන් සකල ලොක ප්‍රේමකාරණා වූ **උපවාණ** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි:-

---

1. නිෂ්පාදනෝක කලපවෘක්ෂ වූ — ඇක.

බ්‍රහ්මාපණීත චතුර්විධ නිමිත්ත සන්දර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාෂවැ රන් සිවි ගෙයකින් **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ තුන් කෙළක් මිනිසුන් හා එක්වැ මහණවැ දස මසක් **මහාවියූහ** කොටැ සකල ලොක විනොකත්ව කාරණ වූ **විශාඛ පූර්ණමාසිය** එළැඹැ සිටි කල්හි **අනූපම** නම් බ්‍රාහ්මණ ග්‍රාමයෙහි සිටි දියණි කෙණෙකුන් විසින් පිළිගන්වන ලද්දවූ කිරි පිඬු වළඳා, සල්වෙතෙහි දිවාවිහාර කොටැ **අනොපම** නම් ආජීවකයා දුන්නා වූ අව මිටක් තණ පිළිගෙණැ සජ්ජන පූජිත වූ මාරතර්ජන කර වූ **අර්ජුන** බොධි මූලයට එළැඹැ:-

අවතිස් රියන් **පමණ** වප්‍රාසනයෙහි හිඳැ කුමාර මාර තරුණ තරණී මණ්ඩලාග්‍රාසෛ'ක[1] ධ්‍රුවග්‍රහවැ යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයය සිද්ධකොටැ පශ්චිමයාම සමධිගත සර්ව්වඥතාඥානවැ සත්සතිසථාන බ්‍රහ්මාරාධනාව පිළිගෙණැ **ධර්මඝණ්** යටහිමින් බැලූ බැලූ සත්ත්වයන්ගේ ඇසැ ඇසැ සමනිස් පෙරැමෙහි අඟහසේ බදුවූ රැව අදිමින් සියලු ලොව එක ධර්මශාලාවක් සේ කෙරෙමින් එක නිවස් තොටක් සේ එක කුසල් බඩු පවනක් සේ එක ඇදුරු ගලක් සේ එක ධර්මරතන නිධානයක් සේ පවිත්‍ර කෙරෙමින් කුලයෙන් කුලයෙහි ග්‍රාමයෙන් ග්‍රාමයෙහි නිගමයෙන් නිගමයෙහි රාජධානියෙන් රාජධානියෙහි මොහ නිද්‍රා දුරු කෙරෙමින් මෙඟන මුද්‍රාව බිඳිමින් සද්ධර්මාඹත නිඝෙකය කෙරෙමින් වසන සේක.

එ සමයෙහි අපගේ සඟම්දරුවෝ ලොකාර්ථ තත්පරවැ බොධි පාක්ෂික ධර්මයන් මුහුකුරුවමින් මරහුගේ විරෝධ අස්සිර කෙරෙමින් ඇසිපිය එළාළන ඇසිල්ලකුදු සසරට ඔද වඩනා කටයුත්තක් නො කෙරෙමින් **කරණ** කටයුත්තෙහි බොධිසත්ත්ව ධුරය සරහමින් **යස්ස සෙනාධිපතිවැ** බුදුන් ලොකයෙහි උපන් බව අසා සතුටුවැ එළඹැ ඉණ අසා සත් රැවන් මඬුවක් නිමවා එහි සපරිවාර සර්ව්ඥයන් වඩා හිඳුවා මහ දන් දුන්හ.

බොධි සත්ත්ව වුව! දෙවතා වුව! බුදු කෙණෙකුන් දුව! දනව් පවන් ගත! කවර ලෙස ඔහු දන් දෙද්ද? ඒ මම මෙලෙස කැ සි කෙසේ කියා නිමවම් ද? එසේ සදිව්‍ය ලොක සම්පත්තිය එකවාර කරන්නා සේ මහදන් දුන් මහා පුරුෂයාතන් වහන්සේ අනික් සම්පත්තියක් ම නො පතා ම මෙ ම ධර්මය ම පසක් කෙරෙම් මැ සි ධර්ම ලොභයෙන් ප්‍රාර්ථනා කොටැ වදාළ සේක.

---

1. මණ්ඩලාග්‍රසෛ'ක — ඇතැම්

සර්ව්‍යඥයන් වහන්සේ ද ඔවුන් වහන්සේගේ අදහස් දැක "මේ මහා පුරුෂ තෙම මේ දැනයෙහි අනුසසින් මතු ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙයි" කියා දීපඞ්කර සාමින් වදාළ පරිදි දෙන් ම විවරණ පතුල් දී වදාළ සෙයෙක. එබස් ඇසූ මහා පුරුෂයානත් වහන්සේ ද මම මතු බුදුවෙම් යි යන අදහසින් එම සමතිස් පැරැමෙහි තපපරවැ වදාළ සේකැ. මෙසේ මාගේ සවාමි දරු වූ තිලෝගුරු වූ ශාක්‍ය සිංහයන් වහන්සේ විසින් කොසෙක් උත්සාහයෙන් පතා පසක් කළාවූ ධර්මය සරණ යෙමි යි දහම් සරණ යා සුතු.

7. අනවම දර්ශි සම්බුද්ධ විවරණ කථා.

මෙසේ ත්‍රිකාල දර්ශි වූ අනවමදර්ශි නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ නිරිහිඳුන් සැ පසු එක් බුද්ධාන්තරයක් අතිත වූ කල්හි පුරණ ලද්දා වූ සමතිස් පෙරුම් ඇති නිරුපම වූ බුද්ධ ශ්‍රී පද්ම වූ විකසිත මුඛ පද්ම වූ පදම[1]

8. පදුම සම්බුද්ධ විවරණ කථා. නම් සවාමිදරුවෝ තුසිපුර යෙන් චුතවැ සකල ලොකාර්ථ සම්පාදක වූ ඛම්‍යා නම් පුරවරයෙහි සකල ගුණ ගණයෙන් අප්‍රතිසම වූ **අසම නම්** මහ රජානත් වහන්සේ නිසා කල්‍යතා සම වූ තනු ලතා විලාස ඇති **අසමා** නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ක්‍රමයෙන් ප්‍රසවවැ වැඩි රුවිර යෞවනාවතාර පරම මධුරීභූත ශරීර ශොභාවෙන් ලොකොත්තර **උත්තරා** නම් මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොවැ ඇත්තා වූ නිත් දහසක් නාටක සත්‍රීන්ගේ මධුරා'ධර වශකොපනීත ගණ්ඩූෂ මධුපාන මත්තවැ දස දහස් හවුරුදු යවා නිරති'ඝය සෙනඟොත්තර වූ **උත්තරා** නම් මහාදෙවින් වහන්සේ **පරමරම්‍ය** නම් කුමාරයන් වැදූ කල්හි:-

බ්‍රහ්මොපණීත වූ චතුර්විධ නිමිත්ත සන්දර්ශනයෙන් සංසාරයෙහි උවිග්ත්තවැ ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාෂවැ නිර්‍ය්‍යාජ මනොරථ සාධනීය වූ **ආජානීය** රථයෙන් **මහාභිනිෂ්ක්‍රමණය** කොවැ පුරුෂයන් කෙළක් හා කැටිවැ මහණවැ අට මසක් **මහාවීර්‍ය්‍ය** කොවැ වෙසක් මසැ මැදි පොහෝදා **ඛණ්ඩවතී** නම් ග්‍රාමයෙහි ධන්‍ය ශ්‍රෙෂ්ඨිහුගේ දූ වූ අතිධන්‍යා වූ **ධන්‍යවතිය** විසින් පිළිගන් වන ලද්දා වූ කිරිපිඬු වළඳා නයන මනොහර වූ මධුකරා'කර සහකාර වනයෙහි දිවා විහාර කොවැ—

1. පදුම — ඇතැම්.

නානාවිධාජීවකොපනීත අෂ්ට තාණ මුෂ්ටි ග්‍රහණවැ තරුණ ශොණ පල්ලවාතිරාම මහාශොණ බොධි ද්‍රැමයට එළඹැ අට තිස් රියන් වප්‍රාසනයෙහි චතුරඞ්ග වීර්‍යාධිෂ්ඨාන පූර්‍වාඞ්ගමවැ වැඩැහිදැ මාර සාගස ප්‍රභාව තව නානු ප්‍රතාන තුහින ලේසයට පමුණුවා යාමිත්‍රයයෙහි විද්‍යුත්‍රයය සිදිඹ කොවැ බ්‍රහම මුහුනීයෙහි සකල කාල දෙශ සභාව ව්‍යවහිත කෘෂ්ණ ශුකල තින ප්‍රණීත සාවද්‍යතවද්‍ය තෙකවසතු විසතර තත්ත්‍වාවභාවී වූ සම්බුදතාඥත ලදින් ක්‍රමයෙන් සත් සති යවා බ්‍රහමාරාධතා පිළිගෙණැ ඛණ්ඩපරශු යොද්‍යානයෙහි වැඩැ භිදැ ධම්මක් පවත්වා ධම් මකරන්ද සනෙහ නිෂ්‍යන්ද පද්ම වූ පද්ම නම් සඞ්ඝාම්දරුවෝ ක්‍රමයෙන් ලොකානු ශාසතා කොවැ වසන සේක් :-

එක් සමයෙක්හි මධුර ගුම්බ ගුමා'රව මුඛර ඉඩුකර නිකර නිරන්තර වූ ප්‍රවල ප්‍රවාල ජාලාදනතුර වූ තරුණ සහකාරබිම්බාරාසාවාද වපල කොකිල කුලයා විසින් කරණ ලද කුහුක්කුහුරවයෙන් මනොහරවූ ශිතලච්ඡායායෙහි හොත්තා වූ තරුණා'රුණ හරිණ ගණයා විසින් කරණ ලද රොමන්ථයෙන් මන්ථර වූ මිදුණ මාරු තාළෙලිත වූ නව ලතා වනිතාවන්ගේ පල්ලවා'ඞ්කුරාවිෂ්කාතයෙන් සනතුෂ්ටවැ ගත්තා වූ තරුණ පුෂ්පා'ඞ්කුර තැමැති රොමා'ඞ්කුර ඇති ඡායා ද්‍රැමයෙන් හොබතා වූ සනතතා'රබ්ධ වූ සිදධ චිද්‍රුධර යන්ගේ සඞ්ගිත ප්‍රසඞ්ග ඇති වන මහිෂ විහාණ ඝාතයෙන් සුර්ණිත වූ සරොරොධස් ඇති මත්ත මාතඞ්ගයන්ගේ සථූල කපොල භික්තින් වැහෙන්තාවූ දුන ධාරා නිපාතයෙන් සුරභිභූත වූ භූම්භාග ඇති කිසිතැනෙක්හි කපුරු සුණු සේ සුදු වූ වැලිතලා ඇති :-

කිසි තැනෙක්හි සිඛණ්ඩි මණ්ඩලයාගේ එකජීවිකාය මාන වූ විසතිර්ණ වූ සිතල ජල ඇති කිසි තැනෙක්හි නවශාවල කම්බලාවා ගුණ්ඨිත වතසථලි සීමන්තිනීන් ඇති කිසි තැනෙක්හි විකසිත චමපක වනෝ'දිභූත සෞරභ්‍ය ප්‍රසරයෙන් සුරභි භූත වූ වත මසනක ඇති කිසි තැනෙක්හි උද්ගන්ධි ශිතලගන්ධි විටප විගලිත පුෂ්පා'ඞ්කුරයෙන් කරාල වූ භූම් මණ්ඩල ඇති—

කිසි තැනෙක්හි විශාල සාල තරු වනයන්ගේ නූතන ප්‍රශූන සම්පතියෙන් පරම රමණීය වූ කිසි තැනෙක්හි විකසිත වකුල ධූලි පට්ලා'නයන පරිශ්‍රාන්ත මන්ද මාරුත සන්තාපයෙන් දුරුකරණු ලබන්නා වූ ශරීර කලාන්ත ඇති කිසි තැනෙක්හි විනිද්‍ර සාන්ද්‍ර නාග පරාගා'නු රාගයෙන් පිඤ්ජරිත වූ පථික නිකුඤ්ජ ඇති කිසි තැනෙක්හි ගිරි ශිඛරයෙන් වැහෙන්නා වූ නිර්ඣර ක්ෂිලලරීන්ගේ

ඞිංකාරයෙන් මනොහර වූ කිසි තැනෙක්හි සෛවෙර විහාර නිරත ශබර පුලිඳු සුඳුරින්ගේ මධුර ගායනායෙන් මනොහර වූ වන යකට වැඩ :-

අවෙතසක වූ වෘක්ෂයන් විසිනුදු මඳ'නිලා'සෙලිත වූ නව මඤ්ජරී චාමරයෙන් ව්‍යාධූයමානවැ පුෂ්පා'සවාද විදගධවැ හඬන් නාවූ කොකිලාවන් විසින් ම සඞ්ගීයමානවැ වන සරසුන් විසින් පද්ම තැමැති මුඛයෙහි තබනලද රාජහංස තැමැති සකින් පුබුතා ලදින් අන්‍යෝ'න්‍ය ප්‍රීතියෙන් යුකතවූ නිත්‍ය විරොධී සතතියන් පරම මෛත්‍රියෙහි රස දන්වමින් එක් වෘක්ෂයක් මූලැ ප්‍රහාතත වෛතන්‍යෝ'පරොධ ඇති නිරොධ සමාපතතියට සමවැදූ වැඩ හුන් සේක.

එ සමතයස් මම් මවු වූ මව ම පිය වූ මව ම සරණවූ මව ම පරාඛණවූ ලොකනාථ **සම්‍යක් සම්බුදධයන් වහන්සේ** ජාති යෙන් ජාතියෙහි අලංකාර කොටැ ඇවිදිමින් එම වනයෙහි දංෂ්ට්‍රා බලයෙන් බාහුබලයෙන් උභරුබලයෙන් නඛ බලයෙන් මුඛ බල යෙන් සම්පන්නවූ රුචිර කෙශර විසර විසඵාර[1] සමබන්ධයෙන් බන්ධුරවූ සාකණ්ඩ සකී ඇති සඵා'නොචිත වර්ණවිශෙෂයෙන් විරාජ මානවූ අඹ ප්‍රතාඃඛ ශොභා ඇතිවැ **සිංහරාජවැ** උපන් සෙයෙක.

සා වැ උපන් කලැ පවා සිංහ විලාස දක්වන්නාවුන් **සිංහවැ** උපන්කලැ කරන්නාවූ වික්‍රමය කෙසේ කියම්ද? ඔහු එ වල්හි වසමින් වන ඝටාසෙන් වන ඝටායට නිශ්ශඞකාවැ ඇවිදිමින් පවනා'නුපාත විවලිතවූ තරුවනයන් විසින් දෙන කුසුමාඤ්ජලී පිළිගන්මින් විසි තිස් යොදුන් පමණ මහගල් ඇගින් හෙත ඟැල්ලෙන් විසිරෙන ජල බිඳු ඇඟැ ගස්ව ගස්වා රන් රිදී අතලෙහි සිවැ සිවැ යෙහෙන් සැත පෙමින්—

කිසි තැනෙක්හි සුපක්ව වූ ඇම් ඵලයෙහි තුඩු දී මධුර නාද-පවත්වන්නා වූ කෙවිල්ලන්ගේ හඬට කණ නමා කර බිඳැ සිටි මින් කිසි තැනෙක්හි තමන් දැකැ පත පතහි දිවත මතැත් කැල බලා දර්පයෙන් කර නඟා සිටිමින් කිසි තැනෙක්හි පිපාසිත වැ පඤ්ච වණී පද්මා'කිණී වූ වත සරස්හි තුඩු ඔබා ද්‍රවැ ගියා වූ **ඉන්‍ද්‍රනීලමාණික්‍ය** රසායමාන වූ සීතල සලිල පානය කෙරෙමින් කිසි තැනෙක්හි දුරින් දැකැ මොහාඞ්කාරවැ එළඹෙන්නා වූ තරුණතර සිංහින්ගේ අතරුණ සෙනහයෙහි රස විදිමින් බුදුන් වහන්සේ වැඩහුන් තැනට අවුත්:-

---

1. විසතාර - ඇතැම්.

බුදුරුවන්[1] බලා ඇස් අනිත් දසාවකට තමා ලිය නොහි එක පියවරකුත් අනික් තැනකට සොල්මාලිය නො හි ඇසිපිය හෙළා ලන ඇසිල්ලකුදු කප් සියදහස් කොටැ සිහමින් නිර්විසාද වූ ප්‍රේමයෙන් හා ප්‍රසාදයෙන් හා ආදරයෙන් තැම් තැම් වඳිමින් ගෞරවයෙන් කණ් වාලධිය ආදිවූ අවයවයන් නොසොල්වා පැදකුණු කෙරෙමින් ඇතුළෙහි පිරිහිය සෙනහස හෘදයෙන් උදාරය පවත් වන්නාක්හු සේ තුන් වටෙක සිංහනාද කොටැ බුද්ධා'ලම්බණ ප්‍රීතින් ගොවරයෙහි අසා හැර මෙ වැනි සවාමිදරු කෙණෙකුන්ට මාගේ ජීවිතයෙන් පූජා කෙරෙමියි ශ්‍රීපාදමූලයට නුදුරු තැන්හි හිස තබා හෙවැ ගෙණැ සිත්තමැ ඇඳ පූ රුවක් සේ ගල්හි කොටා ලූ රුවක් සේ නිශ්චල වැ නිරොධ සමාපත්ති බලයෙන් සත් දවසක් මුළුල්ලෙහි නිරාහාරවැ වැඩැ හිඳිනා සවාමිදරුවන් හා කැටිවැ බුද්ධා'ලම්බණ ප්‍රීති බලයෙන් තමන්වහන්සේ ද නිරාහාරවැ වැඩැ හොත් සෙයෙක.

එසේ වැඩැ හෙවැ අනික් වසතුවක් නො පතා "මේ ප්‍රසාද යෙහි අනුසසින් මම ද මේ සවාමීන් දුටු නිවත් දහම් පසක් කටහෙම් වසි" පතා වදළසේක. ඉක්බිති නිරොධ සමාපත්තියෙන් නැඟි සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ද මෙසේ වැඩැහොත් සවාමිදරුවන් දැකැ 'මේ සිංහරාජ තෙම අනාගතයෙහි ගෞතම නම් ධම්රාජ වෙසි' යනාදින් ව්‍යාකරණ දී වදළසේක.

එබස් ඇසූ බොධි සත්වයන් වහන්සේ ද මම ද බුදු වෙමිල! යන අදහසින් සමතිස් පැරුම් පිරීමෙහි ම තත්පර වූ සේක. මෙසේ මාගේ සවාමිදරුවන් සිංහරාජවැ උපන්කලැ පවා සම්බුදුයන් වහන්සේට දිවි පුදා සත් දවසක් නිරාහාරවැ හෙවැ මහා දෙළින් පතා ලද්දා වූ ආදී මධ්‍යා'නත කල්‍යාණ වූ ධම් රතනයම මව අභිමතාර්ථ සාධා දෙන පිණිස සරණ කොටැ ගන්මි සි දහම් සරණ යා සුතු.

8. පදුම සම්බුදු විවරණ කථා.

මෙසේ මනොමල දහන දුවානල වූ පදම තම් සවාමිදරුවානන් වහන්සේ ලොකා'ලොචන වකොර චන්ද්‍රිකායමාන සවණිකානන්නින් හා ශ්‍රවණිය පියුෂ නිෂෙක මනොහර භාරතී විලාසයෙන් හා ජගදා'නන්දනය කොටැ අනනයෙහි

9. නාරද සම්බුදු විවරණ කථා. නියති නියොගාතික්‍රමණා'සම්භවැ නිරුපධිශෙෂ නිර්වාණ ධාතුයෙන්

---

[1] බුදුරුවන් — ඇතැම්.

පිරිනිවි කල්හි ක්‍රමයෙන් ශාසනය අන්තර්'හිතවැ බුද්ධාන්තරයක්[1] ඉක්මුණු කල්හි තෘෂ්ණා'හිලාෂ ලතොන්මූලන කෙළි විරද වූ සමස්ත ලොක ශොක විනොද විද්‍ධ විශාරදවූ දෘෂ්ටි'ධ්‍යාශයා නපෙක්ෂිත ප්‍රිඃපුත්‍රදරවූ භුවනා'භොගව්‍යාපි ශෛන කීර්නි පූර පාරවූ චරණ සරණා'පන්න ජනතා බ්‍රහ්ම විහාරද වූ සකල කලි ඝ්මී'පහරණ ප්‍රවීණ මහා නීරදවූ:-

නාරද නම් සම්‍යක් සම්බුදධයන් වහන්සේ සාරාස'ඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි සමතිස් පැරැම් පුරා නිහිත මහිත පරිවිත පාරමිතා මහිමෝ'පහිත මති පරිණාම ඇතිවැ **තුෂිත පුරයෙන්** චුතවැ දෙවසපඪි වූ ප්‍රතාප ඇති සුදෙව **නම්** මහාරජානන් වහන්සේ නිසා **අනවමා නම්** දෙවින් වහන්සේගේ කුක්‍ෂියෙහි පිළිසිඳැ ගෙණැ ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩී සකල කාම සෙතා නායක වූ **විරසෙනා නම්** මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති එක් ලක්‍ෂ විසි දහසක් **පමණ** ඇති තරුණවූ යුවතීන්ගේ වරණ ප්‍රණාම ප්‍රණය ප්‍රසාද විද්‍ධ විදඬිවැ තව දසක් අවුරුදු යවා **විජිත සෙනා නම්** අග්‍ර මහිෂින් වහන්සේ සකල ජන නයන මනෝ තන්‍දතෝ'තතරවූ **නන්‍දනොත්තර නම්** කුමාරයන් වහන්සේ උපත් කල්හි:-

බ්‍රහ්මෝ'පණීත චතුර්විධ නිමිත්ත සංනදශීතයෙන් සංසාර යෙහි කලකිරී ප්‍රව්‍රජ්‍යාවෙහි අභිලාෂවැ එක්වැ සැරහූ මහුලකට තමාගත් සදිව්‍යලොකයෙහි දෙවතාවන් සේ සැදී පැහැදි නික්ම ගත් මහා පරිවාර ජනයන් මධ්‍යයෙහි ශ්‍රීපාදයෙන් ම උයනට වැඩැ මිනිසුන් ලක්‍ෂයක් හා කැටිවැ මහණවැ සත් දවසක් **මහා වියෂ්** කොටැ **වෙසක් මසැ** මැදි පොහෝ දවස් **විජිතසෙනා නම්** අග්‍ර මහිෂින් වහන්සේ විසින් දුන් කිරිපිඬු පිළිගෙණැ වළඳා එම උයන්හි දිවා විහාර කොටැ සවස් වේලෙහි සකල ලොක සුදශීන වූ **සුදශීන නම්** උද්‍යාන පාලයා විසින් දෙනලද්දා වූ අව මිවක් තණ පිළිගෙණැ තමන්ගේ නාම මාත්‍ර සමරණය කළ සත්ත්වයාහට සවගී'පවග්‍ර මාගී'රොපණය කරන්නා වූ **මහාශොන** බොධි ද්‍රැම වර මූලයට එළඹැ:-

අව **පණස්** රියන් **පමණ වජ්‍රාසනයෙහි** වැඩැ හිඳැ යාමත්‍ර යා'ධිගත ඥානත්‍රයය ඇතිවැ පශ්චිම යාම සමනන්තර සමධිගත **සර්ව්‍වඥතාඥාන** ලක්‍ෂමින් සමස්තඥෙයමණ්ඩලයෙහි ඒක රාජ්‍යය

---

1. බුද්ධාන්තරයකුදු — ඇතැම්,

ලදින් සත් සති යවා බ්‍රහ්මාරාධකා පිළිගෙණැ එම උසන්හි **ධර්මසක්** පවත්වා තමන් වහන්සේගේ කරුණායෙහි අඩු පුරමින් බුද්ධකෘත්‍ය මස්සාක ප්‍රාප්ත කෙරෙමින් ලොකයෙහි වසතසේක.

එ සමයෙහි අපගේ බොධි සත්වයන් වහන්සේ **තාපස** ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවැ පඤ්චා'භිඥා අෂ්ට සමාපත්ති උපදවා හිමාලයයෙහි වසතසේක. එ සමයෙහි **නාරද** නම් සම්‍යක් සම්-බුද්ධයන් වහන්සේ අපගේ බොධි සත්වයන් වහන්සේට අනුග්‍රහ කරණු කැමැතිවැ අසූ කෙළක් රහතන්වහන්සේ විසින් හා දස දහසක් අනාගාමී උපාසකවරුන් විසින් පිරිවරණ ලදුවැ බොධි සත්වයන් වහන්සේගේ පන්සලට වැඩිසේක.

ඒ බොධි සත්වයන් වහන්සේ ද **නාරද** ශ්‍රීඝන ශ්‍රීමුඛ සඳෘශීන යෙන් ප්‍රඝඨාවිර්භූත වූ ප්‍රමොද පරම්පරායෙන් පරිපූරිත වූ අනන්‍ය කරණ ඇතිවැ පෙරගමන් කොටැ නානා ප්‍රකාර ආගන්තුක සත්කාර කොවැ තමන් වහන්සේගේ අභිඥ බලයෙන් ආශ්‍රම පදයක් මවා එහි පරිවාර සහිත වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වඩාහිඳුවා රාත්‍රිය මුළුල්ලෙහි ඔවුන් වහන්සේගේ පරම මධුර වූ ධර්මය අසා සිත්හි පතළා වූ ප්‍රීති වේගයෙන්:-

"ජය - ජය - **ශ්‍රමණ පදම!**
ජය - ජය - **ශ්‍රමණ සිංහ!**
ජය - ජය - **ශ්‍රමණ මාණික්‍ය!**
ජය - ජය - **ශ්‍රමණ චන්ද්‍ර!**
ජය - ජය - **ශ්‍රමණ භාස්කර!**
ජය - ජය - **ශ්‍රමණ වතංස!**[1]
ජය - ජය - **ශ්‍රමණ රාජහංස!**
ජය - ජය - **ශ්‍රමණ ශූර!**
ජය - ජය - **ශ්‍රමණ ධීර!**
ජය - ජය - **ශ්‍රමණ පියූෂපුර!**
ජය - ජය - **ශ්‍රමණ ප්‍රදීප!**

ප්‍රතිවාදී විඝට ගජී විඝොෂණ ප්‍රලය මාර්තණ්ඩ!
ප්‍රතිවාදී හරිණ ශාඛ විදාරණෛක පඤ්චානන!
ප්‍රතිවාදී තාල පණ්ණී සවූණී'නෙක නිර්ශඝාත පාත!
ප්‍රතිවාදී මෘණාල නාල විඝෝභ කෙළි දනනාවල!

1. ශ්‍රමණාවතංශ—ඇතැම්

ප්‍රතිවාදී සොඝ පරිවාර විශොෂණෙක සඞ්ඛාවනාර!
ප්‍රතිවාදී මත්සරනක්‍ර දුගීග්‍රාහ සාගර!''

යනාදීන් නොයෙක් ලෙසින් සතුති කොටැ පහන් වූ කල්හි **උතුරුකුරු** දිවින් අහර ගෙණැ අවුත් එපමණ මහා පරිවාර ඇති සම්බුදුයන් වහන්සේ සත් දවසක් වළඳවා අන්නයෙහි හිමාලයයෙහි සඤ්ජාත වූ අනසි වූ ලොහිත චන්දනයෙන් පූජා කොටැ වදුරා ''මේ මා කළ කුසලින් මතු මේ සම්බුදුයන් වහන්සේ සේ ම තව ලොකොත්තර සඞ්ගීය ප්‍රත්‍යක්ෂ කටහෙම්ව යි'' කියා ප්‍රාර්ථනා කොටැ වදළසේක.

ඒ සම්බුදුයෝ ද ඔබගේ චිත්තාචාර දුනැ 'මේ මහා පුරුෂ තෙම තමා කළ බුද්ධ පූජායෙහි හා බුද්ධ සොත්‍රයෙහි අනුසසින් අනාගතයෙහි **ගෞතම** නම් බුදු වෙයි' යනාදීන් විවරණ පතුල් දී වදළ සෙයෙක. බොධි සත්වයන් වහන්සේ ද අවෙත වවන වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ බස් අසා ම 'මතු මම බුදුවැ දහම් පසක් කෙරෙම්ල!' යන අදහසින් බුද්ධ කාරක ධර්මයන් පූරණයෙහි ම තත්පර වැ වදළසේකැ.

මෙසේ මාගේ සවාමි දරුවාතන් විසින් නොයෙක් සුචරිත සහශ්‍ර පූරණයෙහි අනුසසින් නොයෙක් ලෙස පතා බොධි මූල යෙහි වර්‍ධාසනයෙහි වැඩැ හිඳැ පසක් කළා වූ සකල කල්‍යාණ වූ අති මධුර වූ ත්‍රිභුවනෙ'ක සරණ වූ දහම් සරණයෙම් යි **දහම් සරණ** යා යුතු.

9. නාරද සම්බුද්ධ විවරණ කථා.

මෙසේ ශාසන[1] සද්ධර්මාමෘත වර්‍ෂාවූ **නාරද** නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවන් පැ කල්හි, ඒ ශාසනය ක්‍රමයෙන් අන්තරහිතවූ කල්හි, එයින් මතු **එක්**

9. පදුමොත්තර සම්බුද්ධ විවරණ කථා.

එක් අසඞ්ඛ්‍යයක් කප් මුළුල්ලෙහි ම සම්බුද්ධ සුධා රසා'නභිඥවූ සියලු සත්ත්වලොකය වතුර පාය පාතනීයත්වැ[2] මහා'ශුභ භාජනවූහ.

එයින් පසුවැ මෙයට් කප් ලක්‍ෂයකින් ඔබැ සමන්ත භුවන සඞ්කරවූ පරම මහත්තරවූ **පදුමුත්තර** නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සංසාර පූති ගති නිමග්නවූ විශ්වලොකයාගේ පවිත්‍ර සන්තානයට් හෙතුවූ ධර්මමහාහ්‍රදය සංසකරණයෙහි තත්පරවැ සමනිස් පැරැම් පුරා තුෂිතපුරයෙහි ආයු පමණින් සිටැ —

1. ශ්‍රාවක. 2. පාතනීයත වැ.

ධර්මයට වූ බැගෑ හා අධර්මයට වූ බැහැවුම් හා මොහය අභිභෙක කළ පරිදි හා ඥතය අසරණවූ පරිදි[1] හා මිථ්‍යාදෘෂ්ටිය නිෂ්පන්නවූ බව හා තෘෂ්ණාව ජය ලද පරිදි හා මානසය්‍යිය එකාශ්චය්‍යි ලද බව හා ව්‍යාපාදය විශාරදවූ බව හා සත්පුරුෂ ධර්මය නිදිගත් පරිදි හා අවිවේකය පැලඹි සිටි පරිදි හා දුටුවාවූ දිව්‍ය බ්‍රහ්මයන් විසින් නත්ප්‍රතිකාර තත්පරවූ පුරුෂාන්තරා'ලෝකණ ව්‍යග්‍රවෑ තමන් වහන්සේ ම දැකැ බුදුවන පිණිස ආරාධනා කළ කල්හි-

පඤ්චමහාවිලෝකනය කොටැ උදිතෝ'දිත රාජහංස නිසෙවිත වූ **හංසවතී** නම් රාජධානියෙහි සෞඛ්‍ය සුන්දරවූ ධෛර්‍ය්‍ය මන්දිරවූ කිරති සාන්දුවූ වනිතා නයන මධුකර නිසෙවිතා'රවින්දවූ **ආනන්ද** නම් මහරජානන් නිසා සුජාතා නම් දේවීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳ ගෙණැ දස මසක් යවා මවුකුසින් ප්‍රසූතවැ, ප්‍රසව වන සමයෙහි සියලු ලොකොන්නවය[2] හා සමග සක්වළ ගබ පුරා පියුම් වැසි වස්වා එයින් ම **පදුමුත්තරය** යන නම් ලදින් ක්‍රමයෙන් වැඩි අභිනව යෞවන පත්තනවූ ප්‍රණය ප්‍රසාද[3] දත්තාවූ **වාසුදත්තා** නම් දේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති ලක්ෂයක් **පමණ** නාටක ස්ත්‍රීන්ගේ විදඟ මුඛ ශෘඞ්ගාර කෙළි විනොද රසිකවැ අශ්‍රාන්ත චිත්ත සන්තර්පණ භූසිෂ්‍යවැ දසදසක් හවුරුදු යවා **වාසුදත්තා** නම් අග්‍රමහිෂීන් වහන්සේ ප්‍රෙම දුස්තරවූ භාග්‍ය විස්තරවූ **උත්තර** නම් කුමාරයන් වහන්සේ වැදූ කල්හි-

සතර පූර්වනිමිත්ත දැකැ ප්‍රාසාදයෙන් ම මහාභිනිෂ්ක්‍රමණය කොටැ කැටිවැ ගිය පරිවාරයෙහි සත්‍රීන් පිටත්වැ සෙසු පුරුෂ යන් මුළුල්ල හා කැටිවැ මහණවැ සත් දවසක් **මහාවියූහ** කොටැ **වෙසක්මසැ** මැදි පොහෝ දවස් අතක්‍රීවූ[4] ගුණ ඇති **රුචිනන්ද** නම් සිටානන්ගේ දියණියන් විසින් පිළිගත්වනලද කිරිපිඬු වළඳා සල්වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි **සුචිත්‍ර** නම් ආජීවකයා විසින් දෙන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ තරුණ තර තරල පල්ලවා'භිරාමවූ **සාලබෝධිය** පැද කුණු කොටැ අවතිස් රියන් **වජ්‍රාසනයෙහි** වැඩැ හිඳැ තුමූල මාර බලා'වලෙප විලෝප පූර්ඛගම කොටැ යාමත්‍රයෙහි ඥතත්‍රයය ලදින් ප්‍රත්‍යූෂ කාලයෙහි ප්‍රත්‍යූන ශූන්‍යවූ ධර්ම රාජ්‍යා'ධිගම කොටැ සියලු ජම්බුවිපයෙහි පද්මවර්ෂාව වස්වා ක්‍රමයෙන් සත් සති යවා බ්‍රහ්මයාගේ ආරාධනාව පිළිගෙණැ **ඛම්සක්** පවත්වා තුන්ලෝ පවිත්‍ර කරන්නට පටන්ගත් සේක.

---

1. ලද පරිදි 2. ලෝකය. 3. පහළු පුණ්‍ය ප්‍රසාද. 4. අඛ්‍රිත්‍ය වූ.

එසමයෙහි පුත්‍රිකාතවූ සත්ත්වයන් ඇති අපගේ මහාබොධි සත්ත්වයන් වහන්සේ අතෙක කොටි ධන ඇති ජටිල නම් රාෂ්ට්‍රිකවැ සත්ත්ව ගුණ නැමැති මහාසාගරයෙහි තමන්ගේ පරිණාමෝන්මුඛවූ ඥන නැමැති දැසක් යොදුන් ආහඤ නම් මත්ස්‍යයා සෙවර සඤ්චාර කරවා බුදුගුණයෙහි ප්‍රසන්නවැ බුදු පාමොක් මහසඛ්‍යයා වහන්සේට මහදන් දී අනන්තයෙහි තුන් සිවුරු දී මාගේ මේ මහාදානයෙහි අනුසසින් මම ද සියලු සත්ත්වයාගේ දුඃඛ නිවීාපණයෙහි දිව්‍යෞෂධ සදහර්මය මේ මහා පුරුෂයාණන් සේ ම පසක් කට හෙම්ව යි කියා සද්ධර්මය ම පතා වදාළසේකැ. ඒ සම්බුදුයන් වහන්සේ ද "මේ දානයෙහි අනුසසින් මෙයින් කප් ලක්ෂයකින් ඔබ්බෙහි ගෞතම නම් සම්‍යක් සම්බුදු වෙයි" යනාදීන් විවරණ පතුල් දී වදාළසේක.

එබස් ඇසූ බොධිසත්ත්වයන් වහන්සේ මම මතු ලොවුතුරා දහම් පසක් කට හෙම්ව යි යන අදහසින් එම සමතිස් පැරැම් පිරීමෙහි තත්පරවැ වදාළසේක. මෙසේ මාගේ සවාමි දරුවන් වහන්සේ විසින් ජාති ජාතියෙහි අනෙක ප්‍රකාර යත්න කොටැ පතා ලද්දවූ හෘදය නිවීාපණය කරන්නාවූ සම්දුඃඛ සමතික්‍රාන්තවූ ප්‍රණීතවූ සම් බුදු ප්‍රත්‍යෙක බුදු ශ්‍රාවක මහා ශ්‍රාවකාදී මහාපුරුෂ-යන් නිෂෙවිතවූ සවීාර්‍ය සාධක වූ සද්ධර්මය සරණ යෙමි යි දහම් සරණ යා සුතු.

10 පදෙමාත්තර සම්බුදු විවරණ කථා.

මෙසේ කරණ ලද සමස්ත ලොකා'ලොක ඇති. නිරුපහතා' ඥතා'ලොක ඇති, දුරුකරණ ලද ප්‍රජාශොක ඇති, කරණ ලද මාරෝ'ත්සෙක ඇති, තෝ දිනිය හැකි ධම්ා'නික ඇති, ප්‍රත්‍යක්ෂ කරණ ලද කර්මවිපාක ඇති, නිරවධි වූ කරුණා' මෘත නිමෙක ඇති, නිවීාණ නායකවූ ලොකනායකවූ පදෙමාත්තර නම් සම්‍යක් සම්බුදුයන් වහන්සේ පිරිනිවී පසු ව ශාසනය ද ක්‍රමයෙන් අන්තර්ධාන වූ කල්හි, එයින් මත්තෙහි සැත්තෑ දහසක් කප් මුළුල්ලෙහි කිසි බුදු බඹු කෙණෙක් තොවූහ. මෙයින් තිස් දහසක් කපින් මත්තෙහි එක් කපෙක්හි සුමෙධ ය, සුජාත ය, යන සවාමිදරුවෝ දෙදෙනෙක් පහළවූහ.

11. සුමෙධ සම්බුදු විවරණ කථා.

මෙහි සුමෙධ නම් සම්බුදුයන් වහන්සේ සමන්විශත් පාරමිතා පූරණ ප්‍රාවිණ්‍යයෙන් සම්ප්‍රාපතවූ ප්‍රඥ ප්‍රකෘති ඇතිවැ තුන්වන ආත්මභාවයෙන් චුතවැ තුෂිත පුරයෙහි ඉපිද එහි ආයුපමණින්

පසඳුකාම රසා'සාදී කොටැ දෙවතාවන්ගේ ආරාධනායෙන් පසඳුමහා විලොකනාය කොටැ, සකල ලොක සුදශීතවූ සුදශීන නම් රාජධානියෙහි සමපත්තින් අමත්තවූ සුදන්ත නම් මහරජාතන් වහන්සේ නිසා ඔබගේ අග්‍රමහිසින් වහන්සේගේ බඩැ පිළිසිඳ ගෙණැ ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී තව යෞවනා'කාර මධුරවූ අවස්ථාවට පැමිණ, හෘදය මධුකර වාරණ සුමනස්වූ සුමනා නම් මහාදේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති අටසාළිස් දහසක් කාවකසත්‍රීන්ගේ කුව කමල කුඩ්මල සන්නිවෙශ මනොහරවූ වක්ෂසථල නැමැති මහා සරසින් මනොහරවැ තව දහසක් හවුර්ඵු ගිහිගෙයි වැසැ—

සුමනා මහාදේවීන් වහන්සේ විසින් සර්ී ලොක මිත්‍ර වූ පුන්‍යවසුමන්ත්‍ර නම් කුමාරයන් වහන්සේ වැදූ කල්හි, බ්‍රහ්මා'පණීත නිමිත්ත සඳශීතයෙන් ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාෂවැ මහාභිනිෂ්ක්‍රමණය කොටැ කෙළසියක් පිරිමින් හා කැටිවැ මහණවැ අට මසක් මහාවියර්ී කොටැ වෙසඟ මසැ මැදි පොහෝ දවස්–

සකල සමෘඩ් සඩ්කුල වූ නකුල නම් ග්‍රාමයෙහි නකුල නම් සිවානන්ගේ දියණියන් විසින් පිළිගන්වන ලද්දැ වූ කිරි පිඬු වළඳැ සල් වෙතෙහි දිවාවිහාර කොටැ සවස් වේලෙහි සකල ලොක මනොරථ වඩිත වූ ශ්‍රී වඩින නම් ආජීවකයා විසින් පිළිගන්වන ලද්දාවූ අටමිටක් තණ පිළිගෙණැ සකල ලොකදීපවූ ඉෂවාපී සම්ප වූ නිප පාදප මූලයෙහි විසිරියනක් පමණ වජ්‍රාසනයෙහි වැඩැ හිඳැ, ප්‍රබල මාරබල ඉලහ කුල ප්‍රලය ප්‍රදීපාඝමානවැ යාම ත්‍රයයෙහි ඥනත්‍රයාධිගම කොටැ ප්‍රත්‍යුෂ වේලායෙහි සද්ධර්ම රාජ්‍ය ප්‍රතිලබ්ධවැ සම්භාවිත වූ මනොරථ සිද්ධි ඇතිවැ සත් සති ඝවා බ්‍රහ්මාරාධනා පිළිගෙණැ සුදශීනොද්‍යානයෙහි ධම්මක් පවත්වා ලොකා'ලොක කොටැ වදරණසේකැ.

එසමයෙහි මාගේ සවාම්දරුවානන් වහන්සේ උත්තර නම් මානවකවැ නිර්ජිත සංසාරා'ඛකුර ඇති, තර්ජිත මාරා'හඞ්කාර ඇති, සම්පිතවූ කෙලඟ වමතකාර ඇති, ප්‍රාපතවූ ලොකසතකාර ඇති, නිර්ීණාවබොධය ඇති සුමෙධ නම් සවාම්දරුවෝ ලෝකයෙහි උපන්සේකැ සි අසා ප්‍රෙම ප්‍රසාද ප්‍රකම්ී ප්‍රවණීය කෘතා'තම් ඇතිවැ සම්‍යක් සම්බුදධයන් වහන්සේ කරා එළඹැ එ රුව දැකැ, එ ඛණ අසා විසමය ප්‍රාපතවැ—

"මේ කෙබඳුවූ ගාම්භීර්‍යයෙක් ද? මේ කෙබඳු වූ සියලු ක්‍රියා වන්ගේ ඕවිත්‍යයෙක් ද? මේ කෙබඳු වූ අසඳෙහ මධුර වූ විඥනයෙක් ද? මේ කෙබඳු වූ ධර්ම පක්ෂපාතයෙක් ද? මේ

කෙබඳු වූ කර්ණා'මෘත වහන තපස්වී කෙමෙක් ද? මේ කෙසේ වූ සියලු ලෝවැස්සන් මුදුනෙන් පිළිගත් ආශ්චර්‍ය්‍ය කමෙක් ද? මේ කෙසේ වූ නිර්විකාර පුරුෂදම්‍ය ශික්‍ෂා ප්‍රකාරයෙක් ද? මේ කෙසේ වූ අභූතණ සුභග වූ විලාශයෙක් ද? මේ කවර කුශලයක්හුගේ විපාකයෙක් ද? මෙසේ වූවන්ට පූජා නො කොටැ අනික් කාට පූජා කරමෝද්‍ද"යි සිතා වදුරා දනක් සරහන්නට පටන් ගත්හ.

දන් සැරහූ පරිදි කියා නිමවත් හොත් උගහට ය. එක් දවසක් දෙන දනට උපකරණ අසූ කෙළක් ධන වියදම් කොටැ සපයා වදුළුසෙයෙක. මෙසේ මනදන් දී පඤ්චකාම රසයන් හැරැ ඒ සම්‍බුදුයන් වහන්සේගේ ශාසනයෙහි මහණ වැ අනික් සම්පත්තියක් නො පතා, මා දුන්නා වූ දනයෙහි හා රැකි ශීලයෙහි අනුසසින් මම ද මේ සම්‍බුදුයන් වහන්සේ පසක් කළ සදහර්ම ය ම පසක් කට හෙම්ව හි පතා වදුළ සෙයෙක.

ඒ බුදුන් වහන්සේ ද "මේ මහාපුරුෂතෙම දුන්නා වූ දන යෙහි හා සීලයෙහි අනුසසින් මෙයින් තිස්දහසක් කපින් මත් තෙහි ගෞතම නම් සම්‍යක් සම්බුදු වෙයි" යනාදීන් ව්‍යාකරණ දී වදුළුසේක එබස් ඇසූ අපගේ සවාමිදරුවෝ දීපඞ්කර සම්‍බුදුයන් වදුළ සාරාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක් පවා හතර පැයක් විසි අසුරක් කොටැ සිතා වදුළ සේක්, තිස් දහසක් කපා යි කී කල්හි කෙතෙකැ යි සරු කරණ සේක් ද? එහෙයින් "මම තිස් දහසක් කපින් මත්තෙහි බුදු වැ මෙම සදහර්මය පසක් කෙරෙමි යි" යන අදහසින් එම සමතිස් පැරැම් පිරීමෙහි දෘඪ ග්‍රහණය කොටැ වදුළ සෙයෙක.

එසේ මාගේ සවාමිදරුවන් විසින් අනෙක යතනයෙන් සාධාගත් සදහර්මය මම අයතනයෙන් ලදිමි. එහෙයින් මා විසින් මෙම සදහර්මය සරණ යා යුතුයැ යි **දහම් සරණ යා යුතු.**

11. සුමෙධ සම්බුදු විවරණ කථා.

මෙසේ සදහර්ම සම්‍රාජ්‍ය ධුරන්ධර වූ සුමෙධ නම් සම්‍යක් සම්බුදුයන් වහන්සේ පිරිනිවි කල්හි ක්‍රමයෙන් බුදුන්නතරයක් ඉක්මුණු කල්හි සකල කාරුණිකඝ

12. සුජාත සම්බුදු විවරණ කථා සසඳාත වූ සුජාත නම් සම්‍යක් සම්බුදුයන් වහන්සේ සම්‍තිංශත් පැරැම් පිරීමෙන් බොධි සම්භ පුරුෂා'කාරය ම

මස්සකප්‍රාප්ත කොටැ තාවතිසා'තම්භාවයෙන් චුත වැ, **තුෂිත** භවනයෙහි ඉපිද, එහි ආයු පමණින් සිටැ අන්‍යතයෙහි දෙවතා-වන්ගේ ආරධනා පිළිගෙණැ **තුෂිත** භවනෙන් චුත වැ —

සකල ලොක මඩුගල භාජන වූ සුමඩුගල පුරවරයෙහි සකී සම්පත් සමුදාත වූ **උද්ගත** නම් මහරජානන් වහන්සේ නිසා නිරුපමා'ඩුග ප්‍රත්‍යඩුග ප්‍රභාවති වූ **ප්‍රභාවති** නම් දෙවින් වහන්සේ ගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ප්‍රසව වැ, ක්‍රමයෙන් වැඩී සමර ජවර ජර්ජරිත නව යුවති හෘදයා'හලාද **කලහාර කර්පූර** හාරායමාන වූ අසමාන සෞවනයෙහි සිටි අභිනව රූප ශ්‍රී සුන්දර වූ **ශ්‍රී නන්දා** නම් දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති දෙ විසි දහසක් කාවක සත්‍රීන්ගේ ශෘඩුගාර ශාඤ්ජ වාටු[1] වෙෂටා සහස්‍ර මිශ්‍රිත වූ හාව භාවයන්ට භාජන වැ දසදහසක් හවුරුදු ගිහිගෙයි වැස —

ශ්‍රී නන්දා දෙවින් වහන්සේගේ කුක්ෂියෙන් ප්‍රණය ලතා ප්‍රසූත වූ **උපසෙන** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි, බ්‍රහ්මොපණීත නිමිත්ත සන්දර්ශනයෙන් මහා'භිෂ්ක්‍රමණය කිරීමෙහි සාභිලාෂ වැ, **චතුරංගබලෂ** නම් අශ්වරාජයා නැඟී මහා'භිණිෂ්-ක්‍රමණය කොටැ, මිනිස් කෙළක් හා කැටි වැ මහණ වැ නව මසක් **මහාවියූහ** කොටැ —

වෙසක් මසැ මැදි පොහෝ දවස්හි විරචිත වූ නරසුරා'නන්ද ඇති **සුරනාද** නම් නුවරෙහි 'සුරනන්ද' නම් සිවානන්ගේ දියණියන් විසින් එළවන ලද කිරි පිඹු වළඳ සල්වෙනෙහි දිවා විහාර සපයා සවස් වේලෙහි අමන[2] ගුණ සුගන්ධ ඇති **සුනන්දා** නම් ආජීවකයා විසින් දෙන ලද්දා වූ අට මිටක් තණ පිළිගෙණැ සකීලොක ශොක දූරී කරණ ප්‍රවීණ වූ වෙණු බොධිද්‍රැම මූලයට එළඹැ, තෙතිස් රියන් පමණ වජ්‍රාසනයෙහි වැඩැ හිඳැ, මාර මාන ගිරි භඩුග විදුර'ණෙක නිඝාත පාත වූ උදුර වූ පරාක්‍රම ඇති වැ, යාමත්‍රයයෙහි **ඤාණත්‍රය**'ධිගමය කොටැ පශ්චිම යාම සමනන්තර යෙහි ද ධර්ම තත්ත්ව සකී සමය **සක්ෂාත් කරණයෙන්** සම්පූර්ණ වූ මනොරථ ඇති වැ, බොධි මූල ප්‍රාන්තයෙහි සත් සති ඝවා බ්‍රහ්මාරාධනා පිළිගෙණැ **සුමඩුගලොද්ගතයෙහි** ධර්මසක් පවත්වා-

එතැන් පටන් පර ව්‍යඤ්ජනා'පහර කර්මයෙහි **නිෂණාතවැ**[3] සවර්ගා'පවර්ග ඖඝී ව්‍යාඛ්‍යාන විද්‍යුයෙහි **පරමාචාර්‍ය්‍ය** වැ, අපාය ගාමී සත්ත්වයන් ඉවරළ කෙරෙමින් මෙරු මන්දරාදීන් තරළ ස

1. චාරු. 2. අපමණ. 3. සනාත වැ

කරමින් අකලඞ්ක වූ යසයින් සමස්ත ලොකය ධවල කෙරෙමින් නිර්‍ව්‍යාජ මධුර නිර්‍වාණ රසය සබළ කෙරෙමින්, සාධුවාදයන් ප්‍රබල කෙරෙමින්, සත්පුරුෂ වෘත්තයන් තුමුල කෙරෙමින් ලොකාර්‍ථ චර්‍ය්‍යායෙහි තත්පර වූ සේක.

එ සමයෙහි අපගේ සවාමිදරුවෝ සමස්ත චක්‍රවාලා වලාන්ත සීමාන්ත විහාරා විශ්වාම්බර මණ්ඩලෙක මණ්ඩනාය මාන වැ **චක්‍රවර්ත්තිරජ** වැ බුදොත්පාද මඞ්ගල ශ්‍රවණයෙන් සඤ්ජාත වූ කුතුහල ඇති වැ සම්බුදයන් වහන්සේ කරා එළඹැ සද්ධර්‍මය අසා එබදු වූ මහාපුරුෂයාන්ත්ට අනික් සුදුසු පූජාවෙක් නැතැ සි සිතා වදුරා එක මල් මිවක් දමා ලන එකක්හු සේ සතර මහාද්වීපයෙහි සප්තරත්න සමලඞ්කාත වූ **චක්‍රවර්ත්ති රාජ්‍යය** තුණුරුවනට පූජා කොටැ ඔවුන් වහන්සේගේ ශාසනයෙහි මහණ වැ මේ මා පිදූ සක්විති රාජ්‍යයෙහි අනුසසින් හා රැකී ශීලයෙහි අනුසසින් මේ සම්බුදයන් අනුභව කළ දහම් අනුභව කට හෙම්ව සි **එම සද්ධර්‍මය** ම පතා වදාළසේක.

ඒ සම්බුදයන්වහන්සේ ද 'මේ මහා පුරුෂතෙම මේ අසා ධාරණවූ දැන ශීලාදිවූ ගුණ ගණයෙහි අනුසසින් මතු **ගෞතම** නම් සම්‍යක් සම්බුදු වෙයි' කියා **විවරණ** පතුල් දී වදාළ සෙයෙක. බොධි සත්ත්වයන් වහන්සේ ද තමන් වහන්සේ මතු බුදුවන බව අසා විශෙෂයෙන් ම බුදු කාරක ධර්‍ම පූරණයෙහි තත් පරවූ සෙයෙක.

මෙසේ මාගේ සවාමිදරුවන් විසින් චක්‍රවර්ත්තී රාජ්‍යය පුදා මහණ වැ මහායත්නයෙන් පතා ලද්දා වූ අනුපම ධර්‍මය **සරණ** යෙමි සි **දහම් සරණ** යා සුතු.

12. සුජාත සම්බුදු විවරණ කථා.

මෙසේ ප්‍රඥා පුරස්සර වූ, කරුණා ධුරන්ධර වූ, සාර ධිරතා යුගන්ධර වූ **සුජාත** නම් සම්‍යක් සම්බුදුයන් වහන්සේ පිරිනිවි පස්සෙහි මෙයින් මතු

13 ප්‍රියදර්ශි සම්බුදු විවරණ කථා. එක්දස් අටසියක් කපින් මත්තෙහි නිර්‍ම්කල්ප ලොක සඞ්කල්ප ඝිදහි කාරණ වූ එක් කල්පයෙක්හි ලොකලොචන ප්‍රිය දර්ශි වූ **ප්‍රියදර්ශි** නම් එක් සවාමිදරු කෙණෙක. සමස්ත තත්ත්වාර්ථ දර්ශි වූ **අර්‍ථදර්ශි** නම් එක් සවාමිදරු කෙණෙක. මධුර තර ලොකොත්තර සවාමීහු තුන්දෙනෙක් ලෝකයෙහි පහළ වූ හ.

එහි පළමුවන ප්‍රියදර්ශි නම් සර්‍වාර්ථ දරුවෝ විධවසා සමඝා බොධි පාක්ෂික ධර්ම ප්‍රතිබන්ධ ඇති වැ, සම්‍යක්‍සම්බුද්ධත්ව පාරමිතා පූරණ ප්‍රඛිණ පරිණත ප්‍රඥතිරෙක ඇති වැ, තුන්වන ආත්ම භාවයෙන් චුත වැ තුෂිත භවනයෙහි ඉපැදූ එහි ආයු පමණින් වැඩැ සිටැ අප්‍රමාණ රමණීය පඤ්චකාම ගුණාස්වාදයෙන් ප්‍රණීත වූ අන්‍යත්‍ර කරණ ඇති දිව්‍ය සම්පත්හි වළඳ, දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනා ගිවිසැ පඤ්ච මහා විලෝකනය කොටැ දෙව්ලොවින් චුත වැ —

ධන්‍ය නර නාරි නිසෙවිත වූ ධන්‍ය නම් නුවරෙහි අප්‍රමාණ චිත්ත ඇති සුදත්ත නම් මහරජානන් වහන්සේ නිසා මුග්ධ මධුර වූ මුඛ චන්ද්‍ර මනොහර වූ චන්ද්‍රා නම් දේවීන්වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ දසමසක් යවා ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩී වාමලොචනා කයත වඡකපුර නිපෙයකානති පීයූෂ නිෂ්‍යන්ද සුන්දර වූ නව යෞවනා'වතාරයට පැමිණැ —

විමල වදන කමල මනොහර වූ විමලා නම් වූ මහා දේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තෙතිස් දහස් නාටක සත්‍රීන්ගේ මධුරා'ඛකපාළි කෙළී රසික වැ ගෙහි කෙළනා කෙළියෙන් උකවලි යව වැට කොටැ, උද්‍යානයෙහි කෙළනා කෙළියෙන් සොම්නසට දෙර හැරී, වනයෙහි කෙළනා කෙළියෙන් අරනියට වනදුර්ග සංසකාර කොටැ, දියෙහි කෙළනා කෙළියෙන් කුසිද්‍යට ජලදුර්ග සපයා, මිත්‍රයන්ගේ නොවෙනස් කමින්, ඥාතීන්ගේ නොබොරුයෙන් ශරීරයෙහි ආරොග්‍යයෙන් දෙවයාගේ අනුකූල්‍යයෙන් කළ කළ දූයෙහි අපශ්චාත් භාවයෙන් වෙෂභාෂා දෙක්හි විදග්ධ කමින් නව දසක් හව්රුදු ගිහිගෙයි වැසැ —

විමලා දේවීන් වහන්සේගේ කුක්ෂියෙන් සෞන්දර්‍ය්‍ය සාරයෙන් උත්පාදිත වූ කාඤ්චන කුමාර නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි බ්‍රහ්මාපණීත චතුර්විධ පූර්වනිමිත්ත සන්දර්ශිත පූර්‍ව්වඛම වැ ආජානීය රථවරයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොටැ, පුරුෂයන් කෙළක් දෙනා හා කැටි වැ මහණ වැ සත් දවසක් මහාවීර්‍ය්‍ය කොටැ —

වෙසක් මසැ මැදි පොහෝ දවසැ අද දක්වා සමරණීය වූ චරණ බ්‍රාහ්මණ ග්‍රාමයෙහි වාසභ බ්‍රාහ්මණයාගේ දියණියන් විසින් එළවන ලද්ද වූ මිහිරි කිරිපිඬු වළඳ, දිවා භාගයෙහි සාලවනයෙහි වැසැ සවස් වේලෙහි සුජාත නම් අජීවකයා විසින් දෙන ලද්ද වූ අට මිටක් තණ පිළිගෙණැ විවිධ ලොක ප්‍රජාවිධෙය වූ කකුධ බොධියට එළඹැ, නෙ පණස් රියන් වප්‍රාසනයෙහි වැඩැ හිඳැ

මාරබල ව්‍යාලකුල[1] විසෝහ කෙලි වෛනතෙය වැ යාමන්‍රයයෙහි අධිගත වූ විද්‍යාත්‍රයය ඇති වැ සමසත වසතු විසතාර සවභාව සවී සවග්‍රහණ රසික සවීඥතාඥත සමධිගමයෙන් සම්පූර්ණ වූ මනොරථ ඇති වැ, බොධිද්‍රැම සමීපයෙහි ම සත්සති යවා බ්‍රහමාරාධනා පිළිගෙණැ ධම්මක් පවත්වා සකල ලොකාවසී චාර ධෙරෙය වැ කරුණා ප්‍රඥපර වැ අමන්ද වූ ජගද්'නන්දනය කොටැ වදරණ සෙයෙක.

එ සමයෙහි අපගේ බෝසතානන් වහන්සේ කරුණා'වශ්‍ය වූ කාශ්‍යප නම් බ්‍රාහමණ වැ සවීඥයන් වහන්සේගේ ගුණ අසා රූපසන්දර්ශනයෙන් හා සද්ධම් ශ්‍රවණයෙන් හා ප්‍රතිලබ්ධ වූ ශ්‍රද්ධා හා ප්‍රසාද ඇති වැ කෙළ ලක්ෂයක් වියදම් කොටැ නිර්මාණ'රාමා'භි රාම වූ බුද්ධාරාමයක් කරවා බුදු පා මොක් මහාසඞ්ඝයා වහන්සේට පිළිගන්වා සරණ සීල දෙකැ පිහිටා මම මේ කළ පරිත්‍යාගයෙන් හා ගුණධර්මයෙන් හා මතු මේ සවීඥයන් වහන්සේ පසක් කළ සද්ධර්මය ම පසක් කට හෙම්ව යි කියා ප්‍රාර්ථනා කොටැ වදළසේක.

ඒ සවීඥයන් වහන්සේ ද "මේ මහා පුරුෂතෙම මතු ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙයි" වදළ සේක. ඒ අසා සවාමි දරුවානෙනි "මම මතු බුදු වෙම්ල" යන අදහසින් එම සමතිස් පෙරුම් පිරීමෙහි දෘඪග්‍රහණ කොටැ වදළසේක.

මෙසේ මාගේ බොධිසත්ත්වයන් වහන්සේ විසින් මහපොළොවක් පෙරලන්නා සේ, මහමුහුද දිය දෙහොතින් ඉස්නා සේ, මහාමෙරුව පෙරලන්නාසේ, හිරු සඳු දෙදෙනා නො යා දී වළකන්නා සේ, මහා ගතනකොටැ සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි පැරැම් පුරා පරාක්‍රමයෙන් සාධා අත් පත් කළා වූ සද්ධර්මය සරණ යෙමි යි දහම් සරණ යා සුතු.

13. ප්‍රියදර්ශි සම්බුද්ධ විවරණ කථා.

මෙසේ සමසත තත්ත්ව විදර්ශී වූ ප්‍රියදර්ශි නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවි පස්සෙහි ක්‍රමයෙන් බුද්ධානන්තරයක් ඉකුත් වූ කල්හි නිරූපදෙශ බුද්ධගොචර දර්ශී වූ අර්ථදර්ශී සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සමතිස් පැරැම් පුරා තුසිත පුරයෙහි ඉපැද දෙවියන්ගේ ආරා

14. අර්ථදර්ශි සම්බුද්ධ විවරණ කථා.

ධනායෙන් එයින් චුත වැ-

1. ව්‍යාකුල.

සජී'ඛ ශොභන වූ **ශොභනා නම්** නුවරෙහි නොජසින් භාසකර වූ, **සව්ලොක** සඛකර වූ, මනුජලොක පුරන්දර වූ, රාජමූර්ති සුන්දර වූ, ශ්‍රුතවෘත්ත බන්ධුර වූ, රාජලොක ශෙඛර වූ, වාරුභාව පයෝධර වූ, වික්‍ර'මෛක මන්දිර වූ, සම්පූර්ණ'රාත්‍රිසඛකර වූ, විපුල කීර්ති සාගර වූ **සාගර නම්** මහ රජානන් වහන්සේ නිසා සකල ලොක සුදශීන වූ **සුදශීනා නම්** දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳ ගෙණ දසමසක් ඇවැමෙන් ප්‍රසව වැ, ක්‍රමයෙන් වැඩී මදන'මඛල මන්දිර'කාර වාරු ශරීර කාන්ති සම්පූර්ණ වූ තව යෞවනශ්‍රීන් විරාජමාන වූ, කන්දජී තරුවරාග්‍ර ශාඛායමාන වූ **විසාඛා** මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තෙ තිස් දසක් පුරසත්‍රීන්ගේ රුචිර නූපුරාරාවයෙන් අනවරත මුඛර වූ නිජ හර්ම්‍යස්ථල ඇති වැ දස දසක් හවුරුදු ගිහි ගෙයි අනන්ත සම්පත් අනුභව කොටැ —

විසාඛා නම් කල්ප තරු ශාඛායෙහි **ශෛල කුමාර** නැමති කුසුමස්තබකය හටගත් කල්හි චතුර්විධ පූර්වනිමිත්ත දැකැ ප්‍රව්‍රජ්‍යා යෙහි සාභිලාෂවැ **සුදශීන නම්** අශ්වරාජයා පිටින් **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ තව කෙළක් පුරුෂයන් හා කැටිවැ මහණ වැ අට මසක් **මහා වියර්** කොටැ වෙසක් **මසැ** මැදි පොහෝ දවස් **සුවිඤ්ඣර නම්** නාග කන්‍යාව විසින් එළවන ලද මිහිරි කිරි පිඬු වළඳා සල් වෙතෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි **මහාජී නම්** නාගරාජයා විසින් දෙන ලද්ද වූ අට මිටක් තණ පිළිගෙණැ-

වසන්තා'වෙශ සමුද්භූත ප්‍රභූත කුසුම සමූහයි ඇති **චම්පක** මහා බොධියට එළඹැ තමන් වහන්සේගේ බුද්ධ මඩලයට නගා ලූ මහ පහන් ඇඟැයක් බඳු වූ ඒ බොධිද්‍රැම රාජයාගේ මූලයෙහි තෙ **පණස්** රියන් වප්‍රාසනයෙහි වැඩැ භිදැ තුමුල මාර බල බහලා'ඛකාර නිකරයෙහි ප්‍රවණ්ඩ සංවර්තමාර්තණ්ඩ මණ්ඩල වැ වණ්ඩතාව දක්වා යාමත්‍රයයෙහි ඥානත්‍රයා'ධිගමය කොටැ ප්‍රත්‍යූෂ කාලයෙහි **සමෂ්ඨා ඥෙය රෙඛාව** ශ්‍රී හස්තරෙඛා සේ නිර්විශෙෂ කොටැ දැනැ වදාරා ක්‍රමයෙන් සත් සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙණැ **ධම්මක්** පවත්වා —

එනැන් පටන් ඒ ධම් ප්‍රවිණයට ධම් නෛරන්තර්‍යයට ධම් විජයට ධම්'ධිෂ්ඨානයට ධම් විප්‍රැමෝක්‍ෂයට ධම් දීපියට ධම්'ඔඩකාරයට ධම් මහෝ'ත්සවයට ධම්'නෞසකයට ධම් වෛසාරද්‍ය-යට ධම් හර්ෂයට ධම්'ත්තර වෙමින් අධම් තර්ජනයට අධම් නිර්ඵනයට අධම් විදාරණයට අධම් නිෂ්පීවනයට ඒක නිදාන වෙමින් ලොව සදන්නට පවත්ගත් සෙයෙක,

එ සමයෙහි අපගේ සවාමිදරුවෝ **වම්පක** නම් නුවරෙහි සුසීම නම් බ්‍රාහ්මණ මහාසාර වැ සදිලොක සම්මත වැ අභ්‍යසන සමසන විද්‍ය නිරවද්‍ය මනි වැ පඤ්චකාමයෙහි දෙෂ ප්‍රපඤ්චය දැකැ තමන් වහන්සේ සතු වූ සියලු වසතු සමූහය දීනා'නාථ මනොරථ පූරණය හා යොදු හිමාලයට වැඩැ, තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණවැ වසන සේක.

එසේ වූ සවාමිදරුවෝ **චඤ්‍රා'ලොකයට** දිවන වකොරයක්හු සේ තමාල නීලවර්ණ සුන්දර වූ විද්‍යොතමාන විද්‍යුත්වලයා'හිරාම වූ නිරන්තර ඉඳුවාප කලාපා'වනාධ්‍ය වූ මෙඝ කූටයකට දිවන චාතක යකු සේ ද, අතිනීල සිතල සලිල හරිත වන සරසි විගාහ'තෙක රසික මත්ත මානඛ රාජයක්හු සේ ද, ජනනීඤ්ඤන දර්ශනයට දිවන තරුණ සානඤ්ඤයකු සේ ද, පිපාසිත වැ මහා හ්‍රදයකට දිවන පජිකඤ්ඤක්හු සේ ද, නිර්‍වාණෝ'ත්මුඛ වැ දිවන යොගාවචරයක්හු සේ ද, අතිඝසින් ලොල් වැ සිවුවණක් පිරිස මධ්‍යයෙහි ඛණ වදරන්නා වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කරා එළඹැ ඛණ අසා පරම ප්‍රීතිප්‍රඤාද නිරන්තරීභූත හෘදය ඇති වැ —

'මෙයට සුදුසු පූජා කිම් දෝ හෝ'යි **පරීක්ෂා** කොටැ දෘශ්‍යමාන ශරීරයෙන් ම ආකාශයට පැනැ නැඟී සහමුලින් මල් ගෙණැ සිටියා වූ දෙවියන් ගේ සියක් යොදුන් **පරසතු රුක** මුල්හී ගෙණැ පිල අත්තක් සොඬින් අල්වා ගෙණැ සලතලද මතැතක්හු සේ සලා සම්බුදයන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි පහරවා මුළු සක්වළ බුද්ධපූජා පිණිස දිවමල් වැසි වස්වා එම[1] මලින් නොයෙක් වර්ණයෙන් යුක්ත වූ මල් ඇඟැ මල් තොරණ මල් ආසන පණවා තමන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් මල් සතක්[2] අල්වා ගෙණැ මහාපූජා කොටැ 'මම මේ පුෂ්ප පූජායෙහි අනුඝසින් මතු මේ සම්බුදයන් වහන්සේ පරිද්දෙන් ලොවට සද්ධර්මී වම්[3] පැවැත්තිය හෙම්ව හි කියා මේ **සද්ධර්මීය** ම පතා වදළ සෙයෙක.

ඒ සම්බුදයන් වහන්සේ ද 'මේ මහාපුරුෂතෙම මේ පූජායෙහි අනුඝසින් මතු **ගෞතම** නම් **සම්‍යක්** සම්බුද්ධ වෙයි' විවරණ පතුල් දී වදළ සේක. එබඳු අසා වදළ සුසීම නම් බොධිසත්ත්වයන් වහන්සේ "මම මතු බුදුවෙම් ල"යි එම බුද්ධකාරක ධර්මයන්ගේ පූරණයෙහි සතතොද්‍යුක්ත වූ සිත් ඇති වූ සේක. මෙසේ මාගේ සවාමිදරුවන් විසින් සක්වළ ගබ පුරා දිව මල් වැසි වස්වා දිව මල්

---

1. මෙම - 2. සැතක් - 3 වම්‍ - වම්ණ

ඇඟෑයෙන් දිව මල් තොරණින් දිව මල් කුඩයෙන් දිව මල් ධ්වජ යෙන් දිව මල් පතාකායෙන් අපරිමාණ වූ පූජා කොටැ පතා ලද්දු වූ සඳහමය සරණ යෙමි යි දහම් සරණ යා සුතු.

14. අත්‍යදර්ශි සම්බුදු විවරණ කථා.

මෙසේ යථාර්ථ නාමාඛ්‍යර වූ අත්‍යදර්ශි නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවිකල්හි ඒ අනන්තකල්පය ඉක්මුණුකල්හි තමන්ට ම සුදුසු වූ ධම්දර්ශි යන

15 ධර්මදර්ශි සම්බුදු විවරණ කථා. නම් ඇති ධර්මදර්ශි නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සමනිස් පැරැම් පුරා තුන්වත ආත්මභාවයෙන් චුත වැ තුෂිත පුරයෙහි ඉපිද එහි ආයු පමණින් සිටැ දෙවතාවන්ගේ ආරාධනා ගිවිසැ එයින් චුත වැ නිහුවත ශරණ වූ ශරණ නම් නුවරෙහි විරචිත රාජ ලක්ෂ්මී සවයංවර වූ අනුපම වාරුකරණ විභූත සම්පන්න තන්ත්‍ර වාපි නිස්සාරණ වූ ප්‍රණීත ධරණීපති මණී මෞලී මාලා'ලම්බිත වරණ වූ පාර්ථිව සිඤ්ඡුර ගන්ධ වාරණ වූ විරවිතෙ'ඤ්ඡියා, ඔඩ්කාර නිවාරණ වූ මානසයෂී ප්‍රත්‍යක්ඛ්‍යාන කරණ වූ ධර්මේ'ක පරායන වූ දුර්නීති විසරණ වූ සරණ නම් මහරජානන් වහන්සේ නිසා නයනා'නන්ද වූ සුනන්දා නම් දේවීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවැමෙන් මවු කුසින් ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩි —

මුඛා'ඔඝනා වදන කමල කුඩ්මල විකාශ'නෙක රාජහංසාය මාන වැ තව යෞවනාවස්ථා'වතාරයෙන් මනොහර වැ අව්‍යාජ කෙළි රහිත වූ විවිකේළි නම් මහා දේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති විසිදෙනක් නාටක සත්‍රීන්ගේ සර්වාඞ්ගීන වූ අනඝ පරිදෘහ නිර්වාපණයෙහි තව වන්දන පල්ලව රස නිෂේකායමාන වැ අවදෘසක් හවුරුදු ගෘහ ශ්‍රී අනුභව කොටැ විවිකේළි නම් දෙවීන් වහන්සේගේ කුක්ෂියෙන් අව්‍යාජ ප්‍රීති වර්ධන වූ පූර්ණවර්ධන නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි, බ්‍රහ්මා'පණීත චතුර්විධ නිමිත්ත සන්දර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාෂ වූ ක්ෂණයෙහි ම ආකාශයට පැන නැංගා වූ සුදර්ශන නම් ප්‍රාසාදයෙන් ම මහාභිනිෂ්ක්‍රමණය කොටැ කෙළ ලක්ෂයක් පිරිමින් සමග මහණ වැ සත් දවසක් මහා ත්‍යාග කොටැ —

විවිකෝළි නම් දෙමින් වහන්සේ විසින් එළවන ලද්දා වූ කිරිපිඬු වළඳා දහවල් රැවිර තර බදරවනයෙහි[1] දවස් යවා සවස් වෙලෙහි ශ්‍රීවර්ධන නම් යවපාලයා විසින් දෙන ලද අව් මිටක් තණ පිළිගෙණ සතරා'මර ලොකප්‍රණත රක්‍ෂත කොරක ඇති රක්‍ෂා කුරවක බොධියට එළඹ තෙ පණස් රියන් වප්‍රාසනයෙහි වැඩ හිඳ මාර මාර භීර මුසෙනාන්මූලනකෙලි මහා වරාහ වැ යාමත්‍රයා'ධිගත වූ ඤතත්‍රයය ඇති වැ, සර්ධර්ම නිරූපණ ප්‍රඥා ප්‍රකර්ෂ ඇති වැ සත් සතියක් බොධිද්‍රැම මූලයෙහි කල් යවා බ්‍රහමා'රාධනා පිළිගෙණ ධර්මඝක් පවත්වා එතැන් පටන්ගෙණ ජාති වැසෙනයෙන් හා ජරා පරිපන්ථයෙන් හා මෘත්‍යු නිර්‍ඝාත පාතයෙන් හා ශොක විශෝෂ යෙන් හා පරිදෙව ශූලනොදයෙන්[2] හා දුඃඛ ජ්වාලානලජ්වාලා'වලෙප යෙන් හා දෞර්මනස්‍ය මූර්ජා වෙශයෙන් හා උපායාස විශා'වෙශ යෙන් හා එක පැහැරැ ලොව නලවන්නට පටන්ගත් සෙයෙක.

එසමයෙහි අපගේ බොධිසත්ත්වයන් වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍ර වැ ධර්මදර්ශි සවාම්දරුවන්ගේ ත්‍රිභුවන ව්‍යාපී වූ ගුණ ගණ ශ්‍රවණයෙන් අදනා ලද්දා වූ සිත් ඇති වැ දෙවිලොව වසන්නා වූ දිව්‍ය සෙනාව රැස්කරවා නානා ප්‍රකාර වූ පූජා විශෙෂ සපයා සියලු ලොකයෙහි ඇති තාක් විසමය එක තැන්හි ගෙණ වුත් පුරන්නා සේ සියලු ආකාශය පූජා විසින් නිරන්තර කෙරෙමින් සර්ඥයන් වහන්සේ කරා එළඹ-

දිව්‍ය පුෂප ධූප දීප නෘත්‍ය ගීත වාදනාදීන් මහා පූජා පවත්වා රූපසඤ්ඣීතයෙන් හා සද්ධර්මශ්‍රවණයෙන් හා සඤ්ජාත වූ ප්‍රීති ප්‍රසාද ඇති වැ රතනත්‍රය යෙහි සරණ ගොසින් තමන් වහන්සේ කළ අනුපම බුද්ධ පූජායෙහි හා කළ ප්‍රසාදයෙහි හා අනුසසින් මතු 'මම මේ සවාම්දරුවන් දුටු සද්ධර්මය ම පසක් කට හෙම්ව යි ප්‍රාර්ථනා කොටැ වදාළසේක.

ඒ සර්ඥයන් වහන්සේද 'මේ මහාපුරුෂ වූ දෙවරාජතෙම මේ කුසලයෙහි අනුසසින් මතු මා සේම ධර්මරාජ වෙයි' විවරණ පතුල් දී වදාළසේකැ. එබස් ඇසූ ශක්‍රදෙවෙන්ද්‍ර වැ උපන්නා වූ බොධිසත්ත්වයන් වහන්සේ ද "මතු මම බුදුවෙමි"[3] යන අදහසින් සමතිස් පෙරුම් පිරීමෙහි මහොත්සාහ වූ සෙයෙක.

මෙසේ මාගේ සවාම්දරුවන් ශක්‍රදෙවෙන්ද්‍ර වැ ඉපදූ දෙ දෙවි ලොව එක පැහැර පෙරලා අවිනාශ්‍ය වූ අතුල්‍ය වූ අවාච්‍ය වූ අවෙද්‍ය වූ බුද්ධපූජා කොටැ ප්‍රාර්ථනා කොටැ වදාරා නොයෙක් යතනයෙන්

1. බදිර වනයෙහි 2. විනොදනයෙන් 3. බුදුවෙමි ය.

පසක් කළා වූ ඛීණාශ්‍රවයන් වහන්සේ මට ඉහලොකයටත් සරණ ම ය පරලොකයටත් සරණ ම ය. සව් සම්පත්හි නිවන් සම්පත්හි සාධා දෙන්නෙත් එම සඳහමින ම ය. එසේ හෙයින් මට අවශ්‍ය වූ සඳහමින ය සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

15. ඛීණාශ්‍රවයන් සම්බුදු විවරණ කථා.

මෙසේ නිරවසි නිරුපධ විශුද්ධ බුදු කෘත්‍යානුභාවයෙන් විසඳාපිත ප්‍රහ්ලාදිත නිවාපිත සමසත ලොක ඇති **ධර්මදර්ශි** නම් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි ඔවුන් වහන්සේගේ ශාසනය ද ක්‍රමයෙන් අන්තරහිත වූ කල්හි ඒ කල්පය ද විනාශයට පැමිණි කල්හි එතැන් පටන් එක්දහස් සත්සිය ස කපක් ගිය කල්හි මෙ තැනට[1] සුවානුවක් කපින් මත්තෙහි එක් කපෙක්හි ඒක වීර වූ ඒක ධීර වූ ඒක මානය වූ ඒක වදනය වූ ඒක ශලාඝ්‍ය වූ ඒක වාග්මී වූ ඒක පුරුෂොත්තම වූ —

16. සිද්ධාර්ථ සම්බුදු විවරණ කථා.

සමති ප්‍රභාවා'ප්‍රති සිද්ධාර්ථ වූ සංසිද්ධා'ශෙෂ පුරුෂාර්ථ වූ **සිද්ධාර්ථ** නම් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සමනිස් පැරැම් පුරා තුන් වන ආත්මභාවයෙන් චුත වැ **තුෂිත** පුරයෙහි ඉපද විවිධ විබුධ විදඹ මධුර භාවානුභාව භාජනීභූත වැ එහි ආයු පමණින් සිවැ දෙවතාවන්ගේ ආරාධනා ඉවසා **පඤ්චමහාවිලොකනය** කොටැ දෙවි ලොවින් චුත වැ —

ප්‍රකටීකෘත සමසත මහිත මහොත්සව භාර වූ[2] **මෛභාවත** නම් නුවරෙහි උදින සමසතාලොක හෘදයානන්ද වූ **උදයන** නම් මහරජානන් වහන්සේ නිසා සකල යුවති ලීලා දර්ශී වූ ශත වාර විහත කාර්‍යාස කල්ප ස්පර්ශී වූ **සුස්පර්ශා** නම් මහා දේවීන්වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳා ගෙණැ දස මසක් ඇවැමෙන් මවු කුසින් ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩී ප්‍රණයිනී ප්‍රණය කවාක්ෂ නික්ෂෙප ලක්ෂ්මී ක්‍රියමාන ප්‍රතීත නව යෞවන භාජන වැ —

ක්‍රියාවෙන් හා රූපයෙන් හා කුලයෙන් හා යෞවනයෙන් හා සිතූ සිතූ කෙණෙහි බැලූ බැලූ කෙණෙහි ලභ ලභා වූ කෙණෙහි සෞමනස්‍යය ම එළවන්නා වූ **සොමනස්‍යා** නම් මහා දේවීන්

1. මේ කාපව 2. භාර වූ.

වහන්සේගේ කුසින් හෘදයාභ්ලාද වෛද්‍යාපම වූ අනුපම නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි සුද්ධෝදනි රජාණන් මහාභිනිෂ්ක්‍රමණය කොටැ, කෙළ ලක්ෂයක් දෙනා හා කැවි වැ මහණ වැ දස මසක් මහාවියර්‍ය කොටැ, වෙසක් මසැ මැදි පොහෝ දා සකල සමෘද්ධීන් අසදෘශ වූ අසදෘශ නම් බ්‍රාහ්මණ ග්‍රාමයෙහි ප්‍රබුද්ධ වූ උත්පල පත්‍රයකට බදු වූ නෙත්‍ර ඇති නෛත්‍රා[1] නම් බ්‍රාහ්මණ කන්‍යාව විසින් පිළිගන්වන ලද්දා වූ කිරි පිඬු වළඳා ඛදිර වනයෙහි දිවා විහාර කොටැ —

සවස් වේලෙහි වරුණ නම් ශවපාලයා විසින් දෙන ලද්දා වූ අව මිටක් තණ පිළිගෙණැ විනිද්‍ර පුණ්‍යාලඞ්කාරී වූ කර්ණිකාර බොධිද්‍රුම මූලයට එළඹැ සතළිස් රියන් පමණ ප්‍රාසාදයෙහි වැඩැ හිඳැ උදුර මාර සේනා දමා වාරණේ'ක වෛනතෙය වැ ඝාමත්‍රයයෙහි විද්‍යාත්‍රයාධිගමය කොටැ ප්‍රත්‍යූෂයෙහි නිෂ්ප්‍රත්‍යූහ සම්බුද්ධාඥාන සමධිගමය කොටැ බොධිමූල සමීපයෙහි ම සත් සති යවා බ්‍රහ්මාරාධනාව පිළිගෙණැ ක්‍රමයෙන් ධර්මයක් පවත්වා එතැන් පටන් දුර්දාන්ත දමනය කොටැ දොළ විශෝතාපාටනය කෙරෙමින් කුදෘෂ්ටි දෘෂ්ටි සමුද්ඝාටනය කෙරෙමින් ධර්ම ප්‍රදීපය උද්දීපනය කෙරෙමින් ලොකාලෝ කරන්නට පටන්ගත් සෙයෙකැ.

එ සමයෙහි අපගේ සවාමිදරුවෝ අමිත වූ චතුරඞ්ග සේනා ඇති සුරසේන නම් නුවරෙහි දුරැ කරණ ලද අවමඞ්ගල ඇති එළවන ලද සියලු මඞ්ගල ඇති මඞ්ගල නම් වූ සදේවලෝක කාමිණ වූ බ්‍රාහ්මණ වැ කාමයෙහි ආදීනව දැකැ තාපස ප්‍රව්‍රජ්‍යායෙන් මහණ වැ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වසනා සෙවෙක් සිද්ධාර්ථ නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ උපන් බව අසා වදුරා පරම ප්‍රසාදයෙන් සදේවයන් වහන්සේ කරා එළඹැ —

බණ අසා සද්ධර්ම ප්‍රීතින් නිරන්තරීභූත චිත්තසන්තාන ඇති වැ දඹදිවට සලකුණු වූ මහදඹ ගසට ඒළඹැ මහදඹපකක්[2] ගෙණැ අවුදින් අනූ කෙළක් භික්ෂූන් වහන්සේ සපරිවාර කොටැ ඇති සදේවයන් වහන්සේ මහ දඹ රස අනුභව කරවා මම මේ සපරිවාර වූ බුදුන් වහන්සේට දුන්නා වූ දඹ රසයෙහි අනුසසින් මතු සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ අනුභව කළ ධර්මරස අනුභව කටහෙම්ව සි කියා මෙම ධර්මය ම පතා වදුළ සෙයෙකැ.

ඉක්බිති සිද්ධාර්ථ නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ද මේ මහා පුරුෂතෙම මේ දැනයෙහි අනුසසින් මතු ගෞතම

1. සුනෙත්‍රා 2. මහදඹපක් — මහදඹ පලක්.

නම් සම්‍යක් සම්බුද්ධ වෙයි කියා විවරණ පතුල් දී වදාළ සේක. ඒ ඇසූ මහාපුරුෂයාණෝ බුද්ධ භාවයෙහි බද්ධකක්ෂ්‍ය වැ එම සමනිස් පැරැම් පිරීමෙහි තත්පර වූ සෙයෙක. මෙසේ මාගේ සහෝදරුවන් විසින් නොයෙක් ජාතියෙහි නොයෙක් දෙළුන් පතා ලද්දා වූ ඛම්මචක්කය මුදුනෙන් පුදා සරණ යෙමි යි **දහම් සරණ** යා සුනු.

16. සිද්ධාර්ථ සම්බුද්ධ විවරණ කථා.

මෙසේ ප්‍රතිවිදිත තත්ත්වාර්ථ ඇති සිද්ධාර්ථ නම් සම්‍යක් සම් බුදුයන් වහන්සේ පිරිනිවි කල්හි ඒ කල්පය ද ඉක්මුණු කල්හි මධ්‍යයෙහි එක් කල්පයෙක් බුද්ධ ශූන්‍ය විය. එයට ඉක්බිති කප්හි නිර්මිකයන් විසින් අදෘශ්‍යවූ කෙලෙශයන් විසින් අදූෂ්‍ය වූ **නිෂ්‍යාස, පුෂ්‍යාස** යන සහෝදරුවෝ දෙදෙනෙක් ලොකයෙහි පහළ වූ සෙයෙක.

17. නිෂ්‍ය සම්බුද්ධ විවරණ කථා.

එහි නිසසා නම් සහෝදරුවාතෝ සමනිස් පැරැම් පුරා තුන් වන ආත්මභාවයෙන් චුතැ වැ තුෂිත පුරයෙහි ඉපදූ එහි ආයු පමණින් දිව්‍ය ශ්‍රී අනුභව කොටැ, දෙවතා'රාධනා පිළිගෙණැ, එයින් චුත වැ නානා ප්‍රකාර වූ චරිතයෙන් කරණ ලද්දා වූ ප්‍රඥා ලබ්ධ බන්ධුජන ඇති නිරත්‍ය වූ ලොකාත්ම සහිත වූ[1] සහෝ සම්බන්ධ ඇති ප්‍රත්‍යා'ඛ්‍යාත වූ දුර්නීති ගණ ඇති, ලොක ව්‍යාපි වූ කීර්ති ප්‍රබන්ධ ඇති, වෘෂභ සකාශ වූ **සත්‍ය සන්ධ** නම්[2] මහරජානන් වහන්සේ නිසා සෞන්දර්‍යයී ශ්‍රී නිවාස කුශල සම්පූර්ණ වූ විනිද්‍ර මුඛ පද්ම වූ **පද්මා** නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවැමෙන් මවු කුසින් නික්මැ නව සෞඛ්‍යවත සුන්දර තර සෙනහ මන්දිර වූ ශූන්‍යා'වසථාවට පැමිණැ —

සත්‍රින්ව උවමනා ගුණෙන් සම්පන්නොභද්‍ර වූ **සුභද්‍රා** නම් මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තෙතිස් දහස් නාටක සත්‍රින්ගේ නයන කුමුද විකාශ නව චන්ද්‍රිකා ප්‍රවාහ වැ සත් දහස් හවුරුදු ගිහිගෙයි සිටැ බ්‍රහ්මා'පණ්ණිත සතර පුව් නිමිත්ත දැකැ සුභද්‍රා නම් දෙවින් වහන්සේගේ කුසින් පරමා' නන්ද මුනිනි වූ **ආනන්ද** නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි ලොකොත්තර වූ **සොණෝත්තර** නම් අශ්වරාජයා පිට නැඟී

1. ලොකාත්ම සංඛ්‍යාත වූ. 2. සත්‍යබන්ධනම්.

මහාභිනිෂ්ක්‍රමණය කොටැ පුරුෂයන් කෙළක් දෙනා හා කැවි වැ මහණ වැ අට මසක් මහාවීර්‍ය කොටැ වෙසක් මසැ මැදි පොහෝදා ප්‍රවීණ පුරුෂා'කීර්ණ වූ චිර නම් ග්‍රාමයෙහි චිර නම් සිටාණන්ගේ දියණියන් විසින් එළවන ලද්දා වූ කිරි පිඬු වළඳා අවිරල කුසුම කරාල වූ සරල වනයෙහි දිවා විහාර කොටැ —

සවස් වේලෙහි විජිත සඞ්ග්‍රාම නම් යවපාලයා විසින් එළවන ලද්දා වූ අට මිටක් තණ පිළිගෙණැ සර්ලෝක ප්‍රිය දර්ශන වූ සකල කලි නාසන වූ අසන බොධිද්‍රැමයට එළඹැ සතළිස් රියන් වප්‍රාඝනයෙහි වැඩහිඳැ මාරසෙනා මාන ප්‍රතාන ලතා ග්‍රන්ථි භෙදයෙහි ප්‍රබල ප්‍රහර්ෂාත වැ යාමත්‍රයයෙහි ඥන ත්‍රයාධිගමය කොටැ අරුණෝ'දයෙහි අතරුණ කරුණාධිමණ විෂයීකෘත සමසත ප්‍රාණී මණ්ඩල ඥෙය මණ්ඩල ඇති වැ ධර්ම රාජ්‍යයෙහි ඥනා'භිෂෙක ලදින් බොධිද්‍රැම ප්‍රාන්තයෙහි සත් සති යවා බ්‍රහමා'රාධනා පිළිගෙණැ ධර්මඝක් පවත්වා එතැන් පටන් සිඟලු සත්ත්වයන්ගේ ඇසැ ඇදී ගියාක්හු සේ බැසැ බැසැ සැරහී ගියාක්හු සේ ආදරයට නිදන වූවක්හු සේ ලොකා'ලඞ්කාර කරන්නට පටන්ගත් සෙයෙක

එ සමයෙහි අප සම්මා සම්බුදු රජානන් වහන්සේ යසවති නම් රාජධානියෙහි සර්ලෝක විඥාත වූ භූලෝක පාරිජාත වූ විචිත්‍රා'භිග්‍රාම්කා'පදන ජාත වූ උභය පක්ෂයෙන් සුජාත වූ සුජාන නම් මහරජ වැ පඤ්චකාමයෙහි ආදීනව දැකැ සමසත සමපත්ති සාංභිත්‍යයෙන් මනොහර වූ රාජ්‍යය හැරැ මහණ වැ වල්හි වෙසෙමින් නිස්ස නම් සර්ඥයන් වහන්සේ උපන් බව අසා ප්‍රසාද ප්‍රණය පූර්ණඛගම වැ ශ්‍රී පාද සේවා පිණිස එළඹැ සද්ධර්ම අසා මෙසේ වූ කල්‍යාණ කීර්ත්ති වූ ධර්ම මූර්ත්ති වූ සවාම්දරුවෝ තමා සේ වූ ගෑත්ත වූවන් විසින් ශකති පමණින් පූජා කටයුත්තේ යයි සිතා වදාරා —

චිත්තොත්පාද සම කාලයෙහි ම නවිතිසා භවනයට් එළඹැ චින්තලතා වනාදී දිව උයන් සතරට වැදැ පරසතු මදාරාදී වූ දිව මල් බිඳැ ගවිවක් පමණ සත්රුවන් සුමුගෙක්හි පුරා වියතක් පමණ මල් හොවුවක් අල්වා ගෙණැ එන බලවත් පුරුෂයක්හු සේ අයත්ත-යෙන් සර්ඥයන් වහන්සේ කරා එළඹැ ශ්‍රී පාද මූලයෙහි තබා චිත්‍ර විකාසිත මනොහර කුසුම පූජා කොටැ මැණික්මය වූ දඬු ඇති, පද්මරාගමය වූ පත් ඇති, සවර්ණමය වූ කර්ණිකා ඇති, සුරභී කෙශර මනොහර වූ මහ පියුම් සතක් සර්ඥයන් වහන්සේගේ මුදුනට වඩා වැඩැ සිටි සෙයෙක.

එසේ වැඩසිටි මේ සා බුදුධ පූජාවක් කොටැ අනික් වසතුව කට තො පතා මෙහි පෙලෙන් මෙම සම්බුදයන් වහන්සේ දුටු ධර්මය ම පසක් කට ගෙම්ව සි කියා එම සදධර්මය ම පතා වදළ සෙයෙක ඒ සවාමිදරුවෝ ද 'මේ මහා පුරුෂයොම මෙම ඤාසලයෙහි අනුසසින් මතු මා සේ ම ගෞතම සම්‍යක් සම්බුදධ වෙයි' විවරණ පතුල් දී වදළසේක. ඒ අසා වදළ සවාමිදරුවෝ "මම ද බුදුවෙම් ල" යන අදහසින් ඒ සමතිස් පැරැම් පිරිමෙහි සෝතසාහ වැ වදළසේක.

මෙසේ ඕගේ සවාමිදරුවානන් විසින් අනන්‍ය සාධාරණ වූ බුදධ පූජා කොටැ නොයෙක් ජාතියෙහි පතා වදළා වූ අනනත ජාතියෙහි වජ්‍රාසනයෙහි වැඩ හිඳ **මහා වජිරඤාණ**ෝ'දයෙන් පසක් කරණ ලද්දා වූ සදධර්මය ම මව දුක් නො වැද්ද දෙන්නට වජ්‍ර ප්‍රකාරයෙක සියලු සම්පත්ති ඵළවන්නා වූ කල්ප වෘක්ෂයෙක සසරහිම් නිවා වැදූ නිවි සැනහෙන අමාමහ විලෙක. එහෙයින් එසේ වූ සදධර්මය ම සරණ යෙම් සි **දහම් සරණ** යා යුතු.

17. තිෂ්‍ය සම්බුදධ විවරණ කථා.

මෙසේ සම්සා හුවනා'හොග භාසකර වූ අපගත මනඃකාලුෂ්‍ය ඇති තිෂ්‍ය සම්‍යක් සම්බුදධයන් වහන්සේ පිරිනිවි එක් බුදධා'නන්තර යක් ඉක්මුණු කල්හි අනුලෝම විලෝම සම්සා ලොකාවි සිදධි පුෂ්‍ය වූ පුෂ්‍ය නම් සම්‍යක් සම්බුදධයන් වහන්සේ සමතිස් පැරැම් පුරා දෙවියන්ගේ ආරාධනා පිළිගෙණැ තුසි පුරෙන් සැවැ සම්සා සම්පතින් විකසිත වූ කසි නම් නුවරෙහි නිර්ජිත වූ අරාති සෙනා ඇති **ජයසෙන** නම් මහරජාණන් වහන්සේ නිසා නිරුපමෙය වූ රූප ශ්‍රී ඇති ශ්‍රීමති දෙවීන් වහන්සේ ගේ කුසියෙහි පිළිසිඳා ගෙණැ දස මසක් ඇවැමෙන් මවු කුසින් නික්මැ ක්‍රමයෙන් වැඩී සවබාහු පාඟතමින කව යුවති ජන ප්‍රෙෂ්ඨ ගාඪ ශ්ලේෂ රසික වූ අවසථාවව පැමිණැ –

18. පුෂ්‍ය සම්බුදධ විවරණ කථා

අකාෂ වූ සෙනහ ඇති **කිසා** ගොතමීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තිස් දහසක් කාවක සත්‍රීන්ගේ ශාඛාහාර සයන සඟාස වැ දස දහසක් හවුරුදු ගිහි ගෙයි වැසැ බ්‍රහෙමා'පණීත සතර නිමිතත දැකැ ප්‍රව්‍රජ්‍යායෙහි සාභිලාෂ වැ **කිසා** ගොතමීන් වහන්සේ විසින් **අනුපම** නම් පුත්‍රරතනයක් ලත් කල්හි භෂනී

යානයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොටැ උදාන සිද්ධුර වර සකඩි සඩි සමාරොහණ ප්‍රාවිණ්‍යයෙන් ප්‍රකටිකෘත වූ ඓරාවනවාරණාදි රැස වූ පුරන්දර සෞන්දර්‍යය ඇති වැ හස්තියානයෙන් බැසැ කෙළක් පුරුෂයන් හා කැටි වැ මහණ වැ —

සමසක් මහාවීර්‍යයී කොටැ වෙසක් මසැ මැදි පොහෝ දවස් අභිවෘර්ධි වූ සෞන්දර්‍යයී ශ්‍රී ඇති ශ්‍රීවර්ධන නම් සිටුදියණියන් විසින් පිළිගන්වන ලද්ද වූ කිරිපිඬු වළඳ, සවස් වේලෙහි ශ්‍රීවර්ධන තාපසොත් පණිත අෂ්ට මුෂ්ටි ප්‍රමාණ තෘණ ප්‍රතිග්‍රහණ පූර්‍වාඩගම් වැ සකල ලොක පාලක වූ ආමලක බොධිද්‍රැම මූලයට එළඹැ, අට තිස්රියන් වද්‍රාසනයෙහි වැඩැ හිඳ, මාර චක්‍ර වික්‍රම වික්ෂෝභ කෙලි විදාඩවැ යාමත්‍රයයෙහි ඥනත්‍රයා'ධිගමය කොටැ ප්‍රත්‍යූෂ කාලයෙහි සම්බුද්ධතාඥන සමධිගමයෙන් ප්‍රත්‍යාඛ්‍යාත වූ සමස්ත වස්තු විස්තාර යථාතථ්‍ය විරොධනෙ'ක රසිඝ මොහ ප්‍රබන්ධ සම්බන්ධ ඇති වැ බොධිද්‍රැම ප්‍රාන්තයෙහි ම සත් සති යවා බ්‍රහ්මයාගේ ආරාධනා පිළිගෙණැ ධර්‍මයක් පවත්වා එතැන් පටන් සකල චිත්තෙය වර්‍ගයා නිසඟී මධුර තරණයෙන් සවඟී'පවඟී මාර්‍ගයෙහි පිහිටුවමින් ලොකාර්‍ථ කරන්නට පටන්ගත් සෙයෙක.

එ සමයෙහි අපගේ බෝසතාණන් වහන්සේ අරිඤ්ඤම නම් නුවරෙක්හි සකලා'රාති දමනයෙන් යථාර්‍ථ වූ නම් ඇති අරිඤ්ඤම නම් මහරජ වැ පුෂ්‍ය නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලෝක යෙහි උපන්බව අසා උන්වහන්සේ කරා එළඹැ සද්ධර්‍මය අසා නිරතිශය ප්‍රසාදයට පැමිණැ කෙළ ලක්ෂයක් සක්වළ ගබ එක පැහැර වස්තා කප හවහන්තා මහා මෙඝයක් සේ බුදු පා මොක් මහා සඞ්ඝයා වහන්සේට මහත් වූ දානවර්‍ෂා වස්වා නිස්සඞඝ වැ රාජ්‍යය හැර ඔවුන් වහන්සේගේ ශාසනයෙහි මහණ වැ මේ සා මහත් කුශල කර්‍මයකින් අනික් සම්පත්තියක් නොපතා මේ මා දුන් දන් හා ගළ රාජ්‍යයෙහි හා රැකි ශීලයෙහි හා අනුසසින් මම ද සවාමිදරුවානන් වහන්සේ පසක් කළා වූ සද්ධර්‍මය ම පසක් කට හෙම්ව යි කියා දහම් ම පතා වදාළසේක.

ඒ පුෂ්‍යතම් සවාමිදරුවානෝ ද මේ මහාපුරුෂතෙම මතු ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙයි කියා විවරණ පතුල් දී වදාළසේක. ඒ ඇසූ බොධි සත්ත්වයෝ "මතු මම බුදු වෙමිල" යන අදහසින් එම සමතිස් පැරැම් පිරීමෙහි සෞතසාන වැ වදාළසෙයෙක. මෙසේ මාගේ සවාමිදරුවානන් විසින් පසඳ කාම ගුණයෙන්

සමෘද්ධ වූ රාජ්‍යය හැර කොයෙක් ජාතියෙහි මහණ වෑ දුෂ්කර වූ ශාසන ප්‍රතිපත්ති පුරා කොයෙක් යත්නයෙන් පතා ලද්දා වූ ධර්මය ම සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

18. පුෂ්‍ය සම්බුද්ධ විවරණ කථා.

මෙසේ අශෝෂ්‍ය වූ කරුණා ප්‍රවාහ ඇති පුෂ්‍ය නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවි කල්හි, ඒ කලපය ද නව කල්හි, මෙ කපට යවින් එකානූවන

19. විදර්ශි සම්බුද්ධ විවරණ කථා. කපහි භූත - භවිෂ්‍යත් – වර්‍ත මාන යන කාලත්‍රය දර්ශි වූ **විදර්ශි** නම් භගවත් අතීත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සම තිස් පැරැම් පුරා තුන්වන ආත්මභාවයෙන් චුත වැ **තුසිපුර**යෙහි ඉපැදුණ.

එහි ආයු පමණින් දිව්‍ය සම්පත් වළඳා **පඤ්චමහාවිලෝකනය** කොටැ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනා පිළිගෙණ, එයින් චුත වැ සම්‍යක් භූත බන්ධුවූ **බන්ධුමති** නම් නුවරෙහි අක්ෂීණ බන්ධුමත් වූ **බන්ධුමති** නම් මහරජානන් වහන්සේ නිසා ප්‍රබුද්ධ වදන හානු බන්ධුමති වූ **බන්ධුමති** නම් දේවීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳ ගෙණ දස මසක් ඇවැමෙන් මවු කුසින් බිහි වැ මදන ජ්වර ජර්ජරිත යුවති ජන කඝනොතපලා'ස්පද තරුණ සවණී ඵලකාය මාන වූ වක්ෂසඵල ඇති යෞවනයට පැමිණ සෙනහ මධුර දර්ශන ඇති —

සුදර්ශනා නම් මහා දෙවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇත් තාවූ එක් ලක්ෂ විසි දහසක් නාටක ස්ත්‍රීන්ගේ ප්‍රෙම සීමා'විලඛ්‍ය වූ ශෘඛාර සුධා නිෂේක පාත්‍ර වැ අට දහසක් හවුරුදු ගිහි ගෙයි වැසැ වතුර්විධ පූජී නිමිත්ත සන්දර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යායෙහි අභිලාෂ වැ **සුදර්ශනා** දේවීන් වහන්සේගේ කුක්ෂියෙන් නිර්වූඝ ප්‍රෙම බන්ධන ඇති **සම වෘත්තන සකඛ** නම් පුත්‍ර රත්නය උපන් කල්හි අජානිය[1] සෛඛ්වයන් යෙදූ රථයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොටැ සුවාස්‍ර දහසක් පිරිමින් හා කැටි වැ මහණ වැ අට මසක් **මහාඩියභි** කොටැ වෙසක් මසැ මැදි පොහෝ දවස් **සුදර්ශන** නම් මහ සිටාකන්ගේ දියණියන් විසින් ඵලවත ලද්දා වූ කිරි පිඬු වළඳා දහවල් **සහමල්** සල් වෙනෙහි දිවා විහාර කොටැ —

1. ආජානීය.

සවස් වේලෙහි සුජාත නම් යව පාලයා විසින් එළවන ලද්දා වූ අව මිවක් තණ පිළිගෙණැ බහල තුමූල මොහ පවල පාවත සහාය වූ පාටලි බොධියට එළඹැ තෙ පණස් රියන් වජ්‍රාසනා රූඪ වැ මාර සොර හාර හුංකාර විකාර නිකර ධූරි කරණ යෙන් ප්‍රකටිහූත වූ බොධි සත්ව සාම්ප්‍රයය ඇති වැ යාමත්‍රයයෙහි ඥතත්‍රයා ධිගමන කොටැ ප්‍රත්‍යූෂ කාලයෙහි සම්බෙදනාඥන සමධි-ගමයෙන් අනූන පාණ්ඩිත්‍යයව පැමිණැ සත් සති යවා බ්‍රහමා-රාධකා පිළිගෙණැ ධම්මක් පවත්වා සියලු ලොවට හුදකලා වැ මවූ පිය තතතුරෙහි සිටැ ධම්මචක්‍රාය[1] වස් වන්නට පවන්ගත් සෙයෙක.

එ සමයෙහි අපගේ බොධි සත්ත්වයන් වහන්සේ නාගලොක යෙහි මහානුභාව වූ නාගරාජ වැ ඉපදූ අනෙක කොටි ශත සහශ්‍ර සඛ්‍යාත වූ නාග සෙනා පරිවාරයෙන් යුක්ත වැ සම්බුදයන් වහන්සේ කරා එළඹැ බුදු පාමොක් මහා සඛ්‍යයා වහන්සේ වැඩැ හිදිනට සුදුසු වූ මණඩපයක් මවා එහි සපිරිවර සම්බුදයන් වහන්සේ වඩා හිඳුවා සත් දවසක් මහදන් දී අනන්තයෙහි දවස් බුදුන් වහන්සේ වැඩැ හිදිනට සුදුසු වූ සම්පූර්ණ රතන මණ්ඩිත වූ සථා'නොවිත සඛණී කාමීනන්ත විත්‍යාසයෙන් විසිතුරු වූ ආසනයක් මවා දී මෙහි අනුසසින් මොවුන් වහන්සේ විසින් දන්නා ලද්දා වූ සද්ධාමීය මම ද ප්‍රත්‍යක්ෂ කව හෙම්ව යි පතා වදාළ සෙයෙක. ඒ සම්බුදයන් වහන්සේ ද "මේ මහාපුරුෂතෙම මතු මා සේ ම සම්බුදවන්නේය" යි විවරණ පතුල් දී වදාළ සෙයෙක.

ඒ අසා වදාළ මහාපුරුෂයානන් වහන්සේ ද "මම මතු බුදු වෙම් ල" යි එම සමතිස් පැරැම් පිරීමෙහි දෘඪ ග්‍රහණය කොටැ වදාළසේක මෙසේ මාගේ ගෞතම ගොත්‍රයෙහි උපන් සබාම් දරුවන් වහන්සේ විසින් මනුෂ්‍ය වැ ද දෙවෙන්ද්‍ර වැ ද සිංහරාජ වැ ද චක්‍රවර්ති වැ ද නාගරාජ වැ ද නොයෙක් ලෙසින් කුසල් කොටැ පතා ලද්දා වූ සද්ධාමීය ම සරණයෙමි යි දහම් සරණ යා යුතු.

19. විදර්ශි සම්බුදු විවරණ කථා.

මෙසේ සකල ධම්ම'ධම්ම විභාග නිදර්ශී වූ විදර්ශි නම් සම්‍යක් සම්බුදධයන් වහන්සේ පිරිනිවි කල්හි ඒ කලපය ද විනාශයට පැමිණි කල්හි එයින් ඔබ්බෙහි

20. සිඛී සම්බුදු විවරණ කථා. එකුන් සැට කපෙක්හි සම්බෙදය යන නාම ශ්‍රවණ මාත්‍රයකුදු

ලොකයෙහි නොවී ය. මෙයින් එකුන් තිස් කපෙකින් මත්තෙහි

1. ධම්මචක්‍රය.

වනාහි කෙලෙස බැඳින දහන සිඳ වූ **සිබි** නම් සවාමිදරුවෝ ය, ඥාතිරෙක සඟමිහු වූ **වෙසසඤ්ඤ** නම් සවාමිදරුවෝ ය යි මෙසේ නිමියෝ දෙදෙනෙක් ලොකයෙහි පහළ වූ සේක.

එහි රාග නාග මාන මර්දන සිබි වූ **සිබිනම්** සවාමිදරුවෝ සමනිස් පැරැම් පුරා දෙවියන්ගේ ආරාධනායෙන් **පඤ්චමහා විලොකනය** කොටැ තුසි පුරයෙන් චුත වැ පද්මරාග මණිගණ කිරණ සඤ්චරණයෙන් නිරනතරයෙන් අරුණවත් වූ **අරුණවති** නම් රාජධානියෙහි අති තරුණ වූ ලොකත්‍රය ව්‍යාපි වූ තෙජසින් අරුණ වූ **අරුණවන්** නම් මහරජානන් වහන්සේ නිසා සාරවනත ශොභාවති වූ **ප්‍රභාවතීන්වහන්සේ**ගේ කුසියෙහි පිළිසිඳ ගෙණ දස මසක් ඇවැමෙන් ප්‍රසව වැ **ප්‍රණය** කුපිත ප්‍රණයිනීන්ගේ මාන ග්‍රහ විෂ විකිතසා'හී හෙෂජාසමාන වූ තව යෞවනයට පැමිණ —

පසදව කාම සමවාය සවරූප වූ **සච්චකාම** නම් දේවිත්වහන්සේ ප්‍රධාන කොටැ ඇත්තා වූ සුවිසි දහසක් නාටක සත්‍රීන්ගේ කයන මදන සදන ධුරඬර වැ සද්දහසක් හවුරුදු ගිහිගෙයි වැසැ **සච්චකාම** දේවීන් වහන්සේගේ කුසින් සෞභාග්‍ය උද්වතීල වූ[1] **අනුල** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි බුහම සංදර්ශිත චතුර්විධ නිමිතත දැකැ **හසති** වාහනයෙන් මහා'භිනිෂ්ක්‍රමණය කොටැ සැත්තැ දහසක් පිරිමින් හා කැටි වැ මහණ වැ අව මසක් **මහාවියූ** කොටැ වෙසඟ මැදි පොහෝ දවස් **සුදශීන** නම් ගමැ **ප්‍රියදශීන** නම් මහ සිටානන්ගේ දියණියන් විසින් පිළිගන්වන ලද්ද වූ මිහිරි කිරිපිඬු වළඳ හෘදය මදන මන්දිරාසමාන වූ **බදිර** වනයෙහි දිවා විහාර කොටැ —

සවස් වේලෙහි **අනවමදර්ශි** නම් තාපසයන් විසින් පිළිගන්වන ලද්ද වූ අටමිටක් තණ පිළිගෙණැ සකල භව දුඃඛ ප්‍රත්‍යනීක වූ **පුණඩරීක** බොධිද්‍රැම මූලයට එළඹැ සුවිසි රියන් වප්‍රාසනයෙහි වැඩැ හිඳැ මාරබල බාල මෘණාල හෙදයෙහි ප්‍රවර වරාහ විලාස දක්වා යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයා'ධිගමය කොටැ අරුණෝ'දයෙහි කෙලෙසා'වරණ ව්‍යපගමයෙන් විශුද්ධ වූ අනනෘ කරණ ඇති වැ සම්බුතාඥන සමධිගමයෙන් මසාකප්‍රාපත වූ මනොරථ ඇති වැ බොධිය සමීපයෙහි සත් සති යවා බුහමා'රාධනාව පිළිගෙණැ ධම්සක් පවත්වා වදුළ සෙයෙක.

---

1. උදුවර්ත ඉ.

මෙසේ සමසමා සත්ත්වාභි'මතාඪ්‍ය සාධ'නෛක කල්ප ශිඛා වූ සිඛී නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොකානුග්‍රහ කොටැ වදාරණ කල්හි අපගේ සවාමිදරුවෝ සවාමි ය අමාත්‍ය ය යනාදී වූ සපනා'ඔහ සමාර්ධීන් අපරිහූත වූ අපරිහූත නම් නුවරෙහි විරචිත වූ ඉන්ද්‍රිය දමනය ඇති අරිඳමනම් රජ වැ තමන් වහන්සේගේ නුවරට එළඹියා වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට පෙරගමන් කොටැ දැකැ වැඳැ පුදා බණ අසා සතර මහාවිපයෙහි එකහෙළා වස්තා මහාමෙඝයක් සේ සත් දවසක් මුළුල්ලෙහි මහදන් දී, බුදුපාමොක් මහා සඞ්ඝයා වහන්සේට තුන් සිවුරු පිණිස ලක්ෂ ගණන් අගය ඇති උතුරුසළු දහස්ගණන් දී, තමන් වහන්සේගේ මහුලැත්හු සදා සිටුවා ඔහු උසෙක පමණ බෙහෙත් බඩු පුරා දන් දෙවා වදාළසේක.

මෙසේ මහදන් දී ද අනික් වසතුවක් නොපතා මෙහි පෙලෙන් මෙම සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලද ධර්මරාජ්‍යය ම ලබම්ව යි කියා ප්‍රාර්ථනා කොටැ වදාළසේක ඒ සවාමිදරුවෝ ද 'මේ මහා පුරුෂයානෝ මේ දානයෙහි අනුසසින් මතු ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙතියි' විවරණ පතුල් දී වදාළසේක. එබණ ඇසූ මහා පුරුෂයානන් වහන්සේ ද "මම මතු බුදුවෙම් ල"යි එම සමතිස් පැරැම් පිරීමෙහි තත්පර වැ වදාළ සේක.

මෙසේ මාගේ සවාමිදරුවන් විසින් අනික් සමපතනියක් නොපතා සුමේධතාපස කාලයෙහි පටන් ගෙණැ මේ අරිඳම නම් රජ වැ උපන් ජාතිය දක්වා බුද්ධෝ'ත්පාදයෙහි ද බුදු හමු වෙහි ද අබුද්ධොත්පාදයෙහි ද තමන්වහන්සේගේ සුභාවිත වූ බොධිසත්ත්වා'භිප්‍රාය වූ පරිද්දෙන් දානාදී නොයෙක් පරිද්දෙන් පින්කම් කොටැ පතා ලද්ද වූ මේ සද්ධර්මය ම සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

20. සිඛී සම්බුද්ධ විවරණ කථා.

මෙසේ සංහෘත මදන ශිඛා ඇති සිඛී නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ශිඛා ප්‍රාප්ත වූ මනොරථ ඇති වැ පිරිනිවන් පෑ කල්හි ඒ බුද්ධානන්තරය ඉක්මුණු කල්හි

21. විශ්වභූ සම්බුද්ධ විවරණ කථා.

විශ්වභූ නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සමතිස් පැරැම් පුරා තුෂිත පුරයෙහි ඉපද එහි ආයු පමණින් සිටැ දෙවියන්ගේ ආරාධනායෙන් පඤ්ච මහාවිලෝකනය

කොටැ එයින් සැවැ සම්පත්තියෙන් අනුපම වූ **අනුපම** නම් නුවරෙහි සත්ගුණයෙන් සුප්‍රශීත වූ **සුප්‍රශීත** නම් මහරජාණන් වහන්සේ නිසා විශුද්ධ ශීලවන්ත වූ **ශීලවති** නම් දේවීන් වහන්සේ ගේ කුස්හි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවැමෙන් ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩි නව යොවන සුඳර සුඳරි ජන මදන මහෝත්සව මන්දිර වූ යොවනයට පැමිණැ —

ආචාරයෙන් පවිත්‍ර වූ රූපයෙන් විචිත්‍ර වූ **සුචින්‍ද්‍රා** නම් දේවීන් වහන්සේ ප්‍රධානකොටැ ඇති තිස් දහසක් නාටක ස්ත්‍රීන්ගේ මුඛ'වෂකොපනීත මධුර ගණ්ඩූෂ මධු පානයෙන් මත්ත වැ දස දහසක් හවුරුදු ගිහිගෙයි වැසැ **සුචින්‍ද්‍රා** නම් දේවීන් වහන්සේගේ කුසින් ප්‍රසාද සුමුඛ වූ සුප්‍රබුද්ධ පද්මෝපම මුඛ වූ **සුප්‍රබුද්ධ** නම් පුත් රුවන උපන් කල්හි සතර නිමිත්ත දැකැ රත් සිවිගෙන් මහාභිනිෂ්ක්‍රමණය කොටැ සත්තිස් දහසක් පිරිමින් හා කැටි වැ මහණ වැ සමසක් **මහාවියහී** කොටැ **වෙසක් මසැ මැදි පොහෝ දවස් සුමිත්‍රා** නම් ගමැ ශෘඬගාර කාමූක නාග මාණවක මනොරථ වර්ධන වූ **ශ්‍රීවර්ධන** නම් නාග කන්‍යාව විසින් එළවන ලද්දු වූ කිරිපිඬු වළඳා සල්වෙතෙහි දිවාවිහාර කොටැ —

සවස් වේලෙහි **නරෙන්ද්‍ර** නම් නාග රාජයා විසින් එළවන ලද්දු වූ අවමිටක් තණ පිළිගෙණැ ලොකාර්චයහී වන්සල මාංසල වූ **ශාල** බොධියට පැමිණැ සතළිස් රියන් වජ්‍රාසනයෙහි වැඩැ හිඳැ මාර වීර වියහී කර්පූර දහයෙහි ප්‍රබල වහ්නි විලාස දක්වා ක්‍රමයෙන් සම්‍යක් සම්බොධියට එළඹැ සත් සති යවා බ්‍රහ්මා'රාධනා පිළිගෙණැ **ධර්මඝක්** පවත්වා අනන්නා'පයහීනත ලොකා'ර්ථ සම්පාදනයෙහි අවිශ්‍රාන්ත වූ උත්සාහ ශක්ති ඇති වැ භුවනා'චාර්‍ය්‍ය ධුරයෙහි මසාක ප්‍රාප්ත වැ වසන සෙයෙක.

එසමයෙහි අපගේ සවාම්දරුවෝ තමන් වහන්සේ විසූ මනිමායෙන් සිහිකිරීම් මාත්‍රයෙකිනුදු සියලු ලෝකයට සරණ වූ **සරණවති** නම් නුවරෙහි සර්‍වඥත්ව සුදශීන වූ **සුදශීන** නම් මහරජ වැ ගාම නිගම රාජධානියෙහි චාරිකායෙහි වඩනා වූ ඒ සර්‍වඥයන් වහන්සේ තමන් වහන්සේගේ නුවරට පැමිණි කල්හි ඔවුන් වහන්සේ සැරා එළඹැ බණ අසා හටගත්තා වූ මහත් බුද්ධා ලම්බණ ප්‍රීති ප්‍රසාද ඇති වැ බුදු පාමොක් මහාසඞ්ඝයා වහන්සේට තුන් සිවුරු හා එක් කොටැ මහදන් දී —

නිර්ධූත මාර භ්‍රූ කුටි ඇති සර්‍වඥයන් වහන්සේට අනුපම වූ ගඬ කුටියක් කරවා ඒ ගිහාරා විහාර දහසක් කරවා අන්තයෙහි සියලු රාජ්‍යශ්‍රී හැරැ ඔවුන් වහන්සේගේ ශාසනයෙහි මහණ වැ

සියලු සම්පත්හි තුණුරුවන් අග්‍ර කොට තෙළෙහි ධුතා'ඞ්ගධර වැ මහාගුණ පුරා මෙ මා පිරූ සුචරිතයෙහි අනුසසින් මතු මෙම විශ්වභූ සම්බුදුන් වහන්සේ පසක් කළ අරිද්දෙන් සද්ධිම්ම පසක් කට හෙම්ව සි කියා ප්‍රාර්ථනා කොටැ වැඳ ලැබුණි

ඒ සම්බුදුන් වහන්සේ ද මේ උත්තම පුරුෂ තෙම මේ සුචරිතයෙහි අනුසසින් මතු ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙයි කියා විවරණ පතුල් දී වැඳුළ සෙයෙක. ඒ ඇසූ මහා පුරුෂයානන් වහන්සේ ද "මතු මම බුදුවෙම් ලැ" යන අදහසින් එම සමනිස් පැරැම් පිරීමෙහි ම ශත සහස්‍ර ගුණයෙන් තත්පර වැ වැඳුළ සේක. මෙසේ මාගේ සවාමීන් විසින් නොයෙක් කුසල් කොටැ නොයෙක් සම්පත්හින් සමෘද්ධ රාජ්‍යය හැර මහණ වැ නොයෙක් යතනයෙන් පතා ලද්දා වූ සද්ධම්මය සරණ යෙමි සි **දහම් සරණ යා යුතු.**

21. විශ්වභූ සම්බුද්ධ විවරණ කථා.

මෙසේ සියලු ධම්ම මහාතම්‍යයට ප්‍රතිභූ වූ විශ්වභූ නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි එයින් මෑත එකුන් තිස් කපක් මුළුල්ලෙහි

22 ක්‍රකුසන්ධ සම්බුද්ධ විවරණ කථා. බ්‍රහ්මා'තපාදයෙක් නොවී ය. එයින් මුබෙහි අප සේ වූවන්ගේ තුඩ ද තුණු රුවන්හි නම් වක්‍රා පියන්ට (නො) පොහොසත් වූ[1] දෙවිදත්හු වැනි රත්නත්‍රයට ද්‍රෝහීන් පවා බුත් සරණයෙමි' කි බසක් පමණකින් මතු පසේබුදු වැ අමාමහ නිවන් දක්නට හේතු ලබන්නට සුදුසු වූ —

පස්වා දහසක් මුළුල්ලෙහි මාගේ සවාමිදරුවන් පියවර එබූ **සමණොලගල** වැඳහැ **කැලණිය** වැඳහැ යනාදි වූ සුචරිත කළවුන් මාගේ ම සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ අමාමහ නිවණට ගෙණැ යන්නට පොහොසත් වූ මාගේ සවාමිදරුවානන් හිඳැ බුදු වූ බෝරුක්හි පරම්පරායෙන් ආ රුක්හි පවා මළ පරඬලා ගෙණැ පූජා කළවුන් විසින් පවා සජීව බුදුන් වහන්සේට පූජාකළවුන් ලබන දිව්‍ය සම්පත්හි මනුෂ්‍ය සම්පත්හි වළඳවන්නා වූ සවාමිදරුවන් නො හැඳිනැ වන්නා වූ අප පොවා ඒ **තුණුරුවන්හි සරණින්** ගිනි ගිනි යැ සි නො සිතා විෂ විෂ යැ සි නො සිතා වැසැන වැසැන යැ සි කොසිතා —

---

1 අපොහොසත් වූ.

වණ්ඩ වූ සිංහ ව්‍යාඝ්‍රාදීන් වණ්ඩ සත්ත්ව කෙණෙකැ යි නො සිතා, අවිවේකී වූ ප්‍රවණ්ඩ වූ පරලොවක් ඇතැ යි නො සිතන, ජීවිතය ත් අසිර ය යි නො සිතන රා බී මත් ආරොහකයන් න. හී මතැතුන් සේ කි කි වත් කි කි වක් ම කරණ, හඟංකර වූ රාජ කුලයට වැද අප තුණුරුවන් ගැත්තනට කුමන නම් උප ද්‍රවයෙක් වේදැ යි යෙගෙන් නිදැ පිබිදැ අකාල මරණීන් ගැලවෙන පමණ සුචරිත පුරන්නට සුදුසු වූ බුදුන් මරම්හ යි දිවූ අඬගුලි-මාලයන් බිණු පිරිනින් පොවා කපක් මුළුල්ලෙහි ලොක ඥානි එළවන්නා වූ බුදුන් පස අල්වා ගෙණැ පර සක්වළ ගසම්හ යි දිවූ ආලවකයා පවා තමන් වළඳන පස ගත් අනාද මහ නෙරුන් වහන්සේ ලද ගුණ ධර්මයෙහි ම පිහිටුවන මහතුන් ඇතිවීමෙන් ලොවට අසහාය සරණ වූ —

බුදුන් මරන්නට දිවූ **නාලාගිරි** නම් මතැත්හු පවා **ධන පාල** ය **සිලපාල** ය යන නම් කිය වූ බුදුරජ මුහුණ බලා හුන් **බකමුහුණක්හු** පවා **පසේබුදු** වන්නට හෙතු ලබන්නා සේ බුදුන් වහන්සේගේ ධාතු පිහිට වූ සතර රියන් දැගබ බැඳ වූ අප සේ වූවවුන් පවා **අමාමහනිවණට** ගබ් ගන්වන්නා වූ **තුණු රුවන්** පිහිටි මේ **ලක්දිවැ** පස් ගෙණැ මුදුනෙන් පිදූ වනුදු බුදුන් වහන්සේගේ ශ්‍රීපාදය මුදුනෙන් පිදූවන් ලබන අමාමහ නිවන් ලබන්නට කාරණා වැ සිටියා වූ සකල ගුණ භද්‍ර වූ මේ භද්‍ර කල්පයෙහි —

තසන ලද්දා වූ භව ප්‍රතිසන්ධි ඇති **කකුසඳ** නම් එක් සවාමිදරු කෙණෙක. ලොක ප්‍රණාම[1] ගුණාගමන ඇති **කොණා ගමන** නම් එක් සවාමිදරු කෙණෙක, ශ්‍රමණ ගජ ගඬ ලිපන වූ[2] **කාශ්‍යප** නම් එක් සවාමිදරු කෙණෙක, සසර දුකින් වෙවුළුම් ගත් අප තමන් පාමුල්හි ලා ගෙණැ රක්නා වූ —

පිරිනිවි පත් දහසක් හවුරුදු මුළුල්ලෙහි තමන් නම කීවන්ට වැඳ පිදුවන්ට පවා තමන් ලද තනතුරු දෙන සකල **පුරුෂොත්තම** වූ හුදක් මා ම නිසා සසරට වත් මා සේ වූ අඥානයක්හුගේ ප්‍රලයට පවා මිහිරි බව වැටහෙණ පරිදි දෙන් ඉතා ආශ්චය්‍ය වූ ගුණ ඇති **ගෞතම** නම් සවාමිදරුවෝ එක් කෙණෙකැ යි මෙසේ සතර දෙනෙකුන් වහන්සේ බුදු වූ සෙයෙක. සකල ලොක කල්‍යාණ මිත්‍ර වූ **මෛත්‍රෙය නාථයෝ** මතු බුදු වන්නට දවස් ගත වැ දැන් තුසි පුරෙහි වසන සෙයෙක.

1. ලොක ප්‍රමාණ, 2. ගඬාලිප්ත වූ.

එහි පළමු වනු වූ **කකුසඳ** නම් සම්‍යක් සම්බුදධයන් වහන්සේ සමතිස් පැරැම් පුරා තුසි පුරයෙන් සැවැ සමසත සත්ව **ඛෙම** කර වූ **ඛෙමවතී** නම් රාජධානියෙහි **ඛෙම** නම් මහරජානන්ට පුරොහිත වූ **අග්ගිදත්ත** නම් මහා බ්‍රාහමණයානන් වහන්සේ නිසා සමීඳ පුත්‍ර ලාභයෙන් විසොක වූ **විසාඛා** නම් බැමිණියන් වහන්සේගේ කුසියෙහි පිළිසිඳැ ගෙණැ දසමසක් ඇවැමෙන් මවු කුසින් නික්මැ ක්‍රමයෙන් වැඩී මදන දහනා'විෂට විදඟ්ධ වධූ හෘදය නිර්‍වාප'ණෙක සුධා ප්‍රවාහයෙක් සමාන වූ තව යෙවනයට පැමිණැ සෞන්දර්‍යයී ශොභා විරොචිත වූ **රොචිනී** නම් බ්‍රාහමණීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තිස් දහසක් කාවක සත්‍රීන්ගේ ශෘඞ්ගාර යාඥසම්ප්‍රයොගයෙහි අග්‍ර ධූරිණ වැ සාර දහසක් හවුරුදු ගිහි ගෙයි වැසැ **රොචිනී** නම් බ්‍රාහමණීන් වහන්සේගේ කුසින් ලොකොත්තර වූ **උත්තර** නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි සතර නිමිත්ත දැකැ —

අජානීය සෛන්ධවයන් යෙදූ රථයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොටැ සතළිස් දහසක් පුරුෂයන් හා කැටි වැ මහණ වැ අට මසක් **මහාවීර්‍ය** කොටැ **වෙසක්** මසැ මැදි පොහෝ දවස් සුවිකර වූ සත්‍රී පුරුෂයන් විසින් ගැවසී ගත්තා වූ **සුවිකර** නම් ගම්හි වප්‍රෙශ්‍රෂ්ඨ නම් බ්‍රාහමණයන්ගේ දියණියන් විසින් පිළිගන් වන ලද්දා වූ කිරිපිඬු වළඳා කිහිරි වෙතෙහි දිවා විහාර කොටැ **සුභද්‍ර** නම් ගවපාලයා විසින් එළ වූ අට මිටක් තණ පිළිගෙණැ ලොක ශොකා'පහාරී වූ **මහති** මහ බෝරුක් මූලට එළඹැ තිස් රියන් වප්‍රාසනයෙහි වැඩැ හිඳැ මාර හෘදය පලවා දල කමපා-යෙහි යුගා'නත වාත විහ්‍රම දක්වා බුදු වැ සත් සති යවා බඹහුගේ ආරාධනා පිළිගෙණැ **ධම්මක්** පවත්වා ලොකා'ථ මසතක ප්‍රාපත කෙරෙමින් වසන සෙයෙක.

එසමයෙහි අපගේ සවාමිදරුවෝ **ඛෙම** නම් මහරජ වැ බුදු පාමොක් මහාසඞ්ඝයා වහන්සේට සප්‍ර **පරිෂ්කාර** දන් දී **රාජ්‍යය හැරැ** බුදසාසනයෙහි මහණ වැ මම් මේ කුසලින් මේ බුදුන් වහන්සේ පසක් කළ සඳ්ධම්ය ම පසක් කටහෙම්ව සි පතා වදුළ සෙයෙක. ඒ ඇසූ සමීඳයන් වහන්සේ ද මේ මහා පුරුෂතෙම මෙම කප **ගෞතම** නම් සම්‍යක් සම්බුදධවෙයි කියා විවරණ පතුල් දී වදුළසේක.

එබස් ඇසූ මහා පුරුෂයානන් වහන්සේ ද "මම මතු බුදු වෙම් ලැයි" එම සමතිස් පැරැම් පිරීමෙහි දෘඪග්‍රහණය කොටැ

වදුල සෙයෙක. මේසේ මාගේ සවාමිදරු වූ සම්බුදයන් වහන්සේ විසින් පවා මකොරථ ඝන සහසුයෙන් පතා ලද්ද වූ සඳුමීයම සරණ යෙමියි **දහම් සරණ** යා යුතු.

22. කකුසඛ සම්බුදඛ විවරණ කථා.

මෙසේ විවර්ණතා වූ භව බඹින ඇති **කකුසඛ** නම් සමයක් සම්බුදධයන් වහන්සේ අක්ෂීණ සහාව කරුණාගෙන් ලොකා'ථි කොටැ බුදධ කෘත්‍යය නිමවා පිරිනිවන් පැ කල්හි ක්‍රමයෙන් බුදධා'නතරය ද ඉක්මුණු කල්හි සකල ලොකයා විසින් අතවරත යෙන් කරණලද වරණ සරණා'ගමන ඇති **කොණාගමන** නම් සමයක් සම්බුදධයන් වහන්සේ තුසි පුරයෙන් සැවැ ප්‍රාසාද ශාඛා'ග්‍රයෙහි විරාජමාන වූ නවරත්න ශොභා ඇති **ශොභාවතී** නම් රාජධානියෙහි **යඥදත්ත** නම් බ්‍රාහමණය තන් වහන්සේ නිසා **උත්තරා** නම් බ්‍රාහමණීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩී නව යුවති හෘදය හරණා'වාර්‍ය්‍ය වූ සෞන්දර්‍ය්‍යයෙන් උද්දීපන වූ නව යෞවනයට පැමිණැ —

23 කොණාගමන සම්බුදඛ විවරණ කථා.

පරම මධුර ගාත්‍ර වූ **රුචිගාත්‍රා** නම් බ්‍රාහමණීන් වහන්සේ ප්‍රධානකොටැ ඇති සොළොස් දහසක් සත්‍රීන්ගේ ප්‍රණය කල-හා'වසාන සමභාව්‍යමාන වූ සමොහ ශාඛාර සුධා'සවාදයෙන් තුන්දහසක් හවුරුදු යවා **රුචිගාත්‍රා** නම් බ්‍රාහමණීන් වහන්සේගේ කුසින් ප්‍රණය රසා'සවාහී වූ **සොථවාහන** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි සතර නිමිත්ත දැකැ **හසති වාහනයෙන්** මහා නිනිෂ්ක්‍රමණය කොටැ තිස් දහසක් පුරුෂයන් හා කැටි වැ මහණ වැ සමසක් **මහාවියූ** කොටැ **වෙසක්** මස මැදි පොහෝ දවස් **අග්නිසෙන** නම් බ්‍රාහමණයන්ගේ දියනියන් විසින් එළවන ලද්ද වූ මිහිරි කිරිපිඬු වළඳා —

සිහිකරන් මිහිරි වූ **කිඹිරි වෙනෙහි** දිවා විහාර කොටැ සවස් වේලෙහි **නිඳුඹ** නම් **යවපාලයා** විසින් දෙන ලද්ද වූ අට මිටක් තණ පිළිගෙණැ නව නීල මෙඝ කූට විලාශයෙන් සා'ඩම්බර වූ **උදුම්බර** බොධියට එළඹැ විසි රියන් **වජ්‍රාසනයෙහි** මාර වීර ඝොෂා'සපද නිර ඝොෂයෙහි ප්‍රලය දිවාකර වැ යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයා'ධිගමය කොටැ ප්‍රතාූෂයෙහි සඳුඹි සමධිගමයෙන් සම්

පූණ් වූ මනොරථ ඇති වැ සත් සති යවා බ්‍රහ්මයාගේ ආරාධනා පිළිගෙණැ ධම්මක් පවත්වා සියලු ලොවට ඉහලොකා'ථ පර ලොකා'ථ සාධනයෙහි අසාධාරණ කරුණා'ඤ්ඤ වැ ම වසන සෙයෙක.

එසමයෙහි අපගේ බොධිසත්ඩයන් වහන්සේ සකල සම්පත්තීන් අසිපිල වූ මිථිලා නම් නුවර. සම්පත්තීන් අගර්මිත වූ ප්‍රතිරූජසෙවා නිවාරණ පළිත වූ පණ්ඩිත නම් මහරජ වැ සළිඳුයන් වහන්සේට තුන් මසක් උපස්ථාන කොවැ අන්තයෙහි බුදු පාමොක් මහාසඩ්ඝයා වහන්සේට චීනපටාදි වූ මහඇඟි වස්ත්‍ර ඇතුළු වූ සළිපරිෂ්කාර දන් දී මම මේ අනුසසින් මතු මේ සම්‍යක් සම් බුද්ධයන් වහන්සේ පසක් කළ සද්ධර්මය ම පසක් කට හෙම්ව සි කියා මෙම සද්ධර්මය ම ප්‍රාර්ථනා කොවැ වදාළ සෙයෙක.

ඒ සළිඳුයන් වහන්සේ ද මේ මහාපුරුෂතෙම මේ දැනයෙහි අනුසසින් මෙම කපහි ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙයි කියා විවරණ පතුල් දී වදාළ සෙයෙක. ඒ ඇසූ මහා පුරුෂයාතන් වහන්සේ ද "මම මතු බුදුවෙම් ල"යි යන අදහසින් මෙම සමනිස් පැරැම් පිරීමෙහි දැඩ ව්‍රත වූ සෙයෙක. මෙසේ මාගේ සවාමිදරුවන් විසින් අනෙක ජාතියෙහි නොයෙක් යත්නයෙන් පතා ලද්ද වූ සද්ධර්මය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

23. කොණාගමන සම්බුදු විවරණ කථා.

මෙසේ **කොණාගමන** නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවි පසු ඒ බුද්ධාන්තරයද ඉක්මුණු කල්හි විශකලිත විශව පාප වූ **කාශ්‍යප** නම්

24. කාශ්‍යප සම්බුදු විවරණ කථා.

සවාමිදරුවෝ තුසි පුරෙන් චුත වැ බාරා-ණසි නම් රාජධානියෙහි **බ්‍රහ්මදත්ත** නම් බ්‍රාහ්මණයාතන් වහන්සේ නිසා ධනවති නම් බ්‍රාහ්මණීන් වහන්සේ ගේ කුසියෙහි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවැමෙන් ප්‍රසව වැ ක්‍රමයෙන් වැඩී යෞවන විලාස පාටව වූ මධ්‍යවයස්ථාවට පැමිණැ අමන්ද විලාස මන්දිර වූ සුනන්ද නම් බ්‍රාහ්මණීන් වහන්සේ ප්‍රධාන කොවැ ඇති අට සාළිස් දහසක් නාටක සත්‍රීන් ගේ කරුණා ශෘඞ්ගාර කෙළි සහාය වැ දෙදහසක් හවුරුදු ගිහි ගෙයි වැසැ සුනන්ද

නම් බ්‍රාහ්මණින් වහන්සේගේ කුසින් සදේලොක විජිත වූ විජිත සෙන නම් ප්‍රතණුවන් වහන්සේ උපන් කල්හි සතර නිමිත්ත දැකැ ප්‍රාසාදයෙන් ම මහාභිනිෂ්ක්‍රමණය කොවැ —

තමන් වහන්සේ හා කැවි වැ නික්මුණා වූ ගැහැණුන් පිටත් කොවැ සෙසු පරිවාර හා කැවි වැ මහණ වැ සත් දවසක් මහාවියදී කොවැ, වෙසක් මසැ මැදි පොහෝ දවස් සුනාඳනම් බ්‍රාහ්මණිය විසින් පිළිගන්වන ලද්දා වූ කිරිපිඬු වළඳා උත්කණ්ඨා වෙන් බාහිර වූ හෘදයා'නන්ද මන්දිර වූ බදිර වනයෙහි දිවා විහාර කොවැ සවස් වේලෙහි සොමිනස් නම් යවපාලයා විසින් එළ වන ලද්දා වූ අව මිටක් තණ පිළිගෙණැ මාර වීර විරොධ නිරොධිත වූ නාග්‍රොධ බොධි මූලයට එළඹැ —

පසළොස්රියන් වප්‍රාසනයෙහි වැඩැ හිඳැ මාරා'ණීක ප්‍රත්‍යනීක නිජ පරාක්‍රම ප්‍රභාව ඇති වැ යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයා'ධිගමය කොවැ ප්‍රත්‍යූෂයෙහි සවාසනා සම්කෙලෙශයන් නසා බුදු වැ බොධි සමීපයෙහි සත්සති යවා බ්‍රහ්මා'රාධනා පිළිගෙණැ ධම්මක් පවත්වා සියලු සත්ත්ව ලොකයා තමන් වහන්සේගේ සද්ධම්මා'මෘත ප්‍රවාහයෙහි ගලමින් උල්පවමින් නිවමින් සනහමින් වසන සෙයෙක.

එසමයෙහි අපගේ බොධිසත්ත්වයන් වනන්සේ ද සකල ලොක පාල වූ ජෝතිපාල නම් මාණවක වැ සපිකාර නම් කුම්භකාර සහායයන් හා කැවි වැ සම්භෘයන් වහන්සේ කරා එළඹැ සම්භෘයන් වහන්සේ ගේ බණ අසා මෙසේ වූ බණ ඇසූ අප සේ වූවෝ පෙරළා ගෙට ගෙද්දැ සි කියා බුද්ධ ශාසනයෙහි මහණ වැ පිළිවෙත් පුරා එම සද්ධම්මය ම පතා වදළ සෙයෙක. ඒ සම්භෘයන් වහන්සේ ද මේ මහාපුරුෂතෙම අපට දෙවනුව මෙම කපැ ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙසි කියා විවරණ පතුල් දී වදළ සෙයෙක.

මෙසේ මාගේ සවාම්දරුවන් විසින් දීපඞ්කර සම්‍යක් සම්බුද්ධ යන් වහන්සේගේ පාද මූලයෙහි පවන් කාශ්‍යප නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රීපාදමූලය දක්වා ඒ ඒ සම්භෘයන් හමුවෙහි ධන පතන මහ දුගියක්හු සේ ද, ආහර සොයන මහා ප්‍රේතයක්හු සේ ද, මවුන් සොයන අසරණ වූ පුත්‍රයක්හු සේ ද, රාජ්‍යය පතන තරුණ රාජකුමාරයක්හු සේ ද, මාගිය සොයන

මං මුළා එකක්හු සේ ද, සුපටුන් සොයන මහාතැවියක්හු සේ ද, සෙවනක් සොයන සම්ා'හිතපත්‍ර එකක්හු සේ ද, සරණක් සොයන දුඃඛිත සත්ත්වයක්හු සේ ද, මුකනියක් සොයන ඛඞ්ගතගත එකක්හු සේ ද, ඖෂධයක් සොයන රොා'ගාතුර එකක්හු සේ ද, අනෙක යතනයෙන් පතා සාරාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි දුක් ගෙණැ අනතයෙහි බොධිමූලයෙහි වජ්‍රාසනයෙහි වැඩැ හිඳැ පසක් කළා වූ සද්ධර්මය සරණ යෙමි සි දහම් සරණ යා සුතු.

24. කාශ්‍යප සම්බුද්ධ විවරණ කථා.

---

1. සූවිසි විවරණ කථා නිමි.

---

2. ජාතක ධම් සංග්‍රහ කථා.

තව ද, මෙසේ සාරාසඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි ඒ ඒ බුදුන් වහන්සේගේ ශ්‍රී පාද මූලයෙහි නානා ප්‍රකාර වූ සුචරිත පිරීමෙන් මෙම ධර්මය ම පතා වෙසතුරු අත්බැව දක්වා සම නිස් පැරුම් පිරුවා වූ **මහාපුරුෂයානන්** වහන්සේ අනන්තා'පරි යන්ත කාලයෙහි ඒ ඒ ජාතියෙහි කොටැ වදාළ සුචරිත කියා නිමවන් එම එම සවාමිදරුවන්ට ත් උගහට ය.

එතකුදු වුවත් ඒ මහාපුරුෂයානන් වහන්සේගේ **ධර්මලොභය** හඟවන පිණිස **පන්සිය පනස් ජාතකයෙහි** ඇතුළත් වූ සුචරිත ඒකදේශයෙකින් කිවා වූ මාගේ හා ඇසූ සැදුහැ ඇත්තවුන්ගේ සිත් හා සතහනු පිණිස **අපණ්ණකාදි** වූ ජාතකයෙහි කථා ශරීරය හැරැ ගෙණැ ඒ සවාමිදරුවන්ගේ ධර්මලොභය හඟවමි. මා තබා වණ්ඩාලයක්හු තුඹින් ඇසුව ද ඇසුවනට අමා මහ නිවන් සිදුකරන්නා වූ ඒ කථා විශෙෂයෝ රත්නත්‍රයයෙහි ප්‍රීති ප්‍රසාද ඇත්තා වූ සත්පුරුෂයන් විසින් සෙනහ ඇති වැ ආදරයෙන් ඇසිය යුත්තාහු සි

ඒ කෙසේද? යත් :-

1. මාගේ සවාමිදරුවෝ මා ඇතුළු වූ සියලු සත්ත්වයා ගන්නා දුකට එකහෙළා තුමූ ල කකියවා ජාතියෙන් ජාතියෙහි පර වැඩ සඳහා දුක් ගෙණැ ඇවිදිනාහු **අපණ්ණක ජාතකයෙහි** ප්‍රඥා සම්පන්න වූ මහවෙළඳ වැ පන්සියක් ගැල් පිරිවරා ගෙණැ මරු කතරට පැමිණැ තමන්සේ ම පන්සියයක් ගැල් පරිවාර ඇති, නුවණ නැති අනිත් වෙළඳහු මිනිස් වෙස් ගත් යකුන්ගේ වසඋවාවට හසු වැ ඔවුන්ට ගොවර වැ නට කල්හි තුමූ තමන්ගේ අසාධාරණ බුද්ධි ශක්තියෙන් යක්‍ෂයන්ගේ මායම් දැනැ ඔවුන්ට ගොවර වූ පරිවාර හා තමන් හා ගළවා ප්‍රඥයෙහි මසාක ප්‍රාප්ත වැ යක්‍ෂ ගොවර වූ සත්ත්වයන් ගළවන්නෝ ද ධර්මයෙහි සළ ලොභයෙන් ම බුදු වෙම් ව සි[1] යන අදහසින් ගැලවූහ.

2. තව ද **වණ්ණුපථ ජාතකයෙහි** එසේ ම මහවෙළඳ වැ පන්සියයක් ගැලින් යුක්ත වැ වඩනාහු ජලය ක්‍ෂය වැ ගියකල්හි එහි එතෙක් පරිවාර ජනයා නහන්නට බොන්නට පැන් නොලදින් වියලී මියන්නට වන් සමයෙහි තුමූ මරු කතරෙහි නිල්

1. බුදුවෙමිනැ සි.

වන් ඊතණ පදුරක්[1] දැකැ සෙසු තැන්හි ගස් කොළ වියලි මිය යාදී මෙතැන්හි මේ ගස නිල් වැ තිබෙන්නේ[2] නියතයෙන් මේ ගවැ පැනක් ඇති හෙයිනැ යි බිම කණවා ගවැ මහගඟ වසා සිටි ගල බිදුවා තල් කඳක් සා මහත් ජල ධාරාව පැන නැඟි කල්හි මහාජනයාට පැන් දී තමන් ඇති කළ ඒ පැනින් ම ඒ මරු භූමියෙහි යන එන වෙළඳුන්ට පැනින් වත මුළා දුරු කොවැ ලොකා'ථී කරන්නෝ ද මේ සසර කතර පිපාසයෙන් පෙළෙන සත්ත්වයාහට පැන් දී දුක් නිවූ සේ ම අමෘත මහා නිර්වාණය ගෙණැ දී සසර දුක් නිවිය හෙම්ව යි කියා මේ ධම්ය ම ප්‍රාර්ථනා කළහ.

3. තව ද **සෙරි වාණිජ ජාතකයෙහි** වෙළඳ වැ ලක්ෂයක් වටනා රන්තලිය දුටු ලොහොබි වෙළඳහු 'නිකම් හැරැ ගන්මි' යන සිතින් මේ කදවළලු අවකුත් නොවව් වි සි[3] කියා ගඟී කොවැ ගිය කල්හි තුමූ ඒ ලක්ෂයක් වටනාබව කියා ඒ පාත්‍රය ඇත්තවුන් "සවාමිදරුවෙනි! ආදි ආ වෙළඳතෝ මේ මදව භාණ්ඩයකුත් නො වව්වි සි[3] කියා අල්වා ගෙණැ බිමට දමා පියා ගියහ. නුඹවහන්සේ දැන් ලක්ෂයක් වටනා රන්පාත්‍රයකැ යි කියන සෙයෙක.

ඒ නුඹගේ පිණින් රන් වූ නියාමයෙක් වන. ඇපි මේ රන් පාත්‍රය නුඹට ම පූජාකරම්හ" යි දුන් කල්හි තමන් වහන්සේ අත තුබූ පන්සියයක් මසුරන් හා පන්සියයක් වටනා බඩු ඔවුන්ට දී තමන්ගේ ඇති වසතුයෙන් අවමස්සක් හා **පසුම්බිය**[4] හා තුලා දණ්ඩ මතු හැරැ ගෙණැ යන්නාහු ද අනුන්ට අධම්යක් නො කොවැ ම ධම්යක් ම රක්ෂාකළහ.

4. තව ද **චුල්ලසෙට්ඨි ජාතකයෙහි** ධන ඕටු වැ වීථියෙහි මියැ හොත්තා වූ මියකු දැකැ 'මේ මියා ගෙණැ වෙළඳම් කළ එකෙක් ඇත්නම් ධනඕටු වෙයි කියා තමන්ගේ උපදෙශ කළා වූ දුගීත තැනැත්තහු ලක්ෂයක් ලබන පරිද්දෙන් කොවැ අනන යෙහි තමන්ගේ දියණියන් ඇතුළු වූ සියලු වසතුවට ඔහු හිම් කරන්නාහු ද මෙසේ ම මතු මව කිකරුවන්නට ම ලද නිර්වාණ සම්පත්තිය ද හිමි ය යි කියා මේ සද්ධම්ය ම අභිලාෂ කළහ.

5. තව ද **කණ්ඩුල නාළි ජාතකයෙහි** ඇතුළු නුවර පිටිනුවර සහිත වූ සරාජක වූ දෙලොස් යොදුන් **බාරාණසිය** සාල් නැළි යක් වටිය යි කියන්නා වූ අඥත වූ **අඟය කරණ තැනැත්තහු**

1. තණ පතක් 2. හිලන්නේ 3. නො වව් යි. 4. පසිම්බුව.

වළකා අඟොදී වූ සියලු වසතුයෙහි ඇති අගය ම දක්වන්නාහු මා මේ අනුන්ට අලාභ නො කොටැ වසතුවෙහි අගය කී කුසලින් මතු බුදු වැ ලෝ වැස්සන්ට සියලු වසතුයෙහි ඇති තත්ත්වය ම හැඟවිය හෙම්ව යි කියා සද්ධර්මය ම ප්‍රාර්ථනා කළහ.

6. තව ද **දෙව ධර්ම ජාතකයෙහි** දෙව ධර්මය කියා **රාක්ෂසයා** අතින් තමන් මළුන් ගළවන්නාහු ද, මම මෙහි අනුශසින් මතු මාගේ ධර්මදේශනාවෙන් යකු අතින් මොවුන් ගැළවූවා සේ ම සියලු සතුන් සසරින් ගැළවිය හෙම්ව යි කියා සද්ධර්මය ම පතා වදාළ සෙයෙක.

7. තව ද **ඝටීහාර ජාතකයෙහි** රජ්ජුරුවන් නිසා දර කැපි දුව වඩා හොවා **කිරි බොන කුමාර** වැ ඒ රජ්ජුරුවන් මේ මා පිත් නොවෙයි කි කල්හි මැනියන් වහන්සේ "මොහු තොප පුතනුකෙණෙක් වූ තම් ආකාශයෙහි ම හිඳින්ව යි – නැත බිම හි මියෙන්ව" යි කියා පය ගෙණැ ආකාශයට දැමූ කල්හි රාජධානි මහනකයෙහි ආකාශයෙහි පළක් බැඳැ හිඳැ—

"පුත්තෝ'ත්‍යාහං මහාරාජ – ත්වං මං පොස! ජනාධිප!
අඤ්ඤ'පි දෙවෝ පොසෙති – කිඤ්චු දෙවෝ සකං පජං"

කියා බණ වදාරා තමන් පුත් බව හිවිස්වන්නෝ ද මතු තමන් තිලෝ මුදුන් පැමිණැ තමන්ගේ ධර්මදේශනා සියලු සත්ත්වයාට ධර්ම සවරූප හඟවන බවට බිජුවට හිදුවූ කෙණෙකුන් සේ සද්ධර්මයට ම අවශ්‍ය වූහ.

8. තව ද **ගාමිණී ජාතකයෙහි** තමන්ගේ වැඩිමහළු නැයන් සිටියදී තමන්ගේ අවවාද කළ **බාල කුමාරයා** රාජ්‍යසම්පත්ති ලැබීමට කාරණා කරවන්නාහු ද මතු තමන් බුදු වූ සමයෙහි තමන්ට නො කිකරු වූ දිව්‍ය බ්‍රහ්මයින් සිටියදී තමන් කී පරිද්දෙන් ධර්මය පිරූ මනුෂ්‍යයන් නිර්‍මාණ සම්පත්ති ලබන බවට පූර්වනිමිත්ත පානාක් සේ ධර්මයෙන් ම ධර්මප්‍රසවය කළහ.

9. තව ද **මඛාදෙව ජාතකයෙහි** හිසැ එක තරඟක් දැකැ සුවාසූ දහසක් හවුරුද්දට ආයු ඇති වැ ද රාජ්‍යය හැරැ මහණ වන්නාහු මේ ධර්මය ම සොයා මහණ වූහ.

10. තව ද **සුඛවිහාර ජාතකයෙහි** රාජ්‍යයක් රකිම් යි නොයෙක් පරිද්දෙන් උත්සාහ කරණ තැනැත්තෝ ද සුවසේ නිදන්නා නම් නොවෙයි. තව ද යමෙක්හු බොහෝ දෙනා සිසාරා

හෙවැ රක්‍ෂා කෙරෙත් තම් හෙද සුවසේ නිදන්නා වෙයි. වැළි කිමෙක්ද? යත්:- අනුන් තමාට කරණ රක්‍ෂා ද තමා අනුන්ට කරණ රක්‍ෂා ද හැර පියා හුදකලා වැ තව පැල්නි ධම්ය රක්‍ෂා කරණ තැනැත්තේ ම යෙහෙන් නිදයි කියා ධම්ය රක්‍ෂා කරණ තැනැත්තහු ම සුවපත් කොවැ රැ හෙවැ බණ කියන්නාහු ද ධම්යට ම ප්‍රශංසා කළහ. මෙසේ මාගේ සවාම්දරුවන් විසින් අනෙක ජාතියෙහි අනෙක ලෙස ප්‍රශංසා කරණ ලද්දු වූ පතත ලද්දු වූ සද්ධම්ය ම සරණ යෙමි යි දහම් සරණ යා සුතු.

11. තව ද **ලක්‍ෂණ මෘග ජාතකයෙහි** තමන් ගේ අවිනීත වූ පුත්‍රයා පන්සියයක් පමණ පරිවාර මුවන් කොයෙක් පරිද්දෙන් විනාශයට පැමිණ වූ කල්හි ද තමන් කිකරු පුතනුවන් තමන් පරිවාරයෙහි පන්සියයක් පමණ මුවන් කොං නසා රක්නා පරිද්දෙන් අවවාද දෙන්නෝ ද ධම්යට ම අනුග්‍රහ කළහ.

12. තව ද **නිග්‍රොධ මෘග ජාතකයෙහි** රන්වන්වැ සියලු මුවන්ට රජ වැ රජ්ජුරුවන් කෙරෙන් අභය ලදින් තමන් සරණ වන් ගර්භිණී වූ මෘග ධෙනුව රක්‍ෂා කරණ පිණිස දම් ගෙඩියෙහි හිස් තබා හෝ නෝ ද.[1] ධර්මයට ම දිවි පුදා හොත්හ.

13. තව ද **බණ්ඩින ජාතකයෙහි** මුවදෙනට වසහ වැ ශර ප්‍රහාරයෙන් නටුවා වූ මුවා දූකැ වෘක්‍ෂ දෙවතා වැ සිටැ සියලු වනය ඒක කොලාහල කොවැ කාමයෙහි ආදීනව හඟවා ධම්දේශනා කරන්නෝ ද දැන් බුදු තුඹුනුදු තමන් එදා වදාළ සේ යහපතැ යි ප්‍රශංසා කරණ[2] පරිද්දෙන් ධම්දේශනා කළහ.

14. තව ද **වාතමෘග ජාතකයෙහි** රස තෘෂ්ණායෙන් මිහි මුසු තණයෙහි කළ ලොභයෙන් රාජා'ඔහණයට පවා නැඟී ආවා වූ මුවා දූකැ රජ වැ සිටැ කාමයෙහි ආදීනව වදාරන්නෝ දැන් වත ලොකොත්තර වූ ධම්කථිකත්තියට එ දවස් ශ්‍රම කරන්නා සේ සියලු බාරාණසී වාසින්ට ධම්දේශනා කළහ.

15. තව ද **වරාදිය ජාතකයෙහි** තමන් කොං කිකරු වූ බැන මුවාට වූ මරණින් මෙ කල්හිදු තමන් කොං කිකරුවන්ට ම වන විපැත්තිය හඟවන්නා සේ මුව වැ සිටැ ද ධම්කථිකත්තිය කොං හළහ.

---

1. හෝනේද. 2. තමාට මැ ප්‍රශංසා කරණ.

16. **[illegible]මිග ජාතකයෙහි** මුවරජ වැ දැන් තමන්ගෙ අවවාද කළවුන් මරහුගේ මලින් ගැළවෙන බවට පූර්වනිමිත්ත පානා සේ තමන්ගේ අවවාද කළ බැනහුවන් වැද්දාගේ මලින් ගළවා සුවපත් කරණුවෝ ධර්මයෙන් ම සරණ ගතයන් රක්ෂාකළහ.

17. තව ද **මාලුත ජාතකයෙහි** ව්‍යාඝ්‍රයාගේ හා සිංහයාගේ හා "සිත තම් දෙය කෘෂ්ණ පක්ෂයෙහි වෙයි ශුක්ලපක්ෂයෙහි ය" යන වාදයෙහි කෘෂ්ණපක්ෂයෙහි වුව මනා ම ය. ශුක්ලපක්ෂයෙහි වුව මනා ම ය. පවතින් ම වෙයි කියා පැණ විසඳන්නෝ ද ධර්ම න්‍යායෙහි සිටැ එක් කෙණෙකුන් කෙරෙහි මමත්වයක් නො කොටැ විසදූහ.

18. තව ද **මනක හත්ත ජාතකයෙහි** බ්‍රාහ්මණ මාණවක වැ වැඩැ හිඳැ අවවාද දී මේ එළුවා මිය යා නො දෙම්හ යි අතැ වැසියන් සිසාරා ගෙණැ රක්ෂාකරව කරවා හිසැ ගල්ලැල්ල කඩා ගෙණැ හි හිස කැපී මළ එළුවා පැ ප්‍රාණා'තිපාතයෙහි ආදීනව දක්වා **වෘක්ෂදෙවතා වැ** සිටැ ආකාශයෙහි පළක් බැඳැ වැඩැ හිඳැ අවවාද දී සියලු දඹදිව් වැස්සවුන් පණිවායෙන් දුරැ කරන්නෝ ද ධර්මයට ම පූජාකළහ.

19. තව ද, **ආයාචිත භත්ත ජාතකයෙහි** දෙවතාවන්ගේ ශක්‍රයන් මම මේ වැඩ සාධාගතිම් යි කියා ඇට බලිකම්නන කෙරෙම් යි බොහෝ ප්‍රාණ වධ කරන්නා වූ **කුවුම්බික්‍යා දූකැ වෘක්ෂදෙවතා වැ** සිටැ ප්‍රාණඝාතයෙහි ආදීනව කියා සියලු සත්වයන් සිතැ ඇති අකුසල් දුරැ කරන්නෝ ද ධර්මය ම ඔවුන්ගේ ලෙහි පිහිටු වූහ.

20. තව ද **නළපාන ජාතකයෙහි** උදක රාක්ෂසයා විසින් අධිගෘහිත වූ විලට නො බැසැ පාරමිතා බලයෙන් එකදු කළ අධිෂ්ඨානයෙන් කපක් මුළුල්ලෙහි ඒ පොකුණ වට කොටැ සිටි බව දඩු ඇතුළෙන් ගැට නැතිවන පරිද්දෙන් අශ්චර්‍ය්‍ය පවත් කොටැ අසූ දහසක් වඳුරන් විලට නො බස්වා බට දණෙඩන් පැන් පොවා රාක්ෂස හයින් මුදා ශාන්ති කරන්නාහු ද ධර්මබල යෙන් ම එබදු පරාක්‍රමයක් කළහ.

එදා උන් වඳුරු වැ උණ දණෙඩහි හළ ගැටිම දැන් පස්වා දහසක් මුළුල්ලෙහි මා ඇතුළු වූ සියලු සත්වයාහට සසරගැට කැඩිවන්නට පූර්ව නිමිත්ත විය. එදා **උදකරාක්ෂසයා** කෙරෙන්

තමන්ට හා තමන්ගේ පරිවාරයට උපද්‍රව නො වියදුන් බව තමන් ඇතුළු වූ මුළු ලොවට මරහු කෙරෙන් උපද්‍රව නො විය දෙන බවට පූර්ව නිමිත්ත වී ය. එකද කළ අධිෂ්ඨාන ය කපක් දවස් මුළුල්ලෙහි පැවැත්වීම බුදු වැ තමන් කළ ආශ්චර්‍ය්‍ය පස්වා දහසක් මුළුල්ලෙහි පවත්වන බවට පූර්ව නිමිත්ත වී ය. මෙසේ මාගේ සවාමිදරුවාණන් අනන්ත ජාතියෙහි අත් නො හැර දෙසා විමසා පරිහරණ කොටැ රක්‍ෂාකළ ධර්මය ම සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

21. තව ද **කුරුඬ මෘග ජාතකයෙහි** මුව වැ ඉපිද ගසා හුන් වැද්ද දුමු ඵල දැකැ මේ එකාන්තයෙන් උඩ හුන් මිනිසෙකු විසින් හෙළන ලද බව මුත් ගසකින් හුනු ඵලයෙක් නො වෙයි, ගසෙක ඉදුරා ඵල හෙළන බව දැකැ මුත් කැව ගසන්නා සේ තෙම දුර හුන්නවුන්ට ඵල නොදෙයි කියා නිශ්චය කොටැ වැද්දගේ වඤ්චායෙන් ගැලවී ඔහු දුමු අඩයටිය වළහා යන්නෝ ද ප්‍රඥයෙහි මාන්‍යකප්‍රාප්ත කොටැ ධර්මයෙන් ම දිවි පිළිපද්දහ.

22. තව ද **කුක්කුර ජාතකයෙහි** බල්ලන්ට රජ වැ තමන්ගේ තැනන්ට නිෂ්කාරණයෙහි වූ ව්‍යසනය දුරු කරණ පිණිස රජ හෙට වැද රජ්ජුරුවන්ට දශරාජධර්මයෙන් අනුශාසනා කරන්නෝ ද "තුඹ බලු තුඹ මුත් බණ බුදු බණට නො අඩු කොවැ" කිහ

23. තව ද **තිත්තිර ජාතකයෙහි** අශ්වා'ධමයා විසින් බටුවා වූ තොටට කොං බස්නා වූ උත්තමා'ශ්වයාගේ අභිප්‍රාය බුදු නුවණින් දත්තා සේ පිරිසිඳැ දන්නා වූ ද තමන්ගේ ප්‍රඥා පාරමිතා බලයෙන් ම කුළුගත්හ.

24. තව ද **මහිලාමුඛ ජාතකයෙහි** දුෂ්ට වූ සොරුන්ගේ බස් අසා අධර්මයෙහි පිළිපන් ලොව තමන්ගේ ධර්මය ඇසීමෙන් තමන්ගේ නවලොකොත්තර ධර්මයෙහි පිහිටවීමට පූර්ව නිමිත්ත පානා සේ ධර්මයට ම ආවාරි වූහ.

25. තව ද **අභිණ්හ ජාතකයෙහි** බල්ලාගේ විරහයෙන් ශොකී වූ හත්තීහුගේ අභිප්‍රාය දැනැ ඔහුගේ ශොක දුරුකරන්නා හු ද මතු බුදු වැ අඥාන සත්ත්වයාගේ ශොක දුරුකොටැ කරන්නා වූ ලොකා'ර්‍ථයට ශ්‍රමකරන්නා සේ ධර්මයෙන් ම ධර්මය ප්‍රසව කළහ.

26. තව ද **නන්දි විශාල ජාතකයෙහි** ගොන්වැ සිටැ අප්‍රිය වචන කිඹුළු බමුණා දාසයකට පරදවා ප්‍රිය වචන කිඹුළු දවස් වැලි බොරළු පිරූ ගැල් සියක් හුදකලා ඇදූ ඒ බමුණා දෙදහස කට දිනවන්නාහු ද ලොකයෙහි සත්ත්වයා විසින් ප්‍රිය වචන කිණිස යුතු බවට උපදෙස දී ධර්මය ම මුල් බැස්වූහ.

27. තව ද **කණ්හ ජාතකයෙහි** දූ එසේ ම ගොන් වැ මඩෙහි ගැලී හිඳ ගැල් පන්සියක් උදකලා ඇදූ ගොඩ දක්වා එයට කුලි පිණිස වෙළඳුන් කරූ බැඳ ලූ මසු දහස ගෙණැ අවුත් තණ පැන් ලා වැඩූ මැණියන්ට දී ඔවුන් යෙහෙන් රක්ෂා කරන්නාහු ද සොළොහිගුණ දැනිම් නැමැති ධර්මය ම රක්ෂා සළෝ නම් වෙති.

28. තව ද **මුනික ජාතකයෙහි** එසේ ම ගොන් වැ ඉපදූ තමන් උපන් කුලයෙහි කුමාරිකාව විවාහයට යන දවස් රැස් වූ මිනිසුන්ට අමුතු බත් දෙන විට මරා මස් ගෙණැ මාළු පිසන පිණිස වඩන්නා වූ ගූරෙකුට දෙන ආහාරයෙහි ලොභ කළා වූ මලනුවන්ට ඒ ආහාරය කා ඔහු විනාශයට බැම්මෙන බව හා තණ මාත්‍රයක් කැ තමන් යෙහෙන් ජීවත්වන බව හා දක්වා ඔවුන්ට ඇති වූ අසථානයෙහි ලොභය හරවා අවවාද වදාරන්නාහු ද ධර්මපිටකයන් කෙරෙහි ම අග්‍ර වැ සත්කාරී කළහ. මෙසේ මාගේ ධර්මස්වාමී වූ ලොකස්වාමිදරුවාණන් වහන්සේ විසින් නොයෙක් ජාති හෙදයට පැමිණ ද අත්තොහැරූ රක්ෂා කොටැ සම්බුදුගුණයෙන් සමෘද්ධියට පැමිණ වූ ධර්මය ම සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

29. තව ද **කුලාවක ජාතකයෙහි** ශක්‍ර දෙවෙන්දු වැ යුද්ධ යෙහි පැරූදූ අසුරයන් කෙරෙහි කළ භයින් දිවෙම්හු දූ තමන්ගේ රථයෙහි හඬින් භය පත් වැ දියෙහි හී දුක් විඳුනා ගරුඩ පොතකයන් දැකැ 'අපට වන භය දුරු කරණ පිණිස අනුන්ට භය උපදවමෝ නම් අපගේ මහා කරුණාවට සුදුසු නොවෙ' යි කියා රථය සතුරන් කරා ම නවතා බිඳී පලා ගිය රථය නැවත එන්නේ පිට පුරා පිරිසක් ආ නෙයිනැ යි අසුරයන් තමන් ම බිඳුනු කල්හි අයත්තයෙන් රජය ගන්නෝ ද ධර්මයෙන් ම රජය ගත්හ.

30. තව ද **සාවජ්ජ ජාතකයෙහි හංසරාජ** වැ තමන් වහන්සේගේ දියණියන් ලොභ කළා වූ මයුරයා "ඒ සතෙකුගෙයෙන් නවම්හ" යි කොපැවැ මහා ගුප්ත අඹත පැ හිරි ඔතප් බුන්

කල්හි "මේ මූයුරතෙම හිරි ඔතප් නැත්තේ ය, එසේ වූ තොහ කවයුත්හොහි ලජ්ජාවක් හයක් නැති තෙනත්තහුව මාගේ දුව නොදෙමි' යි ඔහට ගර්හා කරන්නාහු ද ධම්යෙහි ම රැව් ඉපද වූහ.

31. තව ද සමෙමාදමාන ජාතකයෙහි වවුවෑ ඉපද වටුවන් තමන්ගේ අවවාද කළ දවස් දැල් ඇසින් හිස් කාවා ගෙණ ගොස් කටු ලැහැප්හි හෙළවා වැද්ද, අතින් ඔවුන් ගළවා තමන්ට ත් ඔවුන්ට ත් ශාන්ති කොටැ ඒ වටුවන් සමහර කෙණෙකුන් ඔවුනොවුන් හා විවාද කොටැ "අද සුරුවී නම් තෝ ම දැල නහා ගෙණ යා යි-තෝ ම දැල නහා ගෙණ යා" යි ඔවුනොවුන් හා කරණ වාද අසා "කලහ නම් දෙයින් ඉෂ්ට නම් දෙයෙක් නැතැ" යි විවාදයෙන් මොවුන්ව විනාශ ය නියත ය. එසේ නත්හි තමා එක් වැ නස්නාඛව නො සුදුසු ය යි තමන්ගේ පිරිස හැරගෙණ බැහැරි ගොසින් කළහ කළ වටුවන් වැද්ද දැමූ දැලැ හසු වැ[1] "නෝ දැල් හස්සෙන් හිස නගව, නෝ දැල් හස්සෙන් හිස නගව යි විවාද කොටැ එකකුදු දැල් හස්සෙන් හිස නො නහා ගත හී වැද්දාට හසු වැ විනාසයට පැමිණිය දී තමන් හා කැවි වැ ගියවුන් රක්ෂා කොටැ තමන් පිරිසව ශාන්ති කරන්නෝ ද කලහයෙහි ආදීනව ලොවට අද දක්වා පහළ කොටැ ධම්යෙන් ම ඒ ශාන්ති ය කළහ.

32. තව ද මනුෂ්‍ය ජාතකයෙහි රාජපුරොහිත වැ කාම යෙහි ගිජ්ජු මැසින්න පස්සෙහි දිවෙමි යි දැල්හි හසු වූ මනුෂ්‍යයා කෙවුළන් ගොඩැ ඇදූ හොවා ලූ කල්හි තමා මියන මරව ත් විඳිනා වෙදනාවට ත් නො සිතා මැසින්නගේ වියොගය ක්ෂමා කොටැ ගත නොහී හඬන්නව වන්කල්හි මිනිස් වැ සිටැ පොවා මසුන්ගේ බස් දන්නා නුවණ තමන්ට ඇති හෙයින් මේ මනුෂ්‍ය තෙම තමාගේ මරණ නො සිතා කාමානී වැ හඬයි. ඉදින් මෙසේ කාමානී වැ හඬා මෙලේ වී නම් අනාගතයෙහි නරකයෙහි උපද්දී දැනැ "මා සේ වූ කරුණා ඇති එකක්හු බල බලා සිටියදී මේ අනාථ මනුෂ්‍යයා මියැ නරකයෙහි උපදනා බව සුදුසු නො වෙයි" කියා මහා කරුණාවෙන් වොදිත වැ කෙවුලන් කරා එළඹැ ඒ මනුෂ්‍යයා ඉල්වා ගෙණැ දෙ අතින් වඩාගෙණ ගොස් දියෙහි ලා මරණ භයින් ගළවන්නෝ ද ධම්යෙහි ම පිහිටා ගැළවූහ.

---

1. දැලට හසු වැ.

33. තව ද **වට්ටඛ ජාතකයෙහි** පියාගෙහි පත් නොහට ගත් හෙයින් දෙපයෙහි ශක්ති නොහුන් හෙයින් දෙමවු පියන් හොවර පිණිස හිය හෙයින් අසරණ වැ සියලු වල දවා ගෙණැ කලපා'නත වග්නියක් සේ දිවත්නා වූ ලැව්ගිනි දැකැ "මම පයින් යන් පය ශක්ති නැත්තෙමි, පියා හඬායත් පියාගෙහි හුන්පත් නැත්තෙමි. මවුපියන් වහළිත් ගැළවීම් නම් ඒ මවුපියෝ ද හොවර පිණිස නැහි හියහ මෙතැන්හි මාගේ ධම් බල මුත් අනික් බලයෙක් නැතැ"යි තමන් ගේ **සත්‍ය වචන** ශක්තීන් **කපක් මුළුල්ලෙහි සොළොස් කිරියක්** නැතට ගිනි නො වදිනා පරිද්දෙන් සත්‍යක්‍රියා කොටැ වෙරළ වල වැදගත්නා වූ ගින්න මහාසමුද්‍රයට නො වැද්ද දෙන්නා සේ සියලු වල දවූ ලැව් ගින්න තමන් හොන් නැනට නො වැද්දූ දෙන්නාහු ද ධම් බලයෙන් ම නො වැද්දූ දුන්හ.

34. තව ද **සකුණ ජාතකයෙහි පක්ෂිරාජ** වැ ඉපදූ ඒ වෘක්ෂයෙහි ශාඛායෙහි ඊ ඊ ඇවි ගිනි ගෙනැ දන පරිදි දැකැ මේ හෙත ගිනි අප හා අපගේ කැයන්ට විනාශ කරන්නේ ය යි දැනැ තමන්ට නො කිකරුවන් ගින්නෙහි හී විනාශයට පැමිණියදී කිකරු පිරිස ගැරැ ගෙණැ තුවූ ගැළවී ඔවුන්ට ත් තමන්ට ත් ශාන්ති කරන්නාහු ද ධම්යෙන් ම ශාන්ති කළහ.

35. තව ද **තිතතිර ජාතකයෙහි වටුවැ ඇතක්හු හා වඳුරක්හු** හා සහාය වැ තුන්දෙන එක්වැ එක් නුග ගසෙක් නිසා වෙසෙමින් "අප තුන්දෙනාට තොපි වැඩිමහල්ලහ යි, මොහු බාලය හ යි යන නියමයක් නැති වැ අනවසිත වැ වසන බව සුදුසු නො වෙයි" කියා වැඩිමහල්ලන් නිශ්චය කරණ උපායක් සිතා ඇත්තෙම:- 'මම මේ නුගගස බාල කල මා සතර පා හස්සෙහි සිටියේ ය යි කී කල්හි, **වඳුරුතෙම**:- 'මම මේ ගස බාලකල බිම ඉඳැ කර නො ඔසවා ම අග දළු කම්' කී කල්හි, **තුමූ**:- 'මම අසෝ තැන නුගගසින් පල කා මෙතැන්හි ශරීර ධම් කෙළෙමි. එසින් හටගත් මේ ඵලය'යි කියා ඔවුන් දෙන්නාට තමන් වැඩිමළු බව හඟවා ඔවුන් විසින් "මෙතැන් පටන් තොපට වැඳුම් පිදුම් ආදි වූ උපසථාන කරම්හ. තොප කළා වූ අවවාදයෙහි පිහිටම්හ. තෙපි මේතැන් පටන් හෙණැ අපට අවවාද අනුශාසනා කරව"යි කී කල්හි එතැන් පටන් වටු තෙම ඔවුන්ට අවවාදානුශාසනා කොටැ ඔවුන් පත්සිල්හි පිහිටුවා තුන්දෙන ඔවුනොවුන් කෙරේ සහාය වැ වසන්නාහු තිරිසන්වැ ද පොවා ඔවුන්ට ධම් බලයෙන් ම අවවාද අනුශාසනා කළහ.

36. තව ද **බක ජාතකයෙහි** වෘක්ෂ දෙවතා වැ ඉපද "දිය තැති පොකුණෙන් දිය ඇති පොකුණට ගෙණ යෙමි" යි මගදී මත්‍සයන් කන්නා වූ **බොකු** තැමාට වැඩි වඤ්චා දන්නා වූ **කකුළුවා** එපවත් දැනැ උගුර තළින් මැඩැ මරණ භයින් භයපත් බොවැ "සවාමීනි! මම නොප නො කම්, මම නොප නො කම්මි" කියව කියවා හඬන්නට වන් කල්හි 'එසේ වුව මාගේ පොකුණට ම මා ගෙණැ යා'යි කියා ඔහු පොකුණට ම ගෙණැ ගිය කල්හි දියට වදනා කකුළුවා සූක්ෂම වූ කතුරකින් මානෙල් දණ්ඩක් කපන්නා සේ තීක්ෂණ වූ නළින් ඔහු ගේ ඕස කපා පී කල්හි වඤ්චා දන්නා වූ ඒ **බොකුට** වූ විනාශය දැකැ වඤ්චාවෙහි ආදීනව වදුරන්නෝ ද **සඳකම් ජීවිකායෙහි** ම ගුණ දක්වූහ.

37. තව ද **නඳ ජාතකයෙහි පණ්ඩිත කුටිම්බික** වැ "බැහැර දී ධනපාමි" කියා ධන තුබූ තැනට ගිය කල්හි "මිඩිය පුත! තව ධන කොයිදැ"යි කියා උඳුන කම් බණන්නා වූ **නඳ** තම් දස යාගේ පවත් අසා "මොහු සෙසු තැන දී විනීත වැ මෙ තැන දී උඳුන වන්නේ නියතයෙන් එතැන ගවැ තුබූ ධනයෙහි මහිමා යෙනැ"යි එ තැන්හි ම ධන තුබූ බව නිශ්චය කොවැ ධනය ඇන්තවුන්ට ධනය පාවා දෙන්නැහු ද තමන් ගේ අසාධාරණ වූ ප්‍රඥ ධර්මයෙහි ම පිහිටියහ,

38. තව ද **බදිරඛාර ජාතකයෙහි පසේ බුදුන්ට** දන් දෙන පිණිස පාත්‍රයෙන් දන් ගෙණැ යෙමින් සිටැ "ඒ දන් දීමට විඝතයක් කෙරෙමි"යි මරහු අවුත් සිටැ පසේබුදුන් වහන්සේ හා දෙමැදැ අසූ රියනක් පමණ ගැඹුරු සඟලහුරු වළක් මවාලා ආකාශයෙහි සිටි කල්හි "මේ වැළැ හී දැ මියෙමි නමුදු මා දෙන්නා වූ දනට අන්තරායයක් නොකරමි"යි වළට පය දික් කළ ක්ෂණයෙහි පිපියා වූ සන්බුම්බු මහපියුම් මැඩැ ගෙණැ ගොස් දන් දෙන්නා'හු ද ධර්මයෙහි ම පිහිටා ගිනි මත්තෙහි මහපියුම් පිප්පූහ. මෙසේ මාගේ සවාමිදරුවන් අත් සරු කොවැ පිරිමසා නො තසා රැකැ ආවා වූ ධර්මය සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

39. තව ද **ලොසක ජාතකයෙහි** අවවාද කරන්නා වූ ඉෂ්ට මිත්‍රයන් බස් නො ගිවිසැ විනාශයට පැමිණියා වූ **මිත්‍රවිඳකයා** දැකැ සත්පුරුෂයන් ගේ අවවාද නො කිරීමෙහි ආදීනව දක්වා අවවාද කරන්නාහු ද ධර්මයෙහි ම පිහිටා අවවාද කළහ.

40. තව ද **කපොතක ජාතකයෙහි** තිරිසන් වූ **පරෙවි** වැ ද තමන් නිසා වසන්නා වූ කවුඩුවාට තපස්වී කෙණෙකුන් පසු මහණ කෙණෙකුට අවවාද දෙන්නා සේ ලොලුවීමෙහි ආදීනව

දක්වා අවවාද කොටැ ඔහු ඒ අවවාදයෙහි නො වැළකැ සිටා නන්ව තන්කළ මස් කන්නට වැදූ අරක්කැමියා අතැ විනාශයට පැමිණි කල්හි "මේ අධමයා අපගේ බස් නො කොටැ[1] විනාශ යට පැමිණියේ. ඉතිඛ අප විසිනුදු මෙතැන්හි වසන්නට නො පිළිවනැ" යි එ තැන හැරැ යන්නෝ ද අලොල ධම්යෙහි පිහිටියහ.

41. තව ද **වෙළුක ජාතකයෙහි හිමාලයයෙහි ගණ ශාස්තෘ වූ** තමන්ගේ අවවාද නො කොටැ සපියා වඩා ඔහු අතැ නටුවා වූ තපස්වීහු පැ සෙසු තපස්වින්ට අවවාද දෙන්නාහු ද දුන් තමුන්ගේ අවවාද නො කොටැ සංසාර ගොවර වන සතඛයන් පැ සෙසු භව්‍ය පුද්ගලයන්ට අවවාද දෙන බුද්ධ විලාසය ම දක්වා ධම්යට ම පිහිට වූහ.

42. තව ද **මඝදේව ජාතකයෙහි වෙළඳ වූ** පියා "හිසැ හුන් මදුරුවා මරම්"යි මහ පොරොවින් පියානන් හිසැ ඇතැ මැරූ පුතු දැකැ **"නුවණ නැති මිත්‍රයාට වඩා නුවණැ'ති අමිත්‍රයා උතුමයැ"** යි අවවාද කරන්නාහු ද ධම්යෙන් පෑතා වූ ශ්‍රුතියක් කිහ.

43. තව ද **රොහිණී ජාතකයෙහි මහසිටු වූ** "මව හිසැ හුන් මැස්සා තෙරම්" යි මොහොලින් මව හිසැ පැහැරැ මැරූ **රොහිණී** නම් දුසිය දැකැ **"අනුකම්පාකරණ අඥානයාට වඩා ඥාන සම්පන්න වූ අමිත්‍රයා ම උතුමයැ"** යි අඥතයාට අප්‍රශංසාකරන්නාහු ද ධම්යට ම ප්‍රශංසා කළහ.

44. තව ද **ආරාම දූසක ජාතකයෙහි** පණ්ඩිත පුරුෂ වැ "උයන් පල්ලාගේ නියෝගයෙන් උයන ගසට පැන් වත් කරම්හ" යි පවන් ගෙණැ අඥන වානර ජ්‍යෙෂ්ඨයා නියෝගයෙන් "ඉතා ඟැඹුරට බට මූලට බොහෝ කොටැ පැන් වත් කරම්හ - මඳ කොටැ බට මූලට මදක් පැන් වත් කරම්හ" යි පැලයෙන් පැලය උදුරා බල බලා පැන් වත්කොටැ ගස් මැරූ වානරයා දැකැ "අඥතයෝ වැඩක් කරම්හ යි අවැඩක් ම කෙරෙති. එහෙයින් නුවණ නැත්තවුන් ලවා වැඩක් කරවා ගැන්ම දුෂ්කරය" යි අවවාද දෙන්නාහු ද ධම්තායෙහි ම පිහිටා අවවාද දුන්හ.

45. තව ද **වාරුණී ජාතකයෙහි බාරාණසි සිටු වූ** රා වෙළඳුගේ අතැවැස්සහු තමා විකුණන රා බොන මිනිසුන් ලුණු බැහැ ගෙණැ රා බොන්නා දැකැ "රායෙහි ලුණු මදින් වත මෝවුන් ලුණු බැහැ ගෙණැ රා බොන්නේ" ඇ යි සිතා ඒ රායෙහි ලුණු පුරා රා නැසූ නැතැත්තහු දැකැ අඥතයෙහි ආදීනව වදරන්නාහු ද ධම්යෙන් ම අවවාද කළහ.

---

1. නොකිවිසැ.

46. තව ද **වෙදබ්භජාතකයෙහි** වෙදබ්භ නම් බ්‍රාහ්මණයාට අතැවැසි වැ තමන්ගේ අවවාද නො කොටැ අසථානයෙහි ධනවැසි වස්වා සතුරන් අතැ නැසී මිනිසුන් දහසක් එකතැන්හි ම ජීවිත විනාශයට පැමිණෙන පරිද්දෙන් අවවාදක්ෂම නො වූ බ්‍රාහ්මණයා දැකැ "යමෙක් උපාය නො දැකැ අථ සොයා නම් ඔහු විනාශයට පැමිණෙන්නේ යැ" සි ධර්ම දෙශනා කරන්නාහු ද බුද්ධ විලාශයෙන් ධර්මය ම පරිහරණය කළහ.

47. තව ද **නක්ඛත්ත ජාතකයෙහි** ප්‍රඥා සම්පන්න වූ ග්‍රාමික පුරුෂ වැ නකත නපුරු යි අඹුවන් කෙරෙන් අපවත් වූ පුරුෂයා දැකැ "අථ සිද්ධිය ම නකත නම් වත බව මුත් ආකාශයෙහි තුබූ තරුයෙන් සත්ත්වයන්ට වත සුභා'සුභයෙක් නැතැ" සි වදරන්නාහු ද පරමාර්ථ ධර්මය ම වදළහ.

48. තව ද **දුම්මේධ ජාතකයෙහි බරණැස් රජහට** පුත් වැ "රාජධානියෙහි මිනිසුන් දෙවතාවන්ට බලිකර්මාදිය කොටැ කැමැති කැමැති පරිද්දෙන් වැඩ සාධම්හ" සි බොහෝ ප්‍රාණවධ කරන්නවුන් දැකැ මේ පව් කරන්නා වූ සත්ත්වයා කෙසේ වළකම් දෝ හෝ යි තමන් වහන්සේ දෙවතාරාධනයක් කරන්නා සේ අතුර තුරෙහි මහජනයා පූජාකරණ නුග රුක මූලට ගොසින් ඒ ඒ තැනැ පැදකුණු කොටැ මල් පුදා උදකාභිෂෙක කොටැ අවුත් ක්‍රමයෙන් පියානන් ඇවැමෙන් රාජ්‍යය ලදින් "මේ බාල සත්ත්වයා පාපයෙන් වළකන්නට කලැ" සි සිතා ඇමැත්තන් කැඳවා "මම ප්‍රාණවධ කරන්නා වූ දහසක් මිනිසුන් මරා ලේ හා අතුනුබාන් හා මස් හා ගෙණැ බලිකර්මාදිය කෙරෙමි" සි නුග ගසැ දෙවියාට ආරාධනා කොටැ මේ රාජ්‍යය ලදිමි. දැන් මාගේ විජිතයෙහි යම් කෙණෙක් පණිවා කෙරෙන් නම් එසේ එසේ වූ දහසක් තෝරා අල්වා ගෙණැ කපා ලේ හා මස් ආදිය ගෙණැ බලිකර්මාදිය කරව" සි නියොග කොටැ, "ප්‍රාණවධ කරන්නවුන් ගෙණැ රජ්ජුරුවෝ යක්ෂයාට කපත්ල" සි ඇසූ මහජනයා ප්‍රාණවධයෙන් දුරැ කරවා ධර්මයෙහි පිහිටුවන්නෝ ද ධර්මයට ම අනුග්‍රහ කළහ.

එහෙයින් මාගේ සවාමි වූ ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ නො එක් ජාතියෙහි බොධි සත්ත්ව භූමියෙහි සිටි කල්හි යෙහෙන් පිළිපැදැ රක්ෂාකළා වූ මහඇති ධර්මය ම සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

49. තව ද **මහාසීලව ජාතකයෙහි** සියලු ජම්බුද්වීපය සාධා දෙන්නට සමර්ථ වූ එකි එකි අමාත්‍යයන් විසින් යුක්ත වූ ඇමැත්තන් දහසක් ඇති වැ "රාජ්‍යයක් පිණිස මිනිසකු ඇතින් ලේ

නො සොල්වමි" යි කිසිවක්හට අන්තරාය නො කොට සතුරු රජහු අවුදින් මතු මහල්තෙලෙහි හුන් තමන් හා ඇමැත්තන් පිටිතොල හයා බැඳ අමුසොහොන්හි උගුර දක්වා වළලා පි කල්හිදු මියැසී නො හැරී තමන්ගේ මස් කන්නට ආ කැණහිල්හු නිකටින් කිම හා එක්කොටැ ඔබා ඔහු පසුරු ගහා පස් හැරිපි කල්හි වළින් නැඟී මිනිස බෙදගත මකා ගෙන්නා වූ යක්ෂයන් දෙදෙනාට සතුරු රජහු මහුල් කඩුව ගෙන්වා ගෙණැ එයින් කෙසගක් හා අඩුවැඩියක් නො කොටැ මිනිස කපා දී තමාට සතුටු වූ යකුන් දෙන්නාගේ ආනුභාවයෙන් සතුරු රජහුගේ මතු මහල්හි ඔහු නිදන තැන්හි සිටැ කිරි බොන පුතක්හු සෙමින් සොල්වා පුබුද්දනා සේ මුව අත ඇඟැ නො පාරවා කඩුවෙන් සොල්වා පුබුද්ද තමන්ගේ ධර්මිෂ්ඨකම-උත්සාහය-ප්‍රභාවය යන මේ ආදි ගුණ දුටු ඒ රජහු විසින් තමා කළ දෙෂ ක්ෂමාකරවා තැවත දෙන ලද්ද වූ රාජ්‍යය ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

50. තව ද **චූලජනක ජාතකයෙහි** පඤ්ච වණී පදමයෙන් ගැවැසිගත් විලෙක පිනන එකෙක් සේ මහාසමුද්‍රය පිනා ක්‍රමා-ගත වූ රාජ්‍යය ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

51. තව ද **පූණිපානි ජාතකයෙහි** බාරාණසි සිටු වැ තමන් ම විෂ මිශ්‍ර වූ රා පොවා මත් කොටැ හන් පළන් වස්ත්‍රා-භරණාදිය ගණුම්හ යි සිතූ සොරුන්ගේ වඤ්චා දුනැ ඒ සුරාපාන යෙන් දුරු වන්නාහු ද සුරායෙන් දුරු වූ බව මුත් ධර්මයෙන් දුරු නො වූහ.

52. තව ද **එල ජාතකයෙහි සාළිවාහ** වැ ගමට නො දුරු තැන්හි සිටි සුවසේ නැඟී ගත හැකි ගස්හි තුබූ අඹ පල වැනි පල කම්හ යි තමන්ගේ පරිවාරයෙහි වෙළඳුන් සිතූ කල්හි මේ ගස ගමට නො දුරු වැ සුවසේ නැඟ හැකිවුව කන්නන් නැති වැ සමෘර්ධ වැ තුබුයේ එකාන්තයෙන් විෂ වෘක්ෂයක් හෙයිනැ යි කියා දුනැ ඒ කැ නො දී තමන්ගේ වෙළඳුන් රක්ෂා කොටැ ඔවුන්ට ජීවිත දුනය දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්නාහ.

53. තව ද **පඤ්චාවුධ ජාතකයෙහි පඤ්චාවුධ** කුමාර වැ "මනුෂ්‍ය වැ සිටැ යක්ෂයා හා යුද්ධ කෙරෙමි" යි පවන් ගෙණැ ගැසූ ආයුධය ඇතලූ අත ඇතලූ පය ඇතලූ හිස ඔහුගේ ඇඟැ ඇලී ගත් කල්හි යක්ෂයාගේ ශරීරයෙහි එලෙමින් ඝන නීල මේඝ කුවියක් ඇලයේ තුබූ පූණී චන්ද්‍රමණ්ඩලයක් සේ ප්‍රසන්න වූ මුඛයෙන් නිහිය වැ හෙවැ තමන්ගේ ශෞර්‍යය දුටු යක්ෂයා

විසින් "තොප නො බාන්නේ කුමක් පිණිසද" යි විවාළ කල්හි "එක් ජාතියෙක්හි එක් මරක් නියතවූ ව මා බාන්නේ කුමක් පිණිසද" යි කියා —

තව ද තමන් **දීපඞ්කර පාද මූලයෙහි** පටන් ගෙණ කුසිනාරා යම සලට එනතුරු දෙ අතු'රෙක් අසත්‍යයක් තුබෑ නො පැහැරුවුව ද ව්‍යාජා'නන්තරයෙකින් අසත්‍යයක් ම නො කියා සියලු ලොව දනන්හට සමර්ථ වූ ඉතා තීක්ෂණ වූ ඥන තැමැති වජ්‍රායුධයක් තමන්ගේ අභ්‍යනන්තරයෙහි ඇති හෙයින් "යක්ෂය! මාගේ අභ්‍යනන්තරයෙහි **වජ්‍රායුධයෙක්** ඇත - ඉදින් තෝ මා කැයෙහි වී තම් වජ්‍රායුධය දිරවා ගත නො හෙන්නෙහි එතැන ම තාගේ අතුනු බහන් කපා ගෙණ පිටත නික්මෙන්නෙහ - එසේ කල්හි තොපි ත් මම ත් දෙන්න ම වැනසුම්හ" යි කියා —

ඒ ඇසූ යක්ෂයා විසින් "මේ වීර පුරුෂයා සත්‍යයක් ම කියයි නිබොයින් මොහු කන්නා තබා මොහුගේ ඇඟින් තල ඇටක් සා මස් සුඟකුත් දිව ගැ නො පැහැරි විය හැක්කැ' යි සිතා "මහා පුරුෂය! තා සේ වූවවුන් ඇහැ ලෙහෙ මස් අප සේ වූවවුන්ට ගොවර නො වෙයි - එහෙයින් තෝ රාහු මුඛයෙන් මුක්ත වූ චන්ද්‍රයා සේ මා අතින් ගැළවී යා" කි කල්හි මම ගැළවී මොහු අපායෙන් නො ගළවා ගියෙම් නම් මාගේ කරුණාවට නුසුදුසු ය" යි නො එක් ලෙසින් සම්භ්‍රම විලාසයෙන් ඕනට බණ කියා ප්‍රාණවධයෙන් දුරු කොටැ ඒ වනයෙහි බලි පිළිගන්නා දෙවතාස්ථානයෙහි තබා ඔහු පන් සිල්හි පිහිටුවා වඩතාහු ද තමන්ගේ ධර්මයට ම **ජයඝනමහ** හිඳුවූහ.

54. තව ද **කාඤ්චන ඝණ්ඩ ජාතකයෙහි** ඥන සම්පන්න වූ කෘෂි වැ තමන් සාන කලැ නගුලෙහි ඇවිලැ ගියා වූ ඇත්හු ද සොල්වා ගත නො හැක්කා වූ මහා රන්කදක් දැකැ "හුදකලා වැ සොල්වා ලිය නොහී තමන් සිතින් ම මෙයෙන් මෙතෙක් හැරැ ගෙණැ ජීවත්වෙමි" මෙතෙක් නිධාන කොටැ තබමි යි මෙතෙක් ගෙණැ කර්‍මාන්ත කෙරෙමි" යි යනාදීන් සිතින් ම බෙදා සැල්හු කොටැ පියා යන්නාහු ද දැන් තමන් බුදු වැ කරන්නා වූ **පඤ්ච ඝණ්ඩ විභාගයට** පූර්‍වනිමිත්ත පානා ධර්මයට ම අවාරදුන්හ.

55. තව ද **වානරෙන්ද්‍ර ජාතකයෙහි** වදුරු වැ තමන් කන්නට ගං මැදැ හෙවැ ගත්තා වූ කිඹුලු දැකැ "මේ ගොඩෙක්ද? නොවෙයි කිඹුලැ"යි දැනැ "පහණ! තෝ මා හා පෙර බැණැ දැන් නො බෙණෙහි" කියා "මේ පාණා පෙරමුන් හා බණක වත.

දැන් මා නො බිණුව හොත් රාහැණි වී තම් නපුරැ"යි සිතා කිඹුල්හු බැණැ නැඟි කල්හි කිඹුලා බව නිශ්චය කොටැ "නෝ මා කන්නා කැමැත්තෙහි නම් කට දල්වා ගණු - මම තා කවට පෙණෙමි"යි කියා ඔහු කට දල්වා ගත් කල්හි ඇස පියන්නා ඔහු පිටට පැනැ බිම ගසා ලූ පෙදක් සේ ඝණයෙකින් පිටින් ඇතට ගොඩට පැනපී සෙයෙක. **කිඹුලුන් කට දල්වාගත් කල්හි ඇස් පියෙන්නේය.**

මෙසේ "ඔහු කරා පෙනෙමි"යි කී බස සබා කළ හෙයින් **සත්‍යධර්මය**, උපායෙන් කිඹුල්හු බණවා ගත් හෙයින් **ප්‍රඥාවගේ මහත්ත ප්‍රාප්තවීමය**, ඇත භීතියෙන් කිඹුල්හු පිටට පැනැ එයිනුදු මැත භීතියට පැනැ ගැළවෙන්නා වූ **වීර්‍යය**, කිඹුල්හු පිටට පැන්න වේලෙහි කළ **ආත්ම පරිත්‍යාගය** යන මේ සතර ධර්මය ම රක්ෂාකරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

56. තව ද **තයොධම්ම ජාතකයෙහි** තමන් වහන්සේ මරන්නා කැමැති පිය වූ **වඳුරා උදක රාක්ෂසයා** ලවා මරවාගත මැනවැ"යි සිතා රාක්ෂසයා වසන විලට ගොස් "මල් ගෙණෙවයි" කී කල්හි 'යහපත ගෙණෙමි'යි විලට ගොස් එහි රාක්ෂසයා ඇති බව තමන් ගේ නුවණින් දැනැ "රාක්ෂසයා කන්නේ තමාගේ විලට වන් කෙණෙකුන් වේදැ"යි කියා විලට නො බැසැ ඇතින් ඇතට පැනැ පැනැ මල් කඩා ඒ අද්භූත දුටු රාක්ෂසයා අතින් වැදුම් ලදින් ගැත්තක්හු හිසැ මල් මිටියක් තබා ලා එන සවාමිදරුවක්හු සේ ඔහු හිසින් ම මල් අදවා ගෙණැ පියා කරා අවුත් ඒ විසමය දුටු දුෂ්ට පියා ලය පැලී මළ කල්හි ක්‍රමාගත වූ **වානර රාජ්‍යය** ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

57. තව ද **හෙරිවාද ජාතකයෙහි** හා **සඞ්ඛමන ජාතක යෙහි** තමන් නො කිකරු පියන් අනවරතයෙන් සක් පිඹැ බෙර ගසා ආදි පිඹලූ විට මහා ඊශ්වර කෙණෙක් ආවෝ ය යි සිතා පලාගිය සොරුන් නැවත නැවත පිඹිනා හඬ හා ගසන හඬ අසා "මේ ප්‍රධාන කෙණෙකුන් සක් පිඹිනා හඬ හා බෙර ගසනා හඬෙක් නො වේ"යි කියා දැනැ ආවා වූ සොරුන් වසතු හැරගත් කල්හි එම වල්හි සතීඳු විලාසයෙන් යුක්තප්‍රාප්ත වූ අවවාද දෙන්නාහු ද ධර්මයෙහි ම පිහිටුවා දුන්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි සෝ'තාසාහ වැ සා'හිලාෂ වැ සාර වැ සාරද වැ සප්‍රේම වැ රක්ෂාකළා වූ ධර්මය ශරණ යෙමි සි **දහම් සරණ** යා යුතු.

58. තවද **අසාත මනන ජාතකයෙහි** සියලු ශිල්පයට ආචාර්‍ය්‍ය වැ ජරාජීර්ණ වැ එක්සිය විසි හැවිරිදි වූ එදු ම මියන්නට සිටියා වූ තමන් වහන්සේ ගේ මැණියන් තමන් වහන්සේ ගේ අතවැස්සා කෙරෙහි කළ ලොභයෙන් එබඳු වූ වයසක් නො සලකා, එබඳු වූ ජරාවක් නො සලකා, "මෙබඳු අවස්ථායෙහි සිටියා වූ තමා රක්‍ෂා කරණ මා වැදූ පුතණුවෝ වේද්දැ"යි කොසිතා අතැ වැස්සා ගේ බස් ගෙණැ **කාමතෘෂ්ණා** වසහ වැ ලෙලි ලෙලි[1] පොරව හැරැ ගෙණැ තමන් වහන්සේ මරන්නට අවුදින් පළමුකොටැ ම සත්‍රුන්ගේ ආදීනව හඟවන්නට පටන්ගත්තා වූ තමන් වහන්සේ විසින් තමන් වහන්සේ වැඩැ හෝනා තැන දඹුරුවක් තබා ලූ කල්හි ඒ දඹුරුව තමන් වහන්සේ යැ යි කියා පොරොවින් පැහැරැ දණෙඬහි පොරොව වැදූනත් හඬ අසා "මපුතණුවෝ මාගේ අනාවාර දක්නාහ"යි එතැන්හි ම ඒ මැහැල්ලන් මියැ හුණු කල්හි ඔවුන් දෂ්‍ටානන්ත කොටැ ගැණුන් ගේ ආදීනව ප්‍රකාශ කරන්නාහු ද ධර්මයෙහි ම පිහිටා ප්‍රකාශ කළහ.

59. තව ද **අණ්ඩභූත ජාතකයෙහි බරණැස් රජ** වැ ගර්භයෙහි පටන් ගෙණැ වඩා හිදුවා රක්‍ෂා කරන්නාහු බවුණා ඇස් වසාලා කඩක් බැඳලා සොර සැමි වූ ධූර්තයා ලවා හිසැ පොකු එවූ ගැණිය පැ කාමයෙහි ආදීනව දක්වන්නාහු ද ධර්මය ම මුල් බැස්වූහ.

60. තව ද **තක්ක ජාතකයෙහි** තුමූ **පඤ්චා'භිඤ්ඤ අෂ්ට සමාපත්‍තිලාභී** උපදවා ධ්‍යානලාභී වූ **තාපස්වී** වැ ආශ්‍රමයෙක්හි වෙසෙමින් රුහැ ගංවතුරෙහි හී හඬා යන්නා වූ කුමාරිකාවගේ හඬ අසා මහාකරුණායෙන් සුළු පතක් හැරැ ගෙණැ පිහිනා ගෙණැ ගොස් අැ නහා අැ කෙරෙහි ම කළ ලොභයෙන් **පඤ්චා'භිඤ්ඤ අෂ්ට සමාපත්‍තියෙන්** පිරිහී වල හැරැපියා ගමට අවුත් මෝරු වෙළඳුම් කොටැ රක්‍ෂා කෙරෙමින් එක් දවසක් ගම් පැහැරැ යන සොරුන් අැ හැරැ ගෙණැ ගොස් සොර දෙටුවා තමහට අඹුකොටැ ගත්කල්හි කෙළෙහි ගුණ නො දන්නා ඒ ගැහැණිය විසින් ගඟ වතුරෙන් නැඟ පරිද්ද – තමා නිසා එබඳු ගුණධර්මයෙන් පිරිහුණු පරිද්ද – මෝරු විකොටැ රක්‍ෂාකළ පරිද්ද – නො සලකා "මා මෙහි සුවසේ වසන තැනැත්තිය ඒ යම් ලෙසකින් ගෙණැ ගියේ නම් නපුර. ඌ හිඳැ සැපක් නම් නැත. ඔහු මරවා ගතමැනවැ" යි සිතා පිටින් රුහැසියන් යවා තමන් වහන්සේ ගෙන්වා ගෙණැ බත්

1. වෙළි වෙළි.

කවාලා "මේ වේලෙහි යන බව නපුර; මා හැරී ගෙණැ යව; රැ වතුරු කොටුයෙහි ගැලී ගෙණැ හිදුව" යි කොටුයෙහි ගැල්වා හිදුවා සොර දෙවුවා අවුත් රා බී මත් වැ හුන් කල්හි —

"මෙසේ වූ විට මාගේ සොර සැමියකු දුටුතම් කුමක් කරවී ද" යි විචාරා ඒ ඇසූ සොරු කිපී "මේ මා බොත රාඝට ඌ ඇහ මස් අවුළු කොවැ කා පියම්" යි කී කල්හි එසේ වූ එකෙක්දු රැඳැ තුලු කොටුයෙහි උන්නහු කි කල්හි සොර දෙවුවා පහතක් හැරී ගෙණැ ගොස් කොටුයෙහි හුන් තමන් වහන්සේ අල්වා ගෙණැ නොයෙක් පරිද්දෙන් අනින් පයින් මරන්නට වන් කල්හි ඒ මහ දුක් විඳැ විඳැ ද අනික් බසක් නොකියා "කිපෙති, කෙළෙහි ගුණ නොදනිති, කේලාම් දනිති, මිත්‍රද්‍රොහි"ය යන මේ අර්ථ ගෙණැ.

"කොධනා අඤ්ඤසඤ්ඤු ච - පිසුනා මිත්ත දුභිකා"

යන මේ පදය ම කියා කියා හඬා සොරු තමන් බැඳලා නිදා පියා නැවත නැඟී සිටැ මරන්නට පටන් ගත් කල්හි එම බස් කියා කියා හඬා "මෙබස් තා කියන්නේ කුමකට ද" යි විවාළ කල්හි "එසේ වි නම් අසව" යි කියා ගඟින් තැගූ තැන් පටන් ගෙණැ කොටුයෙහි ගල්වා හිදු වූ තැන දක්වා සිගලු වෘත්තා'නත කී කල්හි ඒ ඇසූ සොරහු මේ සා උපකාරයක් කළ උන්ට මෙසේ කළ තැනැත්තී අපට කුමක් නො කෙරේදැ යි සිතා බොධි සත්ත්‍වයන් වහන්සේ අස්වසා ඇ පුබුද්ද, ගෙණැ මොහු මරන්නා බලන්නට එයි කැඳවා ගෙණැ ඇ විසින් මාගේ සතුරා පිටි දක්මී සතුටු සතුටු වැ ගිය කල්හි බොධි සත්ත්‍වයන් වහන්සේට කඩුව නහාපුන් ලවා මිත්‍රද්‍රොහී තැනැත්තිය ම හිස ගසා පලවා පී කල්හි කාමයෙහි ආදීනව කියා සොර දෙවුවා හා කැටුව ම පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්ම ලොකයට යන්නෝ ද ධර්මයෙන් ම ගියහ

61. තව ද **දුරාජාන ජාතකයෙහි** ආචාර්‍ය්‍ය වූ තමන්ගේ අතැ වැස්සාට "ගැණුන් සෙනහ ඇත්තා යි සතුටු නොවූ වැ මැනව. නො සිනැහැන්තා යි[1] රැහැණී නොවුව මැනව. මසුන් දියෙහි ගිය තැන් නො පැනෙන්තා සේ ඔවුන්ගේ අභිප්‍රාය නො දත හැක්කා යි" අවවාද දෙන්නාහු ද ධර්මයෙන් ම අවවාද දුන්හ.

62 තව ද **අනාගිරති ජාතකයෙහි** "හැමදෙනා පැන්බොක ගඟක්සේ ද, චණ්ඩාල ක්ෂත්‍රිය ආදීන් එකහෙළා යන මහක් සේ ද, බොහෝ රා සොඬුන් එක් වැ රා බොන රා ගෙයක් සේ ද, බොහෝ

1. සිනෙහැ'න්නාහි.

දෙනා එක් වැ යුකති බණත සහාවක් සේ ද, බොහෝ පිපාසා ඇත්තවුන් පැන් බොන පින් පැන් මඩුවක් සේ ද, නිමක් නැති වැ සත්‍රිහු තම් සභී සාධාරණයෝ" යැ සි අතැවැස්සාට අවවාද දෙන්නා හු ද ධර්මයෙහි ම පිහිටා සඩර්මය ම අලඞ්කාර කළහ.

63. තව ද **මුදුලක්ඛණ ජාතකයෙහි** දේවීන්ගේ ලිහිල් වූ සළු ඇති උකුළු දැකැ ධ්‍යානයෙන් පිරිහී රජ්ජුරුවන් දේවීන් තමන්ට ම පාවාදුන් කල්හි උන් පිණිස අසුචි ආදිය ඇදූ දමා පිරිසුදු කොටැ ගෙයක් ඉදිකොටැ එයට සුදුසු උපකරණ හිසින් ඇදූ "අන්‍යයෙහි දේවීන් හා කම්රස අනුභව කෙරෙමි" සි අසන්න වූ බෝසතාණන් දැළි අල්වා ගෙණැ ඇදූ ලූ මාත්‍රාවට කලකිරි පසුව කාමයෙහි ආදීනව සලකා නට ධ්‍යානය උපදවා ආකාශයෙන් හිමාලය යට[1] යන්නාහු ද ධර්මයෙන් ම ගියහ.

64. තව ද **උච්ඡඞ්ග ජාතකයෙහි රජ වැ** ගැහැණියක කී යුක්ති සඟවන බසට සොරහ සි බැඳැ ගෙණැ ආවා වූ බැනෝය, සමනෝය, පුතනුවෝය. යන තුන්දෙන ම හරණාහු සුභාෂිත ප්‍රියතාව ම ආශ්‍රය කොටැ ධර්මයෙන් ම හළහ.

65. තව ද **සාඛෙත ජාතකයෙහි** බුදු වැ වැඩැ හිඳැ පොවා තමන් වහන්සේ **සුදොධාදන රජ්ජුරුවන් නිසා මහාමායා දේවීන්** වහන්සේ කුසින් උපන් බව දිව්‍ය බ්‍රහ්මාදීන් ඇතුළු මුළු ලෝ දනුතුදු ගිය ජාතියෙහි මවූ වූ බැමිණිය හා පිය වූ බමුණා හා පුතැයි කියන බස් ඉවසා ඔවුන්ගේ ගෙට ගොස් වළඳා දෙ දෙනාට අනාගාමි මාගීඵල දී අමාමහ නිවන් දීමෙන් කෙළෙහි ගුණ දැන් ම කුළු ගත්තාහු ද ධර්මයෙන් ම කුළුගත්හ.

66. තව ද **විසවන්න ජාතකයෙහි විෂ වෛද්‍ය** පැ විෂ සොර සපියාට පන්සිල් දී ජාතිය මුළුල්ලෙහි ඔහු සිල් රක්නන් කෙරෙහි ඇතුළත් කරන්නාහු ද ධර්මයෙන් ම ආචාර්‍ය්‍ය වූහ.

67. තව ද **කුඤ්ඤල ජාතකයෙහි කුදාල පණ්ඩිත** වැ හුදලු කෙටියෙක්හි කළ ලොභයෙන් සවිඩෙක මහණ වැ පෙරළ පෙරළා ගෘහස්ථ වැ අන්‍යයෙහි 'මේ සා ලොභයක් මට උපදනේ මේ තුබූ යෙන් වේ දැ"සි ඇස පියා ගෙණැ හුදුල්ල හිසැ සිසාරා ගහට දමා "දිනිමි දිනිමි"සි හඬ ගහා ඒ ඇසූ රජ්ජුරුවන් එතැනට අවුදින් "තොප කා දිනුයෙහිදැ"සි කී කල්හි "මහරජ! තෙපි එක් විඩෙක් දිනූ නම් නැවත පරදුව; එසේ ගෙයින් තොප ගේ ජය අනවස්ථිත

1. හිමාලයට.

ය; මම වූ කල්හි පෙරළා ම සිතට නො පවත්නා පරිද්දෙන් (මහණ වෑ) කෙලෙස් සතුරා දිනිමි''යි බණ වදුරා ඒ ඇසූ රජු කාම යෙහි ආදීනව දැකැ ''මම ද මහණ වෙමි''යි කී කල්හි ඒ රජ්ජුරු වන් ඇතුළු වූ දෙළොස් යොදනෙක්හි පැතිරී සිටියා වූ මහපිරිස් හැරැ ගෙණැ හිමාලයයට වැද මහණ වෑ පසේබා'හිඳු අෂ්ට සමාපත්ති උපදවා එහි මහණ වූ මහපිරිස් හා එක් වැ බඹලොවට වදනාහු ද ධර්මයෙන් ම වැඩියහ.

මෙසේ මාගේ සවාමිදරුවන් විසින් ම ජාති ජාතියෙහි පුරාදු කරණ ලද ශාසන වූ ප්‍රණීත වූ අලෞකික වූ අචින්ත්‍ය වූ අතුල්‍ය වූ අවාච්‍ය වූ අවෙද්‍ය වූ අසාධාරණ වූ සකල ලොකයට සරණ වූ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධාදී සත්පුරුෂ නිසෙවිත වූ ධර්මරතනය ම සරණ යෙමි යි **දහම් සරණ** යා යුතු.

68. තව ද **වරණ ජාතකයෙහි** දිසාපාමොක් ආචාර්‍ය වෑ ''නො කල්හි උත්සාහ කෙරෙමි''යි වරණ හුල ඇනැ ඇස කණ කොවැ ගත් හඩන්නා වූ ශිෂ්‍යයා දැකැ අකාලයෙහි ඉතා යුහු වැ අඥතයෙන් කවයුතු කිරීම්හි ආදීනව වදරන්නෝ ද ධර්මයට ම අලඬකාර සැපයූහ.

69. තව ද **සීලව නාගරාජ ජාතකයෙහි** ඇන්වෑ සිටැ මං මූළාවූ තැනැත්තහු පිටින් ඇදූ කෙළෙහි ගුණ නො දන්නා වූ ඒ අසත්පුරුෂයා තමන්ගේ ම දළ කපන්නට කියත ගෙණැ ආ කල්හි ''මා අතින් එතෙක් උපකාර ලද්දවූ මේ අත්පුරුෂයා දැන් මාගේ ම දළ කපන්නට ආය; එහෙයින් ඔහු සුණු කොවැ පිඟම්''යි නො සිතා ''යහපත - තා කළ සේ. මාගේ දාන පාරමිතාව මසතක ප්‍රාප්ත කෙළෙසි'' වදරා සතර කකුල නමා බිමැ බැසැ හෙවැ ඕ ගට දළ කපා දෙන්නාහු ද ධර්මය ම දළ කළහ.

70. තව ද **සචවං කිර ජාතකයෙහි** මහ වතුරෙන් නැඟූ අසත්පුරුෂ රාජ කුමාරයා ක්‍රමයෙන් රාජ්‍යයට පැමිණැ තමන් මරන්නට උත්සාහ කළ කල්හි එ පවත් ඇසූ රට වැස්සන් ඒ රජහු මරා තමන් රජයට අභිෂෙක කළ කල්හි ඒ රාජ්‍යය ලබන්නාහු ද තමන් ගේ ධර්ම බලයෙන් ම ලදහ.

71. තව ද **රුක්ඛ ධම්ම ජාතකයෙහි** වෘක්ෂ දෙවතා වෑ ඉපදූ තමන් නො කිපෙරැ දෙවතාවන් ඒ ඒ තැන්හි විසිරී පියා තිබෙන්නා වූ රුක්හි විමන් ගත්තා වූ කල්හි තමන් කිපෙරැ දෙවතාවන් කැඳවා ''තොපි ඝනවැ ඔවුනොවුන් නිසා සිටියා වූ රුක්හි

විමන් ගන්ව"යි කියා ඔවුන් ලවා එසේ වූ විමන් ගන්වාලා කාලා'නන්තරයකින් මහවැසි මහසුළං පහළ වූ දවස් තො කිකරු දෙවතාවන් ගේ මැනවැ යි වෙන්වැ සිටි ගස් බිඳුනු කල්හි ඔවුන් විමන් නැතිවැ දුක් ගත දී ඔවුනොවුන් නිසා සිටි රැකකට කියි උපද්‍රවයක් නො වන හෙයින් තමන් කිකරු දෙවතාවන්ට සුව දෙන්නාහු ද ධම්යෙන් ම දුන්හ.

72. තව ද **මනෝජ ජාතකයෙහි මස්වැ** වැසි නට තමන් ගේ සත්‍ය ක්‍රියා බලයෙන් මහගිම් නිවා වැසි වස්නාහුද ධම්යෙන් ම වැස්සවූහ.

73. තව ද **අසංකිය ජාතකයෙහි තපස්වි වැ** හිමාලය යෙහි සිටැ අවුත් මහත් සාත්තුවක්[1] හා කැටි වැ කතරෙහි වඩනාහු රාත්‍රියෙහි සෙස්සවුන් නිදිය දී තො නිදා, මනසිකාරයෙන් යුක්ත වැ සක්මන් කරන්නාහු මිනිසුන් නිදූ වේලෙහි සාත්තුව පහරණට ආ සොරුන් සක්මන් කරන්නා වූ තමන් වහන්සේ දැකැ මේ තපස්වි අප දැකැ වෙළඳුන්ව කිවු නම් නපුර; මොහු නිදූකල්හි පහරුහම්"යි කියා වියහී ඇති මහාපුරුෂයන් වහන්සේ රෑ මුලුල්ලෙහි තො නිදන හෙයින් සිටැ වෙහෙසී පහන් වැ "තෙල තපස්වීන් ඇති හෙයින් මුත් තොප ජීවිත විනාශයට පමුණුවා තොප සතු වසතු හැරිගත්තමෝ වෙයි. උන් පිණිසය තොප දිවි ත් ධන ත් ලද්දේ – එහෙයින් උන්වහන්සේට මහාපූජා කරව්!" යයි හඬ නඟා ගියකල්හි වෙළඳුන් අවුත් "ස්වාමීනි, නුඹ සතුරන් දැකැ කෙසේ නො බෑ ද" යි විවාළ කල්හි "අනුන් පැහැරි ගත හැකි ධනයක් රක්ෂාකරන්නෝ වෙත් ද සතුරන් බන්නේ ය; මම වූකලි කා විසිනුත් පැහැරිගත නො හැක්කා වූ **මෛත්‍රිය – කරුණාය** යන දෙ ධනය රක්ෂා කෙරෙමි; එහෙයින් කිසි භයෙක් නැත්තෙමි" යි ධම් දෙශනා කරන්නාහු ද ධම්යට ම ප්‍රශංසා කළහ.

74. තව ද **මහා සුප්න ජාතකයෙහි** සොළොස් සුප්නයෙක් දුටු රජහු එහි අර්ථ දැනගත නොහී සුප්නයෙන් වන අනිෂ්ට විපාක දුරු කරවන පිණිස බොහෝ ප්‍රාණීන් නසා යාග කරන්නට පටන් ගත් කල්හි සම්භව විලාසයෙන් සුප්නා'ර්ථ කියා එයින් ඒ රජහට වන අනිෂ්ටයක් නැතිබව හඟවා සතුරුයන්හට ප්‍රාණ දුන දෙන්නාහු ද ධම්යෙන් ම දෙවූහ.

75. තව ද **බරණ්සර ජාතකයෙහි වෙළඳ වැ** සොරුන් හා එක් වැ ගෙණැ ගම් පහරණට වන්නා වූ දුෂ්ට ග්‍රාම භොජකයාගේ අධම්ය ක්ෂමා කොටැ ගත නොහී ඔහට පරිහාස කරන්නාහු ද ධම්යෙන් ම පරිහාස කළහ.

---

1. සාත්තුවයක්.

76. තව ද **හිමසෙන ජාතකයෙහි** වුල්ලඛනුගහහ පණ්ඩිත වැ "තමන් හා සමයෙහි වාසති නොගණිමි" යි අවමාන කළා වූ **හිමසෙන** නම් යෝධයා රජහුගේ සුද්ධ වූ දවස් තමන් ඇතුගේ පශ්චිමාසනයෙහි හිඳුවා තමා පූර්‍වාසනයෙහි හිඳ ඇත් සුද්ධියට වැද සතුරන් ලංවත් මරණ භයින් භයපත් වැ ඔහු මල මූත්‍රයෙන් ඇත්පිට නසා පි කල්හි ඔහුගේ අඥානතාවට පරිභව බිණ ඔහු ඇත්පිටින් බහ තුබූ පූර්‍වාසනයෙහි හිඳ ඇත්කැලයක් බිඳින සිංහ රාජයක්හු සේ සතුරන් බිඳ සතුරු රජහු නො මරා ගෙණ බරණැස් රජහට පාවා දී ඔහට අභය දෙවා දානාදී කුසල් කොට මෙලොවින් පරලොවින් අව් සාදන්නාහු ද ධම්මයෙන් ම සැගුහ.

මේසේ ජාති ජාතියෙහි මාගේ සවාමීන්ට හසනසාර වැ සිටි යා වූ සද්ධම්මය ම මට සියලු ඉෂ්‍ටාව් සාදන්නේය. එහෙයින් එසේ වූ සද්ධම්මය ම සරණ යෙමි යි **දහම් සරණ** යායුතු.

77. තව ද **සුරාපාන ජාතකයෙහි මහාකාපස** වැ හිමාලය යෙහි වැඩ හිඳ තමන් වහන්සේ හැර අනායක වැ මනුෂ්‍ය පථයට අවුත් පාන මත් වැ රහමත් සිදී කැවත තමන් වහන්සේ වැඩ හුන් ආශ්‍රමයට ම ගොස් එපවත් දන්වූ කල්හි අවවාද අනුශාසනාකරණ කෙණෙකුත් නැති වැ අනාවාර්‍ය වැ විසිමෙහි දෙෂ දක්වා අවවාද කරණ සෙයෙක් ද ධම්මයෙන් ම අවවාද කොට වදාළ සෙයෙක;

78. තව ද **මිතකවින්ද ජාතකයෙහි** හිත කැමැත්ත වුන්ගේ අවවාද නොහිවිසැ **උරවක්‍රයෙන්** කැපෙන අවිනීතයා දැක දෙවතා වැ සිට අවවාද කරණ සෙයෙක් ධම්මයෙන් ම අවවාද කොට වදාළ සෙයෙක.

79. තව ද **කාලකණ්ණි ජාතකයෙහි මහසිටු** වැ තමන්ගේ මිත්‍රවූ කාලකණ්ණි තැනැත්තහුගේ නම අශුභයැ යි බොහෝ දෙනා විසින් "මොහු නුඹ වහන්සේගේ ගෙට වැද්ද නො දුන මැනවැ" යි කී කල්හි ද ඔවුන්ගේ බස් නො ගිවිසැ "සත් පියවරක් එක් වැ ගියෝ මිත්‍ර නම් වෙති; දෙළොස් පියවරක් එක් වැ ගියෝ සහාය නම් වෙති; මසක් – හෙළමසක් පුරුදුවූවෝ ඤාති නම් වෙති; එයින් වැඩි පුරුදුකමක් ඇති කෙණෙක් ආත්මය හා සමයෙහ; මම මව සුව නසා බොහෝ කලක් පුරුදු වූ කාලකණ්ණිහු සෙසේ අත්හරිම්දැ" යි මිත්‍රයන් අත් නො හරණා හු ද ධම්මයෙන් ම අත් නොහළහ.

80. තව ද අසඨ්ඨ මාර ජාතකයෙහි මහසිටු වැ තමන් කරා අවුත් "අර්‍ථයට උපාය නම් කිම ද" යි විචාළා වූ තමන් වහන්සේගේ පුත් වූ සත් හැවිරිදි කුමාරයන්ට "නිරෝගිබව එක් වැඩ සාධන උපායෙක, ආචාර දන්නා බව එක් වැඩ සාධන උපායෙක, ශ්‍රුතඥාත්තයන් සිටා කරණ බව එක් වැඩ සාධන උපායෙක, බොහෝ ඇසූ පිරිවූ නැන් ඇති බව එක් වැඩ සාධන උපායෙක, සුවර්‍ණයෙහි පවත්නා බව එක් වැඩ සාධන උපා යෙකැ, කටයුත්තෙහි හිත වියඤ්ඤාවක් නැති බව එක් වැඩ සාධන උපායකැ" යි මෙසේ බොධි සත්ත්ව භූමියෙහි සිටැ පවා සර්‍ව්ඥ විලාසයෙන් අර්‍ථවාර වදරණ සෙයෙක් ද ධර්‍මයෙන් ම වදළ සෙයෙක.

81. තව ද කිම්පක්ක ජාතකයෙහි අඹපලැ යි කියා කිම්පල කා මියන්නවුන් එහි සවරූප දක්වා රක්‍ෂා කරණ සෙයෙක් ද ධර්‍මයෙන් ම රක්‍ෂා කළ සෙයෙක.

82. තව ද සීල විමංස ජාතකයෙහි පුරොහිත වැ තමන්ගේ ගුණ නකා බොහෝදෙනා කරණ පූජා දැකැ "මූ මට ආචාර්‍යය පිණිස පූජා කෙරෙත් දෝ හෝ, මොහු මට ගුණ පිණිස පූජා කෙරෙත් දෝ හෝ, අනික් දෙයක් පිණිස පූජා කෙරෙත් දෝ හෝ යි විමසුව මැනවැ" යි සිතා වෙළඳුන්ගේ හලට ගොස් සොරකම් කොටැ ක්‍රමයෙන් සොරකම් වැඩි ගත් කල්හි වෙළඳහු ක්‍ෂමා කොටැ ගත නො හී කර සපා පියා බැඳැ රජ්ජුරුවන්ට දැක්වූ කල්හි රජ්ජුරුවනුදු "මී නියා සථානා'නන්තරයෙක සිටැ අප කරණ සත්කාර නො සිතා මොහු මෙබඳු වූ දුශ්චරිතයක් කළ සේ නපුරු වේ ද මෝහට රාජා'ඥ කරවයි" කී කල්හි —

එතැන්හි සිටැ "මහරජ මම සොරකම් පිණිස මී නියා අනාචාරයක් නොකෙළෙම්; නුඹ ඇතුළු බොහෝදෙනා මට සත්කාර කරන්නෝ ජාති ආදී වූ සෙසු මහතක් නකා දෝ හෝ, ගුණයෙහි මහතක් නකාදෝ හෝ යි පරීක්‍ෂා කරණ පිණිස කෙළෙම්; දැන් නෙපි මාගේ ජාතිය, සථානාන්තරය, ධනය, පුරුදුකම, යනාදී සියලු ගුණ නොනකා එක අනාචාරයක් පිණිස මට වධයට නියොග කළ හෙයින් ලෝකයෙහි සීලය ම උත්තම ය- මෙසේ මහඇති සීලයට පූජා ගෘහස්ථ වැ සිටැ කොටැ ගත නොහෙමි; එහෙයින් මා විසින් මහණවන බව උත්තමයැ"යි සියළු ධන සමෘර්ධිය හැර මහණ වැ පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්ම ලොකයෙහි උපදනාහු ද ධර්‍මය පරීක්‍ෂා කොටැ ධර්‍මය ම බැලූහ.

83. තව ද **මඞ්ගල ජාතකයෙහි නාපසු වැ** මියන් කැ වසත්‍රය අවමඟුල් ය සි සොහොන්හි දැමුවා හැරැ ගෙණැ හමන් කරා අවුත් මී නියා අවමඞ්ගල වසත්‍රයක් ගෙණැ නො නසුව සි අවවාද කී පුරොහිතයාට ලොකයෙහි සත්‍යයාට වත ශුභා'ශුභයෙක් නම් කුශලා'කුශල කර්මයෙන් බවමුත් මඟුල අවමඟුල ශුභය, අශුභය, (යන) මෙයින් වන්නේ නො වෙයි කියා අවවාද වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

84. තව ද **සාරම්භ ජාතකයෙහි ගොන් වැ** සිටැ පවා ප්‍රිය වචනයෙහි අනුසස් වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

85. තව ද **කුහක ජාතකයෙහි** ප්‍රඥ සම්පන්න වූ **පුරුෂ වැ** අනුන්ගේ ගෙයි **තණ** පත හිස්වැද ගතැ සි අතර මංහි සිටැ අවුත් ඒ තණ පත ඔවුන්ගේ ගෙයි ම ලා කුහක කම් පැ අන්තයෙහි රත්රන් සියයක් හැරැ ගෙණැ පැලැවා වූ **කුට ජටිල** යාගේ වඤ්චා හසුකොටැ දී අවඤ්ඤාවෙහි අනුසස් වදාරන්නාහු ද ධර්මය ම වදාළහ

86. තව ද **අකතඤ්ඤූ ජාතකයෙහි බරණැස් මහසිඟු වැ** තමන් වහන්සේ කළ උපකාරයට ප්‍රත්‍යුපකාර නොකළා වූ ප්‍රත්‍යන්ත වාසී සිටුහුගේ කෙළෙහි ගුණ නො දන්මට නිසුකොටැ කෙළෙහි ගුණ දන්මට ප්‍රශංසා කොටැ මතු බුදු වැ "නො හැඳිනැ උපකාර යක් කරණ තැනැත්තේ දුල්භය – කළ උපකාරයෙහි ගුණ දන්නා තැනැත්තේ දුල්භ ය" සි කෙළෙහි ගුණ දන්මෙහි ගුණ වදාරණ සේක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

එහෙයින් මාගේ සැමියන් විසින් මෙතෙහි කොටැ පරීක්ෂා කොටැ නො නසා රැකැ පුරුදු කොටැ ආවා වූ සද්ධර්මය ම **සරණ** යෙමි සි **දහම් සරණ** යා යුතු.

87. තව ද **ලිනත්ථජාතකයෙහි අක්ඛධූර්ත වැ** ඉපදැ "වඤ්චායෙන් දූ කෙළිමි" සි පස ඇවි ගලන **අක්ඛධූර්තයාට** පසඇටෙහි හලා හල විෂ ගල්වා දී ඔහු ඒ ගැලැ මූර්ඡාවට **පැමිණි** කල්හි එයට සුදුසු ඖෂධ දී රක්ෂා කරන්නාහු ද මතු බුදු වූ කල්හි ප්‍රත්‍යවෙක්ෂා නොකොටැ ප්‍රත්‍යය පරිභෝග කරන්නා වූ භික්ෂූන් වහන්සේට යමේක් ප්‍රත්‍යවෙක්ෂා නොකොටැ ප්‍රත්‍ය පරිභෝග කෙරේ නම් හෙතෙම නොචිම්සා පස ඇවි ගිලූ **අක්ෂධූර්තයා** සේ විනාසයට **පැමිණෙ** සි කියා අවවාද දෙන පිණිස මෙන් ධර්මයට ම **උපසන්නමහක** වූහ.

88. තව ද **මහාසාර ජාතකයෙහි** තමන්ගේ උපාය ශක්තියෙන් වැඳිරිය ගත්තා වූ මුඛ්‍යාහාරය ගළවා ගන්නාහු ද මතු තමන් බුදු වැ තෘෂ්ණාවට ගැති වූ මුළුලෝ ගළවන බුද්ධ විලාසයට දෘෂ්ටාන්ත දක්වන්නා සේ ගැළවූහ

89. තව ද **විශ්වාස භොජන ජාතකයෙහි** මිමින්ත හා කළ විශ්වාසයෙන් විෂ මිශ්‍ර වූ ඇගේ ඇඟ ලොවැ මළා වූ සිංහයා දැකැ "විශ්වාස නොකළ මනා වුන් හා විශ්වාස කළ කල්හි ඉන් වන්නේ සත්ත්වයාට ජීවිත විනාසාදී මහා'ලාභය සි" අවවාද දෙන්නාහු ද මතු බුදු වැ නුවණැත්තවුන් විසින් අවිශ්වාස නිය වූ සංසාරය හා විශ්වාස නොකට යුතුයැ සි කරණ ධර්ම දෙශනාවට බිම් ගන්නාක් මෙන් ධර්මයට ම උපකාර වූහ.

90. තව ද **ලොමහංස ජාතකයෙහි ආජීවක වැ** නග්න වැ වසුගොම් වළඳ මරණා'න්තය දක්වා වැසැ මරණ මඤ්චකයෙහි හොත් සමයෙහි නිරා නිමිත්ත පහළ වූ කල්හි මා ගත්තා වූ මේ දුර්ලබ්ධිය අපාය මාගීයෙක් වනැ සි දැනැ එම විට ම මිථ්‍යා දෘෂ්ටි හැරැ සම්‍යක් දෘෂ්ටි ගෙණැ නරකයෙහි නිමිත්තය පෙරළා දිව්‍ය ලොක නිමිත්ත කොටැ නරක ගමනින් වැළකී දෙව් ලොවට ම වඩනාහුද ධර්මයෙන් ම වැඩියහ.

91. තව ද **මහා සුදර්ශන ජාතකයෙහි "මහා සුදර්ශන"** නම් චක්‍රවර්ති වැ ධර්ම නම් ප්‍රාසාදයෙන් බැසැ සත්රුවන් තල් වෙතෙහි මරණ මඤ්චකයෙහි වැඩ හෙවැ සුභද්‍රා බිසවුන් වහන්සේ අවුත් සිටැ "සවාමීනි, නුඹවහන්සේගේ කුසාවතී නම් රාජධානිය-ප්‍රධාන කොටැ ඇත්තා වූ සුවාසූ දහසක් රාජධානිය - ධර්ම නම් ප්‍රාසාදය ප්‍රධාන කොට ඇත්තා වූ සුවාසූ දහසක් ප්‍රාසාදය යනාදීන් ඒ ඒ වසතු පැමෙහි ඇලුම් කළ මැනවැ"යි කියන කල්හි "දේවීනි, වසතුකාම-කෙලසකාමයෙහි අපෙක්ෂාවක් කරන්නා වූ අවවාදයක් මට නො දෙව, අද මේ මාගේ අනන්තශයනය"යි[1] කී කල්හි දේවීන් සොකය ඉවසා ගත නො හී මහ හඬින් හඬන්නට වන් කල සෙසු සුවාසූ දහසක් අඹුවනු දු සුවාසූ දහසක් අමාත්‍යයනු දු රාජ කුමාරයනු දු එක පැහැරැ හඬන්නට වන් කල්හි "හඬා කෝලාහල නොකරව"යි අස්වසා සුභද්‍රා දේවීන් කැඳවා "දේවීනි, ඇති වස්තුවක් නැතිවන කල ශොක නො කළ මැනවැ යි සියලු සංස්කාර ධර්මයන් කෙරෙන් සිටි සේ සිටිනා එක ද ධර්ම කෙණෙක් නැතැ"යි —

---

1. අන්තසෙය්‍යාවයි.

"අනිච්චා වත සඞ්ඛාරා - උප්පාද වය ධම්මිනෝ
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමොසුඛෝ"ති

යන ගාථායෙන් බුදු වූ කල්හි දු අකුරක් පිල්ලක් නො හැරී එම ගාථායෙන් ම වදාරන පරිද්දෙන් අවවාද දෙන්නාහු ද ධම්යෙන් ම අවවාද දුන්හ.

92. තව ද **නෙලපත්ත ජාතකයෙහි** රාජකුමාරවූ සිටු දිව්‍ය රූප මවා ගෙණ් එන්නා වූ යකින්ත ගේ රූ දැකැ තෘෂ්ණා වසඟ නො වන්නාහු ද ධම්යට ම සත්කාර කළහ

93 තව ද **නාමසිද්ධි ජාතකයෙහි ජීවක** තම් ඇත්තෝ ද මියෙති; **ඛනපාල** තම්හු ද දුගීත වෙති; **පඤ්ච** තම්හු ද මං මුළා වෙති; එහෙයින් ම සත්‍යයා හට ධම්යෙන් ම අභිසිඤ්චිය වන බව මුත් නාම මාත්‍රයකින් වන ඉෂ්ටා'නිෂ්ට නැතැ යි අවවාද දෙන්නාහු ද ධම්යට ම පූජා කළහ.

94. තව ද **කුවාණිජ ජාතකයෙහි** වෙළඳ වූ තමන් හා කැවි වැ ධන බෙදන්නා වූ අනික් **අතිපණ්ඩිත** නම් කුට වෙළඳහු තමා පියා ගස් බුහුරෙහි[1] හිඳුවා පියා වෘක්ෂ දෙවතාවන් ලවා කියවන්නා සේ "අති පණ්ඩිතයන්ට වඩා දෙව"යි කියවූ කල්හි වෘක්ෂ දෙවතාවනු ත් වෘක්ෂ දෙවතා නොවන්නහු ත් මම හඳුනන්නෙමි වෙමි දැ'යි ගස් බුහුරෙහි ගිනි ලා ඔහු ගස් බුහුරෙන් දිවැගෙණ් අතු අගට ගොස් අත්ලෙහි එල්බැ ගෙණ් "ඕමැ ගි අති පණ්ඩිතයන්ට වඩා **පණ්ඩිතයෝ** උත්තමයෝ ඇ"යි කී කල්හි වෘක්ෂකයන් ගේ වැඩුවා හැරී සම කොටැ ධන බෙදා දී දානාදි කුසල් කරන්නාහු ද ධම්ය හා ම අත්වැල් බැඳහ.

95. තව ද **පරොසහස්ස ජාතයෙහි** මහාබ්‍රහ්ම වැ ඉපද තමන් බස අවී දන්නාවූ ජ්‍යෙෂ්ඨ තාපසයන් ගේ ප්‍රඥාසම්පත්තියට බ්‍රහ්ම ලොකයෙන් මනුෂ්‍ය ලොකයට අවුත් සතුති කරන්නාහු ද ධම්යෙන් ම සතුති කළහ.

96. තව ද **අසාත රූප ජාතකයෙහි** බරණැස් රජ වැ නිරිසන් වැ සිටි **ශක්‍රයා** අතින් වැදුම් ලබන්නට පොහොසත්වැ ද තමන් බැඳැ ගෙණ් මරන්නා වූ **කොශල රජ්ජුරුවන්ට** කිසි හිංසාවක් නො කොටැ ලෙහි මෛත්‍රිය ම උත්කර්ෂයට පමුණු වන්නාහු ජීවිතය ද හැරී ධම්ය ම රක්ෂා කළහ.

---

1 සුසිරෙහි

මෙසේ මාගේ සවාමිදරු වූ ධර්මචක්‍රවර්ත්තීන් වහන්සේ විසින් අනෙක ජාතියෙහි රක්‍ෂා කළා වූ ධර්මය ම මේ ජාතියෙහි පවත් ගෙණ නිවන් දක්නා ජාති දක්වා අප රක්‍ෂා කරන්නේ යැ යි සත්පුරුෂයන් විසින් දහම් සරණ යා යුතු.

97. තව ද **පරොසත ජාතකයෙහි** පියා විසින් වලව දූ ගෙණ ගොසින් කෙලඟ වසඟයා සේ අත අල්වා ගන්නා ලද්දා වූ දුව ගේ ආචාර ධර්මයට **වෘක්‍ෂ දෙවතා** වැ සිටැ ප්‍රශංසා කරන්නාහු ද ධර්මයෙන් ම ප්‍රශංසා කළහ.

98. තව ද **වෙදී ජාතකයෙහි** බරණැස්හි **මහසිටු** වැ අතරමගැ සොරුන් දැකැ මෙහි කල් යවන බව නපුරැ යි යුතු වැ බරණැසට වැදූ බඩු රක්‍ෂා කරන්නාහු ද සංසාරයෙහි ආදීනව දැකැ යුතු වැ බුද්ධ භූමියට වැදූ සසරින් සත්ත්වයා ගළවන බවට දෂ්ටාන්ත පාතාක් මෙන් ධර්මයෙන් ධර්මය ම සඤ්ඤා කැටුහ

99. තව ද **මිත්තවින්ද ජාතකයෙහි** දිව්‍ය පුත්‍ර වැ සිටැ ලත් ලත් දෙයෙහි අසන්තුෂ්ට වැ ගොස් **උරවක්‍රයෙහි** කැපෙන්නා වූ යථා ලාභ සන්තොෂ නැති සත්ත්වයාගේ තෘෂ්ණා මහිමාවට නිදා කරන්නාහු ද තෘෂ්ණා නිදා මුඛයෙන් ධර්ම ප්‍රශංසාව ම කළහ.

100. තව ද **දුර්විලඝාෂ්ට ජාතකයෙහි** **වෘක්‍ෂදෙවතා** වැ සැලී නැගී දඩ පතව පවා මරණ භයින් වෙවුලන්නා වූ හස්තිහු දැකැ ඔහට අවවාද කියා ඔහු කෙරෙන් මරණ භය දුරුකරන්නාහු ද මතු බුදු වැ කරණ සියලු සත්ත්වයා ගේ මරණ භය දුරු කිරීමට පූර්ව සේවා කළහ.

101. තව ද **උදඤ්චනී ජාතකයෙහි** **තාපස** වැ ගැහැණියක් අවගුණ කී **සෘෂ්‍යකුමාරයන්ට** පඤ්චකාමයෙහි ආදීනව හඟවා ධ්‍යාන සමාපත්තියට උපදේසය දී ජීවිතා'න්තයෙහි බ්‍රහ්ම ලොකයෙහි සිටුවන්නාහු ද ධර්මයට ම මාඟීය පැහැ.

102. තව ද **සාලිනත්‍රක ජාතකයෙහි** රාජාමාත්‍ය වැ අත් හකුරු ගසා[1] ගස් පතැ රූප පාතා වූ පිළි ගම්වර සතරක් ලත් සේ දැකැ සිටැ යම් කිසි ශිල්පයෙක් ම උගත යුතුයැ යි කියා මාත්සර්‍ය්‍ය නැති වැ ශිල්පයට ප්‍රශංසා කරන්නාහු ද ධර්මයට ම ප්‍රශංසා කළහ.

103. තව ද **බාහිය ජාතකයෙහි** **රාජා'මාත්‍ය** වැ රාජා' ඔගණයෙහි ශරීර ධර්මය යුහු වැ කළා වූ ග්‍රාම්‍ය ස්ත්‍රියක් දැකැ සීහපඤ්ජරය හැරැපියා සිටි රජ්ජුරුවන් "මේ ගැණිය මෙසේ වූ

1. අතකුරු ගසා.

රාජා'ඛ්‍යණයෙහි අප්‍රතිවජ්ඣා වැ ශරීර ධර්ම යුහු වැ කෙළේ නිරෝගී හෙයින, මෙසේ වූ නිරෝගීන් ගේ වසතුව ද විශද වෙයි, විශද වසතු ඇති සත්‍රින් ලද පුත්‍රයෝ පිණැති වෙති'' යි අගමෙහෙසුන් තැන තැබූ කල්හි ඇ නොබෝ කලෙකින් සක්විති රජ වන පුතකු වැදුවා දැකැ ශරීර ධර්ම මාත්‍රයක් පිරීමෙන් පොවා ගැණියට මෙතෙක් ඉෂට වූ කල වැඩි විදුවක් උගත්තවුන්ට වැඩි ලාභයෙක් වන්නේ ඇ යි විදුවට ප්‍රශංසා කරන්නාහු ද ශිල්ප ප්‍රශංසා මුඛයෙන් ධර්මයට ම ප්‍රශංසා කළහ.

104. තව ද **කුණඩපූව ජාතකයෙහි** එඩරු ගසැ **වෘක්ෂ දෙවතා** වැ ඉපදූ තමන්ට කුඩු පුවක් පිදූ තැනැත්තවුට ''මේ මද දැයෙක් වේද මට පූජා කෙළේ ඇ''යි නො සිතා එඩරු ගසැ සිසාරා මුව විවින් මුවවිට ඇරැ තුබූ සියදහස් ගණන් **නිධාන** පැ ඔහුගේ සිටු තනතුරු ලැබීමට කාරණා වන්නාහු ද මතු බුදු වැ තමන්ට කුඩු පුව පිළිගැන් වූ පුණ් තම් දැසියට අමාමහ නිවන් පැ සෝවාන් තනතුරු දෙන බවට පූජනිමිත්තන දැක්වූවාක් වැන්නහ.

105. තව ද **සඞ් ඝාතරක ප්‍රශ්නය, ගද්‍රභ ප්‍රශ්නය, අමරා දෙවි ප්‍රශ්නය** යනාදි **උම්මඟ්ග ජාතකයෙහි** තොයෙක් ප්‍රශ්නයෙහි තමන් ප්‍රඥ ප්‍රකාශ කිරීම් මුඛයෙන් ධර්මය ම ලොවට ප්‍රකාශ කළහ

මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් ලොවට ප්‍රකාශ කළා වූ සද්ධර්මය ම අසා විමසා මෙනෙහි කොටැ වැඳැ පුදූ අභිමතා'ථ සාධර්ම යි **දහම් සරණ** යා සුතු.

106. තව ද **සිඟාල ජාතකයෙහි වෘක්ෂ දෙවතා** වැ රාත්‍රියෙහි සොරොව්වෙන් ගමට කැණහිල්හු වැදූ රැ රහ බී නිදූ පහන් වැ හිය කල්හි ගැළවී ගත නො හී ''බමුණක් හට මසුරන් දෙසියයක් දෙමි'' කියා බමුණා ධන ලොභයෙන් පිළියෙන් වසා කිසිල්ලෙහි හොවා ගෙණැ පිටත් කළ කල්හි අමුයොහොන කෙරෙහිදී බැසැ පියා උතුරු සළුව අතුවල යි කියා රන් පොදි බඳවන්නට උතුරු සළුව අතුරාවාලා ''මේ තැන මාගේ ධනය තුබූයේ නො වෙයි'' එතැන ය යි කියා එතැන ඔහු කැණියදී අතුව ලූ පිළියේ සතර කොණෙහි හා මැද හා පස් තැනකට වර්වස් කොටැ වටනින් තෙමා සොහොනට දිවගත් කැණහිල්හු දැකැ දුර්ජන වූ කැණහිල්හු ගේ බස් හැදහු බමුණාට අවවාද දෙන්නාහු ද ධර්මයෙන් ම අවවාද දුන්හ

107. තව ද **මිතවින්දි ජාතකයෙහි** 'මිත විනදි' නම් මත්ස්‍ය රාජ වෑ කෙවුළන් දැල් දැමූ කල්හි දැල ගද අසා දැලට නොඟසු වැ ඟැළවී කිසි පරික්ෂාවක් නැති වැ දැල්හි බැඳී ගියා වූ "බහු විනදි" "අලසවිනදි" නම් මත්ස්‍යයන් දෙන්නා කෙරෙහි කළ කරුණාගෙන් දැල් පස්සෙන් ගොසින් දැල පලා පියා ඔහු ගළවා ගෙණැ ගියාක්හු සේ කෙවුළන්ට පැනී කෙවුළන් මසු දැල් පලා ගෙණැ ගියග සි සිතා 'මසු හස්‍රකරම්හ' යන සිතක් නැති වැ දැල ඔයවා ගත් කල්හි ඔවුන් දෙන්නා දැලින් ගළවා හෙළා ජීවිත දුන දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

108. තව ද **අනුශාසික ජාතකයෙහි ලිහිණී** දෙවු වැ තමා ගොදුරු කන්නා වූ බිම්හි සෙසු පක්ෂීන් නො ඇවිදිනා පිණිස "මෙතැන ඉතා සොපද්‍රව යැ"යි අවවාද කියා තවතා තමා පරීක්ෂා නැති වැ ගොදුරු ගෙණැ දිවන්නා වූ ගැල් සක්හි හසුවැ හිස කැඩීගිය කල්හි මළා වූ පක්ෂියා දැකැ "යම් කෙණෙක් තුමූ ලොල් වැ තමන් ගේ ලෞල්‍යය හැරපිය නොහී අනුන්ට අවවාද කියත් නම් ඔහු මෙසේ විනාශයට පැමිණෙති"යි අවවාද දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

109. තව ද **දුබ්බච ජාතකයෙහි අතවැසි වෑ** තමන් ගේ අවවාද නො කොටැ පමණ දැකැ අඩයට පනෙමි යි එහි ඇනී මළා වූ ආචාර්‍යයා තමා ගේ විද්‍යා ශක්තීන් පමණින් මුත් වැඩියක් කරන්නට සිතූ කෙණෙක් ඇත්නම් මෙසේ විනාශයට පැමිණෙතියි බණ වදාරන්නාහු ද ධර්මයෙන් ම වදළහ.

110. තව ද **තිනතිර ජාතකයෙහි ගුණශාසනාව අසථාන** යෙහි හඬා වටු වැද්ද අතැ නටුවා වූ වටුවා දැකැ "අසථානයෙහි බොහෝ කොටැ දෙඩන්නාහු ද මෙසේ විනාශයට පැමිණෙති" අවවාද වදාරන්නාහු ද ධර්මයෙන් ම වදළහ.

111. තව ද **වට්ටක ජාතකයෙහි වටු වැ** වටු වැද්ද හට හසුවැ "මම අහර කා තරවීම් නම් මෙතෙම වටුමස් කන්න වුන්ට මිළයට මා දෙන්නේ යැ"යි සිතා ගොදුරු නොකා ජීර්ණ වැ සෙසු වටුවන් දී නිමවා පියා ඉතා දිරා ගියා වූ තමන් වහන්සේ අත්ලෙහි හිඳුවා ගෙණැ මේ වටු මෙල්ලේදෝහෝයි පරීක්ෂා කරණ කල්හි ඔහු පමා වන බව දැනැ ක්ෂණයෙහි ආකාශයට නැඟී ගැලවෙන්නාහු ද උපාය කෞශල්‍ය ධර්මය ම රක්ෂා කළහ.

112. තවද **අකාල රාව ජාතකයෙහි දිසා පාමොක් ආචාර්‍යවෑ** නො කල්හි හඬා මළා වූ කුකුළා දැකැ අසථානයෙහි බිණ්හි ශ්‍රේෂ වදාරන්නාහු ද ධර්මයෙන් ම වදළහ.

113. තව ද බඹුන මොකඩ ජාඩයෙහි බරණැස් රජ හට පුරෝහිත වැ ප්‍රත්‍යන්තය සන්හිදුවන්නට යන්නා වූ ඒ රජහු තමන් නුවර රකුණෙහි හිඳුවා ගිය කල්හි තමන් හා අනාචාර කරමිහ යි බිසවුන් කී කල්හි ලොකාමිශ වූ සුඛයක් නැතා මට බත් දුන් රජ්ජුරුවන් කෙරෙහි හා සතර අපායෙහි උපදවන්නා වූ අකුසල්හි හා භය කොටැ අනාචාරයක් නොකරමි යි කියා "ඉදින් එසේ නො කෙරෙහි නම් මාගේ උපාය ශක්තීන් රජ්ජුරුවන්ට කියා නා හිස් කප්පා පියමි"යි කී කල්හි "එක ජාතියෙක්හි වන්නා වූ ජීවිත විනාශයට හිතා ජාති ජාතියෙහි රකුණා කරන්නා වූ ධර්මයට විනාශයක් නොකරමි" කී කල්හි "නට කවයුතු දන්වමි"යි කියා පියා බිසවුන් තමන් ගේ ශරීරයෙහි තබ වුණ කොටැ රජ්ජුරුවන් ප්‍රත්‍යන්තය සාධා ආ කල්හි "නොප රාජ්‍යය රකුණාවට සිටුවා ගිය පුරෝහිතයන් ගේ ආචාර සම්පත්හි බලව, මූ නොප කෙරෙහි භයක් නැතිව පරලොක භයක් නැතිව මා හුන් ගෙට අවුත් තමන් ගේ බස් නො ගිවිස්නා වූ මා හා බලාත්කාරයෙන් අනාචාර කොටැ ගියහ"යි කියා කිව.

එබස් ඇසූ රජ්ජුරුවන් විසින් "ඒ දුෂ්ට පුරොහිතයා පිටිතොල භයා බැඳැ අමුසොහොනට ගෙණැ ගොසින් මරව"යි කියා රාජ පුරුෂයන්ට නියොග කළ කල්හි රාජ නියොග ලද්දා වූ ඒ පුරුෂයන් තමන් වහන්සේ බැඳලා මරන්නට යැ යි අමු සොහොනට ගෙණැ යන කල්හි මේ නියතයෙන් බිසවුන් විසින් වූ උපද්‍රවයෙකැයි දැනැ "නිෂ්කාරණයෙහි රජ්ජුරුවන්ට අලාභ නො කොට මා නො මරා රජ්ජුරුවන් කරා මා ගෙණ යව"යි කී කල්හි ඔවුන් ගෙණැ ගොසින් රජ්ජුරුවන්ට පැ කල්හි "මහරජ, මම ඇති වූ තැන් පටන් ගෙණැ ලෙහෙඩිත්තක ද මරා ප්‍රාණ වධයක් නො කළ විරීමි අනුන් අයිති තණ පත පමණකුදු නො ගත් විරීමි ලොභ වශයෙන් පර සත්‍රී ගේ මුහුණ නොබැලී විරීමි. කෙළි පිණිස ද බොරු නොකී විරීමි. තණ අගෙකිනුදු සුරායෙහි දිව නො පැහැර වූ විරීමියි. නොපගේ බිසව් නොපගේ මේ වර ආ අමාත්‍යයන් සුසැට දෙනකු හා අනාචාර කොටැ මාද කෙළසන්නට කියා සිතා තමන් ගේ බස් නො ගිවිස්සා වූ මා කෙරෙහි දොෂ කොටැ මෙසේ වූ බොරු කිහ"යි කියා ඇ කළ අපරාධ ගිවිස්වා —

ඒ බව දැනැ කිපී රජ්ජුරුවන් ඒ සුසැට දෙනාට හිස් කපන්නට නියෝග කළ කල්හි සියලු ලොව ගළවන්නට සමර්ථ වූ ධර්ම යුක්ත වූ කථායෙන් රජ්ජුරුවන් පොළඹා ඔවුන්ට අභය දෙවා ගැහැණුන් ගේ අවගුණ දක්වා බිසවුන් කෙරෙහි ද ක්ෂමා කරවා, ඔවුනු ද බඹුන'යෙන් ගළවා, තුමූ ද බඹුනයෙන් ගැළවෙන්නාහු ද, ධර්

යෙන් ම ගැලවුනාහ. මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් මෙනෙහි කරණ ලද්දා වූ බුදුරජාණන් වහන්සේ ම සරණ යෙමි යි දහම් සරණ යා සුතු

114. තව ද **කුසනාළි ජාතකයෙහි** දිය මෙරලිය ගස්හි වෘක්ෂ දෙවතා වූ ඉපදුණු තමන් හා මිත්‍ර වූ මහානුභාව වූ වෘක්ෂ දෙවතාවා වසන්නා වූ ගස රජ්ජුරුවන් ගේ ප්‍රාසාදයෙහි සන්නිහිතව කපන්නට පවන් ගත් කල්හි,

විමානය ඇති වෘක්ෂ දෙවතාවා තමාගේ මිත්‍රයන් හා එක් වැ ඔවුනොවුන් වැලඳ ගෙණ වළාම් කරන්නට පවන් ගත් කල්හි, එතැනට වැඩ එපවත් විචාරා දැනැ ජාති ජාතියෙහි අනුන්ට උපන් දුඃඛයක් දුරුකරන්නට සුදුසු වූ නුවණ නම් දෙය තමන්ට කුලධර්ම හෙයින් "තෙපි හැමදෙන ම නොබව – මම මේ වෘක්ෂය රක්ෂා කොටැ දෙමි" යි අස්වසා සෙව වැනි දවස් වඩුවන් ගස් කපනට ආ වේලෙහි (කුටු) බොහොට වෙසක් මවා ගස මුල් අතුරට වන්නා සේ පැනිලා රුක් මැදින් නැඟී කඳ මුදුනෙන් නික්මැ වැඩ හෙවැ, ඒ බව දුටු වඩුවන් මේ ඇතුළෙන් සිදුරු ඇති රුකෙකැයි හැරැපියා ගියකල්හි මිත්‍රයාට විමානය හා වෘක්ෂය හා හැර දෙන්නාහු ද මතු තමන් සවිනේ ගෙවා දැනැ සියලු ධර්මයන් පසක් කරන්නට වැඩ හිඳිනා බොධි වෘක්ෂයට මරහු විසින් කිසි උපද්‍රවයක් නොවිය දෙන්නට හෙතු සම්පාදනය කරන්නවුන් මෙන් සද්ධර්මය ම සුහුඹුල් කළහ.

115. තව ද **දුම්මෙධ ජාතකයෙහි හංසනිරාජ වූ රජහු** නුවරැ රජහු තමන් මරන්නට යැ යි **වෙපුල්ල** පර්වතයට නගා 'එක් පයක් පර්වතයෙහි ඔබා[1] ගෙණැ තුන්පයක් ආකාශයට නගා ගෙණැ සිටුව" යි කියා හංසත්‍යා'චාර්‍යයාට නියොගකළ කල්හි ඒ තමන් වහන්සේ මරන්නට කරන්නා වූ ප්‍රයෝගය බව දැනැ ඒ ක්ෂණයෙහි ම ඇති වැ ගත්තා වූ පුණ්‍යමය වූ සෘර්ධියෙන් හංසත්‍යා'චාර්‍යයා හා එක් වැ ම ආකාශයෙන් බරණැස් නුවරට ම ගොස් තමනුත් හංසත්‍යාචාර්‍යයා ත් ගළවන්නාහු ද ධර්මයෙන් ම ගැලවූහ.

116. තව ද **නඩගලිස ජාතකයෙහි දිසා පාමොක් ආචාර්‍ය වූ** තමන්ගේ ශිෂ්‍යයා දුටු දුටු දෙයක් ම තහුලිසක් වැන්නැ යි කියා කියා පරිවය ලෙස "තහුලිසක් වැනි සජීයකු දිටි"මි කී ද ද එහි මදක් ආකාර සාම්‍යයෙක් ඇතෙයි ගිවිසැ "තහුලිසක් වැනි ඇත්තු දිටිමි" කී ද ද තෝරා කියාලිය නුහුනු බව මුත් ඇතුගේ සොඬ හා තහුලිස මදක් එක්වැනි ලෙසෙක් ඇතැ යි

1 ඔබා.

කියා උපෙක්ෂා කොටැ "තහුලිසක් වැනි උක්දණ්ඩක් කාලා ආම්" කිද ද උක්දණ්ඩට ත් තහුලිසක් වැනි ලෙසෙක් ඇතැ යි උපෙක්ෂ වැ මියෙන් තොබැණැ හිඳැ-අනික් දවසක් දියෙන් කිරිබත් කැමිහ" යි කියා දී කිරි තම් කුමක් වැනිදැයි විචාළ කල්හි 'හැයි දි කිරි තහුලිසක් වැනි වේ ද යි කියා දැන් වූ කල්හි "මේ අඥතයා තො විචාරා දුටු දුටු දැයවම තහුලිසක් වැන්නැයි කියයි මොහු උගන්වාගන්ට තො පිළිවතැ යි අත්හරණාහු ද ධම්යෙන් ම හළහ.

117. තව ද **අඹ ජාතකයෙහි** පැවිදි වැ පන්සියයක් තාපසයන් හා කැටි වැ හිමාලයෙහි වෙසෙම්න් තමන්ගේ අතැවැසි එක් තාපසයක්හු මහ නියම්හි පැන් නො ලබන්නාහු නිරිසනුන්ට ගසක් කැණ පියා දෙණක් ඉදිකොටැ පැන් බොන්නට එන නිරිසනුන් මේ තාපසයෝ අපට පැන් නගම්හ යි කියා එලා' එලයට නො ගොසින් තුමූ සහ දුකින් පෙළෙති. මොවුන්ට අප උපකාර කළ මැනවැ යි ශක්ති තරම්න් අඹ දඹ ආදි වූ ඵල ගෙණාකල්හි එක තමන් කන්නට ගෙණ ඵලා'ඵලයෙන් පන් සියයක් තාපසයන් රක්ෂාකරණ පරිදි දැකැ "එක වතාවත් දන්නා ගුණ සම්පන්න කෙණෙකුන් නිසා බොහෝදෙනා සුවයෙන් වෙසෙති යි වත් සම්පත්තියෙහි අනුසස් වදරන්නාහු ද ධම්යෙන් ම වදළහ.

118. තව ද **කටාහ ජාතකයෙහි මහසිටු වැ** තමන්ගේ ගැන්ත වූ තමන් ලීවා කොටැ පතක් ලියවා ගෙණැ "තමන්ගේ පින්ම්" කියා ගොස් පසල් දනවියෙහි සිටානන්ගේ දුවනියන් හිඳුවා ගෙණැ වසන කල්හි, එපවත් අසා "මොහු කළ සේ ඉතා නපුර - මා ගොසින් ඔහු බැඳ ගෙණෙව මැනවැ" යි ඔබ ගොස් ඔහු පෙරමගට අවුත් කළා වූ ගැති මෙහෙ දැකැ" මපින්ම්" යි මොහු සුව සේ වුන්නෙන් මට කුමන අලාභයෙක්ද යි සිතා පුත් බව ම හිඹිසැ ඔහු ලද්දා වූ ශ්‍රී සම්පත්කොටැ ඒ තමන් වහන්සේගේ ගැන්තහු සිටුදියණියන් තමහට ඉදිකළා වූ අග්‍ර රස භොජනයට ගන්වා කරණ කල්හි එපවත් අසා ඔහට මතුනුත් අවී හැහෙන නියායෙන් ඔහුගේ ගැනිකම් හඟවා ගාථාවක් සිටු දියනියන් උගන්වා ඔහු වාචාලකම් බණන කල මේ ගාථාව තෙපි වදරා ඔහුගේ වාචාල කම් හරවා ඔහුගේ ශ්‍රී සම්පත්කරන්නාහු ද ධම්යෙන් ම සම්පත් කළහ

119. තව ද **අසිලක්ඛණ ජාතකයෙහි රාජකුමර වැ** "කඩුයෙහි ලක්ෂණ පරීක්ෂා කෙරෙම්" යි කඩුව හිඹැ මිරිස් සුණු නාසයට වත් කල්හි කිව්සැ නාසය කපාගත් බඩිග පරීක්ෂකයා හා එම මිරිස් සුණු නාසයෙහි ලා කිව්ස මයිල් රජ්ජුරුවන්ගේ දුවනියන්

හා රාජ්‍යය ලද තමන්වහන්සේ හා දෘෂ්ටානුකොට, "සමහරුන්ට අනිෂ්ටයට කාරණා වන දෑයෙක් සමහරුන්ට ඉෂ්ටයට කාරණා වෙයි" මේ කිවිසැ නාසස කපාගත. ඇපි කිවිසැ රාජ්‍යය ලදුම්හ"යි බණ වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

120. තව ද **කාලණ්ඩුක ජාතකයෙහි** බරණැස් සිටු වැ අයුක්තකාරී වූ තමන්ගේ දාසයා භික්මවා විනීත කරන්නාහු ද ධර්මය ම සුහුඹුල් කළහ.

121. තවද **බිලාර ජාතකයෙහි** හා **අඟුලික ජාතකයෙහි** ද මිහි වැ ඉපදී ද තපස්වී වෙශයෙන් මියන් කන්නා වූ සිවල්හුගේ වඤ්චා ඔසුකොටැ, ඔහුගේ භයින් මුදා තමන්ගේ පරිවාර මිහියන් රක්ෂා කරන්නාහු ද දැන් බුදු වැ සසර භයින් මුදා තමන්ට ගැති වූ මුළුලෝ රක්ෂා කරණ බවට පූර්ව නිමිත්ත පෑහ.

122. තව ද **ඛොසිය ජාතකයෙහි** දිසාපාමොක් ආචාරී වැ තමන්ගේ අතවැස්සාගේ අඹු වූ අනාචාර කරන්නා වූ බ්‍රාහ්මණියගේ දුසීල කම් තමන්ගේ උපායෙන් හරවා ශීලත්‍රයෙහි පිහිටුවන්නාහු ද ධර්මයෙන් ම පිහිට වූහ.

මෙසේ මාගේ සවාමිදරුවූ **නිලෝගුරු බුදුරජානන් වහන්සේ** අතනත ජාතියෙහි නොයෙක් ලෙසින් පිරිමසා විමසා සුහුඹුල් කොටැ පරිහරණය කළා වූ සද්ධර්මය **සරණ** යෙමි යි **දහම් සරණ යා සුතු.**

123. තව ද **අසම්පදාන ජාතකයෙහි "සඬ්ඛ"** නම් සිටු වැ තමන් ගේ ගෙට අනාථ වැ ආ මිත්‍ර සිටුහට සතලිස් කෙළක් ධන දී තමන් අනාථ ව ඔහුගේ ගෙට ගිය දවස්හි ඔහු තමන් වහන්සේ දැකැ මා අනාථ වැ ගිය දා සතලිස් කෙළක් ධන දුන් තැනැත්තෝ වෙත්දැ යි නො සිතා කෙළෙහි ගුත නොදන්නවුන් කෙරෙහි අග තැන්පත් වැ සිටිහෙයින් "පෙරළා අපගේ ගෙට නොඑව – තෙලෙ පිසැ කව"යි කියා කුරුගුළාකන්හි බැඳලූ බොල්තිඹක් ගෙණැ යන්නෝ ද "මා එතෙක් ධන දුන් තැනැත්තහුට මේ බොල් තිඹක් දිනැ"යි නොසිතා මෙපමණ ප්‍රත්‍යුපකාරයක් පිළිගෙණැ ද අපගේ මිත්‍රධර්මය සවිර වී නම් යහපතැ යි සතුටු සතුටු වැ වඩනාහු ද ධර්ම විනයානුයෙන් ම වැඩියහ.

124. තව ද **පඤ්චගරුක ජාතකයෙහි** රාජකුමාර වැ දිව්‍ය රූප මවා ගත්තා වූ යක්ෂින්ගේ වඤ්චා දැන ඔවුන්ට හසු නොවැ රාජ්‍යයට පැමිණැ ලොක රක්ෂාකරන්නාහු ද **දශරාජ ධර්මය** ම රක්ෂා කළහ.

125. තව ද **සතාසන ජාතකයෙහි පක්ෂිරාජ වැ** තමන් වසන වනයෙහි විල නොන්තා වූ නාගරාජයා ගස් මත්තෙහි හුන්නා වූ පක්ෂීන් තමා වසන විලට වර්විස් හෙළති යි කිපී විෂා'ග්නි හරණට වන් කල්හි "බැහැර ගිනි ඇති වූ කල්හි දියෙන් ඒ ගිනි නිවති. දියෙන් නැති ගින්නට ප්‍රතිකාර කොයින් කෙරෙත්ද? එහෙයින් අපට සරණින් ම භය උපනැ"යි කියා තමන් වහන්සේ ගේ පක්ෂීන් ගෙණැ අනික් තැනකට වැඩ නොකිකරු පක්ෂීන් එහි ම හිඳැ මිය යා දී කිකරු පක්ෂීන් ගළවන සෙයෙක් ද මේ කෙලෙස් ගිනි ගත් සසරෙහි තමන් වහන්සේට නො කිකරුවන් දමින් පැලහෙමින් මහ දුක් ගත් දී - තමන් වහන්සේ කිකරුවන් සෙහෙන් ගළවා ගෙණැ අමාමහ නිවන් වදනා බවට පූජා නිමිත්ත පැ සෙයක.

126 තව ද **කිනාසොණ ජාතකයෙහි** හා **වඤ්ඣ ජාතකයෙහි** බ්‍රහ්මලොකයෙන් මනුෂ්‍ය ලොකයට අවුදින් අතැවැස්සා-තන්ගේ බුද්ධියට ප්‍රශංසාකරණ සෙයෙක් ද ධර්මයෙන් ම ප්‍රශංසා කොට වදාල සෙයක.

127. තව ද **සඛාදිහංස ජාතකයෙහි සඛාදී හංසරාජ වැ** ජාත්‍ය'නන්තරයෙහි පුරුදු බැම්ණියට තමන්ගේ ශ්‍රී ශරීරයෙන් රන්පත් දී රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

128. තව ද **බබ්බු ජාතකයෙහි ගල්වඩුදෙවු වැ** ගිය ජාති-යෙහි ධනසිටුහට අඹු වැ ධනයෙහි සෙනහයෙන් තමාගේ නිධානය ආලයෙහි මිහි වැ උපන් තැනැත්තිය තිරිසන් වැ සිටැ පොවා තමා සතු ධනය තමන්ට දෙන පරිද්දෙන් හා ඇ කළ උපකාරයෙහි ගුණ දැකැ ඇට සුදුසු ගොවර දීමෙන් හා උපද්‍රව දුරුකිරීමෙන් ඇ රක්ෂා කරණ පරිද්දෙන් ලෝ වැස්සන්ට ප්‍රිය වන්නාහු ද කෙලෙහි ගුණ දන්නාහු ද ධර්ම බලයෙන් ම මෙසේ වූ විශෙෂයකට පැමිණිය හ.

129. තව ද **ගොධ ජාතකයෙහි ගොවැ** ඉපද තමන් වහන්සේගේ මාංශයෙහි ලොභ කළා වූ කුට තාපසයා තමන් වහන්සේ මරන්නට කළ වඤ්චා ප්‍රයෝගයෙන් ගැලවී ජීවිත රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

130. තව ද **උභතොභට්ඨ ජාතකයෙහි වෘක්ෂ දෙවතා වැ** ඉපද මස් ගන්ම් සි දියට බැසලා අඳුන බිලිවැද්ද පුතු හා කැටි වැ බිලී බාන්නට ගොස් බිලි හෙබට දමා ඒ කතුයෙක්හි වැද්ද ගත් කල ඇද්ද බලා තරබව දුන "මහමසෙක් වැදගත් වනැ"යි

සිතා "මාගේ අඹුව හා ඉක්බිති ගෙහි ඇත්තන් හා ඔබරයක් කොටැ ගත්කල මය් පිරිවුළු නැති වන්නේ යැ යි කියා පුතු යවා අඹුව ඉක්බිති ගෙයි ඇත්තන් හා ඔබර කරන්නට කියවූ කල්හි අඹු නිෂ්කාරණයෙහි ඔබර කොටැ දඬැ හුනේ. මේ මත්ස්‍ය ලොභයෙන් ගොඩ පිළී තබා දිගට බැසැ "මසු සොයම්"යි කණුයෙහි ඇනැ ඇස් කණ කොව ගත. ගොඩ තුබූ පිළී සොරු ගත්හ. තෙමේ ගොඩට නැගී නගන වැ පිළී සොයා නොදක්කී ඔහු දැක "තාගේ ඇස කණ විය පිළී වලව හිඳේය. අඹු දඬැ හුනැ. තෝ අඥතය හෙතුකොට ගෙණැ දියෙහි ගොඩෙහි කම්මානතයෙන් පිරිහිනි"යි අවවාද වදරණ සෙයෙක් ද ධර්මයෙන් ම අවවාද දී වදළ සෙයක.

131. තව ද **කාෂ්ඨ ජාතකයෙහි** කවුඩු වැ ඉපද පොවා **බාරාණසි රජ්ජුරුවන්** ගේ **සිංහාසනයෙහි** ශ්වෙතච්ඡත්‍රය යටැ වැඩැ හිඳැ සප්ත විලාසයෙන් බණ කියා සියලු සත්ත්වයාට අභය දෙවා වදරණ සෙයෙක් ද ධර්මයෙන් ම දෙවා වදළ සෙයෙක. මෙසේ මාගේ සවාමීන් අනෙක ජාතියෙහි පුරුදු කොටැ ගෙණැ ආවා වූ ධර්මය ම සරණ යෙමි, මෙමා සියලු දුකින් ගළවා සියලු සම්පත්තියෙහි යොදු අභිමතා'ව් සාධා දෙන්නේ යැ යි **දහම් සරණ යා යුතු.**

132 තව ද **ගොධ ජාතකයෙහි** ගෝ වැ තමන් වහන්සේගේ පුත් **ගොධි** කුමුබොඩ විශ්වාස කොටැ තමන් වහන්සේ ගේ පරිවාර සියලු ගොයින්ට එළවූ විපත්තිය දැකැ "පාප ජනයන් හා සංසර්ගය කරණ තැනැත්තේ ඉෂ්ටයක් නොලබ"යි කියා අවවාද වදරණ සෙයෙක් මතු තමන් වහන්සේ බුදු වැ "සියලු භය උපදී නම් අසත්පුරුෂයා කෙරෙන් උපද්දි යි – සත්පුරුෂයා කෙරෙන් නූපද්දී" යනාදීන් වදරන්නාහු ද ධර්මයට බිජුවට වපුළ සෙයෙක.

133. තව ද **සිඟාල ජාතකයෙහි කැණහිල් වැ** ඉපද "තමන් වහන්සේ මරා මස් කම්"යි කියා පොල්ල හඟවා ගෙණැ නොමියැ මළ වෙස් ගෙණැ අඹු සොහොන්හි මිනී අතුරෙහි හොත්තා වූ සුරා ධූනියා ගේ වඤ්චා දැනැ තමන් වහන්සේ ගේ බුද්ධි ශක්තියෙන් ඔහු අතින් තමන් වහන්සේ ත්, තමන් වහන්සේගේ පරිවාර ත් ගළවා ගන්නා සෙයෙක් ධර්මයෙන් ම ගළවා වදළ සෙයෙක.

134. තව ද **විරොචන ජාතකයෙහි** සිංහ රාජ වැ "සිංහ ක්‍රියා කෙරෙමි" යි ඇත් පිටැ පැනැ වැරදුන[1] හි ඔහු සතර පයින් ගැහැරී විනාශයට පැමිණි **කැණයිල්ලු** දකැ "තම හට නුසුදුසු ක්‍රියා කරණ සත්ත්වයාට විනාශය නියත යැ යි අවවාද වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

135 තව ද **නඩිගුටඨ ජාතකයෙහි** සංසාර දෙෂයෙන් මිථ්‍යාදෘෂ්ටි ගෙණ ගිනි පූජා කරන්නට එක් දවසක් තමන් වහන්සේ ලත් ගොණුන්හු ගිනි පූජා කරණු පිණිස යැ යි බැඳ සිටුවා ලුණු පිණිස ගමට ගොසින් තමන් වහන්සේ වැඩියදී ආවා වූ වැද්දන් ගොණු මරා ඇට හා නහුට හා තබා මස් කා ගිය කල්හි "තමාට තුබූ ගොණු රක්‍ෂා කොටැ ගත නොහෙන වහ්නි දෙවතාවා මා කෙසේ රක්‍ෂා කෙරේද? එහෙයින් මෙය යහපත් දෘෂ්ටියක් නොවෙයි" සිතා වහ්නි දෙවතාවා කරා එළඹැ තෙපි නොපට තුබූනු ගොණු රක්‍ෂාකොටැ ගත නුහුනුව. සොරු ඔහුගේ මස් කා ගියහ. තුබූයේ මේ නහුව හා ඇටමැ ය. ලද්දෙක් ලද්දේ නහුවත් වී නම් කව "යි කියා ඒ නහුට ගින්නෙහි ලාපියා **ඒ** මතය හැර තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මනණ වැ **පඤ්චා'භිඤ්ඤා අෂ්ට සමාපත්තීන්** උපදවා බ්‍රහ්ම ලොක පරායන වන සෙයෙක් ද අධර්මය දුරැ කොටැ ධර්මය ම මෙනෙහි කොටැ වදාළ සෙයෙක.

136. තව ද **රාධ ජාතකයෙහි** ගිරා වැ ඉපදී බ්‍රාහ්මණියගේ අනාචාරය වැඩූ බමුණු පියානන්ට වදාරණ සෙයෙක් ද අධර්මය ක්‍ෂමා කොටැ ගත නොහී ධර්මයෙහි කළ ලොභයෙන් ම වදාළ සෙයෙක.

137. තව ද **සාඛ ජාතකයෙහි සමුද්‍ර දෙවතා** වැ ඉපදී රහ බී මත් වැ මුහුදු වෙරළහි හිඳැ "රැළට හසුවැ මළා වූ **කැවිඩිය** සොයම්හ යි - මුහුදු දිය තුබින් උකා වළඳවම්හ"යි පටන්ගෙණ ලුණුදිය කවට වදුන් වදුන් උගුරු වියලී ඇස් රත් වැ ගිය කල්හි "මේ අසක්‍යා'නුෂ්ඨාන[2] කරන්නා වූ කාකයන් නො මියන තුරු මෙතැනින් නෙරපුව මැනවැ'යි සිතා හඟඩකර වූ රූපයක් දක්වා ඔවුන් ලුහුබඳවා ප්‍රාණ දනය දෙන සෙයෙක් ද ධර්මයෙන් ම දුන් සෙයෙක.

138. තව ද **පුඤ්ඤරත්න ජාතකයෙහි ආකාශස්ථ දෙවතා** වැ "උත්සවයෙහි අඹුවට පිළී පොරවන පිණිස සොරා වනුක් මල් කඩම්"යි උසනට වැදූ අසු වැ ජීවශූලයෙහි හිඳැ කවුඩුවක්හු අවුත් හිසැ හිඳැ ඇස් සාරා කන කල්හි "මේ දුකට වඩා මාගේ ප්‍රිය

1. වැරද ගෙන 2. අසක්‍යානුෂ්ඨාන.

තැනැත්තිය වනුක් මලින් පෙවූ රතක් එකාංශ කොටැ බහාලා මා ගෙලෙහි එක් අතක් තබා මේ උත්සව නො කෙළිනා බව මට ඉතා දුකැ"යි හඬන්නා වූ කාම වසඟ වූ පුරුෂයා දැකැ පඤ්ච කාමයෙහි ආදීනව වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

139. තව ද **සිගාල ජාතකයෙහි කැණහිල් වැ** ඇත් මිනිස ඇතුළට වැද වත් මග හැසිරී ගිය කල්හි - සත් දවසක් මුළුල්ලෙහි මහදුක් ගෙණැ අන්තයෙහි මහවැස්සක් වැසැ වම්ය සිපිල කොටැ පී කල්හි - විද හී ගත්තා වූ සිදුරෙන් නික්මෙන කල්හි ම ඇඟ සියලු රෝමයෝ රැරා ගෙණැ පිටත් වැ "මෙතෙක් දුක් මට වූයේ රස තෘෂ්ණායෙනැ"යි කාමයෙහි ආදීනව වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

140. තව ද **එකපණ්ණි ජාතකයෙහි තපස්වි වැ** දුටු වූ රාජකුමාරයාට කොසඹ පැලය දෑටෑන්න කොටැ "කුමාරය, එක් පෙති අවස්ථායෙහි මෙසේ තිබුන වූ කොසඹ පැලය වැඩී ගත් තම් කෙසේ තිත්ත නො වේදෝ හෝ යි කියා උදුරා පියා අතින් මැඩැ දැමී. තෝ ද බාලා'වස්ථායෙහි වණ්ඩයෙහි. එසේ ම වණ්ඩ වූ තා ද රට වැස්සෝ "කුමාර බාල කල්හි මෙසේ වණ්ඩ වූයේ මතු රාජ්‍යයට පැමිණී අවස්ථායෙහි කෙසේ නම් වණ්ඩ නොවේ දෝ හෝ යි සිතා මූලෝ'චින්න කරන්නාහ. එහෙයින් වණ්ඩ නොව"යි කියා අවවාද දී ඔහුගේ ඒ ඵරුෂත්වය හරවන සෙයෙක් ද ධර්මයෙන් ම හැර වූ සෙයෙක.

141. තව ද **සඤ්ජීව ජාතකයෙහි දිසාපාමොක් ආචාරී වැ** මළ ව්‍යාඝ්‍රයා උපදවා ඔහු අත ම නට මාණවකයා ගේ ප්‍රවෘත්ති අසා **"අසන්පුරුෂයන්ට අනුග්‍රහ කලෝ ඔවුන් අත ම නසිති"**යි අවවාද වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

142. තව ද **රාජෝවාද ජාතකයෙහි බරණැස් රජ වැ** තමන් වහන්සේ ගේ අගුණ කියන කෙණෙක් ඇද්දෝ හෝ යි කියා පරීක්ෂා කරණ පිණිස රථයකට නැඟී පසල් දනවිවෙහි ඇවිදින සෙයෙක. එසමයෙහි කොසොල් දනවිවෙහි **රජ** ද එසේ ම රථයකට නැඟී අවුත් එතැනට ම සමඟ වී ය. "අපට මහදී තෙපි ඇලවව! තෙපි ඇලවව"යි කියා "ජාති සම්පත්ති ආදී වූ සියලු ගුණ සම් වුව කාට කවුරු ඇලවමෝද"යි කී කල්හි "ගුණයෙන් වැඩි කෙණෙකුන්ට ඇලවම්හ"යි කියා තමන් වහන්සේගේ සාරථිහු කොශල රජහු ගේ සාරථි හට තාගේ රජහු ගේ ගුණ කියයි කී කල්හි —

ඒ සාරථිහු විසින් "මාගේ රජ්ජුරුවෝ දුඩියන්ට දුඩි කම් ම කෙරෙති. මොළොකුන්ට මොළොක්ව ම පවතිති. සත්පුරුෂයන් සත්පුරුෂ කමින් ම දෙතෙති. අසත්පුරුෂයන් අසත්පුරුෂ කමින් ම දෙතෙති. එසින් මුන්ගේ ගුණ වැඩි ය. තෙපි මෙහින් ඇලවව"යි කී කල්හි තමන් වහන්සේ ගේ රථාවාරිහු සී පියා "කොල, තා ගේ රජ්ජුරුවන්ට මා ගේ රජ්ජුරුවන් වහන්සේ ගේ ගුණ කියමි. තා කී සේ සතර අපායෙහි උත්පත්තියට කාරණය වූ අවගුණය හළ - මාගේ සවාමීන් ගේ ගුණ අස"යි කියා ඔහු "කියා බලව"යි කී කල්හි "මාගේ සවාමීහු තමන් කෙරෙහි ක්‍රොධ කළ එකක්හු ගේ ක්‍රොධාග්නිය මෛත්‍රී තැමැති ජලයෙන් නිවන සෙයෙක. අසත්පුරුෂයා සත්පුරුෂ කමින් ම දනන සෙයෙක. කිසිවක් නො දෙන්නා වූ තද මසුරු තැනැත්තහු ගේ මසුරුකම් දනයෙන් දනන සෙයෙක. බොරු කියන තැනැත්තහුට සබා කියා ම දනන සෙයෙක. එසේ හෙයින් මෙබඳු ගුණ ඇති සවාමීන්ට මහ දෙව"යි කී කල්හි —

එබස් ඇසූ කොසොල් රජහු හා සාරථිහු "මේ මහා පුරුෂයාගේ ගුණ සියලු සත්ත්වයාට මවුපිය වැ සිටියා වූ බුදුන්හට ධුර පැමිණි සිටි මහතක්හු ගේ ගුණ මුත් සාධාරණ රජක්හු ගේ ගුණ නොවෙයි. මේ භිමියා ගේ ගුණ නියාව මහ දෙන්නා තබා දිවි දෙන් සුදුසු යැ යි මහින් ඇල වැ සිටි කල්හි රථයෙහි ම වැඳැ හිඳැ ඒ රජ හට බුද්ධ විලාසයෙන් **දශරාජ ධර්මය** වදාරා ඒ රජහු ද තමන් වහන්සේ ගේ ධර්මයෙහි පිහිටුවා නුවරට වැඩැ දානාදී කුසල් කොටැ බොධිසම්භාර ධර්මයන් මුහුකුරුවත සෙයෙක් ධර්මයට ම පිටිවහල් වූ සෙයෙක. මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පරිහරණ කොටැ ආවා වූ ධර්මය සරණ යෙම් යි **දහම් සරණ** යා යුතු.

143. තව ද **සිගාල** ජාතකයෙහි සිංහ වැ ඉපද **කැණහිල්ලු** මරණුවස් පැනැ සැබැ කෙණෙකු දුවාන භීකානියෙහි ගැසී ලය පැලී මළ කල්හි තුමූ සිංහ නාදයෙන් ඇතුළෙහි හොත් කැණහිල්ලු ල පලන්නා වූ මතු තමන් ගේ ධර්මය සිංහ නාදයෙන් විනෙය ජනයා සිත්හි පවත්නා වූ කෙලෙසුන් පැලීමට පූර්ව නිමිත්ත දක්වූහ.

144. තව ද **සූකර** ජාතකයෙහි සිංහරාජ වැ සිටැ අසුචියෙහි වැකුණු ගුරාට දුරුවන්නා වූ මතු බුදු වැ කෙලෙසුන් දුරුවන බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

145. තව ද **උරග ජාතකයෙහි** නාපස වැ නිත්‍ය වෛරී වූ **ගරුඩයා** හා **නයි** හා දෙදෙනා තමන් ගේ අවවාදයෙන් මිත්‍ර කරන්නාහු ද මතු තමන් බුදු වූ මහලෙහි සියලු **කවුඩෝය** - බඤ මූනෝ ය - සිංහයෝ ය - ඇත්තු ය - අස්හු ය - මිගිමු ය - මියෝ ය - බළල්ලු ය - **නයි** ය - මොණරු ය - යනාදී වූ නිත්‍ය වෛරී සත්ත්වයන් ගේ වෛර සන්ඛිදුවීමට පූර්ව නිමිත්ත දක්වූහ.

146. තව ද **ගඟඟ ජාතකයෙහි** සිටුපුත්වැ කිවිස්සනට ආ තෝ වැඩුවන් හා ආ වැඩුවන්ට පෙරළා ආ නොවැඩුවන් හා **කන්හා යක්ෂයා** ගේ සවරූප දැනැ කිවිස පූ පියානන් වහන්සේට ආ වඩා යක්ෂයා අතින් තමන් වහන්සේ ගැළවී තමන් වහන්සේගේ උපදෙශ යෙන් ම පියානන් වහන්සේ ලවා තමන් වහන්සේට ත් ආ වඩවා ඔහුනුදු යක්ෂයා අතින් ගළවා යක්ෂයා ද තමන් වහන්සේ ගේ උපදෙශයෙන් ම දමා පන්සිල් ගන්වා ඒ යක්ෂයා විසින් සියලු සත්ත්වයාට වන උපද්‍රව වළකා ලොක ඥානනිකරණ සෙයෙක් ද ධර්මයෙන් ම කොටැ වදාළ සෙයෙක.

147. තව ද **අලීන චිත්ත ජාතකයෙහි** කිරි බොන කුමාර වැ පියානන් මළකල්හි සතුරු රජහු රාජ්‍යය සිසාරා ගත් කල්හි ඒ අවස්ථායෙහි ඇත්පිටැ නැඟී සතුරු රජහු ලුහුබදවා රාජ්‍යයට පැමිණෙන්නාහු ද දැන් වප්‍රා'සකාරුස වැ මාර සෙනාව ලුහුබදවා ධර්ම රාජ්‍යය ගන්නා බවට පූර්ව නිමිත්ත දක්වූහ.

148 තව ද **ගුණ ජාතකයෙහි සිංහරාජ** වැ මඩෙහි එරී ගිය තමන් නැඟ **ඛැණගිල්ලු** හා ඔහුගේ අඹුදරුවන් හා තමන්ගේ කාඤ්චන ගුහායෙහි ලා රක්ෂාකොටැ මිත්‍රධර්මයෙහි කුළුගන්නාහු ද ධර්මයෙහි ම කුළුගත්හ.

149. තව ද **සුභතු ජාතකයෙහි පණ්ඩිත අමාත්‍ය** වැ කුළු අසුව කුළු අසු හරවා අස් වෙළඳුන්ට ධන ලාභයකට කාරණා වූවාහු ද ධර්මයට ම කාරණා වූහ.

150. තව ද **මොර ජාතකයෙහි මයූර** වැ බුදු වැ දෙසූ කල්හි කෙළ ලක්ෂයක් සක්වළෙහි ආඥ පවත්නා පමණ **මොර පිරිත්** පිරිවහන්නාහු ද ධර්මයට ම කාරණා වූහ.

151. තව ද **චිනීල ජාතකයෙහි 'විදෙහ රජ'** වැ රථයෙන් නගර ප්‍රදක්ෂිණා කෙරෙමින් හංසයන් දෙන්නකු ඔහැගත් දඬු මැදු හුන් **කාකයා** "මේ රජ්ජුරුවන් අස්හු අදිනි; මා හංසයෝ අදිනි; අප දෙදෙනාගේ කවර වෙනසෙක් ද" යි සිතූ ක්ෂණයෙහි ම විනාශයට පැමිණෙන පරිද්දෙන් ම ආනුභාව ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

[illegible]ත් මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි සාතම
[illegible]ද පිරිමසා පරිහරණ කොට ආවා වූ "ධම් රතනය ම
[illegible]ට දුක් කොවැද්ද දෙන වජ්‍රායුධයෙහා; සියලු සම්පත්ති
[illegible]ත ඝාලන වෘක්ෂයෙහා; එහෙයින් ඒ මේ සරණ යෙමි" යි
රණ සා සුත්‍ර.

[illegible] තව ද **ඉදඤ්චමාහ** **ගොතම** **ජාතකයෙහි** බ්‍රාහ්මණ
[illegible]තමන්ගේ අවවාද නොකොට ඇතු අතැ මළා වූ තපස්වීහු
[illegible]විශ්වාස නොකට්‍යුතු වූ අසත්පුරුෂයන් හා විශ්වාස කළ
[illegible]ලා'නතරයෙනුදු සත්‍යයාට අනර්ථ ම වන්නේ ය; එහෙයින්
[illegible]ත් ප්‍රඥාවෙන් බහුශ්‍රැතතායෙන් සම වූ හෝ වැඩිසිටියා වූ
[illegible]ත්පුරුෂයන් හා ම සමාගම කළ මැනවැ"යි අවවාද වදා
[illegible]ත ද ධර්මයෙන් ම වදාළහ.

3. තව ද **සත්තව** ජාතකයෙහි බ්‍රාහ්මණ වූ වහ්නි පූජා
එම වහ්නින් තමන්ගේ පණ්ඩශාලාව දැ කල්හි "තමාට
[illegible]ණය කළා වූ මාගේ දුකින් කළා වූ පණ්ඩශාලාව දැවූ
[illegible]ද වූ වහ්නියට පූජාවෙන් ප්‍රයොජන නැතැ" යි තමන් පුදන
[illegible]සා නිවා පියා පන්සලට වැද තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වැ
[illegible]හිඳ අෂ්ට සමාපත්ති උපදවන්නාහු ද ධර්මයෙන් ම ඉපදවූහ.

4. තව ද **සුසිම** **ජාතකයෙහි** **හසනිමඛල** **පුරොහිත**
[illegible]යාව පුත් වූ ඉපදූ සොළොස් හැවිරිදි අවස්ථායෙහි
[illegible]ත් මළකල්හි ඇත් මහුල් දවස ආසන්න වැ සිවිකලැ ඇත්
[illegible]කරණ පුරොහිතයා "නැත ඇපි මහුල් කොටැ ධන ගණුම්
[illegible]හමණයන් ධන ගන්නට සැරහී සිවිකල්හි තමන් වහන්
[illegible]මැණියන් වහන්සේ "සත්වන පරම් පරායෙහි පවත්
[illegible]තිබී ආ ඇත්මහුල් දැන් අන්හූ කරන්ට වන්හ. අපගේ
[illegible]පිරිහෙන වනැ" යි හඬා හුන් කල්හි "අම්ම, කුමක් පිණිස
[illegible]සෙයෙක්දැ" යි විචාරා එපවත් අසා "මම ඇත් මහුල්
[illegible]යි නොහැඬුව මැනවැ" යි කියා මැණියන් වහන්සේ
[illegible]වෙදත්‍රය ය නොදනු ත් **'හසනිසුත්‍ර'** නොදනු ත් කෙසේ
[illegible]රවිදැ" යි කී කල්හි —

[illegible]ත් මහුල් කී දවසකින්දැ" යි විචාරා "මෙතැනට සතර
[illegible]වැ" යි කීකල්හි "නුඹවහන්සේ වදාළ **තුන්වේදය** හා
[illegible]ත්‍රය දන්නෝ කොයි වෙසෙන්දැ" යි විචාරා "මෙතැනට
[illegible]විසි යොදනෙක්හි **තක්සලා** **නුවර** වෙසෙති" යි වදාළ
අම්ම, ශොකා නොකළ මැනවැ; මේ සතර දවස මට සතර
[illegible]කා සම ය; මේ එක්සිය විසි යොදන මට එක්සිය විසි

පියවරක් හා සම ය; සෙට එක දවසින් ඔබ ගොසින් රැ තිස් පැසින් ම තුන්වේදය හා හසනිසුත්‍ර ඉගෙණැ තුන් වෙනිදා මුඛ අවුත් සතර වෙනිදා ඇත් මහුල් කොටැ නුඹවහන්සේගේ ශොක පසිදිමි'' යි වදාරා දෙවෙනි දවස් මැණියන් වහන්සේ වැඳැ පැදකුණු කොටැ ''මා වැනි පුතුන් ඇතිකල්හි ශොක නොකළ මැනවැ'' යි සමු ගෙණැ —

තිස් පැසින් එක්සිය විසි යොදන ගෙවා ගොස් ආචාර්‍යයන් දැකැ එපවත් කියා මසු දහසක් ඉදිරියෙ තබා ලා ''අද එක රැයට මට අවකාශ දෙව'' යි කියා ඉල්වා ගෙණැ දෙනිස් අකුරක් ගණන් ඇති එක සතරපද **සොළෝවක්** උගන්නා සේ ලක්ෂ ගණන් ග්‍රන්ථ ඇති **තුන්වේදය** හා **හසනිසුත්‍රය** සොළොස් දහසක් ඉගෙනැ අලුයම් තො විදහනාතුරු ආචාර්‍යයන් වහන්සේ දන්නා දෙය නිමවා උන්මුවෙන් නො බැණැ හුන්කල්හි ''දන්නා දෑ තවත් ඇත්ද? මෙතෙක්මදැ''යි විචාරා ''පුතනුවෙනි, මා දන්නේ මෙතෙක් ම යැ''යි කී කල්හි එසේ වුවහොත් නුඹ මා ඉගැන්වූ තැන්හි ''මෙතෙක් පදවැටි හිත. මෙතෙක් තැන් හදරා වරදවා පියනලද. මෙතැන් පටන් ගෙණැ ශිෂ්‍යයන් මෙසේ ඉගැන්වුව මැනවැ''යි කියා ගුරුන්ට ත් වැරදි තැන් වදරා අනික් දවස් බරනැසට අවුත් මැනියන් වහන්සේගේ ශ්‍රී පාදය වැඳලා තමන්දෑ උගත් ශාස්ත්‍රය කියාලා ''ශොක නොකළ මැනැවැ''යි කියා අන්ලේවා දවස් සියලු නුවර ඇත් මහුල් සරා රජ්ජුරුවන් සිංහාසනාරූඪ වැ හුන් තැනට ගොස් දැන් බුදු වූ දවස් නිගණ්ඨයන් තමන් මධ්‍යයෙන් බැණ ගත නො හෙන්නාසේ ම හසනි මඩහල කරන්නට ආවා වූ බ්‍රාහ්මණයන් තමන් මධ්‍යයෙහි එකබසක් සොල්වා ලිය නොදී සියලු ශාස්ත්‍රය පිරිවහා පියා තමන්ගේ අසමසිත සිංහනාදයෙන් ඔවුන් ලුහු බදවා පියා සරාජික පඬිද් විසමයට පමුණුවා ඇත් මහුල් කොටැ බොහෝ ධන ලදින් ශොක'තුර වූ මැනියන් වහන්සේගේ ඇසැ කඳුළු පෙරළා සතුටු කඳුළු කොටැ ඔවුන් රක්ෂා කරන්නාහු ද ධම්යෙන් ම රක්ෂා කළහ.

155. තව ද **ගිජ්ඣ ජාතකයෙහි** ගිජුලිහිණි වැ ඉපැ මවු පියන් රක්ෂා කරන්නෝ ද ධම්යෙන් ම රක්ෂා කළහ.

156. තව ද **නකුල ජාතකයෙහි තපස්වි වැ** ඔවුනොවුන් හා නිත්‍ය වෛරී වූ මුගටියා හා සපියා හා දෙදෙනා දැන් හමන් වහන්සේගේ සස්නෙහි පැවිදි සැරියුන් මුගලන් දෙදෙනා වහන්සේ ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරණ පරිද්දෙන් අවවාද කොට වදරණ සෙයක් ද ධම්යෙන් ම වදළ සෙයක.

157. තව ද **උපසාළහාඛ ජාතකයෙහි** නාපස වැ "අනුන් නොදුවූ බිමක තමා දවන්නට යැ"යි කිය කියා ඟල් පිහිනාදිය සොයා ගිජ්ඣකූට පර්වත මස්සාකයෙහි තමා දවන්නට සොහොන් බිම් පා එන බමුණා කැඳවා එපමත් අසා බමුණා ඔබ කැඳවාගෙණැ ගොස් එහැන බලා "මේ අනුන් නොදුවූ තැනැ"යි තා පියාතෝ තට කිව්දැ යි කියා "එසේයැ"යි දැන් වූ කල්හි සි පියා "මෙතැන්හි සෙසු සත්ත්වයා දුවූතන් තබා පියා මෙම උපසාළහාඛ තම් කල්හි මෙතැන්හි ම දුවූ යේ තුදුස් දහසක් වාරයෙක;- එහෙයින් ලොකයෙහි අනුන් නොදුවූ බිමෙක් නැතැ"යි බණ වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයක.

158. තව ද **සම්භූ ජාතකයෙහි තපස්වි වැ** තමන්ගේ රූපා'ග්‍රප්‍රාප්ත වූ ආත්මභාවයෙහි ලොභකළා වූ දෙවතා දුවගේ බස් අසා ද දැන් මාරසන්‍රින්ගේ බස් අසා ලොභ නොකළ පරිද්දෙන් ම ඇ කෙරෙහි ලොභ නොකොවැ බ්‍රහ්මචර්‍යාව රක්ෂාකොවැ වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයක.

159. තව ද **සකුණඝි ජාතකයෙහි** වටු වැ ඉපදැ උස්සාව හසු වැ "සියලු සත්ත්වයන් තමන්ගේ විෂයෙහි මුත් අනුන්ගේ විෂයෙහි හැසිරෙණ බව විනාශ කාරණයැ යි කියා සියලු ලොවට අවවාද දෙන්නාහු ද ධර්මයෙහි ම හැසුරුණාහ.

160. තව ද **අරඤ ජාතකයෙහි මහරූසි වැ** සත්අවුරුද්දක් මෛත්‍රී භාවනා කොවැ ඒ කළ මෛත්‍රියෙහි අනුසසින් සංවට්ට-විවට්ට කල්ප සතක් ම බ්‍රහ්ම ලොකයෙහි වසන සෙයෙක් ද ධර්මයෙන් ම විසූ සෙයක.

161. තව ද **උමංදුයෙහි ආඛණවඤ ජාතකයෙහි මහෞෂධ පණ්ඩිත වැ** තිරිසන් වූ ඝාවුබෝඩාගේ අභිප්‍රාය බුද්ධඥානයෙන් දන්නා සේ දැන වදාරණ සෙයෙක් ද තමන් වහන්සේගේ ඥාන ධර්මයෙන් ම දැනැ වදාළ සෙයක.

මෙසේ අනෙක ජාතියෙහි මාගේ සවාමීන්ගේ සිත හා ප්‍රිය මිත්‍රකම් ඇත්තාක් වැනි වූ ධර්මරතනය සරණයෙමි යි **දහම් සරණ යා සූත්‍ර.**

162. තව ද **කල්‍යාණධර්ම ජාතකයෙහි 'මහා ධන සිටු'** වැ රජගෙට ගොස් එනවිට "තමන් වහන්සේ මහණවූව" යි යන බසක් ගෙයි කියා කොලහල කරන්නා අසා උපන්නා වූ කීර්ති ශබ්දය නොනැසුව මැනවැ යි සිතා ඒ සා මහත් ධන සම්භාර්යයක් හැර මහණ වන සෙයෙක් ද, ධර්මයෙහි ලොභයෙන් ම මහණ වූ සෙයෙක.

163. තව ද දඳුරු ජාතකයෙහි සිංහරාජ වූ තමන් වහන්සේ වදුල අවවාද නො ගිවිසූ "සිංහනාද කෙරෙමි" යි හඬ හැඬූ කැණහිල් පැටහුගේ අවිනීතකමට වර්ණනා කොට අවවාද වදුරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදුල සෙයෙක.

164. තව ද මකසකට ජාතකයෙහි තාපස වූ තපස්වී වෙශය ගත්තා වූ වානරයාගේ වඤ්චාව දන්නා සෙයෙක් ද දුන් ධර්මසවරූපයෙන් සිටියා වූ නීචකයන්ගේ අධර්මයෙහි සවරූපය දන්නට පුළුවන් නිමිත්ත සාධන්නාහු ද තමන් බුදු වූ කල්හි සංසාරයට පසු බස්නා විතෙය බැඳුන් ලවා කෙලෙසයන් මඩවා නිර්වාණය හසුනප්‍රාප්ත කරණ බවට පුළුවන් නිමිත්ත දැක්වූහ.

165. තව ද දුතිය මකසකජාතකයෙහි තාපස වූ තමන් වහන්සේ හිසැ වර්වස් හෙළන්නා වූ වඳුරාගේ කෙළෙහි ගුණ දැනුම් නොවිවාරා ධර්මයෙහි සිටූ පැන් දී වදුරණ සෙයෙක් ද ධර්මයෙන් ම දෙවා වදුරණ සෙයෙක.

166. තව ද ආදිච්චුපට්ඨාන ජාතකයෙහි තපස්වී වූ හිරුට උපස්ථාන කරන්නා සේ කොහොන්කම් හඟවා සිටි වානරයාට ප්‍රශංසා කරන්නා වූ මනුෂ්‍යයන් දැකූ "මේ ආචාර සම්පන්න නොවෙයි; අග්නි හොත්‍ර දූෂකයෙක; කමණ්ඩලු හෙද කළා වූ දුෂ්ටයෙකැ" යි ඔහුගේ කොහොන්කම් ප්‍රකාශ කොට වදුරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදුල සෙයෙක.

167. තව ද කාලායමුට්ඨි ජාතකයෙහි අමාත්‍ය වූ සිටූ අකාලයෙහි යුද්ධයට යන්නා වූ රජ්ජුරුවන්ට අවවාද කියා අකාලයෙහි කරන්නා වූ යුද්ධයට ගමන් වළකා බත් දුන් රජ්ජුරුවන්ට අනුග්‍රහ කොට වදුරණ සෙයෙක් ද ධර්මයෙන් ම අනුග්‍රහ කොට වදුල සෙයෙක.

168. තව ද තිණ්ඩුක ජාතකයෙහි වානරෙන්ද්‍ර වූ අසූදහසක් වානරයන් මරණ භයින් හුන් සමයෙහි ඔවුන් අස්වසා පසුවූ වූ තමන් වහන්සේගේ බැනනුවන් ලවා සියලු වානරයන්ට ජීවිත දානය දෙවන සෙයෙක් ද ධර්මයෙන් ම දෙවූ සෙයෙක.

169. තව ද කාවජප ජාතකයෙහි කුම්භකාර වූ සිටූ "මා හුන් තැනැ" යි කියා භූමියෙහි ආලය නොහැරූ තමන් වහන්සේගේ හුදුල්ලෙහි පහරින් මලා වූ කැස්බෑ පැ "යමෙක් උපද්‍රව සහිත වූ ස්ථානය පුරුදුයැ යි කියා නොහරී නම් ඒ මෙසේ විනාශයට පැමිණෙයි" කියා අවවාද දී වදුරණ සෙයෙක් ද ධර්මයෙන් ම දී වදුල සෙයෙක.

170 තව ද **සනඛම්ම ජාතකයෙහි** චණ්ඩාල වෑ තමන් වහන්සේගේ ඉදුල් කා මළා වූ කුලිතයාගේ වෘත්තා'නත ඉපැද්ද වීමෙන් මතු බුදු වැ මා වණ්ඩාල වූ ජාතියෙහි මා ඉදුල් කෑ නැකැත්තවුව් සුවයක් නොවූවා සේ මාගේ ශාසනයෙහි මහණ වූ කුල පුත්‍රයා නුසුදුසු පරිද්දෙන් ආහාර උපදවා අනුභව කරන් සුවයෙක් නැතැ යි කියා කරන්නා වූ ධර්ම දෙශනාවට උල් උන්වා[1] වදාළ සෙයෙක.

171. තව ද **දුද්දද ජාතකයෙහි තාපස වෑ** පරිවාර තාපස යන් හා කැටි වැ බරණැසට වැඩැ තමන් වහන්සේට දන් දුන්නා වූ උපාසකවරුන්ට "මතා දනයෙහිදු චිත්ත ප්‍රසාදය මහත් කල්හි මහඵල වෙයි" කියා අවවාද වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක. මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අභ්‍යාස කරණ ලද්ද වූ ධර්මයම සරණයයි කියා **දහම් සරණ යාසුනු.**

172. තව ද **අසදිස ජාතකයෙහි බ්‍රහ්මදත්ත** රජ්ජුරුවන්ට පුත් වැ **අසදිස කුමාර වෑ** සුවාසූ දහසක් යොදුන් **තච්ඡිසා** භවනය දක්වා තැඹෙන පරිද්දෙන් විදින ශරය සතර රියනක් පමණ තැනට විදින්නක්හු සේ විදිනට සමර්ථ වැ ඒ ශක්තිය දක්වා සියලු ජම්බුවිපයෙහි ප්‍රසිද්ධ වැ මලනුවන්ගේ රාජ්‍යය සිසාරා ගත්තා වූ රජ්ජුරුවන් සත්දෙනා බන්ධන තලියෙහි තමන්ගේ නම් ලී සර හෙළා බවුන් ලුහු බඳවා මලනුවන්ට රාජ්‍යය සවසථ කොටැ තබා තුමූ සියලු පඤ්චකාමයෙහි අපෙක්ෂාවක් නැති වැ මහණ වන්නාහු ද ධර්මය පිණිස ම මහණවූහ.

173. තව ද **සඞ්ඛාමාවචර ජාතකයෙහි හත්ථාරෝහ** වෑ ඇතු නැඟී යුද්ධ මධ්‍යයට වැද ඝනත්‍ර පාෂාණාදීන් පහර කා ලොහොදියෙන් ද පසුබස්නා ඇත්හට තමන් වදාළ එකවචන මාත්‍රයකින් උත්සාහ වඩවා සියලු දුශ්ය එක ඇත්හු ලවා බිඳුවා රාජ්‍යය සාධන්නාහු ද තමන් බුදු වූ කල්හි සංසාරයට පසු බස්නා විනෙය බැඳුන් ලවා කෙලෙසයන් මඩවා නිර්වාණය හස්තප්‍රාප්ත කරණ බවට පූර්වනිමිත්ත දැක්වූහ.

174. තව ද **වාලොදක ජාතකයෙහි අමාත්‍ය වෑ** අග්‍ර රස පානය කොටැ නොමත් වූ **සෙඞ්ඛවයන්** හා හීන වූ කසට රස බී මත් වූ **ගද්‍රභයන්** හා දැකැ හීනයන් මතා දෙයකින් මත්වන බව දක්වන්නාහු ද ධර්මයෙන් ම දැක්වූහ.

---

1. උල්ගන්වා.

175. තව ද ගිරිදන්ත ජාතකයෙහි රාජාමාත්‍ය වූ කොරුගේ ගමන් ඉගෙණ කොරව ඇන්නා වූ තෝ කොර අශ්වයාගේ අභිප්‍රාය දැක අනික් යහපත් වූ ගමන් ඇති පුරුෂ යක්ෂ ඉදිරියෙහි ලා ඔහුගේ ගමන් උගන්වා කොර හරවන්නාහු ද ධර්මයෙන් ම හැරැවූහ.

176. තව ද අනඟ්ගි රත ජාතකයෙහි ආචාර්‍ය වූ ඝිඝිගෙයි කම්කටුලෙන් මන්ත්‍රය පිරිවහා ගත නොහෙන්නා වූ ශිෂ්‍යයා දැක සිත "මියවුල් කල්හි අර්ථය කොවැටහෙන්නේ යැ' යි කියා වදාරන්නාහු ද මතු තමන් බුදු වැ "සමාහිතෝ යථාභූතං පජානාති" යි වදාරන්නා වූ ධර්මයට ම බිජුවට දැක්වූහ.

177. තව ද දඛ්වාහන ජාතකයෙහි අමාත්‍ය වූ කොසඔ ගස හා එක් වූ අඹ ගස විරස වූවා දැක අන්පුරුෂ සමාගමයෙන් සත්පුරුෂයා හට විනාශය දක්වන්නාහු ද ධර්මයෙන් ම දැක්වූහ.

178. තව ද චතුමටට ජාතකයෙහි හංසපොතකයන් දෙදෙනා ඔවුනොවුන් හා මන්ත්‍රණය කරණ තැනට වැදූ බණන්නා වූ කැණහිල්ලු දැක වෘක්ෂදෙවතා වූ සිවැ "මේ උත්තම ජාති වූ හංස රාජයන් දෙදෙනා සිටි තැනට තා සේ වූ හීන ජාතීන් වදනට කාරණා කිම්දැ" යි ගර්හා කරන්නාහු ද දැන් බුදු වැ අකුශල ධර්මයන් කුශල ධර්මයන් හා එක්විමට කරණ ගර්හාව ම දැක්වූහ.

179. තව ද සිහකොසීසක ජාතකයෙහි සිංහරාජ වූ "සිහ හඬ හඬම්"යි කැණහිල් හඬ හඬා තමාගේ සබරූප ප්‍රකාශ කරන්නා වූ කැණහිල් පැටවි දැක ඕහට අවවාද කියා ඔහු මතු නොබණන පරිද්දෙන් භික්මවන්නාහු ද දැන් බුදු වැ ධර්මය කියා අධර්මය හඬ වන්නාහු ද තීර්ථකයන් භික්මවා නිශ්ශබ්ද කරණ බවට පූර්ව නිමිත්ත දැක්වූහු.

180. තව ද සිහචම්ම ජාතකයෙහි ගොවි වූ කෘෂි කර්මාන්ත කොටැ ජීවත් වෙමින් සිංහ චර්ම පෙර වැ ඇවිත් නා[1] භද්‍රභයා බොහෝ දෙනාට සිංහභයක්හු සේ වැටහී භය උපදවා තමා මරන්නට සිසාරාගත්තා වූ මිනිසුන් මැද ගද්‍රභ ශබ්ද පවත්වා තමා සිංහ නොවන බව හඟවා විනාශයට පැමිණි කොටළුවා දැක "මේ ගද්‍රභයා තමාගේ ශබ්දයෙන් ම විනාශයට පැමිණියේ යැ"යි ධර්ම දෙශනා කරන්නාහු ද ධර්මයෙන් පිටත් නොවූ කථා ම කළහ.

181. තව ද සීලානිසංස ජාතකයෙහි සමුද්‍රදෙවතා වූ මුහුදු වැදූ නැව් බිඳි නෙසරණ සිහිකළ මාත්‍රයෙකින් ම මහානාග රාජයක්හු නැව් වෙස් ගන්වා තුමූ නියමු වෙස් ගෙණ නැව සත්

1. ඇවිදිනා.

රුවනින් පුරා ඒ උපාසකයා තමා පස්සෙහි යන කරනැවැමියා ගේ ගුණයක් නැති හෙයින් නැවට නොනගා එතර කොටැ දෙදෙනා ගේ ගෙහි ධන පුරා තමා ගුණයක් නැති කරනැවැමියා පොවා සත්පුරුෂ සමාගමයෙන් ගැළවුනු පරිදි බණ වදාළ සෙයෙක.

මෙසේ මේ ජාතකයෙහි මුහුදු මැද නැවු බුන්නත් පොවා **"බුන් සරණ යෙමි" "දහම් සරණ යෙමි" "සඟ සරණ යෙමි"** සි කී බැවින් නාගරාජයන් සත්රුවන් නැවි වෙස් ගෙණ, සමුද්‍ර දෙවතාවන් නියමු වෙස් ගෙණ, **නෙසරණ** ගතුවන් ඒ නැවට නගා උන් ගත් නෙසරණයෙහි අනුමෝදන් වූවනුදු ඒ නැවට නගා එතර කොටැ උන්ගේ ගෙයි සත්රුවන් පුරා ගිය බව ම "රතනත්‍රයය සරණ ගියවුන්ට සියලු දුක් දුරු වෙයි" කියා මා **කියන්නා වූ නෙසරණ ගුණයට ම දෙස.** එහෙයින් මාගේ සවාමීන් විසින් මෙසේ අනන්ත ජාතියෙහි පරිහරණය කරණ ලද්දා වූ ධර්මය **සරණ යෙමි** යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ යා යුතු.**

182. තව ද **රුහක ජාතකයෙහි බාරාණසි රජ වූ** අඹුවගේ බසින් අස් සැදැ ලා ගෙණ අස්බෙර හස්වා ගෙණ අස් ගමනින් රජගෙට ආ පුරෝහිතයා දැකැ ගැහැණුන් ගේ ආදීනව වදාරන් නෝ ද ධර්මයෙන් ම වදාළහ.

183. තව ද **සිරි කාලකණ්ණි ජාතකයෙහි** ශ්‍රී කාන්තාව හා කාලකණ්ණියා හා දෙන එක් කොවන බව වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

184. තව ද **චුල්ලපදුම ජාතකයෙහි පදුම කුමාර වූ** උරෙන් ලෙහෙ පෙවූ ගැහැණිය කොටෙක් කෙරෙහි කළ සෙනහයෙන් තමන් උස් ගලින් හෙළූ කල්හි තමන්ගේ භාග්‍ය බලයෙන් හා පූර්ව සෙනහ බලයෙන් **ණෝ වූ** උපන්නා වූ **ආනන්ද** තම් මහ තෙරුන් වහන්සේ පිට හෙළවා ගෙණ[1] දිවි දුන් කල්හි ගොසින් රජය ලදින් ඇතු නැඟී දන් දෙන්නට වඩනා තැනට **කොටු** පැසින් උසුළා ගෙණ අවුත් තමන් වහන්සේ නො හැඳිනැ සිටියා වූ කෙළෙහි ගුණ නොදන්නා වූ ගැහැණිය තමන් වහන්සේ හැඳිනැ ඇගේ බොරු හසුකරණ පිණිස "මේ තිව කුමක් වේදැ"යි විචාරා "මාගේ නැන්දනියන් බබා ගොන් මයිලනුවන් පුතනුවෝය"යි කී කල්හි තමන් උරෙන් ලෙහෙ පෙවූ පරිදි ද කොටහු කෙරෙහි කළ සෙනහයෙන් තමන් වහන්සේ ගලින් හෙළූ පරිදි ද ප්‍රකාශ කොටැ වදාරා තමන් වහන්සේ දිවි ගන්නට සිතූ අනාචාරයට ද ක්ෂමා කොටැ වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම ක්ෂමා කොටැ වදාළ සෙයෙක.

---

1. එළවා නෙව.

185. තව ද **මණ්ඩොර ජාතකයෙහි ගෘහපති වූ** වහන්සේගේ අඹුවන් කෙරෙහි සෙනහ කළා වූ රජහු ත මාණික්‍යය තමන් වහන්සේ කැඟී ආ ගැලැ ලවා පියා "මු සොරා ගත් තැනැත්තේය යි තමන් වහන්සේ මරන්නට කල්හි තමන් වහන්සේගේ ඇඹේණියන් වහන්සේගේ සත බලයෙන් ආවා වූ **ශක්‍රයා** තමන් වහන්සේගේ හිසැ තු ගෙඩියෙහි ඒ දුෂ්ට වූ රජාගේ හිස තබා ඔහුගේ හිස කපවා වහන්සේ ඇත්පිටැ හිඳු වූ කල්හි ඇඹේණියන් වහන්සෙ කැටි වැ අභිෂෙක ලදින් රාජ්‍යශ්‍රියට පැමිණෙන සෙ ධම්යෙන් ම පැමිණි සෙයෙක.

186. තව ද **පඛ්ඛතූපඤ්ඤර ජාතකයෙහි අමාත** තමන්ගේ රජ්ජුරුවන්ගේ අන්තඃපුර ද්‍රොහ කළ අමාත්‍ය පවත් අසා "මහරජ, මේ අමාත්‍යයා ත් තොපට ප්‍රයොජනවත මේ සත්‍රියත් තොපට ප්‍රිය වුව, දෙදෙනාට ක්‍ෂමා කරව" යි දෙ කෙරෙහි රැහැණි හරවා ඔවුන්ගේ සම්පත්තිය ඔවුන්ට ස්ථිර ස යෙයෙක් ද ධම්යෙන් ම ස්ථිර කර වූ සෙයෙක.

187. තව ද **චලාහකාස්‍ස ජාතකයෙහි** ආකාශචාරී වූ **රාජ වැ** ඉපදුණු කැටුබිඳී විදෙශයට වන්නවුන් තමන් වහන්ෙ පිටින් ඇදුණු සවදෙශයට පමුණුවා නිදුක් කරවන සෙයෙක් ද යෙන් ම කළ සෙයෙක.

188. තව ද **මිත්තාමිත්ත ජාතකයෙහි ගණාශාස්තෘ වැ** මිත්‍ර සවරූප වදුරණ සෙයෙක් ද දැන් තමන් වහන්සේ වදුරන්නා වූ කුශලා'කුශල ධම්ස්වරූප සේ ම අවිපරීත වදුළ සෙයෙක.

189. තව ද **රාධජාතකයෙහි ගිරා වැ** බැමිණියගේ අ පියානන්ට වදුරණ කල්හි දු "නුවණැත්තෝ තම් ඇත්තක් නැත්තක් වත් කියන කල්හි ඇසුවන් සිත ඇලලෙන නො කියති" යි බණ වදුරණ සෙයෙක් ද ධම්යෙන් ම වදුළ සෙ

190. තව ද **ගෘහපති ජාතකයෙහි ගොවි වැ** වහන්සේගේ දරුවන් කෙරෙහි විප්‍රතිපන්න වූ ග්‍රාම භෝජ අවවාද කොටැ වදුරණ සෙයෙක් ද ධම්යෙන් ම වදුළ සෙ

191. තව ද **සාධුසිල ජාතකයෙහි දිසාපාමොක් ආචා** "දුන් විවාහ දෙන්නා කැමැති බමුණු දුන්නම් රූපසම්පන්න දුන මනාදෝ, වය සම්පන්නයාට දුන මනාදෝ, ජාති සම්පන්

දුන මිකාදෝ, සිල සමපන්නයාට දුන මනාදෝ''සි විමාළ කල්හි සිල සමපන්නයාට දීම උත්තම කොටැ වදුරණ සෙයෙක් ද සතර අගති දුරුකොටැ ධර්මයෙන් වදුළ සෙයෙක. මෙසේ මාගේ සැමියන් විසින් අතහැර ජාතියෙහි සාත්මකොටැ තොතසා විමසා රක්ෂාකරණ ලද්දා වූ ධර්මය සරණ යෙමියි **දහම් සරණ** යායුතු.

192. තව ද **බඹනාගාර ජාතකයෙහි තාපස** වැ තොහරණා වූ දඹුදරුවන් හැර මහණ වැ පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා අපරිමිත ධ්‍යාන වැ බ්‍රහ්ම ලොකයෙහි උපදවන්නාහු ද ධර්මබලයෙන් ම උපන්හ.

193. තව ද **කෙළි සිල ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර** වැ ඉපදූ කෙළි සිල වූ රජහු ඥාතිවෘද්ධයන් වයෝ වෘද්ධයන් හා කැටි වැ කෙළි කෙළෑ අනර්ථ කරන්නා දැකැ දිව්‍ය ලොකයෙන් මහළු වෙසක් මවා ගෙණැ අවුත් ඇත් පිටින් තුවර පැදකුණු කරන්නා වූ රජහු ඉස දී සැලියක් බිඳැ ලජ්ජාවට පමුණුවා ඔහුගේ අවිනිතකම් හරවා ආචාරයෙහි පිහිටුවන්නාහු ද ධර්මයෙන් ම පිහිටුවූහ.

194. **වඞ්ඛවතන ජාතකයෙහි තපස්වී** වැ සිටැ තමන්ගේ මෛත්‍රී බලයෙන් විෂ ඝෝර වූ සර්පයන් තමන් බුදු වූ කල්හි දරණ ගබ වැඩැහිදැ ගදකිළි කළ මුවලිඳනම් **නාගරාජයා** සේ භික්ෂූවා තමන්ගේ අතැවැසි තපස්වීන් වහන්සේ ද නිත්‍යයෙන් උපස්ථාන කරණ උපාසකවරුන් සේ ද භික්ෂූවා මෙත් සිත් පිහිටුවන්නාහු ද ධර්මයෙන් ම පිහිටුවූහ.

195. තව ද **චිරඤ්ඤ ජාතකයෙහි දියඤ්ඤ** ව උපන් කල්හි කල්හි පොවා තමන් සේ ක්‍රියා කරන්නා වූ **ඤාඤයාගේ** විනාශ දුක්වීමෙන් බුදු වූ කල්හි තමන් සේ කෘත්‍යය කරන්නට පටන් ගත්තා වූ **දෙවදත්තයාට** වත විනාශයට පූර්වනිමිත්ත දැක්වූහ.

196. තව ද **ගඞ්ගමය්‍හ ජාතකයෙහි වෘක්ෂදෙවතා** වැ ඉපදූ ''මම යහපතිමි! මම යහපතිමි'' සි ක්‍රියා ගළී කොටැ **ඤැස්බෑ** කරා ගියා වූ **ගඞ්ගමය්‍හ** නම් මත්‍ස්‍යයා හා **යාමුණෙය්‍ය** නම් මත්‍ස්‍යයා හා තුන්දෙනාගේ රූප ප්‍රශංසා අසා සිටියාහු දැන් තමන්ගේ රූප ප්‍රශංසා කරන්නවුන් භික්ෂූවන්නට වදුරණ ධර්ම එදවස් ම මෙතෙහි කොටැ සිටියාහ සි සිතමි.

197. තව ද **කුරුඞගමිග ජාතකයෙහි මුව** වැ ඉපදූ තමන් මරන්නට ලා ලූ මලෙහි බැඳී මිත්‍ර වූ **ඤැරොලාගේ**[1] හා **ඤැස්බාගේ** බලයෙන් ම මලින් ගැළවී දිවි ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

1. ඤැරලාගේ.

198. තව ද **අයඝර ජාතකයෙහි තාපස** වැ මළා වූ අඹු වැ දෙණෙහි ලාලා ශොකයෙන් හඬන්නා වූ රජහුගේ ශොක දුරු කොවැ බණ වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

199. තව ද **සුංසුමාර ජාතකයෙහි වඳුරු** වැ කිඹුලාට හසු වැ තමන් ගේ උපාය ශක්තීන් ගැලවෙන්නාහු ද ධර්මයෙන් ම ගැලවුනාහ.

200. තව ද **ඛණ්ඩහාල ජාතකයෙහි වෘක්ෂ දෙවතා** වැ ඉපද ශරීර රක්ෂායෙහි කුසල වූ **ඛණ්ඩහාල** නම් පක්ෂීහු වැද්දට හසු නොවන සේ බලා "මතු තමන් දරුවන් මරණට හසු නොවන බව එසේ ම ඇ"යි ධර්ම යුක්ත වූ චින්තාවක් ම කළහ යි සිතමි.

201. තව ද **ඛණ්ඩහාලක ජාතකයෙහි ගස්කොටන පක්ෂි** වැ ඉපද තමන් වහන්සේ ගස් කොටන ලෙස් බලා "මම ද මෙසේ ගස් කොටමි" තමාගේ ජාතියට නුසුදුසු වූ ක්‍රියා කොවැ තුඛ බිඳ ගත්තා වූ පක්ෂීහු දක්නාහු මතු බුදු වූ කල්හි "තමන් ලෙස ධර්ම දෙසම්හ"යි පවන්ගත්තවුන් දළ දප් බිඳෙන බවට පූර්ව නිමිත්ත දක්වන්නාහු ද ධර්මයෙන්ම දුටහ. මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ජාතියෙහි අනෙක් ලෙසින් සාක්ෂාත් කරණ ලද්දා වූ ධර්මය සරණ යෙමි යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ යා යුතු.**

202. තව ද **සොමදත්ත ජාතකයෙහි** රජ්ජුරුවන්ට උපස්ථාන කරන්නා වූ **සොමදත්ත මාණවක** වැ තමන් ඉගැන් වූ ගාථාව සහවුරුද්දක් මුළුල්ලෙහි ඉගෙණැ ද අන්තයෙහි වැරැද්ද වූ පියා තන්ගේ දෘෂ්ටාන්තයෙන් ම දැන් බුදු වූ කල්හි මහා බ්‍රහ්මයනු ද තමන් දෙසූ ධර්මය එලෙසින් ම දෙසිය නොහෙන බවට දෘෂ්ටාන්ත දක්වූහ.

203. තව ද **උච්චිට්ඨභත්ත ජාතකයෙහි දුගත** වැ ඉපද සොර සැමියා ගේ ඉදුල් බත් මත්තෙහි සිය සවාමියාට බත්ලා[1] කවන්නා වූ ගැණියගේ දුක්මෙන් දැන් බුදු වැ වදාරන්නා වූ ගැහැණුන් ගේ දුෂ්ටකම් හඟවන ධර්මයට දෘෂ්ටාන්ත දුටහ.

204. තව ද **භාරු ජාතකයෙහි තපස්වී** වැ සිවැ ඔවු නොවුන් හා කලහ කරවා නුන්සියක් ගොදුන් රට මුළුල්ලෙහි දෙවතා කොපයෙන් විනාශයට පැමිණියා වූ රජ්ජුරුවන් ගේ දුක් මෙන් දැන් තපස්වීන් ඔවුනොවුන් කලහ කරවන **ඛොසොල් රජ්ජුරුවන්ට** අවවාද දෙන්නාහු ධර්මයට මූල දෘෂ්ටාන්ත දුටහ.

---

1. බත් දී.

205. තව ද **පුණ්ණනදී ජාතකයෙහි පුරොහිත** වූ ගුණ වූ අභිප්‍රාය ඇති රජ්ජුරුවන්ගේ බස්හි අවි දන්නාහු ද ප්‍රඥා සම්පන්න වූ ධර්මයෙන් ම දන්හ.

206. තව ද **කච්ඡප ජාතකයෙහි අමාත්‍ය** වූ "ආකාශයෙහි දණ්ඩ ඇගෙණෑ යෙමින් සිටියා වූ **කැස්බා** බෙණෙමි"යි කියා **දණ්ඩ** කටින් හැරී ගොස් බිම හි මළ පරිදි දක්වා බොහෝ කොටැ දෙඩන්නා වූ රජ්ජුරුවන්ට අවවාද දී ඔවුන් ගේ වංචාලකම් හරවන්නාහු ද ධර්මයෙන් ම හැරවූහ.

207. තව ද **මහාසුත සෝමජාතකයෙහි පුරොහිත** වූ මැසින්න පස්සේ යා දී දුලට හසු වූ ගොඩ ඇදූ හොවා ලූ කල්හි "මේ ගින්නෙහි දුම්ට වඩා, මේ උල්හි ඇවිනීමට වඩා, මාගේ මැසින්න මා අනික් තැනකට ගියහ"යි කියා සිතන සිතෙක් ඇත්නම් ඒ ම මා ළය තවන්නේයැ"යි හඬනා වූ හඬ අසා කාමයෙහි ආදීනව දූකැ ඔහු ගලවා දිවි දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

208. තව ද **සෙඟ්ගු ජාතකයෙහි වෘක්ෂ දෙවතා** වූ ඉපදූ දුවගේ සිලාචාර විමසන්නා වූ බ්‍රාහ්මණයා දක්නෝ දැන් ඔහු තමා දුව විමසූ කල්හි "පෙරත් තෝ මෙසේ ම විමසී"යි කියා ධර්මය වදාරන්නට මූල කථා කළහ.

209. තව ද **කූට වාණිජ ජාතකයෙහි වෙළඳ** වූ තමන් ගේ "යපලු මියන් කැ වනැ"යි නුදුන්නා වූ **කූට වාණිජයා** ගේ පුතු **උතුස්සා** ගෙණැ ගියහ" යි කියා උපාය ශක්තීන් ම ඔහු ගේ වසඳවා හැරැ තමන් සතු වසතුව තුමූ ගන්නාහු ද ධර්මයෙන් ම ගත්හ.

210. තව ද **ධර්මධවජ ජාතකයෙහි අමාත්‍ය** වූ රජ්ජුරුවන් ලවා තමන් මරන්නට සිතුවා වූ කුහකයා ගේ බසින් නොකට හැකි දෙයක් කරන්නට සොඳලා "මොහු මරවාපුව මැනැවැ"යි සිතූ රජ්ජුරුවන් 'එක් දවසකින් ම මැරවුව මැනැව, පොකුණු වූව මැනැවැ"යි යනාදීන් කී කල්හි තමන් ගේ ධර්මයෙහි ප්‍රසන්න වූ **ශක්‍රයා** අවුත් මැවූ උසන් ආදී පැ රජ්ජුරුවන් ඇතුළු වූ සියලු ලොව සතුටු කොටැ ශත්‍රු විනය පුළිඟහම වූ මහා සම්පත්තී ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ. මෙසේ අනන්ත ජාතියෙහි මාගේ සවාමීන්ට ම කුලධර්ම වැ සිටියා වූ ධර්මය සරණ යෙමි යි **සත්පුරුෂයන් විසින් දහම් සරණ යා යුතු.**

211. තව ද **ගරහිත ජාතකයෙහි වානර** වූ සිටැ පොවා මම ය මාගේ යැ යි කියන්නා වූ මනුෂ්‍යයන්ට තුමූ ගහීා කොටැ එසේ ම ගහීා කරන්නා වූ වදුරු පිරිස් ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

212. තව ද **කාසාව ජාතකයෙහි** හයනිරාජ වැ ඉපද පසේ බුදුන් ගේ වෙස් ගෙණැ කාෂාව වස්ත්‍රය පෙර වැ සිවැ ඇතුන් මරන්නා වූ පුරුෂයාගේ වෘද්ධාව දැනැ ඔහු තමන් ගේ පිරිස් රක්‍ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්‍ෂා කළහ.

213. තව ද **චූලනන්දි ජාතකයෙහි** වානර වැ ජරා ජීර්ණ වූ මැණියන් විදිනට දුන්න හයා ගත්තා වූ කරුණා නැති පුරුෂයාගේ ශරයට තුමූ හස්ත වැ වැදූ මැණියන්ට දිවි දෙන්නාහු ද ධර්මයට ම දිවි පිදූහ.

214. තව ද **පුටභත්ත ජාතකයෙහි** අමාත්‍ය වැ බිසවුන් කෙරෙහි නිෂ්කරුණා වූ රජ්ජුරුවන්ට අවවාද කියා අනාථ සමයෙහි දුග්ගත් බිසවුන්ට ශ්‍රී දෙන්නාහු ද ධර්මයෙන් ම දෙවූහ.

215. තව ද **කුම්භීල ජාතකයෙහි** වානර වැ සිවැ තමන් මරන්නට ප්‍රයෝග කළා වූ කිඹුලා අතින් ගැළවෙන්නාහු ද ධර්ම යෙන් ම ගැළවුනාහ.

216. තව ද **ඛන්තිවණ්ණන ජාතකයෙහි** තමන්ගේ ප්‍රිය භාර්‍යාවන් කෙරෙහි අපරාධකළා වූ අමාත්‍යයා කෙරෙහි ක්‍ෂමා කරන්නාහු ද ධර්මයෙන් ම ක්‍ෂමා කළහ.

217. තව ද **සොණිය ජාතකයෙහි** අමාත්‍ය වැ නොනික්මුනු මතාකල නික්මුනු බකමූණා කවුඩුවන් අතැ නට පරිදි පැ "මහරජ තමාට නුසුදුසු කල්හි නික්මුනාහු මෙසේ විනාශයට පැමිණෙති" යි අකාල ගමනයෙන් ඒ රජ්ජුරුවන් වළකා ඒ රජ්ජුරුවන්ට ද සෙනාවට ද දිවි දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

218. තව ද **ඝටීපාන ජාතකයෙහි** "හස්තියකු හා යුද්ධ කරම්" යි පවන් ගත් රා බී මත් අසුවි පණුවා ඇත්හු අතැ නට පරිදි දූකැ "තමාගේ බල නොදනැ වැඩිසිටියන් හා ස්පර්ධා කරන්නාහු මෙසේ විනාශයට පැමිණෙති" යි වෘක්‍ෂ දෙවතා වැ සිවැ බණ වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

219. තව ද **කාමනීත ජාතකයෙහි** ශක්‍රදෙවෙන්ද්‍ර වැ සිවැ කාමයෙහි ලොභ ඇත්තා වූ රජහු කෙරෙහි කළ කරුණායෙන් දිව්‍ය සම්පත්හි හැරැ මනුෂ්‍ය ලොකයට අවුත් තමන් වහන්සේගේ ධර්ම දෙශනාවෙන් ඔහුගේ ලොභය හරවා ශීලයෙහි පිහිටුවන සෙයක් ද ධර්මයෙන් ම පිහිටූ වූ සෙයක.

220. තව ද **පලාසි ජාතකයෙහි ද - දුනියපලාසි ජාතක යෙහි ද බරණැස්රජ වැ** මහසෙනඟ ගෙණැ ආවා වූ සතුරු රජහු තමන් වහන්සේගේ දෙරටු පට හා තමන් වහන්සේගේ

කාඤ්චන පර්වතයක් වැනි වූ තලල හා දුටු සතුරු රජහු එතැන්හි ම සිටැ බිඳී වල්වදනා පරිද්දෙන් මහානුභාව ඇතිවත සෙයෙක් ද ධර්මයෙන් ම ඇති වූ සෙයෙක. මේසේ මාගේ සවාමිදරු වූ ධර්මාධිරාජ වූ ත්‍රිභුවනෙශ්වර වූ ශාක්‍යසිංහ වූ සුරාසුර ප්‍රජාපති මකුටමණි ලලිත චරණ කමල ඇති සවාමිදරුවන් අතෙක ජාතියෙහි පරිහරණය කළා වූ ධම් රතනය සරණ යෙම් සි සත් පුරුෂයන් විසින් දහම් සරණ යා යුතු.

221. තව ද **උපාහන ජාතකයෙහි** හඤ්ඤාවායී වැ තමන් වහන්සේ හා ස්පර්ධා කරන්නට ආවා වූ අතැවැස්සා හා විවාද යෙහි ලෝවැස්සන් කරණ හසුනි ශික්ෂාව හැරැ යන්නට කළ සංඥයෙහි සිටිනා පරිද්දෙන් සිටිනට කළ සංඥවෙහි යන පරිද්දෙන් යනාදීන් ආශවයී හසුනි ශික්ෂාව දක්වා අතැවැස්සා ලුහුබඳවා ජයගන්නාහු ද දැන් බුදු වැ නිර්වකයන් කරණ ලොක ශික්ෂාවට ප්‍රතිපක්ෂ කොටැ ලොක ශික්ෂා කොටැ අමෘත මහා නිර්වාණය දක්වා ධර්මයෙන් ම ජයගන්නා බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

222. තව ද **විණාථුණ ජාතකයෙහි** උත්තම ගොණුන්ගේ මොල්ලි ඇත්තා දැකැ කුදු පිටත් ගැට දැකැ, "මේ ත් උත්තම පුරුෂයෙකැ" සි කියා කුදු පස්සෙහි ගියා වූ සිටුදුව දැකැ ඇගේ අඟුනය තත් වූ පරිද්දෙන් නිශ්චය කරන්නාහු දැන් අසුභ වූ ආලම්බණයෙහි ශුභසංඥයෙන් අනුපවත්තා වූ තෘෂ්ණායෙහි සවරූප දැන් මට පූර්ව නිමිත්ත දැක්වූහ.

223. තව ද **විඛණ්ඩණඛ ජාතකයෙහි රජ වැ** "මත්‍සයන් පස්සෙහි එම්" සි ශර ප්‍රහාර කා මළා වූ කිඹුල්හු දැකැ පඤ්චකාම යෙහි අනු වැ ගොස් නස්නා වූ සත්ත්වයාට වන විනාශය නිශ්චය කරන්නාහු ද ධර්මයෙන් ම නිශ්චය කළහ.

224. තව ද **අසිතාභූ ජාතකයෙහි තපස්වී වැ** තමන්ගේ සවාමී වූ රාජකුමාරයා **ලිය කිනනරාව** පස්සෙහි ගියැ පරිදි දැකැ කළකිරී තමන් වහන්සේ කරා අවුත් වන් කල්හි ඇට එතැන්හි ම පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා ගන්නා සෙයින් උපදෙස් දෙන සෙයෙක් ද ධර්මයෙන් ම දුන් සෙයෙක.

225. තව ද **වඩ්ඪමාන ජාතකයෙහි පරිබ්‍රාජක වැ** තමන් පඤ්චකාම ගුණයෙන් පැවරූ මහසිටුහට එහි ආදීනව දක්වා ගුණධර්මයෙන් පිරිනොහෙන්නාහු ද ධර්මයෙන් ම නොපිරිහුන්හ.

226. තව ද **සාකෙත ජාතකයෙහි** බ්‍රාහ්මණපුත්‍ර වූ ජාත්‍යන්තරයෙහි තමන්ට මවුපිය වූ බමුණා හා බැමිණිය කියන පුත්‍රවාදය ඉවසා "සෙනහ නම් දෙය ජාත්‍යන්තර වාසනාවෙන් වෙයි" යි දක්වන්නාහු ද ධර්මයෙන් ම දැක්වූහ.

227. තව ද **එකපද ජාතකයෙහි** මහසිටු වූ තමන් ඇකයෙහි හුන්නා වූ තරුණ කුමාරයා සිඟලු අර්ථ සාදන පරිද්දෙන් ඔහු කී ප්‍රශ්න විසඳ ඔහුගේ අර්ථසිද්ධියට කාරණා වන්නාහු ද ධර්මයෙන් ම කාරණා වූහ.

228. තව ද **භද්‍රිතමාතු ජාතකයෙහි නිලමණ්ඩුක** වූ තමා බලවත් ද මත්ස්‍යයන් කා දුර්බල වූ ද මත්ස්‍යයන් අතැ නවුවා වූ **උදක සර්පයා** දැකැ" සියලු සත්ත්වයෝ තමන් බලවත් ද අනුන්ට හිංසා කෙරෙති අනුන් බලවත් ද ඔහු අතැ විනාශයට පැමිණෙති" යි **නිලමණ්ඩුක** වූ කෙමෙන මත්තෙහි භිදැ කියන බණ වදාළසන යෙහි හුන් බුද්ධ විලාසයෙන් වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

229. තව ද **මහා පිඬඟල ජාතකයෙහි 'මහා පිඬඟල'** නම් රජ හට පුත් වැ අධර්මිෂ්ඨ වූ ඒ පියරජහු මළ කල්හි තුමූ රාජ්‍යය ලදින් සියලු රට වැස්සන් ඒ රජහු මළ බවට සතුටු වැ සැලෙන කල්හි —

ඔඩ ඔඩා සිටියා වූ **දෙරටු ගොව්වා** කැඳවා "මේ සියලු රට වැස්සන් ඒ රජහු මළ බවට සතුටුව තෝ හුදකලා තැනැත්තෙහි, කුමට හඬහිදැ"යි විචාරා "මහරජ! මම ඔහට සිතා හඬන්නෙම් නොවෙමි; ඒ රජ්ජුරුවෝ තමන් ඇති කල ගෙන් පිටතට යන කලත්, ඇතුළට වදනා කලත් මා හිසැ ටොකු අනාගෙණ ම යෙති. ඒ ටොකු ඉතා රළුව ය; මා හිසැ ඒ අන්තා ලෙස ම පරලෝ ගොසින් යමයා හිසත් යමපලුන් හිසත් ටොකු ඔත්තු නම් ඌ ඒ වේදනාව ඉවසාගත නොහි ඒ රජහු පෙරළා මෙහි එවාපු නම් නැවත මට ටොක්කෙන් ගැළවීමෙක් නැතැ යි හඬමි"යි කී කල්හි රජ්ජුරුවන් ගේ වණ්ඩත්වයෙහි ආදීනව සලකා තුමූ **දශරාජ ධර්ම** යෙහි පිහිටා ලොකය රක්‍ෂා කරන්නාහු ද ඒ ආකාරයෙන් ම රක්‍ෂා කළහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි තමන්ට ආවෙණික ධන කොටැ රක්‍ෂා කළා වූ සද්ධර්මය ම මා සියලු දුකඛ-යෙන් ගළවා සියලු සුවයෙහි යොදා රක්‍ෂා කරන්නේය යි සත්පුරුෂ යන් විසින් **දහම් සරණ යා යුතු.**

230. තව ද **සබ්බ දුඨ ජාතකයෙහි** පෘථිවි ජයමන්ත්‍රය ඉගෙණ සියලු තිරිසනුන් පිරිවරා ගෙණ ඇත්හු පිටැ සිංහයන්හු සිටුවා, සිංහයා පිටැ හිඳ ගෙණ සියලු පොළොව දහ ගෙණ තමන් ගේ රාජ්‍යයට ආවා වූ කැණහිල්හු තමන් ගේ උපාය ශක්තීන් දූනැ පරදවා ජයගන්නාහු ද දූන් බුදු වැ මුළුලොව දිනූ සංසාර ඛ්‍යසන ලුහුබදවා තමන් ගන්නා ජයට පූජා නිමිත්ත දක්වූහ.

231. තව ද **සුනඛ ජාතකයෙහි පණ්ඩිත පුරුෂ වැ** උපාය ඥානයි නැති බැවින් බහණ කා පියා පලා නො ගොස් බන්ධනයෙහි හෙවැ දුක් ගන්නා බල්ලා දූකැ ඕහට අවවාද කියා ඒ බන්ධනය ඔහු ලවා කවා බන්ධන මුක්ත කරවන්නාහු ද සියලු සත්ත්ව ලොකයා හට කරන්නා වූ බන්ධන මුකතියට පූජානිමිත්ත දක්වන්නාහු මෙන් මේ ධර්මය ම පෙරදැරි කළහ.

232. තව ද **ගුත්තිල ජාතකයෙහි මනුෂ්‍යව සිටැ ශක්‍ර දෙවෙන්ද්‍රයා** මිනිස් ලොවට අවුත් තමන් ගේ වීණා අසා නැවත **වෛජයන්ත රථය** එවා දෙව්ලොවට ගෙන්වා දිව්‍ය සත්‍රීන් මධ්‍යයෙහි වීණා ගයවා **පඤ්චසිඛයා** වැනි වීණා ගයන්නවුන් ඇති තැන්හිදූ තමන් ගේ වීණාවට සතුටු වැ "තොප කැමැති වසතුවක් ගන්ව"යි කී කල්හි දිව්‍ය සම්පත්තියෙහි අපෙක්ෂා නො කොටැ ඒ දිව්‍ය සත්‍රීන් කැඳවා "මට අනික් මිළයකින් ප්‍රයෝජන නැත; තොප මේ දෙව්ලොව උපදින්නට කාරණා වූ ගිය ජාතියෙහි කළ කුසල් කියව"යි කියා ඔවුන් විසින් වෙන වෙන ම "මම සිල්වත් වහන්සේ කෙණෙකුන්දූට පුදන්නට මල් දින්මි" "මම දුගඹ් අතුල් ගසන්නට සුවඳ දින්මි" යනාදී තමන් කළ කුසල් කී කල්හි මනුෂ්‍ය ලොයට අවුත් මිනිස් ලොවැ ගැහැණුන්ට "මෙවැනි මද කුසල් කළ ගැහැණුහු මෙසේ ශක්‍රයාට අඹු වූ හ"යි කියා කුසල්හි උතසාහ වඩා වඩා සියලු සත්‍රීන් මරණින් මත්තෙහි ද දෙව්ලොව උපදනා පරිද්දෙන් කුසල්හි සමාදන් කරවන්නාහු ද ධර්මයෙන් ම කරවූහ.

233. තව ද **චිතිචඡා ජාතකයෙහි තාපස වැ** සියලු ජම්බුද්වීපය දූනැ ආවා වූ පරිබ්‍රාජකයින් වචන මාත්‍රයෙකින් පරද වන්නාහු ද ධර්මයෙන් ම පැරදවූහ.

234. තව ද **මූලපරියාය ජාතකයෙහි ආචාර්‍ය වැ** අසදෘශ වූ මානයෙන් "නිග්‍රන්ථයෙහි තමන් හා සමයන් නැතැ"යි සිතා ආවා වූ පන්සියයක් මානවකයන් එක වචන මාත්‍රයකින් පරදවා තමන් ගේ ශ්‍රී පාදය වන්දවන **පරිද්දෙන්** විහතමානීන් කරවන්නාහු ද ධර්මයෙන් ම කළහ.

235. තව ද **තෙලෝවාද ජාතකයෙහි තපස්වි** වූ මත්‍ස්‍ය මාංස දන්දුන් උපාසකයා ප්‍රාණීන් මරා මත්‍ස්‍ය මාංස වැළඳුයේ නපුරු වේ දැ''යි කී කල්හි "දන් දෙන තැනැත්තේ තමා අඹු දරු වන් මරා දුන් තමුදු ශුද්ධ චිත්තයෙන් වළඳන තැනැත්තහුට දෙස් නැතැයි" අවවාද වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

236. තව ද **පාදඤ්ජලි ජාතකයෙහි අමාත්‍ය** වූ සිවැ කළ කළ දෙයට තොල් බිඳ ලන්නා වූ **පාදඤ්ජලිය** තම් රාජ කුමාරයා ගේ අඥතත්වය ප්‍රකාශ කොට තුමූ රාජ්‍යය ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

237. තව ද **කිංසුකොපම ජාතකයෙහි රජ** වූ තමන් කරා විවාදකොටැගෙණ ආ දරුවන් සතර දෙනාට **කණුකලය - පන්කලය - මල්ගත් කලය - ඵලගත් කලයැ - යි** සතර අවස්ථායෙහි කැලගස් සාරපිහු පැ කල්හි විවාද කොටැගෙණ ආ රජදරුවන් සතර දෙනා ම තමන් දුටු අවස්ථායෙහි ගස් සවහන් කී කල්හි "තෙපි හැමදෙන ම කැලගස දුටුව; විභාග කොටැ විවාරා නොගත් හෙයින් සංශය වී" යැයි වදාරන්නාහු ද දැන් තමන් බුදු වැ **සතර ආර්‍ය සත්‍යයෙහි** සවරූප වෙන වෙන විවාරන්නවුන්ට එකහෙළා සිතට නඟාලන පරිද්දෙන් බණ වදාරණ ආවර්ජනීකමට පූර්ව නිමිත්ත දැක්වූහ.

238. තව ද **සාලක ජාතකයෙහි ධාන්‍ය වාණිජ** වූ එක දෙමයක් දැකැලා ම සවාමීහු අතින් පලාගිය වදුරා නැවත ඔහු කරා නොඇ පරිදි දක්වන්නාහු ද දැන් තමන් සිතින් එකවරෙක්හි ගිය කෙලඟයන් නැවත තමන් සිතට නොඑන බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

239. තව ද **කපි ජාතකයෙහි තාපස** වූ සෘෂි වෙෂයෙන් ආ වානරයා ' තපස්වී කෙණෙකැ" යි හඳහා ගන්නා වූ පුතනුවන්ට ඔහු වදුරුබව හඟවන්නාහු ද තමන් බුදු වැ 'කාමසුඛා"නුයොගය ධර්මයැ යි සරණ ගත්තා වූ[1] ලොවට ඒ අධර්මයැ" යි හඟවන බවට පූර්ව නිමිත්ත දැක්වූහ. මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභ්‍යාස කළා වූ තමන්ගේ ලෞක්‍ය සේ රක්ෂා කරණ ලද්දා වූ ධර්මයම සරණ යෙමි යි දහම් **සරණ** ගියසුතු.

---

1. ගත්තාහු.

240. තව ද **සඞ්ඛපාල ජාතකයෙහි තපස්වී වූ** සිවැ රජ්ජුරුවන්ගේ බිසවුන් කෙරෙහි ලොභයෙන් කාමා'තුර වැ හඬා නැවත ඒ ශොකය නැති කොටැ ධ්‍යාන උපදවා ආකාශයෙන් යන්නාහු තමන් සේ වූ සත්පුරුෂයන් සිතැ ධර්මයක් මුත් අධර්මයක් බොහෝ කලක් නො පිහිටුවන බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

241. තව ද **නිලමුටසි ජාතකයෙහි දිසාපාමොක් ආචාර්‍ය වූ** තල මිටක් සොරා ගත් රාජකුමාරයාට හුණ පත්තෙන් ගෙඩි දී භික්මවා ඔහු ක්‍රමයෙන් රාජ්‍යය ලදින් ඒ වෛරය සිතැ තබා තමන් ගෙන්වා මරන්නට ප්‍රයොග කළ කල්හි අවවාද කියා ගැළවෙන්නාහු ද ධර්මයෙන් ම ගැළවුනාහ.

242. තව ද **මණිකණ්ඨ ජාතකයෙහි තපස්වී වූ** නාග රාජයාගේ සමාගමයෙන් දුකඛිත වූ තමන්ගේ මලනුවන්ට "ඔහු තෙප කරා නොඑන පරිද්දෙන් කණ්ඨ මාණික්‍යය ඉල්වව" යි කියා ඔවුන් ඒ ඉල් වූ කල්හි නාගරාජයා කණ්ඨ මාණික්‍යය දෙන්නට මැලි වැ ඔහු කරා නොඅවුත් හැරපී කල්හි විෂ ඝෝර සර්පයා කෙරෙන් මලනුවන්ට වන භය දුරුකරන්නාහු ද දැන් තමන් බුදු වැ සියලු සත්ත්ව ලොකයාට සසර භය දුරු කරවන්නට පූර්ව නිමිත්ත දක්වන්නාහු ධර්මයෙන් ම දැක්වූහ.

243. තව ද **කුණඩකුච්ඡ සිඛිව ජාතකයෙහි අස්වෙළඳ වූ** මැහැල්ලන්ගේ ගෙන් කුඩු කා වැඩී අශ්වරාජයාට තමන් කෙරෙහිදී සෙඛ්වයන්ට සුදුසු අශ්ව භොජනය දෙන්නාහු දැන් බුදු වැ නිර්භයන් කෙරෙහි අධර්ම අනුභවකළ ලොවට තමන් කෙරෙහි දී සද්ධර්මා'මෘත දෙනබවට පූර්ව නිමිත්ත දැක්වූහ.

244. තව ද **සුකජාතකයෙහි ගිරාරාජ වූ** භොජනයෙහි ප්‍රමාණ නොදැනැ අඹ රස අති පානයෙන් අක්ෂම වැ මුහුදු බත් වූ ගිරවි දක්නාහු දැන් තමන් බුදු වැ භික්ෂූන් වහන්සේට "මහණෙනි, භොජනයෙහි පමණ දනුව, පමණ නොදැනැ අඹරස බී පී ගිරවි මුහුදු බත් වූ පරිද්දෙන් අප්‍රමාණ භොජනයෙන් විනාශයට නොපැමිණේවි" යි වදාරන්නාහු අවවාදයට දෘෂ්ටාන්ත දුවහ.

245 තව ද **ජරුදපාන ජාතකයෙහි පණ්ඩිත වෙළඳ වූ** ලොභයෙන් ලිංවලට වඩාලා කණතා වෙළඳුන්ට ලොභයෙහි ආදීනව දන්වන්නාහු ද නොකණුව යි අවවාද දී ඔවුන්ට එයි නොවැළකා කැණැ යව නොන්නා වූ **නාගරාජයා** අතින් විනාශය පැමිණි කල්හි එම නාගරාජයා අවුත් තමන්ගේ ගුණයෙහි පැහැදූ පන්සියයක් ගැල්හි සත්රුවන් පුරා පූජා කළ කල්හි එබඳු වූ පූජා ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

246. තව ද **ගාමණී** වණ්ඩ ජාතකයෙහි **'ආදූසමුඛ කුමාර'** වූ පියාගෙන් මළකල්හි සත්හැවිරිදි වූ සිටු ශක්‍ර බ්‍රහ්මාදීන් විසිනුත් නො විසඳිය යුතු වූ අර්ථය සමීඳු විලාසයෙන් ප්‍රකාශ කොට දක්වන්නාහු ද දැන් තමන් බුදු වැ තමන් ම දෙසා නත කොට සත්ත්වයාගේ කාමයෙහි තෘප්තියක් නැතිබව දක්වා ධර්මදේශනා කරන්නට කථා'නන්තර දැක්වූහ.

247. තව ද **නිරිටවස්ස ජාතකයෙහි තපස්වී** වූ සිටු යුද්ධයෙහි පැරැදුණු වල්වැදූ පිපාසයෙන් තමන්ගේ ලිඳට වැටී හුන් රජ්ජුරුවන් ගොඩට නඟා ජීවිත දන දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

248. තවද **දූත ජාතකයෙහි රජ** වූ සිටු ලක්ෂයක් වියදම් කොට මෙහෙ නිමවමින් එහි ලොභ කළා වූ පුරුෂයක්හු "දූත යෙකිමි" කියා ඵුවැ ගෙණැ ගොස් තමන් වහන්සේ මෙහෙ නිමවන තලියෙන් බත් ඉඳුල් කොට හැරගත් කල්හි, මෙහෙ නිමවන තැනැ රැකවල සිටි අමාත්‍යයා ඔහු හිස කපන්නට වන් කල්හි, එසේ නොකරව"සි වළකා "තෝ කාගේ දූතයෙක්ද"සි විචාරා "මම තෘෂ්ණාව ගේ දූතයෙකිමි"සි කී කල්හි "මමත් ඒ තෘෂ්ණා වගේ දූතයෙමි, තා ත් තෘෂ්ණා දූත වූ වැ, මාත් තෘෂ්ණා දූත වූ වැ, දූතයන්ට උපකාර කළ මතා වේද"සි රතු ගෙරි දහසක් ප්‍රධාන කොට ඇති බොහෝ සමපත් දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද ධර්මය සරණ යෙමි යි **සත්පුරුෂයන් විසින් දහම් සරණ යා යුතු.**

249. තව ද **පදුම ජාතකයෙහි සිවුකුමාර** වූ නාසා හිත පියුම් **ගොව්වාගෙන්** බොරු ගුණ කී ශ්‍රේෂ්ඨ පුත්‍රයන් පියුම් නො ලද කල්හි තුමූ ඔහු ගේ සවභාවයන් කියා "මේ ජාතියෙහි නාසාව නට. ඒ ඇතිවෙන්නේ නොවෙයි. මා විසින් ඇත්තක් කී බැවින් සත්‍යයෙහි ප්‍රියයක් ඇත්තෙහි වී නම් මල් දෙව"සි කියා ඔහු විසින් "ඇති ගුණ කියේ යහපත් වේ ද"සි සතුටු වැ ඔහු දුන් මල් ලබන්නාහු ද දැන් තමන් සත්‍යයෙන් මරහු ලුහුබඳවා වජ්‍රා'සනය ලබන බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

250. තව ද **මුදුපාණී ජාතකයෙහි මහරජ** වූ තමන් ගේ දියනියන් රකිමි යි අත අල්වා ගෙණැ සිටු ඔවුන් පෙරළා බාල කොල්ලකු අත පියාගෙන් අතැ තබා සැමියා හා කැටුවැ ගිය කල්හි "ගැහැණු නම් මෙසේ රක්ෂා කොට ගත නොහැකි ජාතියෙක් වනැ"සි ගැණුන් ගේ අයුතු දන්නාහු ද ධර්මයෙන් ම දන්හ.

251. තව ද **වුල්ල පලෝභන ජාතකයෙහි 'අනිජ්ජි ගඞ්ඛ කුමාර'** කල්හි බ්‍රහ්ම ලොකයෙන් චුත වැ ආ හෙයින් ගැහැණුන් දුර බිණු කටහඬට පවා වෙවුලා සැලී සපගීයෙන් දුරු වැ ගඞ්ගී සත්‍රිය ගේ හී අසා ඇ කෙරෙහි බැඳි කාමරසානුභවයෙන් මූර්ඡිත වැ "ගැහැණුන් මම් අනුන්ට නො දෙමි" යි කඩුව හයා ගෙණ වීථියට බැසැ පුරුෂයන් ලුහුබඳවමින් වීථියෙහි නික්මුනි. එබස් ඇසූ රජ්ජුරුවන් ගැහැණිය හා එක්කොටැ රාජ්‍යයෙන් තෙරපි කල්හි ඇ අත අල්වා ගෙණ වල් වැද ආශ්‍රමයෙක්හි වෙසෙමින් එතැන්හි වසන ආකාශචාරී වූ තාපසයන්හු තමන් වහන්සේ ඵලා'ඵල පිණිස වලට ගිය කල්හි ආකාශයෙන් යෙමින් සිටැ ඇ කෙරෙහි පෙළඹි ධ්‍යානයෙන් පිරිහි ආශ්‍රමයෙහි හිඳැ තමන් වහන්සේ එන්තා දැකැ දිවන්තට වත් කල්හි —

ඔහු දුටු තමන් වහන්සේ ත් කඩුව හයා ගෙණ ලුහු බඳවා ඔහු මුහුදු කොලට පැමිණැ පෙර ඇති සෘර්ධිය පිරිහුනු බව නො දැනැ "ආකාශයට නැඟී සෘර්ධින් යෙමි"යි උඩට පිනූ පිම්මෙන් ම මුහුදු දියෙහි හුනුවා දැකැ "මේ ආකාශචාරී වූ තාපසයෙක් වත. පඤ්චකාමය නිසා නටුයේ යැ"යි සිතා කාමයෙහි ආදීනව දැකැ ඒ ගැහැණිය ගෙණැ අවුත් මනුෂ්‍ය පථයෙහි සිටුවා පියා එම ආශ්‍රමයෙහි තාපස ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි වැ **පඤ්චා'භිඤ්ඤ අෂ්ට සමා පතනි** ලදින් ආයු කෙළවරැ බ්‍රහ්ම ලොකයෙහි උපන් සෙයෙක් ද ධර්මයෙන් ම උපන් සෙයෙක.

252. තව ද **මහා පනාද ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර** වැ ඉපැදූ මනුෂ්‍ය වූ **මහාපනාද** නම් වූ රජ්ජුරුවන්ට කාශවෙය්‍යාවව **කරණ** සෙයෙක් ද, දැන් තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ වැ ලෝ වැසියා ගන්තා දුකට පූජී නිමිත්ත දැක් වූ සෙයෙක.

253. තව ද **බුරප්ප ජාතකයෙහි ඛනුඞ්ඩර** වැ දහසක් දුන් වෙළඳහුට ජීවිත පරිත්‍යාග කොටැ ඔහු ඒ කාන්තාරයෙන් එතර කරවන සෙයෙක් ද, දැන් තමන් වහන්සේට අහර බත් දුන්න වුන්ට ධර්ම පරිත්‍යාග කොටැ සසර කතරින් ඔවුන් එතර **කරණ** බවට පූජී නිමිත්ත දැක් වූ සෙයෙක.

254 තව ද **වාතග්‍ග සිඤ්ඣ ජාතකයෙහි අශ්ව රාජ** වැ "**කොටලිය** හා සමාගමය කෙරෙමි"යි එළඹැ ලොමුදහැ වැ සිටැ ගෙණැ සිටි කල ගසා ලූ එක පා පහරින් ඇ කෙරෙහි අභිලාෂ නැති වැ වඩනා සෙයෙක් ද තමන් වහන්සේ ගැහැණුන් ගේ පිළිකුල් දුටු මට **කාමිලවසතු පුරය** ගැරැපියා යන බවට පූජී නිමිත්ත දැක්වූහ.

255. තව ද **කකිමඝ ජාතකයෙහි** ඇත් වැ **කකුළුවා** තළුවී හසු වූ වේලෙහි පටන් ගෙණ කකුළුවා මැඩැපියන තුරා අත නොහැරැ සිටිතා ඇතින්න ලබන්නාහු ද, සසරට හසු වූ වේලෙහි පවන් ගෙණ සසර මඩැ පියනතුරු අත් නොහරින ප්‍රඥව ලබන ලෙසින් ලදහ.

256. තවද **ආරාම දූස ජාතකයෙහි පණ්ඩිත පුරුෂ** වැ ආරාම දූෂක වානරයන් ගේ සවරූප දන්නාහු ද දැන් ලොක දූෂණය කරන්නා වූ කෙලෙසුන් ගේ සවරූප දන්නා පරිද්දෙන් ම දත්හ.

257. තවද **සුජාත ජාතකයෙහි රජ** වැ එරුෂ වචන බණන්නා වූ මැණියන්ට අවවාද දී බණ වදරන්නාහු ද දැන් බුදු වැ **මහාමායා** දේවීන් වහන්සේට වදරණ බණට අභ්‍යාස කළහ.

258. තව ද **උලූක ජාතකයෙහි හංසපොතක** වැ "බකමූණා ගන්මි" සි සිතූ පක්‍ෂි රාජයා තුමූ ලබන්නාහු ද දැන් මරහු පැතූ වප්‍රා'සනයා තුමූ ගෙණැ ලබන්නා වූ ධර්මරාජයාට පූජී නිමිත්ත දැක්වූහ.

259. මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අත් නොහැරැ පිරිමසා විමසා ලයක් සේ ඇසක් සේ රක්‍ෂාකළා වූ සද්ධර්මය මා රක්‍ෂා කරන්නට පොහොසතැ සි **දහම් සරණ යාසුතු.**

260. තව ද **උදපානදූසක ජාතකයෙහි ගණශාසනා** වැ උදපාන දූෂණය කළා වූ වඳුරාගේ සවරූප දන්නාහු ද චිත්ත දූෂණ කෙලෙසයන්ගේ සවරූප දැන් මට පූජී නිමිත්ත දැක්වූහ.

261. තව ද **ව්‍යාඝ්‍රජාතකයෙහි වෘක්‍ෂ දෙවතා** වැ ඉපැදී වණඹ වූ **සිංහ ව්‍යාඝ්‍රයන්** නිසා තමන්ගේ විමානයට ආශ්‍රය වූ වනය රැකෙන බව දන්නාහු බොධිසත්ව භූමියෙහි කෙලෙසයන් නිසා බොධි සම්භාර ධර්මයට ආශ්‍රය වූ තමන්ගේ චිත්ත සන්තානය පවත්නා බවට නිදර්ශන දුටහ.

262. තව ද **කච්ඡප ජාතකයෙහි තාපස** වැ ඉපැදී තමන්ගේ කණී විවර, මුඛ විවරාදියෙහි විප්‍රකාර කරන්නා වූ **වානරයා** කෙරෙහි ක්‍ෂමා කරන්නාහු ද බොධිසත්ත්ව භූමියෙහි ම කුළු ගත්හ.

263. තව ද **ලොල ජාතකයෙහි** හා **රූචිර ජාතකයෙහි** ද **පෙරෙව් වූ** තමන්ගේ අවවාද නොගත් කාංඛයන් රජ්ජුරුවන්ගේ මුළුතැන් ගෙට වැදූ විනාශයට පැමිණි සේ දැකැ ලොලත්වයෙහි ආදීනව දක්වන්නාහු ද ධර්මයෙන් ම දුටහ.

264. තව ද **කුරූ ධර්ම ජාතකයෙහි රජ වූ** උත්සවයෙහි විදි තිය දියෙහි හුන්නුවා නො දැකැ "ප්‍රාණයක් නසම්හ" යන සිතක් කැත ද, "එහි ප්‍රාණියෙක් නටදේ හෝ" යි යන සිතින් තමන් රක්නා පඤ්චසීලයට කලඬකයෙක් වීයැ යි සිතන්නාහු ධර්මයෙන් ම කුළු ගත්හ.

265. තව ද **රොමක ජාතකයෙහි පරෙව් වූ** තමන් මරන්නට සිතූ **කුට තාපසයා** කෙරෙන් ගැළවෙන්නාහු ද දැන් තමන් සසරින් ගැළවෙන්නට පූර්ව නිමිත්ත දුක්වූහ.

266. තව ද **මහිස ජාතකයෙහි 'සිලව මහිසරාජ' වූ** නාගබල ඇති වැ තමන්ගේ ශරීරයෙහි මල මූත්‍ර කරන්නා වූ **වානරයා** කෙරෙහි, ශරීරයෙහි මල මූත්‍ර කරණ ප්‍රිය පුත්‍රයන්හුට මෙන් **ක්ෂමා** කොටැ ක්ෂාන්ති පාරමිතායෙහි කුළුගන්නාහු ද සත් පුරුෂ ධර්මයෙහි කුළුගත්හ.

267. තව ද **සතපත්ත ජාතකයෙහි සොරදෙටු වූ** සිටැ දහසක් හැරැගෙණැ යන මානවකයා **කැණකිල් වූ** උපන් මවගේ හිතකාමී වූ හඬ නො ගිවිසැ අනර්ථ කැමැති සියොත්හුගේ හඬ ගිවිසි බව ද දැනැ "වැඩ කැමැත්තවුන්ගේ බස් නොගිවිස්මෙහි හා නොවැඩ කැමැත්තවුන්ගේ බස් ගිවිස්මෙහි" ආදීනව දක්වන්නාහු ද ධර්මයෙන් ම දුක්වූහ.

268. තව ද **පුටදූසක ජාතකයෙහි උදුනපාලයා** හෙළැ හෙළැ පුවය නසන්නා වූ වානරයාගේ සවරූප දන්නාහු ලොක විනාශක කෙලසයන්ගේ සවරූප දන්නා බවට පූර්ව නිමිත්ත දක්වන්නාක්මෙන් ධර්මය ම මෙනෙහි කළහ.

269. මෙසේ ශරණා'ගත වජ්‍රපඤ්ජර වූ සමස්ත ලොකපාල වූ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදුකළ ධර්මය ම සරණ යෙමි යි **දහම් සරණ යායුතු.**

270. තව ද **අඛ්‍යානතර ජාතකයෙහි තාපස වැ ශක්‍රයාට** සංශය උපදනා පරීක්ෂාවෙන් සිල් රක්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

271 තව ද **සෙයාංස ජාතකයෙහි බරණැස් රජ වැ** කිපී බැලූ මාත්‍රයෙකින් ම සියලුම ශත්‍රුමණ්ඩලය හසම කරන්නට සමර්ථ වැ "සතුරු රජහු අවුත් තමන් බදවා බන්ධනාගාරයෙහි ලනතුරු රාජ්‍යයක් පිණිස අනුන් හා යුද්ධයක් නො කෙරෙමි" යි වැඩ හිඳ බන්ධනාගාරයෙහි ලූ කල්හි එහි වැඩ හිඳ සතුරු රජහු මුල් කොට මෛත්‍රී කොට ධ්‍යාන උපදවන්නාහු ද ධර්මයෙන් ම ඉපැදවූහ.

272. තව ද **වඩ්ඩකි සූකර ජාතකයෙහි වෘක්ෂ දෙවතා වැ** දුර්ලභ වූ **හූරෝ** උපාය ශක්තීන් බලවත් වූ **ව්‍යාශ්‍රයා** ගිලූ පරිදි දක්නාහු දැන් බුදු වැ තමන්ගේ සවිවන් බලවත් සසර දනත පරිදි දක්නා බවට පූර්ව නිමිත්ත දුටහ.

273. තව ද **ඝටිජාතකයෙහි හස්තාචාර්‍ය වැ** කුලූපග වැ තමන්ට බත් දුන් හස්තාචාර්‍යයා මහානුභාව වූ කුකුළු මස් කවා රාජ්‍යත්වයෙහි පිහිටුවන්නාහු ද ධර්මයෙන් ම කළහ.

274. තව ද **මණ්ඩූකර ජාතකයෙහි තාපස වැ** මැණික් පව්වට කොලෙසම්හ යි කියා හූරන් මඩෙහි වැකී රෝමයෙන් ගැසූ ගැසූ සේ ම විශෙෂයෙන් ඔප් නගන්නා වූ මාණික්‍ය දක්නා හු ද "දැන් තමන් බුදු වැ නිර්‍වකයන් තමන්ගේ කීර්තිය කිළිටු කරම්හ" යි සිතූ සිත සේ ම ඒ කීර්තිය භවා'ග්‍රප්‍රාප්ත වැ විශෙෂ යෙන් නිමල වන බවට පූර්ව නිමිත්ත දුටහ.

275. තව ද **සාලූක ජාතකයෙහි හොන් වැ** සිටැ වධ්‍ය වූ **හූරන් කත** ගොදුරෙහි ලොභකළ මලනුවන්ට අවවාද දී ලොභ යෙන් වළකන්නාහු දැන් වසතු කාම කෙලශ කාමයෙහි ආදීනව නොදැනැ පඤ්චකාමයෙහි හුනුවා වූ සත්ත්ව ලොකයාගේ එහි ලොභය හැරවීමට ශ්‍රම කළහ.

276. තව ද **ලාභ ගරුක ජාතකයෙහි දිසාපාමොක් ආචාර්‍ය වැ** "ලාභ ලබන්නේ කෙසේදැ"යි විවාළා වූ ශිෂ්‍යයාට "අඳුනයන් අනින් ලාභ ලබන්නේ නම් "විසරුහුණුවන් සේ වුව මැනව, කේලම් කිව මැනව. නවන නාට්‍යකාරයන් සේ ද අලජ්ජී වුව මැනව. කටට ආවාක් බිණුව මැනවැ"යි කියා ලාභ උපදවන කාරණය ම තපුරු සේ දක්වා ඔහු ලාභයෙහි අපරීක්ෂා නො කොට මහණ වැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවන පරිද්දෙන් අවවාද වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

277. තව ද **මච්ඡුද්‍දූන ජාතකයෙහි** වෙළඳ වෑ මසුන්ව බත් ලාලා ඒ පින් ගඟැ දෙවතාවන්ට දී ඒ පින් අනුමෝදන් වූ දෙවතාවන් විසින් මසු ගැලපු තමන් සතු දහසක් බඳ පියල්ල එළවූ කල්හි එසේ තව වසතුව ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

278. තව ද **නාහාවඡ්ඣ ජාතකයෙහි රජ** වෑ තමන් සොරුන් අත්පත් වැ ගැළවුනු බව කී නැකත්තා හට බෝ යසස් දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ

279. තව ද **සිලවීමංස ජාතකයෙහි පුරොහිත** වෑ සොරකම් කොවැ සිලය ම උත්තම සේ පරීක්ෂා කොටැ සියලු සම්පත්හි හැරැ පියා රජ්ජුරුවන් අනු දන්වා හිමාලයට වැද පැවිදි වැ පඤ්චා'භිඥ අෂ්ටසමාපත්ති උපදවා බ්‍රහ්මලොක පරායණ වන්නාහු ද ධර්මය ම අවශ්‍ය කොට රක්කහ.

280. මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කොවැ ජීවිතයක් සේ රක්ෂා කළා වූ ධර්මය ම සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

281. තව ද **භද්‍රඝට ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර** වැ සිටැ ගිය ජාතියෙහි තමන් ගේ පුත්‍රයා හට සිතූ පැතූ දෙය දෙන **භද්‍ර කුමාරය** දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

282. තව ද **සුපත්‍ර ජාතකයෙහි කාක** වෑ සිටැ තමන් දිවි පුදා බරණැස් නුවර රජ්ජුරුවන් ගේ මුළු තැන පහරණ **කාකා'** මාත්‍යයන් පහර ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

283. තව ද **කාසවිවඡ්ඣ ජාතකයෙහි පණ්ඩුරොග ඇති** වෑ වෙදුන් අසාධ්‍ය ය යි හළ කල්හි "මේ රෝගය නැති වූ විට ම මහණ වෙමි" යන සිතින් කිප දවසකින් ම පොකුරු පතෙක්හි වත්කළ පැනක් සේ ඒ රෝගය ශරීරයෙන් ගිලිහි ගිය කල්හි මහණ වැ බ්‍රහ්මලොක පරායණ වන්නාහු ද ධර්මයෙන් ම නිරෝගී වූහ.

284. තවද **ජම්බුඛාදක ජාතකයෙහි** ද **අනන්ත ජාතකයෙහි** ද **වෘක්ෂ දෙවතා** වෑ ඉපැදූ වතුෂ්පාදයන් කෙරෙහි අධම වූ **කෑණ-හිල්ලු** හා **පක්ෂීන්** කෙරෙන් අධමවූ **කාකයා** හා ඔවුනොවුන්ට ප්‍රශංසා කරණ පරිදි දූකැ හෙරව රූපයෙන් ඔහු ලුහුබඳවන්නාහු දැන් බුදු වැ හින වැ සිටැ අන්‍යෝන්‍යයන් ප්‍රශංසා කරන්නා වූ තීර්ථකයන් ලුහුබඳවන බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

285. තව ද සමුද්‍දජ ජාතකයෙහි සමුද්‍ර දෙවිනා වැ "මහා සාගරයෙහි පැන් නොත සා බොව"යි කියා බට සාඛ්‍යයන්ට අව වාද කියන්නාහු ඛාඛයා ගේ ලොභයට ගහිා කරන්නාහු ද ධර්ම යෙන් ම කළහ.

286. තව ද කාමවිලාප ජාතකයෙහි දෙවිනා වැ ජීව ශූලයෙහි හිඳා පඤ්චකාම පිණිස විලාප කරන්නවුන් දක්නාහු ද දැන් බුදු වැ තමන් වදුරණ පඤ්ච කාමා'දීනවයට දෘෂ්ටා'නත දුවහ

287. තව ද උදුම්බර ජාතකයෙහි වෘක්ෂ දෙවිනා වැ ඔවු නොවුන් හා විවාද කරන්නා වූ වඳුරන් දෙදෙනා දක්නාහු සංසාර යෙහි පාපධර්මයන් ඔවුනොවුන් ගේ විශේෂයෙහි නැවත නැවත පවත්නා බවට දෘෂ්ටා'නත දුටහ.

288. තව ද කොමාය පුත්‍රත ජාතකයෙහි තපස්වි වැ සිවැ කෙළි සිල වූ තාපසයන් හා පරිවයෙන් නොයෙක් මූඛ විකාර කරන්නා වූ වානරයා තමන් ගේ අවවාදයෙන් හික්මවන්නාහු දැන් කෙලශ සංසර්ගයෙන් විප්‍රකාරයට පැමිණි ලොව හික්මවන බවට පුළි නිමිත්ත දැක්වූහ.

289. තව ද බක ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර වැ එළු වෙසක් මවා ගෙණැ සිසාරා වතුරෙන් හසු වැ ගිය ගඟ මැදු ගොඩෙහි හොත් ක්ෂොභ්නාවා කත ගොදුරක් නැති හෙයින් "සිල් රකිමි"යි සිතූ කල්හි ඔහු ඉදිරියෙහි පැනී තමන් වහන්සේ දුටු ඔහු සිල් පසු වැ රැකගත හැක්කැ සි ගන්නට පැණැ හුණු කල්හි ශක්‍රා'නුභාවයෙන් ආකාශයෙහි සිවැ ඔහුගේ ලොල චිත්තත්වය ප්‍රකාශ කරණ සෙයෙක් තමන් වහන්සේ අගුණයෙහි ප්‍රිය නැති බව හා ගුණ යෙහි ම ප්‍රිය ඇති බව හා දක්වා වදාළ සෙයෙක.

මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද ධර්මය සරණ යෙමි සි සත්පුරුෂයන් විසින් දහම් සරණ යා යුතු.

290. තව ද චුල්ලකාලිඞග ජාතකයෙහි තපස්වි වැ ශක්‍ර දෙවෙන්ද්‍රයා "දෙනෙති" කි රජහු පැරැදි කල්හි "තා දෙනෙති කි රජහු පරදනට කාරණා කිම්ද" යි විචාරා "පරාක්‍රමය – දමනය – සමාධිය යනාදී වූ ධර්මයෝ ඔහුගේ විජයට කාරණායහ" යි ශක්‍රයා කි කල්හි ඒ ධර්මයන්ගේ විශෙෂ දක්වන්නාහු ධර්මයෙන් ම දත්හ.

291. තව ද මහා අස්සාරොහ ජාතකයෙහි රජ වැ උපකාර කළ කුටුම්බිකයාට ප්‍රත්‍යුපකාර කරන්නාහු ද ධර්මයෙන් ම කළහ.

292. තව ද **එකරාජ ජාතකයෙහි රජ වෑ** මෛත්‍රී පුරස්සර වූ ධර්ම පරායණ වූ තමන් අල්වා ගෙණ රාජවාරයෙහි හිස බිම් බලා බැඳ එල්වාපු රජහු කෙරෙහි මෛත්‍රී කොටැ බැඳුම් සිඳ ගෙණ ආකාශයෙහි පළක් බැඳ ගෙණ හිඳිනාහු ද ධර්මයෙන් ම හුන්හ.

293. තව ද **දද්දර ජාතකයෙහි** විෂ සොර වූ **නාගරාජ වෑ** ලූබ්‍ය වූ කැට කැබිලිනි බැහලා මරතුදු විෂ නැති ගරබොසින් දියබරණුන් සේ ක්ෂමා කරන්නාහු ද ධර්මයෙන් ම ක්ෂමා කළහ.

294. තව ද **සිලවිමංස ජාතකයෙහි පණ්ඩිත මාණවක වෑ** දිසාපාමොක් ආචාර්‍යයන් ශිෂ්‍යයන්ගේ ආචාර පරීක්ෂා කරණ පිණිස "මාගේ දියතියන්ට විවාහගුල් කෙරෙම්" "තෙපි හැමදෙනා වස්ත්‍රා'ලඞ්කාරාදිය ගෙණෙව" යි කී කල්හි සෙසු අන්තෙවාසිකයන් සොරා වස්ත්‍රා'ලඞ්කාර ගෙණතුදු තුමූ නොගෙණ අවුත් ආචාර්‍යයන් විසින් "සෙස්සහු අපට වස්ත්‍රා'ලඞ්කාර ගෙණෙත් තෙපි නොගෙණෙව්" යි විවාළකල්හි "අනුන් නො දක්ක දී ගෙණෙන්නට වේ" ද නුඹ කියන්නෙහි ය. කාත් නැතත් දෙවතාවන් මා කරණ පව් බලා සිටු ත්, "කෙසේ රහසැ යි පව් කෙරෙම්ද" යි කියා පාපය නොකරන්නාහු ධර්මයෙන් ම නො කළහ.

295. තව ද **සුජාතා ජාතකයෙහි අමාත්‍ය වෑ** ඩෙබර පල විකුණන ගැහැණිය රජ්ජුරුවන් කෙරෙහි හිඳ අන්තයෙහි "මෙම වට පල ජාතිය කුමක්දැ යි" කියා රජ්ජුරුවන් කන ඩෙබරෙහි නම් විවාළ කල්හි "පෙර තොප මුඛ හිසින් රෙදි කඩක් හැඳ ගෙණ අතු කඩා බහා කැබූ පල වේ ද" යි කියා කිපී තී නො හඳුන ඩෙබර හැඳිනැ ගෙණ පෙර සේ ම වසව යි නෙරන්නට වන්කල්හි, මහරජ! එසේ නො කිපුන මැනව, "ශ්‍රී ලත් කල්හි පෙරැ හුන් දුකෙක් ඇත් නම් සිහැ නො තිබෙයි" කියා ක්ෂමා කරවා අස්වසන්නාහු ද ධර්මයෙන් ම අස් වැසූහ.

296. තව ද **පලාස ජාතකයෙහි** කැහැල ගසැ **වෘක්ෂදෙවතා වෑ** තමන්ට ආරාධනා කළ දුර්ගතයාහට මුවවිටින් මුවවිටි පැහැරැ සිටි මහා නිධාන දෙන්නාහු ද ධර්මයෙහි ම අභිලාෂයෙන් ම දුන්හ.

297. තව ද **ජව සකුණ ජාතකයෙහි පක්ෂි වෑ** සිවැ කෙළෙහි ගුණ නො දන්නා වූ සිංහයාගේ උගුරට වැදූ එහි ඇණුනු මස් ඇට හැරැ ඔහු සුවපත් කරන්නාහු ද ධර්මයෙන් ම සුවපත් කළහ.

298. තව ද **ජවන ජාතකයෙහි චණ්ඩාල වෑ** සොරකමට උසන් වැදූ ගස් උඩ හිඳැ රජ්ජුරුවන් උඩහිදුවාලා බිම හිඳැ බණ කියන පුරොහිතයාගේ අධර්මය ක්‍ෂමා කොටැ ගත නොහී ජීවිතයෙහි ආසා නැති වැ මා දිවි ඇති වැ ධර්මයට කරණ නිසුව ක්‍ෂමා කෙරෙම්දැ යි ගසින් බිමැ හි බණ කියා **චණ්ඩාල වෑ** සිටැ රාජ්‍යය ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

299. තව ද **සඤ්ඤ ජාතකයෙහි පුරොහිත පුත්‍ර වෑ** හස්ත ප්‍රාප්ත වූ පුරොහිත ස්ථානය හැරැ මහණ වන්නාහු ද ධර්මයෙන් ම මහණවූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්‍ය ජාතියෙහි **සා'තම් කරණ** ලද ධර්මය සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

300. තව ද **පුච්මන්ද ජාතකයෙහි කොසඔ ගසැ වෘක්ෂ දෙවතා වෑ** ඉපැදූ ගම් පැහැරැ වසතු ගෙණැ ඒ ගසමූල හොත්තා වූ සොරහු තමන්ගේ වෘක්ෂ මූලයෙන් තෙරපා ඒ ගසට උපද්‍රව විය නොදී රක්‍ෂා කරන්නාහු ද දැන් තමන් වැඩහුන් බොධි වෘක්ෂයට මරහු විසින් උපද්‍රව විය නො දෙන බවට පූජා නිමිත්ත දැක්වූහ.

301. තව ද **ඛණ්ඩපමඬ්ඩිය ජාතකයෙහි තාපස වෑ** බාල කුමාරයන් කෙරෙහි කළකිරුණා වූ පියානන් වහන්සේට අවවාද දී විරොධ හරවන සෙයෙක් ද ධර්මයෙන් ම හැරැ වූ සේයෙක.

302. තව ද **ක්‍ෂාන්තිවාදි ජාතකයෙහි තාපස වෑ** අත් පා කපන්නට පරශු ධාරා ගෙන්වන රජ්ජුරුවන්ගේ මුහුණ සඳ'ඔය යෙහි අමෘතධාරා තමන වළඳයා සේ ප්‍රසාද මධුර වූ නෙත්‍රයෙන් බලන සෙයෙක් ද ධර්මයෙන් ම බැලූ සේයෙක.

303. තව ද **ලොහකුම්භි ජාතකයෙහි තාපස වෑ** ලොහොකුඹු නරකයෙහි පැසෙන්නා වූ සතුන්ගේ හඬ අසා භයපත් වූ රජහු ධනලොභී බ්‍රාහමණයන්ගේ බසින් නොයෙක් ප්‍රාණවධ කොටැ යාග කරන්නට පවන්ගත් කල්හි සවප්නයෙහි අඳී කියා රජහට වන අනිෂ්ටයක් නැති බව හඟවා මරණ මුඛයට පැමිණි සියලු අපාද චිපාද චතුෂ්පාදයන් ගළවා සත්ත්වයාට ප්‍රාණදාන දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ

304. තව ද **මාංස ජාතකයෙහි සිවු පුත්‍ර වෑ** ප්‍රිය වචන බලයෙන් වැද්දා අතින් මස් ලබන්නාහු ද ධම්යෙන් ම ලදහ.

305. තව ද **සස ජාතකයෙහි සහ වෑ** ඉපැදූ "සාමි"යි ආ බමුණාට "ගිනි වැදූ මස් දෙමි"යි ගින්නට පැන තමන්ගේ ප්‍රති බිම්බය කලපා'නතය දක්වා සිටිනා පරිද්දෙන් චන්ද්‍රමණ්ඩලයෙහි අන්දවන්නාහු ද ධම්යෙන් ම ඇන්දවූහ.

306. තව ද **මිතවින්දක** ජාතකයෙහි සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාව නොදැන මළවුන් කෙරෙහි ශෝක කරන්නවුන් අස්වසන සේයෙක් ද ධර්මයෙන් ම අස්වැසූ සේයෙක.

307. තව ද **කණවේර** ජාතකයෙහි **සොර** වූ ඉපැදී ගැහැණුන් ගේ ආදීනව දන්නාහු ද ධර්මයෙන් ම දත්හ.

308. තව ද **තිත්තිර** ජාතකයෙහි **තාපස** වූ සිටි වැද්දගේ සත් වටුවා ඔහු අතින් ගැලවී වලට වැදී තමා වසන තැනට ආවා වූ වැද්ද අතින් මළ හෙයින් මට ත් 'ප්‍රාණාතිපාත ඇද්දෝ හෝ''යි කියා විවාළ කල්හි "ප්‍රාණ වධයක් කෙරෙමි යි යන සිතක් නැති කල්හි තව පාපයෙක් නැතැ"යි ධර්මයෙන් වදරන්නහු ද දැන් බුදු වූ "චෙතනාහං හික්ඛවෙ කම්මං වදාමි''යි කියා වදරණ බණට පූර්ව නිමිත්ත දක්වූහ.

309. තව ද **සුචවජ** ජාතකයෙහි **අමාත්‍ය** වූ රජ්ජුරුවන් හා කැටි වැ වල්හි දුක්ගත් බිසවුන් කෙරෙහි රජ්ජුරුවන් කරුණා නැති වූ කල්හි බිසවුන් ගේ ගුණ සිහි කරවා කෙළෙහි ගුණ දැන් මෙහි අනුසස් වදරා ඔවුන් කෙරෙහි සෙනහ කරවා බිසවුන් ගේ සම්පත්තිය විගුණ ත්‍රිගුණ කරවන සෙයෙක් ද ධර්මයෙන් ම කළ සෙයෙක.

මෙසේ මාගේ සැමියන් විසින් අතීත ජාතියෙහි පුරුදු කොට අභිවෘද්ධියට පැමිණ වූ ධර්මය ම **සරණ** යෙමි යි **දහම් සරණ යා** සුතු.

310. තව ද, **කුවිදූසක** ජාතකයෙහි **පක්ෂි** වූ තමන්ගේ කසල්ල බිඳපු වදුරා බලා බිඳින කසල්ල බල බලා කරුණ මෛත්‍රී "මාගේ ලෙහි කෙලෙසුන් බිඳින බවට ප්‍රත්‍යය වේව'' යි සිත සිතා මෛත්‍රී කරන්නාහු ද ධර්මයෙන් ම කළහ.

311. තව ද **දද්දර** ජාතකයෙහි **සිංහ** වූ ඉපැදී බෙලි පල හුණු හඬට "පොළොව පෙරළෙ යි'' කිය කියා දිවන්නාවූ සහවිගේ බස් ගිවිසැ මුහුදු බත් වන්නාවූ සියලු චතුෂ්පදයන් රක්ෂා කරන්නාහු ද දැන් බුදුවැ තීර්ථකයන්ගේ අධර්මය ගිවිසැ තරකයට වදනා වූ සත්ත්වයන් රක්ෂා කරණ බවට පූර්ව නිමිත්ත දක්වූහ.

312. තව ද **බ්‍රහ්මදත්ත** ජාතකයෙහි **තපස්වී** වූ රජ්ජුරුවන් අතින් එක්පට වහනක් හා පත් කුඩයක් ඉල්වා ගන්නට සිතා "අනුන් අතින් යමක් ඉල්වීම නම් අප්‍රිය ය'' යි දෙලොස් හවුරුද්දක් කල් යවන්නාහු ද ධර්මයෙන් ම කල් යැවූහ.

313. තව ද **චම්මසාටක ජාතකයෙහි** වෙළඳ වැ ඇත්මව පසු බස්නා එළුවා "තමා කෙරෙහි ගෞරවයෙන් පසුබසිනි"යි සිතා ඇල කොවැ සිටැ ඔවුන් අතින් ඇතුම් කා මළාවූ **පරිබ්‍රාජකයා** දැකැ "ලොකයෙහි සත්ත්වයාට විනාශ තම් අඥානයෙන් ම වෙයි" කියා නිශ්චය කොටැ ඒ අඥානයෙන් දුරුවන්නාහු ද ධර්මයෙන් ම දුරුවූහ.

314. තව ද **ගෝධ ජාතකයෙහි** ගෝ වැ **ඉපද** තමන් මරන්නට සිතූ **බොහොන් තාපසයා** අතින් ගැළවෙන්නාහු ද දැන් බුදුවන ජාතියෙහි තමන් විනාශ කරන්නට සිතූ **මරඟු** අතින් ගැළවෙන බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

315. තව ද **ඛණ්ඩහාරී ජාතකයෙහි දිව්‍යපුත්‍ර** වැ තමන් මිනිස් ලොවට ගෙණා දිව්‍ය කුසුම් නැති ගුණ ඇත්තෙම් සි කියා පැළඳ වූ පුරෝහිතයා හිස රාජා ක්ෂමා කොටැ ගත කොඟි හඬන්නා වූ පුරොහිතයා කෙරෙහි කරුණා කොවැ ඔහු හිසින් මල් ගළවා රාජා නැති කොටැ "නැති ගුණ ඇත්තම්හ"යි හැඟැවීමෙහි ආදීනව දක්වන්නාහු ද ධර්මයෙන් ම දැක්වූහ.

316. තව ද **ඛාණ්ඩාණි ජාතකයෙහි රජ** වැ සමුද්‍ර මධ්‍යයෙහි ගරුඩ විමානයෙහි ලා ත් ගැහැණුන් කොරැකැ ගත හැකි බව නිශ්චය කොටැ **පඤ්චකාමයෙහි** ආදීනව දක්වන්නාහු ද ධර්මයෙන්ම දැක්වූහ.

317. තව ද **අනානුසොවිය ජාතකයෙහි තාපස** වැ කැටි වැ පැවිදි වූ රන් පිළිමයක් වැනි ඇඹෙනියන් සිහා වැඩිය දී මළ කල්හි රැස් වූ මනුජනයා උන් ගේ රූ බල බලා හඬ හඬා සිටි තැනට අවුත් මියැ හොත් පරිබ්‍රාජිකාවන් දැකැ **"සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයහ"**යි කිසි ශොකයක් නො කොටැ ඔවුන් මියැ හොත්තා වූ පෝරු කෙළවර ම හිඳැ අහර වළඳ රැස් වූ මනුෂ්‍යයන්ට අනිත්‍යතා ප්‍රතිසංයුක්ත වූ ධර්මදෙශනා කරන්නාහු ද ධර්මයෙන් ම දෙශනා කළහ.

318. තව ද **සීලවීමංස ජාතකයෙහි පුරොහිත** වැ සීල යෙහි ම අනුභස් පරීක්ෂා කොටැ හස්න ප්‍රාප්ත වූ රාජ්‍ය සම්පත්තියට ද අධික වූ පුරොහිත සථානය හැරැපියා මහණ වැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්මලොක පරායණ වන්නාහු ද ධර්මයෙන් ම බ්‍රහ්මලොක පරායණ වූහ.

මෙසේ මාගේ සවාමින් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කරණ ලද්දා වූ අප්‍රමාණ ගුණ ඇති **ධර්ම රත්නය සරණ** යෙමි සි **දහම් සරණ යා යුතු.**

319. තව ද **කොකාලි ජාතකයෙහි රාජාමාත්‍ය වූ** කැවිඩියගේ කසල්ලෙහි වැඩුනු කොවුලු පැටව් තමා කවුඩු පැටවෙකැ යි සිතා කැවිඩිය රක්ෂා කරණ කල්හි නො හඩා නො භිදෑ කෙවිලි හඬ හඬා කැවිඩිය තමා දරු නො වන බව දැනැ තුඩින් කසල්ලෙන් ගෙළා පි කල්හි ඔහු පැලා "අසථානයෙහි දී දෙඩිම් විනාශ කාරණා යි" බොහෝ කොටැ බණන්නා වූ රජ්ජුරුවන් හික්මවන සෙයෙක් ද ධර්මයෙන් ම හික්ම වූ සෙයෙක.

320. තව ද **රථලට්ඨි ජාතකයෙහි ද රාජාමාත්‍ය වූ** තමා කැරින් තමා හිස ඇතැ ගෙණැ අනුන් තමා මැරුහ යි පැමිණැ සිටි ඔවුන්ගේ සළුවට ගන්නට පටන්ගන් පුරොහිතයාගේ අධර්මය දැනැ වූ පරිද්දෙන් නිණය පවත්වන්නාහු ද ධර්මයෙන් ම විනිශ්චය කළහ.

321. තව ද **කාලබාහු ජාතකයෙහි ගිරා වූ** කාලබාහු තම් වපල වානරයා විදි අසපිර සමපත්තියෙහි ලොභ නො කරන්නාහු ද ධර්මයෙන් ම නො කළහ.

322. තව ද **සොඩ ජාතකයෙහි** එසේ ම **රාජාමාත්‍ය වූ** කෙළෙහි ගුණ නො දන්නා වූ රජහු බොහෝ කලක් දුක් ගත් දේවින් කෙරෙහි කරුණා ඇති කරන්නාහු ද ධර්මයෙන් ම ඇති කැරැ වූහ.

323. තව ද **රාජෝවාද ජාතකයෙහි තපස්වී වූ** සිවැ තමන්ගේ ගුණ පරීක්ෂා කරන්නට වලට වන් රජ්ජුරුවන්ට "සිත් නැති නුග පත් පවා රජ්ජුරුවන් ධර්මිෂ්ඨ කල්හි මිහිරි වන බව හා අධර්මිෂ්ඨ කල්හි තිත්තවන බව" දක්වා අවවාද කියා ධර්මයෙහි පිහිටුවන්නාහු ද ධර්මයට ම වහල් වූහ.

324. තව ද **ජම්බුක ජාතකයෙහි සිංහරාජ වූ** තමන් සේ ක්‍රියා කෙරෙම් යි කියා නටුවා වූ **ශෘගාලයා** දැකැ "මහතුන් කරණ ක්‍රියා කරම්හයි සිතූ ක්ෂුද්‍රයන්ට වන මහා විනාශ දක්වා "බණ වදරන්නාහු ද තමන්ගේ සිංහ නාද පවා ධර්ම නාද කළහ.

325 තව ද **බ්‍රහ්මදත්ත ජාතකයෙහි අමාත්‍ය වූ** උයන්හි තිබූ නිධානයෙහි වසතු හැරැ ගෙණැ එහි තණ ඔබා පියා රාජපුත්‍රයා නැඟී හිස කල්හි ධන ශොකයෙන් තණයෙහි තම කිය කියා හඬන්නා වූ රජ්ජුරුවන්ට බණ වදරා ශොක දුරු කරන්නාහු ද ධර්මයෙන් ම දුරු කළහ.

326. තව ද **පීඨ ජාතකයෙහි තපස්වී වූ** අනුන් ගෙදොරැ සිහා සිටැ ප්‍රතිවචන මාත්‍රයක් නො ලබන කල් පවා **නිර්කථිලප වූ** ආසා නැති වූ යන්නාහු ද ධර්මයෙන් ම ගියහ.

327. තව ද ථූස ජාතකයෙහි **දිසාපාමොක්** ආචාර්‍ය වූ පියානන් මරන්නට පවත් ගත්තා වූ රාජපුත්‍රයාගේ මායාවෙන් වන උපද්‍රව වළකා රජහට ජීවිත දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

328. තව ද බාවෙරු ජාතකයෙහි **මයූර රාජ** වූ පැසිත් තෝ හඳුනන රවෙහි පූජා ලද්දා වූ කාකයාට කරණ සත්කාර සම්මාන දුරුකොටැ තුමූ බොහෝ සම්මාන ලබන්නාහු ද දැන් තමන් තෝ උපන්නාට පළමු ලොක පූජා ලදින් සිටි නිර්‍ධකයන් මැඩැ තමන් මහා පූජා ලබන බවට පුළු නිමිත්ත දැක්වූ හ.

329. තව ද **විසයහ** ජාතකයෙහි **සිටු** වූ අසූකෙළක් ධන විසදම් කොටැ දන් දී වසතු නිමාවට යන්නා හා තණ ගෙණැ අවුත් විකොටැ දන් දෙමින් අවියෙහි තණ කද ඇදු ගත තොහී කඩා ගෙණැ හී. ආකාශයෙහි සිටි ශක්‍රදෙවෙන්‍ද්‍රයා "මෙතැන් පටන් ගෙණැ දන් තෝ දෙව යි වැළකුව ද තමන්ගේ දෘතාඛ්‍යා'සය හඟවා "කුමක් පිණිසද තොප දන් දෙන්නේ" දැයි විවාළ කල්හි "අනික් භව සම්පත්තියක් පතා දන් තෝ දෙමි. සවිතේ ගෙවා දැනැ බුදු වැ මුළුලොව ගළවන පිණිස දන් දෙමි" යි හී කල්හි ඒ බව දැනැ සතුටු වූ ශක්‍රයා තමන්ගේ ගෙය සත්රුවනින් පුරා හියැ කල්හි දවස් පතා දෙලොස් ලක්ෂයක් විසදම් කොටැ දන් දෙන්නාහු ද ධර්මයෙන් ම දන් දුන්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අතෘත්ත ජාතියෙහි පුරුදු කරණ ලද **ධර්ම සරණ යෙමි යි දහම් සරණ යා සුතු.**

330. තව ද **වානර ජාතකයෙහි වඳුරු** වූ තමන් මරණු කැමැති වැ "ඇත දියෙහි උයනක් ඇතැ" යි පිටට නඟා ගෙණැ යන්නා වූ කිඹුලාගේ වඤ්චා දැනැ "මාගේ හදවත තෙල දිඹුල් ගස තුබු යේ ය" යි කියා එතනට කිඹුල්හු ගෙණැ හියැ කල්හි ඔහු අතින් ගැලවෙන්නාහු ද ධර්ම බලයෙන් ම ගැලවුනාහ.

331. තව ද **කුනතිනී ජාතකයෙහි බරණැස් රජ** වූ තමාගේ දරුවන් මළ හෙයින් තමන්ගේ ගෙහි තෝ වැසැ හිමාලයට යන්නා වූ කුනතිනී තම් පක්ෂියාගේ දුක්මෙන් දැන් තමන් හැරී යන්නා වූ කෘෂ්ණාවට පුළු නිමිත්ත දැක්වූහ.

332. තව ද **අම්බචොර ජාතකයෙහි ශක්‍රදෙවෙන්‍ද්‍ර** වූ භාවනා කොටැ අඹ උයන රක්‍ෂා කොටැ වසන්නා වූ කුට ජටිල යාගේ අනාචාර දැකැ දෙව්ලොවින් මිනිස් ලොවට බැසැ ඔහට භය උපදවා ශ්‍රමණ ධර්මයෙහි පිහිටුවන්නාහු ද ධර්මයෙන් ම පිහිටු වූහ.

333. තව ද **ඝටිකුමහ ජාතකයෙහි රාජාමාත්‍ය වූ** සෙමෙන් සෙමෙන් යන්නා වූ **ඝටිකුමහ** නම් ප්‍රාණීහු පෑ අලස යන්ට වත විනාශය දක්වා රජ්ජුරුවන් අතලසෙහි පිහිටුවන්නාහු ද ධම්සෙන් ම පිහිටු වූහ.

334. තව ද **සෙසව ජාතකයෙහි කල්ප නම් තාපස වූ** රජ්ජුරුවන් පන්සියක් වෙදුන් ලවා සන්හිදුවා ගත නුහුණු **සෙසව තාපසයන් ගේ** රොගයට තමන් දී ලූ ලුණු ඇඹුල් නැති පලා මාත්‍රයෙකින් සන්හිදු වන්නාහු ද ධම්යෙන් ම සන්හිදු වූහ

335. තව ද **අයකූට ජාතකයෙහි රජ වූ** පණිවා වළකා බලිකම්නත නො ලැබීමෙන් කිපියා වූ යකුන් තමන් මරන්නට එවූ යක්හු කන් කුළක් සා යකුළක් අල්වා ගෙණ ආකාශයෙන් අවුත් තමන් හිසැ පහරණට සිටි කල්හි තමන් රැකි ධම්බලයෙන් ම ශක්‍රදෙවෙන්ද්‍රයා ගේ ආසනය හුණුවූ කල්හි ඔහු දිලියෙන වජ්‍රායුධය හැරගෙණ අවුත් "ඉදින් නෝ මේ ධර්මිෂ්ඨ මහරජාණන්ට විපත්තියක් කෙළෙහි නම් තා හිස මම මේ වජ්‍රායුධයෙන් පළා පියම්"සි කියා යක්හු භයපත් කරවා ලුහු බැඳැ වූ කල්හි නිරුපද්‍රව වැ ජීවිත ලබන්නාහු ද ධම්මෙන් ම ලදහ.

336. තව ද **අරඤ්ඤ ජාතකයෙහි තපස්වී වූ** මනුෂ්‍ය පථයට යන්නා කැමැති පුතනුවන්ට සේවකය කටයුතු පුරුෂ යන් ගේ ගුණ දැක්වීමෙන් ම එසේ වූ පුරුෂයන් දුලීහ බව හඟවා මනුෂ්‍ය වාසයට යන ගමන් වළකා කිසුණු පරිකම් කියා ධ්‍යාන උපදවා බ්‍රහ්ම ලොකයට ගෙණ යන්නාහු ද ධම්යෙන් ම ගෙණ ගියහ.

337. තව ද **සඞ්ඛභෙද ජාතකයෙහි ඔරණ්ඩ රජ වූ** සිංහ වෘෂභ දෙදෙනා ගේ මෛත්‍රී භෙදයට කාරණා වූ සිවල්හු ගේ සවරූපය දක්වන්නාහු ද සියලු කුශලධම් විනාශ කාරණා වූ අකුසල ධම්යන් ගේ සවරූප දැක්මට පුළු නිමිත්ත දැක්වූහ.

338. තව ද **චුල්ලකුණාල ජාතකයෙහි පක්ෂි වූ** සිවැ සත්‍රින් ගේ අවගුණ දන්නාහු ද ධම්යෙන් ම දන්හ.

339. තව ද **මහොෂධ පණ්ඩිත වූ** මිනිස් ලොවැ සිවැ දෙවතාවන් විචාරණ ප්‍රශ්නයෙහි අවි දන්නාහු ද ධම්යෙන් දන්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් මෙතෙහි කොටැ පුරුදු කොටැ පරිකම් කොටැ හස්තසාර කොටැ කුලධන කොටැ වඩන ලද්දා වූ **ධම්ඔම සරණ ඔයම් සි දහම් සරණ යා සුතු.**

340. තව ද **මණිකුණ්ඩල ජාතකයෙහි** බරණැස් රජ වැ රාජ්‍යය හැරැ ගත්තා වූ සතුරු රජහු කෙරෙහි අත තුබූ බත් පිඬ උදුරා හැරැගෙණැ සෙනහයෙන් කන ප්‍රිය පුත්‍රයක්හු කෙරෙහි සේ මෛත්‍රී කරන්නාහු ද ධම්මයෙන් ම කළහ.

341. තව ද **සුජාත ජාතකයෙහි** කොළඹ පුත්වැ මළ පියානන්ට හඬන්නා වූ තමන් ගේ පියානන් දැකැ මළ ගොණෙකු හොවා ලා ඕ හට තණ ලාලා "තණ කායි – තණ කාසි" කිය කියා සිටැ තමන් ගේ පියානන් "මප්පතනුවෝ වියරුහුණු වන්හ"යි කියා ගොසින් "පුත තෙපි වියරුහුණුදැ"යි කී කල්හි "දැ හළුවැ ගියැ අපගේ මුත්තනුවන්ට හඬන තොපට වඩා අත් පා හිස් වාලධි ආදී තුබූ සේ තුබුවා වූ ගොණුට තණ ලන්නා වූ මම වියරු හුණිම් දැ"යි කියා පියානන්ගේ ශොක හරවන්නාහු ද ධම්මයෙන් ම හළහ.

342. තව ද **වෙනසාඛ ජාතකයෙහි** තමන් ගේ අවවාද නොකළා වූ රාජ කුමාරයා රජදරුවන් දහසක් ඇස් උදුරුවා යකකු එක් ඇසක් උදුරා ගෙණැ ගිය කල්හි ගිජුලිහිණියක කවින් ගැලවී හුණු ඇවින් දෙවන ඇස සිල්වැ ගිය කල්හි හඬ හඬා ම්හැ නිරා වදනේ මාගේ සවාමීන් ගේ ධම්මයෙන් යුක්ත වූ අවවාද නො කළ වුන්ට වන විපත්ති දුක්වී ය.

343. තව ද **උරග ජාතකයෙහි** බමුණු වැ උරෙහි දැ දරුවන් මළ කල්හිදු මරණ සී භාවකයෙන් සිත්හි ශොක දුරැ කරන්නාහු ද ධම්මයෙන් ම දුරැ කළහ.

344. තව ද **ඝට ජාතකයෙහි රජ වැ** තමන් ගේ රාජ්‍යය හැරැගත් රජහු කෙරෙහි මෛත්‍රී කරුණා කොවැ බඹුතය සිදැ ගෙණැ ආකාශයෙහි පළක් බැඳැ හිදිනාහු ද ධම්මයෙන් ම හුන්හ.

345. තවද **සාරාණීය ජාතකයෙහි අනෙනවාසික වැ** අනුන්ට නො කැමැති සේ සිල් දෙන්නා වූ ආචාර්‍යයන් හික්ම වන්නාහු ද ධම්මයෙන් ම හික්ම වූහ.

346. තව ද **ලටුකික ජාතකයෙහි මහතහසති වැ** බල වත් වැ සිටැ "මාගේ බිජුවට නො මැඩැ මැනැවැ"යි භැඬූ කිරිල්ල ගේ බස් අසා මෛත්‍රීන් බිජුවට වළහා යන්නාහු ද ධම්මයෙන් ම වැඩියහ.

347. තව ද **ධම්මපාල ජාතකයෙහි සත්මැසි කුමරු වැ** සිටැ මහතෙල් මල් පෙති සේ මොළොක් අත් පා කපන්නා වූ පියරජහු කෙරෙහි මෛත්‍රී කරන්නාහු ද ධම්මයෙන් ම මෛත්‍රී කළහ.

348. තව ද **සඞ්ඛමිගජාතකයෙහි** රන්වන් මුව වැ මලෙහි බැඳී මුවදෙනගේ ශක්තියෙන් ගැලවෙන්නාහු ද දැන් තමන් ප්‍රඥ බලයෙන් සංසාර සාගරයෙන් ගැළවෙන බවට පූර්ව නිමිත්ත දක්වූහ.

349. තව ද **උසුනී ජාතකයෙහි** සුපණ්ණරාජ වැ සුපණ්ණ භවනයෙහි ත් ගැහැණුන් රක්ෂාකොටැ ගත නො හැකි බව දක්වන්නාහු ද ධර්මයෙන් ම දැක්වූහ.

මෙසේ මාගේ සවැමින් විසින් අතීත ජාතියෙහි පුරුදු කරණලද ධර්මය ම මට රක්ෂා මන්ත්‍රයෙක, මට වජ්‍ර කවචයෙක, මට රක්ෂා ප්‍රාකාරයෙක, මට අමෘතෞෂධයෙක, මට අභිමතාර්ථ සාධා දෙන්නා වූ කල්ප වෘක්ෂයෙකැ යි **දහම් සරණ යා යුතු.**

350. තව ද **පණ්ණරොහ ජාතකයෙහි** වෘක්ෂ දෙවතා වැ සිටැ මිත්‍ර වූ සිංහ - ව්‍යාඝ්‍ර දෙදෙනා බිඳුවන්නට කැණහිල්ලු ප්‍රයෝග කොටැ අභිමතාර්ථ සාධාගත නොහී ගිය පරිදි දක්වන්නාහු ද දැන් තමන් හිඳු වූ ගුණ ධර්මයන් විසුරුවන්නට උත්සාහ කරන්නා වූ තීර්ථකයන් හිතෝත්සාහ වන බවට පූර්ව නිමිත්ත දුටහ.

351. තව ද **සීලවීමංස ජාතකයෙහි** බ්‍රාහ්මණ වැ සියලු ධනයට වඩා සීලධනය ම උත්තම බව දැනැ හිමාලයයට වැදැ මහණ වන්නාහු ද ධර්මයෙන් ම මහණ වූහු.

352. තව ද **හිරි ජාතකයෙහි** බරණැස් සිටු වැ මිත්‍ර ධර්මයෙහි ගුණ දැනැ එම මිත්‍ර ධර්මය රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

353. තව ද **අභිතුණ්ඩි ජාතකයෙහි** ධාන්‍ය වාණිජ වැ එක් වරෙක්හි දෙම දුටුවා වූ වානරයා අභිතුණ්ඩිකයා හැර පැල බව දක්වන්නාහු එක්වරෙක්හි තමා සිතින් පැල කෙලෙසයන් නැවත තමන් කරා නොවදනා බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

354. තව ද **ගුම්බිය ජාතකයෙහි** වෙළඳ වැ "මධුවණ්ණ වූ විෂය මිහිය" යි කියා කන්නට වන්නා වූ තමන්ගේ පරිවාර ජනයාට එහි ආදීනව හඟවා නො කැ දී රක්ෂා කරන්නාහු "දැන් පණ්ඩිකාමයන් මධුර යි අනුභව කොටැ නස්නට සිටි සියලු ලොව ගළවා අමාමහ නිවන්හි දක්වන බවට" පූර්ව නිමිත්ත දැක්වූහ

355 තවද **සාලිය ජාතකයෙහි** කුමාර වැ "තමන් කා මරම්හ" යි සිතූ සජ්ජා තරවා උගුර ගෙණැ භූමියෙහි හෙළා දුරුවන්නාහු ද දැන් තමන්ගේ සිත්හි පවත්නා වූ ක්ලේශයන් දුරු කොටැ ක්ලේශොපද්‍රවයන් ගැළවෙන බවට පූර්ව නිමිත්ත දක්වන්නාහු ද ධර්මයෙන් ම දැක්වූහ.

356. තව ද **තවසාර ජාතකයෙහි** ග්‍රාමජාන දරක වූ සම් ප්‍රාප්ත වූ මරණයෙහි සෙසු ගම් දරුවන් දෙම්තස් පත් නො වන්නට අවවාද කොටැ තුමූ ද දෙම්තස් පත් නො වැ ප්‍රසන්න වූ මුඛ ඇති වැ රජ්ජුරුවන්ට බණ කියා සපරිවාර වැ මරණින් ගැළ වෙන්නාහු ද ධර්මයෙන් ම ගැළවුනාහ.

357. තව ද **මිතඥවිඳු ජාතකයෙහි** දිව්‍ය පුත්‍ර වූ ඔසුපත් තරකයෙහි හි වක්‍රායුධයෙන් හිස කැපෙන්නා වූ පුරුෂයා දැකැ ශාස්ථෘහ සන්තොෂයක් නැතිවීමෙහි ආදීනව වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

358. තව ද **පලාසි ජාතකයෙහි සුවණ්ණ හංස** වූ තමන්ට මිත්‍ර වූ වෘක්ෂ දෙවතාවාගේ විමානය පිහිටි ගසට විනාශ කර වූ නුගගස වැඩෙන බව කියා එයින් දුරුවන්නට උත්සාහ කරවා ද ඔහු එසේ නොකළ කල්හි ක්‍රමයෙන් වැඩී ගියා වූ නුග ගසින් ඔහුගේ විමානයට පිහිට වූ වෘක්ෂය නටකල්හි හංසරාජයා කිවා නො කෙළේ ඊතම් තමන් වදාළ අවවාද සිහිකරණ පරිද්දෙන් තිරිසන් වැ සිටැ දෙවතාවාට අවවාද දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කරණලද ධර්මය ම සරණ යෙමි. ඒ මට ඉක්බ'ඬී සිද්ධියට මහා වාරයෙකැ යි **දහම් සරණ යා යුතු.**

359 තව ද **දිඝිති කොසල ජාතකයෙහි දීර්ඝායුෂ්ක කුමාර** වූ මවුපියන් මැරූ රජ්ජුරුවන් හිසකේ අල්වා ගෙණැ කඩුව හයා ගෙණැ **"අනුන් කෙරෙහි මෙෂ නොකළ මැනැවසි"** මවුපියන් දුන් අවවාද සිහි කොටැ ගුරුවවකයට උලුඬ්ඝකයක් නො කරන්නා වූ "මා තොපට කළ අපරාධ මහත් වුව ත් තොපට කිසි ද්‍රොහයක් කට නො හෙමි" යි තමන් අත කඩුව සතුරු රජහු අතට දුන්නාහු ධර්මයෙන් ම දුන්හ.

360. තව ද **මිගපොතක ජාතකයෙහි** ශක්‍රදෙවෙන්දු වූ "වැඩූ මුවා මළහ" යි ශොක කරන්නා වූ තාපසයාගේ ශොක දුරුකරණ පිණිස දිව්‍ය ලොකයෙන් අවුත් අවවාද කියා ඔහුගේ ශොක දුරුකරන්නාහු ද ධර්මයෙන් ම දුරුකළහ.

361. තව ද **මූසික ජාතකයෙහි දිසාපාමොක් ආචාර්ය** වූ තමන් කෙරෙහි විද්‍යා'භ්‍යාස කළා වූ කුමාරයාට පුත්‍රයා විසින් වන උපද්‍රව දුරු කරන්නාහු ද ධර්මයෙන් ම දුරු කළහ.

362. තව ද **චුල්ලබ්‍රහ්මායු ජාතකයෙහි** ශක්‍රදෙවේන්ද්‍ර වැ "සමණන් අතැ කොපුව තබා, සොරු අතැ කඩුව තබා, සමණන් මරවා සොරහට අඹුවෙමි" යි සිතා "ඒ සොරහු විසිනුදු කෙළෙහි ගුණ නො දන්නා එකෙකැ" යි හැරැ ගිය කල්හි දෙතැනින් ම පිරිහි හඬන්නා වූ ගැහැණිය ගුන් තැනට කැණහිල් වෙසින් අවුත් මස් කැවියක බැහැ ගෙණැ යෙමින් සිටැ මස් වෙස් ගත් මාතලිහු දියෙන් ගොඩට පන්නා හා "මස් ගනිමි"යි කවැ තුබූ මස් ගඩුව හෙළා පියා ගිය කල්හි ලිහිණි වෙස් ගත්තා වූ **පඤ්චසිඛයා** මස් ගඩුව හැරැ ගෙණැ අහසට නැගී කල්හි මත්‍ස්‍යයා ද පැනැ දියෙහි හුණු කල්හි මවජ මාංශ දෙකින් පිරිහි තමන් දැකැ සී පූ - ඒ කෙළෙහිගුණ නො දන්නා ගැහැණියට අපහාස කරන්නාහු ද ධර්මයෙන් ම කළහ.

363. තව ද **ඛපෝත ජාතකයෙහි ඛපෝත** වැ ලොල් වැ කටුවා වූ කාකයාට අවවාද දී තමන් කී අවවාද නො ගෙණැ ඔහු කට සේ දැකැ බණ වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

364. තවද **ආවාරිය ජාතකයෙහි තාපස** වැ අවේෂයෙහි අනුසස් වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

365. තව ද **සෙනකෙතු ජාතකයෙහි පුරෝහිත** වැ චණ්ඩාලයා විවාළ ප්‍රශ්න කියා ගත නොහී තමන් ගේ අත වැස්සා ඔහු ඇට පස්සෙන් ගිය කල්හි ඒ ප්‍රශ්නයෙහි අර්ථ බුද්ධ විලාසයෙන් වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

366. තව ද **දරීමුඛ ජාතකයෙහි බරණාස් රජ** වැ පසේ බුදුන් ගේ අවවාද අසා රාජ්‍යය හැරැ මහණ වන්නාහු ද ධර්මයෙන් ම මහණ වූහ.

367. තව ද **සුනෙරු ජාතකයෙහි සවණ්හංස** වැ වසන්නා හු ද සියලු සත්ත්වයන් එකවණ් කරන්නා වූ පර්වතය දැකැ "මේ පර්වතය උත්තමා'ධම දෙපක්‍ෂය ම එකවණ් කරණ පර්වතයෙක. ගුණා'ගුණ විභාග කරණ තැනෙක්හි මුත් මෙසේ වූ තැනැ වසන බව සුදුසු නොවෙ යි" කියා ඒ පර්වතය හැරැ යන්නාහු ද ධර්මය ම කියා ගියහ.

368. තව ද **ආසඬ්ක ජාතකයෙහි තාපස්** වැ පදමගහී යෙන් ගෙණැ වැඩූ දියණියන් රජහට දෙන්නාහු දැන් තමන් ලද නිර්වාණ සම්පත්තිය ලෝවැස්සාට දෙන බවට පූර්වනිමිත්ත දැක්වූහ.

369. තව ද **මිගලෝප ජාතජකයෙහි ගිජ්ඣලිනිණ්** වැ තමන් ගේ අවවාද නොගත්තා වූ ගිජ්ඣ පොතකයා වෙරම්බ වාතයෙහි නට බව පැ සෙසු ගිජ්ඣයන්ට අවවාද දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

370. තව ද **ඝටිකාලඝණකී ජාතකයෙහි** බරණැස් සිටුවැ තමන් ගේ ගහන්හි ගැවී ගිය ශ්‍රී දෙවතාවා සියලු දෙවතාවන් මැඩැ අනුතත්විල ගැළී නහා නිවෙන පරිද්දෙන් කරන්නාහු දැන් තමන් ගේ ධර්මයෙහි පා හළවන සියලු සත්ත්ව ලොකයා මැඩැ අමෘත මහා නිර්වාණයට වැදූ සැනහෙන බවට පූර්ව නිමිත්ත දක්වූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභ්‍යාස කරණ ලද **සච් ධර්මය මා**[1] මට සියලු අඟ මතා' ඒව සාධා දෙන්නේය සි දහම් සරණ යා යුතු.

371. තවද **කුක්කුට ජාතකයෙහි** කුකුළු වැ සිටි බැලළගේ වංඤවා දැනැ ඇ අතින් ගැළවෙන්නාහු ද ධර්මයෙන්ම ගැළ වුනාහ.

372. තව ද **ධර්මධවජ ජාතකයෙහි පක්ෂි රාජ වැ** "තපස් වීමි"සි කියා අඥන පක්ෂීන් බඳ ගෙණැ ඔවුන් ගේ බිජුවට කන්නා වූ කවුඩුවා ගේ වඤ්චායෙන් පක්ෂීන් රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

373. තව ද **නන්දිය රාජ ජාතකයෙහි** මුව වැ සිටි මවු පියන් රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

374. තව ද **බුරපුත්ත ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර වැ** අඩුවට මන්ත්‍රය කියා ගිනි වදනා රජහු කෙරෙහි කරුණායෙන් දිව්‍යලොකයෙන් අවුත් ඕහට ජීවිත දානය දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

375. තව ද **සුචි ජාතකයෙහි කඹුරු වැ** කඹුරු පෝරු වෙයෙහි හිදිකටු විකොවැ සියලු දඬුවිවි වැසි කම් කාරයන් කොහත හුණු කඹුරු දුව ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

376. තව ද **සඞ්ඛ කකිටක ජාතකයෙහි බ්‍රාහ්මණ වැ** තමන් ගේ මිත්‍ර වූ කකුළුවා ගේ බලයෙන් තමන් කා මැරූ සර්පයා දැක ඕහට උපදෙස් දුන් කවුඩුවා හා දෙදෙනා කෙරෙන් වන උපද්‍රවයෙන් දුරුවැ ජීවිත ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

377. තව ද **මච්ඡඛ සකුණ ජාතකයෙහි මහා ධන සිටු වැ** සියලු වසතුව හැරැ මහණ වැ තමන් කර වූ දන්හල විදහා දන් පිරිහෙළූ මල්හට බණ කියා දන්හල් පෙර පරිද්දෙන් පවත්වන්නා හුද ධර්මයෙන් ම පැවැත්වූහ.

1· සද්ධර්මය මූ.

378. තව ද **පඛ්ඛජීත විහෙඨ ජාතකයෙහි ශක්‍ර දෙවෙන්ද්‍ර වූ තපස්වී** වෙශධාරී වූ දිව්‍ය විදූධරයා බිසවුන් හා කළ අනාචාර දැකැ තපස්වීන් කෙරෙහි කලකිරුණු රජහු කෙරෙහි කළ කරුණා යෙන් පසේ බුදු කෙණෙකුන් වහන්සේ පළමු කොටැ ලා තමන් වහන්සේ වැඳැ වැඳැ ආකාශයෙහි සිටැ රජ්ජුරුවන් අවුත් "ශක්‍ර දෙවෙන්ද්‍ර වැ සිටැ මේ තපස්වීන් කුමක් පිණිස වඳුදැ"සි කී කල්හි තපස්වීන්ට කරණ තමස්කාරයෙහි අනුසස් දක්වා රජහු හා ලෝ වැස්සන් කුසල්හි යොදන්නාහු ද ධර්මයෙන් ම යෙදූහ.

379. තව ද **උපසිඛ්ඨ පුප්ඵ ජාතකයෙහි තපස්වී වැ** තෙලුම් මල හිඳිමින් සිටැ "සුවඳ සොරය"සි හඬ ගැහැ වූ දෙවතාවා ගේ බස් අසා "එපමණකුදු දුශ්චරිතයෙක් වතැ"සි එයින් දුරු වන්නාහු ද ධර්මයෙන් ම දුරුවූහ.

380. තව ද **විසාසාද ජාතකයෙහි ශක්‍ර දෙවෙන්ද්‍ර වැ** සිටැ වලව වැදූ මහණ වැ තපස් තො කොටැ කෙලෙසි වසන්නා වූ තපස්වීන් කෙරෙහි අනුග්‍රහයෙන් ගිරා වෙසින් අවුත් බණ කියා ඔවුන් තපස්වී බැවිනි පිහිටු වන්නාහු ද ධර්මයෙන් ම පිහිටුවූහ

381. තව ද **වටටක ජාතකයෙහි වටු වැ** ප්‍රණීත හොජන කෑ කවුඩුවා ලද දෙයෙහි සන්තොෂයක් නැති හෙයින් කෘශවන බව අසා තමන් අම්බුර හොජනය අනුභව කරතුදු ලද දෙයෙහි සන්තොෂ ඇති හෙයින් සථුල වන බව වදරන්නාහු ද ධර්මයෙන් ම වදළහ.

382. තව ද **කාක ජාතකයෙහි පරෙවි වැ** ලොල භාව යෙන් බරණැස් රජ්ජුරුවන්ගේ මුළුතැන්ගෙට වැද නටුවා වූ කාකයා දැකැ ලොලත්වයෙහි ආදීනව හා අලොලත්වයෙහි අනුසස් මෙතෙහි කරන්නාහු ද ධර්මයෙන් ම මෙතෙහි කළහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි මෙතෙහි කරණ ලද්දා වූ ධර්මය ම **සරණ** යෙමි යි ඒ ම මට ඉෂ්ටා'නිෂ්ට සාධා දෙන්නා වූ දිව්‍ය මන්ත්‍රයෙකැ යි **දහම් සරණ යා යුතු.**

383. තව ද **කුක්කු ජාතකයෙහි පණ්ඩිතාමාත්‍ය වැ** අධාර්මික වූ රජ්ජුරුවන්ට "කැණි මඩල සථිර වුවහොත් ගොණැස් සථිර වෙයි ගොණැස් සථිර වුවහොත් අමාත්‍යාදි සියලු රාජ්‍යය සථිර වෙයි. රාජ්‍යය සථිර වූ කල්හි රජ ද සථිර වන්නේය"සි අවවාද කියා අධර්මිෂ්ඨ වූ රජහු ගේ අධර්මය හරවන්නාහු ද ධර්මයෙන් ම හැරවූහ.

384. තව ද මනොජ ජාතකයෙහි සිංහ රාජ වැ තමන් ගේ ධර්මඥ වූ අවවාද නොගිවිසැ "සිංහයා රජ්ජුරුවන් ගේ අඟ ශාලායෙහි අසුන් ගන්මි"යි විනාශයට පැමිණි බව දක්වන්නාහු ද අද දක්වා තමන් ගේ ධර්මය නො වරදවා ලෝවැස්සන් පිළිගත මනා බවට පූර්ව නිමිත්ත දක්වූහ.

385. තව ද සුතන ජාතකයෙහි තමන් ගේ ප්‍රඥා බලයෙන් යක්ෂයා අතින් ගැළවෙන්නාහු ද ධර්මයෙන් ම ගැළවුනාහ.

386. තව ද ගිජ්ඣ ජාතකයෙහි ගිජුලිහිණි වැ සිටැ මලෙහි බැඳි තමන්ට වන විනාශය නො සිතා තමන් විසින් රක්ෂාවන මවු පියන් දෙදෙනා ගේ අනාථ කමට ශොක කොටැ හඬා මලින් ගැළ වෙන්නාහු ද ධර්මයෙන් ම ගැළවුනාහ.

387. තව ද දබ්භපුප්ඵ ජාතකයෙහි වෘක්ෂදෙවතා වැ ඉපද අනුන් සතු මාංස විලොපනය කරන්නා වූ ශෘගාලයා ගේ වඤ්චා ප්‍රයොග දන්නාහු ද ධර්මයෙන් ම දන්හ.

388. තව ද දශාර්ණක ජාතකයෙහි පණ්ඩිතා'මාත්‍ය වැ කෙලඹ වසඟ වැ චෛතසික රොගයෙන් මියැ යන්නා වූ රජහු තමන් ගේ අවවාදයෙන් රක්ෂා කරන්නාහු ද ධර්මයෙන්ම රක්ෂා කළහ.

389. තව ද සතතුනතත ජාතකයෙහි ධර්මකථික වූ සෙනක පණ්ඩිත වැ බ්‍රාහ්මණයා ගේ පසුම්බියේ හොත්තා වූ තයි ප්‍රඥා චක්ෂුසින් බලා ඔහු ගේ දුක් මුදා මරණින් ගළවා සුවපත් කරන්නා හු ද ධර්මයෙන් ම කළහ.

390. තව ද අවකීර්ණ ජාතකයෙහි රජහු විසින් රාජ්‍ය යෙන් පැවරුව ද "යාඥ තම් තපස්වී වූ මට සුදුසු දෙයෙක් නො වෙයි" කියා කිසිවක් නො ඉල්වන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

391. තව ද කපි ජාතකයෙහි වඳුරු වැ සිටැ පුරොහිතයා හිසැ වර්චස් ලූ අවිනීත වානරයා නිසා වන උපද්‍රව දැකැ තමන් ගේ සෙනෙහ හැරැ ගෙණැ ගොස් ඔහු පක්ෂීන් හා කැටි වැ අම්බිල පාණ්ඩු නවන කල්හි තමන් හා තමන් ගේ සෙනෙහ කිසි උපද්‍රවය කට පැමිණිය නො දී රක්ෂා කරන්නාහු ද ධර්මයෙන්ම රක්ෂා කළහ.

392. තව ද බ්‍රහ්ම ජාතකයෙහි කප්ප නම් තාපස වැ නාරද නම් අමාත්‍යයා විසින් හිමාලයට ගෙණැ ඛෙමව නම් තාපස යා ගේ රොගය තමන් ගේ දර්ශන මාත්‍රයකින් ම සංසිඳුවන්නාහු ද ධර්මයෙන් ම සංසිඳුවූහ.

මෙසේ මාගේ සැමියන් විසින් අනන්‍ය ජාතියෙහි පුරුදු කරණ ලද ධර්මය ම සරණ යෙමි යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ** යා යුතු.

393. තව ද, **ගඞ්ගාර ජාතකයෙහි** රාහු ගත්තාවූ චන්ද්‍ර මණ්ඩලය දැක එපමණක් ආලම්බණය කොටැ රාජ්‍යය හැර මහණ වැ තමන් වහන්සේගේ මහණ වූ බැව් අසූ විදෙහ රජ්ජුරුවනුදු තමන්ගේ රාජ්‍යය හැර පියා මහණ වැ තමන් වහන්සේ හා කැටිවැ ග්‍රාමා'න්තයට අවුත් සෙවට ය''යි පතක ලුණු අසුරක් නැබුවා දැක රාජ්‍යයක් හැර පියා "ලුණු මාත්‍රාවෙකැ ලොභ කළ සේ නුසුදුසු"යයි අවවාද දෙන දැ ද ධර්මයෙන් ම අවවාද දුන් සෙයක.

394. තව ද **මහාකපි ජාතකයෙහි** වානර වූ ජීවිත සංසයට පැමිණියා වූ අසූ දහසක් වදුරන් පිටින් එතර කොටැ අන්තයෙහි කෘතඥ වූ වදුරා පිටින් පළාපි කල්හි තමන් ක්ෂමාවැ වසන්ට කැප සප්ටික විමානයෙහි සොදුළු හොණැස්සේ පරාල ඇට පැණිහිය කල්හිදු මාගේ දස පක්ෂයා[1] ගැළවුණු බැවින් මට මරණ වූව ත් කිසි චිත්ත බෙදයෙක් නැතැයි සැතහි වැඩැ හෝනාහු ද ධර්මයෙන් ම වැඩැ හොත් සෙයක.

395. තව ද **කුම්භකාර ජාතකයෙහි** කුම්භකාර වූ මද අරමුණක් දැකැ සංසාර සාගර වෛරාග්‍යයෙන් පසේ බුදුව මහතුන් දැකැ පමපතතිය හැර මහණ වන්නාහු ද ධර්මයෙන් මහණ වූහ.

396. තව ද **දළහධම්ම ජාතකයෙහි පණ්ඩිතා'මාත්‍ය** වූ ශක්ති ඇති ද මෙහෙ ගෙන අශක්ති ද කිසි ගොචරයක් නො දී රජ්ජුරුවන් විසින් අනාථ කොටැ හරන ලද්ද වූ තිරිසන් වූ ඔටු දෙනගේ අනාථකම් දැක රජ්ජුරුවන් කරා එළඹැ කෙළෙහි ගුණ දන්මෙහි අනුසස් දක්වා ඇවි පෙරපරිද්දෙන් සත්කාර සම්මාන තබා දෙන සෙයෙක් ද ධර්මයෙන් ම තබා වදුළ සෙයක.

397. තව ද **සොමදත්ත ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර** වූ බොහෝ අඹුදරුවන් හැර මහණවැ ඇත් පැටවෙක්හු පුත් කොටැ වඩා ඔහු මළ කල්හි ශොක කරන්නා වූ තපස්වීහු ක්‍රමා එළඹැ ඔහුගේ ශොක දුරුකරන්නාහු ද ධර්මයෙන් ම දුරු කළහ.

398. තව ද **සුසීම ජාතකයෙහි පුරෝහිත** වූ තමන්ගේ රූපය දුටුවා වූ රජ්ජුරුවන්ගේ මැනියන් තමන් සෙනහ කොටැ ශොකා'තුර වැ ප්‍රතාන්‍රුවන් කෙරෙහි පොවා ලජ්ජාවක් නැති වැ තමන් පිණිස වූ ශෝක කියා තමන් ඉල්වා ගන්නා පරිද්දෙන්

1. දස ජනයා—

රූපසම්පත්ති ඇති වෑ එම කාරණයෙන් තුමූ රජ වෑ මැනියන් පාවා දුන් රජ්ජුරුවන් යුවරජ කොටැ රජ්ජය කෙරෙමින් සිසවුන් "හිස තරයෙකැ"යි අත කඩා ලා ලූ මාත්‍රයෙකින් ම ඉහ වාසයෙහි ආදීනව දැකැ මහණවන්නාහු ද ධර්මයෙන් ම මහණවූහ.

399. තව ද **සෝණසිඞ්ගාලි ජාතකයෙහි වෘක්ෂ දෙවතා වෑ** ශබ්දකා කළමනා සථානයෙහි ශබ්දකා කරන්නාහු ද ධර්මයෙන් ම ශබ්දකා කළහ.

400. තව ද **ධූමකාරී ජාතකයෙහි විධුරපණ්ඩිත වෑ** "අමුතු වෑ ඇති වූ දෘසයන්ට සත්කාර කෙරෙමි"යි පෙර තිබී ආ දෘසයන්ට සත්කාර නො කොටැ යුද්ධයෙහි පැරැදි රජ්ජුරුවන්ට දිව්‍ය විලාසයෙන් අවවාද කියා සියලු කටයුත්තට වඩා කුශල සංග්‍රහය ම කවයුතු බව දක්වා ඔවුන් දැනා'දී සුචරිතයෙහි පිහිටුවන සෙයෙක් ද ධර්මයෙන් ම පිහිට වූ සෙයක.

401. තව ද **ජාගර ජාතකයෙහි තපස්වි වෑ** සිටැ සියලු මහාජනයා නිද්‍රාප්‍රාප්ත කල්හිදු මනසකාරයෙහි නිරත වෑ නිදි දුරු කොටැ සක්මණින් කල්යවා ඒ අනලස කමට සතුටු වූ වෘක්ෂ දෙවතාවන් අතින් සකුනි ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

402. තව ද **කුම්මාසපිණ්ඩ ජාතකයෙහි අනාථ වෑ** සිටැ කොමු පිඬක් දී රාජ්‍යය ලදින් ජාතිසමරණ ඥානයෙන් තමන් කොමු පිඬක් දීලා රාජ්‍යය ලත් බව සිහි කොටැ "මම මේ සා රාජ්‍යයක් කොමු පිඬක් දීලා ලදිමි"යි කී කල්හි මහජනයා මා කෙරෙහි අවමානය කෙරෙති' යි නො සිතා මහජනයා මධ්‍යයෙහි කොමු පිඬක් දීලා තමන් රාජ්‍යය ලත් බව හඟවා දේවින් ඇතුළු වූ සියලු නුවර වැස්සන්ට දැනයෙහි අනුසස් දක්වන්නාහු ද ධර්මයෙන් ම හැඟවූහ.

403 තව ද **පරණතප ජාතකයෙහි රජ වෑ මනුෂ්‍ය වෑ** සිටැ කැණහිලුන්ගේ බස අවී දන්නාහු ද දැන් තමන් බුදු වෑ කිහිඹි-කුහුඹුවන් ආදි වූ සියලු සත්ත්වයන් භාෂිතයෙහි අවී දැන ඔවුන්ගේ අභිප්‍රාය දැන බණ වදාරණ බවට පූර්ව නිමිත්ත දක්වූහ.

මෙසේ මාගේ ස්වාමීන් විසින් අනන්ත ජාතියෙහි අනෙකා' කාරයෙන් භාවිත කරන ලද්දා වූ සද්ධර්මය ම මට සියලු අභිමතා'ර්ථ සාධා දෙන කල්ප වෘක්ෂයෙක. එහෙයින් ඒ ම මට අසාධාරණ වූ ශරණයෙකැ යි දහම් සරණ යා යුතු

404. තව ද **කුම්මාසපිණ්ඩ ජාතකයෙහි** ශක්‍රදෙවෙන්ද්‍ර වැ "ධම්මඝ මෙලේඝ"යි කියා හඬන්නා වූ මැහැල්ල සිටි තැනට ආකාශයෙන් අවුත් "ලෝකයෙහි ධර්මය නම් නො මෙලේ මා ඇති කල්හි ධර්මයෙක් නම් නැද් ද? ධර්මයක් නැති කල්හි මා නම් ඇද්දැ"යි වදරන්නාහු ද ධර්මයෙන් ම වදළහ.

405 තව ද **අට්ඨසදද ජාතකයෙහි තාපස** වැ යාගයට බැඳැ සිටුවූ ප්‍රාණීන් ගළවා ලොවට ශාන්ති කරන්නාහු ද ධර්මයෙන් ම ශාන්ති කළහ.

406. තව ද **කුලඝා ජාතකයෙහි වෘක්ෂ දෙවතා** වැ තමන් ගේ උපාය ශක්තීන් සොරහු මරන්නා වූ ගණිකාව දක්නාහු තමන්ගේ ප්‍රඥා බලයෙන් සංසාරය මූලෝච්ඡින්න කරණබවට පූර්වනිමිත්ත දැක සිටි සෙයෙක.

407. තව ද **සුමඛගල ජාතකයෙහි රජ** වැ සිටැ සතීඥ විලාසයෙන් රාජ ධර්මය කියන්නාහු ද ධර්මයෙන් ම වදළහ.

408. තව ද **ගඛගමාල ජාතකයෙහි උදය නම් රජ** වැ එක් රැයක් රැක්කා වූ සීලය කරණකොටැ ගෙණැ බාරාණසියෙහි රාජ්‍යය ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

409. තව ද **චෙතියරාජ ජාතකයෙහි කපිල බ්‍රාහ්මණ** වැ තමන්ගේ අවවාද නො ගිවිසැ බොරු කී රජහු අපායෙහි හෙන පරිද්දෙන් ලොවට ඉෂ්ට වූ අවවාද දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

410. තව ද **ඉන්ද්‍රිය ජාතකයෙහි සරභඞ්ග තාපස** වැ පඤ්ච කාම'ස්වාදයෙහි ලොභයෙන් ධ්‍යානයෙන් පිරිහුනු තපස්වීන්ට අවවාද කොටැ ධ්‍යානය නැවත උපදවන්නාහු ද ධර්මයෙන් ම ඉපැදූ වූහ.

411. තව ද **ආදිත්‍ය ජාතකයෙහි හරත මහරජ** වැ දක්ෂිණාවට සුදුස්සවුන් නෝරා මහාඵල වූ දන් දී අමෘත මහා නිර්වාණය සාධන්නාහු ද ධර්මයෙන් ම සැදූහ.

412. තව ද **අට්ඨාන ජාතකයෙහි ශ්‍රේණි පුත්‍ර** වැ දහසක් ගන්නා ගැණියට දවසින් දවස දැහැසක් දහසක් බැගින් දී එක් දවසක් රජගෙයි සිටැ කල්හිය හෙයින් ගෙට ගොසින් දහසක් ගෙණැ යා නො හී "මෙතෙක් දා මා නිබඳයෙන් ම දහස් දහස් බැගින් ම දුන. අද එක දා සිස'නින් හිය හෙයින් මට රැහණී වේ ද? සෙට දෙදහසක් එක් කොටැ දීලම්" යි සිතා සිස'නින් ගොස් නිකම් හිය බැව් දන්නා වූ වෙශ්‍යාව එතෙක් කල් දවස් පතා දුන් වසතු නො සිතා "සෙට දිවුණු දෙම් යි කියව කියවා

අනුභව කැමැති බව මුත් වස්තුවට සිතහැති එකෙකැ" යි කියා කර සප්පා දෙර ලවා පි කල්හි "ගැහැණුන්ගේ ආදීනව මෙසේ වකැ" යි සිතා පඤ්චකාමයෙන් ප්‍රයොජන නැතැයි සිතා සියලු සමාධි තාක් හැරැ පියා මහණ වැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්මලොකයෙහි උපදනාහු ද ධර්මයෙන් ම උපන්හ.

413. තව ද **දිසා ජාතකයෙහි තපස්වී වැ** සිවැ දිවියා අත හුනු ඒ ලියගේ විනාශ දක්නාහු ද තමන්ගේ විශුද්ධ වූ ඥානයට හමු වූ කෙලෙසයන්ගේ විනාශ දැක්මට පූර්වනිමිත්ත දැක්වූහ.

414. තව ද **ගිජ්ඣ ජාතකයෙහි ගිජ්ඣලිඛිණී වැ** තමන්ගේ අවවාදයෙහි නො සිටියන්ට වත විනාශ හා එහි සිටියවුන්ට වත අවිනාශය දක්වන්නාහු ධර්මයෙන් ම දුටහ.

415. තව ද **මහාසුව රාජ ජාතකයෙහි හා චුල්ල සුවරාජ ජාතකයෙහි ගිරා වැ** සා මල් පල රුක් බල බලා පුරුදු වූ දිඹුල් කණුව නො හැරැ තමන්ගේ ගුණයෙහි ප්‍රසන්න වූ ශක්‍ර දෙවෙන්ද්‍රයා ලවා ඒ රුක අමාත ඵලයෙන් යුක්ත කොටැ සමාධ කරවන්නාහු ද ධර්මයෙන් ම කරවූහ.

මෙසේ මාගේ සවාමින් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභිවාර්ධියට පමුණුවා ලොවට සියලු ඉෂ්ටා'ර්ථයට මුල් කොටැ තබා වදාළ ධර්මය සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

416. තව ද **හරිතව ජාතකයෙහි** දෙර අඩවාළු කොටැ වැඩැ හිඳැ කෂිණය බැලූ මාත්‍රයකින් ම තව ධ්‍යානය උපදවා ගන්නා වූ ශක්ති ඇති වැ පවා රාග වසඟ වැ ධ්‍යානයෙන් පිරිහෙන සෙයෙක් ද දැන් තමන් වහන්සේ වදාරන්නා වූ කෙලෙසයන්ගේ ආදීනවය දක්නා බවට පූර්වනිමිත්ත පැ සේක.

417. තව ද **පද මානවක ජාතකයෙහි** ආකාශයෙහි සොරුන්ගේ පියවර දක්නා සෙයෙක් ද දැන් තමන් වහන්සේ කා විසින්හුත් නො දත හැක්කා වූ **චතුරාර්ය සත්‍යයයන්** දක්නා බවට පූර්ව නිමිත්ත පැ සෙයෙක.

418. තව ද **ලොමස කාශ්‍යප ජාතකයෙහි චන්ද්‍රවතී නම් බිසවුන් පිණිස තාපස වැ** සිවැ ඇතු මරමි" යි කඩුව හයාගෙණැ ඔහුගේ ආර්තස්වරය අසා කාන්තාරයෙහි පුත්‍ර මාංස කන්නට යි අල්වා ගත් එකක්හු ඔහු හැඹූ හඬට කරුණා කොටැ අත ඇදැ ගන්නා සේ මරන්නට ගත් කඩුව හෙළා පියා "ක්ලෙශ වසඟ වැ ප්‍රාණ වධ නො කෙරෙමි" යි ප්‍රාණාතිපාතයෙන් දුරුවන්නාහු ද ධර්මයෙන් ම දුරු වූහ.

419. තව ද **චක්‍රවාක ජාතකයෙහි** සක් වා වැ ද ලොල වූ කාකයාට තමන් අනුන්ට හිංසාවක් කොා කිරීමෙන් වණී සම්පත්තිය වඩනා බවට කාරණා දක්වන්නාහු අවෙෂයෙහි අනුසස් වැදෑරීමෙන් ධර්මයට ම අනුග්‍රහ කළහ.

420. තව ද **හලිද්දරාග ජාතකයෙහි තාපස** වැ සිටැ තපස්වී කුමාරයන්ට අසත්පුරුෂ ගුණයෙහි සවරූප දක්වන්නාහු ද ධර්මයෙන් ම දූක්වූහ.

421. තව ද **සමුගග ජාතකයෙහි දූනවරාක්ෂසයා** බඩැ හොත්නා වූ සත්‍රිය සොර සැම් වූ විදූධරයා හා දෙන්නා ප්‍රඥාබල යෙන් දක්නාහු සත්වයන්ගේ සිත්හි පවත්නා වූ කා විසිනුත් කොා දත හැක්කා වූ තෘෂ්ණාව හා දොෂය හා දෙක බුදු නුවණින් දක්නා බවට පූර්වනිමිත්තා දූක්වූහ.

422. තව ද **පූතිමංස ජාතකයෙහි වෘක්ෂ දෙවතා** වැ පූති මාංශ පයෙෂ්ඨණය කරන්නා වූ ශෘගාලයාගේ සවරූප දක්නාහු දූන් කාම ලොල වූ සත්වයාගේ සවරූප දක්නා බවට පූර්ව නිමිත්තා දූක්වූහ.

423. තව ද **තිතතිර ජාතකයෙහි වවූ** වැ සිටැ වෙදත්‍රය උගන්නාහු ද තමන්ගේ ප්‍රඥ ප්‍රකර්ෂය ත්‍රිභුවනා'තිශායි වන බවට පූර්ව නිමිත්තා දූක්වූහ.

424. තව ද **චතුවාර ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර** වැ කොා කිකරු බැවින් නටුවා වූ **මහාතිඤ්ඤකයාගේ** තීව්‍ර වූ දුඃඛානුභවය දක්වන්නාහු ද ධර්මයෙන් ම දූටහ.

425. තව ද **කණ්හ ජාතකයෙහි තපස්වී** වැ සිටැ මනුෂ්‍ය වූ තමන් කරා ආවා වූ ශක්‍රදෙවෙන්ද්‍රයා සතුටු වැ "වරගන්ව" යි කී කල්හි සියලු අභිමතා'ර්ථයන් ශක්‍රයා විසින් සිද්ධවතුදු බ්‍රහ්මචරියා නිශ්‍රිත වූ වර ගන්නාහු ද ධර්මයෙන් ම ගත්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්තා ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභ්‍යාස කොටැ පුරුදු කරණ ලද්දා වූ ධර්මය සරණ යෙමි යි **දහම් සරණ සා යුතු.**

426. තව ද **චතුපොසථික ජාතකයෙහි** ක්‍රොධ කටයුත්තහු කෙරෙහි ක්‍රොධ නොා කිරීමෙහි අනුසස් වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

427. තව ද **ශඛබ්‍රාහ්මණ ජාතකයෙහි ශඛබ්‍රාහ්මණ** වැ මහා සමුද්‍රයෙහි නැවූ බිදී සත්වයක් මුහුදු පිකා නැවූ කැඟෙණ සමයෙහි පසේ බුදුන් වහන්සේට පිළිගැන්වූ වහන් සඟලෙහි අනුසසින් මුහුදු මධ්‍යයෙහි තම් දෙවිදුව මැවූ සත්රුවන් මහ කැව ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

428. තව ද **චූළලඛෝධි ජාතකයෙහි** බෝධි තාපස වැ ගෘහස්ථ සමයෙහි පාදපරිචාරිකා වැ මහණ වන සමයෙහි කැපි වැ මහණ වූ බුදුවන දවස් දක්වා නො හැරැ අඹු වූ පරිබ්‍රාජිකාවන් ක්ලෙශ වසඟයෙන් බලා හඬව හඬවා උයනින් රජ ගෙට ගෙණැ යන කල්හි ඔවුන්ගේ හඬ අසා චිත්තයෙහි ශොක මාත්‍රාවක් නො උපදවන්නාහු ද ධම්මයෙන් ම නො ඉපැදුවාහ.

429. තව ද **කණ්හදීපායන ජාතකයෙහි** තාපස වැ පණස් හවුරුද්දක් මුළුල්ලෙහි කාම වසඟවැ ද චිත්තයෙහි බලවත් වූ කාමරාගය පවතුදු රාග වසඟ වැ කිසි කාය ප්‍රයොගයක් වත් වාක් ප්‍රයොගයක් වත් නො කරන්නාහු ද ධම්මයෙන් ම නො කළාහ.

430. තව ද **නිග්‍රොධමිග ජාතකයෙහි** නිග්‍රොධරජ වැ අකෘතඥ වූ ශාඛා කුමාරයාගේ කෙළෙහි ගුණ නො දැන්මට නිදු කරන්නාහු ද ධම්මයෙන් ම නිදු කළාහ.

431. තව ද **තක්කාල ජාතකයෙහි** පණ්ඩිත කුමාර වැ සත්‍රී වසඟ වූ පියානන්ට බණ කියා ගැහැණියගේ බසින් තමන්ගේ පියානන් මරා නරකයෙහි අනන්‍ත කල්පයක් මුළුල්ලෙහි දුක් ගන්නා පියානන්වහන්සේ ගළවන්නාහු ද ධම්මයෙන් ම ගැළවූහ

432. තව ද **මහා ධම්මපාල ජාතකයෙහි** ධම්පාල කුමාර වැ පඤ්චශීලය රක්‍ෂාකොටැ වැළඳුවමනා පරමායුසයෙන් එක අසයෙකුදු නො හැරැ වළඳන්නාහු ද ධම්මයෙන් ම වැළඳුහ.

433. තව ද **කුක්කුට ජාතකයෙහි** කුක්කුට නම් පක්‍ෂි වැ තමන් වහන්සේ මරන්නට ප්‍රයොග කළා වූ උකුස්සා අතින් ගැළවෙන සෙයෙක් ද ධම්මයෙන් ම ගැළවුනු සෙයෙක.

434. තව ද **මටටකුණ්ඩලී ජාතකයෙහි** මියැ දිව්‍ය පුත්‍ර වැ තමන් වහන්සේ පිණිස හඬන්නා වූ පියානන් වහන්සේගේ ශොක දුරුකරණ පිණිස දෙව්ලොවින් අවුත් බණ වදාරණ සෙයෙක් ද ධම්මයෙන් ම වදාළ සෙයෙක.

435. තව ද **බිලාළ ඛොසිය ජාතකයෙහි** ශක්‍රදෙවෙන්ද්‍ර වැ තණපතක් අගැ වැදගත් තෙල බිඳු මාත්‍රයකුදු ලොභයෙන් අනුන්ට නො දෙන්නා වූ සිටුහට අනුග්‍රහ කරණු පිණිස දෙව් ලොවින් අවුත් බණ වදාරා ගිය ජාතියෙහි දන් දී තමන් වහන්සේ දිව්‍ය වූ බව ප්‍රකාශ කොටැ මසුරු සිවානන් එතැන් පටන් කොටැ නිවන් දක්නා ජාති දක්වා ඔවුන් තමන් ලද්දා වූ සුණු සුඟකුදු අනුන්ට නො දී නො කන පරිද්දෙන් දැනා'භිරත කාණ සෙයෙක් ද ධම්මයෙන් ම කොටැ වදාළ සෙයෙක.

මෙසේ මාගේ සැමියන් විසින් අතෙත ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් ලොකා'ඤ්ඤ තත්පර වැ පුරුදු කරණ ලද්දා වූ සද්ධර්මය ම සරණ යෙමියි **දහම් සරණ** යා යුතු.

436. තව ද **චක්‍රවාක ජාතකයෙහි** සක්වා වැ බ්‍රාහ්මණයා යෙහි හසුනි කුණපාදීන් අතෘප්ත වැ මහා හිමාලයට වැදූ එහිදු පලාපලයෙන් අතෘප්ත වැ ගඩාතිරයට ගොස් තමන් දැකැ "මුන් ඉතා යහපත්— බොහෝ මත්‍යා මාංශ කන හෙයින් වත. "ඔවුන් කන ආහාරය මාත් කව මැනවැ යි" සිතා "තෙපි කවර ආහාරයක් කා වර්ණ සම්පන්න වූ දැ" යි විචාළ කාකයාට— සෙවෙල් මාත්‍රයක් කා ලත් දෙයෙහි සන්තෝෂයක් ඇති හෙයින් වර්ණ සම්පත්ති ඇති බවට කාරණා වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

437. තව ද **භූරිපඤ්ඤ ජාතකයෙහි** ප්‍රඥා සම්පත්තියෙහි ගුණ දන්නාහු ද ධර්මයෙන් ම දත්හ.

438. තව ද **මහාමඞ්ගල ජාතකයෙහි** මනුෂ්‍ය වැ සිටැ සියලු මනුෂ්‍යයන් ගේ හා දෙවියන් ගේ හා බ්‍රහ්මයන් ගේ සිත සැක හැරි **මඞ්ගල ප්‍රශ්න** වදාරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

439. තව ද **ඝතපණ්ඩිත ජාතකයෙහි** ඝත පණ්ඩිත වැ මළ පුතනුවන්ට හඬන්නා වූ වාසුදෙව නම් බැනන් දැකැ ඔවුන් ගේ ශොක දුරුකරණ උපාය සිතා තුමූ විඟරු වෙස් ගෙණැ "සහ වක දෙව! සහවක දෙව[1]" යි හඬා ළිපියෙහි දිවෙමින් තමන් විඟරුහුණු බව ඇසූ වාසුදෙව නම් රජ්ජුරුවන් පුත්‍ර ශොකයට වඩා තමන් කෙරෙහි කළ ශොකයෙන් අවුත් "තොප කවර සාවකට හඬන්නේ ද" යි විචාරා "මා අනික් සාවකට නොවෙ යි හඬන්නේ— චන්ද්‍රමණ්ඩලයෙහි සාවට" ය යි කී කල්හි තෙපි අඥාන කෙණෙකු ද? සඳමඩලෙහි තුබූ සාවා කෙසේ ලැබේ දැ? යි කී කල්හි මහරජ! මට වඩා උම්මත්තකයා තොපි ය. මම වූ කලි පැණෙන්නා වූ සාවාට හඬමි. තෙපි වූ කලි "මෙ තැනට ගියේ ය— මෙ තැන හුන්නේ ය යන විභාගයක් නැති වැ ම මළ පුතනුවන්ට හඬනේ" යි අවවාද කියා ඔවුන් ගේ සිත සොක දුරුකරණ සෙයෙක් ද ධර්මයෙන් ම ශොක දුරු කොටැ වදාළ සෙයෙක.

440. තව ද **මාතුපොසක ජාතකයෙහි** ඇන් වැ සිටැ දෙදළ අල සාරා, කෙටි කොටැ සොඩ ඵලාඵල ඇදැ, පිඬා කොටැ සොඬ සිදුරින් මැනියන් වහන්සේ ඇඟ තෙමා ගිම් නිවා, අදනා

---

1. සාවක දෙව- සාවක දෙව-

පැනින් නො පමා කොටැ මැනියන් වහන්සේ රක්‍ෂා කොටැ, බරණැස් නුවර රජ්ජුරුවන් තමන් ගේ රාජ්‍යය පුදා "දඹදිව්හි මඩගල හස්තිව" යි ආරාධනා කළ කල්හිදු රාජ්‍යයෙහි අපෙක්‍ෂාවක් නො කොටැ අනාථ වූ මැනියන් වහන්සේ පිණිස ම හඬා තමන් වහන්සේ ගේ බස් ඇසූ රජ්ජුරුවන් ඒ ගුණෙහි පහන් වැ "නොපගේ මැනියන් රක්‍ෂා කරව" යි මුදා, ගළ කල්හි අඬ වූ මැනියන් වහන්සේ සිවි තැනට ගොස් සොඬින් ඇඟ නිවා පැන් ඉසැ පලාපල කවා ශොක දුරුකොටැ දැන් අනඳමහ තෙරුන් වහන්සේ තමන් වහන්සේ ගේ ඉහි දැනැ උපස්ථාන කරණ පරිද්දෙන් මැනියන් වහන්සේ ගේ ඉහි දැනැ උපස්ථාන කරණ සෙයෙක් ද ධර්මයෙන් ම උපස්ථාන කළ සෙයෙක.

441. තව ද ඡණ්ණ ජාතකයෙහි බරණැස් රජ වැ කුමාර සමයෙහි තක්ෂලා නුවර ශිල්ප උගන්නට ගිය කල්හි උරයෙන් උරය ඟැසී ගියා වූ බ්‍රාහ්මණයාට එපමණ පුරුදුකමෙක්හි ගුණ දැනැ ගම්වර පසෙක; මිහිගෝ සියයෙක; සත්සියයක් ගෙරි ය; මැණික් දහසකට වැනියෙක; කුල ශිල ගුණෙන් අනුරූප අඹුවෝ දෙදෙනෙක— යනාදීන් බොහෝ සම්පත්ති දෙන්නාහු දැන් තමන් ගේ සත්තෙහි වැද පය පහළවන්නට නවලොකොත්තර ධර්ම දෙන බවට පූර්ව නිමිත්ත දක්වන්නාහු ද ධර්මයෙන් ම දැක්වූහ.

442. තව ද ධම්මදෙව පුත්ත ජාතකයෙහි ධර්ම තම් කාමාවචර දිව්‍යපුත්‍ර වැ දිව්‍ය ලොකයෙහි අනුභව කරන්නා වූ පඤ්චකාම සුව තබා රථයක නැඟී මනුෂ්‍ය ලොකයෙහි ඇවිදින සත්ත්වයන්ට කුසල්හි අනුසස් කියා සියලු ජම්බුද්වීප වාසීන් දශ කුශල කර්මපථ ධර්මයෙහි පිහිටුවන සෙයෙක් ද ධර්මයෙන් ම පිහිටූ වූ සෙයෙක.

443. තව ද උදයභද්ද ජාතකයෙහි උදය රජ වැ දෙළොස් යොදනක් පමණ වූ සුරිඤ්ඤ නම් නගරයෙහි රාජ්‍යය කෙරෙමින් මහත් වූ ඓශ්වර්‍යයෙහි සිටැ දිව්‍යස්ත්‍රීන් සමාන රාජකන්‍යාවන් හා සත්සියයක් හවුරුදු එක ගබඩාවේ වෙසෙමින් ද, ඇසිපිය හෙළා ලත ක්‍ෂණයෙක් ද, කෙලශ වසඟ වැ ඔවුන් මුහුණු නො බලා බ්‍රහ්මවර්‍යාව රැකැ මරණින් මත්තෙහි ශක්‍රභවනයෙහි ශක්‍ර දෙවෙන්ද්‍ර වැ උපදනාහු ද ධර්මයෙන් ම දෙව්ලෝ ගියහ.

444 තව ද පානීය ජාතකයෙහි බරණැස් රජ වැ පසේ බුදුන් වහන්සේගෙන් බණ අසා පඤ්චකාමයෙහි ආදීනව දැනැ, සත්යොදුන් කසිරටයෙහි හා දෙළොස් යොදුන් බාරාණසි රාජ ධානියෙහි හා නානා ප්‍රකාර වස්තු කාම කෙලශ කාමයෙහි අපෙක්‍ෂා

නැති වැ, සුදු බිත්ත බල බලා ධ්‍යාන හා අභිඥා උපදවා ආකාශයෙහි වැඩැ හිඳැ, අගමෙහෙසුන් බිසවුන්ට හා සියලු නුවර වැස්සන්ට බණ වදරා, හිමාලයට වැඩැ මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණ වූහ.

445. තව ද **සුධාසඳ්ජය ජාතකයෙහි සුධාසඳ්ජය නම් රාජකුමාර වූ** සූර්‍ය්‍ය රශ්මීන් විසලී හියැ පිනිබිඳෙහි අනිත්‍යතාව දැකැ "සියළු සත්ත්වයන් ගේ ආයු සංඛාරය ද මෙසේ අනිත්‍යයැ"යි ප්‍රත්‍යක්ෂ කොටැ ක්‍රමාගත වූ රාජ්‍යය හැරැ පියාතන් වහන්සේ අනුදන්වා හිමාලයට වැදැ මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණ වූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් මා එක ගැත්තහු රක්‍ෂා කරණ පිණිස මෙන් මට සුවදෙන පිණිස මෙන් මට අභිමතාර්‍ථ සාධා දෙන පිණිස මෙන් මා ලවා ම සියලු ලොකාර්‍ථ කරවමි"යි යන අභිප්‍රායයෙන් මෙන් අනෙක ජාතියෙහි පුරුදු කරණ ලද්දු වූ අමා මහ නිවන් සම්පත් සාධාදෙන ධම් රත්නය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

446 තව ද **දසරථ ජාතකයෙහි රාජකුමාර වූ** පියාතන් ගේ නියොගයෙන් අරණ්‍යයට ගොසින් තමන් වහන්සේ වලට වැනි නවවන අවුරුද්දෙන් පියාතන් වහන්සේ සවගීසථ වූ බව අසා **"සියලු සංඛාර ධම්මෝ අනිත්‍යහ"**යි ශොක ඉවසා වදරා මාගේ පියාතන් වහන්සේ මා වලට එන කල "දෙළොස් හවුරුද්දකින් මා මළ කල්හි තොප ගේ රාජ්‍යය තොපි ම ගන්ව"යි වදළ සෙයෙක. ඉදින් මම උන්වහන්සේ මළැ යි නව හවුරුද්දකින් යියෙමි නම් **ගුරුවචනය** උල්ලඛ්ඝණය කළා නම් වෙමි. රාජ්‍යය ලොභයෙන් කුලජ්‍යෙෂඨයන් කි බස් ඉක්මවම්දැ"යි දෙළොස් හවුරුද්ද පිරෙණ තුරු ම වෙනෙහි වසන්නාහු ද රාජ්‍යය ලොභයට වඩා ධම්මයෙහි ම ලොභ කළහ.

447. තව ද **සංවර මහාරාජ ජාතකයෙහි අමාත්‍ය වූ** තමන් ගේ අවවාද ලබා බාල රාජකුමාරයාතන් වැඩිමහළු බැයන් දහසක් දෙනා සිටිය දී අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් රාජ්‍යය ගන්නා පරිද්දෙන් අවවාද දෙන්නාහු ද ධම්මයෙන් ම දුන්හ.

448. තව ද **සුපාරක ජාතකයෙහි සුපාර පණ්ඩිත වූ** වඩබා මුඛ සාගරයට වත් මහණැ තමන් ගේ සත්‍ය බලයෙන් ධම්මයට දිවන තමන් ගේ සිත සේ පොළොව මුහුදු ඉක්මවා

ගොඩෙහිදු දියෙහිදු දිවන පරිද්දෙන් දිවවා **පටුන් ගම්** තැවියාගේ එළිපත ඇනී සිටිනා පරිද්දෙන් තමන් ගේ සත්‍යය ම ඒ තැවට රුවල් කොටැ මෛත්‍රී රසයෙන් ම මහපොළොව දුව කොටැ, තැවෙහි නස්නා සත්ත්වයාව ජීවිත දානය දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

449. තව ද **චූලකුණාල ජාතකයෙහි** තිරිසන් සත් වැ **කොවිලි වැ** සිවැ බුදුනුවණ හා එක්කොටැ කිරු කල්හි අඩු නො පාතා පරිද්දෙන් ගැණුන් ගේ අවගුණ දැනැ ඔණ වදරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

450. තව ද **භද්දසාල ජාතකයෙහි භද්දසාල නම් දිව්‍ය රාජ වැ** රජ ගට ඔණ කියා තමන් ගේ බන්ධුන් ගේ හා සියලු දෙවතාවන් ගේ විමානයට වූ උපද්‍රව දුරුකරන්නාහු ද ධර්මයෙන් ම දුරු කළහ.

451. තව ද **සමුද්දවාණිජ ජාතකයෙහි වඩු වැ** මහා සමුද්‍රයෙහි දීපාන්තරයකට වැදූ තමන් විනාශය කැමැත්තා වූ දිව්‍ය පුත්‍රයා සමුද්‍රෝ'ත්තාත කොටැ මරණු කැමැති වැ වඤ්චාවෙන් කී බස් නො ගිවිසැ තමන් ගේ වචන කරයන් මහ තැවට තහා ගෙණැ සමුද්‍රෝත්තාතයෙන් රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

452. තව ද **කාම ජාතකයෙහි පණ්ඩිත මාණවක වැ** තෘෂ්ණාවෙහි ආදීනව දැනැ තුන් රාජ්‍යයෙකින් අපවත් වී මී''සි අසංඛ්‍ය වූ ශොකානීසාරයෙන් පීඩිත වූ රජ්ජුරුවන්ට අවවද කියා ඔවුන් ගේ ශොක දුරු කොටැ රජ්ජුරුවන් ගේ ශ්වෙතච්ඡත්‍රය බලා ධ්‍යාන උපදවා ආකාශයෙහි හිඳැ රජ්ජුරුවන්ට දිවි දුන් හෙයින් කරන්නා වූ පූජාවෙහි අපෙක්ෂා නැති වැ භිමාලයට ආකාශ යෙන් වැඩැ මහණ වැ **පඤ්චා'භිඥ** අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්ම ලොක පරායණ වන්නා හුද ධර්මයෙන් ම වූහ.

453. තව ද **ජනසන්ධ ජාතකයෙහි** අඥතයන් ප්‍රාණා'ති පාතාදී වූ අකුශල කර්ම කොටැ නරක පරායණ වන්නා වූ **රාජතන්ත්‍රය** යෙහි සිටැ ධර්මයෙහි පිහිටුවා සහපිරිවර වැ දිව්‍යලොක පරායණ වන්නාහු ද ධර්මයෙන් ම වූහ.

454. තව ද **මහාසුදර්ශන ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර වැ** මනුෂ්‍ය ලොකයෙහි අධර්ම පවත්නා පරිදි බලා **මාතලිහු** බලු වෙස් ගන්වා තුමූ වැදි වෙස් ගෙණැ මිනිස් ලොවට බැසැ මනුෂ්‍යයන් ධර්මයෙහි පිහිටුවන්නාහු වැදි වෙස් ගත් තමන් හා බලු වෙස් ගත් මාතලීහු හා දෙදෙන මිනිස් ලොව දඩ වැදූ අධර්ම මෘගයන් මරා ලුහු බැඳ වූහ.

455. තව ද **මහාපදුම ජාතකයෙහි මහාපදුම කුමාර වැ** ගැහැණියගේ බස්ගත්තා වූ රජහු ප්‍රපාතයෙහි හෙළවාපී කල්හි ප්‍රපාතයෙහි වසන දෙවතා දුව ගසක් උඩින් හෙන සුවඳ මලක් බිම්හි යා නොදී අල්වා ගත්තා සේ තමාගේ ලෙහි හෙළවා ගෙණැ රක්‍ෂා කරණ පරිද්දෙන් මහා පින් ඇතිවන්නාහු ද ධම්‍ යෙන් ම වූහ.

456. තව ද **මිත්තා'මිත්ත ජාතකයෙහි රාජාමාත්‍ය වැ** බුදු හුවණින් පරීක්‍ෂා කළ කල්හිදු අඩුවැඩි නොපැණෙන පරිද්දෙන් **මිත්‍රා'මිත්‍ර ලක්‍ෂණ** කියන්නාහු ද ධම්‍යෙන් ම වදාළහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් පුරුදු ඖවැ මෙතෙහි කොවැ මව ම හිත සුව එළවන පිණිස ලොවෙහි පවත් කොවැ වදාළ ධම්‍ය සරණයෙමි සි **දහම් සරණ යා යුතු.**

457. තව ද **අම්බ ජාතකයෙහි චණ්ඩාල වැ** ඉපැදූ තමන් අතින් නොකල්හි වෘක්‍ෂයෙහි ඵල ගන්නා වූ මන්ත්‍රයක් උගන්වා අසත්පුරුෂ බ්‍රාහ්මණයා නොකල්හි අඹගස් ආදියෙහි ඵල ගන්වා සියලු ජම්බුද්වීපයෙහි වඳ සූර්‍යයන් සේ ප්‍රසිද්ධ වැ රජ්ජුරුවන් විසින් "මේ කා අතින් උගතුදැ සි" විවාළ කල්හි "චණ්ඩාලයකු අතින් උගත්මි සි කිම් නම් බොහෝ දෙන මා කෙරෙහි සම්භාවනා නො කෙරෙති" සි සිතා **තක්ෂලා** නුවර **දිසාපාමොක්ඛ** ආචාර්‍යයන් අතින් උගත්මි"සි කියා චණ්ඩාලවූ ද මාගේ සවාමීන්ට අවමාන කළ ක්‍ෂණයෙහි මන්ත්‍රයෙන් පිරිහි ලොක සම්මානයෙනුදු පිරිහි විනාශයට පැමිණෙන පරිද්දෙන් හීන ජාතියෙහි පවා අවමාන නොකට යුතු වැ පූජා වන්නාහු ද ධම්‍ බලයෙන් ම ලොකපූජ්‍ය වූහ.

458. තව ද **එදත්ත ජාතකයෙහි වෘක්‍ෂදෙවතා වැ** ඉපැදූ කලඟයෙහි ආදීනව හා සමඟවීමෙහි අනුසස් දක්නාහු ද ධම්‍ යෙන් ම දුටහ.

459 තව ද **ජවන හංස ජාතකයෙහි හංසරාජ වැ** සූර්‍ය්‍ය මණ්ඩලය හා කැටි වැ බරණැස් නුවරට බැසැ බාරාණසී රජ්ජුරුවන්ගේ සිංහාසනයෙහි වැඩ හිඳ, කරු සණ්ඩාරයක් බැඳ ගෙණැ මැදූ වැඹෙක හිඳැ ගෙණැ, සතර දිසාවෙහි සිටියා වූ අසඟණවෙදී වූ ධනුර්ධරයන් සතර දෙනා එක පැහැරැ විදිනා ශර වෙන වෙන තුඩින් ඔඟැ ගෙණැ අවුත් රජ්ජුරුවන් පා මුල්හි ලා තමන්ගේ ජවවෙග දුටු රජ්ජුරුවන් විසින් **"හංස පණ්ඩිතයෙනි! නොපගේ**

ජවය දුටුම්හ. මෙයට වැඩි අනික් ජවයෙක් ඇද්දැ"යි විචාළ කල්හි "මෙයට වඩා ශත ගුණෙන් සහස්‍ර ගුණෙන් සත්තියා මරහු මුඛයට දුවන ජවය අධිකයැ"යි අනිත්‍යතාව ප්‍රකාශ කොටැ රජ්ජුරුවන් දානාදි සුචරිතයෙහි යොදා වදුරන්නාහු ද ධම්මයෙන් ම යෙදූහ.

460. තව ද **දූත ජාතකයෙහි පණ්ඩිත මාණවක** වැ තමන්ගේ ධම්දෙශනා බලයෙන් හා දෘඪ ප්‍රතිඥා බලයෙන් හා රජ්ජුරුවන් අතින් කතකාණ්ඩලි ලබන්නාහු ද ධම්මයෙන් ම ලදහ.

461. තව ද **කාලිඞබොධි ජාතකයෙහි කාලිඞබ භාරද්වාජ නම් අමාත්‍ය** වැ තමන්ද බුදුවන්ට වැඩ හිඳිනා වූ බෝමඩ ඉද්දේ ආකාශයෙහි ඇත්පිටින් යන්නා වූ **කාලිඞබ චක්‍රවර්ති** මෙහෙයූ ඇත්හු ද අකුසු පහරින් මියනතුරු එතන ඉද්දෙහි ආකාශයෙන් නො ගිය කල්හි තුමූ බිමට බැසැ පරීක්ෂා කොටැ "මේ සවාසනා සම්බෙලශයන් නසා බුදුවන මහාපුරුෂයන් වැඩ හිඳිනා සථානය"යි කියා තමන් වැඩ හිඳිනා තැන එදා ම හැදිනැ රජ්ජුරුවන් ලවා එතන්හි අටලොස්රියන් සඛීසතමහයෙක සත්රුවන්මය පිළිකඩ ය සිසාරා සත්රුවන් වැලිය-සත්රුවන් දෙරටුය-දවස්පතා සුවඳමල් සැවයාළක් ය යන මෙයින් පූජා කරවන සෙයෙක් ද ධම්මයෙන් ම කැරැ වූ සෙයෙක.

462. තව ද **අකිතති ජාතකයෙහි අකිතීනි නම් තාපස** වැ **කාර දිවසින** වෙසෙමින් බ්‍රාහ්මණ වෙශයෙන් තමන් කරා ආවා වූ ශක්‍රයාට නිරාහාර වැ නොලුණු නොඇඹුල් කරපලා දන් දී තමන්ගේ ගුණයෙහි ප්‍රසන්න වූ ශක්‍රයා විසින් "තොප කැමැති වරයක් ගන්ව යි කී කල්හි මේ ජාතියෙහි පවන් වළා'සනය නැති මුළුලොව ගළවන ජාති දක්වා අසත්පුරුෂයන් හා එක් නො වෙම්ව යි, අසත්පුරුෂයන් නො දකිම්ව යි, අසත් පුරුෂයන්ගේ බස් නො අසම්ව යි, සත්පුරුෂයන් දක්කහෙම්ව යි, ඔවුන්ගේ බස් ඇසිය හෙම්ව"යි කියා වරගන්නාහු ද ධම්මයට ඉදුරා ම වර ගත්හ.

463. තව ද **තක්කාරි ජාතකයෙහි තක්කාරි පණ්ඩිත** වැ දුර්භාෂිතයෙන් නටුවා වූ **ආරාළ පිඛගල** සුභාෂිතයෙන් රජ්ජුරුවන් අතින් ගැළවුණු **කින්නරයන්** හා දැකැ ලොකයෙහි සත්ත්වයාව සුභාෂිතයෙන් වත ඉසට කියන්නාහු ද ධම්මයෙන් ම වදුළහ.

464. තව ද **රුරුමිග ජාතකයෙහි** මුව වැ ඉපැදූ ගහ දියෙන් යන්නා වූ අසත් පුරුෂයා ගොඩ දක්වා පිටින් ගෙණැ අවුත් ජීවිත දන දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

465. තව ද **සරභ මිග ජාතකයෙහි සරභ මෘග රජ වැ** තමන් මරන්නට ලුහු බඳවා දිවන්නා වූ රජ්ජුරුවන් සැරියන් පමණ වළහුන්නු කල්හි ඔවුන් පස්සෙහි දිවන පියවර හඬ කොසා "කුමක් වී දෝහෝ" යි බලා වළ හුන්නු බව දැනැ "මා මරන්නට දිවූහ යි මේ රජ්ජුරුවන් මේ වළින් කොතැනිම් තම් සසර වළෙහි හුන්නා වූ සියලු සත්ත්වයා කෙසේ නසම්දැ" යි වළට පැනැ රජ්ජුරුවන් පිටැ හිඳුවා ගෙණැ ගොඩට පැනැ ජීවිත දානය දී පිවින් ගෙණැ ගොස් සේනාවට නො දුරැ තන්හි සිටුවා ඔවුන්ට පන්සිල් දී දශරාජ ධර්මයෙහි පිහිටුවා ඔවුන් ලවා මුළු ලොවට ඥානග්‍ය කරවන්නාහු ද ධර්මයෙන් ම කරවූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් පුරුදු කොටැ මෙනෙහි කොටැ වඩා අමා මහ නිවන් හි පහරවා මුදුන්පත් කොටැ සිටු වූ සද්ධර්ම රත්නයෙ ම සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

466. තව ද **සාලිකෙදාර ජාතකයෙහි ගිරා වැ** මහා ක්ෂේත්‍ර යෙහි හැල් කා මවුන් පිණිස කණෙහි ලූ කොළක් සා හැල් කරල් මිටියක් තුඩින් ගෙණැ ගොස් හැල්කෙත ඇති බමුණා එ පවත් අසා බදු ගෙන්වා ගත් කල්හි, ගිරා තුඩින් ඔවුන්ට බණ කියා දහසක් කිරි හැල්කෙත ධර්ම පූජා කොටැ ලදින් මලින් ගැලවී මවුපියන් හා සෙසු පරිවාරයෙහි ගිරවුන්ගේ කදුළු මුසු මුහුණු අධික සන්තොෂයට පමුණුවමින් වඩනාහු ද ධර්මයෙන් ම වැඩියහ.

467. තව ද **චන්දකිනනර ජාතකයෙහි කිනනර වැ** තමන් වහන්සේගේ අඹු වූ **චන්ද්‍රා නම්** කින්නරිය කෙරෙහි පිළිබඳ වූ සිත් ඇති බරණැස් රජහුගේ විෂ පිත ශරප්‍රහාරයෙන් මූර්ඡිත වැ **චන්ද්‍රා නම්** කින්නරියගේ ශීල තෙජසින් ආවා වූ ශක්‍ර දෙවෙන්ද්‍රයා ශරීරයෙහි ඉසි අමෘත ජලයෙහි ආනුභාවයෙන් නො විදි ශරීරයක් සේ ම සවසථ වැ දිවි ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

468. තව ද **මහා උකකුස ජාතකයෙහි සිංහරාජ වැ** මිත්‍ර ධර්මය රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ.

469. තව ද **උදුල ජාතකයෙහි පුරොහිත වැ** කුට වූ **උදුලක නම්** තාපසයාගේ කොහොන්කම් ප්‍රකාශ කොටැ අසථානයෙහි ප්‍රසන්න වූ රජ්ජුරුවන්ට අවවාද වදරන්නාහු ද ධර්මයෙන් ම වදුලහ

470 තව ද **ගිරිසඬ ජාතකයෙහි මහාකාපින[1] තාපස වැ** සහපිරිවරින් පළඳවා ගිහි කොටැ ශපථ කරන්නාහු ද ධර්මයෙන් ම ශපථ කළහ.

---

1. මහාකපින.

471. තව ද සුරැවි ජාතකයෙහි ශක්‍ර දෙවෙන්ද්‍ර වැ සුමේධා දේවීන්ගේ ශීලාචාර ගුණෙහි ප්‍රසන්න වැ මනුෂ්‍ය ලොකයට අවුත් පුත්‍රවර දී ඔවුන්ගේ මනොරථ මස්තක ප්‍රාප්ත කොට වදුරණ සෙයෙක් ද ධම්මයෙන් ම කොටැ වදුළ සෙයෙක.

472. තව ද පඤ්චුපොෂථ ජාතකයෙහි තපස්වි වැ ජාති මානය නිසා පසේ බුදුන් වහන්සේට නමස්කාර මාත්‍රයකුදු නො කොට ඒ පසේ බුදුන් වහන්සේ විසින් "මහා පුරුෂයානෙනි මෙම කප්හි සම්මාසම්බුදු වන එකෙක් ය. එසේ හෙයින් කෘතාධිකාර වූ තෝ කුමක් පිණිස අභිමාන ඇති වැ ගෙණැ ධ්‍යාන සමාපත්ති මාත්‍රයකුදු නො උපදව" යි වදුළහ.

එකල්හිදු අභිමානයෙන් ම ඔබ නො වැන්දහ. මහා කරුණා ඇත්තා වූ ඒ පසේ බුදුන් වහන්සේ "තෝ අභිමාන ඇත්තෙහි වී නම් මා සේ ම ආකාශයට පැනැ නැහෙ" යි වදරා තමන් වහන්සේගේ ශ්‍රීපාද ධූලි ජටා මඩලයෙහි ඉස්මින් ආකාශයෙන් වැඩි කල්හි ජාති ආදියට වඩා ගුණ ම ප්‍රධාන වනැ" යි සිතා අභිමානය හැරැ. මම මාගේ අභිමානය නිසා පසේ බුදුන් වහන්සේ අතින් "මා බුදු වන්නේ කවර කල්හිදැ" යි විචාරාගත නුහුණු යෙම්" යි සංවෙගයට පැමිණැ හුනස්නෙහි ම හිඳැ භාවනා කොටැ පඤ්චා'භිඥ අෂ්ටසමාපත්ති උපදවන සෙයෙක් ද ධම්මයෙන් ම උපදවා වදුළ සෙයෙක.

473. තව ද මහා මයුර ජාතකයෙහි රන්වන් මොණර වැ තිරිසන් වැ සිටැ පවා දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් සාධාගත නොහැක් කාවූ "බුදුහු ඇත. දහම් ඇත. කම් ඇත. කම්ඵල ඇත" යන සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටා තමන් වහන්සේ මරන්නට බැලූ වැද්දනුවන්ට හිස බිම බලවා පය උඩු බලවා වැඩැ හෙවැ බණ වදරා පසේ බුදු කොටැ බැඳූ වැද්දන් කෙලඟ බඳින යෙන් ගළවා තමන් හා සියලු පක්ෂීන් බඳින මූකතා කරවන් නාහු ද ධම්මයෙන් ම කළහ.

474. තව ද තචජකසූකර ජාතකයෙහි වෘක්ෂදෙවතා වැ ඉපැදූ උපාය ශක්තීන් යුක්ත වූ ශූරා බලවත් වූ ව්‍යාඝ්‍රයා දිනූ පරිදි දක්නාහු තමන් අසාධාරණ ප්‍රඥා බලයෙන් බලවත් වූ සංසාරය මඩනා බවට පූර්ව නිමිත්ත දුටහ.

475. තව ද මහාවාණිජ ජාතකයෙහි වෙළඳ වැ කෙළෙහි ගුණ දූනැ මරුභූමියෙහි නොයෙක් ධන දුන්නා වූ වෘක්ෂයේ මූල් කපන්නට පටන් ගත්තා වූ වෙළඳුන් දැකැ "හිමි සැතපුනු වෘක්ෂයේ පතක් පවා කඩා පියන බව මිත්‍රද්‍රොහයෙහි ඇතුලත් වෙයි,

එහෙයින් මෙහොක් උපකාර කළා වූ වෘක්ෂයට ද්‍රෝහ නො කරව"යි වදුරා තමන් වහන්සේ ගේ අවවාදයෙන් නො වැළක්කා වූ වෙළඳුන් "ගස මූල කපන්නව" ය යි කියා පවන් ගත් කල්හි.

එගස නාගරාජයා "කෙළෙහි ගුණ නොදන්නා දුර්ජනයෝ තමන්ට මෙතෙක් උපකාර කළා වූ වෘක්ෂය කපති. මොවුන්ට මේ වේට ජීවත්වීය නො දෙමි"යි සිතා තමාගේ ආනුභාවයෙන් මහ සේනාවක් මවා ඒ දුර්ජනයන් කෙරෙන් එකෙකුත් ගැලවිය නො දී හසම කොටැ තමන් ආදිකොටැ වදුළ අවවාදයෙහි ප්‍රසන්න වැ "කෙළෙහි ගුණ දන්නා වූ මේ මහා පුරුෂයාට පූජා කළ මැන වැ"යි පන්සියයක් ගැල්හි සත්රුවන් පුරා තමන් වහන්සේ ගැලෙහි වඩා හිඳුවා මාණවකු වෙස් මවා ගෙණැ ගැල් පැදූ බර ණැස් නුවරැ සිටුවා මහා පූජාකොටැ වැදැ සමු ගෙණැ ගිය කල්හි ඒ සත්රුවනින් දානාදී කුසල් කරණ තමන් කෙළෙහි ගුණ දන්නාහු ධර්මයෙන් ම විෂ සොරවූ නයින් අතින් සත් රුවන් පූජා ලදහ.

"මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද්දා වූ ආශ්චර්‍ය්‍ය අද්භූත වූ, ඉෂ්ටාර්ථ සාධක වූ, ධර්මරතනය සරණ යෙමි යි **දහම් සරණ** යා යුතු.

476. තව ද **සාධින රාජ ජාතකයෙහි සාධින නම් රජ** වැ මනුෂ්‍ය ශරීරයෙන් සිටැ ශක්‍රදෙවෙන්ද්‍රයා දහසක් සෙසඟවයන් යෙදූ **වෛජයන්ත රථය** එළවා දෙව්ලොවට ගෙන්වා මහ පෙළහර කොටැ දෙව්ලොවට වැනියා වූ සර්ව්ඥයන් වහන්සේ දුටු දෙවෙන්ද්‍රයා සතුටුවන පරිද්දෙන් සතුටු වැ ආනන්තයෙන් පවරා මනුෂ්‍ය ශරීරයෙන් දිව්‍ය පඤ්චකාම ගුණ අනුභවකරණ පරිද්දෙන් හා දිව්‍ය රාජ්‍යය අර්ධයක් කොටැ බෙදා පියා දුන් කල්හි සත්සිය යක් හවුරුදු දිව්‍ය සුව වලඳන්නාහු ද ධර්මයෙන් ම වැළඳූහ.

477. තව ද **දසබ්‍රාහ්මණ ජාතකයෙහි කුරුරට ඉඳිපත්** නුවර **සුඛීඤ්ඤිල** නම් රජ්ජුරුවන් බුද්ධි විලාසයෙන් අග්‍රදක්ෂිණෙය්‍ය වූ සිල්වතුන් ගුණ හෙයින් පරීක්ෂා කොටැ විභාග කරන්නාහු ද ධර්මයෙන් ම විභාග කළහ.

478. තව ද **භික්ඛාපරම්පරා ජාතකයෙහි හෙමවත නම් තාපස** වැ රජ්ජුරුවන් අතින් පුරෝහිතයා පිළිගෙණැ පුරෝහිතයා අතින් තමන් වහන්සේ පිළිගෙණැ එසේ පිළිගත්තා වූ බත් පාත්‍රය තමන් වහන්සේ නො වළඳා අග්‍ර දක්ෂිණෙය්‍ය වූ පසේ බුදුන් වහන්සේට පිළිගන්වන සෙයෙක් ද දැන් තමන් වහන්සේ ලද්දා වූ නිර්වාණය සදෙවක සමාරක සබ්‍රහ්මක ලොකයට දෙවන බවට පූර්ව නිමිත්ත දක්වූහ.

479. තව ද **මානඛගපණ්ඩිත ජාතකයෙහි** වණ්ඩාල වැ බ්‍රහ්මවිමානයෙහි මහාබ්‍රහ්ම විලාසයෙන් වැඩ තමන් වහන්සේ පිටින් උසුලා ගෙණ ගියා වූ දෑසට මඩගලිකාවගේ දෙපත්ල සුදු කළ පැන් සියලු දඹදිව රජ්ජුරුවන් මුදුනට අනිමෙක ජලය කොටැ දක්වන පරිද්දෙන් චන්‍රමණ්ඩය පලා ගෙණ මනුෂ්‍ය ලොකයට වැඩ අනුග්‍රහ කොටැ වදරණ සේක් දැන් තමන් වහන්සේ සිතින් ඉසිළු සත්ත්වයන්ගේ පතුල මුළු ලොවට මුදුන් මල්වන බවට පූර්ව නිමිත්ත දැක්වූ සෙයෙක.

480. තව ද **විශ්වාසම්භූත ජාතකයෙහි** තමන් වහන්සේ හා මිත්‍රධර්මය කළවුන් තුන් සතර ජාතියක් දක්වා අත් නො හරණ සෙයෙක් ද දැන් තමන් වහන්සේගේ ගුණයෙහි පහන් සත්ත්වයා **නිරුපධිශෙෂ නිර්වාණ ධාතුව** දක්වා අත් නො හරණ බවට පූර්ව නිමිත්ත දැක් වූ සෙයෙක.

481. තව ද **සිව්රාජ ජාතකයෙහි සිව් නම් මහාරජ වැ** දවස ලක්ෂයක් වියදම් කොටැ මහ දන් දී ඒ දානයෙනුදු අනාපත වැ "මේ යාචකයෝ මා කරා අවුත් රත්රන් හෝ ඉල්වති. අමු රන් හෝ ඉල්වති. දැසි දැසාදී කෙණකුන් හෝ ඉල්වත්. තොප ඇස උදුරා දෙව තොප හිස කපා දෙව" සි එක බසකුදු කියන යාචකයක්හු නො දක්නේ මාගේ ම අභාග්‍යයැ සි කියා ඉදින් කිසිවෙක් අවුත් තමාට ගැනිවන්නට කි නම් "මාගේ **මාණික්‍ය** රශ්මීන් රැඳි හිසැ වොටුන්න බහා තබා පියා ඔහු ගේ දෙපත්ල මා මුදුනෙන් පිළි ගෙණ ගැනි වැ මෙහෙ කෙරෙම්. ඉදින් යමෙක් මාගේ ශරීරයෙහි මස් ඉල්වූයේ වී නම් මාගේ **දානපාරමිතා** නැමැති මහවිල්හි වූ තරුණ වූ තෙළඹු දැලි සේ සුදු වූ ඇට පැණෙන තුරු සවීඹයෙහි මස් ලියා පැස් පුරා දන් දෙම්.

ඉදින් යමෙක් මාගේ හිස ඉල්වූයේ වී නම් සහ වොටුනු වූ හිස මාගේ මගුල් කඩුවෙන් කපා පියා ආදී කියන්නට පවන් ගත්තා වූ සාධුකාර කපා පි **පස්සෙහිදු** දෙතුන් වටෙහිදු කියන පරිද්දෙන් **සඤ්ඤාණ දුන** දෙම්. ඉදින් යමෙක් මාගේ දෙ ඇස ඉල්වූයේ වී නම් තමා ගේ විල්හි හටගත්තා වූ මහතෙල් මල් දෙකක් යාචකයාට දෙන එකකුදු ලොභ ඇති වැ දෙව"සි මම වූ කලි කිසි ලොභයක් නැතිවැ ම මාගේ දෙ ඇස ම උදුරා දන් දෙම්.

මාගේ මේ දානාධ්‍යාශය කෙසේ **සම්පූර්ණ** වේ දෝහෝ සි මාගේ මනෝරථය කෙසේ **මස්තකප්‍රාප්ත** වේ දෝහෝ සි සිතා වදරා ඒ උදර වූ අධ්‍යාශයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයා ගේ **පාණ්ඩු කම්බල ශෛලාසනය** හුණු වූ කල්හි තමන් ගේ ආසනය හුණු වූ කාරණය

පරීක්ෂා කරන්නා වූ ශක්‍රදෙවෙන්ද්‍රයා එ පවත් දැනැ මේ මහා පුරුෂයා මේ නියා සිතිවිල්ලක් සිතයි. හෙ ද මෙම කප්හි සවාසනා සම්බුදුරජානන් සසා බුදු වැ මුළුලොව ගළවන්නා වූ මහතෙක් ය.

ඔහු ගේ **දුනාඟිරතිය** මසකසප්‍රාප්ත කළ මැතවැ"යි **අඞ්ඛ බ්‍රාහ්මණ** වේසයෙන් අවුදිත් "තොපගේ **ඇස** දෙව"යි කී කල්හි බුදුහු බුදු වැ දිව ඇස් ලත් දවස් සතුවක් සේ "ඒ ඇස උදුරා දෙව" යන බස අසා සතුටු වැ සියලු අමාත්‍යයන් සියලු අන්තඃපුර සත්‍රීන් සියලු රාජකුමාරයන් "සාමීනි! රාජ්‍යයක් දුන මැනව හස්ත්‍යා'ශ්ව රථ පදුනින් දුන මැනව. නානාප්‍රකාර වූ සප්ත රත්නයන් දුන මැනවැ යි මුළු දඹදිවට ඇසක් සේ සිටි නුඹ වහන්සේ ගේ ඇස් නුදුන මැනවැ"යි හඬව හඬවා දෙ ඇස උදුරා දී ඒ දානයෙහි අනුසසින් බුදු වැ ලබන දිව ඇසට පූජා නිමිත්ත පාණා සේ දිව ඇස් ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ.

482. තව ද **රොහණමිග ජාතකයෙහි** සවණී වණී වූ **මෘග රාජ වැ ද හංස ජාතකයෙහි හංස රාජ වැ ද දැන් ධර්මරාජ වැ බණ වදරණ** පරිද්දෙන් ධර්ම දෙශනා කරන්නාහු ද තමන් ගේ සාමිත්වය ම ප්‍රකාශ කළහ.

483. තව ද **සුතසෝමඹ ජාතකයෙහි** හිඹුල් වනයෙහි **ගිරා වැ** තමන් හා එක් වැ උපන් ගිරා පැටව් හා කැටි වැ **කසල්ලේ** හෙවැ ප්‍රචණ්ඩ වාතයකින් අනික් ගිරව් ගොස් සොරුන් අතුරෙහි හුණු කල්හි තුමූ ආශ්‍රමයෙහි තපස්වීන් අතුරෙහි හී සොරුන් අතුරෙහි හුණු ගිරව් වලව් ගියා වූ රජ්ජුරුවන් දැකැ "මේ රජ්ජුරුවන් මරා පියා **ආභරණ** ගණුව"යි සොරුන්ට නියොග කළ කල්හි, ආශ්‍රමයට ආවා වූ රජ්ජුරුවන් දැකැ තුමූ තපස්වී **කුමාරකෙණකුන්** සේ මධුර ඵලාඵල ආදීන් පවරා. තමන් ගේ ගුණයෙහි ප්‍රසන්න වූ රජ්ජුරුවන් විසින් තමන් වහන්සේ ගේ කුලයෙහි උපන් ගිරවුන්ට අභය දෙවා තමන් වහන්සේ වැඩූ සෘෂීන්ට දිවි පමණින් උපසථාන කරවා සුචරිතයෙහි පිහිටුවන සෙයෙක්ද බුදු රජ වැ කොටැ වදරණ ධර්ම කෘත්‍යය ගිරා රජවැ ද කොටැ වදළ සෙයෙක.

484. තව ද **හල්ලාතික**[1] **ජාතකයෙහි හල්ලාතික නම් රජ වැ** හිමාලයෙහි දඩ වැදූ එක රැයක් උනුන් නුදුටු කින්නරයන් දෙදෙනා සත්සියක් හවුරුදු උනුන් වැළඳැ ගෙණැ හඬන පරිදි දැකැ වදරා හිමාලයෙන් රාජධානියට වඩනා සෙයෙක්ද මතු තමන් වහන්සේ **කොසොල්** රජ්ජුරුවන් හා **මල්ලිකා** දේවීන් ගේ කලණ සන්හිදුවන්නට පූර්වධර්ම කථාව දුටු සෙයෙක.

---

1. හල්ලාවිය.

මෙසේ මාගේ සවාමීන් විසින් අසන්න ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද ධර්මය සරණ යෙමියි **දහම් සරණ යා යුතු.**

485. තව ද **සොමනස්ස ජාතකයෙහි** දිව්‍ය ලොකයෙන් චුත වැ උත්තර පඤ්චාල නම් නුවර රෙණු නම් රජ්ජුරුවන්ගේ අග මෙහෙසුන් කිසවුන් බඩැ පිළිසිඳැ ගෙණැ **සොමනස්ස** නම් **රාජකුමාර** වූ කුට ජටිලයා ගේ වඤ්චා ප්‍රයොග නො දැනැ "ඔහු දිව ඇස් ඇති තපස්වීන් යැ"යි සිතන්නා වූ රජ්ජුරුවන් ගේ අඟුන කම් දැකැ "මෙසේ වූ මූර්ඛයන් අතුරෙහි වසන බව සුදුසු නො වෙයි" කියා ක්‍රමාගත රාජ්‍යය හැර හිමාලයට වැද මහණ වන්නාහු ද ධර්මයෙන් ම මහණ වූහ.

486. තව ද **චම්පෙය්‍ය නාගරාජ කාලයෙහි** සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් වට ඇති සක්වළ ශ්වාස මාත්‍ර යෙකින් දවා පියන්නට සමර්ථ වැ "සමාදන් වූ අට සිලයට විරෝධයක් නො කෙරෙමි"යි යන සිතින් වණඹු වූ **අහිතුණ්ඩිකයා** දළ උදුරා පියා කට දල්වාලා මුවෙහි ඖෂධ මිශ්‍ර කෙළ වක්කරණ කල්හි, තුමූ ද තමන් සිත වෙෂය උදුරා පියා මෛත්‍රී තැමැති දිව්‍ය ඖෂධය ඔහු කෙරෙහි නමා ලන්නාහු ද ධර්මයෙන් ම නැමූහ.

487. තව ද **මහාපලෝභන ජාතකයෙහි** බ්‍රහ්ම ලොකයෙන් චුත වැ රාජකුමාර වැ ඉපැද කාමයෙන් දුරු වැ සත්‍රී සපර්‍ශී මාත්‍රය කට ද හඬා නො සැනහී යෞවන ප්‍රාප්ත වූ අවස්ථාවෙහි විදහි වූ ගන්ධර්ව සත්‍රියගේ ගීත ශබ්දයෙන් පැලැඹී කාමාස්වාදය කොටැ පඤ්චකාමයෙන් මූර්ච්ඡිත වැ හොස් "මෙසේ වූ රසයක් මා මුත් අනික් පුරුෂ කෙණෙකුන් අනුභව කට නො දෙමි"යි කඩුව හයා ගෙණැ විපියට වැද පිරිමින් මරා එ පවත් ඇසූ රජ්ජුරුවන් ඒ ගැණිය හා තමන් හා වලට නෙරපී කල්හි වලට වැද ආශ්‍රමයෙකැ වෙසෙමින් තමන් වහන්සේ එලාඵලයට වැඩි කල්හි ඒ දුර්ජිත වූ සත්‍රිය ආකාශචාරී වූ තපස්වියකුගේ ශීලභෙදය කොටැ ඔහු හා කැවි වැ හුන්කල්හි තමන් වහන්සේ අවුත් කඩුව හයා ගෙණැ ඔහු ලුහුබැඳවූහ.

තපස්වීහු හඔමින් මුහුදු කොලට ගොස් ආකාශයට නැගෙණ ආකාරය දක්වා මුහුදු ලුණු කරදියෙහි හී ගැලෙන්නට වන් කල්හි තමන් වහන්සේගේ **වප්‍රඥානයෙන්** "මේ ආකාශචාරී වූ තපස් වියෙක් වත. මා අඹු පිණිස නටුයේ ය"යි වදරා පඤ්චකාමයෙහි ආදීනව සලකා එසේ වූ ප්‍රිය වූ සත්‍රිය ගෙණැ අවුත් මනුෂ්‍ය පථයෙහි සිටුවා තමන් වහන්සේ හිමාලයට වැද තාපස ප්‍රව්‍රජ්‍යා

වෙන් පැවිදි වැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා ජීවිත පර්‍යවසානයෙහි බ්‍රහ්මලොකයෙහි උපදනා සෙයෙක් ද ධර්මයෙන් ම උපන් සෙයෙක.

488. තව ද **හත්ථිපාල ජාතකයෙහි හත්ථිපාල කුමාර** වැ ප්‍රව්‍රජ්‍යායෙහි අනුසස් හා පඤ්චකාමයෙහි ආදීනව වදරා මහණ වැ තමන් වහන්සේගේ ආශ්‍රමයෙහි සිසාරා සතිස් යොදනක් තැන් මහණ මෙහෙණුන් විසින් අතුරු සිදුරු නැතිවැ ගැවසී ගන්නා පරිද්දෙන් තමන් වහන්සේගේ ආඥාවර්‍ත්‍ති වූවු සත් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යශ්‍රී හැර සහපිරිවරින් මහණ වූ කල්හි ඔවුන් හා සමඟ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා ජීවිත පර්‍යවසාන යෙහි බ්‍රහ්ම ලොකයෙහි උපදනා සෙයෙක් ද ධර්මයෙන් ම උපන් සෙයෙක.

489. තව ද **අයොඝර ජාතකයෙහි අයොඝර පණ්ඩිත කාලයෙහි අයොඝර නම් රාජකුමාර** වැ යක්ෂයන්ගේ උපද්‍රව දුරු කරණ පිණිස පියාතන් වහන්සේ සොළොස් හවුරුද්දක් ශ්‍රේෂ්ඨ රක්ෂා කොටැ නුවර පැදකුණු කර වූ දවස් සමඟ වූ රාජ්‍යය දැකැ "මා මෙතෙක් දවස් මෙබඳු රාජ්‍යයක් නො දැකැ ශ්‍රේෂ්ඨ හුන්නේය. සසරෙහි ආදීනව වේ දැ"සි බණ වදරා දෙළොස් යොදුනක් දිග ඇති සත්යොදුන් පළල ඇති ආශ්‍රමය තපස්වීන් විසින් නිරන්තර වන. පරිද්දෙන් තමන් වහන්සේ ගේ අවවාද ඇසූ පියාතන් වහන්සේ හා සියලු රාජ්‍යය හැර මහණ වැ ජීවිත පර්‍යවසානයෙහි බ්‍රහ්මලොකයෙහි උපදනා සෙයෙක් ද ධර්මයෙන් ම උපන් සෙයෙක.

490. තව ද **කිංඡන්ද ජාතකයෙහි** රාජ්‍යය හැර මහණ වැ අඹ පලෙක්හි කළ ලොභයෙන් සත්දවසක් නිරාහාර වැ භිදිනා සෙයෙක් රස තෘෂ්ණායෙහි ආදීනව ලොවට ප්‍රකාශ කොටැ දැන් වදරණ බණට දෂ්ටාන්ත දැක් වූ සෙයෙක.

491. තව ද **කුම්භ ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර** වැ මනුෂ්‍ය ලොකයට අවුත් සුරාපානයෙහි ආදීනව දක්වා පඤ්ච් සහිත වූ රජ්ජුරුවන් සුරාපානයෙන් දුරු කරන්නාහු ද ධර්මයෙන් ම දුරු කර වූහ.

492. තව ද **ජයද්දිස ජාතකයෙහි** තමන්ගේ ප්‍රාණ පරිත්‍යාග කොටැ පියාතන් වහන්සේට දිවි පුදා **පොරිසාදයා** ඇතැ හී එ තැන්හි ද තමන්ගේ හස්තාසාර වූ ධර්මය වදරා **පොරි සාදයා** අතින් ගැළැවී ඔහු ද මිනී කෑමෙන් දුරු කොටැ පන් සිල්හි පිහිටු වන්නාහු ද ධර්මයෙන් ම පිහිටුවූහ.

493. තව ද ඡද්දන්ත ජාතකයෙහි විෂ පිත වූ ශරයෙන් තමන් විද්දු වූ සොණුත්තර තම් වැද්දට කපා දුන්නා වූ සවණක් රුසින් යුක්ත වූ දළින් දානපාරමිතාව දළ කළහ.

494. තව ද සම්භවකුමාර ජාතකයෙහි සම්භවකුමාර වූ පියාණන් වැලි කෙළිමින් සිටිය සියලු ජම්බුද්වීපයෙහි බුද්ධිසම්පන්න යන් කියාගත නුහුනුවා වූ ප්‍රශ්නය ඇතැ තුබූ වැලි දමා පියා සිටිය බුද්ධ විලාසයෙන් වදාරන්නාහු ද ධම්මයෙන් ම වදළහ.

495. තව ද මහාසුපි ජාතකයෙහි වානර වූ ගසට නැඟී "නිබ්බිරි පල කම්"යි අත්තෙන් වැරද මහා ප්‍රපාතයෙහි හි හඬන්නා වූ පුරුෂයාගේ බැගෑ හඬ අසා "මා සේ වූ කරුණා ඇති එකක්හු බල බලා සිටිය දී මොහු දුක් ගන්නා බව සුදුසු නො වෙයි" සිතා වදාරා වැලක් බැඳා ගෙණ ගොඩ සිටා වළට පැනැ වළසිටා ගොඩට පැනැ ශ්‍රමකොටා පසුවැ ඔහු හිණ ගන්වා ගෙනැ ගොඩට පැනැ නැඟී ඔහු නහා විඩා වැ "තොප නහා විඩා වැ ගියෙම්, මා නිදා පියන තුරු මට වත උපද්‍රවයක් ඇත බලව"යි කියා ඔහු ඇලයෙහි නිදන්නට වැඩ හෙව.

කෙළෙහි ගුණ නො දන්නා වූ ඔහු තමාට දුන් ජීවිත දානය නො සලකා "මේ වදුරා පමා වැ නිදයි, මොහු මරා පියා මස් හැරගෙණැ කකා ගිය මැනවැ" යි හිස පහණින් ඇනපි කල්හි මුහුණ වැටී හුණුවා වූ සම් අතින් නහා ගෙණැ ඔහු මුහුණ බලා ප්‍රිය පුත්‍රයක්හු හා බණන ලෙසින් "තොපට මා දුන් ජීවිත දානයට තොප මෙසේ වූ දුර්ජන කමක් කෙළේ කුම වදැ" යි ප්‍රිය වචන වදාරා "ඉදින් මම මෝහට රැහැණිවැ මග නො පැයෙම් වී නම් මා සරණින් රැකෙන්නා වූ මුළු ලොවට නිර්භීණ මාගීයන් පැ ගත නො හෙන්නෙම් වේ දැ" යි සිතා වදාරා සියලු හිමාලයයෙහි වෘක්ෂ දෙවතාවන් මහාපුරුෂයාතෙනි! තෙල දුර්ජනයා කෙරෙහි කරුණා නො කරව" යි කියව කියවා "තොප කියන්නේ එක තමා ආතමයට සිතන්නවුන් කළමනා දැය, මා කරන්නේ මුළු ලොව රක්නවුන් කළමනා දැයැ" යි වදාරා දේවතාවන් බස් නො ගිවිසැ ඔහට මහ පානා සෙයෙක් ද ධම්මයෙන් ම මහ පැ වදාළ සෙයෙක.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද්දු වූ ධම්මරත්නය මට අනුපාදි නිවන්[1] පහරවා සියලු අභිමතාර්ථ සාධා දෙන්නා වූ විඤ්ඤාණඤ්චායතන. එසේ වූ ධම්මරත්නය සරණ යෙමි යි දහම් සරණ යා සුතු.

1. අනුපාදිශේෂ නිවන්.

496. තව ද **උදඤ්චරකඛස ජාතකයෙහි මහෞෂධ පණ්ඩිත වූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් "උදඤ්ච රාක්ෂසයාට මම ඔත් වැ මහෞෂධ පණ්ඩිතයන් නො දෙමි" යි යන පරිද්දෙන් සම්ලොක ප්‍රියවන්තාහු ද ධර්මයෙන් ම ප්‍රිය වූහ.**

497. තව ද **පණ්ඩරඤ්ඤ ජාතකයෙහි සඞ්ඛරාජ වැ බොරු කිවා වූ දෙවදත්තයාගේ එම ශරීරයෙන් අපායෙහි හිම් දක්වන්නාහු දැන් තමන් වදරන්නා වූ මුසාවාදයේ ආදීනවයට දෘෂ්ටාන්ත දුටහ.**

498. තව ද **සම්බුලා ජාතකයෙහි කුසට ඇත්තා වූ හඤ්ඤිසෙන නම් කුමාරයන් හා කැටි වැ වලට ගොස් වල්හි දෙවතාවන් තමන් කෙරෙහි අභිරත කළ කල්හිදු සවාමි පක්ෂ පාතයෙන් දිව්‍ය ශ්‍රී යෙහි අපෙක්ෂාවක් නො කොටැ තමන්ගේ සත්‍ය ක්‍රියායෙන් සමණන්ගේ රෝග සන්හිදුවා ආ සම්බුලා නම් බිසවුන් වහන්සේ කෙරෙහි රජ්ජුරුවන් නිරා'දර වූ කල්හි ඔවුන්ගේ ගුණ රජ්ජුරුවන්ට කියා බිසවුන්ගේ ශ්‍රී සම්පත් කරන්නාහු ද ධර්මයෙන් ම සම්පත් කළහ.**

499. තව ද **භණ්ඩුනිණ්ඩුක ජාතකයෙහි වෘක්ෂ දෙවතා වැ සිටැ අධර්මිෂ්ඨ වූ රජ්ජුරුවන්ට අවවාද දී දුක්පත් වූ සියලු ලෝ රක්ෂා කොටැ ඒ රජ්ජුරුවන් දශ රාජ ධර්මයෙහි පිහිටුවන්නා හු ද ධර්මයෙන් ම කළහ.**

500. තව ද **තෙසකුණ ජාතකයෙහි ජම්බු නම් පක්ෂි වැ සිංහාසනාරූඪ වැ බාරාණසියෙහි ඉසිපතනයෙහි මිගදායෙහි ධර්මාසනයට නැඟී ධර්මචක්‍රය පවත්වන විලාසයෙන් බණ වදරා රජ්ජුරුවන් දශ රාජ ධර්මයෙහි පිහිටුවා ලොකා'ර්ථ කරණ සෙයෙක් ද ධර්මයෙන් ම කොටැ වදළ සෙයෙක.**

501. තව ද **සරභඞ්ග ජාතකයෙහි මනුෂ්‍ය වැ සිටැ ශක්‍රාදීන්ගේ ශංසය දුරැ කොටැ ප්‍රශ්න වදරණ සෙයෙක් ද ධර්මයෙන් ම වදළහ.**

502. තව ද **අලම්බුසා ජාතකයෙහි තාපස වැ අලම්බුසා නම් දිව්‍ය සත්‍රීගේ ශරීර සපර්‍යායෙන් මුසපැ වැ තුන් හවුරුද්දක් විසඳූ වැ ධ්‍යානයෙන් පිරිහී සංඥ ලත් ක්ෂණයෙහි පඤ්චකාම සෙවනය කළ බවට උකහණ්ඩිත වැ නට ධ්‍යානය ඉපැද වූ ඉසිසිඞ්ග තාපසයන්ගේ කාමවිකාර දක්වන්නාහු ද දැන් තමන් වදරන්නා වූ පඤ්චකාමා'දීනවයට මූල් කාරණා දුටහ.**

503. තව ද **සඞ්ඛපාල ජාතකයෙහි** විෂඝෝර වූ **නාග රාජ වෑ** තමන් ගත්තා වූ අෂ්ටාඞ්ග ශීලයට භෙදයක් නො කරණ පිණිස තමන්ගේ ශරීරය අවතැනෙක් විදිනා භොජපුත්‍රයන් කෙරෙහි මෛත්‍රී කරන්නාහු ද ධර්මයෙන් ම කළහ.

504. තව ද **චුල්ලසුතසෝම ජාතකයෙහි සුතසෝම නම් මහරජ වෑ** හිසැ තරයක් දූකැ රාජ්‍යය හැරැ මහණ වන්නාහු ද ධර්මයෙන් ම මහණ වූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද්දා වූ **ධර්මරත්නය** සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

505. තව ද **නලිනී ජාතකයෙහි තාපස වෑ නලිනී නම් රාජකන්‍යාව** කෙරෙහි පෙලැඹි ශීලභෙදයට පැමිණෑ මහාවිභාශ යට සම්ප්‍රාප්ත වූ සෘෂි කුමාරයන්ගේ ප්‍රවෘත්ති දැන්මෙන් තෘෂ්ණා වගේ අනිවාරිය භාවය ම දූකැ ලොවට තෘෂ්ණා වනසන්නා වූ ධර්මය ම පවත් කරන්නට උත්සාහ කළහ.

506. තව ද **උම්මාදයන්ති ජාතකයෙහි සිවිරජ වෑ උම්මාද යන්තියගේ** රූපය දූකැ විසංඥවැ ද පර ස්ත්‍රී සෙවනයෙන් වන ධර්ම විනාශය තමන්ට නො වැද්ද දී ධර්මය ම රක්ෂා කළහ.

507. තව ද **මහාබෝධි ජාතකයෙහි පරිබ්‍රාජක වෑ** ධර්මයෙන් යුක්ති විනිශ්චය කොටැ අඳුන ජනපද වාසීන් ගේ බසින් රජ්ජුරුවන් තමන් කෙරෙහි විමති ඇති වූහ යි තමන් ගේ ප්‍රඥයෙන් පරීක්ෂා කොටැ ජීවිතය රක්ෂා කරන්නාහු ද ධර්මයෙන්ම රක්ෂා කළහ. තව ද **සොණක ජාතකයෙහි අරින්දම නම් මහරජ වෑ** රාජ්‍යය හැරැ මහණ වන්නාහු ද ධර්මයෙන් ම මහණවූහ.

508. තවද **සංකිච්ච ජාතකයෙහි සංකිච්ච නම් තාපස වෑ** පිතෘ ඤාත කම් කළා වූ රජ්ජුරුවන් අස්වසා බණ වදරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ.

509. තව ද **කුසජාතකයෙහි** ප්‍රභාවතීන් කෙරෙහි කළ අනුරාගයෙන් **කුසාවතී නම්** රාජධානිය හැරැ ඔවුන් පස්සෙහි යන්නාහු දීපඞ්කර පාදමූලයෙහි හස්තප්‍රාප්ත වූ නිර්වාණ සම්පත් හැරැ කරුණාව පස්සෙහි සසරට වන් බවට දෘෂ්ටාන්ත දූක්වූහ.

510. තව ද **සොණනන්ද ජාතකයෙහි** මවුපියන්ට උපස්ථාන කරන්නාහු ද ධර්මයෙන් ම කළහ.

511. තව ද **චුල්ලහංස ජාතකයෙහි** ද **මහාහංස ජාතකයෙහි** ද **හංසරාජ** වැ මලෙහි බැඳි තමන් මලෙහි නො බැඳුන ද සොහොන පාසයෙන් බැඳි සිටින **හංස සෙනාධිපතීන්** ලදින් "මලින් ගැලවී බැඳූ වැද්දාටත් උපකාර කළ මැනවැ"යි සිතා **රජ්ජුරුවන්** කරා ගොසින් බණ කියා ශ්වේතච්ඡත්‍රයෙන් පූජා ලදින් බැඳූ වැද්දාට ත් සම්පත් දෙන්නාහු පවා දැන් තමන් විදිනට දුනු ගත්ත වුන්ට අමෘත මහා නිර්ව්‍රණය දෙන බවට පුළු නිමිත්තා දැක්වූහ.

මෙසේ මාගේ සවාමී වූ **බුදුරජාණන් වහන්සේ** විසින් සියලු ලොකඕවයව්‍යාව පිණිස කරුණාගෙන් ප්‍රකාශ කොටැ භාවිත කොටැ පිහිට කොටැ තබා වදාළ **ධම්මරත්නය** සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

512. තව ද **සුධාභොජන ජාතකයෙහි** **ශක්‍රදෙවෙන්ද්‍ර** වැ අදහා'භිරත වූ **කොසියයාගේ** තණ අගකින් තෙල බිඳු මාත්‍රය කුදු අනුන්ට නො දෙන්නාහු භික්ෂාව නිරුපධිශෙෂ නිර්වාණ ධාතුව දක්වා ලද්දා වූ තල ඇට කුදු අනුන්ට නො දී නො කත පරිද්දෙන් දානාභිරත කරණ සෙයෙක් ද ධම්යෙන් ම කොටැ වදාළ සෙයෙක.

513. තව ද **සුතසොම ජාතකයෙහි** රාජ්‍යය පුදා ද සත්‍යය ම **රක්ෂා කරණ** සෙයෙක් ද, ධම්යෙන් ම රක්ෂා කළ සෙයෙක.

514. තව ද **තෙමිය ජාතකයෙහි** **තෙමිය කුමාර** වැ ප්‍රාණවධ ආදී වූ දුශ්චරිත කොටැ විඳිනා රාජ්‍යශ්‍රියෙහි කළකිරී නො ගොළු වැ ගොළු වැ - නො බිහිරි වැ බිහිරි වැ - නො පිළු වැ පිළු වැ - සොළොස් හවුරුද්දක් සිතියමැ ඇඳ ලූ රූපයක් සේ වැසැ "කාලකන්නි තැනත්තනු වළලා පියව"යි කියන පරිද්දෙන් කිසි ඇසිපියක් සොල්වා ලති - අතක් පයක් සොලවා ලති - ඝනාදී වූ කිසි විකාරයක් නො කොටැ තමන් කැමති **මහණිනික්මන්** සාධා ගෙණැ මුළුලෝ ගළවන්නාහු ද ධම්යෙන් ම ගැළවූහ.

515. තව ද **මහාජනක ජාතකයෙහි** සත්දවසක් මුළුල්ලෙහි මුහුදු පිනා අනෙක ප්‍රකාරයෙන් දුක් ගෙණැ ලද්දා වූ **මිථිලා නුවරෙහි** රාජ්‍යය කෙරෙමින් "පලගත් අඹ රුකකට අඹ ජාති කම්හ"යි බොහෝ දෙනා කළ විනාශ බලා "ලොකයෙහි විපත්ති නම් මහත්වැ සිටි කෙණෙකුන්ට වත දෙයෙක් වනැ"යි සම්පත්තියෙහි කළකිරී චක්‍රවර්ති සමානවූ සම්පත්තිය හැරැ මහණ වන්නාහු ද ධම්යෙන් ම **මහණ** වූ හ.

516. තව ද සුවණ්ණ සාම ජාතකයෙහි සාමකුමාර වැ පිළිය‍ක්ෂ තම් රජ්ජුරුවන් විෂපිත වූ ශරයෙන් පහර කා ඒ ශර වෙදනාව ඉවසා අඬ වූ මවු පියන් ගේ දුක් සිතා හඬන්නාහු ද ධර්ම පිණිස හැඬුහ.

517. තව ද නිමිරාජ ජාතකයෙහි නිමි මහ රජ වැ මනුෂ්‍ය වැ සිටැ ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ වෛජයන්ත රථයට නැඟී දෙව් ලොවට යන්නට සුදුසු වූ සාමර්ථ්‍යය ඇති ව ද හිසැ එක තරයක් දැකැ රාජ්‍යය හැරැ මහණ වන්නාහු ද ධර්මයෙන් ම මහණ වූ හ.

518. තව ද චන්දකුමාර ජාතකයෙහි චන්ද්‍ර නම් රාජ කුමාර වැ බ්‍රාහ්මණ තම් පුරොහිතයා ගේ බසින් "යාගයෙහි මරන්නටය"යි කියා බදනා ලදින් චන්ද්‍රාදේවීන් ගේ සත්‍ය ක්‍රියා යෙන් ආවා වූ ශක්‍ර දෙවෙන්ද්‍රයා ගේ ශක්තීන් තමන් හා යාගයට මරන්නට ගෙණා අනන්ත ප්‍රාණීන් ගේ දිවි ගළවා රාජ්‍යය ලබන්නා හු ද ධර්මයෙන් ම ලදහ.

519. තව ද භූරිදත්ත ජාතකයෙහි භූරිදත්ත නම් නාග රාජ වැ ශක්‍රසම්පත්ති සමාන නාගසම්පත්ති හැරැ මනුෂ්‍ය ලොකයට අවුත් පෙහෙ වැ හෙවැ කිපි බැලූ බැලුම් මාත්‍රයෙකින් ම මුළුලොව භසම කරන්නට සමර්ථ්‍ව ද තමන් බිම ඇදූ දික් කොටැ හොවා පාවිලිඹින් තළන්නා වූ අහිතුණ්ඩිකයාගේ මුහුණ ඇස දල්වා බැලුව හොත් දෙඅ විත්තයක් උපත හොත් බැලූ දෘෂ්ටියෙන් ම නික්මුණු විෂ වෙගයෙන් මොහු නව නොත් නපුරැ යි තමන්ගේ බලවත් වූ විෂය පිටත් විය නො දෙන පිණිස දෙර පියා ගත්තාසේ දෙ ඇස පියා හෙවැ කම් කටුල් විදැ ද ශීලභෙදයක් නො කරන්නා හු ද ධර්මයෙන් ම නො කළහ.

520. තව ද මහානාරද කස්සප ජාතකයෙහි නාරද තම් මහාබ්‍රහ්ම වැ අඩහානි නම් රජ්ජුරුවන්ගේ මිථ්‍යාදෘෂ්ටි බිඳැ ගුණ තම් නිවටාගේ දුර්බ්බුද්ධි දුරැ කොටැ, මුළුලොව සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටුවන්නාහු ද ධර්මයෙන් ම පිහිටුවූ හ.

521. තව ද විධුර ජාතකයෙහි විධුරපණ්ඩිත වැ ඉරන්දතී නම් නාග කන්‍යාව කෙරෙහි ලොභ කළාවූ පූර්ණක තම් යක්ෂයා සැට යොදුන් පමණ කාලපර්වතයට නහා ගෙණැ "තමන් ලය පලා පියා මස් ගන්මි" යි පවන්ගත් කල්හි තමන්ගේ මධුර වූ ධර්ම දෙශනායෙන් තමාගේ ලෙහි මස් ගන්නට සිතූ යක්ෂයාගේ ලය තුමූ පළමු කොටැ ගන්නාහු ද ධර්මයෙන් ම ගත්හ.

522. තව ද **උමංදුයෙහි මහෞෂධ පණ්ඩිත** වූ අවිලෝස් අසෙහෙණියක් තමන් ගෙණාවාවූ **බ්‍රහ්මදත්ත** රජ්ජුරුවන් තමන් ගේ එක බුදි ශක්තියෙන් ලුහුබඳවා අන්තයෙහි කාමවසඟ වූ බ්‍රහ්ම දත්ත රජ්ජුරුවන්ගේ රාජධානියෙහි හසු වූ හියා වූ මෙදෙහ රජ්ජුරුවන් ලෙහි ඇවිලි ශොකා'ග්නි තමන්ගේ වවතා'නුසමරණ යෙන් නිවා සහ පිරිවර රජ්ජුරුවන් තමන් බුන් උමඟින් ගළවා ජීවිතදානය දෙන්නාහු ද ධම්යෙන් ම දුන්හ.

523. තව ද **වෙස්සන්තර ජාතකයෙහි වෙස්සන්තර මහ රජ** වූ **සුමෙධ නාපස** කාලයෙහි පුරන්නට පටන් ගත්තා වූ සමතිස් පෙරුම්හි කුළු ගෙණ සත් ඉඩෙකැ පොළොව කම්පා කොවැ මහ දන් දී බොධිසම්භාර ධම්යන් මස්තක ප්‍රාප්ත කරන්නා හු ද ධම්යෙන් ම කළහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි, අනන්ත ප්‍රකාරයෙන් පුරුදු කොටැ වජ්‍රාසනයෙහි පහරවා අන් නො හැරැ ආවා වූ **දීපඞ්කර** පාදමූලයෙහි පටන් ධාතු පරිනිර්වාණය දක්වා ලොකාර්ථයට ම සරහා සිටු වූ මා සේ වූ අනාථයන්ට ක්ෂෙම මන්ත්‍ර කොටැ තුබූ මාගේ ලයට අමෘත පරිඝෙකයක් බදු වූ මාගේ කණට අමෘත මන්ත්‍රයක් වැනි වූ, **සඳ්ධම්ම රත්නය** සරණ යෙම් යි **දහම් සරණ යා සුතු.**

තව ද මාගේ සවාමි වූ තිලෝගුරු වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් බුදු වූ සත් සති ඇතුළත්හි "තමාට හිතොපදෙශ කරන්නා වූ ආචාර්‍ය්‍ය කෙණෙකුන් නැති වැ වසන බව සුදුසු නො වෙයි. මට ආචාර්‍ය්‍ය වන්නට සුදුස්සෝ කවුරු දෝ හෝ යි සිතා වදාරා" අවීචියෙහි පවත් ගෙණ භවාග්‍රය දක්වා භවාග්‍රයෙහි පවත් ගෙණ අවීචිය දක්වා සසර අනන්තා'පරිමාණ සක්වළෙහි මට ආචාර්‍ය්‍ය වන්නා තබා මා හා සමසථානයෙහි සිටිනට ද එක ද සත්ත්වයෙක් නැත. සදෙවක සමාරක ස'බ්‍රහ්මක ලොකයෙහි හැම මාගේ දැස පක්ෂයෙහි සිටියහ. අනාචාර්‍ය්‍ය වැ වසන බවක් සුදුසු නො වෙයි.

එහෙයින් මට ආචාර්‍ය්‍ය කා කෙරෙම් දෝ හෝ යි සිතා වදාරා "මව බැහැරින් ආචාර්‍ය්‍ය වරුන් සොයන්නේ කුමකට ද? මාගේ සබ්බඤ්ඤුතයෙන් දන්නා ලද්දා වූ සද්ධම්ය ම මට ආචාර්‍ය්‍ය සථාන යෙහි තබමි" යි සිතා වදාරා **තිලෝගුරු** වූ **තමන් වහන්සේට ගුරු කෙනතුරෙහි** තබා වදාළ **සද්ධම්ය** ම මට **ශරණ** ය. එසේ වූ ධම්රත්නය සරණය ගියා වූ මට මනුෂ්‍යා'මනුෂ්‍යාදී වූ කිසි කෙණෙ

කුන් විසින් වන්නාවූ උපද්‍රවයෙක් දුරා'තිදුර ය. එසේ හෙයින් මුළුලොවට වප්‍ර කවව වූ **ධම්මරත්නය** සරණ යෙමි යි දහම් **සරණ යා යුතු.**

තව ද මාගේ සවාමි මැසි මදුරු කිහිඹි කුහුඹු ආදිවූ සුළුදු ප්‍රාණීන් කෙරෙහි පවත් හෙණැ තුන්ගවු පමණ උස ඇති **ශක්‍රදෙවෙන්ද්‍රයා** දක්වා, දෙළොස් යොදුන් **මහාබ්‍රහ්මයන්** දක්වා, සෙළසියයක් යොදුන් **ගරුඬයන්** දක්වා, දහස් යොදුන් **ආනන්දාදි** මනුෂ්‍යයන් දක්වා, සාරදහස් අවසියක් යොදුන් **රාහුඅසුරිඳු** දක්වා, සියලු ලොව තමන්ගේ ඥන ශක්තියෙහි **කරුණා** කුක්ෂියෙහි ලා හෙණැ මම ය, මාගේ ය, මාගේ මිත්‍රයෝ ය, මට මඛ්‍යසථයෝ ය, මට අමිත්‍රයෝ ය, සත්‍රු ය, පුරුෂයෝ ය, ආර්‍යයෝ ය, අනාර්‍යයෝ ය, දිව්‍යයෝ ය, නරයෝ ය, අපායසථයෝ ය, දසදික් භාග වර්ති වූ අනන්තා'පරිමාණ සක්වළ පවත්නා වූ සියලු සත්ත්වයෝ රාජභය චොරභයාදි වූ සියලු භයින් මුකත වැ, ජාති ජරා ව්‍යාධි ආදි වූ අපරිමාණ ඛ්‍යසනයෙහි රස නො දනැ මේ ලෝ පර ලෝ දෙක යෙහෙන් සාධා කෙසේ ගැළවෙදෝ හෝ කවර ලෙසෙක මොවුන් රක්ෂාවක් කෙරෙම් දෝ හෝ යි සිතා සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි සසරට වැදූ වෙහෙසි පෙළී සමතිස් පෙරුම් පුරා කෙළවර වප්‍රාසනාරූඪ වැ—

සවාසනා සර්ව කෙලෙශයන් නසා සව්නේ ගෙවා දනැ බුදු වූ මා මෙතෙක් කල් දුක් ගත්තේ ලොව රක්ෂා කරණ පිණිස මුත් මා පිණිස නො වත්. මේ අනාථ ලොවට රක්ෂා වන්නට සුදුසු දෙයක් කිම් දෝ හෝ යි සිතා **පරීක්ෂා** කොවැ වදරමින් සියලු තත්ත්ව තාක් තමන් වහන්සේගේ ඥනයෙන් පරීක්ෂා කොවැ මේ අනාථ ලොව රක්ෂා කරන්නට කිසි දෙවතා කෙණෙකුට පිළිවන් නොවෙයි. කිසි බ්‍රහ්මයෙකුට පිළිවන් නො වෙයි. සෙසු නාග සුපර්ණාදි සත්ත්වයන් අතුරෙන් එක්තරා එක් සත්ත්වයක් හට පිළිවන් නො වෙයි. මහා සාගරයෙහි පත්ලට බැසැ ද, මෙර උසුලා සිටි ත්‍රිකූට පර්වතයෙහි යටට වැදූ ද, ආකාශයට නැඟී ද, සංසාර ඛ්‍යසනයෙන් සත්ත්වයා ගැළවා රක්ෂා ගන්නට සුදුසු එක ද කාරණයෙක් නො පැණෙයි.

මොවුන්ට රක්ෂාව නම්, මොවුන්ට සරණ නම්, මොවුන්ට පියෝ නම්, මොවුන්ට මවු නම්, මොවුන්ට අතලොඹු නම් එක ම ධර්මය මුත් අන් දූයෙක් නැතැ යි වදරා,

"ධම්මෝ හවෙ රක්ඛති ධම්මචාරිං-
ධම්මෝ සුචිණ්ණෝ සුඛ'මා 'වහාති,
එසා'නි සංසෝ ධම්ම සුචිණ්ණ-
නා දුග්ගතිං ගච්ඡති ධම්මචාරි"සි,

වදරා ලොවට රක්ෂා කොටැ ලොවට ප්‍රතිසරණ කොටැ තිලෝ ගුරු සම්‍යක් සම්බුධියන් වහන්සේ විසින් සිටුවා වදළ ධම් රත්නය සරණ යෙමි සි දහම් සරණ යා යුතු.

තමා ශරණ ගියවුන්ට සියලු උපද්‍රව දුරුකරන්නා වූ ධම් රත්නය සරණයෙමි සි දහම් සරණ යා යුතු.

"ධම්මං සරණං ගච්ඡාමි-දහම් සරණ යෙමි.

2. ජාතක ධම් සංග්‍රහ කථා නිමි.

3. සද්ධම්ම වණ්ණණා කථා

මෙසේ ශ්‍රද්ධා සම්පන්න වූ ජනයන්ට අනුග්‍රහ සඳහා දහම් සිහිකළ කෙණෙහි බොහෝ සත්ත්වයාට උපද්‍රව දුරුවන බව භගවත පිණිස පිටකත්‍රයයෙහි පැණෙන්නා වූ කථානන්තර දක්වා දහම් සරණ වණ්ණණා කෙරෙමි. ඒ කෙසේ ද? යත් –

1. උත්තරා කුමාරි කථා

මාගේ සවාමි වූ, මට කල්‍යාණ මිත්‍ර වූ, මට ම සියලු දුකඛ ප්‍රතිකාරයට දිව්‍ය ඖෂධ වූ, මගේ ලයට අමෘත පරිශෙක වූ, මාගේ ඇසට අමෘතාඤ්ජන වූ, මා සසර වලින් නඟන්නට අත් දී සිටි මට ම සිතහැති වැ මට ම කරුණා ඇතිවැ මා එක තැනැත්තහු ම ගළවන පිණිස මෙන් දීපඞ්කර පාද මූලයෙහි ම අත්පත් නිවන් සැප හැර සසරට වන් තිලෝගුරු ගෞතම ශොත්‍රයෙහි උපන් සම්මා සම්බුදු රජානන් වහන්සේ එක් සමයෙක්හි රජගහානුවර වෙළුවන විහාරයෙහි වැඩ වසන සේයෙක.

එ සමයෙහි පුණ්ණ නම් දුගියෙක් රජගහානුවර සුමන නම් සිටානන් නිසා ජීවත් වන්නේය. ඔහුගේ ගෙයි මිනිස්සු නම්?–අඹුව හා උත්තරා නම් දුව හා දෙන්න ම ය. එ සමයෙහි එක් දවසක් රජගහා නුවර "සත් දවසක් කෙළි කෙළනෝය"යි බෙර ලැවුහ ඒ අසා සුමන සිටානෝ උදැසන ම ආවා වූ පුණ්ණ නම් දුගියා දැක්ක "දරුව! අපගේ පරිවාර ජනයෝ කෙළි තළු කෙළනා කැමැත්තෝ ය. තෙපි අද කෙළු ද? බැළ මෙහෙකරුදැ"යි කියා විවාළහ.

පුණ්ණ නම් දුගියා ද "සවාමිනි! කෙළිතළු නම් සුව පතුන්ටම ය. මාගේ ගෙයි සෙට දවසට හඹු පිසන්ට ද සහල් නැත. එහෙයින් මට කෙළියෙන් ප්‍රයෝජන කිමෙක් ද? "ගොන් දුනහොත් සාන්නට යෙමි"යි කියා කිහ. තැවත සිටානන් විසින් "එසේ වුවහොත් ගොන් ගෙණැ සාන්නට යව"යි කී කල්හි ගොන් හා නඟුල් ගෙණැ සාන්නට යන්නේ තමා අඹුවට කියන්නේ, "අද නුවර වැස්සන් කෙළි කෙළිය දී මම බැළමෙහෙ කරන්නට යෙමි යි අද මට වඩාලා බත් පිසැ ගෙණැ එව"යි කියාලා කුඹුරට ගියේ.

ඉක්බිති සැරියුත් මහතෙරුන් වහන්සේ සත්දවසක් නිරොධ සමාපත්තියට සමවැදැ එයින් නැඟී "අද කාට උපකාර කෙරෙමි දෝ හෝ" යි බලා වදුරණ සේක් ඒ පුණ්ණ නම් දුගියා

දැකැ "නැවත මේ තෙම් සැදුහැ ඇත්තේ වේ හෝ මට දන් දෙන්නට පොහොසත් වේනෝ"යි බලා වදරණ සේක් ඔහු සැදුහැ ඇති බව ද, දන් දෙන්නට පොහොසත් බව ද, දැනැ තමන් වහන්සේට දුන් දනින් ඕහට මහා සම්පතනි වන බව ද බලා වදරා පා සිවුරු ගෙණැ ඔහු සී සාතා තැනට වැඩැ එක්වළක් අසල ලැහැබක් බල බලා[1] වැඩැ සිටි සෙයෙකි.

ඒ පුණණ නම් දුගියා ද තෙරුන් වහන්සේ දැකැ අවුත් පසඟ පිහිටුවා වැඳැ දුහටු[2] දඬු කැමැති සේක් වනැ යි සිතා දුහටු දඬු කපා දී නැවත තෙරුන් වහන්සේ තමා අතට පාත්‍රයත් පෙරහන්කඩත් දුන් කල්හි පැන් කැමති සේක් වනැ යි සිතා පැන් පෙරා දිනි. ඉක්බිති තෙරුන් වහන්සේ "මෙතෙම අනුන්ගේ පිටි පැලදෙර ගෙයක වසන්නේය. එහෙයින් මොහුගේ ගෙට ගියෙම් වී නමුත් මොහුගේ අඹු මා නො දක්නී ය. එහෙයින් යම් තාක් ඕ තොමෝ ඒ ඔත් ගෙණේ ද ඒ තාක් මෙහි ම සිටිමි" යි සිතා එ තැන ම මඳ විගසක් කල් යවා සිටැ ඔහුගේ අඹුව මගට ආ බව දැනැ ඇතුළු නුවර බලා නික් මුනු සේක.

ඔහුගේ අඹුදු අතර මග තෙරුන් වහන්සේ දැකැ "දනව සුදුසු දෙයක් ඇති දවසක් තෙරුන් වහන්සේ දැක්ක නො හෙම්. තෙරුන් වහන්සේ දුටු දවසක් දෙන්නව සුදුසු දෙයක් නො ලබන්නෙම්. අද දෙන්නට සුදුසු දෙයකුත් ඇත. තෙරුන් වහන්සේත් දුටිමි. තෙරුන් වහන්සේ මට කරුණා කොටැ වදරණ සේක් වේ හෝ යි සිතන්නී ඔත් බඳන බහා තබා පියා තෙරුන් වහන්සේ පසඟ පිහිටුවා වැඳැ "වහන්ස ! මේ මිහිරිය නො මිහිරිය යි නො සිතා නුඹ වහන්සේගේ ගැත්තවුන්ට කරුණා කොටැ වදළ මැනවැ" යි ආරාධනා කළා.

ඉක්බිති තෙරුන් වහන්සේ පාත්‍රය පැ වදරා ඔත් භාගයක් ගෙණැ ලූ කල්හි අහින් පාත්‍රය පියා ගෙණැ වළකා වදළ සේකි. නැවත ඕ තොමෝ "නුඹ වහන්සේගේ ගැත්තවුන්ට මෙලොවින් කරුණා නො කොටැ පර ලොවින් කරුණා කොටැ වදළ මැනවැ" යි ආරාධනා කොටැ අහර මුළුල්ල ම පාත්‍රයෙහි පිළිගන්වා නුඹ වහන්සේ දුටු නිවන් දැක්ක හෙම්ව" යි ප්‍රාර්ථනා කළාය තෙරුන් වහන්සේ ද "එසේ ම වේවා" යි වදරා එක් පැන් ඇති තැනෙකැ වැඩැ හිඳැ වළඳ වදළ සේකි. පුණණ නම් දුගියා ද සසින් ඔබා වැ සහන්නට නො පොහොසත් වූයේ ගොන් මුදු හැරැ පියා

1. තෙබක් බලා. 2 දුවැටි දුවටු-දුහැටු

ගසක් මුලැ අඹුව එන පෙර මහ බල බලා හුන්නේ ය. ඔහුගේ අඹුව ද නැවත ගෙට ගොස් බත් පිසැ ගෙණැ ගෙණෙන්නී ඔහු දැකැ මේ තෙම සසින් විඩාව හුන්නේ "බත් ලස් කෙළේ කුමවදැ" සි මා මැරි තම් මා විසින් දුන් දන් සිස් වන්නේය.

එහෙයින් "පළමු කොටැ ම මෙයේ ඕහට කිව මැනවැ" සි සිතා පුණණ නම් දුගියාට "සැමිය! අද එක දවසක් තොප ගේ සිත පහදව, මා විසින් බොහෝ වේලේ ම තට බත් පිසැ ගෙණැ ගෙණෙන්නෙම් අතර මහ ධම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ දැකැ තට ගෙණෙන ඒ බත් ඔවුන් වහන්සේට පිළිගත්වා නැවත ගෙට ගොස් බත් පිසැ ගෙණැ ආම්" සි "තා සිත පහදව" යි කිවු ය.

ඉක්බිති පුණණ නම් දුගියා "කිමෙක් ද? නි කියන්නේ" යැයි විචාරා නැවත එපවත් කි කල්හි "සාධු! සාධු!! යහපත කළ සේ ය. මම ද අද දවස උන්වහන්සේට උදැසන දැවටි දඹු මුඛ සොධන පැන් ද දින්මි" සි සතුටු වූ සිත් ඇත්තේ ඒ තමා අඹුව කි බස් පහන් සිතින් අනුමෝදන් වැ සෘ විඩා වැ බත් කැමෙන් විඩා වූ ශරීර ඇත්තේ අඹුව ඇකයේ හිස තබා ගෙණැ මදක් නිදැ පිබිදැ ඇත් මැන් බලන්නේ තමාගේ සාන කෙත්වත මුළුල්ල ම කිණිහිරි මල් රැකක් සේ රන්වන් වැ පියා පැණෙන්නා දැකැ "මෙ මා සාන තැන් තාක් රන්වන් වැ පියා පැණෙයි. කිමෙක් දෝ හෝ කල් යවා බත් කැ හෙයින් මා ඇස් බමණ නියා වනැ" සි සිතා තමා අඹුව අතිනුදු විචාරා ඇ විසිනුදු "සැමිනි! මට ත් මෙ පරිද්දෙන් පැණෙ" සි කි කල්හි තෙමේ නැඟී සිවැ කුඹුරට ගොස් එක් මැටි පිඩක් ගෙණැ තහුළිසැ පැහැරැ රත්රන් බව දැනැ ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේට දුන් දනින් අද ම මෙබදු විපාකයෙක් වී යැ" සි සතුටු වී.

"නැවත මෙ පමණ ධන සහවා ගෙණැ වැළඳ ගන්නට නො පිළිවනැ" සි තමාට බත් ගෙණ ගිය බදනෙන් රන් බඳ තක් පුරා ගෙණැ රජගෙට ගොස් රජ්ජුරුවන් දැකැ 'සැමිනි! අද මා සාන තැන් මුලුල්ලෙහි ම රන්වන් වැ පියා තුබුයේ. ඒ ගෙන්වා ගත මැන වැ" සි කිහ. ඒ අසා රජ්ජුරුවෝ "තෝ කවරෙක්හි ද අද කුමක් කෙළෙහිදැ" සි විචාළෝ ය.

"සුවාමිනි! මම් පුණ්ණ නම් දුගියෙක්මි. අද මම් උදැසන ධම්සෙනෙව් සැරියුන් මහතෙරුන් වහන්සේට දුවැටි දඹු ද මුඛ සොධන පැන් ද දිනිමි"යි "මාගේ අඹු ද මට ගෙණෙන බත් අතර මහ දැකැ ඔවුන් වහන්සේට ම දන් දුනි"යි කී කල්හි "ධම්සෙනෙව් සැරියුන් මහතෙරුන් වහන්සේට දුන් දන්හි විපාක අද ම දුටුයෙහි වේ ද"යි කියා නැවත "දරුව අපි! කුමක් කරමෝද යි විචාළෝ. සුවාමිනි! ගැල් දහස් ගණන් යවා ඒ රත්රන් ගෙන්වුව මැනවැ"යි කිහ.

ඉක්බිති රජ්ජුරුවන්ගේ නියෝගයෙන් රජ්ජුරුවන් සතු කොටැ ගන්නා කල්හි ගත් ගත් දෙය ම මැටි වැ යන්නේ ය. ඒ බව ගොස් රජ්ජුරුවන්ට කී කල්හි "තෙපි කුමක් කියා ගණුදැ"යි විචාරා "නුඹ වහන්සේ සතුය යි කියා ගණුම්හ"යි කී කල්හි "මම ඒ රනට කවරෙක් වෙම් ද? පුණ්ණයා සතු කොටැ ගණුව"යි කියා රජ්ජුරුවෝ මිනිසුන්ට නියෝග කොළෝ. ඉක්බිති රජ්ජුරුවෝ නුවර වැස්සන් කැටි කොටැ "මෙතෙක් ධන මේ නුවර කාට ඇද්ද"යි විචාරා "කාවත් නැතැ"යි කී කල්හි "නැවත මෙතෙක් ධන ඇත්තා වූ මෝහට කුමක් දෙන්නට සුදුසුදැ"යි "විචාරා සිටුතනතුර දෙන්නට සුදුසුයැ"යි කී කල්හි ඔවුන්ට බහුධන සිටානෝයැ යි නම් දී සිටු තනතුරු දුන්හ.

ඉක්බිති ඒ සිටානෝ "සුවාමිනි! මෙතෙක් කල් අනුන්ගේ ගෙයි විසුම්හ. දැන් අපට වෙනම වසන තැනක් දුන මැනව"යි ඉල්ලූහ. රජ්ජුරුවෝ ද ඔවුන්ට නැසී පියා තුබූ පෙර සිටු කෙණෙකුන්ගේ බිමක් දුන්හ. ඒ සිටානෝ ද ඒ බිමැ කිප දවසකින් ගේ කැවා එගෙට වදන මගුල් ද තමන්ට සිටු තනතුර ලද මඟුල් ද එක් කොටැ කරන්නාවූ සත් දවසක් මුළුල්ලෙහි බුදු පාමොක් මහා සඞ්ඝයා වහන්සේව මහදන් දුන්හ. බුදුන් වහන්සේ ද බණ වදාළ සෙයෙකි. එ බණ අසා පුණ්ණ නම් සිටානෝ ද ඔවුන්ගේ අඹුවෝ ද උත්තරා නම් දියනියෝ ද සෝවාන් වැ නිවන් සුව ලදහ.

පසුව කල් යාමෙකින් එම නුවර සුමණ නම් සිටානෝ මෙ කී පුණ්ණ නම් සිටානන්ගේ දියනියන් ඉල්වා "ඔවුන් නො දෙම්හ"යි කී කල්හි "එසේ නො කියව; මෙතෙක් කල් තෙපි අප නිසා වැසැ මේ සම්පත් ලදුව; එහෙයින් අපගේ දරුවන්ට තොපගේ දියණියන් පාවා දෙව"යි ඉල්වා තොප පුතනුවෝ සැදැහැ නැත්තෝ ය. අපගේ දූ තුණුරුවන් හැර නොපවත්නීය. එහෙයින් නො දෙම් හ"යි කිවුහ. ඉක්බිති බොහෝ සිටුවරුන් ආදී බොහෝ කුලපුත්‍රයෝ

ගොස් "ඒ සුමන සිටාණන් හා විශ්වාස කම් නොබිඳ්ද මැන වැ"යි ආරාධනා කළෝය. ඔවුන්ගේ ආරාධනයෙන් **පුණ්ණ** සිටානෝ තමන්ගේ දියනියන් සුමන සිටානන්ගේ පුතනුවන්ට ඇඟැළ මසා මැදි පොහොය හිඳුවා දුන්හ.

ඕහට දුන් තැන් පවත් ගෙණ **උත්තරා** නම් උපාසිකාවෝ සඞ්ඝයා වහන්සේ වරුන්දූ කරා එළඹෙන්නට ද දනක් දෙන්නට ද බණ අසන්නට ද නො ලබන්නාහු මෙසේ දෙ මස් දෙ පෝයක් ගැවූහ. නැවත **උත්තරා**වෝ එක් දවසක් තව මේ වස් වසන කලින් කි දවසෙක් ඉතිරිදූ යි තමා ගේ කැටිවැ සිටියවුන් අතින් විචාරා "තව දෙපෝයෙක් ඇතැයි කි කල්හි ඕ තොමෝ තමාගේ පියානන්ට "කුමක් හෙයින් මා මෙබදු දහ ගෙයකැ දැමූ සෙයක් ද? මෙසේ වූවන්ට දීමට වඩා සන් ගසා අනුන්ට මිඹි කොටැ දෙන බව යහපතැ"යි මේ මට ආ තැන් පවත් කොටැ සඞ්ඝයා වහන්සේ වරුන්දූගේ දූකුම් ආදී වූ කිසි පින්කමක් කරන්නට නො ලැබෙම්[1]" කියා ගැවූහ.

ඉක්බිති **පුණ්ණ** නම් සිටානෝ "මාගේ දියනියෝ දුක්පත් වැ හියෝ වනැ"යි සිතා පසළොස් දහසක් මසුරන් ගැවූහ. රන් ගවන්නෝ ද "මේ නුවර **සිරිමා** නම් කුනියක් ඇත. ඕ තොමෝ දවස් පතා දහසක් ගන්නී. මේ රන් යවා ඇ ගෙන්ව ගෙණැ තමන් සමනන් පාවා දී ලත් අවසරයෙක කුසල් කරන්නේ"යි කියා ගැවූ ය. **උත්තරා**වෝ ද එකී පරිද්දෙන් **සිරිමා** නම් කුනිය ගෙන්වා ගෙණැ තමන්ගේ සමනන් කරා ගොස් සාමිනි! මේ දෙ පෝයෙහි මාගේ මේ යෙහෙළි නොපට අත් පා මෙහෙ කෙරෙයි. මම මේ දෙපෝයෙහි දන් දෙනු කැමැත්තෙමි. බණ අසනු කැමත්තෙමි"යි කිව. ඒ සුමන සිටානන් ගේ පුතනුවෝ ද ඒ **සිරිමා** නම් කුනිය දූකැ ඇ කෙරෙහි අලුම් ඇතිව යහපතැ"යි ගිවිස්සෝය.

ඉක්බිති **උත්තරා**වෝ ද බුදුපාමොක් මහා සඞ්ඝයා වහන්සේට ආරාධනා කොටැ කන බොන දූ ආදි දන්දීමෙහි යෙදී දන් පිසන තැන ම යෙදී ඇවිදිනාහු යි. එක් දවසක් සුමන සිටානන්ගේ පුතනුවෝ "ඒ නුවණ නැති තැනැත්ති කුමක් කෙරේ දෝ හෝ යි කවුළුයෙන් බලන්නේ **උත්තරා**වන් බාදියෙන් තෙමී දැලි වැකී අඟුරු කණුවක් සේ බත් මාලු පිසන්නට නියොග කොටැ ඇත මැත ඇවිදිනාවුන් දූකැ මේ නුවණ නැති තැනැත්තී මෙසේ වූ තැන සම්පත්හි අනුභව නො කොටැ මෙතෙක් දුක් ගෙණැ ඇවිදිනී, සතුටු සතුටු වැ ඇවිද්දී"යි සි පියා එතැනින් ගියේ.

1. නොලැබිමි.

ඔවුන් එහාෑනින් ගිය කල්හි ඔහු සමීපයෙහි සිටි ඒ සිරිමා නම් කුති "කුමක් බලා දේ හෝ සි මොහු සි පියේ?"යැ සි උත්තරාවත් කෙරෙහි වෛර බැඳැ උඩුමාලෙන් බැසැ දන් පිසන තැනට ගොස් කැවුම් පිසිමින් සිටි ඇතිළියෙහි කකියන තෙල් සාළුවෙන් උකා ගෙණැ උත්තරාවන් ආලයට ගියා උත්තරාවෝ ද ඒ කුතිය කකියන තෙල් සාළුවෙන් උකා ගෙණැ තමන් කරා එන්නිය දැකැ "මාගේ යෙහෙළිය මට කළ උපකාරයට් මේ සක්වළ ඉතා කුඩා ය. බඹලොව ඉතා මිටි ය. මාගේ යෙහෙළිය ගේ ම ගුණ ඉතා මහත. මම මැ නිසා දන් දෙන්නට බණ අසන්නට ද ලැබෙමි ඉදින් මැ කෙරෙහි රැහැණියක් ඇත්තෙම් විම් නම් මේ තෙලින් මා ඇහ දැ සේව"සි "නො එසේ විම් නම් නො දුව"සි කියා මෙසේ ඇ කෙරෙහි මෙත් සිත් පැතිරැ වූහ.

ඒ සිරිමා නම් කුති ද තමාගෙන් කකියන තෙල් උත්තරාවන් මුදුනෙහි වත් කළා. එසේ හුණු වූ තෙල් පැන් සේ වි ය. මෙසේ සිත් තැන්තා වූ ගිනි ගෙණැ දිලියෙන තෙල් පවා ධර්මඤ්ඤයන්ට අමෘත පරිඝෙකයක් සේ සිහිල් වූ බව අසා මෙතෙහි කොවැ අපට ද සියලු උපද්‍රව මෙසේ ම දුරැ කරම්හ සි සිතා සියලු සංසාරයෙහි පවත්නා සත්ත්වයන්ට දුක් දුරැ කොටැ සුව ළබවන්නා වූ ධර්ම්ය සරණ යෙම් සි **දහම් සරණ** යා සුතු.

1. උත්තරාකුමාරියගේ කථාව.

"ධම්මං සරණං ගච්ඡාමි" දහම් සරණ යෙම්. තමා සරණ ගිය මේ ධර්මය තමා රැක්කවුන් රක්ෂා කරණ පරිදි මේ කථානන්තර යෙනුදු දත යුතු. හේ කෙසේ ද? යත්-

මඛඟල සම්‍යක් සම්බුඛයන් වහන්සේ තමන් වහන්සේ බොධි සත්ත්ව භූමියෙහි සිටිකල්හි සවිනේ ගෙවා දූනැ සවාසනා සඒ කෙලඹයන් තසා බුදු වැ කළමනා බුඛි

2. බොධිසත්ව කථා කෘත්‍යය තාක් මස්තක ප්‍රාප්ත කොටැ සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් ගේ අමෘත මහා නිර්වාණ සන්දර්ශනයෙන් වූ සන්තෝෂය එකතින් බෙදා වළඳ කරුණාබ්‍රරයෙහි මුදුන්පත් වැ පිරිනිවන් පෑවා වූ එක් සම්‍යක් සම්බුඛි කෙණෙකුන් වහන්සේගේ චෛත්‍යය දැකැ වදුරා "මේ චෛත්‍යය නම් සර්ව්ඥ කෙණෙකුන්ගේ ධාතු නිධාන කළ චෛත්‍ය යෙකැ"සි යන බැවහාර මාත්‍රයක් බව මුත් "සකල ලොකාර්ථ තාක්

එක් තැන් කොටැ බැන්දූ මහනිධාන යෙකැ''සි පිරිනිවියා වූ තමන්ගේ ශරීරයෙහි ඇවින් පවා ලොකාථී කරන්නා වූ මහා පුරුෂයන්ට මා විසින් මාගේ ජීවිතයෙන් පූජාවක් කළහොත් යහපතැ''සි සිතා වදාරා-

සසර පමණින් තමන්ගේ සිත ශීලාදී වූ ගුණ ධර්මයෙන් වෙළා අනාථ සත්ත්වයන් කෙරෙහි පවත්නා වූ සෙනහයෙන් අද ද කොටැ ඥත තෙජසින් දල්වා පිරිනිවියා වූ මහා පුරුෂයානන් වහන්සේට මම ද මාගේ ශරීරය පහන් පියල්ලෙන් වෙළා තෙලින් අද ද කොටැ ''ගින්නෙන් දල්වා පහන් පූජා කෙරෙමි''සි සිතා වදාරා දඹුවැටක් වෙළන්නා සේ සියලු ශරීරය තඹින් වෙළා තෙල් ගසා ගිනි අවුලුවා ලක්ෂයක් වටනා සවණී පාත්‍රයෙක සුවඳ තෙල් පුරා වැටි දහසක් එහි ම අවුලුවා හිසැ සිටැ දෙ පත්ල දක්වා සරීර'ඔහයෙහි ගිනි අවුලුවා තුන් යමකින් යුක්ත වූ රාත්‍රී යෙහි තිස් පැය මුළුල්ලෙහි ඒ චෛත්‍යය පැදකුණු කොටැ වදාළ සෙයෙක.

එසේ ම සරීර'ඔහයෙහි ඇවිලී ගින්න ඒ මහා පුරුෂයානන් ගේ සිත්හි පිරී තුබුවා වූ ධර්මයෙහි අනුසසින් ශරීරයට උපද්‍රවයක් කරන්නා තබා රොම කූප මාත්‍රයකුදු හුණු කොටැ පිය නො හික. පවනින් සැලෙන්නා වූ පෙති ඇති පියුම් ගබකට වන්නා වූ රාජ හංසයකු සේ දිලියෙන්නා වූ ගිනි මධ්‍යයට වන්නා වූ මහා පුරුෂ යානෝ නිරුපද්‍රව වැ පහන් කොටැ වදාළ සෙයෙක.

ඒ අනුසසින් තමන් වහන්සේ බුදු වූ කල්හි අනූදහසක් අවු රුදු මුළුල්ලෙහි දසදහසක් සක්වළ ගබ කෘෂ්ණ පක්ෂ වාතුර්දශියෙහි දිලියෙන්නා වූ **ගණ්ඩමාදනපර්වතය** සේ ශරත් කාලයෙහි දිලි යෙන්නා වූ **ලඟිරු කුසක්** සේ හාත්පසින් නැහෙන්නා වූ රශ්මීන් ගැවසී ගත්තා වූ **ජාතිරඹ මාණික්‍යයක්** සේ එකා'ලොක කොටැ වදාළ සෙයෙක.

මෙසේ ධර්මය තම් සිත් පිත් නැති ගින්නෙන් පොවා උපද්‍රව යක් වැද්ද නො දී ලොව රක්ෂා කරණ දෙයෙක. එසේ වූ ධර්මය ද මෙතෙහි කොටැ සසර පමණින් රක්ෂා වන බව සත් පුරුෂ ධර්මයෙක බුදු පසේබුදු මහ රහතන් වහන්සේ ද තමන් වහන් සේට ශරණ කොටැ තකා වදාළේ මේ ධර්මය ම ය. පෙර වූ අනන්නා පරිමාණ සම්‍යක් සම්බුද්ධයෝ ද දැන් පවත්නා **ගෞතම** **ගෝත්‍රයෙහි** උපන් **සර්වාර්ථ දරුවෝ** ද මතුවන අප්‍රමාණ සම්‍යක්

සම්බුද්ධයන් වහන්සේ ද තමන් ජීවමාන කල්හි ද, පිරිනිවි කල්හි ද, සියලු ලොකාවී මෙම ධර්මය ම එල්බ කොටැ ගෙණැ වදාළ සෙයෙක.

එහෙයින් යක්ෂයන් සේ පරාභයන් ගේ ක්‍රොධාග්නීන් පිරී තිබෙන ලය තමා දුටු වේලෙහි අමායෙන් පිරූ මහවිල් සේ සිහිල් කරණ පිණිස ද **රාජභය චොරභය අග්නිභයාදි** භය සංසන්දනය කෙනුදු මා කරා නො වැද්ද දී ධර්මයෙහි ගුණ නො දන්නා වූ සත්ත්වයන්ට විෂ සේ පවත්නා වූ සංසාරයට ම අමෘතමය කොටැ මෙම ධර්මයෙන් ම අත්වැඩ පරවැඩ මුදුන් පත් කොටැ අමා මහ නිවන් වැදූ සැනහෙන පිණිස ධර්මය ම සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

2. බොධිසත්ව කථා.

"ධම්මං **සරණං** ගච්ඡාමි" – **දහම් සරණ** යෙමි. තව ද අනන්ත දුකඛයෙන් ගැවැසි ගත්තා වූ මේ සංසාරයෙහි සියලු දුකින් මුකත වැ බ්‍රහ්ම විමානයෙහි වසන්නා වූ බ්‍රහ්මයන් විලාශයෙන් යෙහෙන් වසන පිණිස මා සරණයව තැකුවා වූ මේ සද්ධර්මය මුලුලොවට සරණ බව හඟවන පිණිස තමන් වහන්සේ බඩහොත් කල්හි මළා වූ මැණියන් වහන්සේ හා එක් වැ සොහොනට දවන්නට ගෙණැ ගියා වූ **සඞ්කිච්ච සාමණේරයන් වහන්සේ** සොහොන්හි දරුසැයෙහි ඇවිලි වූ ගින්නෙහිදු නො දැ රුකුනු පරිදි හඟවනු පිණිස ඒ **සංකිච්ච සාමණේරයන් වහන්සේ** ගේ කථාමෘතය දක්වමි. තමාට සිතෙහැති ධර්මයට සිතෙහැති බුදු රුවනට සිතෙහැති සඟුරුවනට සිතෙහැති සත්පුරුෂයන් විසින් සිතෙහැතිව ඇසිය යුතු. හේ කෙසේ ද? යත්:–

3. සංකිච්ච සාමණේර කථාව.

සංකිච්ච සාමණේරයන් වහන්සේ තම **සැරියුත් මහතෙරුන් වහන්සේ** ගේ අතවැසි වූ සත් හැවිරිදි සඞ්ඝාමදරුවාන කෙණෙක. උන්වහන්සේ ගේ මැණියන් වහන්සේ උන්වහන්සේ බඩහොත් කල්හි ම මළ සේක. මළා වූ ඔබ දවන කල්හි සියලු ශරීරය දැ ගෙණැ ගොස් සඞ්ඝාමදරුවානන් වැඩ හොත්තා වූ ගර්භ මාංශය ම සඞ්ඛ්‍යාවලාසයෙහි තුබූ පූර්ණ චන්ද්‍රමණ්ඩලයක් සේ ඇවිල නැහෙන්නා වූ ගිනි මධ්‍යයෙහි නො දැ තුබූ සේ. දවන මනුෂ්‍යයෝ නො දැ තුබුවා වූ ගර්භමාංශය දැකැ ගිනි මද පිණිස ය යි දෙතුන් තැනෙක හුලින් ඇනැ අඟුරු පිහිරා යව ලා පියා නැඟී ගියහ.

ගඟී මාංශය ගින්නෙන් දත් ද මල ද ඉඳිවැ ගියාවූ රන් පිළිමයක් සේ රෑම මාත්‍රයකට ද උපද්‍රවයක් නො වූ කුමාරයෝ ගිනි මඬ්‍යයෙහි විකසිත වූ පද්මයක් මඬ්‍යයෙහි දිලිහි දිලිහී හුන්නා වූ රන්වන් හංසරාජයක්හු සේ වැඩ හුන්හ. පසුව සොහොන් නිවන්නට ගිය පුරුෂයෝ ගින්නෙහි වැඩහුන්නා වූ කුමාරයන් දැකැ විසමය පත් වැ ගෙණ'වුත් වැඩුහ.

ඔබ සත්ගැවිරිදි කල්හි කෙළිමඬලෙහි දී කැටි වැ කෙළනා කුමාරයන් විසින් "තොප බඹ ගෝනා කල්හි ම තොපගේ මැණියෝ මළහ. තෙපි ඔවුන් දරසැයට නහා දවන කල්හි ද නො දැ රැකුණුව" යන බස අසා "මාගේ මේ සා උපද්‍රවයෙන් රැකුණු ජීවිතය අසථාන සේ නො නසමි" සිතා කැයන් අනුදන්වා **සැරියුත්මහතෙරුන්වහන්සේ** කෙරෙහි මහණ වන්නට පවන් ගෙණැ මහණ කරවන පිණිස හිසකේ බහන්නට ය සි කරය හිස ඔබා ගත් කර අක්ෂිම සිවුපිළි සිඹියාපත් රහත් වූ සේක.

මුන්වහන්සේ මවුකුස්හි වසන කල්හි මැණියන් වහන්සේ හා එක දරසැයට තැබූ කල්හි ඒ ගින්නෙන් රක්ෂා කෙළේ ද ඔබ ගිය ජාතියෙහි පිරූ සුචරිත ධර්මය ම ය. හුලින් පෙරළ පෙරළා අන්නා කල්හිදු ජීවිත විනාශයක් විය නො දී රක්ෂා කෙළේත් ඔබ පිරූ ධර්ම ය ම ය. එහෙයින් "මේ සියලු උපද්‍රවයට වජ්‍ර කවචයක් වැ සිටියා වූ සද්ධර්මය මුත් අනිත් සරණෙක් සත්ත්ව යන්ට නො පැණේ" සි දැනැ තමාට හිත කැමැත්තවුන් විසින් නිවන් හිමි කොටැ **දහම් සරණ යා යුතු.**

3. සංකිච්ච සාමණේර කථාව.

"ධම්මං සරණං ගච්ඡාමි" දහම් සරණ යෙමි. තව ද ධර්මයෙන් සියලු සත්ත්වයාට

මහා කප්පින රාජ කථාව. වන්නා වූ ඉෂ්ට සිද්ධිය දක්වන පිණිස **මහා කප්පින** ජාජ්ජුරු-

වන්ගේ කථාව දක්වනු ලැබේ

හේ කෙසේද ? යත්:-

මේ **කප්පින මහතෙරුන් වහන්සේ** පියුමතුරා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි කරණලද කුසල් ඇති වැ සංසාරයෙහි ඇවිදිනා සෙයෙක් මේ කප්හි **බරණැස්** නුවරට නුදුරු තැන්හි වියන්නවුන්ගේ ග්‍රාමයෙක්හි වියන්නවුන්ට වැඩි

මාළු වැ උපන්සේක. එසමයෙහි පසේ බුදුන් වහන්සේ වරුන්දූ දහසක් දෙන අටමසක් හිමාලයයෙහි වැසැ වැසි සාර මසක් මනුෂ්‍ය වාසයෙහි වසන සේක. ඔබ එක් සමයෙක්හි ආකාශ යෙන් බරණැස් නුවරට නුදුරු තැනකට බැසැ, වසන්නා වූ සෙනසුන් කරවන පිණිස වහල්වන්නට රජ්ජුරුවන්ට සැල කරවයි පසේ බුදුන් වහන්සේ අවදෙතෙකු යවා වදුළසේක.

එසමයෙහි රජ්ජුරුවන්ගේ වප් මහුලෙක් ආසන්න වී ය. රජ්ජුරුවෝ පසේ බුදුන් වහන්සේ වැඩිබව අසා ගෙන් නික්මැ වැඳැ එකත් පස්වැ සිටැ වැඩි කාරණා විචාරා එ පවත් අසා "අද අවකාශ නැත. සෙට අපගේ වප් මඟුල, - තුන්වන දවස් වසන විහාර කරවම්හ වස් වසවම්හ" යි කියා පසේ බුදුන් වහන්සේ නො පවරාම රජගෙට වන්හ. පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන් නො පැවරූ හෙයින් "අනික් ගමකට යම්හ" යි කියා නික්මුනු සේක.

එසමයෙහි ඒ ගමට වැඩිමහළු යට දක්වක. ලද වියන තැනැත්තවුගේ අඹු කිසි කවයුත්තක් පිණිස බරණැස් නුව රට යන්නි වඩනා වූ පසේ බුදුන් අටදෙනා වහන්සේ දැකැ "සවාමිනි! නො වේලේ වැඩියේ කුමක් පිණිසද" යි විචාරා ආදි යෙහි පටන් ගෙණ එපවත් අසා තමා ශ්‍රද්ධා සම්පන්න හෙයින් හා බුද්ධි සම්පන්න හෙයින් හා "සවාමිනි! සෙට අපගේ ගෙන් වැළඳුව මැනවැයි පැවරුව. ඒ පසේ බුදුන් වහන්සේ "නඟ! අපි බොහෝ දෙනම්හ,, යි වදුළසේක. ඕ තොමෝ "සවාමිනි! හැමදෙනා වහන්සේ කෙතෙක් ඇති සේක්ද" යි විචාරා "දහ සක් දෙනම්හ" යි වදුළ කල්හි "සවාමිනි! මේ ගමත් අපගේ කුලගෙවල් දහසෙක. එකි දෙන එකෙකි දෙනා වහන්සේට දන් දෙම්හ යි වසන තැනු ත් කරවම්හ යි ඉවසා වදුළ මැන වැ" යි පැවරුව.

එසේ පවරා ගමට වැදූ ගම්වැස්සන් එක්කොටැ ගම්මැදූ මඩුවක් කරවා පසේ බුදුන් වහන්සේ වඩා හිඳුවා වළඳවා තුන් මසක් එහි ම වස් වසන පිණිස පවරා ගම්වැස්සන් එක්කොටැ දහසක් දෙනා වහන්සේට වෙන වෙන පන්සල් කරවා තුන් මසක් වස් වස්වා වස් අන්තයෙහි එකෙකී දෙනා වහන්සේට දහස් දහස් වටිනා සිවුරු දෙවූහ. පසේ බුදුන් වහන්සේ වස් වසා අනුමෙවෙනි බණ වදාරා වැඩියේක. එගම් වැස්සෝ ඒ කළ කුසලයෙහි අනුසසින් මිය තාවතිංසා භවනයෙහි ඉඳ

දිව්‍යපුත්‍ර වැ උපන්හ ඔහු ඒ දිව්‍ය සම්පත්හි අනුභව කොටැ ක්‍ෂයුජ් සම්මා සම්බුදුන් දවසැ බරණැස් නුවර වෙත වෙත කෙළෙඹි කුලයෙහි උපන්හ.

ජ්‍යෙෂ්ඨ පෙසකාරයා වැඩිමහළු කෙළෙඹියාට ම පුත් වැ උපත. ඔහුගේ අඹු ද ජ්‍යෙෂ්ඨ කුටිම්බික යාට ම දූ වැ උපත. ඒ දහසක් ගැණු වැඩිමහළු වැ කුලගෙට යන්නාහු පෙරැ තමන් සැමියන් දහසක් දෙනාගේ ගෙට ම ගියහ. එක් දවසක් ඒ දහසක් කුටිම්බිකයෝ "ක්‍ෂයුජ් සම්මක් සම්බුදුඩයන් වහන්සේගේ බණ අසම්හ" යි බණ පිරිස් හා කැටිවැ විහාර යට ගියහ. ඔවුන් විහාරයට වත් කෙණෙහි ම මහ වැස්සෙක් නැඟී ය.

එහි තම තමන්ගේ වෙන වෙන උපස්ථාන කරණ සාමණේර යන් කුලූපගයන් වහන්සේ ඇති උපාසක වරහු තමන්ගේ වහන්සේ වරුන් සතු පිරිවෙන් ආදියට වන්හ. දහසක් උපාසක වරහු තමන් උපස්ථාන කරණ වහන්සේ වරුන්දැ වත් තමන්ට නැ වන වහන්සේ කෙණෙකුන් දැවත් නැති හෙයින් විහාර මධ්‍යයෙහි ම සිටියාහ

එසේ සිටි කල්හි ජ්‍යෙෂ්ඨ වූ කුටිම්බිකයා "අප වහන්සේ වරුන්ට විහාරයක් නො කර වූ හෙයින් හා වෙන උපස්ථානයක් නො කරණ හෙයින් හා වැස්සෙහි වදනා තැනකුත් නො ලද්දම්හ. හැම දෙන ම ධන රැස් කොටැ පිරිවෙනක් කරවම්හ"යි කියා හැම දෙනා හිවිස්සවා ගෙණැ ගැහැණුන් හා පිරිමින් හා එක් වැ ධන රැස්කොටැ දහසක් කුටාගාරයෙන් යුක්ත වූ විහාරයක් කරවා බුදුපාමොක් මහා සඞ්ඝයා වහන්සේට සත් දවසක් මහ දන් දී විසි දහසක් භික්ෂූන් වහන්සේට තුන් සිවුරු සරහා දන් දින.

ජ්‍යෙෂ්ඨ වූ කුටිම්බිකයා ගේ අඹු තොමෝ "හැම දෙන කළ පූජාවට වඩා කෙරෙමි"යි සිතා අනෝජා මලට බඳු වූ පැහැ ඇති දහසක් වටකා වසන්‍රයක් හා අනෝජා මල් සුමුගක් හා ගෙණැ ගොසින් අනුමෙවෙනි බණ වදරණ කල්හි අනෝජා මල් පුදා-ගෙණැ ගිය වසන්‍රය ශ්‍රී පාද මූලයෙහි තබා "සවාමීනි! මේ කුසලයෙහි අනුසසින් මා උපනුපන් තැන්හි මාගේ ශරීරය අනෝජා මලට බඳු වූ පැහැ ඇති වේව"යි-මම ද නම්න් අනෝජා නම් වෙම්ව"යි පැතුව. සම්බුදුයෝ ද අනාගත ඥානයෙන් බලා වදරා ඔවුන් පැතූ ප්‍රාර්ථනාව සිද්ධවන බව දැන, "තොප පැතුවා වූ ප්‍රාර්ථනාව සිද්ධ වේව"යි කියා අනුමෙවෙනි බණ වදාළ සෙයෙක.

ඔහු හැම දෙන ම ආසු පමණින් යිවැ එයින් මිය දෙවිලොව ඉපදූ අපගේ සම්බුදුන් වහන්සේ ගේ බුදුබෝ'නපාදයෙහි දෙව් ලොවින් චුත වැ ජ්‍යෙෂ්ඨ කුටුම්බික හෙම කුක්කුටවතී නම් රාජ ධානියෙහි **මහාකපිණ** නම් රජ වී ය. සෙස්සෝ ඔහු අමාත්‍ය වැ උපන්හ. ජ්‍යෙෂ්ඨ කුටුම්බිකයාට අඹු වූ තැනැත්තී **මදුරට සාගල නුවර** රජ කුලෙහි උපන.

ඇගේ ශරීරය - කාශ්‍යප සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ගේ ශ්‍රී පාදයෙහි පැතූ පරිද්දෙන් අනෝජා මලට බඳු වූ පැහැ ඇති හෙයින් ම **අනෝජා** නම් වුව. හෝ තොමෝ වැඩි **මහාකපිණ රජ්ජුරුවන්ට** අඹු වැ **අනෝජා** දේවිය යි ප්‍රසිද්ධ වුව. සෙසු ඇණුහු ද අමාත්‍ය කුලෙහි වැඩී, ගිය ජාතියෙහි තමන් තමන්ට සැම් වූ වන්ට ම අඹු වූහ. ඔහු ගැම දෙන ම ගිය ජාතියෙහි **මහා කපිණ** රජ්ජුරුවන් හා කැටුවැ ම කුසල් කළ හෙයින් ඇශ්වය්‍ය වූ අද්භූත වූ සම්පත්හි රජ්ජුරුවන් හා කැටිවැ ම අනුභව කරන්නාහ.

රජ්ජුරුවන් ගේ **මාලය - වාලවාහනය - පුෂ්පය - පුෂ්ප වාහන ය - සුපත්‍ර ය** යන නම් ඇති අස්සු පස් දෙනෙක් ඇත. රජ්ජුරුවෝ තුමූ **සුපත්‍ර** නම් අසු පිටට නැඟෙති. ඉතිරි අසුන් සතරදෙනා පිටට අශ්වාරොහකයන් සතරදෙනකු යවා "නෙපි දෙතුන් යොදනකට ගොසින් සිසාරා ඇවිදූ බුද්ධරත්නය හෝ **ධම්මරත්නය** හෝ **සඞ්ඝරත්නය** හෝ ලොකයෙහි පහළ වූ හස්තෙක් ඇත්නම් දැනැ එවයි" නහා යවති. ඔහු දවස්පතා සතර දෙන සතර දෙරින් නික්මැ තුන් තුන් යොදනෙහි සිසාරා ඇවිදූ කිසි වානීවක් නොලදින් එති.

එක් දවසක් රජ්ජුරුවෝ **සුපත්‍ර** නම් අශ්ව රාජයා නැඟී අමාත්‍යයන් දහසක් පිරිවරා උයනට යන්නෝ දුරු කතරින් ආ හෙයින් විඩා විඩා වැ වදනා වූ පන්සියයක් වෙළෙදුන් දැකැ "මොහු විඩා විඩා වැ එති. නියතයෙන් අමුතු වානීවක් දනිති"යි සිතා ඔවුන් කැඳවා කොයි සිට එවුදැයි විචාරා "සඞ්ගාමිනි අපි මෙතැනට එක්සිය විසි යොදනෙක **සැවැත් නුවර** සිට එම්හ"යි කිහ. "තොපගේ රට අමුතු වානීවක් ඇද්දැ"යි විචාරා "සඞ්ගාමිනි! අනික් අමුතු වාහීවෙක් කුමක් දන්නමෝද? බුදුරුවන් ලෝක යෙහි පහළවී"යැයි කී කල්හි බුදුබ යන නම කණ වැටී හෙන්නා හා සමග මහ වතුරක් මැඩැ ගෙණැ පවන්නා සේ සඞ්ඝ'ඔඝය මැඩැ ගෙණැ පවත්නා වූ ප්‍රීතියෙන් අවධි අවසථා නො දැනැ ඇසූ බස් කුමක් ඔවත් නො දැනැ මූර්ඡිත වැ ගියක්හු සේ කාලා'නන්තරයක් යවා දෙවනවට ද කුමක් කිවුදැ යි ඒ විචාරා—

"සවාමිනි! බුදුරුවන් ලොකයෙහි පහළවී"යයි කී කල්හි දෙවතවට ත් එසේ ම මූර්ඡා වැ තුන්වන වට ත් එසේ ම විවාරා එසේ ම මූරිඡිත වැ, සතර වන වාරයෙහි අවධි ලදින් "කුමක් කිවුදැ"යි විවාරා "සවාමිනි! බුදුරුවන් ලොකයෙහි පහළ වි ය. කුලයෙන් ශාක්‍ය කුලයෙහි උපන් කුමාර කෙණෙක. වයසින් එකුන් තිස් හවුරුද්දෙහි මහණවූහ. මහණ වන්නන් හැර පියා ආයේ දෙදහසක් කොදෙව් පිරිවර ඇති සතර මහාඉපයෙහි චක්‍රවර්ති රාජ්‍යය ය. උපන් තැන් පටන් මෙතැන් දක්වා දෙවියන් පිදූ පරසතු මල් පිටින් වඩනා සේ වැඩියහ. බඹුන් තැගූ සේසත් යටැ වඩනා සේ වැඩියහ රුවට තුමූ ම ය. දහමට තුමූ ම ය ආඥාවය්‍යයට තුමූ ම ය. පරාක්‍රමයට තුමූ ම ය.

"ශීල-සමාධි-ප්‍රඥා යන තුන් ධර්මයන් එක්කොටැ වවා හැඟුරුවක් වැන්තහ. බොධිමූලයෙහි වජ්‍රාසනාරූඪ වැ "බුදුවන් නට යැ"යි වැඩ හුන්නවුන් ලුහු බඳවන්නට ය යි යෙළසියක් යොදුන් ගිරිමෙඛලා නම් හසතියහු නැඟී මහා මාර සෙනාව ගෙණැ දහසක් අතින් දහසක් ආවුධ හැර ගෙණැ සසලා පියා දිවන මහාමාරයා කටින් නැඟූ දුම්කඳු තමන් අභිමුඛයෙහි දෙවතාවන් කළවැල් දුම් ලූ දුඹුලු සිදුරෙන් නැගෙන දුම්කොට ත් නො සිතූහ. සවාසනා සඒ කෙලඹයන් නසා බුදු වැ බ්‍රහමයාගේ ආරාධනායෙන් දම්සක් පවත්වා ක්‍රමයෙන් ලොකා'ථ කෙරෙමින් සැවැත් නුවරට වැඩැ තමන්ගේ ගුණයෙහි ප්‍රසන්න වූ අනේපිඬු මහා සිටානන් විසින් සුපණස් කෙළක් ධන වියදම් කොටැ කැර වූ ජෙතවන මහා විහාරයෙහි වෙසෙනී"යි දැන් වූ කල්හි-

ඒ අසා "දරුවෙනි! මේ ජාතිය මුළුල්ලෙහි පතා නො ලද්දා වූ හස්නෙක. මෙසේ වූ මධුර හස්නක් මා කණ හෙළවා වූ තොපට සතුටු පඬුරු දෙමි"යි ලක්ෂයකින් පූජා කොටැ නැවත ද "ඛම් රන්නය ලොකයෙහි පහළ වි ය" යනු තුන්විටෙක අසා තුන් විටෙකැ මූර්ඡා වැ සතරවන විටැ කුමක් කිව්දැ යි විවාරා "සවාමිනි! අප බුදුහු බුදු වූහ සි දැන්වූහ. සවාමි දරුවානෙනි තුමූ බණ වදාරති. ඒ බණ අසා නිවන් රස නො විඳැ ගැළවෙන්නෝ නැත. තමන් ඉදිරියෙහි පොවා සද්ධම් රසයෙන් මත් වැ නැඟී සිටැ වීළි නැති වැ නටා පියන පරිද්දෙන් බණ කියත්.

"දෙව්ලොවට වැඩි ය එම බණ ය. බඹලොවට වැඩි ය එම බණය. නාලොවට වැඩි ය එම බණ ය. සදෙව් ලොවට වැඩි ය එම බණ ය. සදෙවක සමාරක සබ්‍රහමක ලොව ද ඒ දහමට ගැති

පත් වූහ. එසේ වූ ධර්මරත්නය ලොකයෙහි පහළවිය"යි කී කල්හි ඒ හස්තට ද ලක්ෂයකින් පූජා කොටැ නැවත එසේම **සඝරත්නය** උපන්බව තුන්විටෙකැ අසා තුන්විටෙකැ මූර්ඡාවැ සතර වත විටැ "කුමක් ද? තොප කියන්නේ"යැයි විචාරා-

"ස්වාමිනි! ඒ සම්බුදුයන් පුත්‍ර වූ ඒ ධර්මය වූ පරිද්දෙන් පිළිපදනා වූ, සුප්‍රතිපන්න වූ, ප්‍රතිපත්තියට දිවි දුන්නා වූ **අෂ්ටාර්ය පුද්ගල සඝරත්නය ලොකයෙහි පහළවූහ.** සෝවාන් මාර්ගඵල ය, ඵලඵල ය, සකෘදාගාමි මාර්ගඵල ය, ඵලඵල ය, අනාගාමි මාර්ගඵල ය, ඵලඵල ය, අර්හත් මාර්ගඵල ය, ඵලඵල ය යන සත්‍යාර්ය දරුවෝ අටදෙන තමන් වැඳ පිදුවන්ට වෙන වෙන ම **අටමහ නරකයෙහි** හකුල් ගෙළමින් සිටියාහ. දැන් ඒ අටදෙනා තමන් ම **අටමහා නරකය** ම සිස් වෙමින් සිටියේ. මෙසේ වූ **සඟ රුවන්** ලොකයෙහි පහළවිය"යි දැන්වූහ.

එ පවත් ඇසූ රජ්ජුරුවෝ ඒ හස්තට ලක්ෂයකින් පූජා කළහ.

මෙසේ තුණුරුවන්හි නමට ම තුන්ලක්ෂයෙන් පූජා කොටැ අමාත්‍යයන් දහස මුහුණ බලා "දරුවෙනි! මම තුණුරුවන් පහළ විය යන හසුන් අස අසා නැවත ගෙට නොයෙමි. මාගේ තුණුරුවන් උදෙසා මෙතැන්හි සිටැ ම හොස් මහණවෙමි"යි කියා "ඇපි ත් නුඹවහන්සේ හා කැටි වැ මහණ වම්හ"යි අමාත්‍යයන් කී කල්හි වෙළෙඳුන් කැඳවා තෙපි මාගේ රාජ්‍යයට ගොසින් **අනෝජා දෙවින්ට** ත් මෙ පවත් කියව. තොපට තුන් ලක්ෂයකින් පූජා කෙරෙති. ඒ පූජා පිළිගෙණැ දේවින්ට "රජ්ජුරුවෝ තොපට මේ රාජ්‍යය පාවා දුන්හ. තොප කැමැති පරිද්දෙන් ශ්‍රී අනුභව කරව යි කියවි. රජ්ජුරුවෝ තුමූ කොසිදැ යි තොප විවාළෝ නම් සම්බුදුයන් වහන්සේ උදෙසා මහණ වන්නට ගියබව කියවයි" කීහ. අමාත්‍යයෝ ද ඒ තමන් තමන්ගේ අඹුවන්ට එසේ ම අසුන් කියා යැවූහ.

ඉක්බිති රජ්ජුරුවෝ වෙළෙඳුන්ට සමු දී යවා අමාත්‍යයන් දහස හැරගෙණැ **බුදුරත්නය, ධර්මරත්නය, සඝරත්නය,** යන තුණුරුවන්හි නම කිය කියා ප්‍රීතියෙන් පිණ පිණා සම්බුදුයන් වහන්සේ වසන **සැවැත් නුවර** දිසාවට වැඳ වැඳ නික්මුණහ. සම්බුදුයෝ ද එදවස් ප්‍රත්‍යූෂකාලයෙහි **මහා කරුණා සමාපත්තියෙන්** නැගී ලොව බලා වදුරණ සෙයෙක් **"මහා කපිණ රජ්ජුරුවෝ** තුණුරුවන්හි නමට ම තුන් ලක්ෂයකින් පූජාකොටැ රාජ්‍යය හැරැ නික්මුණාහ. ඔහු අමාත්‍යයන් දහස හා කැටිවැ ම **සිවුපිළි සිඹියාපත්** රහත් වෙති යි දැන වදුරා-

දිපඞ්කර පාදමූලයෙහි පවත් ගෙණ කුසිණාරා යම්හල දක්වා තමන් ගුණයට මැ ප්‍රිය වැ ආ හෙයින් **අනිත්‍යනි පණ්ඩිත** කල්හි තමන්ට වර දෙන ශක්‍රයා "අනිත් අඥතයන් නොදකිම් ව යි ඥාන සම්පත්‍යාශයන් ම දකිම්ව යි" පැතූ හෙයින් **මහාකපපිණ රජ්ජුරුවන්ගේ** එබඳු වූ ගුණයට පූජා කොටැ පෙර ගමන් කළ මැනවැ"යි සිතා "සදෙවක සමාරක සබ්‍රහ්මක ලොකයා මා පා මුලට එන බව මුන් මම අනුන් පෙරමගට යෙම්දැ"යි යන ගමියක් තැනිවැ —

තමන් වහන්සේගේ පාත්‍රා සිවුරු තමන් වහන්සේ ම අල්වා ගෙණ එක්සිය විසියොදනක් තැන් හෙවා **චන්ද්‍රභාගා** නම් ගං තෙරට වැඩැ නුගරුක් මූලැ සතර පව කොටැ සහළ සිවුරු අතුව ලා සවනක් ඝන බුදුරැස් විහිදුවා තමන්ගේ ශරීර වර්ණයෙන් ම රැඳී ගියා වූ ඒ නුගරුක දෙවතාවන්ගේ **නන්දන වනයෙහි** සජන රතන රශ්මීන් රැඳී ගිය කලප වෘක්ෂයකට වඩා ඝනසහස්‍ර ගුණ යෙන් හොබවමින් සියලු **චන්ද්‍රභාගා** නම් ගංගාව එකහෙළා විරු වාපි වූ රත්රන් රසධාරාවක් සේ රන්වන් කෙරෙමින් සියලු ජල යෙහි මවිඡ කච්ඡපයන් සවණක් ඝන බුදුරැසින් රදා ශක්‍රයාගේ **නන්දා නම් පුෂ්කරණියෙහි** ජල ක්‍රීඩාවට දෙවියන් මවා ගත්තාවූ මවිඡ-කච්ඡප-රූප සේ ම මනොහර කෙරෙමින් ගඞ්ගායෙහි ජලාශ්‍රයවූ දේවතාවන්ගේ හා නදී තීරයෙහි වෘක්ෂාශ්‍රය වූ දේවතා වන්ගේ හා ඇස් එකහෙළා තමන් වහන්සේ කරා අදිමින් රජ්ජුරු වන් එන පෙර මහැ බල බලා මහා කරුණා යෙන් තෙත් වූ ලයින් වැඩැ හුන් සේක.

එ සමයෙහි **මහාකපපින රජ්ජුරුවෝ** ද දුරුකතර ගෙවා එන්නා වූ අතර මගෙහි මහා ගඞ්ගාවකට පැමිණ අමාත්‍යයන්ට "දරුවෙනි! මේ කිතම් ගහෙක්දැ"යි විචාරා "සවාමිනි මේ **අරවිඡා** නමැයි කී කල්හි" මේ ගඞ්ගාවෙහි ගැඹුර කෙතෙක් ද? පළල කෙතෙක් දැ"යි විචාරා "සවාමීනි! මේ ගඞ්ගාව ගැඹුරෙන් ගවුවෙක, පළලින් දෙගවු වෙකැ"යි කී කල්හි "මේ ගහින් අමාත්‍යයන් දහස හා අසුන් දහස හා මා හා මාගේ අසු හා එතර වැ යන්නට හොරු අහුළු ඇද්දැ" යි විචාරා "සවාමීනි! නැතැ" යි කී කල්හි "මට බැහැරින් නැවු පහුරු ආදීන් ප්‍රයෝජන කිම්දැ" යි "මේ ගඞ්ගාව ගැඹුරෙන් ගවුවෙක. පළලින් දෙගවුවෙකැ යි තෙපි ම කිවාවද? බුදු ඇසට නැත් නොපෙණෙන්නා වූ මහත ඇති සංසාර සාගරයට මහ නැවු වැ සිටියා වූ බුදුරැවන උදෙසා වේද ? මා ආයේ. එහි අනුසසින් ම මේ දිය මට දිය නො වෙයි. තෙපි හැම දෙන ම බුදුරැවන් සිහි කොටැ ලා අසුන් දහස මෙහෙයා ලව" යි කියා තුමූ ද දෙහොත් මුදුනෙහි තබා ගෙණැ —

සැවැත් නුවරෙහි ජේතවන මහාවිහාරය දිසාවට වැඳලා "**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස, නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස, නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**" යි තුන්විටෙක බුදුන්ට නමස්කාර කොටැ අසුන් මෙහෙයා ලුහ. සියලු අස්සු ම එබදු ගැඹුරු වූ දියෙහි ඉඳුනිල් මිණි ගල්තලක් පිටැ දිවන්නා සේ දිව ගත්හ.

එසේ ම ගසින් එතර වැ ගෙණැ ගොස් අනික් ගහකට පැමිණැ "මේ කිතම් ගහෙක් ද"යි විචාරා "**නිලවාහිනි** තම්" යි කී කල්හි "මේ ගඟ ගැඹුර පළල කෙතෙක් ද"යි විචාරා "ගැඹුරෙනුත් පළලිනුත් දෙගවුවෙකැ"යි කී කල්හි "මා හා මාගේ අසුදහස හා අමාත්‍යයන් දහස හා එතරවන්නට සුදුසු වූ හොරු අහුළු මෙහි ඇද්ද? නැද්ද" යි විචාරා "නැතැ" යි කී කල්හි "තම කිවන්ට සතුටු පඬුරු කොටැ තුන් ලඝුගයක් දී "**අනෝජා දේවි** වැනි අඹුවන් හැරැ, **කුක්කුටවති** නම් රාජධානිය වැනි රාජධානියක් හැරැ, ඇසූ තමට ම දිවිපුදා සරණ ගියා වූ **ධම්මරත්නය** මේ මුඛෙහි තුබූ ගහින් එතර නො කෙරේ නම් ඔබෙහි තුබූ සංසාර සාගරයෙන් කෙසේ එතර කෙරේ ද?

"එසේ හෙයින් මේ ගඟට මට මඟ නැවු නම් මා තිසා නැහි ආ ධම්මරතනය ම ය. නෙපි හැමදෙනා ම ඒ තිලෝගුරු සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදාළ ධම්මය සිහි කොටැ එකවට ම අසුන් මෙහෙයා ලව"යි කියා තුමූ ද දෙහොත් මුදුනෙහි තබා ගෙණැ "තම ඇසුවිට ම මාගේ ලෙහි අමා තමා පිටා වූ **සඳහම් රත්නය සරණ යෙමි** යි මා ගිය ඒ ධම්මරත්නයෙහි අනුසසින් ම මේ ගඟ මත්තෙහි ඇදලු අතළ ගලක් සේ දිය ලෙසින් නො සිටිව" යි අධිෂ්ඨාන කොටැ "**සඞ්ඝෝකඩ්ඪතෝ භගවතා ධම්මෝ**" යන පදය කියමින් තඟාගත් පය හා සමග අසු දියට මෙහෙයූහ.

අමාත්‍යයන් දහසගේ අස් දහස හා තමන්ගේ අසු හා එක පැහැරැ දිවන්නට වන්හු. රජ්ජුරුවන්ගේ අශ්වා'රොහණ මඬගල යට වළඟොඩ නැති කොටැ තුබූ රාජ ඕපියෙහි දිවන්නවුන් සේ ගැසූ ගැසූ කුරෙහි තට තට යන අනුකරණයෙන් ගඞ්ගායෙහි දියෙහි වසන්නා වූ දෙවතාවන්ට විසමය එළවමින් නික්ම ගත්හ. එසේ ඒ ගඟ ධම්මරත්නයෙහි අනුසසින් ආනුභාවයෙන් නික් මැ ගෙණැ තුන්වන ගහට පැමිණැ "මේ කිනම්ද" යි විචාරා වඳුරා හඟා නමැයි කී කල්හි "මේ ගඟ දිග පළල කෙතෙක් ද" යි විචාරා "ගැඹුරෙනුත් පළලිනුත් යොදනකැ" යි කී කල්හි:

මේ ගඟට අනික් කැවූ පස්සරු කුමට ද? "බුදුසස්කව් වන් දවස් පවත් ගෙණැ පිරිනිවන් පානා දවස් දක්වා සංසාර සාගරයෙහි නො ඇලුනා වූ සතුරන්වන්හි අනුසසින් මාගේ අඹයෝ මේ ඉඟ නො ගැලී එතර වෙත්ව"සි අධිෂ්ඨාන කොටැ දෙහොත් මුදුනෙහි තබා ගෙණැ **"සුපටිපන්නෙනා භගවතෝ සාවකා සඞ්ඝා"** යන බස හා එක්වැ ම අසුන් මෙහෙයා ගොස් එන කල්හි පවා වළෙහි ගොඩෙහි ශබ්කාවක් නැත. මේ ගඟෙහි දිවන කල ම අපව සුවඇ යි අනුන් සිතන පරිද්දෙන් ගහින් එතරවැ ඉදිරිය බැලුවාහු —

භූතගණ පත් අතුරෙන් වෙළෙප් මැඩැ ගෙණැ සම් මැඩැ පී කඹුරු උදුනෙහි අඟුරු අතුරෙහි **පැනැ** නැඟි ගිනි රැසක් සේ ආකාශයෙහි වැනී ගිය බුදුරැස් බලමින් විසමය පත්වැ "මේ අප දුටු විරූ රශ්මියෙක් නො වෙයි සඳු උදය වන්නාට පළමු අඟසැ වැනී නැඟී ගිය සඳරැස් දුටු විරුම්හ. හිරු උදා වන්නට පළමු අඟසැ වැනී ගිය හිරු රැසදු දුටු විරුම්හ. මේ එබදු රශ්මියකුත් නො වෙයි නියතයෙන් මා ගැනිවැ නැඟී ආ සඵාම් දරුවානන් ඇසට මම පැණීම් වනිම් ඒ සඵාම් දරුවානෝ තමන්ගේ **ත්‍රිබුවන චක්‍රවර්ති** කමුන් නො සිතා ගුණයෙහි ප්‍රිය ගෙයින් තමන් ගැනිහු පෙරමඟට වැඩි දූ වනැ යි සිතා අස් පිටින් බැස ගෞරවයෙන් නැමී නැමී සවණක් සණ බුදුරැස් පිඹිරා ගෙණැ ගොස් ශ්‍රීපාද මූලයෙහි වැතිරැ තබ රශ්මි තමැති අමා මහ ඉගෙහි ගැලී අමාත්‍යයන් දහස හා කැටිව වැඳ එකත් පස්වැ හුන්හ.

එ සමයෙහි **සච්ඡයන් වහන්සේ** පෙර ඇසූ බුදුගුණයට දැන් දුටු බුදුරුවනට ම කළ පූජාවට සුදුසු කොටැ මධුර වූ ධර්මය එළවා අමාත්‍යයන් දහස හා කැටිවැ රජ්ජුරුවන් සෝවාන් කොටැ **"එහි භික්ෂු භාවයෙන්"** මහණ කොටැ ඔවුන් පිරිවරා වැඩැ හුන් සේක. මෙසේ තමාගේ තම ඇසූ ශ්‍රද්ධා සම්පන්නයන් සතුටු පඬුරට ලක්ෂයකින් පූජාකරණ පරිද්දෙන් මානැඟි වූ තමා සිහි කළවුන් උපුලන අසුන්ට පවා ගඞ්ගායෙහි ජල අතළ ගල් සේ කරණ සැදෑගැයෙන් ඇසුවන්ට අමා මහ නිවන් දෙන ධර්මරත්නය සරණ යෙමි සි **දහම් සරණ යා සුතු.**

ඉක්බිති ඒ වෙළෙඳහු ද රාජධානියට ගොස් **අනොජාදේවීන්** දැකැ තුණුරුවන් උපන් හසුන් දන්වා රජ්ජුරුවන්සේ ම දේවිහුදු තුන් වාරයෙකැ සතෙනාෂයෙන් මූර්ජාවට පැමිණැ තුන් ලක්ෂය බැගින් දුන් කල්හි තුණුරුවකට එක හෙළා දෙවින් අනික් තව ලක්ෂයකින් පූජා ලදින් රජ්ජුරුවන් තුණුරුවන්හි හසුන් අසා ම රජ්‍යය බිසවුන්ට පවා දී මහණ වන්නට ගිය බව දන්වූහ.

දේව් ද එපවත් අසා "අමාත්‍යයන් දහසක් දෙනාගේ අඹුවන් දහසක් දෙනා ගෙන්වා රජ්ජුරුවන් හා අමාත්‍යයන් දහස හා සියලු සම්පත්තිය හැර මහණ වන්නට හිස බව කියා සංසාරය දුරුණු වූයේ අපගේ රජ්ජුරුවන් හා අමාත්‍යයන් දහසකට මත්‍ර අපටත් එසේ ම දරුණු ය. එහෙයින් දැන් ම නික්මුණ මැනව 'යි රථ දහසකින් නික් මැ රජ්ජුරුවන් එහාර වූ පරිද්දෙන් ම තුන් ගව රථ දහසෙහි සක ද ගත් ධූලි තෙමෙන තරම් එබෙන පමණක් අද ද නොව දැඩිවැ සිටි කල්හි එයින් එහාර වැ රජ්ජුරුවන් දුටු පරිද්දෙන් නැහෙන්නා වූ බුදුරශ්මි දැකැ අනුමාන ඥානයෙන් සම්බුදුයන් වහන්සේ බව දැන බුදු රශ්මි පිහිරා ගෙණ වැඩහුන් තැනට යන්නට පටන් ගත්හ.

එ සමයෙහි සම්බුදුයන් වහන්සේ "මේ ගැණු බණ නො අසා ම සැමියන් දුටු තම් මහණ වැ හුන්නා වූ සැමියන් දැකැ ශොකා'තුර වැ ඉදුරා බණ අසා ගත නොහෙති"යි සිතා වදාරා "මේ බිසවුන් ගැණු දහසත් තමන් තමන්ගේ සැමියන් නොදකින්ව"යි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයක.

සහ පිරිවරින් සම්බුදුයන් වහන්සේ වැඳ එකත්පස් වැ සිටැ "සවාමීනි! අපගේ මහා කපිණ රජ්ජුරුවෝ අමාත්‍යයන් දහසක් ගෙණැ ශ්‍රීපාද වඳනට යැ යි ආහ. ඔහු කොයිදැ"යි විමාළ හ. එබස් අසා සියලු සත්ත්වයන් අමාමහ නිවනට ගෙණ යන්නා වූ උපායා'නතර දන්නාවුන් කෙරෙහි අග්‍ර වූ සවාමි දරුවෝ "රජ්ජුරුවන් දැන් දැන් දක්නාව ද? තෙපි තෙල සේ ඉඳුව"යි වදාරා එකත්පස්වැ හුන්නා වූ සහ පිරිවර වූ දේවින් කණ අමා තමන්නට ය යි පටන් ගත් සෙයක.

කෙසේ වූ බස් ද? කෙසේ වූ වියත් කම් ද? කෙසේ වූ ල ගන්නා ධර්ම ශ්‍රුතයි ද? කෙසේ වූ මෙලෝ පරලෝ දැක්වීමෙක් ද? කෙසේ වූ අමාමහ නිවන් රසයෙහි ගැල්වීමෙක් ද? එ බණ වදාරත් වදාරත් දේවීන් පරිවාර සත්‍රින් දහස හා කැටිවැම සෝවාන් වූහ. ගංඟිසෑ වට වැස්සෙන් වැවක් පිරෙන්නා සේ බිසොවුන්ට වදාළ ධර්මයෙන් රජ්ජුරුවෝ සහ පිරිවරින් ඕවිපිළිඕඕයා පත් රහත් වූ හ.

එ කෙණෙහි ම සම්බුදුයන් වහන්සේ "බිසොවුන් ඇතුළු වූ ගැහැණුන් තමන් තමන්ගේ සැමියන් දකින්ව" සි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙක. ඔහු ද සෝවාන් වැ අවල ශ්‍රද්ධාවෙහි පිහිටා සැමියන් දැකැ පසඟ පිහිටුවා වැඳැ "සවාමීනි! නුඹවහන්සේගේ පැවිද්ද මහානකප්‍රාප්ත වී ය" යි කියා සම්බුදුයන් වහන්සේ අතින් පැවිද්ද ඉල්වා, "සැවත් නුවරට ගොස් මෙහෙන සස්-

නෙහි මහණ වව" යි වදළ කල්හි ක්‍රමයෙන් සැවැත් නුවරට අවුත් මෙහෙණ සස්නේ මහණ වැ රහත් වූ හ. සම්බුදුන් වහන්සේ ද මහාකප්පින මහතෙරුන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති මහණ දහස පිරිවරා ක්‍රමයෙන් ජෙතවන මහා විහාරයට වැඩි සෙයෙක.

මහා කප්පින මහතෙරුන් වහන්සේ සියලු ඉරියව්වෙහි තමන් වහන්සේ ලද්දා වූ ධර්මය සිහි කොටැ "සුවයක් යහපත් නියා ය! සුවයක් යහපත් නියා ය" යි කියා කියා උදන් අනන සෙයෙක. ඒ ඇසූ භික්ෂූන් වහන්සේ සම්බුදුන් වහන්සේ කරා එළඹැ "ස්වාමීනි! මහා කප්පිනයෝ හුන් සිටි තැන "අහෝ ! සුඛං !! අහෝ සුඛං !!" කියා උදන් අනති. තමන් අනුභව කළ රාජ්‍යශ්‍රී සිහිකොටැ කියන බසෙකැ යි සිතම්හ"යි දැන් වූ සෙයෙක.

ඒ අසා සම්බුදුන් වහන්සේ මහා කප්පින මහ තෙරුන් වහන්සේ කැඳවා "කප්පින ය තා රාජ්‍ය ශ්‍රී උදන් අනන්නේ ඇද්ද" යි විචාරා වදාරා ඔබ විසින් "ස්වාමීනි! මා ඇතුළු වූ මුළු ලෝ වැස්සන්ගේ සිත ස්වාමි දරුවන්ට ම හැසෙන්නේ වේදැ" යි දැන් වූ සෙයෙක. ඒ අසා ස්වාමි දරුවෝ "මහණෙනි! මාගේ පුතනුවෝ කාම සුඛයක් උදෙසා උදන් අනන්නේ නො වෙයි. තමන් ලද්දා වූ නවලොවුතුරා දහම් සිහි කරන් සිහි කරත් ලය ඉතිරි ගෙණැ පවත්නා වූ ප්‍රීතිය ඉවසා ගත නොහී උදන් අනති" යි වදාරා:

ධම්ම පීති සුඛං සෙති – විප්පසන්නෙනන චෙතසා
අරිය'ප්පවෙදිතෙ ධම්මෙ – සදා රමති පණ්ඩිතෝ.

යන ගාථාවෙන් බණ වදළ සෙයෙක. ඒ වදළ බණ ඇසූ බොහෝ දෙනාට අමා මහ නිවන් සැබි ය. එසේ හෙයින් තමා සිහිකළ කල්හිත් සිත් නැත්තැ වූ ජලයේ පවා දැඩි කොටැ පියන ලද්දාවුන් අනවරතයෙන් ප්‍රීති ඉවසා ගත නො හී උදන් අන අනා භිදිනා ශාන්ත වූ ප්‍රණීත වූ ධර්ම රත්නය මට සරණය යි දහම් සරණ යා සුතු.

4. මහා කප්පින රාජකථා

ඉක්බිති ධර්මය සරණ ගියවුන්ට ඒ ධර්මය සියලු උපද්‍රව දුරු කරණ බව හඟවන පිණිස

5. උදේන රාජකථා සමාවතීන් ගේ කථාව දක්වනු ලැබේ.

හේ කෙසේද? යත්

අතීතයෙහි **අල්ලකප්ප** නම් රට **අල්ලකප්ප** නම් රජ්ජුරු වෝ ද **වෙඨදීපයෙහි වෙඨදීපක** නම් රජ්ජුරුවෝ ද යන මොහු දෙපක්ෂයෙහි ඇත්තෝ කුමාර කාලයෙහි පටන් ගෙණ එක ගුරුන් කෙරෙහි ශිල්ප ඉගෙණ තම තමන්ගේ පිය රජ්ජුරුවන් අභාමෙන් දස යොදුන් දස යොදුන් රටට රජ වූහ.

ඔහු අතරතුරෙහි ඔවුනොවුන් කරා එළඹ එක්වැ හිඳ, එක්වැ සිටැ, සුදුසු වූ ක්‍රීඩායෙන් දවස් යවන්නාහු උපදනා වූ සත්ත්වයන් ද මියන්නා වූ සත්ත්වයන් ද දැකැ සංසාර සවරූපය දැනැ "මෙලොවින් පරලොවට යන්නා වූ සත්ත්වයන් පස්සෙහි යන්නා වූ එක ද වස්තුයෙක් නැත." "අධම්ම වශයෙන් සහජාත වූ තමා සතුය යි තමා වූ ශරීරය ද සත්ත්වයා හා කැරිවැ පරලොව නොයෙ යි." එසේ ගෙයින් සියල්ල ම හැරපියා යා යුතු ය.

එසේ වූ සංසාරයෙහි සිටියා වූ අපට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්ද යි "ගිහි ගෙය හැරැ මහණ වම්හ" යි කියා තමන් තමන් සතු රාජ්‍ය ය අඹු – දරුවන්ට පාවා දී තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වැ හිමාලයයෙහි එක් වැ වසන්නාහු එක් දවසක් ඔවුනොවුන් හා කැටි වැ ඛණන්නාහු "අපි දෙදෙන රාජ ශ්‍රී හැරැ මහණ වන්නමු. ජීවනෝ'පායක් පිණිස මහණ වූ වමු නො වම්හ. එසේ මහණ වූ ඇපි එක තැන වසමෝ නම් දෙන්නකු එක තැන වසන කල්හි අල්ලාප සල්ලාප මාත්‍රයකුදු කරමෝ නම් ඒ අප පැවිදි වූව ත් පැවිදි නොවූ වා හා සම ය.

එ හෙයින් අප වෙන් වෙන් වැ විසුව මැනවැ යි "තෙපි එක් පර්වතයෙක වසව අපි එක් පර්වතයක වසම් හ. අඩි මාසයෙන් අඩි මාසයෙහි එක් වම්හ" යි කියා "එසේ ත් එක්වීම **ඉණ ඝඩඉණ්** කාවට කාරණ ය. එසේ හෙයින් දෙන්න ම එක් වැ නො වසම්හ. තෙපි තොප ගේ පර්වතයෙහි ගිනි දල්වව. මම මාගේ පර්වතයෙහි ගනි දල්වම්. ඒ සලකුණින් ඔවුනොවුන් ජීවත්වන බව දනුම් හ යි නියත කළහ. ඔහු එසේ නියත කරණාහු දවස් යවති එසේ කාලා'නන්තරයක් ගිය කල්හි **වෙඨදීපක තාපසයෝ** මියැ මහෙසාක්‍ය දිව්‍ය රාජ වැ උපන්හ.

ඉක්බිති අඩි මාසයක් ගිය කල්හි **අල්ලකප්ප තාපසයෝ වෙඨදීපක තාපසයන්ගේ** පර්වතයෙහි ගිනි නො දැකැ "සහාය තාපසයන් මළහ" යි නියත කොටැ දන්හ. **වෙඨදීපක තාපසයෝ** මියැ දිව්‍ය රාජ වැ උපන් ක්ෂණයෙහි තමන්ගේ අසාධාරණ වූ

දිව්‍ය සම්පත්හි දැකැ "කවර කුශල කර්මයක් කොටැ දෙ මේ සම්පත් ලද්දේය"යි බලන්නාහු "හිය ජාතියෙහි රැක්කා වූ ශීලය ම දැකැ මා හා කැටි වැ සිල් රැක්කා වූ ඇළු තාපසයන් බලා පියා යෙමි"යි සිතා දිව්‍ය'තම භාවය හැරැ මහී වෙසක් මවා ගෙණැ **අල්ලඋපස තාපසයන්** හුන් තැනට ගොසින් වැඳැ එකත්පස් වැ සිටිය හ. ඔවුන් දැකැ තාපසගේ "කොයි සිටැ අවුදැ"යි විවාළහ.

ඒ අසා දිව්‍ය පුත්‍ර තෙම "ස්වාමීනි! මම දුර සිටැ එන්නා වූ මහී එකකි මී යි. ස්වාමීනි! මෙතන්හි හුදකලාව තපස් රක්‍ෂා කරණ ලද්දු ද? අනික් තපස් වී කෙණෙකුන් ඇද්දැ"යි විවාරා "මාගේ එක් තාපස කෙණෙක් ඇතැ"යි කී කල්හි "දැන් ඌ කොයි දැ"යි විවාරා "ඇපි දෙ පක්‍ෂයේ ඇත්තමෝ පොහෝ දවස් ඔවු නොවුන්ට උපද්‍රව නො වූ බව හඟවන පිණිස ඔවුනොවුන් ගේ පළිතයෙහි ගිනි දල්වම්හ. මේ පොහෝයෙහි ඒ තාපසයෝ තමන් ගේ පළිතයෙහි ගිනි නො දැල් වූ හ. එයින් ඔවුන් මළහ යි සිතම්හ"යි කී කල්හි සවාමීනි! "මම අනිකෙක් කොවෙමි. නුඹ වහන්සේ ගේ යහළු තාපස යෙම්හ – මම ය"යි කියා "මා රැක්කා වූ සිලයෙහි අනුසසින් දිව්‍ය රාජ වැ උපන්මි යි, සවාමීන් දක්නා පිණිස ආමි. මෙතැන්හි වසන්නා වූ සවාමීන්ට කිසි උපද්‍රවයෙක් ඇද්දැ"යි විවාළේය.

"අපට අනික් උපද්‍රවයෙක් නැත. ඇතුන් විසින් උපද්‍රවයෙක් ඇතැ"යි කී කල්හි "එසේ වුවහොත් ඇතුන්ට මෙසේ කළ මැන වැ"යි කියා විණාගේ තුන් තතක් පැලා තුන් මන්ත්‍රයක් උගන්වාලා "වහන්ස! මේ තත ගසා මේ මන්ත්‍රය කී කල්හි හසතිහු පෙරළා සිටැ බලන්නට ත් අසමර්‍ථ වැ පලා යෙති. මේ මන්ත්‍රය කියා මේ තත ගැසූ කල්හි පෙරළී බල බලා යෙති. මෙසේ මේ මන්ත්‍රය කියා මේ තත ගැසූ කල්හි ඇත් මූලට ප්‍රධාන වූ ඇත් තෙමේ ම නැමෙමින් නැමෙමින් ඇවිත් පිට දෙයි. මෙයින් නුඹ වහන්සේට හැඟුණක් කළ මැනවැ"යි කියා ගියේ. එතැන් පටන් ඒ තාපසයෝ ඇතුන් පලා යන්නට සුදුසු මන්ත්‍රය කියා උන් පලා යන්නට සුදුසු තත ම ගසා තමන් සිතට අසමාධි කරන්නා වූ හසතීන් දුරු කොටැ කාය චිත්ත සමාධි ලදින් යෙහෙන් පණ් ශාලායෙහි වසන සේක.

එසමයෙහි **කොසඹෑ රට පරන්තප** නම් රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කරණ කල්හි එක් දවසක් ගර්භිනී දේවීන් හා සමග ලහිරු අව් තප්මින් අබහ්‍ර'වකාශයෙහි හුන්හ. දේවීහු රජ්ජුරුවන් පොරෝණා ලක්‍ෂයක් අගනා රත්න කම්බලයක් පෙරවා හිඳැ රජ්ජුරුවන් හා බැණැ බැණැ රජ්ජුරුවන් ඇඟිල්ලෙහි තුබූ ලක්‍ෂයක්

විටෙක මුන්ද තමන් ඇතිල්ලෙහි ලා ගත්ත එසමයෙහි **භයානි ලිඛා නම් සකුණියෙක්** ආකාශයෙන් යන්නේ රත් පලඟ පෙරවැ ගෙණ හුන්නා වූ දේවීන් දැක මස් පිඩෙක් දෙ හෝ යන සංඥවෙන් **භයාගෙණෑ**[1] යන පිණිස පියා විදහා ගෙණෑ බස්නට වන.

රජ්ජුරුවෝ ඔහු බස්නා හඬින් නැඟී සිටැ ඇතුළු ගෙට වැදූ හිය හ. දේවී ගර්භිනී හෙයින් හා **සභාවයෙන්**[2] යමකට හය ඇති හෙයින් හා නැඟී යන්ට අසමර්ථ වූ වාය. ඉක්බිති ඒ පක්ෂිතෙම අවුත් දේවීන් නිය හස්සෙහි ගොවාගෙණෑ තමා ඇතුන් පස්දෙනකුට බල ඇති හෙයින් අසතනයෙන් ආකාශයට නැඟි මස් කන පිණිස ගෙණෑ හියේ. දේවී දු මරණ භයින් භය පත්වැ ද "ඉදින් මම මෙතැන්හි දී හැඩිම් නම් මිනිසුන්ගේ හඬ නිරිසනුන්ට භය එළවන හෙයින් හෙළා පුව හොත් මම ත් මාගේ ගර්භය ත් බිමෑ හි නසුම්හ. එහෙයින් යම් තැනෙක්හි තබාලා ම කන්නව පවත් ගණී ද එ තැන්හි දී මහත් කොටැ හඬා මොහු ලුහුබඳවා පියම්හ"යි සිතූහ.

පක්ෂි ද හිමාලය වනයෙහි මදක් වැඩි මණ්ඩපා'කාරයෙන් සිටි නුග රුකෙක්හි වෙලෙප් අතුරෙහි දේවීන් හොවාලා පක්ෂීන් ගොදුරු ගෙණ එක් තැනෙක්හි බැසැ හුන් කල්හි පෙරළී ආ මඟ බලාපියන බව සභාවයෙක් හෙයින් හෙද පෙරළී ආ මඟ බැලීය. දේවී ද "මෙවිට මොහු නෙරපියම්" සිතා අතින් අත පැහැර මහත් කොටැ හඬා පක්ෂීහු ලුහුබැඳ වූ හ.

ඉක්බිති එ දවස් ම හිරු හසුනට යන වේලෙහි දේවීන්ව විළි පහරින්ට පවත් ගත. සියලු දිශාවෙන් ම සොර වූ ගජිනා කරන්නා වූ මහා මෙඝ නැඟී ය. සුවයෙන් වැඩි දේවීන් අස්වසා ලන්ට එක ද කෙණෙක් නැති හෙයින් රාත්‍රියෙහි නින්දෙක් නම් නො වී ය. පහන් වැ ගිය කල්හි වැසි වලා පහවීම ද අරුණු නැගීම ද ප්‍රසව වීම ද එකවිට ම වී ය දේවී ද මෙඝ සෘතුව ද, පණිත සෘතුව ද, අරුණු සෘතුව ද, ගෙණෑ උපන් හෙයින් පුත නුවන්ට **උදෙන කුමාරයෝ ය**"යි නම් තැබූ හ.

අල්ලකප්ප තාපසයන් වසන්නා වූ පණ්ණ ශාලාව ද ඒ නුග ගසට නුදුරු තැන්හි ය. ඔහු සභාවයෙන් ම වැසි දවස් සීත භයින් වනයට නො වැදූ ඒ ගස් මූලට ගොසින් පක්ෂීන් කෑ ඇට අවුලා ගෙණෑ තළා පියා රස කකාරා ගෙණෑ බොති. එයින් එදවස් ද "ඇට ගෙණෙම්"යි ගොසින් ගස මූල ඇට සොයන්නාහු උඩ අඩනා වූ කුමාරයන්ගේ ශබ්දය අසා උඩ බලා දේවීන් දැකැ

1. ගසාගණ. 2. සභාවයෙන් ම භය ඇති හෙයින් හා

"නෙපි කවුරුදැ"යි විචාරා "මම මනුෂ්‍ය සත්‍රියක්මි"යි කී කල්හි "මෙතැනට කෙසේ අවිදැ"යි විචාරා පක්ෂිනු ගෙණා පරිදි අසා "එසේ වුවහොත් බැසැ පියව"යි කියා දේවීන් විසින් "මාගේ ජාතියට විරොධයක් වෙති යි භය ඇත්තෙමි"යි කී කල්හි "නෙපි කවර ජාතියෙහි කෙණෙකුදැ"යි විචාරා මම **ක්ෂත්‍රිය ජාතියෙහි** යැ යි කී කල්හි-

"මම ද **ක්ෂත්‍රිය** යෙමි"යි කියා "එසේ වුවහොත් ගසට නැඟී මාගේ පුතනුවන් බහා ගනුව"යි කී කල්හි එක් පාර්ශ්වයෙකින් ගසට නැහෙන්නා වූ උපාය'න්තරයක් ඉදිකොටැ නැඟි දරුවන් අල්වාගෙණැ බැසැ නැවත දේවීන් ද බහා ගෙණැ ආශ්‍රම පදයට ගෙණැ ගොසින් ශිල හෙදයක් නො කොටැ ම රක්‍ෂා කළහ. පණු පිළවුන් නො වන මී හා සවයංජාත සාලින් හා ගෙණැවුත් රක්‍ෂා කෙරෙති.

මෙසේ ඔවුන් රක්‍ෂා කරණ කල්හි දේවීහු "මම මා පක්ෂිනු බැහැ ගෙණැ ආ හෙයින් කිසි මනුෂ්‍ය වාසයකට සලකුණකුදු නො දන්මි. මේ තපස්වීන් හා මා හා කිසි විසවාසයකුත් නැත. ඉදින් මේ තපස්වීහු අප හැරපියා බැහැරට පලාගියෝ නම් අපි දෙපක්‍ෂයේ ඇත්තමු ම මෙහි ම මරණයට පැමිණෙමිහ. එහෙයින් මොහු අප නො හරණ පරිද්දෙන් ශිල හෙදයට පමුණුවා සැමි කොටැ ගත මැනවැ"යි සිතා සවභාවයෙන් ම රූසවත් වූ රාජ කුලයෙහි උපන් තාපසයන් සිටිල වූ වස්ත්‍රාදීන් මනොහර වූ ලොභ කවයුතු වූ ප්‍රදෙශය දක්වා ශිල හෙදයට පමුණුවා එතැන් පටන් දෙදෙන ම සමග වාසයෙන් වසන්නාහ.

ඉක්බිති එක් දවසක් තාපසයෝ **නක්‍ෂත්‍ර** යොගයක් බලන්නාහු **කොසඹෑ නුවර** රජ කරන්නා වූ **පරන්තප** නම් රජ්ජුරුවන්ගේ ජනම නක්‍ෂත්‍රයට වූ පිඩා දුකැ බිය වූන්ට කියන්නාහු "හද්‍රාව! **කොසඹෑ නුවර** රජ කරන්නා වූ **පරන්තප රජ්ජුරුවෝ** මළහ"යි කිහ. ඒ අසා දේවී "සවාමිනි! කවර කාරණයකින් ද මෙසේ වදුලේය"යි කිහ. තාපසයෝ කියන්නාහු "නක්‍ෂත්‍ර පිඩා වක් දුක ය. මා කියන්නේය"යි කිහ. ඒ අසා බිසව් හඬන්ට පටන් ගත්හ.

තාපසයෝ "කුමක් පිණිස හඬව්දැ"යි විචාරා "බිසවුන් විසින් **කොසඹෑ නුවර පරන්තප රජ්ජුරුවන්** තමන් සමණන් බව කී කල්හි" ඒ තපස්වීහු "හද්‍රාව! ශොක නොකරව, උපන් සත්ත්ව යන්ට මරණ නියතය"යි කිහ. ඒ අසා බිසව "උපන් සත්ත්වයන්ට මරණ නියත බව දනිම් ම ය. මා හඬන්නේ මාගේ පුතනුවන්ට පියාණන් සතු රාජ්‍යය ලබන තරම් පිණක් නැති හෙයිනැ"යි කිහ.

ඒ අසා තපස්වීහු "එසේ වුවහොත් ශොක නොකරව. තොපගේ පුතනුවන් රාජ්‍යය ලබන උපාය'නතරයක් මම දනිමි" යි කියා රාජකුමාරයන් කැඳවා **හසනික්‍රානන නම් විණාව** ඔවුන්ට දී **හසනික්‍රානන මන්ත්‍රය** උගන්වා තොයෙක් ඇත් දහස් ගණන් නුග රුක මූලට කැටිවන දවස් කුමාරයන් කැඳවා ලා "තෙපි මේ ඇතුන් එන්නාට පළමු කොටැ ම නුග රුක් මත්තෙහි හිඳැ ඇතුන් මුළුල්ල රැස් වූ කල්හි මේ මන්ත්‍රය කිය කියා මේ තත ගසව සියලු ඇත්තු පෙරළි බැලිය නොහී පලා යන්නාහ. එසේ ඇතුන් නැති ගිය කල්හි තෙපි ගසින් බැසැ මා කරා නැඟී එව" යි කිහ. රාජ කුමාරයෝ ද එසේ ම කළහ.

දෙවන දවස් "අද ගසට නැඟී ඇතුන් ආ කල්හි මේ මන්ත්‍රය කියා මේ තත ගසව – එසේ කල්හි හසුනිහු පෙරළී බිල බලා යන්නාහ" යි කිහ. ඔහු ද එසේ ම කළහ. ඉක්බිති තාපසයෝ බිසවුන් කැඳවා "තොපගේ පුතනුවෝ පියානන් සතු රාජ්‍යය ගණිති, මුන්ට හසුන් දී නහා යව" යි කීහ. බිසවු පුතනුවන් කැඳවා "පුත! තෙපි **කොසඹෑ නුවර පරනතප රජ්ජුරුවන්ගේ** පුත නුව වැ. තොපට මා දූරි ඇති කල්හි ම මා පක්ෂීහු ගසා ගෙණැ ආ බව කියා ඒ දෙශයෙහි සෙනාපතින්ගේ නම් සලකුණු මෙසේ කියව. ඉදින් එසේ කොා අදහත් නම් තොප පියානන් අත ලත මුන්ද හා පොරෝණා පලස හා දෙව" යි නහා යැවූහ.

කුමාරයෝ තාපසයන් කරා ගොසින් "මෙවිට කුමක් කෙරෙම් ද" යි විවාළහ. තාපසයෝ "අද තෙපි නුග ගස පාත අත්තේ හිඳැ මේ මන්ත්‍රය කියා මේ තත ගසව, සියලු හසුනින්ට රජ වූ ඇත් තෙම තොපට පිට දී අවුත් සිටී. තෙපි ඔහු පිටට නැඟී ගොස් පියානන් සතු රාජ්‍යය ගණුව" යි කීහ. කුමාරයෝ තාපස යන් හා මැනියන් වැඳැ මන්ත්‍රය පිරිවහා පිට දුන්කා වූ ඇතු පිටට නැඟී ඇත්හුගේ කණට "මම **කොසඹෑ නුවර පරනතප රජ්ජුරුවන්ගේ** පුතනු වෙමි. මට පියානන් සතු රාජ්‍යය ගෙණැ දෙව" යි කිහ.

ඇත් එබස් අසා "තොයෙක් ඇත් දහස් ගණන් කැටිවන පරිද්දෙන් මහත් කොටැ හැඩි ය. ඔහු ගේ හඬ හා කැටි වැ ම තොයෙක් දහස් ගණන් හසුනිහු කැටි වූ හ. ඉක්බිති වැඩි මහළු ඇතුන් ගා බාල ඇතුන් දුරුවන පිණිස ඊට සුදුසු හඬ හැඩි ය. ඒ අසා එසේ වූ හසුනිහු දුරු වැ ගියහ. ඉක්බිති රාජ කුමාරයෝ ඝොධ හසුනින් දහස් ගණන් පිරිවරා ප්‍රත්‍යන්ත ග්‍රාමයට ගොස් "මම රාජ පුත්‍රයෙමි, සමපත්තියක් කැමැති කෙණෙකුන් මා හා

කැටි වැ එන්නේ යැ යි බොහෝ දෙනා කැදවා ගෙණැ ආ ඇ මනුෂ්‍යයන්ට උපකාර කෙරෙමින් රාජ්‍යය සම්පයට ගොස් "මා හා යුද්ධ හෝ කරන්නේ ය. රාජ්‍යය හෝ දෙන්නේ ය" යි හසුන් යැ වූ හ.

අමාත්‍යයෝ එ පවත් අසා "ඇපි රාජ්‍යය ත් නො දෙමිය. යුද්ධය ත් නො කරමිය. අපගේ සවාමීන්ගේ බිසවුන් ගර්භනී කල ම පක්ෂියෙක් ගසා ගෙණැ ගියේ උන් ගෙණැ ගිය තැන මළ බව රැකුණු බව නො දනුම්හ. උන්ගේ පවත් දන්නා තුරු අප දෙන රාජ්‍යය ත් නැත – කරණ සවනු ත් නැතැ" යි කිහ. ඒ අසා කුමාරයෝ එසේ වුවහොත් "මම ඒ බිසවුන් ගේ පුත්‍ර යෙමි" යි බිසවුන් කී පරිද්දෙන් අමාත්‍ය'දීන්ගේ නම් කියා එසේ ත් නො අදහන කල්හි රජ්ජුරුවන් ශ්‍රී හස්තයෙහි ලත මුන්ද හා පොරෝණා පලඟ හා පැ. ඉක්බිති අමාත්‍යයෝ හදහා නුවර දෙර හැරැ කුමාරයන් ඇතුළට ගෙණැ රාජ්‍යයට අභිෂෙක කළහ.

6. මේ උදෙන රජ්ජුරුවන්ගේ උත්පත්ති කථාවයි.

තව ද **අජිත නම් රට** දුර්භික්ෂ සමයෙක්හි ජීවත් වන්නට අසමර්ථ වූ **කොකුහල** නම් එක් මනුෂ්‍යයෙක් **කාපින** නම් එක් තරුණ පුත්‍රයක්හු හා **කාලි** නම් අඹුවක හා ගෙණැ **කොසඹෑ** නුවරට ගොස් රක්ෂාවෙමි" යි මහට සුදුසු උපකරණ ගෙණැ නික්මින. ඔහු මාර්ගයෙහි යන්නාහු මඟෝපකරණ නිමා යන්නා හා ශක්තී නැති වැ ගොස් සා දුකින් පීඩිත වැ දරුවන් වඩාගෙණැ යන්නට නො පොහොසත් වූ හ.

ඉක්බිති සැමි තෙම අඹුවට කියන්නේ "තෙලි! ඇපි ජීවත් වමෝ නම් දරු කෙණෙකුත් වදා ගනුම්හ. මූ මහැ හැරැ පියා යම්හ" යි කිහ. ඒ අසා මවුතොම පියන්ගේ ලඟට වඩා මවුන් ගේ ලඟ මොළොක් හෙයින් "මෙ මා දිවි තබා මාගේ පුතනු වන් දිවි තබා හැරැ පියා නො හෙමි" යි කියා "වැලි කළමනා කිම්දැ" යි කී කල්හි "තෙපි එක් විටෙක වඩා ගනුව. මම එක් විටෙක වඩා ගණිමි" යි කියා "එක් විටෙක මවු මල්දමක් සේ උරෙහි හොවා ගෙණැ යෙ යි එක් විටෙක පිය වඩා ගෙණැ යෙ" යි. ඔහු වඩාගත් ක්ෂණයෙහි ම ක්ෂුධාවට වඩා ඒ වෙද නාව බලවත් වෙයි.

ගෙතෙ ම් වෙදකාව ඉවසා ගත නො හී තැවත තැවත අඹුවට කියන්නේ "ඇපි ජීවත්වමෝ නම් පුතුන් ලබම්හ. මොහු උපුළා ගෙණැ යතහොත් ඇපි ත් මේ දරුවොත් ඇවොම[1] දෙන ම මියම්හ. මොහු හැර පියා යම්හ" යි කියා හෝ ද තැවත තැවත වළකා වෙහෙසී පියා පසුව මුහෙන් නො බිණුව. කුමාරයා ද පියා ඔරින් මව ඔරට මවු ඔරින් පියා ඔරට ගොස් විඩා වැ නිදන්නට පවන්ගත. පියෙ ඔහු නිදන බව පළමු කොටැ දැනලා කුමාරයා එක් ගසක් යටැ කොළ ඇතිරියෙක්හි හොවා පියා නැගී ගියේ ය. මවු පෙරළී බලන්නී පුතු නො දැකැ "මාගේ පුතනුවන් කොයිදැ යි දමා පියා අවිදැ" යි සවාමිනි! මා නො නසව. මම මාගේ පුතනුවන් නැතිවැ ජීවත් නො වෙමි. මාගේ පුතනුවන් ගෙණෙව" යි හඬන්නව පටන් ගත. ඇගේ හඬ බලා නැවත කුමාරයා ගෙණා ය.

මෙ පමණ නැනක පුතනුවන් හැර පියා ගිය හෙයින් භවා'නතරයෙහි සත් ඉඩෙක හරණ ලද. **අකුශල කම්ම නම් මද දෙයෙකැ යි නො සිතිය යුත්තේ ය.** ඔහු දෙ මහල්ලෝ යන්නාහු එක් **ගොපලු** ගමකට පැමිණි ය හ. එ දවස් ම ගොපල්ලාගේ දෙනුන්ට කළ මනා මහා මහුලෙක් එළඹැ සිටියේය ඒ ගොපල්ලාගේ ගෙයි එක් **පසේ බුදුකෙණෙකුන් වහන්සේ** නිබදයෙන් ම වළඳන සේයෙක. එ දවස් ගොපලු **පසේ බුදුන්** වහන්සේ වළඳවා මහුල් කෙළේ ඒ මහුල්හි ද බොහෝ කිරිබත් තන් කරණ ලද. ගොපලු තෙම මහී වැ ආ ඔවුන් දැකැ "කොයි සිටැ අවුදැ" යි විචාරා එ පවත් හැම අසා මොළොක් වූ ලය ඇති කුලපුත්‍ර තෙම ඔවුන් කෙරෙහි කරුණා කොටැ බොහෝ හෙළහිතෙල් හා කිරිබත් දෙවී ය.

අඹුතොමෝ කිරිබත් ගෙණැ "සවාමිනි! "මම තොප ඇතොත් ඇත්තෙමි. බොහෝ කලක් සසින් උන්නව. බඩ පුරා බත් කව" යි හෙළහිතෙල් උණ දිශාවට නමාලා තොමෝ හෙළහිතෙල් මිද දිශාවෙන් බත් කැව. සැමි බොහෝ කොටැ බත් කා සත් අට දවසක් සාවැ හුන් හෙයින් ආහාර තෘෂ්ණාව ඉවසාගත නො හිත. ගොපලු තෙම ඔවුන්ට බත් දෙවා තෙමේ කිරිබත් කන්ට පටන් ගත. මහී පුරුෂතෙම ඔහු බල බලා හුන්නේ යට මැස්සෙහි හොත්තා වූ බැල්ලට ගොපල්ලා දෙන කිරිබත් පිඩ බලා "දවස දවස මේ බත් පිඩ ලබන බැල්ලක් කුශල් කළ නියාය" යි සිතා රාත්‍රියෙහි කිරිබත දිරවා ගත නො හී මිසැ එම බැල්ලගේ බඩැ උපත.

---

1 සැවොම්.

ඉක්බිති අඹු තොමෝ ම සැමියා දවා එම ගෙහි ම බැලූ මෙහෙ කොටැ සාල් නැළියක් ලදින් ලත් සාල් නැළිය පිසැ පසේ බුදුන් වහන්සේට දන් දීලා "මේ පින් නුඹ වහන්සේගේ මළ ගැත්තවුට වේ ව" යි කියා "මා මෙහි ම විසුව මැනව. මාගේ සවාමි දරු වූ පසේ බුදුන් වහන්සේ නිබඳයෙන් මෙයට වඩනා සෙයෙක. පිළිගන්වන්නට දෙයක් ඇත මැනව. නිබඳව දැකැ දැකැ ශ්‍රී පාද වැඳැ වැඳැ වසන්නෙමි මෙහි ම වෙසෙමි" යි බැලූ මෙහෙ කොටැ විසුව. ඒ බැලිද සත්වෙනි අවවෙනි මස කුකුරුවකු වදා පුව. ගොපලුතෙම කුකුරට නිබඳයෙන් එක් දෙනකගේ කිර තබා දින. කුකුරා නොබෝ කලකින් වැඩී මහත් විය.

ඉක්බිති **පසේ** බුදුන් **වහන්සේ** වළඳන වේලෙහි කුකුරට නිබඳ ම බත් පිඩක් තබා දෙන සෙයෙක. කුකුරුතෙම බත් පිඩ නිසා පසේ බුදුන් වහන්සේ කෙරෙහි සෙනහ කෙළේ ගොපලු ද දවස් පතා දෙ වේලෙහි ම පසේ බුදුන් වහන්සේට උපසථානයට යන්නේ අතර මහැ වණඹ මෘගයන් ඇනි තැනැ බිමත් ගසත් දණෙඹත් ගසා පියා මහත් කොටැ හඬ ගසාපියා වණඹ මෘගයන් ලුහුබඳව යි. බලු ද ඔහු හා කැටිව යෙ යි එක් දවසක් ගොපලුතෙම පසේ බුදුන් වහන්සේට "සවාමීනි! මට අවකාශයක් නැතිදා මේ බල්ලා එවාලූ සලකුණෙන් වැඩිය මැනවැ" යි සැලකොටැ තමාට අවකාශයෙක් නැති දවස් "පුත! ගොස් මාගේ සවාමීන් වඩා එව" යි කියා බල්ලා යව යි.

ඔහු කී එක බස ම ගිවිස ගෙණැ නික්මැ සවාමි දරුවා ගස කොළ දණඹ ගසා වණඹ සත්ත්වයන් දුරු කරණ තැන්හි දී තෙමේ මඟත් කොටැ බුරා වණඹ සත්ත්වයන් දුරු කෙරෙමින් පසේ බුදුන් වහන්සේ වසන තැනට ගොස් පන්සල් දෙරැ සිවැ තුන් විටෙක හඬා තමා ආ බව සැලකොටැ ඇතුළට වැදූ එකත් පස් වැ සිවැ වැදූ හොවී. පසේ බුදුන් වහන්සේ ද "වළඳන වේලා වනැ" යි නික්මුණු කල්හි බුර බුරා වණඹ සත්ත්වයන් දුරු කෙරෙමින් අභිමුඛයෙහි යෙ යි. අතුර තුරෙහි පසේ බුදුන් වහන්සේ ඔහු විමසනු පිණිස අතික් මඟකින් වඩනට පටන් ගත්තා සෙයෙක. ඉක්බිති බලුතෙම අභිමුඛයෙහි මඟ අහුරා සිවැ ගෙණැ බුරා නො වැඩිය දෙ යි.

එක් දවසක් පසේ බුදුන් වහන්සේ ඔහු වළක්ව වළක්වා වැඩැ බල්ලා පයින් ඉවත ලා පියා නික්මුණු සෙයෙක. බලු තෙමා වැළකැ වඩනා දැකැ පසු පස්සෙහි දිවැගෙණැ ගොස් සිවුරු කණ ඇහැගෙණැ ඇදූ මඟට ගෙණා ය. මෙසේ පසේ බුදුන්

වහන්සේ කෙරෙහි බලවත් වූ සෙනහ ඇති කොටැ එක් දවසක් පසේ බුදුන් වහන්සේ සිවුරු ගෙත්තම් කරණ පිණිස ගොපල්ලා අතින් සමුගෙණැ ආකාශයට නැඟී වඩනා බලමින් **නරිසතුන් නම් මිනිසුන් සේ තුඹින් එහාක් කියා සිතින් එහාක් සිතන වක්‍ර බුදුගියක් නැති වැ සෘජු බුදුහෙයින්** වඩනා පසේ බුදුන් වහන්සේ බලා බුර බුරා සිටැ ලඟ පැලී මියැ තමා කළ අතික් කුශලයක් නැත ද පසේ බුදුන් වහන්සේ කෙරෙහි කළ සෙනහ යෙන් **තාවතිංසා භවනයෙහි** මහෙශාක්‍ය දිව්‍ය පුත්‍ර **ම**ැ ඉපැදැ දිව්‍ය සත්‍රින් ලක්‍ෂ ගණන් පිරිවරා දිව්‍ය සමපත්හි අනුභව කරන්නව පවන් ගත.

එහෙයින් සත්පුරුෂයන් විසින් ඉතිරි කරණ ලද කුසල් නැද්ද? තුණුරුවන්හි සෙනහ මාත්‍රයක් කොටැ ද අසාධාරණ වූ අනුපම වූ දිව්‍ය සමපත් අනුභව කරන්නව උපන්න කළ මැනව.

එසේ උපන්නා වූ ඒ **සොසක** අනුන් කණට කොදුරා බණත කල්හි ශබ්දය දෙළොස් යොදනක තැන් පැතිරැ සිටී. සවභාව යෙන් බණත කටහඬ සියලු දස දහසක් යොදුන් දෙව්ලොව පැතිරැ ගෙණැ සිටී. මේ හැම බලු වැ පසේ බුදුන් වහන්සේට රක්‍ෂා පිණිස බිරැ බිරැමෙහි අනුසස ය. එහෙයින් ම ඕ හට **සොසක දිව්‍ය පුත්‍රය** යි නම් තුබූහ.

හෙතෙ ම එවෙනි මහත් වූ දිව්‍ය සමපත්හි අනුභව කරන්නේ "මේ ආහාර අනුභව කරණ වේල ය" යි නො දැන සිහි මුළාව ආහාර කෘයින් මියැ **කොසඹෑ නුවර** නගර ශොභනාවකැ කුසැ පිළිසිඳැ ගත. හෝ තොමෝ වැදූ දවස් "දුසිය! මා වැදූයේ දුවක ද පුතකුදු දැ" යි විචාරා 'පුතෙකැ" යි කී කල්හි "එසේ වුවහොත් මොහු කුල්ලෙක ලාලා කසළ ගොඩට දමා පියව" යි කියා දම්මවාපුව. මොහු බලු වැ උපන් කල පසේ බුදුන් වහන්සේට රක්‍ෂා පිණිස බිරැ බිරැමෙහි අනුසසින් සිසාරා ගෙණැ හිත්තා දහස් ගණන් කපුටු බල්ලෝ මොහු ඇඟැ තුඩ ඔබා ලන්නට ත් සමර්ථ නො වූහ.

මෙසේ **ධර්‍මය** නම් තමා රක්‍ෂා කරන්නවුන්ට රක්‍ෂා කරන් නේය යි දන්නා වූ සත්පුරුෂයන් විසින් ධර්‍මය සරණ යෙම් යි **දහම් සරණ යා යුතු.**

එසේ ම ඔහු කසළ ගොඩෙහි ඔත් කෙණෙහි පිවිත යන්නා වූ එක් පුරුෂයෙක් රැස් වැ ගෙණැ හුන්නා වූ කවුඩු බල්ලන් දැකැ මේ කිම් දෝ හෝ යි පරීක්‍ෂා කරන්නේ කුමාරයා දැකැ පුත්‍ර සෙනහ උපදවා පුත් කොටැ වඩා ගෙණැ ගෙට ගියේ ය. එ සමයෙහි

කොසඹෑ නුවර සිටානෝ රජගෙට යන්නාහු රජගෙයි සිටැ ගෙට යන්නාහු පුරෝහිතයා දැකැ 'ආචාර්යයෙනි! අද වක දවස තකත් පරීක්ෂා කළාදැ'' සි විචාරා ''පරීක්ෂා කෙළෙමි'' සි කී කල්හි ''විශෙෂ කිම්දැ' සි ''අනික් විශෙෂයෙක් නැත. අද මේ නුවර උපන් කුමාර කෙණෙක් ඇත්තම් මහසිටු තැන් ලැබෙති'' සි කීය.

ඒ අසා සිටානෝ තමන්ගේ අඹුවන්ට ත් ප්‍රසව ආසන්න බව දැනැ ගෙට යවා ''වැදූ දෙ හෝ'' සි විචාරා නො වැදුව යනු අසා රජ ගෙට ගොස් රජ්ජුරුවන් දැකැ අවුත් තමන්ගේ මිඩියක කැඳවාලා ඇට දහසක් දීලා ''තෝ සියලු නුවර බලා අද උපන් දරු කෙණෙකුන් ඇතහොත් හැර ගෙණැ එව''සි යැවී ය. හෝ නොමෝ සියලු නුවරෙහි ඇවිදිනී කසළගොඩ හොත් දරුවන් වඩා ගෙණැ ආ ගෙට ගොස් දහස දී දරුවන් ගෙණැ සිටාණන්ට පැව. සිටානෝ ''මාගේ අඹුවන් දුවක ලදහොත් මෝ හට විවාහ දී රක්ෂා කෙරෙමි'' සි ඉඳින් ''පුතනු කෙණෙකුන් උපන්නු නම් මොහු හැර පියමි'' සි වඩන්නට පටන් ගත්හ.

ඉක්බිති සිටානන් ගේ ඇඹනියෝ පුතකු වැදූහ. සිටානෝ ද ''මොහු ඇතහොත් මාගේ පුතනුවන්ට සිටු තනතුරු නො ලැබෙන්නේ වේදැ''සි, සිතා එම මිඩිය කැඳවා ''මොහු ගෙණැ ගොස් ගොපල්ලන් ගෙරි පිටත් කරණ වේලෙහි ගොවුදෙනි ගෙරි නික්මෙන කඩැ හොවා ලව - එසේ කල්හි ගෙරි ම මොහු මැඩැ මරන්නාහ''සි නඟා යැවූහ. ඕ ගොසින් කුමාරයා ගොවුදි කඩෙහි හෙවූහ. එ දවස් පෙරැ හැම ගෙරින්ට පසුව ලා යන වැඩි මහළු ගොන් හැම දෙනාට පළමුව නික් මැ කුමාරයන් සතර කකුල හසුසෙහි ලා ගෙණැ ගොන් යන තුරු උපද්‍රවයක් විය නො දී සිටියේ.

ගොපලු ගොනු සිටි කාරණ ය පරීක්ෂා කරන්නේ කුමාරයන් ගොත්තවුන් දැකැ ''මහ පිණැ'නි දරු කෙණෙකුන් ලදිමි''සි වඩා ගෙණැ තමාගේ ගෙට ගෙණැ ගියේ. මෙතෙ ම තමා බලු වැ උපන් ජාතියෙහි පසේ බුදුන් වහන්සේට වණඹ සතළුයන් දුරු කරණ පිණිස බිරු බිරුමෙහි අනුසසින් අඳුන වූ ගොණුන් අතින් පොවා මෙබඳු වූ රක්ෂා ලදහ.

එසේ හෙයින් ධර්මය සේ ලොවට රක්ෂාවට සුදුසු අනික් වසතුවක් නැති හෙයින් තම හට සෙනහ ඇති සත්පුරුෂයන් විසින් ධර්ම ය පුරා ධර්මයම සරණ යා යුතු.

ඉක්බිති සිවානන්ගේ මිඩිය ගොසින් සිවානන්ට එ පවත් දැන් වූ හ. සිවානෝ ද එ පවත් අසා දහසක් යවා ඔහු ගෙන්වා ගෙණ එම මිඩිය අත යවා පන්සියයක් ගැල් යන මහ හෙ වූ හ. හැම දෙනාට පළමු ගැල් ලා පළමු කොටැ වි ය. ඉක්බිති ඒ ගැල් දෙටුවා ගේ ගැල්හි යෙදූ ගොන්හු දරුවන් හොත් තැනට ගොසින් විය කරින් හෙළා පියා වක්‍ර කම් කරන්නාහු තැවත යොදලා මෙහෙ යුව ද වක්‍ර ම කොටැ අරුණු නැහුහ.

ඉක්බිති ගැල් දෙටුවා පෙරළී "ශික්ෂිත ගොණුන් අද මේ සම භූමියෙහි නො යාහි වක්‍ර කොටැ පහන් කෙළේ කුමක් දෝ හෝ"යි සිතා පරීක්ෂා කරන්නේ හොත්තා වූ දරුවන් දැකැ "මහා භාග්‍ය දරු කෙණකුන් ලදිමි"යි තමාගේ ගෙට වඩා ගෙණැ ගියේ. මේ තැන්හි ද සම භූමියෙහි පන් සියක් ගැල් පැකිල සිටිනා පරිද්දෙන් ඔහුගේ රක්ෂාවට වජ්‍ර ප්‍රාකර වූ යේ ඔහු රක්ෂා කළා වූ ධර්මය ම ය.

එ හෙයින් මෙසේ අසරණ ස්ථානයෙහි සරණ වන්නා වූ "ධම්මරත්නය සරණ යෙමි"යි **දහම් සරණ යා යුතු**

තැවත සිවානෝ එ පවත් අසා දහසක් දී ගෙන්වා ගෙණැ ඇ ම අතැ "මොහු ගෙණැ ගොසින් අම්බ සොහොන්හි ගස් කොළ අතුරෙහි හොවාපියා" "එ තැන්හි මොහු කවුවු බල්ලෝ හෝ කා මරන්නාහ. යක්ෂයෝ හෝ ගෙණැ යන්නාහ. එහි මොහු ගේ පවත් දැනැ එව"යි එහි නහා යැවූහ. හෝ තොමෝ ඔහු අම්බ සොහොන්වලට දමා පියා එකත් පස්වැ ගැළීගෙණැ සිටියහ. එසේ වූ විජන ස්ථානයෙහි සතිස් යොදනෙක පැතිරී ගෙණැ සිටියා වූ පිරිසින් රැකවල් ලද වක්‍රවර්ති මහ රජක්හු සේ කුමාරයා නිරුපද්‍රව හොත් කල්හි එක් එළු පල්ලෙක් එළුවන් උණාගෙණැ එතැනින් යෙමින් සිටියේ.

එ සමයෙහි එක් එළියක් යන මගින් ඇලවැ ඇලවැ කොළ පත් කකා යන්නී ඔත්තා වූ කුමාරයන් දැකැ ඔවුන්ගේ ධර්මී බලයෙන් උපන්නා වූ සෙනහ බලයෙන් තැමී ගොස් දෙ දන බිමැ ඇතැ ගෙණැ හය පඤ්ච පාතයෙන් රාජ කුමාර කෙණකුන් කිරි පොවන කිරි මවක සේ තනය කට තබා කිරි පොවන්නට පටන් ගත්හි. එළු පල්ලා නෙරිනට වන ත් නො යෙ සි. ඉක්බිති එළුපල් "එළිය කෙවිටින් ඇතැ බැණැ ගෙණැ යෙමි"යි සිතා එතනට ගියේ හොත්තා වූ කුමාරයන් දැකැ "මහා දෙව ඇත්තා වූ පුතනු කෙණකුන් ලදිමි"යි සිතා වඩා ගෙණැ ගෙට ගියේ.

ඉක්බිති සිවාතෝ එ පවත් අසා නැවත දහසක් දී ඔහු ගෙන්වා "මෙතෙම මෙසේ මරාගත හැකි කෙණෙක් නො වෙයි. මොහු පණිත මසාතකයෙහි හෙළා පියා එසේ කල්හි පණිත ප්‍රපාතයෙහි ගැසී මියන්නේ ය"යි යැවී ය. හෝ තොමෝ පණිතයට නැඟී කුමාරයා ගෙළුව ඔහු ගෙන්නහු ම බලු වැ පසේ බුදුන් වහන්සේට කළ රක්ෂායෙහි අනුසසින් කෙළිපෙදක් බිම ගිය නො දී අත හෙළවා ගන්නා සේ හුනු ලාගැබ මොළොක් වූ ශාඛායෙන් පිළිගෙණැ එසමයෙහි එක් නලා කාර-යෙක් තමාගේ පුතු හා කැටි වැ හුණ දඬු කපන්නට ගියේ කුමාරයන් ශාඛා'ග්‍රයෙහි හොත්තාවුන් දැකැ වඩා ගෙණැ තමාගේ ගෙට ගියේ. සිවාතෝ ද එපවත් අසා නැවත දහසක් දී කුමාර යන් ගෙන්වූහ.

මෙසේ බලු වැ පසේ බුදුන් වහන්සේට කළ රක්ෂායෙහි අනුසසින් මෙතෙක් උපද්‍රවයෙන් කුමාරයන් ගැළවුනු බව ඇසූ සත්පුරුෂයන් විසින් ධර්මය සේ වූ රක්ෂාවරණයක් ලෙ,වට නැති බව දැනැ අප්‍රමත්ත වැ එම ධර්මය ම පුරා එම ධර්මය ම සරණ ගා සුනු.

මෙසේ සිවාතෝ මෙතෙක් මෙතෙක් උපාය කරත් කරත් කුමාරයෝ වැඩුනාහ වැඩුනා වූ කුමාරයන්ට සොසඤ්ඤය යි නම් කළහ කුමාරයෝ සිවානන් ඇසැ ගසා ලූ කටුවක් සේ වැටහුනාහ. ඇස දල්වා ඉදුරා ත් බලා පියැ නො හෙනි නැවත ද කුමාර යන්ට මරණ උපායක් සිතන්නා වූ සිවාතෝ තමන්ගේ ම ගෙට වලන් ලන්නා වූ කුඹලා කැඳවාලා "කවර දවසකැ සුල ලසිදැ"යි විචාරා "සෙට ය"යි කී කල්හි එසේ වුවහොත් "මේ දහස ගෙණැ අපට එක් කටයුත්තක් කරව"යි කියා "කවර කටයුත්තෙක් ද සවාමිනි! කී කල්හි මාගේ එක් අවජාත පුත්‍රයෙක් ඇත. ඔහු තා කරා එවා ලන්නා හා ගබඩාවෙහි ලා ගෙණැ පොරොවකින් කඩකඩ කොටැ කපා පියා සැළියෙක ලාලා වලන් පලහන සුල යෙහි ලා පිඟ. මේ දැස තොපට නිකම් අත් පඬුරැඟ. මේ කට යුත්ත සිදුවූ කල්හි කරන්නා වූ උපකාර මම් ම දන්නෙම් වේදැ"යි කිහ.

කුඹලා ද "ගහපත, සවාමිනි! මේ කවර බැරි දෙයෙක්දැ"යි කියා ගිවිස්සේ. සිවාතෝ දෙවන දවස් සොසඤ්ඤයා කැඳවාලා "මම ඊයේ කුඹලාට කටයුත්තක් කිම් තෝ ගොසින් ඊයේ කී කටයුත්ත නිහඬව කරන්නට කුඹලාට කියවයි" කියා යැවූහ. ඔහු යන්නහු කෙළි මඩලෙහි සිටියා වූ සිවානන්ගේ ගෙහි වැදූ පිත් තෙමේ දැකැ "කොයි යවුදැ"යි විචාරා "අප්පාගේ මෙහෙ

වරෙක. කුඹල්ගෙට යෙමි''යි කී කල්හි මේ කොල්ලෝ කෙළි මඩලෙහි මා බොහෝ කොටැ පරදවා පිහ. නුඹ ඔවුන් හා කෙළි කෙළෑ දැන් මාගේ පැරදුම් ගෙවන්නේ. ''මම කුඹල්ගෙට ගොස් නුඹගේ කවයුත්ත කොටැ ගෙණෑ එමි''යි කියා **සෝසකයන්** කෙළි මඩලෙහි හිටුවා තෙමේ කුඹල්හලට ගොස් ඊයේ අපගේ පියාතන් වහන්සේ කී කවයුත්ත නිහඬව කළ මැනව' යි කිහ.

කුඹලා සිටානත් කී පරිද්දෙන් ම කුමාරයා මරා පියා වලන් පළහන සුලයෙහි ලා පිය. **සෝසක කුමාරයන් ද** දිවාභාගය මුළුල්ලෙහි කෙළෑ සවස ගෙට ගොසින් සිටානන් විසින් ''හැයි? පුත! කුඹල්ගෙට ගියාදැ යි'' කී කල්හි තමන් ගන්නවුන් වළකා පියා සිටානෝ පුතනුවන් ගිය බව කී කල්හි දෙහොත මුදුනෙහි තබා හඬා ගෙණෑ කුඹල්ගෙට ගොස් කුමාරයන් මළ පවත් අසා මහත් වූ ශොකයෙන් ආතුර වූහ. **තමා කෙරෙහි මෙෂයක් නැන්තවුන්ට මෙෂ කළවුන්ට වන්නා වූ විපතතිය නො වළකා ගත හැකි බව මේ කථාවෙන් අසා සත්පුරුෂයන් විසින් මෙෂ නම් දෙයක් නො කමසුතුය.**

මෙසේ බලු වැ පසේ බුදුන් වහන්සේට රක්ෂාව පිණිස බිරු බිරුමෙහි අනුසසින් කුමාරයෝ මෙවෙනි මිත්‍ර වධයෙන් ගැළ වී දිඝායුෂක වැ මතු මහා සමපතති අනුභව කරන්නට වහල්වූයේ ජාත්‍ය'නතරයෙහි මොහු පිරූ සුවරිත ධර්මය ම ය. එහෙයින් මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා සසරෙහි රක්ෂා හා අභිමත වූ සියලු අනුභව හා අනතයෙහි **අමෘත මහා නිර්වාණය** කැමැති සත්පුරුෂයන් විසින් ධර්මය ම පුරා ''දහම් සරණ යෙමි''යි **දහම් සරණ යා සුතු.**

මෙසේ නොයෙක් ලෙසින් කුමාරයන්ගේ භාග්‍යය නිශචය වුව ද සිටානෝ කුමාරයන් ඉදුරා ත් බලා පිය නො හී ''කවර ලෙසකින් මොහු මරා ගණිම් දෝ හෝ''යි සිතා ''මාගේ ගම් සියයකට මුදලි වැ සිටින තැනත්තහුට කියා මරමි''යි සිතා **සෝසක කුමාරයන්** කැඳවා ''පුත! මේ පත ගෙණෑ ගොසින් අපගේ **ගම්මුදලින්ට** දී ලව''යි කියා ''තෙල අපගේ කාල කණ්ණි පුත්‍රයෙක. තුලු මරා පියා මඩොරයෙක්හි ලා පුව හොත් තමන්ට කළමනා සත්කාර මම් ම දන්මි''යි කියා කුමාර යන් අකුරු නො දන්නා ගෙයින් පත් දීලා යවන්නෝ පලා බතුත් නො ලා ''අතර මග අපගේ යාළු සිටානන් කෙණෙක් ඇත ඔවුන්ගේ ගෙට වැදූ බත් කා ගෙණෑ යව''යි තහා යැවූහ.

කුමාරයෝ ගොස් අතර මහැ සිටානන්ගේ ගෙට වැද ඔවුන්ගේ ඇඹේනියන් දැකැ තම් සලකුණු කියා **"සෝසක කුමාරයෝ** තම් තොපි ද"යි කී කල්හි "එසේය"යි කීහ. ඔවුන් දුටු ඇසිල්ලෙහි ම සිටානන් ඇඹේනියන්ට ඔවුන් කෙරෙහි පුත්‍ර සෙනහ උපන. එසමයෙහි සිටානන්ගේ සත්බුමු පායෙක්හි ලා ලා එක් මෙහෙකරණ එකෙක් පාවා දී රක්‍ෂා කරණ දියනි කෙණෙක් ඇත. සිටු දියනියෝ තමන්ගේ මිඹිය ඒ වේලෙහි කිසි කවියුන්තක් පිණිස ව්‍යාපාර වීථියට ගවන්නාහ. ඇ යන්නිය දැකැ සිටානන්ගේ ඇඹේනියෝ ඇ කැඳවා "නි යන මෙහෙවර තබා මාගේ පුතනුන් පතුල සෝධවා යාන් අතුව එහි හොවා ලව"යි කීහ. ඕ ඒ මෙහෙවර කොවැ කල් යවා සිටු දියනියන් සම්පයට ගියහ

සිටු දියනියෝ කල් යැවූ කරණය විචාරා **"සොණක කුමාරයන්ට** නුඹගේ මැනියන් කී මෙහෙවර කොවැ කල් යැවිමි"යි කී කල්හි තම කණ වැටහෙන්නා හා ම උපන්නා වූ සෙනහයෙන් පිරී ගියා වූ සිත් ඇතිවූහ. ඔහු ද අනික් කෙණෙක් නො වෙති මේ කුමාරයන් බලුවැ උපන් කාලයට පළමු උපන් ජාතියෙහි අඹු වැ පසේ බුදුන් වහන්සේට මෙහෙකළ තැනැත්තහ.

එහෙයින් ගිය ජාතියෙහි ඇඹේනියන් හෙයින් ම සෙනහ කොට "උන් අත ගමක් ඇද්දැ"යි විචාරා "කුරහුලා කණ බැඳලූ පතක් මුත් අනිකක් නැතැ"යි කී කල්හි කාත් නො දන්වා කුමාරයන් ඔත් තැනට ගොස් පත උකා පියා කියවා හසුන් දැකැ සංපා වැ "මා නුදුටුව හොත් මාගේ සැමියන්ගේ ජීවිතය නවුගේ වේදැ"යි සිතා ඒ පත හිරා අනික් පතෙක **"අපගේ ගම් සියයෙක්හි නියුක්තය මුදලියාට ය. මාගේ පුත්‍ර වූ සොණක කුමාරයන් තා බලා එවිමි. තෙල අපසතු ගම් සියයෙන් ම පඬුරු හැරිඟෙණෑ ජනපදවාසිවූ සිටානන්ගේ දුවනියන් හා විවාහ කරවා ගම්මැද දෙමහල් පහයක් කරවා එහි උන් ලවා එපවත් කියා එවා මා අතින් මහා ප්‍රසාද ලබන්නේ ය"**යි පත ලියා කුරුහුලෙහි බැඳාලූහ.

කුමාරයෝ බත් කා සැත පි නික් මැ ගම්මුදලිහු දැකැ ඒ පත් දුන්හ. හෙතෙම ඒ පත දැක සතුටු වැ එසේ ම විවහා කරවා පායෙහි ලා එපවත් සිටානන්ට කියා එවිය. සිටුතෙම එපවත් අසා "මා කළ කළ දෙයෙක් සිඳ්‍ධ නො වනා වනැ"යි ශොකයෙන් ඇතිවූ අතිසාරයෙන් පීඩිත වි ය. සොණක කුමාරයන්ගේ ඇඹේනියෝ ද "සිටානන්ගෙන් ඇ හස්නක් මට කියා මුත් උන්ව

නොකියව"යි නියොග කළහ. සිවානෝ ද "මෙ විට ඌ මාගේ වසතුවට හිමි විය නො දෙමි"යි තමාගේ එක් නියුක්තා යක්ෂ කැඳවා "මාගේ පුතනුවන් මා දක්නට කැඳවාගෙණැ එව"යි කියා යැවිය.

සිටු දියණියෝ එපවත් අසා 'සිවානෝ රෝගයෙන් දුර්වලයෝ ද බලවත්හු දැ"යි විචාරා "තව අහාර කා හෙති"යි කී කල්හි **සෝෂක කුමාරයන්ට** එ පවත් නො දන්වා "මා කී කල යන්නේ ය. මා කියනතුරු මෙතැන්හි හිඳුව"යි ඔහු එක් තැනෙක්හි සුවසේ හිඳවූහ මෙසේ ම දෙවරෙකැ හිඳුවූහ. තුන්වන වර රොගය බලවත් වැ ගිය කල්හි ගිය තැනැත්තේ සිවානන්ට රෝග බලවත් වූ බවත් එක් කබල් තබා-එක් කබල් පහකරණ බව ත් කිය.

එ පවත් අස සිටු දියණියෝ "මේ යන්නට සුදුසු කලැ"යි "ගම් සියයෙහි පඩුරු හැරැ ගෙණැ නික්මැ තොපගේ පියානන් බලම්හ"යි එන්නාහු "මෙතෙක් වසතු හැරැ ගෙණැ යන්නට කල්ය"යි කියා වසතුව තමන්ගේ කුලෙහි තබා "සවාමිනි! තොපි තොපගේ පියානන් දුටුවිට වැඳලා පාමුලැ සිටුව. මම ඉස්දෙරැ සිටිමි"යි කියා ගෙට වදනා විට ම ගෙය සිසාරා තමන්ගෙන් රැවකල් ලවා ඇතුලට වැදූ සිවානන් වැඳ තුමූ ඉස්දෙරැ සිටියහ. කුමාරයෝ පා මුලැ සිටියහ.

එ සමයෙහි සිවානන් පය මැඩැ හුන් තැනත්තහු "සවාමිනි! නුඹගේ පුතනුවෝ අවූය"යි කී කල්හි ඇස් දල්වා කුමාරයන් බලා තමාගේ **ලියන්නවුන්** කැඳවා වසතුවෙහි සඞ්ඛ්‍යා විචාරා "ධනය සතලිස් කෙළෙක මෙතෙක් චිපද වතුෂ්පාදදීහු ය" යනු අසා "මෙතෙක් වසතු මාගේ පුතනුවන්ට නොදෙමි"යි කියන්නට පටන් ගත්තේ කුමාරයන්ගේ භාග්‍යයෙන් 'දෙමි"යි කියා පිය. සිටු දියනියෝ එපවත් අසා "පෙරළා අනිකක් කිවොත් නපුරැ"යි සිතා උන්ට සිහි නැතිව හඬන්නා සේ "මි නියා අවමඞගල්‍ය බස් දුන් ම වදුරන්නේ කුමටදැ"යි ලෙහි අඩාගෙණැ හී ලය හිසින් හැනැ එතැන්හි ම මරා පුව. රජ්ජුරුවෝ සිවානන් මළ බව අසා දවා "උන්ගේ දරු කෙණෙක් ඇද්දැ"යි විචාරා **"සෝෂක** නම් පුතනු කෙණෙක් ඇත ජීවත් කල්හි ම ඇති වසතුව උන්ට ම පවා දී මළහ" යනු අසා "ඔවුන් කැඳවව"යි කැඳවූහ

එ සමයෙහි රාජාඞගණයෙහි වැසි වැසැ දිය හෙළාපී ය. කුමාරයෝ රජ්ජුරුවන් කැඳ වූ හෙයින් යන්නෝ දියට නො බැසැ දිය පැකැ පියා නැගී ගියහ. ගොසින් රජ්ජුරුවන් දැක වැඳැ

එකත් පස්වැ සිටියහ. "සොසඟයෝ [illegible] යි විචාළ කල්හි "එසේ ය"යි කිහ. තෝ ශොක නොකොට [illegible] දෙම්, දැන් ගෙට යා"යි සමු දුන් කල්හි ගෙට යන්නෝ ආදී පැනැ පියා ගිය දිසට බැසැ පියා නැගී ගියහ

රජ්ජුරුවෝ දෙක ම බලා සිටැ ඔහු කැඳවා යි කැඳවා "තොපි ආදි දිගට පැනැ ගෙණැ ආයේ කුමට ද? පසුව දිසට බැස ලා ගියේ කුමක් පිණිස දැ"යි විචාරා සවාමිනි! ආදි කුඩා කොල්ලන් කෙරෙහි ඇතුළන් වැ අනා'ජානා වැ ඇවිදිනා හෙයින් දිය පැනැ ගෙණැ ආමි. දැන් සවාමින් සිටු තතතුරු දෙම්හ යි වදාළ කල්හි ආජානා වූවමනා වේ දැයි දිසට බැසැ ලා ගියෙමි යි" කී කල්හි රජ්ජුරුවෝ "ඉතා ධෛර්‍ය්‍ය සම්පන්න වූ කටයුතු දන්නා වූ පුරුෂයෙකැ"යි එ වේලෙ හි ම සිටු තැන් දී නුවර පැදකුණු කරවා ගැවූහ.

ගෙට වදනා සිටානන් දැකැ "මෙතෙක් සම්පත්ති මා නිසා ය ලද්දේය"යි ඇඹේනියෝ සී පිහ. සිටානෝ සී පූ කාරණා විචාරා එපවත් අසා "මෙතෙක් තැන් අනතරායෙන් ගැලවුනේ මා ගිය ජාතියෙහි කළ කුසලින් වේ ද? එ හෙයින් අප්‍රමාද වැ කුසල් කළමනා වේදැ"යි දවස් පතා දහසක් වියදම් කොටැ දන් දී සොසඟ සිටානෝය යන නමින් අද දක්වා ම ලොක ප්‍රසිද්ධ වූහ.

මොවුන් බලු වැ පසේ බුදුන් වහන්සේට රක්‍ෂා පිණිස බිරු බිරුමෙන් දිව්‍ය ලොකයෙහි දිව්‍ය සම්පත්ති අනුභව කොටැ මනුෂ්‍ය ලොකයෙහි මෙතෙක් උපද්‍රවයෙන් ගැලවී සිටු තතතුරු ලදින් මහා සම්පත්තියට පැමිණි කථා ඇසූ සත්පුරුෂයන් විසින් උපන් සත්ත්වයාට ධර්‍මය ම මුත් අනික් සරණයෙක් නැතැ යි නියත කොට සියලු සත්ත්වයාට සියලු උපද්‍රව දුරු කොටැ සියලු සම්පත්ති ලබා වන්නා වූ ධර්‍මය ම සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

මෙසේ සොසඟ සිටානන් පහළ වූ සමයෙහි භද්‍රවතී නම් නුවරැ භද්‍රවතී නම් සිටානෝ සොසඟ සිටානන් හා ඔවුනොවුන් නො දැකැ ම මිත්‍ර වැ හිඳිනාහ. දෙපක්‍ෂයෙහි ඇත්තෝ ම ඔවු නොවුන් ගේ රටින් ආවා වූ වෙළඳුන් අතින් ඔවුන් ගේ සවරූප අසා ඔවුනොවුන්ට පඬුරු යවා විශ්වාසය ස්ථිර කළහ.

එ සමයෙහි භද්‍රවතීය සිටානන්ගේ ගෙයි අතිවාතක රොග යක් උපන. සිටානෝ රොගයෙන් දුසි දුසාදීන් ඇතුළු ව හැම මියන්නට වන් කල්හි ඇඹේනියන් හා දියණියන් කෙණෙකුන් කැඳවා ගෙණැ ගෙහි හිතති බිඳැ ගෙණැ නික්මැ "අප ගේ මිත්‍ර වූ සොසඟැ නුවරැ හිඳිනා සොසඟ සිටානන් නිසා ජීවත් වම්හ"යි අවුත් මාගෝ'පකරණ කෂිණ වැ ගිය හෙයින් ඉතා දුර්‍ලභ වැ

වාතා'නපඤ්ඤාතවිසේසේ දුග්ගාහඛා නුවරෙහි ශාලාවට අවුත් "ඇපි ඉතා දුප්පත්ය. මෙසේ වූ දුප්පත් වෙශයෙන් ගොසින් අපගේ මිත්‍රයානන් කෙසේ දක්මෝ ද? ඔහු අප ගේ මිත්‍රයානෝ දවස් පතා දානයක් පියදම් කොටැ දන් දෙත් ලු. ඔවුන් ගේ දන් හලට අප ගේ දියනියන් යවා දන් බත් ගෙන්වා ගෙණැ කා මදක් ශරීරය පුෂ්ටි කොටැ ගෙණැ යමිහ"යි සිතා ම දියනියන් දන් සැලට යැවූහ.

සිහා සිටි දියනියන් දැකැ "තොපට කි කොටසක් දුන මතා දැ යි කි කල්හි තුන් කොටසක් උව මැන වැ"යි කි කල්හි "තුන් කොටසක් උව මැනවැ"යි කියා තුන් කොට සක් ගෙණැ අවුත් මවු පියන් හා එක් වැ කන්නට බැසැ හුන්හ. මැනියන් හා දියණියන් දෙන්න "දුක තම් දෙය මහතුන්ට ත් වන දෙයෙක. නුඹ ජීවත් වුවහොත් අපි ත් සුවසේ ජීවත් වම්හ. අප නො බලා මේ ආහාරය නුඹ ම කැව මැනවැයි" තුන් කොටස ම සිවානන් කැවූහ. සිවානෝ සිස් කයින්[1] බත බොහෝ කොටැ කා දිරවා ගත නොහී අළුයම් වේලෙහි මළහ. මැනියන් හා දුවනියන් හා දෙන්න ම ශොකයෙන් හඬා වැලපැ උදැසන මැනියෝ ශාලාවෙහි හිඳැ දියනියන් සිහා ඇවූහ.

දියනියෝ එදවස් "තොපට කි කොටසක් උවමනා දැ'යි කි කල්හි "දෙකොටසක් ගන්මි" යි ගෙණැ අවුත් තමා ගෙණා දෙකොටස මැනියන් කැවූහ. මැනියෝ ද එසේ ම දිරවාගත නො හී මළහ හෝ තොමෝ හඬා වැලපැ අනික්දා සිහා ගොස් "කි කොටසක් ගන්නදැ"යි කි කල්හි "එක කොටසක් ගන්මි"යි කිව දන් දෙන කෙළෙඹියා ඇ තුන්දා තුන් පරිද්දකින් දන් ගත් නියා හැඳිනැ "පෙරවි දා තුන් කොටසක් ගෙණැ, ඊයේ දෙකොටසක් ගෙණැ, අද එක කොටසක් ගන්නට තිගේ කුසැ පමණ දත්තේ අදසි"[1] කිය. ලජ්ජා සම්පන්න වූ සිටු දියනියෝ පරිහව අසා සමා කොට ගත නොහී "සවාමිනි! මට ම ගත් කොටසෙක් නො වෙයි. මාගේ මැනියන් හා පියානන් හා ඇති දවස් උන්ට ත් එක්ක ගනිමි අද මා හුදකලා නෙයින් මට ම ගන්මි"යි කියා තමා වූ පරිදි කිව.

කෙළෙඹියා එපවත් අසා ශොකයෙන් හඬා වැලපැ සිවානන් ගේ දියනියන් සතහා පියා ගෙට කැඳවා ගෙණැ ගොසින් දූ තනතුරෙහි තැබී ය. හෝ තොමෝ දන්හල අරගල අසා කෙළෙඹි යන්ට 'මේ අරගල සන්සිඳුවා දන්දිය නො හැකි දැ" යි විචාරා "නො පිළිවනැ යි කි කල්හි "මම එක් උපායක් කියමි" යි කියා

---

1 සිස්බනිත් 2. අද දූ යි

මේ දන්ගල එකක්හු වැදූ එකක්හු නැඟී යන පරිද්දෙන් දෙ දෙරක් කරවව. එක් දෙරකින් වත් නැනැත්තහු දන් හැර ගෙණ අනික් දෙරින් නැඟී යන්නට නියව. එසේ කල්හි අරගල නො වෙයි" කිව හේ එසේ කොටැ අරගල සන්සිඳවී ය

සොසඝ සිටානෝ දන්දෙන කුවුඹ්බිකයා තමන් කරා ආ කල්හි "මාගේ දානශාලාවේ අරගල නැත්තේ දන් නැති හෙයින් දූ" සි විචාළහ. ඔහු විසින් භද්‍රවතිය සිටානන්ගේ දියනියන්ගේ පවත් කී කල්හි "එසේ වුව මාගේ ඥාඤුවන්ගේ දුවනියෝ වෙත්දූ" සි ගෙන්වා පන්සියක් පරිවාර සහිත් දී තමන්ට දූ කොටැ වැඩුහ හෝ සාමාවති නමින් ප්‍රසිද්ධ වුව එක් දවසක් නුවර උත්සවයක් කෙළෙනට ඇ සි කියා ඕ පන්සියයක් පරිවාර සහිත් ගෙණ රාජා'ඔසණයෙන් නික්මුනාහ. රජ්ජුරුවෝ පරිවාර සහිත් හා සාමාවතින් දැකැ උපන්නා වූ සෙනහ ඇති වැ "සොසඝ සිටානන්ගේ දියනියෝ" ය යනු අසා සිටානන්ට "තමන්ගේ දියනියන් අපගේ අන්තඃ පුරයට එවන්නේ ය" සි කියා යැවූහ.

සිටානෝ "අපගේ දරුවන්ට රාජ කුලයෙහි විසීමෙන් දුක් වෙයි - එහෙයින් නො දෙමිහ" සි කීහ. රජ්ජුරුවෝ එපවත් අසා කිපී සිටානන්ගේ ගෙහි අස් ඔබ්බා සිටානන් හා ඇඹේනියන් මතු පිටත් කළහ. සාමාවති අවුත් එපවත් අසා රජ්ජුරුවන් කි බස් නො ගිවිස්සේ නපුර. මා හා මාගේ පරිවාර හා රජ්ජුරුවන්ට දුන මැනවැ" සි කීහ. සිටානෝ "නොප ගිවිස්සහොත් කරම්හ"සි ගිවිස්සහ. රජ්ජුරුවන්ට එපවත් කියා යැවූහ. රජ්ජුරුවෝ "යහපතැ"සි සාමාවතින් පරිවාර සහිත් පන්සියයක් දෙනා හා ගෙන්වා සාමාවතින් අභිමෙක කොටැ තමන්ට අගමෙහෙසුන් තැන්හි තුබූහ.

මෙසේ මවු පියන් ආදී සැම දෙනා ම තව කල්හි ද කුසල් ඇත්තවුන් තමන්ගේ කුසලින් ගැළවී සම්පත් ලද පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් "උපන්නා වූ සියලු සත්ත්වයන්ට සියලු සම්පත්තියට ධර්මය මුත් අනික් කාරණයෙක් නැතැ" සි දැනැ මෙම ධර්මය ම රැස්කොටැ සියලු ලොවට රක්ෂා සථාන වූ ධර්මය ම සරණ යෙමි සි **දහම් සරණ යා යුතු.**

6. සොසඝ උතපතති කථා.

මෙසේ සාමාවතීන් හිඳුවූ උදෙන රජ්ජුරුවන්ගේ වාසුලදත්තා නම් අනික් දේවී කෙණෙකුන් ඇත. ඒ දේවී උදෙනි යෙහි වණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවන්ගේ දියනියෝ ය. ඔවුන් උදෙන රජ්ජුරුවන්ට අඹු වූ පරිදි කෙසේද? යත්—

උදෙනියෙහි වණ්ඩප්‍රජ්‍යොත රජ්ජුරුවෝ එක් දවසක් උයන්හි සිටැ එන්නාහු තමන්ගේ සම්පත්තිය බලා "මනුෂ්‍ය ලොකයෙහි අනික් කිසිවක් හට මෙබදු සම්පත්තියෙක් ඇද්දැ" යි කියා විචාරා අමාත්‍යයන් විසින්

7. වාසුලදත්තා උත්පත්ති කථා. 'මේ ත් කවර සම්පත්තියෙක් ද?' කොසඹැ නුවර උදෙනි නම් රජ්ජුරුවන්ගේ සම්පත්තිය මෙයට වඩා ශතසහස්‍ර ගුණයෙන් අධිකය" යි කී කල්හි "එසේ වුවහොත් ඔහු ගන්මි" යි කියා "දේවයිනි! ඔවුන් ගන්ට නො පිළිවන. ඒ රජ්ජුරුවෝ හස්ති ක්‍රාන්ත නම් ශිල්පයක් දනිති මන්ත්‍රය පිරිවහා විණාව ගහා නො කැමැති ඇත් කෙණෙකුන් ලුහුබදවා පියවා පියති කැමැති ඇත් කෙණෙකුන් අල්වා ගණිති.

ඉදින් ඒ රජ්ජුරුවන් සාධන්නා කැමති වූවහොත් දන් ඩෙන් ඇතෙකු ඉදි කොටැ ඒ රජ්ජුරුවන්ට ආසන්න සථාන යෙහි සිටුවුව මැනව. ඒ රජ්ජුරුවෝ හස්ති වාහනයෙක අශ්ව වාහනයෙක නම ඇසුකල දුරට ත් ගොසින් ගණිති. එසේ දුරට ගිය කල්හි ඒ රජ්ජුරුවන් අල්වා ගත හැකැ" යි කිහ. වණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවෝ "මේ යහපත් උපායෙකැ" යි දණ්ඩෙන් ඇතෙකු ඉදිකරවා සිනියම් කරවා ඇතු කුසැ මිනිසුන් සැව දෙනකු සක්මන් කරණ පරිද්දෙන් සලහා රජ්ජුරුවන්ගේ විජිතයට ආසන්න සථානයෙහි හැරැ පුහ හස්ති ලණ්ඩ ද ඒ ඒ සථානයෙහි රැස් කර වූහ. ඉක්බිති එක් වැද්දෙක් ඒ ඇතු දැකැ "මේ ඇත් අපගේ උදෙන රජ්ජුරුවන්ට සුදුසු ය" යි හස්ති හුගේ රූප සම්පත්ති රජ්ජුරුවන්ට ගොස් කී ය. රජ්ජුරුවෝ ඔහු ලවා ම මහ පාවා ගෙණැ ඇතකු තැඟී සහ පිරිවරින් නික්මුනාහ.

වණ්ඩ ප්‍රජ්‍යොතයෝ ද උදෙන රජ්ජුරුවන් නික්මුනු බව අසා තුමූ ම නික්මැ මධ්‍යයෙහි මහ සිස් කොටැ දෙ දිසා වෙහි සෙනහ සිටුවා ලූහ. උදෙන රජ්ජුරුවෝ වණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවන් ආ බව නො දැනැ ඇතු ලුහුබදවා ගත්හ. ඇතු ළෙහි සිටි මනුෂ්‍යයෝ යන්ත්‍රයෙන් ඇතු හැරැ ගෙණැ දුවන් නට පටන් ගත්හ. රජ්ජුරුවෝ මන්ත්‍රය මතුවැ විණාව ගසා ද

ඇතු රඳවා ගත නො හී අසකු නැඟී ඇතු ලුහුබඳවා ගන්ට වන්හ. රජ්ජුරුවන් යුහු වැ දිවගත. සෙනාව පසුව හියහ. එ සමයෙහි දෙපාර්ශ්වයෙහි සිටි වණඬ **ප්‍රජ්‍යොත** **රජ්ජුරුවන්ගේ** සෙනාව **උදෙන** **රජ්ජුරුවන්** මැද්ද කොටැ අල්වා ගෙණ තමන්ගේ රජ්ජුරුවන්ට පාවා දුන්හ.

උදෙන රජ්ජුරුවන්ගේ සෙනාව ද රජ්ජුරුවන් සතුරන්ට හසු වූ බව දුනා එතැන්හි ම කඳවුරු බැඳ උන්හ. **වණඬ ප්‍රජ්‍යොතයෝ** ද උදෙන රජ්ජුරුවන් ජීවග්‍රාහ කොටැ ගන්වා එක් දහ ගෙයෙක් හි ලවා ලා තුන් දවසක් මුළුල්ලෙහි ජයපානය බොන්නට පවන් ගත්හ උදෙන රජ්ජුරුවෝ තුන් වන දවස් "තොපගේ රජ්ජුරුවෝ කුමක් කෙරෙත්ද" යි රැකවල් සිටි පුරුෂයන් විමසා "සතුරු රජ්ජුරුවන් ගත්මී යි මදයෙන් ජය පානය බොති" යනු අසා "තොපගේ රජ්ජුරුවන් කරන්නේ ගැහැණුන් විසිනුත් නො කළමනා දෙයෙක. සතුරන් අල්වා ගත් කලැ මරා හෝ නො පියා හැරැ හෝ උන් දුක් පත් කොටැ හිඳුවා කුමන ජයපානයක් බොන්නේද" යි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ උදෙන රජ්ජුරුවන් හුන් තැනට අවුත් "එසේ කියේ සැබෑදැ" යි විමසා "සැබෑව. මහරජ!" යි කී කල්හි "එසේ වුවහොත් තොප හරිම්හ, තොප දන්නා මන්ත්‍රය අප උගන්වව" යි කිහ. ඒ අසා රජ්ජුරුවෝ "මන්ත්‍රය උගන්නා පරිද්දෙන් උගණුත් හොත් දෙමි. උගන්නා කල වැන්ද මැනවැ" යි කිහ ඒ අසා වණඬ **ප්‍රජ්‍යොත** රජ්ජුරුවෝ "මන්ත්‍රයක් පිණිස මම තොප වදිම් ද? මන්ත්‍රය නො උගන්වත් හොත් රාජාඥ කරවම්" යි කිහ. ඒ අසා උදෙන රජ්ජුරුවෝ **"මාගේ ශරීරයට තොපගේ ආඥාව ලබන බව මුන් සිනට නොවැටෙන්නේ වේද"** යි "කැමැති, ආඥාවක් කරතුත් නො වදනා කෙණෙකුන්ට මන්ත්‍රය නො උගන්වම්" යි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ "මේ මන්ත්‍රය කෙසේ උගණිම්දෝ හෝ" යි සිතා "මේ මන්ත්‍රය අනුන් උගන්නා බව සුදුසු නො වෙයි. මාගේ දියනියන් වාසුලදත්තාවන් උගන්නා ගෙණ උන් අතින් මම උගන්මි" යි සිතා රජ්ජුරුවන්ට "අපගේ ගෙහි කුදක් ඇත. ඇ කඩතුරාවෙන් මුවාවේ සිටුවාලා උගන්වව" යි කිහ. රජ්ජුරුවෝ "කුදක වුව මැනව, පිළෙක වුව මැනව, මා වදනා කෙණෙකුන්ට දෙමි" යි කිහ. ඒ අසා රජ්ජුරුවෝ දියනියන් වාසුලදත්තාවන් හුන් තැනට ගොස් "පුතණඹ! ශ්වෙත කුෂ්ඨ ඇති එකෙක් අනඹී මන්ත්‍රයක් දනී. තෙපි කඩතුරාවෙන් පිටත සිටිව

ඒ මන්ත්‍රය ඉගෙණැ ගණුව" යි කීහ. මෙසේ රජ්ජුරුවෝ ඔවු නොවුන් කෙරෙහි අනුරාගයක් කෙරෙති කියා වළහා කඩතුරා වක් අදවා දියනියන් කඩතුරා මුවායෙහි හිදුවා මන්ත්‍රය උගන්වති.

මෙසේ කිප දවසක් හිය කල්හි **උදෙන රජ්ජුරුවෝ වාසුල දත්තාවන්** මන්ත්‍රය වරදවා කියන්නා හා "දුෂ්ටවූ කුද! තිගේ තොල හා දිවි බොල්වැ ගියේද? දවස් පතා කියවාත් මන්ත්‍රය වරදවා කියනු" යි කීහ ඒ අසා බිසවු කිපී "ශෛත කුෂ්ඨය! කුමක් ද? තා කියන්නේය! අප සේ වූවොත් කුදුන් කෙරෙහි ඇතුළන්නු දැ" යි කඩතුරාව ඔසවා පියා ඔවුනොවුන් බලා ඔවු නොවුන්ගේ සවරූප විවාරා දැනැ "රජ්ජුරුවෝ වළහා කි වන්හ" යි නිශ්චය කොටැ ඔවුනොවුන් කෙරෙහි අනුරාග ඇති වැ ජවනිකාව අතුරෙහි දී ම මවුනොවුන් හා සෘඩ්ගාර රසානුභව කළහ. එතැන් පවත් ගෙණැ මන්ත්‍ර ඉගෙණීම් නම් දෙයෙක් නැති විය.

වණ්ඩ ප්‍රජ්‍යෝත රජ්ජුරුවෝ ද "පුත! මන්ත්‍රය උගතුදැ"යි විවාරා "උගන්මින් සිටියෙමි"යි කී කල්හි "උගන්ව"යි මුවෙන් තො බැණැ හිදිනාහ. එක් දවසක් **උදෙන රජ්ජුරුවෝ වාසුල දත්තාවන්ම** "හද්‍රාව, ගැහැණුන්ට සැමියන් කරණ උපකාර මවු පියෝ ද, කුසෙහි ඔත්තෝ ද, දහස් ගණනුදු කොටැ ගත නොහෙති. ඉදින් මට මාගේ ජීවිතය ගළවා දුනු නම් මාගේ අන්තඃපුර පන්සියයට තොප ප්‍රධාන කොටැ අග මෙහෙසුන් කෙරෙමි යි" කීහ. ඒ අසා බිසවු "මහරජ! මම තොප ගළවමි. තොප වූ කලි තොප කි බස සථිර කරව"යි කියා පියානන් කරා ගොස් වැඳලා සිටියහ.

"මන්ත්‍රය උගණුදැ"යි කී කල්හි "උගන්මි, ඒ මන්ත්‍රයට උප වාර පිණිස තරු සලකුණෙන් ගන්නා එක් ඖෂධයක් ඇත්ල. ඖෂධය හැරැ ගන්නට යන වේලෙහි නැගෙන්නා අසකු දෙවුව මැනව කැමැති දෙරකින් යන වේලෙහි තො වළකන පරිද්දෙනුත් සම්මත කරවා වදුළ මැනවැ"යි කීහ. ඒ අසා රජ්ජුරුවෝ මන්ත්‍ර ලොභයෙන් "යහපතැ"යි කියා ගිවිස්සාහ. රජ්ජුරුවන්ගේ ද එක් දවසකට පණස් යොදනක් තැන් යන්නා වූ **භද්‍රවතී නම් ඇතින්නක**, සැට යොදනක් තැන් යන්නා වූ **ඛාණ නම් දුස යෙක. නෙලඛණ්ඩිය** [1]**මඤ්ඡුකෙසිය** යන අශ්වයෝ දෙදෙ නෙක් යොදුන් සියයක් යන්නාහ. **නාලාගිරි නම් ඇතෙක්** යොදුන් එකසිය විස්සක්[2] යන්නේය මෙසේ පස්වාහනයෙක් ඇති විය.

1. මූඤ්ජ කෙසිය 2. යොදුන් සියයක්

ගෙද රජ්ජුරුවන් හිය ජාතියෙහි වේලා ආසන්න වැ හිය කල්හි පසේ බුදුන් වහන්සේ කෙණෙකුන්දුට බත් පාත්‍රයක් හැරැ ගෙණැ යුහුව දිවැ ගෙණැ හොස් පිළිගැන් වූ කුසලින් ඇති වි ය. ඉක්බිති එක් දවසක් ඒ වණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවෝ උයන් කෙළියට ය"සි නික්මුනාහ. උදෙන රජ්ජුරුවෝ "අද පලා හිය මැනවැ"සි සිතා හද්‍රවතී නම් ඇතින්ත පිටට පැනැ නැගිලා බිසවුනුදු ඇතින්ත පිටැ නහා ගෙණැ සම් පසිම්බියෙහි මසුරන් පුරා එම ඇතින්ත පිටැ නහා ගෙණැ නික්මැ ගත්හ.

වණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවෝ ද එපවත් අසා පස්සෙහි පිරිස් මෙහෙයුන රජ්ජුරුවෝ ද පිරිස් එන්නා දැකැ ඇතින්ත පිටැ තුබූ පසිම්බිය උතා හෙළා පුහ. සෙනාව ධන ලොභයෙන් "රන් ගණුම්හ"සි ගැවිලිය දී රජ්ජුරුවෝ තමන්ගේ සෙනාව හුන් තැනට ගොස් වැද හිඳහ. ඉක්බිති සෙනාව රජ්ජුරුවන් වඩා නුවරට ගෙණැ හියහ. රජ්ජුරුවෝ ද නුවරට වැද තමන් කී පරිද්දෙන් ම වාසුල දන්නාවන් අග මෙහෙසුන් කොටැ රාජ්‍යය කරන්නාහ

මෙසේ කුසල් කළවුන්ට කිසි විපත්තියක් වුව ද ඒ දුරුවත බව ඇසූ සත්පුරුෂයන් විසින් ධර්මය ම සරණ කොටැ සියලු සංසාර ව්‍යසනයෙන් ගැලවෙම්හ සි සිතා ධර්මය ම සරණ යා යුතු.

7. වාසුලදත්තා උතපතති කථා.

---

8. මාගන්දි උතපතති කථා.

තව ද අනික් මාගන්දි නම් එකක් රජ්ජුරුවන් සම්පයෙන් අග මෙහෙසුන් තැන් ලදහ:

හේ කෙසේද? යත්-

හෝ තොමෝ කුරුරට මාගන්දිය නම් බමුණකුගේ දුවක. ඇගේ මවු මාගන්දී නම. පිළි පියෙ ද මාගන්දිය නම. ඒ මාගන්දී නම් බ්‍රාහ්මණී තොමෝ අධික වූ රූප ඇත්තී ය. දිව්‍යාඞ්ගනාවක් සේ මනොහරය. ඇගේ පියේ තමාගේ දුවට සුදුසු සවාමි කෙණෙකුන් නො දක්නේ "බොහෝ ධන ඇති මහා පරිවාර කුලෙන් තමා දුව හිඳුවම්හ"සි වාර්තා කළ ද "තෙපි මාගේ දුවට නුසුදුස්සව සි පරිභව බැණැ යවයි.

මෙසේ කල්හිය කල්හි සතර අපායෙහි අකුලු හෙළැ සදෙව්, ලොවට අගුල් හළ, බඹ ලොවට රජ මහවත් ගැසූ, නිවන් පුරය තමන් වසන විහාරය සේ මුළු ලෝවැස්සන් සුවයෙන් වදනා පරිද්දෙන් කළා වූ පිරිනිවන් පෑ පසු පස්වාදහසක් මුළුල්ලෙහි

තමන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් විසිරී ගියා ධාතු මරහු ඇසැ හුණු දුවාතල සේ, සත්පුරුෂයන් ඇසට කර්පූර සලාක සේ, සංසාර විෂයට අද්ද ගුළිකා සේ, කළා වූ මහා පුරුෂයානන් වහන්සේ ප්‍රතාූෂ කාලයෙහි ම මහා කරුණාසමාපත්තියෙන් තැතී ලොව බලා වදුරණ සේක් මාඝන්දිය නම් බ්‍රාහ්මණයා හා අඹුවට අනාගාමී ඵලයට උපනිශ්‍රය දැකැ තමන් වහන්සේගේ පා සිවුරු තමන් වහන්සේ ම හැරී ගෙණැ මාඝන්දිය බ්‍රාහ්මණයා වන්දි පූජා කරණ තැනට වැඩි සෙයෙක.

බ්‍රාහ්මණ තෙම දිව්‍ය ලොකයෙහි සප්ත රතනමය වූ කල්ප වෘක්ෂයෙකැ පිල්මරා හෙළාහුන් ඉන්ද්‍රනීල මයූරයන් දෙදෙනෙක් සේ නීලකාන්ති තමන්තා වූ විශාල වූ ඇස් දෙකින් හොබතා වූ බුද්ධක්‍රිය මූළුලොවට දැකැ නාසිකා නැමැති ශවණීසතම්භයෙහි තඹා බැඳ වූ ධජ පතාකා දෙකක් සේ තෙවුනා වූ බැම සහළින් යුක්ත වූ රන්ගල් අතලයෙකින් වැටී හුනුවා වූ මහා හැල්ලක් සේ තළල මැදැ වැටී හුනු අනිඛවල වූ ඌණ්ණරෝම ධාතුයෙන් මනොහර වූ ප්‍රවාල සාගරයෙහි රළින් වැසෙන සඳ මඬලක් සේ රත් වූ අධර කාන්තින් වැසි වැසි නිබෙන්තා වූ ශ්‍රී මුඛයෙන් සියලු ලෝවැස්සන් ගේ නෙත් සිත් බඳනා වූ මුහුණෙකින් හොබතා වූ පෙරෙවි රත් සිවුරු විදුගෙණැ දුවන්තාවූ සඛණී වණ් වූ රශ්මින් බැලූ බැලූවන් ඇසැ අමා නමන්තා වූ බුදුරුව දැකැ මේ පුරුෂ රත්නය හා සම පුරුෂයෙක් නැත.

මොහු සිප ගෙණැ විදඟ මධුර ක්‍රීඩාවෙන් රාත්‍රිය ගැවූ ගැහණිය ගැහණිය නම. මෝ ඟට මාගේ දුව දෙමි"යි සිතා "බුදුන් වහන්සේ කරා එළඹැ මහණ! මාගේ එක දුවක් ඇත. ඇ මම සුදුසු සැමි කෙණෙක් නැති හෙයින් මෙතෙක් කල් ගෙහි ලා රක්‍ෂා කොටැ ගෙණැ හුන්මි. දැන් තොපගේ රුව දුටු නියාවට ඕ තොපට සුදුස්සී ය තෙපි ඇට සුදුස්සව. මම ඇ තොපට පාදපරිචාරිකා කොටැ දෙමි. මා ඇ කැඳවා ගෙණැ එනතුරු මෙතැන්හි ම සිටුව"යි කියා දිවැ දිවැ ගෙට ගොසින් තමාගේ අඹුවට "බ්‍රාහ්මණියෙ! තව කුමක් කොටැ හුන්නෙහි ද? තිගේ දුවට සුදුසු සමණන් කෙණෙකුන් දැකැ මහ සිටුවා ලා ආම්. තිගේ දුව සරසා ගෙණැ වෙලෙව්ව එයි" කියා දුව හා අඹුව කැඳවා ගෙණැ නික්මින.

බමුණු නික්මෙන්නාහා ම සියලු නුවර වැස්සෝ මේ බමුණු පෙරැ අහු - මහඛ - ඣාගි - ඣොශල - වජ්ජී - මල්ලාදී වූ සියලු දෙසෙහි බොහෝ උත්තම පුරුෂයන් "තමා දුව හිඳුවම්හ" යි කී කල උන්ගේ රූප වූ නියා අසා "මාගේ දුවට තෙපි නුසුදුස්සහ" යි

කියා විවාහ නො කොටැ "අද තෙමේ ම මාගේ දුවට සුදුසු සමණ කෙණෙකුන් දිවිම්" යි දුව කැඳවා ගෙණ එයි. ඒ කෙබඳු පුරුෂ රත්නයෙක් දෝහෝ යි බැලුව මැනවැ යි පස්සෙහි හුන්හ. එ සමයෙහි සම්මාසම්බුදුවෝ ඌ සිටුවාලා ගිය තැනැ නො සිටැ එ තැන්හි ශ්‍රීපාදය ඔබාලා ඒ පියවර පැණෙන පරිද්දෙන් අධිෂ්ඨාන කොටලා ඔබ්බෙහි වැඩසිටි සෙයෙක.

බුදුන් "පියවර එබූ තැන පැනෙව" යි කියා අධිෂ්ඨාන කළ ගොත් මුත් නො පෙනෙයි "මෙතෙක් දෙනා ම පෙනෙව" යි කියා අධිෂ්ඨාන කළ කලැ ඔවුන්ට මුත් සෙස්සවුන්ට ජාත්‍යන්ධයන්ට චන්ද්‍ර මණ්ඩල සූර්‍ය්‍ය මණ්ඩල නො පැනෙන්නා සේ නො පැනෙ යි. 'මෙතෙක් කල් තිබෙව' යි අධිෂ්ඨාන කළ කලැ සතර මහාදිව එක හෙළා මහවැසි වැසැ වතුර හෙළා තමුදු කෙසඟක් හා තැනකට උපද්‍රවයක් නො වෙයි. මහමෙර උදුරා පියන වෙරළ්ඛ වාතයෙනුදු ඒ පියවර එබූ තැන්හි ලෙහෙඩිත්තක සා ධූලි සුනිත්තකුදු නො සෙල්වෙයි.

ඉක්බිති බැමිණිය බමුණාට "තොප දුටු තැනැත්තෝ කොයි දැ" යි විවාළාහ. බමුණු "මෙ තැන්හි ම හිටුවාලා ගියෙමි. දැන් ඔහු එහි නැතැ" යි කියා වැඩැ සිටි තැන බලන්නේ ඔබාලා වැඩි පදලස්සකැ "මේ උන් ඔබාලා ගිය පියවරය" යි සම්මාසම්බුදුවන්ගේ පියවර පෑ ය. බැමිණි පියවර බලා පියා තමා වෙදත්‍රයෙහි ප්‍රාප්ත හෙයින් හා ලක්ඛණ මන්ත්‍ර දන්නා හෙයින් හා පියවර ලකුණු බලා "බමුණ! තෝ කුමක් කියයි ද? මේ ගැණුන්ගේ තත නැමැති මස් ගඩුයෙහි තමන්ගේ ලැම්බිය පහරවා අපවිත්‍ර කරණ කෙණෙකුන් එබූ පිය වරෙක් නොවෙයි. මෙ දෙනිස් කුණප කොටසෙකින් යුකතාවූ ගැහැණියක බොල් කෙල පිරුණු මුඛයෙහි තමන්ගේ මුඛය තබා කාමා'තුරවැ වෙහෙසෙන කෙණෙකුන්ගේ පියවරෙක් නො වෙයි.

අභිමත වූ ගැහැණියක කි සලකුණට නො අවුත් ඇ හිස තුබූ මල්දමින් පිටිතොල හසා බැඳුම් කා රාත්‍රිය මුළුල්ල සතාද බරින් සිස් කරණ කෙණෙකුන්ගේ පියවරෙක් නො වෙයි තමාට දුර්ලභ වූ ගැහැණියක නො ලදින් කාලා'නන්තරයෙකින් ඇ පියවර එබූ බිමක් ලදින් ඒ බිම රජස් හිස එව ගෙණැ සඕඛ්‍යය ඒ බිම ගසා පෙරළෙන එකක්හුගේ පියවරෙක් නො වෙයි. හැම පියවර ඇත් පියවර හෙත් ම මැකෙන්නා සේ සදෙව සමාරක සබ්‍රහ්මක ලොව තමන් පයින් යට කොටැ පි කෙණෙකුන්ගේ පියවරෙක. රාගයට දුරු වූ, වෙෂයට විෂ වූ, මොහයට අදෘශ්‍යා'සඳෘත ගැහූ ධර්මයට කල්‍යාණ

මිත්‍ර වූ පාපයට ද්‍රෝහී වූ, බුදුසිරිය සහාය වූ, මෛත්‍රියට සවාමි වූ, කරුණාවට කුල දෙවත වූ, නිවණට වමත් දකුණත් හඟවා මහ කියන ධර්මයට අග රජ කරණ අනන්තා'පරිමාණ සක්වළ විෂය ක්ෂේත්‍ර කොටැ ඇති කෙළ ලක්ෂයක් සක්වළ ආඥා ක්ෂේත්‍ර කොටැ ඇති දස දහසක් සක්වළ ජනාම ක්ෂේත්‍ර කොටැ ඇති ධර්ම චක්‍රවර්ති කෙණෙකුන්ගේ පියවරෙකැ'' යි කිව.

ඒ අසා බමුණා ''බැමිණියි! තෝ පයැ ඔත් දියෙහි කිඹුලුන් ගන්නා එකක් හිද? එසේ වූ රුවක් ඇති කෙණෙක් නම් පඤ්ච කාම තබා පියා තපස් කෙරෙත් දැ''යි කිය බැමිණි ''තෝ කුමක් කියයි ද? **මහා පුරුෂයා** මෛත්‍රිය – කරුණාය – මුදිතාය – උපෙක්ෂාය යන අඹුවන් සතර දෙනා හැර පස්වන අඹුවක හිදුවන එකෙක් නො වෙයි'' කිව. බමුණු ඒ අසා ඇත් මැත් බලනුයේ ඇලවැ ලා මුළු ලොව අළලා සලාගත් අමා පිඩක් සේ වැඩැ සිටි බුදුන් වහන්සේ දැකැ ''අර! මූය, මා කී තැනක් තෝ ය''යි ගොස් ''තොපව අඹුකමට මදුව ගෙණා මි''යි කිය.

සම්මිදරූවෝ එබස් අසා ''තාගේ දුව විසින් අපට ප්‍රයෝජන යෙක් නැත – ඇත – යන දෙක ම නො වදරා ''බමුණ! තට එකක් කියම්හ සඳ තැගෙණ සාගරයට දැනි මොහොරුන් ගෙන් භයක් නො වන්නා සේ **සයොධරාවන්** වැනි අඹුවක් හා **කිඹුල්වන්** නුවරට සසරෙහි කළකිරී හසින් නො වනුම්න. හසත්‍ර ප්‍රාප්ත වූ චක්‍රවර්ති රාජ්‍යය හැර පියා සතළිස් දහසක් අඹුවන් හුන් රාජ්‍ය යෙන් මධ්‍යම රාත්‍රියෙහි අසකු නැගී ගෙණැ දිවන්නමු[1] සැපින් නක්හු හොත් සුඛසෙක ලොභ නො කොටැ දිවන්නා සේ දිවුම්හ. සහවුරුද්දක් අප පස්සෙහි ඡායාවක් සේ ඇවිදින මරහු අප ගේ කාම චිතකිය කුදු සොයා ගත නො හීයමැ යි කියා ''කැහැල මල් රැකැ ගෙණැ හුන් කැණහිලකු සේ සිටැ වෙහෙස වැ නැගී පියා ගියේ.

සහවුරුද්දක් මහා වීර්‍ය්‍ය කොටැ අනන්තයෙහි **චක්‍රාඝනායට** නැගී මාර පරාජය කොටැ වා පොළොවෙහි පවන් අකණිටා බඹ ලොව දක්වා දසදහසක් සක්වළ මදයෙන් සලන්නා වූ ඇතක්හු පිටට නැගී රා බී මත් ආරොහකයකු සේ සලා පියා **බුදුවුම්හ.** අනන්තයෙහි පියාට වූ පරිභව පසිදු වම්හ යි කියා ආවා වූ මරහු ගේ දූ වූ **තෘෂ්ණාය, අරතිය, රගාය** යන දිව්‍ය සත්‍රීන් තුන් දෙනාගේ එවෙනි තුන් මුහුණට අනිත්‍යය – දුඃඛය – අනාත්මය, යන තුන් ලකුණු ම යෙදූ බව මුත් රාගයක් නො යෙදූ වම්හ. ඇසක් බලා ලොභ කරන්නමෝ නම් මුළු ලෝ වැස්සා ගේ සිත් තමා කරා වදනට අඩවාලු කොටැ තුබූ ඉදුනිල් මිණි කවුලු සේ ඒ ඇසෙහි ලොභ නො කරමෝ ද?

---

1. දිවන්නමෝ.

බැමයෙක ලොභ කරමෝ නම් නිලිපුල් මල්හි මිහි බී මත් වැ රොද බැඳැ ගෙණැ හොත්තා වූ බමර වැල දෙකක් සේ ඒ ඇස ඇලයෙහි චිත්‍ර චිත්‍යාසයෙන් තුබූ බැම සහලෙහි ලොභ නො කර මෝ ද? කන් වැලෙක්හි ලොභ කරමෝ නම් එය වසවත්තී මාරයා මුළු ලොව බඳන්නට හෙළැ කඳක පාස දෙකක් බඳු වූ එකන් වැලැ ලොභ නො කරමෝ ද? අධරයෙක්හි ලොභ කරමෝ නම් ඒ රූප තැමැති සාගරයෙහි ලසඳ වැ හටහත්තා වූ පබළු දලුවක් බඳු වූ ඒ අධරයෙහි ලොභ නො කරමෝ ද?

සවෙනි දිව්‍ය ලෝකයෙහි මාර සත්‍රින් මවන රුවක් වුව. ඒ ත් අප වැනි කෙණෙකුන් බඳන්නට යැ සි මවන රුවක් වුව. එබඳු වූ වලැ, එබඳු වූ රහසැ, එබඳු වූ රැයෙකැ එබඳු ලසඳ පහනෙක. ඔවුන් දැකැ අමු සොහොණට දමා ලූ මිනීකුණු තුණක් කොවැ සිතා අවුත් දැන් තාගේ දුවය සි කී අශුචි හා මූත්‍ර පිරු බදුතෙහි ලොභ කරමෝ ද? ඒ එසේ වූ කුණක් සිප ගන්නා තබා අප පය පහරුත් කැන ඇත්තම්හ"යි වදාළ සෙයෙක.

බණ වදාරත් වදාරත් බමුණා හා අඹුව හා දෙන්න **අනාගාමී** වූහ. බමුණා ගේ දූ බුදුන් වදාරණ බස් අසා "නො කැමැති කල නො හින්දවම් සි නො කියා **අපිස්කම්** පානේ අප වැන්නන්ට ද? අසුචි බදනක් කොවැ බෙණෙත් ද? මට සුදුසු සැමියකු කෙරේ හුන බිණු පරිභවයට සුදුසු වෛර පහ කොවැ ගන්නෙම් වේදැ"යි **සඞ්ඝාමිදෘවන්** කෙරෙහි වෛර බඳ. මවු පිය දෙදෙන ඇ ගෙණැ ගොසින් සුළු පියාට පාවා දී බුදු සස්නට වැදූ මහණ වැ **රහන්වූහ.** සිලිපියේ[1] මැ **කොසඹෑ** නුවරට ගෙණැ ගොසින් **උදෙන රජ්ජුරු** වන්ට පාවා දින. **උදෙන රජ්ජුරුවෝ ද** මැ ගේ රූප සම්පත්ති බලා උපන්නා වූ සෙනහයෙන් අභිෂෙක කොවැ පන්සියක් ගැහණුන් පරිවාර කොවැ දී අග මෙහෙසුන් තැනැ තිබී ය.

එසමයෙහි **කොසඹ** සිටාතෝ ය - **කුක්කුට** සිටාතෝ ය - **පාවාරිය** සිටාතෝය යි **කොසඹෑ** නුවර සිටුවරු තුන්දෙනෙක් ඇත. ඔහු වස් වසන කල ආසන්නා වූ කල්හි පන්සියක් තාපස යන් හිමාලය වනයෙන් බැසැ නුවර පිඹු සිඟා ඇවිදින්නවුන් දැකැ පැහදූ වළඳවා සාරමස වස් වස්වා වස් අනතයෙහි නැවත වස් වසන සමයෙහි එන පිණිස ප්‍රතිඥ කරවා නඟා යැවූහ එතැන් පටන් අටමසක් හිමාලයයෙහි වැසැ සාරමසක් ඔවුන් සමීපයෙහි වෙසෙති.

---

1. සුළු පියේ.

ඔහු එසේ කල්‍යාමකින් හිමාලයයෙහි එන්නාහු අතර මහ මහනුග ගසක් මූල හුන්හ. එහි වැඩි මහළු තාපසයෝ "මේ සා නුගගස මහෙශාක්‍ය දෙවතාවකු වුව මැනවැ යි - ඔහු අප වළඳන පැනක් දුනහොත් යහපතැ" යි සිතූහ. දෙවතාවා තාපසවරුන් පැන් වැළඳ වී ය. නැවත "නහන පැන් දුනහොත් යහපතැ" සි සිතූහ දෙවතාව නහන පැනුදු එළවී ය. ඉක්බිති "වළඳන ආහාරයක් දුනහොත් යහපතැ"යි සිතූහ. දෙවතාවා ආහාර එළවිය ඉක්බිති තාපසයෝ "මේ දෙවතාවා අප සිතූ යමක් ම දෙයි - ඔහු දුටුමෝ නම් යහපතැ" යි සිතූහ.

ඉක්බිති වෘක්ෂ දෙවතාවා ගස කඳ පළා ගෙණැ තමාගේ දිව්‍ය වෙශය දැක්වී ය. තාපසයෝ "තාගේ සම්පත්තිය ඉතා ම යහපත. කවර කුශලයක් කෙළෙහිදැ" යි විවාළහ හෙතෙම තමා කළ කුසල් මදහෙයින් කියන්නට මැලි මැලි වැ නැවත නැවත තාපසයන් විවාළ කල්හි "ශ්‍රිය ජාතියෙහි අනේපිඬු මහාසිටානන්ට ගැති වැ එකරාත්‍රයක් වූ පෙහෙයෙන් මියැ අඩාල පෙහෙයෙහි අනුසසින් තමා වෘක්ෂ දෙවතා වැ උපන් බව කියා මා වහල් වූ අනේපිඬු මහ සිටානෝ බුද්ධරත්නය - ධර්මරත්නය - සඞ්ඝරත්නය යන තුණුරුවන්හි මම්පස්ව ඇත්තාහ"යි කිය.

තාපසවරු එබස් අසා පෙරැ බුදුන් වහන්සේ ලොකයෙහි උපන් බව නො දනැ දුන් දෙවතාවා අතින් තුණුරුවන් කම් අසා රත්නත්‍රයයෙහි භක්තීන් හා ප්‍රීතීන් හා ප්‍රසාදයෙන් හා පිරී ගියා වූ සිත් ඇති වැ හැමදෙන ම දෙහොත් මුදුනෙහි තබා ගෙණැ නැගී සිටැ දෙවතාව! "තුණුරුවන් කවෙක් ද තා කියන්නේ" ය සි කියා තුන්වටෙක්හි ම දෙවතාවා එසේ ය" සි කී කල්හි බුද්ධය යන ශබ්දය පොවා දුර්ලභය, එසේවූවන්ගේ දැක්මෙන බස් ඇසිමෙනැයි කිකල ඒ අති දුර්ලභය. එහෙයින් ඒ සම්මාදරුවානන් වැඩ හුන් තැනට යම්හ යන්නමෝ ද අපට බොහෝ උපකාර කළ සිටුවරුන් තුන්දෙනාගේ ගෙට වැදූ ආහාර වළඳ ගෙණැ යම්හ"යි කියා ඔවුන් කරා වැදූ ආහාර වළඳ "අපි යම්හ"යි කියා වස් වසන කල වුව කෙදුට වඩනේ" යයි සිටුවරුන් කී කල්හි "තුණුරුවන් ලොකයෙහි පහළවී ය. ඔබ යම්හි"යි කිහ.

"එසේ වුවහොත් ඇපි ත් කටයුතු කොටැ ගෙණැ එම්හ"යි කී කල්හි "තොප කටයුතු කරණ කලින් අපට කල්යෙයි තෙපි තොප කළමනා කටයුතු කොටැ ගෙණැ පසු වැ එවු. අපි පළමු ගොස් අපගේ සම්මාදරුවන් දකුම්හ"යි පළමු කොටැ ගොස්

සම්බුදුන් වහන්සේ දැක්ක මහා ප්‍රසාදයෙන් සතුනි කොටැ කන් නිවා, සිත් නිවා. බණ අසා හුනස්නෙහි ම හිඳැ සිවු පිළිසිඹියා පත් රහත් වැ එහි භික්ෂුභාවයෙන් මහණ වැ බුදුසසුනය බබුලුවා විසූ සෙයෙක.

මෙසේ ශ්‍රද්ධාසම්පන්න වූ මහා පුරුෂයන් තණ හුණු කෙණෙහි ම අමාමහනිවන් සාධා දෙන්නා වූ ධම්මරත්නය සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

9. කාපඝ කථා.

ඉක්බිති කොසඹැ නුවර සිටුවරු තුන්දෙන ද පන්සියක් පන්සියක් ගැලින් තොයෙක් දෑතොග්පකරණ තහා ගෙණැ සැවැත් නුවරට අවුත් සඞ්ඝාමිදරුවන්ගේ

10. මාඝණ්ඩි - සාමාවතී කථා. ශ්‍රීපාද දැක මධුර වූ ධම් කථා අසා තුන්දෙන ම සෝවන් ඵල යෙහි පිහිටා අසීමාසයක් දන් දී සම්බුදුන් වහන්සේ කොසඹැ නුවරට වඩනට ආරාධනා කොටැ සඞ්ඝාමිදරුවන් විසින් "සම්බුදු යෝ ශූන්‍යාගාරයෙහි ඇලෙති" යි වදාළ කල්හි "සඞ්ඝාමිනි! වදාළ අභිප්‍රාය හැඟිණ. වඩනට ආරාධනා කොටැ එවූ කල වැඩිය මැනවැ" යි සැල කොටැ කොසඹැ නුවරට ගොස් කොසඹ සිටානෝ කොසම්බාරාමය කැරැවූහ. කුක්කුට සිටානෝ කුක්කුටාරාමය කැරැවූහ. පාවාරිය සිටානෝ පාවාරියාරාමය කැරැවූහ.

මෙසේ තුන්දෙන තුන් විහාරයක් කරවා සඞ්ඝාමිදරුවන් වඩනට හසුන් යැවූහ. සඞ්ඝාමිදරුවෝ ද සත්ව කරුණායෙන් සැවැත් නුවර සිටැ කොසඹැ නුවරට වැඩි සෙයෙක.

ඉක්බිති සිටුවරු තුන්දෙන ම බුදුන් වැඩි පවත් අසා මහා පූජා කෙරෙමින් පෙර ගමන් කොටැ විහාරයට වඩා ගෙණැ ගොස් මුරයෙන් මුරයෙහි සඞ්ඝාමිදරුවන්ට උපස්ථාන කෙරෙති. සත්ත්ව කරුණායෙන් තෙත් වූ ලය ඇති සඞ්ඝාමිදරුවෝ එකෙකි දවස් එකෙකි දෙනාගේ විහාරයෙහි වඩින සෙයෙක.

මෙසේ කල් යන කල්හි ඒ සිටුවරුන් තුන්දෙනා නිසා වසන්නා වූ සුමන නම් මාලාකාරයෙක් සිටුවරුන් කරා එළඹැ "සවාමිනි! මම බොහෝ කලක් තුඹ තුන්දෙනා වහන්සේට උප සථාන කොටැ සිටියෙමි මට ඊට සුදුසු අතික් ප්‍රත්‍යුපකාරයෙක් නොකළ මැනව. එක් දවසක් වළඳන පරිද්දෙන් බුදුන් වහන්සේ මට ගළ මැනවැ"යි කීය. සිටුවරහු ඔහුගේ බස් ගිවිස්සහ.

හෙතෙම සම්බුදුන් වහන්සේ පවරා දැනොප'කරණ සැප වී ය. එ සමයෙහි උදෙනි රජ්ජුරුවෝ දවස් පතා සාමාවතින් පලදිනට මල් ගන්නා පිණිස අට මස්සක් තබා දෙන්නාහ. ඒ රන් ගෙණැ සාමාවතින්ගේ බුද්ධුත්තරා නම් මිඹියක් දවස් පතා මල් ගෙණවුත් සාමාවතින්ට දෙයි.

එ දවසැ සුමන මාලාකාර තෙම සාමාවතින් කෙරෙහි සිටැ මල් ගන්නට ආවා වූ බුද්ධුත්තරාව දැකැ "අද මම් ගෞතම බොන්දුයෙහි උපන් සම්බුදුන් වහන්සේ දන් දී වැළඳු අනන යෙහි සුවඳ මලින් සම්බුදුන් වහන්සේට පූජා කෙරෙමි. තෝ සිටැ වළඳවන තැනැ කවයුතු කොටැ ඉතිරි මලක් ඇත අනන යෙහි ගෙණැ යා" යි කිය.

හෝ තොමෝ එබස් අසා ගිවිස්සාහ. සුමන මාලාකාර තෙම බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේ වළඳවා අනුමෙවෙනි බණ වදරණ පිණිස පාත්‍රය ගෙණැ සිටියේ. ඒ වේලෙහි ධම්ම චක්‍රවර්ති වූ සම්බුදුරුවන් වහන්සේ මධුර සවරයෙන් නානා නය මනොහර වූ ධම්දෙශනා කරන්නට පටන් ගෙණැ වදළ සෙයෙක.

බුද්ධුත්තරා තොමෝ බණ අසා සිටිවිට ම දහසක් නයින් හෙබියා වූ සෝවාන් ඵලයෙහි පිහිටා අමා මහ නිවන්රස විඳැ සෙසු දවස් අටමස්සෙන් සතර මස්සක් සඟවා ගෙණැ සතර මස්සෙක මල් ගෙණැ ගන්නී. එ දවස් සොරසින් සහ මුල් වැ උපුළ හෙයින් අටමස්සෙහි ම මල් ගෙණැ ගියා.

සාමාවති මල් බොහෝ වා දැකැ "හැයි? දෙවගෝ අපට මල් මිළ බොහෝ කොටැ දුන්නුදු" යි විචාළා. ඉක්බිති බුද්ධුත්-තරා තොම "සුවාමි දියනි! මම මෙතෙක් දවස් මලට ගෙණැ යන අට මස්සෙන් සතර මස්සක් සොරා ඇරැගෙණැ සතර මස්සෙක මල් ගෙණෙමි.

අද මා මල් ගෙණෙන්නට ගිය මාලාකාරීන්ගේ ගෙයි පන්සියක් පරිවාර හැරැ ගෙණ වැළඳූ රන්වන් සුවාමිදරුවාන කෙණෙක් තුන් ලොවට එකගෙළා පලදවාලූ තිලකයක් වැන්නහ. මුළුලෝ වැස්සන් එක් වැ එක්කෙණෙකුන් බැලූ කෙණෙක් අනික් කෙණෙකුන් නො බලා දිවි පමණින් බලතෝතිනිදු බලා නිමවා පිය නොහැකි රූ ඇත්තාහ.

එක් ලඟෙ අට සැට දහසක් ගොදුන් මහමෙර මුරුන මල් කැලයෙකින් වසාලූවා සේ එවැනි රන්වන් ශරීරය රත් සිවුරෙකින් වසා පෙරවැගත්හ.

පබළු සයුරෙහි ඉඳුනිල මණි [illegible] සිවුරු හස්සෙන් මිණි නිල්වන් පාතු [illegible] බෙණෙති. රුහැණි රුහැණි වැ නො [illegible] නො බෙණෙති. අහර ගෙණෙන්නට [illegible] බලති. පාත්‍රයෙන් පිටත ඇස නො හෙළති. [illegible] යන බමුණන් ලාලා ලූ මාළුවට, ලාලා ලූ [illegible] වාරු සේ බත් මාලුවෙහි කරණ වණිතා නැත්තාහු.

අතින් හැරුගත් පිඬින් එක හුලකුත් පාත්‍රයාහි [illegible] පිඬ කෙරෙති. ශ්‍රීමුඛය පිවින් එක හුලකුදු පිවත් [illegible] නො හෙළති. දෙ තොලෙහි ඇලෙන දෙයෙක. දෙ තොලින් පිවත් වන දෙයෙක. දත ඇලී ගන්නා දෙයෙක යන නම් නැත. කිඳා වළඳූ. වැළඳූ පාත්‍රය තුමූ ම සෝධා. වැළඳූ ඉක්බිත්තෙහි බණකාව පවත් ගත්හ.

මෙලොවින් පරලොවින් නො පැ දෙයෙක් නැත. ව්‍යවහාර යෙන් පරමාර්ථයෙන් වැළඳූ දෙයෙක් නැත. මී පුයෙන් අව කෙණෙක් සේ එගෙට වනු වනුවෝ ධර්ම රසයෙන් මන් වැ නව මින් සිටියහ. කිරි බොන බාලයෝ වතුභේදයෙහි පාරප්‍රාප්තයක් සේ අර්ථ රස විදිමින් හොත්හ. එ ගෙයි මියන් කැරපියන් මැස්සක් කිහිබි කුහුඹුවන් දක්වා හැම ඔවුන් ම රස දන්නා බණ පිරිස් වැ ගියහ.

මම ද ඔවුන්ගේ බණ අසා අමා මහ නිවන් රස වැළඳිමි. පණිවායට අහස් පොළෝ සේ දුරුවිමි. මාගේ දිවි මා ම හැරි ගන්නට නො සිතන්නා සේ අනුන් සතු වසතුවක් හැරි ගන්නට නො සිතන්නවුන් කෙරෙහි ඇතුළත්විමි. මේ සංසාර ඛසර පසිඳ මුසවාවට වස දී ලිමි. සුරාපානයට මාගේ මුඛය අදෘශ්‍ය කෙළෙමි. පෙර කළ සොරකමට ක්ෂමාකළ මැනව. අද අටමස්සෙහි ම මල් නො වළහා ගෙණාමි" යි කිව. ඒ අසා සාමාවතී ප්‍රිතීන් පිතා ගොස් "පුත! නී යූ අමෘත මහා නිර්වාණ රස අප විසිනුත් පිය හැකිදූ" යි කිව.

ඒ අසා බුද්ධාන්තිකරාවෝ— "එසේ ය. ඒ පිය හැක්කැ" යි කියා සොළොස් කළයක් සුවඳ පැනින් නහා එක් සුදක් හැඳ එක් සුදක් පෙර වැ පැනැ වූ ධර්මාසනයෙහි හිඳ ගෙණැ විජිතිපත්‍ර යක් අතින් අල්වා ගෙණැ පන්සියක් ගැණුන් හා පරිවාර සත්‍රීන් හා සමාවතීන් හා කැඳවා සම්බුදුගුණ වහන්සේ වදුළ පරිද්දෙන් ම බණ කිහ.

ඒ බණ අසමින් ම පන්සියක් දෙනා හා සාමාවතීන් හා හුකස්තෙහි ම හිඳ සෝවාන් වැ බ්‍රාහ්මණතරාවන් වැඳ ගෙණ හෙවැ 'මෙබඳු නිවන් රසයක් දුන්නා වූ තෙපි අද පටන් ගෙණ අපගේ මැනියව! පිටතට ගොස් දවස් පතා වදුල බණ අසා ගෙණ අපව කියව" යි කිහ. බ්‍රාහ්මණතරාවෝ එලෙසින් ම බණ ඉගෙණ පිටකත්‍රය ධරවූහ.[1] ඉක්බිති **සවීඥයන් වහන්සේ** "බහුශ්‍රැත වූ උපාසිකාවන් අතුරෙහි බ්‍රාහ්මණතරාවෝ අධිකයහ" යි **එතදග්‍රස්ථානයෙහි** තබා වදුල සෙයෙක.

මෙසේ බුදු තුඩින් ඇසුව ද, ඒ තුඩින් ඇසුවන් අතින් ඇසුව ද, කවර ලෙසකිනුදු **අමාමහ නිවන්** තොවරදවා සාදු දෙන්නා වූ ධර්මරත්නය **සරණ** යෙමි යි **දහම් සරණ යා යුතු.**

ඉක්බිති ඒ පන්සියයක් සත්‍රිහු බ්‍රාහ්මණතරාවන්ට "අම්ම! ඇපි **සවීඥයන් වහන්සේ** දක්නා කැමැත්තම්හ. ගඤ්ඣ මාලාදීන් පූජා කරණු කැමැත්තම්හ. **සවීඥයන් වහන්සේ** අප දක්වව" යි කිහ. ඒ ඇසූ **බ්‍රාහ්මණතරාවෝ** "ආර්‍යාවෙනි! රජගෙය **නම්** ඉතා බැරිය— තොප ගෙණ පිවිතට යන්නට නො පිළිවනැ" යි කිහ.

ඒ අසා **සාමාවතීන්** ඇතුළු වූ පන්සියයක් දෙන "අම්ම! අපගේ **සවීඥයන්** නො දැක්මෙන් අපගේ ජීවිතය නිෂ්ඵල නො කරව **සවීඥයන් වහන්සේ** දක්වව" යි කිහ. ඒ අසා බ්‍රාහ්මණතරාවෝ 'එසේ වුවහොත් තොප වසන්නා වූ ගබඩාවෙහි බිත්ති දෙදෙනෙකු නො බලන පරිද්දෙන් ඡිද්‍ර කොටැ තබා ගෙණ ගඳ දුම් මල් පහන් ආදී රැස් කොටැ ගෙණ සිටැ **සවීඥයන් වහන්සේ** සිටුවරුන් තුන්දෙනාගේ ගෙට වඩනා වේලෙහි දැකැ වැඳ පුදව" යි කිහ.

ඔහු එසේ කොටැ වඩනා වූ සවීඥයන් වහන්සේ දැකැ වැඳ පිදූහ. **මාගන්දි තොමෝ** තමාගේ ප්‍රාසාදයෙන් නික්මැ මොවුන් ගේ ප්‍රාසාදයට අවුත් වෙන වෙන ගබඩාවෙහි තුබූ සිදුරු දැකැ "මේ කිමෙක්දැ" යි විචාරා සවීඥයන් කෙරෙහි ඇ වෛර බඳ බව නො දන්නා වූ ඔවුන් විසින් **සවීඥයන් වහන්සේ** දැකැ වැඳ පුදන පිණිස කළ ඡිද්‍රයැ" යි කී කල්හි මාගේ සතුරු වූ **ශ්‍රමණ ගෞතමයෝ** මෙයට ආ වන්හ.

දැන් ඔවුන්ට හා ඔවුන්ට උපස්ථාන කරන්නා වූ මේ **පන්සියයක්** දෙනාට හා කවයුතු දන්මි" යි සිතා රජ්ජුරුවන් කරා එළඹ "මහරජ! සාමාවතීන් ප්‍රධාන කොටැ ඇති **පන්සියයක්**

1. දුරි වූන.

දෙන පිටත අනාචාරයක් ඇත්තාහ. දෙතුන් දවසකින් තොප දිවි නැතැ''යි කියා රජ්ජුරුවන් නො අදහන කල්හි ''මාගේ බස් නො අද හු නම් ගොසින් උන් වසන්නා වූ ගබඩා පරීක්ෂා කරව''යි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ ඔවුන් වසන්නා වූ ගබඩාවලට ගොසින් ගබඩාවෙක පාසා සිදුරු දැකැ ''මේ කුමක්දැ'' යි විචාරා එපවත් කී කල්හි සිදුරු හස්ස සියලු ගබඩාවෙහි ම උසින් ජාලා කවුළු ලැවූහ. එසමයෙහි **මාඝඤි තොමෝ** ඔවුන්ට කිසිවක් කරන්නට අසමර්ථ වැ ''ඔවුන්ට මා කිසිවක් කොවැ ගත නොහෙතු ත් ශ්‍රමණ ගෞතමයන්ට ම කවයුත්තක් කෙරෙමි'' යි නුවර වැස්සන්ට අත්ලස් දී ''ශ්‍රමණ ගෞතමයන් සිහාවන් කල්හි හැම තොප තොපගේ ගැති මිඬියන් හැර ගෙණැ පරිහව බැණැ ලුහු බඳවා පියව''යි කිව.

ඒ අසා රත්නත්‍රයයෙහි ප්‍රසාද නැති මනුෂ්‍යයෝ සිහා වැඩී **ඣාමිදරුවන්ට** පරිහව බණන්නට පටන් ගත්හ. ඒ අසා **අනඳ** මහ තෙරුන් වහන්සේ ''ස්වාමීනි! මේ නුවර වැස්සෝ ඉතා **රත්නත්‍රයයෙහි** ප්‍රසාද නැති වැ පරිහව බෙණෙති. මේ නුවර හැර අනික් නුවරකට යම්හ'' යි දැන් වූ සෙයෙක.

ඒ අසා **සර්ඥයන් වහන්සේ** ''ආනන්දය! අප හිය ඒ නුවර වැස්සොත් පරිහව බෙණෙත් නම් අනික් කොයි යමෝ ද? යම් තැනෙක්හි අධිකරණයෙක් උපන් නම් ඒ සන්හිදී හිය කලැ අනික් තැනකට යන බව සුදුසුය. මම සඞ්ග්‍රාමයට වන්නා වූ ඇතකු වැන් නෙමි. යුද්ධයට වන්නා වූ ඇතු සතර දිසාවෙන් වස්නා වූ ශර වර්ෂාවත් ක්ෂමා කරන්නා සේ දුස්සීලයන් බිණූ පරිහව **ක්ෂමා කරණ** බව මට ම සුදුසුයැ'' යි බණ වදාළ සෙයෙක.

දෙසා වදාළ බණ සම්ප්‍රාප්ත වූ පෂිදට බොහෝ වැඩ සැටි ය. මෙසේ බණ වදාරා **''ආනන්දය! සර්ඥයන් විෂයෙහි උපන් අපවාදයෙක් සන්දවසකින් ඔබ්බෙහි නොසිටී''** යි වදාළ සෙයෙක.

ඉක්බිති **මාඝඤි තොමෝ සර්ඥයන්** එනුවරින් නොවඩනා හෙයින් ''සර්ඥයන් වහන්සේට උපසථාන කරන්නා වූ පන්සියයක් ගැණුන්ට ම ව්‍යඤ්ජනයක් කළ මැනවැ'' යි සිතා රජ්ජුරුවන් රහ බොන තැන් සිටැ උපසථාන කරන්නී ''තමාගේ සිලිපියා හුන් තැනට නොමළ කුකුළන් අවදෙනකු හා මළ කුකුළන් අට දෙනකු හා ගෙණවුත් හිණි හිසැ සිටැ තමන් ආ බව රජ්ජුරුවන්ට දන්නවා

ඇතුළට වත මැන වැයි කී කල ත් නොවැද පළමු නොමළ කුකුළන් අවදෙනා එවා පසුව මළ කුකුළන් එවුව මැනවැ'' යි හසුන් එවා චුල්ලූපසථායකයාට ද තමා කිවක් කරණ පරිද්දෙන් අත්ලස් දුන්හ.

මාගන්දිය බ්‍රාහ්මණ ද අවුත් පිටත සිටැ කියා එවා ''අව මැනවැ'' යි කී කල්හි ''රා බොන තැනට නො වදිමි'' යි කියා පිටත සිටියේ. මාගන්දිතොම පළමු කොටැ ම අත්ලස් දුන් චුල්ලූප සථායකයා කැඳවා ''මාගේ සිලිපියා සිටි තැනට යා'' යි නහා යැවුව. හෙතෙම ගොස් උන පාවා දුන්කා වූ නොමළ කුකුළන් අටදෙනා ගෙණවුත් ''සවාමිනි! පුරොහිතයන් එවූ පඬුරු යැ'' යි රජ්ජුරුවන්ට දැක්වී ය ''රජ්ජුරුවෝ අපට මේ යහපත් අවුලෙක. කා ලවා පිසවමෝදැ'' යි විචාළහ.

මාගන්දි නොම ''සාමාවතින් ඇතුළු වූ පන්සියයක් දෙනා හිඳිති. ඔවුන් ලවා පිසවා ගෙන්වුව මැනවැ'' යි කිව. රජ්ජුරුවෝ ඒ අසා ''අනුන්ට නො දී තෙලෙ තමන් ම අපට පිසැ එවන්නේය'' යි කියා යැවූහ.

ඒ අසා ශාසනයෙහි අති ප්‍රසාද වැ සත්‍රිහු ''අපි ප්‍රාණ වධ නො කරම්හ'' යි පෙරළා යවා පූහ. ඒ අසා මාගන්දි ''මහරජ! මේ නොපව ය යි කී හෙයින් නො පිසූ බව මුත් ශ්‍රමණ ගෞතමයන්ට ය යි කියා යැවුවහොත් දැන් දැන් පිසෙති'' යි කීහ.

රජ්ජුරුවෝ ''එසේ වුවහොත් මෙසේ ම කියව'' යි නහා යැවූහ. ආදි ම අත්ලස් ගත් චුල්ලූපසථායකයා නොමළ කුකුළන් සහ වෑපියා මළ කුකුළන් ගෙණැ ගොසින් එපවත් කීය. ඔහු අසා ''මේ අපව සුදුසු ය'' යි හිවිසැ බුදුන් වහන්සේට දන් ඉදිකොවැ යැවූහ. මාගන්දි රජ්ජුරුවන්ට ''නුඹට ය යි කී කලැ නො පිසන නියාත් බැලුව මැනවැ'' යි කියා සිටුවුව. රජ්ජුරුවෝ ඒ අසා ක්‍ෂමා කොටැ මුවෙන් නො බැණැ හුන්හ.

ඉක්බිති මාගන්දි තවත් තවත් කුමක් කරම් දෝ හෝ යි සිතා වෙහෙසෙයි. එසමයෙහි රජ්ජුරුවෝ සාමාවතිය, වාසුල දත්තාය, මාගන්දිය යන තුන්දෙනාගේ තුන් ප්‍රාසාදයෙහි මුර යෙන් මුර තබා එකි එකි මුරයෙහි සත් සත්දවස් ශ්‍රී අනුභව කොවැ යෙහෙන් වෙසෙති.

එ සමයෙහි මාගන්දි තොම ''සෙට හෝ අනිද්ද හෝ රජ්ජුරුවෝ සාමාවතීන්ගේ ප්‍රාසාදයට යෙති කියා දැනැ තමාගේ සිලිපියාට කියා යවා'' දලෙහි ඔසඩ ගල්වා විෂ නැති කළ නයෙකු

ගෙන්වා ගෙණැ රජ්ජුරුවන්ගේ වීණායෙහි සිදුරෙන් ඇතුළෙහි ලා පියා මල් වටෙකින් සිදුර පියාලා සජ්ඣා දෙතුන් දවසක් නිරාහාර කොටැ රජ්ජුරුවන් කරා ගොස් "අද කාගේ ප්‍රාසාදයට වඩන්නේ ද" සි විචාරා "සාමාවතීන්ගේ ප්‍රාසාදයට ය" යි කී කල "සුවාමීනි! ඊයේ නපුරු සුපනයක් දිටිමි. ඔබ නොවැඩිය මැනවැ" යි වළකා රජ්ජුරුවන් නො වැළැකැ යත් යත් "ආවක් කැවිව දක්මි. මම ත් එමි" යි කියා කැටුවැ ගොස් රජ්ජුරුවන් සාමාවතීන්ගේ ගෙයි බත් අනුභව කොටැ යෙහෙන් නිදන්නට පටන් ගත් වේලෙහි තෙමෝ සක්මන් කරණ ලෙසින් ඇවිදැ සිටැ ලා වීණා සිදුරෙන් මල්වට හයා ගත.

10. මාගන්දී - සාමාවති කථා

11. සාමාවතී කථා

නිරාහාර වැ හොත්තා වූ සජ්ඣා පණ කොටැ ගෙණැ වීණාවෙන් නික්මැ හැඳ වැටී හිත. තෙමෝ ආදි නො දන්නා එකක සේ හඬා සසලා පියා "සුවාමීනි! සජ්ඣයෙකැ" යි රජ්ජුරුවන් පුබුද්ද "නුඹ කාගේ ත් බස් නො ගිවිසැ මේ දුෂ්ට සත්‍රින් කෙරෙහි ම ඇලුනු සේක" යි නොයෙක් ලෙසින් රජ්ජුරුවන් ගිවිස්සූ ය.

රජ්ජුරුවෝ තත්ත්‍වය නො දනැ කිපුනාහ. සාමාවති රජ්ජුරුවන් කිපුනු බව දූනැ පන්සියයක් පරිවාර සත්‍රින් කැඳවාලා "රජ්ජුරුවෝ නිෂ්කාරණයෙහි කිපියහ. මෙතැන්හි අපට අනික් සරණෙක් නැත. **අපගේ සාමිදරු වූ සුචිඤ්ඤයෝ තමා කෙරෙහි මෙෂ කළවුන්ට මෛත්‍රී කරණ බව සියලු උපද්‍රව නො වැද්ද දෙන දිව්‍ය ඖෂධයෙකැ** යි **වදාල සෙයෙක.** එ හෙයින් අප අප ගේ ආත්මයෙහි ද මේ රජ්ජුරුවන් කෙරෙහි ද අපට බොරු වරද නහන්නා වූ බැමිණිය කෙරෙහි ද සම සිත් වුව මැනවැ"යි අවවාද දුන්හ.

ඉක්බිති රජ්ජුරුවෝ බලවත් වූ රාජ කෝපයෙන් නැඟී සිටැ දැහක් දෙනා නඟන බඟන මැඬගහූ දුන්න නහාලා විෂ පොවා පිඟරය එහි තබා ගෙණැ හී දණ්ඩ සාමාවතීන් ගේ ලයට අභිමුඛ කොටැ හයා ගෙණැ අත හැරී පිහ. ඒ සිත් පිත් නැති ශරය ද සාමාවතීන් ගේ මෛත්‍රී ආනුභාවයෙන් පහිලිය සාමාවතීන් දසාවට ගොසින් ඔවාත රජ්ජුරුවන් දසාවට දිවන්නට වත,

රජ්ජුරුවෝ එවිට තිය තමන් දසාවට දිවත් දිවත් "මේ සිත් පිත් නැති ගරය පොවා සාමාවතින් ගේ ගුණ දන්නී මම් ම ය ඔවුන් ගේ ගුණ කොා දන්මි"යි දුන්න ගෙළා පියා දෙහොත මුදුනෙහි තබා ගෙණැ "දේවිනි! අඥත වූ මා රක්ෂා කරව. තොපි ම මට සරණ වව. තොප සරණ යෙමි"යි කිහ.

ඒ අසා සාමාවතී "මම තොප සරණ යෙමි" කොා කියා "දේවයෙනි! මා සරණ යන්නේ කුමට ද? තුන් ලොවට එකහෙළා සරණ වූ තමන් කි පරිද්දෙන් පවත්නා වූ ලඝට විදි ගරය පොවා පෙරළි විද්දවුන් දසාවට යන පරිද්දෙන් කරන්නා වූ ගුණ ඇති **සඞ්ඝයන් සරණ යව**"යි කියා රජ්ජුරුවන් සරණ ගන්වා ඒ සරණ කියා වූ රජ්ජුරුවන් බුදු පාමොක් මහා සඞ්ඝයා වහන්සේ පවරා දන් දී සාමාවතින් කැඳවා "තොප විසින් මට මේ සා ලාභයක් වූයේය. තොප කැමැති වරයක් ගන්ව"යි කී කල්හි "මට අනික් වසතුවකින් ප්‍රයෝජන නැත. **සඞ්ඝයන්** නිබඳයෙන් මාගේ ගෙට වැඩ බණ වදරණ පරිද්දෙන් ආරාධනා කළ මැනවැ"යි කිහ. රජ්ජුරුවෝ **සඞ්ඝයන් වහන්සේට** ආරාධනා කළහ.

සාමිදරුවෝ එබස් අසා "මහරජ! **සඞ්ඝයෝ** නිබඳයෙන් එක තැනකට යෙති යනු නැත. මුළු ලොවට කරුණායෙන් උපන් **සඞ්ඝයන් වහන්සේ** එක තැනකට නියත ව ගියහොත් අනාථ වූ ලොවට මහා අලාභ වන්නේය"යි වදරා **අනඳමහ තෙරුන් වහන්සේට** සම්මත කොට වදාළ සෙයෙක.

අනඳ මහතෙරුන් වහන්සේ පන්සියක් දෙනා වහන්සේ ගෙණැ අනතඃ පුරයට වැඩ බණ වදරණ සෙයෙක. තෙරුන් වහන්සේ ගේ ධර්ම **අසන්නා** වූ **සාමාවතිඹු** ප්‍රසන්න වූ සිතින් ධර්මයෙහි වූ ප්‍රීති සෞමනස්‍යයෙන් පන්සියයක් වස්ත්‍රයෙන් පූජා කළහ ඒ අසා රජ්ජුරුවෝ ද බොහෝ වස්ත්‍රයෙන් පූජා කළහ.

මෙසේ අවෙතසක වූ ගරය පොවා අනුන් කෙරෙහි මෙත් සිත් කළවුන් ලඝට නොා වැද්ද හි පගිලිය පෙරළි ගොස් කිසි උපද්‍රවයක් කට නොහි හුනු බව ඇසූ සත්පුරුෂයන් විසින් "උපන් සත්ත්වයන්ට ධර්මය මුත් අනික් සරණයෙක් නැතැ"යි කියා නිශ්චය කොට අනවරතයෙන් තමන්ට උපන්නා වූ දුඃඛයන්හි දුඃඛ දුරු කරණ පිණිස සියලු සසර සුව එළවන පිණිස අමෘත මහා නිර්වාණ සුව සිදුවන පිණිස **දහම් සරණ** යෙමි යි **දහම් සරණ** යා යුතු.

ධම්මං සරණං ගච්ඡාමි — **දහම් සරණ** යෙමි.

11. සාමාවතී කථා.

තව ද මහා සමුද්‍රයෙහි නැව රක්‍ෂා කරණ නැවියා එම නැවින් රැකෙන්නා සේ තමා රක්‍ෂා කරන්නවුන් රක්‍ෂා කරණ "බුද්ධ සරණ යෙමි"යි දහම් සරණ යා සුතු.

හේ කෙසේද? යත්.—

එක් සමයෙක්හි පසේනදි කොසලයෝ සඞ්ගරණයෙන් සැදී සඞ්ගරණ විහිඹින වූ එකපුණ්ඩරීක නම් ඇතකු නැඟී මහත් වූ රාජා'නුභාවයෙන් මහ පොළොව පෙරළන්නාක්හු සේ, මහා සමුද්‍රය උතුරුවන්නාක් සේ, සපතාකුල පර්වතය උදුරා නහන්නාක්හු සේ, මහා කොලාහලයෙන් නුවර පැදකුණු කරන්නාහ. එ සමයෙහි රාජ්‍ය රක්‍ෂායෙහි නියුක්ත පුරුෂයන් විසින් ගසා දුරු කරණු ලබන්නා වූ මහාජනයා "ඉය ජාතියෙහි මහත් මහත් කුසල් කළා වූ රජ්ජුරුවන් ගේ රාජ්‍යශ්‍රී බැලුව මැනවැ"යි ලොභයෙන් පෙරළී පෙරළී සිටැ බලන්නාහ.

12. කුමුදුපපලාතිත දූගතත සෙවක කථා.

එසමයෙහි එක් අන්ධ මිනිසකුගේ අඹුවකුදු සත්මහල් පාසෙක්හි මතු මහල් තෙලෙහි සිටැ ජාලා කවුළුව හැර රජ්ජුරුවන් බලා රජ්ජුරුවන් තමන් බැලූ ක්‍ෂණයෙහි දෙර පිසා ඇලව ගත.

එසමයෙහි රජ්ජුරුවන්ට ඒ මූහුණ බලා වලා වැසී ගිය සඳක් සේ වැටහින. ඇ කෙරෙහි පිළිබඳ සිතැ'ත්තා වූ රජ්ජුරුවෝ ඇතු පිටන් වැටී හෙන්නාක් සේ ශොකා'තුර වැ යුහු වැ නුවර පැදකුණු කොටැ රජගෙට වැද "මා නුවර පැදකුණු කරණ වේලෙහි අසවල් තැන ප්‍රාසාදයෙහි මතු මහල් තෙලෙහි සිටි ගැහැණියක නෝ ත් දුටුයෙහි වේද්ද" යි කියා "ඇගේ සැමියන් ඇති බව ත් නැති බව ත් ගොස් දනැ එව" යි පුරුෂයෙකු යැවී ය.

හෙතෙම සඤ්ඤාමික භාවය දනැ රජ්ජුරුවන්ට දන්වී ය. රජ්ජුරුවෝ එසේ වුවහොත් "ඇගේ සැමියා කැඳවාගෙණැ එව" යි හැවූහ. හෙතෙම "රජ්ජුරුවෝ තා කැඳවූහ" යි කියන්නා හා ම "මාසේ වූ අන්ධ එකකු රජ්ජුරුවෝ කුමක් පිණිස කැඳවත් ද? මාගේ අඹුවන් නිසා මව භයෙක් උපන් වනැ" යි භයපත් වැ රජ්ජුරුවන් කරා ගොස් වැඳ සිටියේ ය.

රජ්ජුරුවෝ "අද පටන් ගෙණැ මට සේවය කරව" යි කිවූ ය. හෙතෙම "සවාමීනි! මම මගේ කටයුතු කොටැ මා දුන මනා අය දී වැදූ හිඳිනා අන්ධයෙකිමි, මට රාජසෙවයෙන් ප්‍රයෝජන නැතැ"යි කියා රජ්ජුරුවෝ "කෙසේ ත් සෙවය කළ මැනවැ" යි කඩුවක් හා පලඟයක්[1] දෙවූහ.

1. පලිඝයක්.

හෙතෙම "මේ රජ්ජුරුවෝ උපායා'නන්තරයෙකින් මා මරා පියා මාගේ අඹුවන් හැරැ ගන්නා කැමැති වන්නාහ" යි සිතා අප්‍රමාද වැ රාජ සෙවය කෙරෙයි. රජ්ජුරුවෝ ඔහුගේ දෝසයක් දැකැ ගත නොහී කාමරාගය වඩුන් වඩුන් "මෝහට දෝසයක් ආරොපණය කළ මැනවැ" යි සිතා ඔහු කැඳවා "මෙ තැනට සතර ගවුවෙක ගහෙක් ඇත. එහි මේ තම් තොටට ගොස් සවසැ මා නහන වේලාවට කඩුපුල් - මහනෙල් ආදී වූ සුවඳ මල් හා අරුණුවන් මැවි ගෙණැ එව. නො ගෙණාවහොත් තා දිවි නැතැ" යි කිවු ය.

හෙතෙමේ "ආඥ සම්පන්න රජ්ජුරුවන් කි බස නො කොටැ හෙමි යි නො කියා ගෙණෙම්" යි සමූ ගෙණැ "අරුණුවන් මැවි තම් නාලොව ඇති දෙයෙක. ඒ මට කෙසේ ලැබේදැ" යි මරණ භයින් භයපත් වැ ගෙට ගොස් අඹුවට "ඔත් උදවුදැ" යි විවාරා "උදුනෙහි ය" යි කි කල්හි ඔත් පැසෙන තුරු ලස්වන හෙයින් සාලුවෙන් දෙනා දිය ඇලකර වා පියා සමීපව මාලුයෙකින් කැඳ කැඳ ඔත් මල්ලෙක ලා බැඳා ගෙණ නික්මින.

ඇත් යත් අතර මඟදී ම හුණු සුමින් පැසින. හෙතෙම ඔත උනාපියා නො ඉදුල් කොටැ මද ඔතිවියක් ඇලකොටැ පියා ඔත් කන්නේ අතර මඟ සා විඩා වැ ගිය මගියක්හු දැකැ ඔහු ඔත් කවාලා තෙමේත් ඔත් කා එක් ඔත් පිඩක් හැරැ ගෙණැ දියෙහි මසුන්ට දන් දී මහත් කොටැ "මේ ගඞ්ගාවෙහි වසන්නාවූ නාග - සුපණී - දෙවතාවන්ට ය මා දන්වන්නේ! රජ්ජුරුවෝ මා මරණ පිණිස නාලොවින් මුත් නො ලැබෙන්නා වූ කඩුපුල් මල් හා අරුණුවන් මැවි ගෙණෙන්නට කිහ. මා මගියාට දුන් ඔත කුසල් හා මසුන්ට දුන් ඔත් මිට කුසල් හා හැමදෙනා ම අනුමෝදන් වැ මට කඩුපුල් මල් හා අරුණුවන් මැවි දෙව" යි හඬ හැසී ය.

ඒ අසා ගඞ්ගාවෙහි අධිගෘහීත වූ නාගරාජයා ඔහු හඬ අසා යහළු වෙසයෙකින් ඔහු කරා අවුදින් "තා කළ පින් මට දෙව" යි තුන්විටෙක පින් ඉල්වා ගෙණැ ඔහුගේ ලෙහි මරණ භය ද අඹු ශොක ද නිවා අරුණුවන් මැටි හා කඩුපුල් මල් හා දින.

වැඩි කුසලයක් නො කොටැ මගියාට ලූ ඔත් පිඬෙහි හා මසුන්ට ඉසැලූ ඔත් පිඬෙහි අනුසසින් නාගරාජයන් පවා මෙසේ ප්‍රසන්න වැ මේ සත්ත්වයාගේ දුක් දුරු කොටැ ජාති ශතසහස්‍රයෙ-කිනුදු මිනිසුන් විසින් නො ලැබිය හැක්කාවූ අරුණුවන් මැටි හා කඩුපුල් මල් දී කළා වූ ඥානවති ඇසූ සත්පුරුෂයන් විසින් මේ සංසාර යෙහි සිටියා වූ සත්ත්වයන්ගේ සියලු උපද්‍රව සංසිදුවන්නට ධර්ම

සේ වූ පිටිවහලෙක් නැතැ යි "කයින් වචසින් මනසින් ම එම සඳකඹ්ය වැඳැ පුදා, එම සඳකඹ්ය මෙනෙහි කොට, එම සුවරිතයෙන් සුව විඳුම්හ" යි නිශ්චය කොට මෙබඳු සංසාරයෙහි නිවී සැනසී යෙහෙන් විසුව මැනවැ යි **සඳකඹ්ය ම සරණ යා සුතු.**

රජ්ජුරුවෝ ද ඒ මිනිසා මෙහෙවර යවාලා "මිනිස්සු තම් බොහෝ උපාය දන්නාහ. ඉදින් කිසි උපායකින් හේ ඒ අරුණුවන් මැටි හා කඩුපුල් මල් ලත් නමුදු මේ නුවරට වැද්ද නුදුන මැනවැ" යි කියා නුවර දොර වේලාපස ම හෙළවා එහ. හෙ ද අවුදින් පිහි දොර දූකැ තුන්විටෙක හඬගහා පියා "කොයි යෙම් දෝ හෝ" යි සිතා සඟුරුවන් නම් ඉතා මොළොක් වූ සිත් ඇති සෙයෙක. ඔබ ගොසින් රාත්‍රියට නිදම් යි විහාරයට ගොස් එක් පහසු තැනෙක්හි වැද හොත්තේ ය.

ඒ රාත්‍රියෙහි රජ්ජුරුවෝ ද ඒ ගැහැණිය කෙරෙහි පිළිබඳ සිතින් නිදි නො ලබන්නාහු "මාගේ ගැත්තකුගේ අඹුවක පිණිස මා මෙතෙක් දුක් ගත්තේ කුමක් පිණිස ද? පහන් වන්නා හා ම ඔහු මරවා පියා අඹුව ගන්මි" යි සිතා හොත්තාහ.

එ සමයෙහි සැව යොදුන් **ලොහොකුඹු නරකයෙහි** උපන් නාවූ බලවත් අකුසල් කළ පුරුෂයෝ සතර දෙනෙක් උදුන්හි ලා ලූ සඟල් සේ උඩුයටියා වැ පැසෙන්නාහු තිස් දහසක් හවුරුද්දෙන් පත්ලට බැසැ තිස් දහසක් අවුරුද්දෙන් උඩට නැඟී ඔවුනොවුන් දූකැ "තමන් පෙරැ කුසල් නො කළ බව හා දැන් කුසලට ආසාව ඇති බව හඟවා එකෙකි ගාථා කියම්හ" යි සිතා සම්පුණී කොට කියාගත නොහී එකෙකි අකුර කියා නැවත නරකයෙහි ගැලී ගියහ

රජ්ජුරුවෝ ඒ අසා "කවර විපැත්තියෙක් වේ දෝ හෝ" යි මහා භයින් භයපත් වැ රාත්‍රිය මුළුල්ලෙහි දල්වා ලූ ඇසිපිය නොලා හිඳැ පහන් කොටැ උදැසනක් සේ ම පුරෝහිතයන් කැඳවා එපවත් කිහ.

පුරොහිතයා සතර අකුරු අසා සිටැ මේ බුද්ධ විෂය බව මුත් තමහට විෂය නො වන බැවින් "ඔබ සිතා ගත නොහී නො දන්මි" යි කිවහොත් මට ලාභා'නතරාය වෙයි සිතා "මහරජ! ඉතා බැරි සවජ්තයෙක. නොපගේ ප්‍රාණයට භීතාසයෙක් පැමිණේ" යි කිහ,

ඒ අසා දිසුණු වැ භයපත් වූ රජහු "කළමතා කිම්ද" යි කී කල්හි "ඇත් අස් ආදී ප්‍රාණීන් කෙරෙන් සියක් සියක් මරා යාග කළ මැනවැ" යි කිය. ඒ අසා රජ්ජුරුවෝ "මුළුලොව මරා ත් මා ගැළවෙන බව යහපතැ" යි ප්‍රාණීන් කැවි කරවන්නට පවන් ගත්හ. පළමු කොටැ පන්සියයක් ගොන් හා පන්සියයක් වස්සන් හා පන්සියයක් තාඹුන් හා පන්සියයක් නිරළුවන් හා පන්සියයක් පලෙළුවන් හා උගුරු කපන පිණිස බැඳැ සිටුවා ගත්හ.

සියලු දස කම්කරයෝ මරණ භයින් තර්ජිත වැ ගඩ ගඩා කම්කාන කරන්නට පවන් ගත්හ. මහ පොළොව ඉදිරී යන කෝලාහලයක් සේ මහා කෝලාහල පවත්වමින් සිටියේ. "එ සමයෙහි **මල්ලිකා දේවීන්** රජ්ජුරුවන් හුන් තැනට ගොස් ශ්‍රී මුඛය දුර්මුඛ කාරණ කිම්ද" යි විචාරා එ පවත් අසා "මහරජ! තෙපි හැම කල්හි ම අඹ බාලයව. මෙසේ වූ සවප්නයක් දුටු කල්හි ම යුගාන්ත වත්නියක් සේ ඉපිළ ගියාවූ ශොක ඇත්තවුන්ගේ ලය අමා මහ මෙසයක් නිවාලන්නා සේ තමන්ගේ වචනයෙන් නිවාලන සේ දන්නා සමීඳ වූ **සවාමි දරුවන්** කුමට නො විවාළාදැ" යි කිහ.

රජ්ජුරුවෝ ඒ අසා යුහු වැ ගමන් ඇති වාහනයක **නැඟී මල්ලිකාදේවීන්** හැරගෙණැ විහාරයට ගොස් **සවාමිදරුවන්**. ශ්‍රීපාද වැඳැ එකත්පස් වැ හිඳැ මළාක්හු සේ එක බසකුත් නො බෙණෙයි.

ඉක්බිති නිහුවන භාදය නිවීපන වූ **සවාමිදරුවෝ** තමන් වහන්සේ ම මධුර වූ සවර විහිදූ "මහරජ! "ඉතා දහවල් වේලෙහි කොයි සිට ද? එන්නේ ය"යි විචාරා වදාළ සෙයෙක. ඒ අසා රජ්ජුරුවෝ මරණ භයින් භයපත් වැ මුවෙන් නො බැණැ හුන් තාක. ඉක්බිති **මල්ලිකාදේවී** එ පවත් සවාමිදරුවන්ට දැන්වූහ. ඒ අසා **සවාමිදරුවෝ** "මහරජ! මෙසේ වූ සවප්නයක් දුටුයේ ඇද්ද" යි විචාරා වදාළ සෙයෙක. රජ්ජුරුවෝ "ඇත සවාමිනි" යි කියා "කෙසේ වූ සවප්නයක්ද? තොප දුටුයේය" යි කිකල්හි තමන් දුටු පරිද්දෙන් දැන්වූහ.

සවාමිදරුවෝ එ පවත් අසා මහමෙර සා වැටියක් සතර මහා සාගරයෙහි දිය පමණ තෙල ගලා පහනක් අවුලුවා ගෙණැ සතර රියන් ගබඩාවට වත් එකකු සේ තමන් වහන්සේගේ **අනාවරණ ඥාණයෙන්** සතර අකුරු පරික්ෂා කොටැ මනාතක්හු මැඩැ පූ ලයෙකැ සහස්‍රපාක අමෘත තෙලයක් ගාන්නා සේ "මහරජ! "මේ

නිසා නොපව වන්නා වූ භයෙක් නැතැ'' යි අස්වසා ''අස! මහරජ! මොහු සතරදෙන ඤාසුජ් සම්මා සම්බුදුන් වහන්සේ දවසැ සතළිස් කෙළක් පමණ ධන ඇති සිටු දරුවෝ සතර දෙනක.

ඔහු එතෙක් ධනයෙන් තමන් තමන් පිහිට වූ කිසි කුසලයක් නො කොටැ පඤ්ච දුශ්චරිත කොටැ අවීචි මහානරකයෙහි ඉපිද එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි පැසී කර්මාවශෙෂයෙන් ලොහොකුඹු නරකයෙහි ඉපිදී තිස්දහසක් හවුරුද්දෙන් පත්ලට බැස තිස්දහ සක් හවුරුද්දෙන් මත්තට නැඟී ඔවු'නොවුන් දැකැ එකෙකි ගාථා කියම්හ'' සිතා —

දූජජීවිතං අජීවිමහ – යෙසඤෙන න දදමහසෙ,
විජජමානෙසු භොගෙසු – දිපං නාඤමම අත්තනො.

යන මේ ගාථාව කියනු කැමැත්තේ ''දූ'' යන්න මතු කියා ගැලී ගියේ.

සට්ඨි වස්ස සහස්සානි – පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පචචමානානං – කදා අන්තො භවිස්සති.

යන ගාථාව කියනු කැමැත්තේ ''ස'' යන්න මතු කියා ගැලී ගියේ.

නත්ථි අන්තො කුතො අන්තො – න අන්තො පතිදිස්සති,
තදා හි පකතං පාපං – මම තුය්හං ච මාරිස!

යන ගාථාව කියනු කැමැත්තේ ''න'' මතු කියා ගැලී ගියේ.

සො හි නූන ඉතො ගන්ත්වා – යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සිලසම්පන්නො – කාහාමි කුසලං බහුං.

යන ගාථාව කියනු කැමැත්තේ ''සො'' යන්න මතු කියා ගැලී ගියේ.

මොහු සතරදෙන ''තමන් පෙර පරස්ත්‍රී සෙවනාදී දුශ්චරිත කරම්හ'' යි කුසල් නො කළබවට පශ්චාත්තාපනායෙන් මේ ගාථා සතර කිහ. ඉන් ''නොපව වන උපද්‍රව නැතැ'' යි වදළ සෙයෙක. ඒ අසා රජ්ජුරුවෝ ''පරස්ත්‍රී සෙවන නම් බැරි ය. පවෙක් වනැ'' යි කියා පරස්ත්‍රී සෙවනයෙහි දොෂ දැනැ ''මා ත් ඒ පාපයෙන් දුරු වුව මැනවැ'' යි සිතා ''සඛාමිනි! රෑ මේ සවපහාය දුටු වේලෙහි පටන් කොටැ හයින් නිදි නොලත් හෙයින් රාත්‍රිය නම් මෙසේ දික් දෙයක් වනැ යි ඒයේ රෑ මම දන්මි'' යි දැන්වූහ.

ඒ පුරුෂයා ද "මෙහැන දී මා ත් වැද බිණුව මැනවැ" යි සිතා "සැමිනි! රජ්ජුරුවන්ට රාත්‍රිය දික්වූ බව හැඟුනේ ඊයේ රෑ ය. යොදන දික් දෙයක් බව හැඟුනේ ඊයේ දවාලැ" යි දැන්වී ය. ඒ අසා සැමිදරුවෝ "නිදි නො ලබන්නාහට රාත්‍රිය දුරු. වීඩා තැනැත්තවුට යොදනෙක් තම් දුරු. ධර්ම නො දන්නා අඥයා හට සසර දුරැ" යි කියා බණ වදාරණ සෙයෙක.

දීඝා ජාගරතො රත්ති - දීඝං සන්තස්ස යොජනං,
දීඝෝ බාලානං සංසාරෝ - සද්ධම්මං අවිජානතං.

යන ගාථායෙන් බණ වදාළ සෙයෙක. දෙසනා කෙළවර ඒ පුරුෂයා ඇතුළු වූ බොහෝ දෙන අමා මහ නිවන් පසක් කළහ.

රජ්ජුරුවෝ ද ශොකයෙන් මිදී රජගෙට ගොස් මරන්නටයැ යි බැඳැ සිටුවූ ප්‍රාණීන්ට අභය දී උනා හළහ. සිඟලු නුවර ප්‍රීතිමය වූ සොම්කස්හි ගැලි ගැලී හියේ. තිරිසන් වූ මසුන්ට ලූ බත් පිඬක් හා යාචකයාට දී ලූ බත්පිඬෙහි පමණින් සියලු දුඃඛයෙන් ගැලවී අමා මහ නිවන් දැකැ නිවී සැනහී සුවපත් වූ මේ පුරුෂයාගේ කථාව ඇසූ සත්පුරුෂයන් විසින් "ධර්මය සේ සත්ත්වයන්ට පිහිටයෙක් නැතැ" යි දැන ඒ ධර්මය ම අප්‍රමාදයෙන් පුරා එම ධර්මයෙන් අධික සතෙකුත් ලබම්හ යි සිතා නිශ්චය කොට **දහම් සරණ යා යුතු.**

තව ද බොධිමූලයෙහි වැඩ හුන්නා වූ තමන් වහන්සේ දහන්ට යැ යි කියා ආවා වූ **වසවත්තිමාරයා** පවා හිරු හසුනගට කොයන තුරු ලුහුබැඳවූ සැමිදරුවානන් වහන්සේ තමා ගේ විමානයෙහි හුන්හ යි කිපි වෙෂයෙන් දිව අවුත් රාත්‍රියක් මුළුල්ලෙහි උපක්‍රම කළා වූ **ආලවකයා** හා නවවිධ වර්ෂාවකින් හා ප්‍රචණ්ඩ වූ හිති ගෙණ දිලියෙන වෙලායුධයෙන් හා කිසි උපද්‍රවයක් කොටැ ගත නොහී "මහණ තා ප්‍රශ්නයක් විචාරම් යි ඒ ප්‍රශ්නය කිවහොත් ගැල වෙන්නේයි. නො කිවහොත් තා හදවතට අත ලා ලා මැඩැ වියරු හෝ හෙළා පියම්. ලය හෝ පලා පියම්. කකුල හෝ අල්වා ගෙණ ගඞ්ගායෙන් පාර්ශ්වයට හෝ ගසා පියම්. තාගේ ප්‍රාණය රක්ෂා කරන්නා කැමැත්තෙහි නම් මා විවාළ ප්‍රශ්නයක් කියයි දැ" යි කියා.

"කුමක් කළ කලැ සුව එළවේ දැ" යි කී කල්හි සවී ධර්මයෙහි අප්‍රතිහත වූ බුද්ධි ඇති සැමිදරුවන් විසින් "යක්ෂය! අපට කරණ උපද්‍රව පසු කොටැ තා කැමැති ප්‍රශ්නයක් විචාර" යි සවිඳ ප්‍රවාරණ යෙන් පවරා වදාළ කල්හි ප්‍රශ්න විචාරන්නට පටන් ගත් ආලවකයා සිත් ගෙණැ ඒ ධර්මය ඇසූ ක්ෂණයෙහිම ඔහට අමා මහ නිවන් දෙනු කැමැත්තා වූ ප්‍රඥ ඇත්තවුන් කෙරෙහි අග්‍රවූ කරුණා

ඇත්තවුන් කෙරෙහි අග්‍ර වූ ආසයානුසය දන්නවුන් කෙරෙහි අග්‍ර වූ සර්වාම්දරුවන් විසින් සියලු සම්‍යක්සයන් වහන්සේ විසින් මේ ප්‍රශ්නය විසඳූ ක්‍රමය පරීක්ෂා කොට බුද්ධ පරම්පරා දෙශනාවට අවිරුද්ධ කොට ධර්ම්‍යව්‍යවහාරයට අවිරුද්ධ කොට ප්‍රශ්නය විසඳන්නට පටන් ගෙණ "යක්ෂය! තා නොකිවහොත් අපට උපද්‍රව කරම්හ යි කියා ප්‍රතිඥා කළාවූ තා විසින් කුමක් කළ කල්හි සුව ඵළවේ ද" යි විවාළේ ය.

ඒ අසා "ලොකයෙහි ධර්ම්‍ය කළ කල්හි සුව ඵළවව" යි කියා වදාරා ඔහු සිත් ගෙණ "මූළු ලෝ සිත් ගෙණ සුවයට මූලකාරණය" යි කියා සම්‍යක්සයන් වහන්සේ විසින් සම්‍යක්ඥානයෙන් හිමි සෙවූ වදාළා වූ ධර්ම්‍ය ම සරණ යෙයි යි **දහම් සරණ යා යුතු.**

කුමුදුප්පලානීත දුගත සෙවක කථා.

තව ද ධර්ම්ප්‍රිය වූ ආත්මහිත තත්පර වූ පරහිතයෙහි දෙළ ගත්තා වූ සත්පුරුෂයන් විසින් සසර වැටහී හී අනවසීත වැ දුග්ගත්තා වූ අඥානයන් සේ නොවැ "බුදු-

13. කොණ්ඩඤ්ඤ සථවිර කථා.

රුවනට ගැති වූ තැන් පවත් සඟුරුවනට දිවි දුන් තැන් පවත් දහම් සරණට දිවි දුන් තැන් පවත් තයින් හා එක් වැ වැසැ ද ඔවුන් හා කෙළි කෙළැ උපද්‍රව නො විඳැ යෙහෙන් වසන්නා වූ විෂ වෛද්‍යවාඝ්‍රීයන් සේ සෞර වූ සංසාරයේ හිදැ කිසි උපද්‍රවයක් නො විඳැ යෙහෙන් වසම්හ' යි සිතා "ධර්ම්‍යෙහි ගුණ දූනැ ධර්ම්‍ය සරණ යම්හ" යි සිතා තත්පර වැ අප සරණ ගියා වූ ඒ ධර්ම්‍ය තමා රැක්කවුන් රැක්ක හේ දෝ නොහේ දෝ හෝ යන සංශයක් ඇතහොත් ඒ සංශය දුරුකරණ පිණිස **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** මහතෙරුන් වහන්සේ ගේ කථාව ද අසා ධර්ම් ලොභය රක්ෂා කරණ පරිදි නිශ්චය කොටැ දත යුතු.

හේ **කෙසේ** ද? යත්:—

මෙයට එකානූවනකප්හි දහමට ල ඇති ලොව රැක්මෙහි උත්සාහ ඇති, සර්වාර්ථයෙහි පිටි පෑ, පරාර්ථයෙහි නිත්‍යෝත්සාහී වූ, වියත් කම්හි මතුපත්, කරුණායෙහි තෙරපත්, ප්‍රඥයෙහි මුල්බට භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ විදර්ශි නම් සර්වාම්දරුවෝ අද දක්වා තමන් ගේ නම කී මාගේ ලය සහභන පිණිස ලොකයෙහි පහළ වූ සෙයෙක.

එ සමයෙහි චූලකාල ය මහාකාල ය යන කෙළෙඹි දෙබෑ කෙණෙක් මහත් වූ හැල් කොහක් වැපිරිවූහ. ඉක්බිති එක් දවසක් චූළකාළ තෙමේ හැල් කෙතට ගොස් එක් හැල්ගබක් පලා ඇතුළෙහි තුබූ ඇට කා බැලී ය. ඒ ඔහුට අතිමධුර වැ වැටහින. හෙතෙමේ "මේසේ වූ මධුරයක් බුදුපාමොක් මහසඞ්ඝයා වහන්සේට දුන මැනවැ" යි සිතා වැඩිමහළු බෑනන් කරා එළඹ "බෑනෙනි! ලොකයෙහි අතිමධුර රසයකට සුදුස්සෝ සම්‍යක් සම්බුද්ධයන් සේ විනා අනික් කෙණෙක් ඇද් ද? අද මම හැල් කෙතට ගොස් ලාවූ හැල්ගැබ පලා ඇතුළ කා බැලීමි. එසේ වූ මධුරයෙක් නැතිවැ වැටහින. එසේ හෙයින් හැල් පලා හැල්ගැබ ගෙණැ බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේට දන් දෙමහ" යි කී ය.

ඒ අසා මහාකාළ තෙම "මල! තොප කියන්නේ කිම් ද? බඹ කුඹුරෙහි ගොයම් පලාපියා දන් දුන් කෙණෙක් පෙර ත් නැත. මතු ත් නැත. දැනු ත් නැත. නිකම් ඉදිව. පැසෙන ගොයම් නො නසව" යි කී ය. ඒ අසා චූළකාළ තෙම "නැවත නැවත දන් දුන මැනවැ" යි ආරාධනා කෙළේ.

ඒ අසා මහාකාළ තෙම "තොප මෙසේ ගත්නැති බැවින් කුඹුර දෙකොටසක් කොවැ බෙදා පියා මා සතු භාගය නො අල්වා තොප සතු කොටසින් කැමැත්තක් කරව" යි කී ය. ඒ අසා චූළකාළ තෙම "යහපතැ" යි කුඹුර බෙදා ගෙණැ බොහෝ මිනිසුන් වත්කම් කොවැ ගෙණැ හැල්ගැබ පළවාලා කරල් හැරි ගෙණැ පැන් නුමුසු කිරින් පැසවා හෙළහිතෙල්-මිහි-ශර්කරා ආදිවූ මධුර ද්‍රව්‍ය මුසු කොවැ බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේට මහ දන් දී වැළඳූ අතර මද්‍යයෙහි[1] සඞ්ඝයන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳගෙණැ හෙවැ "සවාමිනි! මේ අගහස්දන හෙතුකොවැ ගෙණැ මම මතු සඞ්ඝ කෙණෙකුන්ගේ පළමු ධර්මදේශනාව ම පිළිගත හෙම්ව" යි ප්‍රාර්ථනා කෙළේ.

ඒ අසා සඞ්ඝයන් වහන්සේ "තා සිතුවා තට සිද්ධවේව" යි වදාරා අනුමෙවෙනි බණ වදාළ සෙයෙක. හෙතෙමේ දන් දී බණ අසාලා "කරල් පලා හැරිගත්තා වූ සිස් හැල්කෙත බලන්නට යෙමි" යි කියා ගියේ – එකෙණෙහි ම ඔහු හදහා දුන්නා වූ දනයෙහි අනුසසින් සියලු හැල් කෙත කරල් පලපලා හැරගත් මුහුනින් දෙ දියුණු – තුන් දියුණු කරල් නැගී සියලු හැල් කෙත ඉස්සන් ඉතිරි ගිය මුහුදක් සේ, සඞ්ඛ්‍යා වලා වැනී ගිය අහසක් සේ, රත් වූ කරලින් පිරී ගොස් මුහු දුන්නා වූ දනය පින් අනුමෝ වන්නට වැදුම් ගෙණැ කර නමා ගෙණැ සිටින සේ කරල් බරින් නැමී ගොස් එකගෙළා හැල් ඇබ සලක් පැසෙන්නට වන.

---

1 මැළඳූ අතෘරහි.

හෙතෙම දුරදී ම හැල් කෙත දැකැ "මා දුන්නා වූ දානය මෙසේ මහාඵල මහානිසංස දෙයෙක් වනැ"යි පසාදවශී ප්‍රීතින් පිනා ගොස් දියුණ - දියුණා එම දානයෙහි ම උත්සාහ ඇති වැ පුලු සමයෙහි පුලු අගහස් දින ගම් වැස්සන් හා කැටි වැ අගහස් මහදන් නම් දානක් දින දන සමයෙහි වෙනම දානක් දින. කොළ කන්දෙහි ලත කැලැ වෙන ම දානක් දින. කොළ නහන සමයෙහිදු වෙන ම දානක් දින. කළපිව[1] වී මැඩැ කැටි කරණ සමයෙහිදු වෙන ම දානක් දින.

කොටගෙට වී ගෙණා සමයෙහි දු එසේ ම මහදානක් දින. මෙසේ ඔහු නව වරෙක්හි නවමහ දානක් දෙන කල්හි කරල් හැර ගත් තැන කරලින් පිරී යෙයි. වී හැරගත් තැන වියෙන් පිරී යෙයි. දන් දී මෙ නම් දෙයෙක් අඩු විය යනු නො වී ය. දන් දුන් සේ මෝ හට වූ සමෘද්ධිය බලා සෙසු මහජනයා ද දානයෙහි ම සෝත්සාහ වූහ.

ධර්මය නම් තමා රක්ෂා කළවුන් රක්ෂා කරන්නේ ය.

ධම්මෝ හවෙ රක්ඛති ධම්මචාරිං-
ධම්මෝ සුචිණ්ණෝ සුඛ'මාවහාති,
එසා'නිසංසෝ ධම්මෙ සුචිණ්ණෙ-
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරි.

යනු යෙයින් ම දක්වන ලදි. මෙසේ ධර්ම ය නම් තමා රක්නවුන් රක්නේ යැ යි නිශ්චය කළා වූ සත්පුරුෂයන් විසින් ආත්මාර්ථයට වෙන උපායා'නන්තරයක් නො සිතා පරාර්ථයට වෙන උපායානන්තරයක් නො සිතා සුවයෙන් සුවයෙහි ප්‍රීතියෙන් ප්‍රීතියෙහි ගැලී දුකෙකැ රස නො දනැ අයතනයෙන් අභිමතාර්ථ සිද්ධ කොවැ කෙළවරැ අමාමහ නිවන් සුව විඳිනා පිණිස දහම් සරණ යා යුතු.

මෙසේ චූළකාල තෙම විපස්සි නම් සම්‍යක් සම්බුද්ධ සර්වාඥ දරුවාතන් ගේ කල්හි අග්‍ර ධර්ම පතා අගහස් දන් නවයක් දුන්කාහ. මෙයින් කප් ලක්ෂයකින් මත්තෙහි හංසවතී නම් නුවරැ ලොකොත්තර වූ ගුණ ඇති පදෙමාත්තර නම් සම්‍යක් සම්බුද්ධ යන් වහන්සේ දවසැ සත් දවසක් මහදන් දී ඒ සර්වාඥ දරුවන් ගේ ශ්‍රීපාදය වැඳැ ගෙණැ හෙවැ අග්‍ර ධර්ම ප්‍රතිවෙධය පැතූහ

මෙසේ පතා ක්‍රමයෙන් දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි ශ්‍රී අනුභව කෙරෙමින් අප ගේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දවසැ [illegible] නම් බ්‍රාහ්මණ වැ ශාක්‍යසිංහ වූ මාගේ සර්වාඥ-

1. කළ විට — කළ පිට

දරුවානන් දෙවතාවන් ගේ ආරාධනායෙන් මවු කුසැ පිළිසිඳැ ගෙණැ ක්‍රමයෙන් ලුම්බිනී වනයෙහි ප්‍රසූත වැ කපිලවස්තුවට වඩා ආ කල්හි සුද්ධොදන මහාරජාණන් වහන්සේ ලක්ෂණ පරීක්ෂා කරන්නට දුක් වූ කල්හි "මේ සවාමිදරුවානෝ සවාසනා සම්පී කෙලෙසයන් නසා බුදු වැ මුත් නො නවත්නා කෙණෙකැ"යි දැනැ බුදුන් ගේ මහාභිනිෂ්ක්‍රමණයට පළමු වැ මහණ වැ සහවුරුද්දක් මහා වීර්‍ය්‍ය කරන්නා වූ සවාමිදරුවානන් වහන්සේට උපස්ථාන කොටැ ඔවුන් වහන්සේ දුෂ්කර ක්‍රියායෙන් ඉෂ්ටයෙක් නැතැ යි මහා වීර්‍ය්‍ය හැරැ ඖදාරික ආහාර අනුභව කොටැ ශරීරයෙහි බල ගන්වන්නට පටන්ගත් කල්හි —

එතෙකින්[1] බුදුවිය නොහෙත වන්හැ"යි ශංසය කොටැ උරුවෙලායෙන් නික්මැ බාරාණසියෙහි ඉසිපතනාරාම යෙහි මිගදායෙහි වැඩැ හිඳැ පසුව ක්‍රමයෙන් ශරීරයෙහි බලගන්වා වෙසෙන මැදි පොහෝ දවස් අජපාල මූලයෙහි වැඩැ හිඳැ සුජාතා-වන්ගේ කිරිපිඬු පිළිගෙණැ නෙරඤ්ජරා නම් නදීතීරයෙහි දී වළඳා ගඩහායෙහි පාත්‍රය හැරැ ශුභ නිමිත්ත පරීක්ෂා කොටැ පාත්‍රය උඩුගං බලා ගිය කල්හි "එකානනයෙන් බුදුවෙමි"යි නිශ්චය කොටැ සල්වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි දෙවියන් සැදූ මඟින් බොධිමූලයට වැඩැ මහීකානනාව පලා ගෙණැ නැංගා වූ තුදුස් රියන් වප්‍රාසනයෙහි මනශ්ශිලා තලයෙහි හිඳගත් කෙශර සිංහයක්හු සේ වැජඹවමින් සඛී ය - මතඞ්ගී ය - පාතාල ය යන ත්‍රිභුවනය තුන් මහල් එක ගඳකිළියක් සේ පූජාමය කෙරෙමින්[2] වැඩැ හිඳැ පිඬු වූ තාක් දිව්‍ය බ්‍රහ්මයන් ලුහුබඳවා ගෙණැ ආවා වූ මරසෙනඟ පහනෙහි නැසී හෙත පලහුන් සේ තමන් වහන්සේ ගේ ප්‍රතාප යෙහි ගසා බිම් සැපිලියා[3] කොටැ මරහු නැති හිමිමෙඛලා නම් ඇත්හු අතින් පාරලිය වනයෙහි ඇත්හු කරණ වැදුම් පිදුම් සේ වූ වැදුම් පිදුම් ලදින් —

දහසක් අතින් දහසක් අයුධ ගෙණැ දිවූ වසවත් මරහු තමන්ගේ අනුපම සත්‍ය විලාසයෙන් ලුහුබඳවා ජයගෙණැ අරු-ණොදයයෙහි සවාසනා සම්කෙලෙසයන් නසා බුදු වැ ක්‍රමයෙන් සත්සති ඔවා අජපාලයෙහි වැඩැ හිඳැ දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනා පිළිගෙණැ ශ්‍රීපාදය වැඳැ ගෙණැ හොත්තා වූ, සනඞ්කුමාර මහා බ්‍රහ්මයාට ධර්මදේශනා කරණ බවට ප්‍රතිඥ දී ආලාර කාලාමයන් හා උද්දකරාම පුත්‍රයන් නැති බව දැනැ වදාරා "ඉනි'බ ආදි බණ කිවමනා පස්වග මහණුන්ට ය, ඔහු දැන් කොහි වෙසෙන්දෝ හෝ" යි පරීක්ෂා කොටැ —

1. ඉතිකින්. 2 පූජාණ්ඩරෙමින්. 3. සැලි ඵසා.

"බ්‍රාහ්මණඝෙහි-ඉඝිපත්තඝෙහි - මිගදූඝෙහි වෙසෙති"යි දූනෑ ශ්‍රීපාදයෙන් එතැනට වැඩැ ධම්මසභාරූඪ වැ මූළුලොව එක පැහැරැ අමාඝෙහි ගල්වමින්, ජාතිදූකට හිනි දෙමින්, ජරාදූකට සෙන හෙළමින්, ව්‍යාධි දූක් සහමූලිනුදුරමින්, මරණ දූකට අපුනර්භව ප්‍රතිකාර කෙරෙමින්, අෂ්ටාඞ්ගමාර්ගීය රාජමාර්ගීය කෙරෙමින්, ශාන්ති පුරයට අටලොස් කෙළක් මහබඹුන් වදනා උත්සව පුර කෙරෙමින්, අද දක්වා මින් ඔබ්බෙහි පස්වාදහසක් දක්වා වදුරන්නා තබා වදුළ පාළිය පොත් බලා පිරිවහන්නවුන් අතින් ඇසූ මා ඇතුළු වූ සියලු සතුන් දෂට ධම් වෙද්‍ය, අපරා පයී වෙද්‍ය, උපපද්‍ය වෙද්‍ය, සියලු සම්පත්හි හා යොදමින් වදුළා වූ **ධම්මක් පැවතුම් සූත්‍රය** අසා අග්‍ර ධම් දෙශකා අසා අමා මහ නිවන් පසක් කළ සෙයෙක.

"මෙසේ මේ ධම්ය තම් තමා පිරූ දවස් පටන් ගෙණ අමා මහ නිවන් දක්වා සත්ත්වයා අත් නො හැරැ සියලු ඉෂටයට මුල්ව සිටිනේඇ" යි දූනෑ තමා වෙන වෙන ම සැපතට උත්සාහ නො කොටැ සියලු සම්පත්හි වදනා **මහාමාර** තමුදු සියලු සම්පත්හි පිටිවතුරූ ගන්වන්නා වූ **අමෘතමහාමෙඝ** තමුදු මෙම ධම්ය යැ යි නිශ්චය කොටැ තමා සිහිකළ විට ම සුව ඵළවන්නා වූ ධම්රත්නය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

13. බොණ්ඩඤ්ඤ සථවිර කථා.

14. මෂමානවෂ කථා

තව ද දහම් සරණ යන්නා වූ සත්පුරුෂයන් විසින් ධම්ය තමා රක්නවුන් රක්නා පරිදි හා සියලු සම්පත්හි සාධා දෙන පරිදි හා අසා දූනැ දහම් සරණ යාමෙහි උත්සාහ වඩනා පිණිස මේ කථානන්තරය දක්වමි. ඒ සාවධාන වැ සගෞරව වැ ඇසිය යුතු.

හේ කෙසේ ද? යත්—

අතීතයෙහි මගධ රට මවල ගමැ එක් මාණවකයෙක් ගම ඇත්තවුන් කම්මන්ත කරණ තැනට ගොස් තමා සිටින තැනැ පස් පසින් සම කොටැ කටු – පහණ – කසළ ආදි වූ දූය දුරැ කොටැ රමණීය කොටැ ගෙණ සිටියේ අනිකෙක් එතැනට අවුත් ඔහු අතින් ඇනැ ගතා පියා[1] තෙමේ එතැනැ සිටැ ගත. හෙතෙමේ ඔහු කෙරෙහි වෙෂයක් නො කොටැ තමා සිටි තැනින් පහ වැ ගොස් අනික් තැනක් එසේ ම රමණීය කොටැ ගෙණ සිටියේ. එතැනැ සිටියා වූ ඔහුදු අනිකෙක් යතා[2] එතැනැ සිටැ ගත.

1. යවා පියා - භයා පියා. 2. යවා.

හෙතෙමේ ඔහු කෙරෙහිදු කොපයක් නො කොටැ අනික් තැනක් රමණීය කොටැ ගෙණැ සිටියේ. එතැනැ සිටියා වූ ඔහුදු අනිකෙක් යතා පියා සිවැ ගත. ඒ ඔහු කෙරෙහිදු කොපයක් නො කොටැ අනික් තැනක් ඉදිකොටැ ගෙණැ සිටියේ. මෙසේ ආ ආ මිනිස්සු ඔහුව ගෙඩි දී සිටි සිටි තැනින් නෙරපා පියා තුමූ තුමූ සිවගත්හ

හෙතෙමේ හැම හැම දෙනා කෙරෙහි ම මෛත්‍රී කොටැ "මා නිසා මෙතෙක් දෙන සුවසේ සිටියහ මේ මට මෙලොවින් පර ලොවින් ඉෂ්ට සාධා දෙන්නා වූ කුශල කර්මයක් වුව මැනවැ" සි සිතා දෙවන දවස් උදැසනක් සේ ම තැගී සිටැ උදැල්ලක් හැරැ ගෙණැ කලවිට මැඩිල්ලක් සා තැන් රමණීය කොටැ සම කෙළේ ය. එදවස් එතැන්හි බොහෝ දෙන අවුත් සිවගත්හ. ඒ තෙමේ එහි සිටියා වූ ඔවුන්ට සිත සමයෙහි සිත දුරුකරණ පිණිස හිති දල්වා දින.

ඉක්බිති "යහපත් තැනෙක් නම් හැමදෙනාට ම ප්‍රියවත. මා මෙතැන් පටන් ගෙණැ මහ මං සකස් කොටැ හැමද මැන වැ" සි සිතා උදැසනක් සේ ම තැගී සිටැ උදුරා හැරැ පියයුතු යනු මුල් ආදිය ද උදුරා - දුරුකටයුතු කටු පහණ ආදි දුරුකොටැ - මහ මං සම කෙරෙයි. ඔහු එසේ කරන්නාහු අනිකෙක් දැකැ "යහළු තොපි කරන්නේ කිමෙක්දැ" සි විමසා ලේ. හෙතෙමේ "මට සියලු සම්පත්හි සාධා දෙන්නා වූ සසරැ සිටිතෙක් මානයෙහි දෙව්ලොව හැරැ සිටුවන්නා වූ කෙළවරැ අමා මහ නිවන්හි සිටුවන්නා වූ සියලු සුවයට මූලකාරණා වූ මහ සම කෙරෙමි' සි කියා කිව.

ඒ අසා "මෙසේ වූ ඉෂ්ටයක් තොපි කරා නම් ඒ ඉෂ්ටය මට ත් වන බව යහපත් වේ ද? මම ත් තොප හා කැටි වැ මෙම ඉෂ්ටය සාධමි" සි හෙද ඔහු හා කැටි වැ එ ම කුශල කර්මය කරන්නට පටන් ගත එතැන් පටන් දෙදෙනා එක් වැ එ ම කුශල කර්මය කරන්නාහ. ඔවුන් දැකැ අනිකෙකුදු එසේ ම පටන් ගත. අනිකෙකුදු පටන් ගතැ සි දෙනිස් දෙනෙක් එක් වූහ ඔහු හ මදෙන හුදලු ආදිය හැරැ ගෙණැ මහ මං සකස් කරන්නා වූ යොදනක් යොදනක් තැන් යන්නාහ.

ඔවුන් මෙසේ කුසල් කරන්නවුන් දැකැ එගමට වැසි මහළු තැනැත්තෝ "මේ මනුෂ්‍යයෝ කොකට යුත්තෙහි යෙදී ඇවිදිනාහ. හැමදෙන ම මට වලින් මත්‍යමාංශාදීන් ගෙණෙත් නම් හෝ රා ඉදිකොටැ ගෙණෙත් නම් හෝ අනික් එබඳු වූ සුදුසු වූ කර්මානතයක්

කෙරෙත් නම් හෝ මට ත් කිසි ලාභයක් වන්නේයැ" යි සිතී ය. එසේ සිතා කුසල කම්යෙහි යෙදී වසන මිනිසුන් දැකැ කැදවා "කුමක් කොටැ ආවිදුදැ" සි විචාළේ ය.

ඒ අසා මනුෂ්‍යයෝ "සවාමීනි! අපි දෙව්ලොවට යන මහවත් ගෙළි කරම්හ" යි කිහ. ඒ අසා ගම් වැසිමහළු මනුෂ්‍යයෝ "මෙසේ වූ නො කටයුතු කුමක් පිණිස කරා ද? වලින් මාංශාදිය නෝ ගෙණෙව මැනව සුරා කම්‍මන්තාදී හෝ කළ මැනවැ" සි කිහ.

ඔහු කී අනාථ බස් නො ගිවිස්සහ. ඒ නැවත නැවත කියා ද ගිවිස්සා ගත නොහී රජ්ජුරුවන් කරා ගොස් "සවාමීනි! බොහෝ සොරු එක් වැ ගෙණැ ගම් පැහැරී ඇවිදිනි" සි කී ය. "ඔවුන් අල්ලා ගෙණැ එව" සි කී කලැ අල්ලා ගෙණැ ගොස් රජ්ජුරුවන්ට පැහ.

රජ්ජුරුවෝ කිසිවක් නො විචාරා ම "මද නැති ඇතුන් ලවා තුලුන් මඩවා පියව" සි කිහ ඒ අසා හැමදෙනාට වැඩි මහළු මනුෂ්‍ය නම් මාණවක තෙම සෙස්සවුන්ට "දරුවෙනි! අපට මෙ තැනට මෛත්‍රී මුත් අනික් සරණෙක් නැත. තෙපි කිසි කෙණෙකුන් කෙරෙහි ත් කෝප නො කොටැ අප මරවන රජ්ජුරුවන් කෙරෙහි ද අප නො කළ වරද කළහ සි කී ගම් වැඩිමහල්ලා කෙරෙහි ද, අප මඩනට දිවන ඇතු කෙරෙහි ද, අප අපගේ ආත්ම යෙහි ද සම සිත්ව" සි කියා ඔහු මෙසේ ම මෛත්‍රී කරන්නට පටන් ගත්හ.

ඉක්බිති ඔවුන් පිළිවෙළින් සිටුවා මතැත්හු මෙහෙයුහු. මදයෙන් අඬ වැ, සුරා පානයෙන් දියුණු වූ ක්‍රොධ ඇති ඒ ඇත්තෙම තමාගේ සෙය තමා අන්මින්, ඇත් ගොවුවන් ලුහුබදවම්න් බලවත් වූ වෙග යෙන් දිව ගත්තේ ඔවුන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් විදුරු පව් වෙක්හි ගැසී නැවැත්තාක්හු සේ මහත් වූ ය කතයමෙක්හි ඇනී සිටියක් සේ සිටියේ.

රජ්ජුරුවෝ එපවත් අසා "බොහෝ මිනිසුන් දැකැ භයින් නොවන්නා වනැ" යි මොවුන් වෙන වෙන ම කළාලින් වසාලා මඩවා පියව" සි කිහ. ඒ අසා ඔවුන් කළාලින් වසා ඇතුළ ලා ලූහ. ඔහු ද ආදියට වඩා ලා දියුණු වූ මෛත්‍රී කළහ. ඇත් ආදිවිටට වඩා ශත සහස්‍රගුණයෙන් පසුබස්නට වන

රජ්ජුරුවෝ එපවත් අසා "මේ කාරණයක් වූවමැනවැ" සි ගෙන්වා ඔවුන් නොසොර බව ත් සුවරිතයෙහි තත්පර වැ වසන බව ත් ගම්මුදලිහු වෛරයෙන් කී බවත් අසා "දරුවෙනි! තොපගේ ගුණ තිරිසන් වූ ඇත් පවා දන. මිනිස් වූ ඇපි දැන ගත නුහුනුවම්හ.

අප නො දූනෑ කළ වරද ක්‍ෂමා කරව" යි ක්‍ෂමා කරවා ගම්මුදලිහු ඔවුන්ව ගැති කොටැ දී, ඇත්හූ ඔවුන්ට නැඟෙන්ට ප්‍රසාද කොටැ දී, එම ගම ද ඔවුන්ට ධර්‍ම පූජා කොටැ දින.

ඔහු මෙතෙක් ධර්‍ම පූජා ලදින් "මේ අපට අප ගේ සුචරිත බලයෙන් ඉහ ජාතියෙහි ම ලද්දා වූ සම්පත්තිය. එහෙයින් අපට මෙතෙක් සම්පත්තියට කාරණා වූ කුශලකර්‍ම නො පමාව කළ මැනවැ"යි දියුණ දියුණා කරන්නට පටන් ගත්හ. මෙසේ ධර්‍මය නම් ඉහ ජාතියෙහි ම සත්ත්‍වයා හට රාජ භය ය ~ හස්ති භය ය- මරණ භය ය යනාදි වූ සියලු භය දුරු කොටැ සියලු සම්පත්ති ළඟවන්නේ ය"යි දන්නා වූ සත්පුරුෂයන් විසින් කුශල කර්‍මයෙහි ප්‍රමාද නොවී මහ පොළොවට වඩා සත්ත්‍වයා හට පිහිට වූයේ ධර්‍මය ම යැ යි දූනෑ ක්‍ෂණයෙකින් ම සියලු අභිමතාර්‍ථ සාධා දෙන පිණිස **දහම් සරණ** යා යුතු.

මෙසේ මේ ජාතියෙහි ම තමන් කළ කුසල්හි පල ලද්දා වූ ඒ දෙතිස් දෙන වාරයෙන් වාරයෙහි ඇතු නැඟී යන්නාහු "ඉහ ජාතියෙහි කළ කුසල් පල ලද්දා වූ අප අප්‍රමාද නොවැ වඩා වඩා කුසල් කළමනා වේ ද? එ හෙයින් අපි හැම දෙන ම එක් වැ ගෙණැ සතර මං සඟියෙහි බොහෝ දෙනා සැතපෙන්නට සුදුසු වූ ශාලාවක් කරවම්හ"යි මන්ත්‍රණය කොටැ කර්‍මාන්ත දන්නා වූ වඩුවකු කැඳවා ලා ශාලාවක් කරවන්නට පටන්ගත්හ. ගැහැණුන් කෙරෙහි අධික වූ ඇල්මක් නැති හෙයින් කරවන ශාලාවෙහි පින් ගැහැණුන්ට නුදුන්හ.

මඝ මානවකයන් ගේ ගෙයි **නන්දා** ය - **චින්ත්‍රා** ය- **සුධර්‍මා** ය - **සුජාතා** ය යන අඹුවෝ සතර දෙනෙක් ඇත. ඔවුන් අතුරෙන් **සුධර්‍මා** නම් අඹු තොමෝ ශාලාවෙහි කර්‍මාන්ත කරන්නා වූ වඩුවා හා මන්ත්‍රණය කොටැ "බැණෙනි! මේ තඟන්නා වූ ශාලාවට මා නායක කොටැ ගණුව"යි කියා අත්ලස් දුන - ඒ "යහපතැ"යි කියා ගිවිසැ පළමු කොටැ ම කැණී මඩලයට ගන්නා වූ දූවය දිය බහා වියලා ගෙණැ, සැස පියා, විද පියා, කැණී මඩල ඉදිකොටැ "මේ ශාලාව **සුධර්‍මා** නමැ"යි කැණී මඩලෙහි අකුරු කොටා කඩෙකින් වසා තබා ශාලාවෙහි කර්‍මාන්ත කරවන මාණවකයන් කැඳවා "මම මෙතෙක් දවස් සිහි නැති වැ කැණී මඩලෙහි සඩරූප නො කිමි. ඉතිඛ අලුත් දණ්ඩක් කපා කැණී මඩලයක් කොටැ ගන්ට කල් නැත - පෙර ම කොටැ තුබූ කැණී මඩලයක් ඇති තැනෙකින් සෙව්ව මැනවැ"යි කියා.

ඔහු සොයා ගෙණැ යන්නා වූ සුධම්මාවන් ගේ ගෙහි කැණි මඩලක් දැකැ දහසක් දී ඉල්වූහ. හෝ තොමෝ දහසකට කොදී "මට ශාලායෙහි පින් දෙවි නම් කැණි මඩල දෙමි"යි කිව. ඒ අසා ඔහු "අපි ගැහැණුන්ට පින් නො දෙමිහ"යි කිහ. ඒ අසා වඩු තෙමේ "බඹලොව තබා සෙසු ගැහැණුන් නැති තැනෙක් නැත. ගැහැණුන් කුසල්හි එක් නො කරන්නේ කුමක් පිණිස ද? පින් දී කැණි මඩල ගත මැනවැ"යි කිහ ඒ අසා ඔහු කැණි මඩල ගෙණැ ශාලාව නිමවා තුණක් කොටැ බෙදා එක් භාගයෙක්හි අනාථයන් වසන තැනක් ඉදිකළහ එක් භාගයෙක්හි සුව පතුන් වසන තැනක් ඉදිකළහ. එක් භාගයෙක්හි රෝගීන් වසන තැනක් ඉදිකළහ.

දෙනිස් දෙන ම දෙනිස් කොළඹුවක් තබා "ඇතුළට ආගනතුක යෝ අවුත් යමක්හු ගේ කොළඹුවෙහි හුන්නෝ වී නම් ඔවුන් උන් ගේ ගෙටම ගෙණ යා" යි සංඥකළහ.

ඉක්බිති එකී පරිද්දෙන් ඇරැගෙණැ ගිය කල්හි තමන් තමන් ගේ කොළොඹුවෙහි හුන්නවුන්ට තුමූ තුමූ උපසථාන කරන්නාහ. **මඝමාණවකයෝ** ශාලාවට නුදුරු තැන්හි කොබෝ ලීල ගසක් හිඳුවා ඒ මුලැ බොහෝ දෙනා හිඳිනට පහණක් ලූහ

ඉක්බිති **නන්දු** නම් අඹු **සුධම්මා** නම් අඹු තොමෝ තමන් ගේ ශාලාවට හිමි වැ හත්තාහ. "මාත් එක් කුශලයක් කළ මැනවැ"යි සිතා ශාලාවට වනුවන්නන්[1] පැන් බොන පිණිස තමන් ගේ නමින් **නන්දු නම් පොකුණක්** බිඳුවූහ.

චිත්‍රා තොමෝ "මා කළමනා කිම් දෝ හෝ යි සිතන්නී ශාලාවට වැද සැතපී යනවුන් මල් පලැඳැ යන පිණිස මල් වත්තක් කරවූව.

සුජාතාවෝ තොමෝ ඉතිරියන් කුසල් කවදී මඝමාණවක යන් ගේ කැදිමසිලන් දරු අඹු වෙමි. උන් කළ කුසල් මට එන්නේ වේදැ"යි කිසි කුසලක් නො කළාහ.

මෙසේ මඝමාණවකයෝ මවුන්ට උපසථාන කිරීම ය – පියන්ට උපසථාන කිරීම ය– කුලෙහි වැඩියන්ට ආදර කිරීම ය – සබා බස් කිම ය – නො රළු කොටැ බිණීම ය – කේලාම් නො කිම ය – මසුරු නොවීම ය – වෙහි නො වීම ය – යන මේ කුශලධම් සතෙහි යෙදී ඒ ජාතියෙන් චුත වැ නිදා පුබුදු එකක්හු සේ තව්තිසා දෙව්ලොව ශක්‍රදෙවෙන්ද්‍ර වැ උපන්හ

---

1. අවුවන් — අවතුන්.

මෙසෙයින් "කුසල් තම් දෙය කළ ජාතියෙහිදු සියලු උපද්‍රව දුරු කොට සුව විඳ දෙවන ජාතියෙහිදු කැමති සම්පත්හි සාධා දෙන බව දත්තා වූ සත්පුරුෂයන් විසින් ධර්මය මුත් සත්ත්වයා හට අනික් සරණයෙක් නැතැ"යි දූතැ ඉන්ද්‍රජාලයෙහි පෑනා දෙයක් සේ සියලු අභිමාතාථ වහා සාධන පිණිස **දහම් සරණ** ඝා යුතු.

මේසේ ඔහු ශක්‍ර දෙවෙන්ද්‍ර වැ උපන් කල්හි ඔහු හා කැවි ව කුසල් කළ මිත්‍රයෝ ද එහි ම දිව්‍ය පුත්‍ර ව උපන්හ. මොවුන්ගේ නියෝගයෙන් ශාලාව කළා වූ වඩුතෙමේ විශ්වකර්ම දිව්‍ය පුත්‍ර ව උපන.

එ සමයෙහි තව්තිසා භවනයෙහි අසුරයෝ වසන්නාහ. "ඔහු අභිනව දිව්‍ය පුත්‍රයෝ උපන්හ" යනු අසා දිව්‍ය සුරාපන සැදූහ. ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ තමාගේ පිරිස කිසිවක්හු නො බොන පිණිස සංඥ කෙළේ ය අසුරයෝ පානයෙන් මත් වූහ.

ශක්‍රයා "මොවුන් හා එක් වැ වළඳන රාජ්‍යයෙන් මට ප්‍රයෝජන කිම්දැ' යි පිරිසට ඉඟි කොට ඔවුන් කකුල් අල්වා මහා සමුද්‍රයෙහි ගස්වා පියා ඔවුන්ගේ කුසල්හි ආනුභාවයෙන් මහමෙර යටැ **අසුර විමානය** පහළ වි ය. ශක්‍රදෙවෙන්ද්‍රයාට ගිය ජාතියෙහි මස මාණවක කලැ කළ සුචරිතයෙහි ආනුභාවයෙන් දසදහසක් යොදුන් **තව්තිසා** දෙව්නුවර පහළ වි ය.

ඒ දෙව්නුවර මැදෙහි ගිය ජාතියෙහි මිනිසුන් සැතපෙන්නට ශාලාව කැරැවූ අනුභසින් තුන්සියයක් යොදුන් උස ඇති ධවජ යෙන් හොබනා වූ සත්සියයක් යොදුන් උස ඇති වෛජයන්ත ප්‍රාසාදය පහළ වි ය. එහි රතයටැ මැණික්මය දද කෙළනේ ය. පබලුමය යටැ මුතු දද කෙළනේ ය. මුතුමය යටැ පබලුමය දද කෙළනේ ය. සත්රුවන් යටැ සත්රුවන් දද කෙළනේ ය.

මෙසේ ශාලායෙහි අනුසසින් සපත රතනමය වූ වෛජයන්ත ප්‍රාසාදය පහළ වි ය. මිනිසුන් සැතපෙන්නට හිඳුවාලූ කොඛෝලිළ ගස අනුසසින් සිසාරා යොදුන් සියයක් පමණ වට ඇති පරසතු රුක පහළ වි ය. ඒ ගසමුලැ මිනිසුන් සැතපී හිඳිනට ලූ ගල අනුසසින් පරසතු රුක්මුලැ දිග සැටයොදුන් පළල පණස් යොදුන් බොළ පහළොස් යොදුන් **පාණ්ඩුකම්බල ශිලාසනයෙක්** පහළ වි ය

මනුෂ්‍යලොකයෙහි සිටි සමයෙහි ඔවුන්ගේ නියෝගයෙන් යාවකයන් පිටින් ගෙණ ගිය ඇත් **ඓරාවණ** නම් දිව්‍ය පුත්‍ර වැ උපන. හෙතෙමේ ශක්‍රයා උඩන් කෙළනට යන කලැ දෙනිස් දෙනා හිඳිනට ගවු ගවු පමණ වට ඇති දෙනිස් කුඹක් ම වන්නේ ය.

මෑද ශක්‍රදෙවෙන්ද්‍රයා හිඳිනට සුදර්ශන නම් වූ නිස්යොදුන් වූ කුඹක් මවන්නේ ය. ඒ කුඹ මත්තෙහි දෙළොස් යොදුන් රුවන් මණ්ඩපයක් මවන්නේ ය. හෙතෙමේ ධ්වජපතාක - කිංකිණික ජාලාදී වූ නොයෙක් අලඞ්කාරයෙන් හොබනේ ය.

මණ්ඩප මධ්‍යයෙහි යොදුනක් පමණ මිණි පලහක් වන්නේ ය. වෙරාවණ තෙමේ මේ දෙනිස් කුඹින් එකෙකි කුඹකට දළ සත සත ම වන්නේ ය. එහි එකෙකි දළ පණස් පණස් යොදුන් දිග ඇත්තේ ය. එහි එකි දළ සත් සත් දිවපොකුණු වන්නේ ය. එකෙකි පොකුණෙහි සත් සත් නෙලුම් ගස ය. එකෙකි ගස්හි සත් සත් නෙලුම් මල එකෙකි මල්හි සත් සත් පෙති ය එකෙකි පෙත්තෙහි මධුර වූ නෘත්‍ය ගීත වාද්‍ය පවත්වන්නා වූ දිව්‍ය ස්ත්‍රිහු සත් සත් දෙනා ය. මෙසේ හාත්පසින් පණස් යොදුන් පමණ තැන්හි ඇතුගේ දළුන් එක රහමඬල වන්නේ ය.

මෙසේ ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ බුදුතුඹෙකිනුදු කියා නිමවා පිය නොහැකි සම්පත්හි නිබඳ කොවැ තුන් කෙළ සැට ලක්ෂයක් හවුරුදු අනුභව කරන්නේ ය. මහමං හැමදෑ එක ශාලාවක් නම්, එක පොකුණක් කරවා, මහිතට උපස්ථාන කළ මාත්‍රයෙකින් ශක්‍ර දෙවෙන්ද්‍ර වැ උපන්නා වූ ඔහු ලද්දා වූ සම්පත්හි ඇසූ සත්පුරුෂයන් විසින් සියලු සත්ත්වයාහට ධර්ම්ය මුත් අනික් සරණක් නැතැයි නිශ්චය කොවැ මෙලෙවින් - පරලොවින් නිවන් හිමි පහරවා සියලු සම්පත්හි සාධා දෙන පිණිස **දහම් සරණ යා සුතු.**

සුධර්ම්මා ද මිය ගොස් එම තවතිසා භවනයෙහි ම උපන. එ සම යෙහි නවසියයක් යොදුන් පමණ **සුධර්ම්මා** නම් වූ දිව්‍ය සභාව පහළ වී ය. සියලු දිව්‍ය ලොකයෙහි ඒ දිව්‍ය සභාවට වඩා රමණීය වූ අන් ස්ථානයක් නැත. මසින් මසට අට දවසක් බණ ඇසීම ද එහි ම පවත්නේ ය. **නන්දා** ද මිය ගොස් එහි ම උපන. ඇ ගිය ජාතියෙහි කැණවූ[1] පොකුණ පහළ වී ය. **චිත්‍රා** ද මිය ගොසින් එහි ම උපන. ඇට ද ගිය ජාතියෙහි කැරැවූ මල්වත්තෙහි අනුසසින් පන්සියයක් යොදුන් පමණ **චිත්‍රලතා වනය** පහළ වී ය.

සුජාතාවෝ වනාහි මියැ ගොසින් තමා විසින් කළ තෙපු කුසලයක් නැති හෙයින් එක් පළිතයක් අස කඳුරෙක්හි කණ කෙකිනි වැ උපන. ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ තමන්ගේ පරිවාර ස්ත්‍රීන් බලා - **සුධර්ම්මා** ය-**නන්දා** ය-**චිත්‍රා** ය යන තුන්දෙනා දැකැ සුජාතා කොයි ගොසින් උපන් දෝ හෝ" යි කියා බලන්නේ ගිය ජාති

1. කැරවූ

යෙහි කුසලක් නො කොට කණකෙකිනි වැ උපන් බව දැක "ඇ ලමා ත් කුසල් කරවා මෙහි උපදවා ගතමැනවැ" යි සිතා තමන්ගේ ශක්‍රාත්මභාවය හැර අනික් වෙසක් මවා ගෙණ ඒ කණකෙකින්න හුන් තැනට ගොස් "තෝ මෙහි කුමක් කොට වෙසේදැ" විචාළේ.

හෝ තොමෝ "සවාමිනි! තොපි කවුරුදැ යි විචාළා ය. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම "මම ගිය ජාතියෙහි තිව සැම් වූ **මඝ මානවක යෙමි**" කිව. ඒ අසා කණකෙකිනී "සවාමිනි! තෙපි කොයි උපනුදැ" යි විචාළා. ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ "මම ගිය ජාති යෙහි කළ කුසලින් තව්තිසා භවතයෙහි අසාධාරණ වූ සමපත්ති ඇති ශක්‍රදෙවෙන්ද්‍ර වැ උපනිමි.

නී හා කැටි වැ මව අඹු වැ විසූ **සුධම්මාව** හා **නන්දාව** හා **චිත්‍රාව** හා උපන් තැන් දන්නිදැ" යි කියා "තො දන්මි. සවාමිනි" යි කී කල්හි "ඔහු ද තමන් කළ කුසලකම්යෙන් මියැ මව අඹු වැ දිව්‍යස්ත්‍රී වැ උපන්හ. ඔවුන් බලන්නට වරෙ යි ඇ අත්ලෙහි හිදුවා ගෙණ ගොස් නන්දා නම් පුෂ්කරණි තෙර හිදුවාලා අනික් තුන්දෙනා කරා ගොස් සුජාතාව කුසල් නො කොට වූ නියා බලව" යි පැහ.

ඔහු ද "ගිය ජාතියෙහි කුසල් නො කොට ශරීර මණ්ඩනය ම කොට ලත් තුඹ ත් බලව. නිය මට කළ පයක් බලව" යි යනාදීන් වෙහෙසන්නට පටන් ගත්හ. හෝතොමෝ ශක්‍ර දෙවෙන්ද්‍රයා ආවවුට "මොහු මා වෙහෙසති. මා ගෙණ ගොස් මගේ පොකුණෙහි ම ලා පියව" යි කිව. ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ ඇ පොකුණෙහි හිඳවාලා "නිගේ යෙහෙළියන් කුසල් කොට දෙව්ලොව්හි උපන්බව දුටු බැවින් තෝ ද මා කී අවවාදයක් කොට පන්සිල් රක්ෂාකර" යි පන්සිල් දී ගියේ.

හෝ ද තමා ගත්තා වූ පඤ්චශීලයෙහි අප්‍රමාද වැ එතැන් පටන් ගෙණ මළ මසුන් මුත් නොමළ මසුන් නො කයි. ශක්‍ර තෙමේ ඇ පරීක්ෂා කරණ පිණිස මළමස් වෙස් මවා ගෙණ හොත්තේය. "කණකෙකිනි මේ මළ මසෙකැ" යි ගලන්නට පවන් ගත. එසමයෙහි නකුට සලා ලීය. හෝතොමෝ නො මළ වනැ" යි හළ. නැවත ඇගේ අභිමුඛයෙහි බඩ පැලා හොත. නැවත හෝතොමෝ ගලන්නට වත.

හේතෙමේ උගුරට වදනා කලැ නගුට සලාලී ය. එවිට හැරපුව. මෙසේ ඇ පරීක්ෂා කොට ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ දිව්‍යාත්ම භාවයෙහි සිටැ නී මම පරීක්ෂා කරන්නට ආමි" සී මෙසේ ශීලය

රක්ෂා කෙරෙහි නම් නො බොහෝ කලකින් දිව්‍යලොකයෙහි මා සමීපයෙහි ම උපදනේ වෙහිදැ" යි කියා හිඳේ. හෝ ද මළමසුන් ලැබීම් දුලීහ හෙයින් ආහාර නො ලදින් මියැ තමා රැකි සිලයෙහි අනුසසින් තිරිසන් යොනියෙන් ගැළ වී බාරාණසියෙහි කුඹල් ගෙයක කුඹලකුට දුව වැ උපන.

ඇ පහළොස් සොළොස් හැවිරිදි වියට පැමිණි කල්හි ශක්‍ර දෙවෙන්දුතෙමේ "කොයි උපන්දෝ හෝ යි පරීක්ෂා කරන්නේ "කුඹල් ගෙයි උපන් බව දුනැ මා දුන් ඔබ ගිය මැනවැ" යි සිතා කැකිරි පල සේ සත්රුවන් ගැලක් පුරා ඒ ගැල පැදැ ගෙණැ බාරාණසියට වැදැ "කැකිරි ගන්ව" යි හඬගහා මිලගෙණ ආවන්ව "මම අනික් මිලයකට නො දෙමි. පන්සිල් රක්නා කෙණෙකුන් ඇත දෙමි" යි කියා කුඹල්දුව අවුදින් "සිල්රක්න කෙණෙකුන්ට දෙතගොත් මට දුන මැනවැ" යි කී කල්හි තී පිණිස ම මා ගෙණා ධනය" යි සත්රුවන් ඇව දී තමා ශක්‍රදෙවෙන්ද්‍ර බව දන්වා "අප්‍රමාද වැ සිල් රක්ෂා කරව" යි කියා දෙව්ලොවට හිඳේ.

හෝ තොමෝ ඒ ජාතියෙහි අඛණ්ඩ පඤ්චශීලය රක්ෂා කොටැ එයින් චුත වැ තමා රැකි ශීලයෙහි අනුසසින් අසුර භවනයෙහි අසුරෙන්ද්‍රයාහට දුව වැ සියලු අසුර භවනයෙහි තමා හා සම වූ රූපයක් ඇති අනික් සත්‍රියක් නැති වැ සියලු සම්පත් තින් සමෘර්ධ වුව. හිය ජාතියෙහි නො කළ කුසලින් කණ කෙකිනි වැ ඉපදැ අමු කුඛම්සසන් කා ජීවත්වෙමින් සත්පුරුෂ යන්ගේ අවවාද පිළිගෙණැ රක්ෂා කළා වූ සීලයෙහි අනුසසින් ක්‍රමයෙන් මේසා සම්පත්තියක් ලද බැවි ඇසූ සත්පුරුෂයන් විසින් ලොකයෙහි සත්ත්වයාහට ධර්මය මුත් අනික් පිටිවහලෙක් නැතැ" යි නිශ්චය කොටැ සියලු ඉෂ්ටඵව සියලු සම්පත්තියට සියලු සන්තොෂයට සියලු අධිපත්‍යයට මූලකාරණ වැ සිටියා වූ ධර්මය අපට සරණය යි නිශ්චය කොටැ **දහම් සරණ යා යුතු.**

ඉක්බිති ඇගේ පිය වෙපච්චිත්ති නම් අසුරෙන්ද්‍ර තෙමේ විවාහ පිණිස ආ අසුරයන්ට "තෙපි මාගේ දියණියන්ට නුසුදුස්සව"යි ඇ කිසිවක්හට නො දී "මාගේ දියණියෝ තුමූ ම තමන් හට සුදුසු සැමි කෙණෙකුන් සොයා ගණිති" යි කියා අසුර සෙනාව රැස් කරවා "තෙපි ම නොපට සුදුසු කෙණෙකුන් සොයා ගන්ව" යි කියා ඇ අතට මල්දමක් දින,

එකෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ "සුජාතා කොයි උපන් දෝ හෝ" යි බලා එපවත් දැනැ "ඇ දැන් මා ගොසින් ගෙණෙව මැනවැ" යි මහලු අසුර වෙසක් මවා ගෙණැ පිරිස් කෙළවර සිටියේ.

හෝ තොමෝ "නමාව සුදුසු සවාමියකු සොයමි" යි ඔහු දැකැ ගිය ජාතියෙහි වූ පුරුදුකමින් ඇති වූ බලවත් වූ සෙනහස චතුරක්සේ මැඩැ ගෙණැ එත් එත් "මව සුදුසු සවාමිහු නම් මොහුම යැ" යි අතැ තුබූ මල්දම ඔහු කර බහාලූහ. අසුරයෝ ද "අපගේ රජ්ජුරුවෝ මෙතෙක් දවස් අප නුසුදුස්සහ යි නුදුන්හ දැන් දියණියෝ තමන්ගේ මුත්තණු කෙණෙකුන් වැනි මහල්ලා සුදුස්සායැ යි තෝරා ගත්හ. මෙහෙමය[1] උන් සුදුසු" යැයි අප හාස කෙරෙමින් නික්මුණාහ.

ශක්‍රදෙවෙන්ද්‍රයා ද සුජාතාවන් අත අල්වා ගෙණැ ආකාශගව පැන නැඟී ශක්‍රාත්මය මවා ගෙණැ මම ශක්‍රදෙවෙන්ද්‍රයා යැයි හඬ ගසා පියා නික්මිත. ඒ හඬ අසා අසුරයෝ "අප බැඳි ය – ඔහු ගණුම්හ" යි සියලු අසුර සෙනාව ගැරැ ගෙණැ ලුහුබඳවා ගත්හ. ඒ වේලෙහි **මාතලි** සඞ්ගාහකතෙමේ **වෛජයන්ත** රථය සදා ගෙණැ අවුත් අතරමග සිට ගත ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ රථයට නඟා ගෙණැ තව්තිසා පුරයට අභිමුඛ වැ නික්ම ගත.

එසේ අසුර භයින් දුවන්නා වූ ශක්‍රයා හිඹුල්වනයට ලඟ වැ ගිය ක්‍ෂණයෙහි වෛජයන්ත රථයෙහි සක්හඬ ඇසූ ගරුඬ පොතකයෝ භයපත් ව හඬන්නට පටන් ගත්හ. ශක්‍රතෙමේ හඬන ගරුඬ පෝතකයන්ගේ ශබ්දය අසා "මේ කුමක්දැ" යි විචාරා "රථයක හඬ අසා භයපත් ව හඬන්නා වූ ගරුඬ පොතකයන්ගේ ශබ්දය" යනු අසා "මා හුදකලා එකක්හුගේ ජීවිතය පිණිස මෙතෙක් දෙනාට දුක් කුමක් පිණිස දෙමි ද? මාගේ ජීවිතය නැසී ත් මොවුන්ට භය දුරුවන බව යහපතැ" යි සිතා මාතලීහට "මාතලිය! අනුන්ට දුක් දී රක්‍ෂා කරන්නා වූ ජීවිතයෙන් අපට ප්‍රයෝජන නැත. රථය මේ මහින් වළකා අසුරයන් දිසාවට ම මෙහෙයව" යි කීය.

ඒ අසා මාතලිතෙමේ දහසක් සෛන්ධවයන් යෙදූ වෛජයන්ත රථය පෙරළා අසුර සෙනාව අභිමුඛ කොටැ පැලී ය. පස් සෙනි දිවන්නා වූ අසුර සෙනාව වෛජයන්ත රථය පෙරළී දිවන්නා දැකැ "අසුර පුරයෙහි පවත් ගෙණැ බිඳීගියා වූ රථය

1. මෙහමය.

පසු නො බලා දිවැ දැන් පෙරළී සිටගත. තියතයෙන් ම දිව්‍ය සෙනාව අවන්හ'' යි බිදී ගොස් එකපැහැර අසුරපුරයට ගොස් රථය දිසාව පෙරළී බලන්නට ද නො පොහොසත් වූහ. ශක්‍ර දෙවෙන්ද්‍රයා ද සුජාතාවන් දෙව්ලොවට ගෙණැ ගොස් අඩුතුන් කෙළක් අඹුවන්ට අගතැන්හි තැබී ය.

හෝ ද ශක්‍රදෙවෙන්ද්‍රයා කරා එළඹැ ''සවාමීනි! මට මේ දිව්‍ය ලොකයෙහි මවුපිය කෙණෙක් වත් බැහැණ බුහුතන් කෙණෙක් වත් නැත. නුඹ වහන්සේ යම් තැනකට වඩනා වේලෙහි මා ගෙණැ මුත් නො වැඩිය මැනවැ'' යි වර ඉල්ලුව. හෙතෙමේ ''යහ පතැ'' යි ප්‍රතිඥ දින. මෙසේ වසන සමයෙහි අසුරයෝ අප වසන්නේ දිව්‍ය පුරයෙහි ම යැ යි සිතන්නාහු චිත්‍රපාවලි වෘක්ෂ යෙහි මල්පිපී යන්නාහ. ''මේ දෙවිලොව නොවනැ යි ශක්‍රයා අප බැඳිවන. ඔහු ගොසින් ගණුම්හ'' යි සෙනාව හැරී ගෙණැ නික්මුණාහ.

ශක්‍රදෙවෙන්ද්‍රතෙම එතැන්හි මුහුදු දියෙහි නයින් රැකවල සිටිවි ය. ඉක්බිත්තෙන් ගුරුළුන් සිටිවි ය. ඉන් මත්තෙහි කුමහාණඩයන් සිටිවි ය. ඉන් මත්තෙහි සතර දිගැ සතර වරම් මහරජ්ජුරුවන් සිටිවි ය. **චතුනියා** භවනයෙහි නුවරැ දෙරැ වජ්‍රායුධ ගත්තා වූ තමා වැනි වූ ශක්‍රප්‍රතිමා සිටිවි ය. අසුරයෝ කෙතෙක් ජය ගෙණැ අවි නමුදු **ඉන්ද්‍රප්‍රතිමා** දුටු පස්සෙහි බලා පියන්නට අසමර්ථ වැ බිදී ගොසින් ශක්‍රයාහට ජය ගෙණැ දෙන්නාහ.

මෙසේ මේ ශක්‍රයා ගිය ජාතියෙහි **මඝමාණවක** වැ තමා සිටිනට පහයා ගත් තැන සිට පිය නොහී අනුන් අතින් ගෙඩි කැ පරිදි කෙසේ ද? දුහි වැ මහ මං හැමදෑ කළා වූ සුචරිතයෙහි බල යෙන් ලද්දා වූ දෙදෙව් ලොව සමපතනි හා ප්‍රසාද හා උයන් හා පොකුණු හා අඩුතුන් කෙළක් අඹුවන් හා රථ හා හසුනින් හා සියලු සමෘර්ධින් ඇසු සත්පුරුෂයන් විසින් උපන් සත්ත්වයාගේ සුව විඳිනට ධර්මය මුත් අනික් ගත්‍යන්තරයක් නැති බව දැන සියලු සුව එයින් ම සිද්ධකොටැ සියලු අභිමතයට එම පමපත් වාර තක්ෂත්‍ර කොටැ අනවරතයෙන් **දහම් සරණ** යා යුතු.

තව ද සුචරිත ධර්මය සත්ත්වයා රක්ෂා කරණ පරිදි දන්නා කැමති සත්පුරුෂයන් විසින් මද ධර්මයෙකින් බොහෝ රක්ෂා හා බොහෝ වූ සමෘද්ධි හා වන බව දිව්‍ය සමපත්තියෙන් හා ආයු ශක්ති යෙන් හා පිරිහී ආ ශක්‍රදෙවෙන්ද්‍රයා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ

ශ්‍රී පාදය වැඳැ හෙණැ හොත් සුවරිත මතයෙකින් ලද්දාවූ යුත් කෙළ සැට ලක්‍ෂයක් අවුරුද්දට ආයු හා දෙදෙව්ලොව දිව්‍ය සම්පත්හි හා තුදුස් කෙළක් ප්‍රාණීන් හා කැටුවැ ලද්දාවූ අමෘත මහා නිර්‍වාණසම්පත්හි හා අසා —

ප්‍රාණ චිතාශයෙක් තුබූ තැනෙක්හි සම්පත්හි පිරිහීමක් වන්නට තුබූ තැනෙක්හි සංසාරයෙන් ගැළවෙන්නට සුදුසුවූ උපායන්තරයක් සිත්න තැනෙක්හි එළඹැ සිටි අන්තරාය දුරුකරන්නට සුදුසුවූ ද පිරිහෙන සම්පත්හි සථිර කොටැ ලන්නට සුදුසුවූ ද සසර පමණින් නුහුන්විරු අමෘතමහා නිර්‍වාණ රසය අනුභව කරන්නට සමර්‍ථවූ ද සද්ධර්‍මය ම අපට සරණ යැ යි එකඟ සිතින් ඇදහිලි ඇති සිතින් **දහම් සරණ යා යුතු.**

මෙහි ශක්‍රදෙවෙන්ද්‍රයා ආයුශක්තියෙන් පිරිහී දිව්‍ය සම්පත්හියෙන් පිරිහී අවුත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳ තමාගේ සම්පත්හි නැවත ලදින් අමෘතමහා නිර්‍වාණ රසා'නුභව කොටැ නිර්‍වෘති සැනහී අනිමිතාර්‍ථ සාධාගත් පරිදි කෙසේ ද යත් —

එක් සමයෙක්හි ධර්‍මස්වාමී වූ ධර්‍මධ්වජ වූ දෙවාතිදෙව වූ ශක්‍රාභිශක්‍ර වූ බ්‍රහ්මාභිබ්‍රහ්ම වූ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ගෞතම ගොත්‍ර යෙහි උපන් අනාවරණඥාන ඇති සර්‍වාර්‍තදරුවානන් වහන්සේ මගධ ජනපදයෙහි **රාජගහානුවරම** පැදුම් දික්හි **අම්බසණ්ඩ** නම් බමුණු ගමට උතුරු දික්හි **ඉන්ද්‍රසාල** නම් ගුහායෙක්හි වැඩවසත සෙයෙක. එ සමයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයා හට "සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රීපාදය දැකැ නිර්‍වෘති සැනහී ගත මැනවැ" යි අභිප්‍රායයෙක් ඇති විය.

මෙහි **ශක්‍රදෙවෙන්ද්‍ර** තෙමේ සර්‍වඥයන් වහන්සේ බොහෝ සේ ම දක්නේ ය. ඒ ශක්‍රදෙවෙන්ද්‍රයා නො මැදවූ දෙවතා සන්නි පාතයෙක් සර්‍වඥයන් දවස නැත. සියලු දෙවතාවන් කෙරෙන් ශක්‍රයා සමාන අප්‍රමාද වූ දෙවපුත්‍රයෙකුදු නැත. එසේ කල්හි සර්‍වඥයන් දක්නට නො හිය විරූ එකක් හට මෙන් සර්‍වඥයන් දක්නට උත්සාහ කුමක් පිණිස උපන්නේ ද? යත්:-

එ සමයෙහි වනාහි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ ආයුෂය ක්‍ෂීණ වී ය. නෙතෙමේ පඤ්චපූර්‍ව නිමිත්තයන් උපන් කල්හි මාගේ ආයුෂ ක්‍ෂය වීයැ යි දත. යම් දෙවපුත්‍ර කෙණෙක් සවලප වූ කුශලකර්‍මයෙන් දෙවලොකයෙහි උපන්නහු ද ඔහු මෙයින් චුත වැ කොයි උපදුමෝ දෝ හෝ යි භයින් ත්‍රාසය වෙති. යම් කෙණෙක් බොහෝ කුසල් කොටැ දිව්‍ය ලොකයෙහි උපන්හු ද ඔහු තමන් විසින් දෙන ලද

දන් ද, රක්තා ලද සිල ද, කළ භාවනා ද, දැකැ මෙයින් චුත වැ මත්තෙහි දිව්‍ය ලොකයෙහි ඉපදූ මහත් වූ දිව්‍ය සම්පත්හි අනුභව කරම්හ යි සිතා භය නැති වන්නාහු ය.

ශක්‍රදෙවෙන්ද්‍රයා වනාහි මරණට වූ පූර්වනිමිති දැකැ දසදහසක් යොදුන් පමණ ඇති දිව්‍ය නගරය ද, දහසක් යොදුන් උස ඇති විජයොත් පහය ද, තුන් සියයක් යොදුන් උස ඇති සුධම් දෙව් සභය ද, යොදුන් සියයක් උස ඇති පරසතු රුක ද, සැට යොදුන් පමණ පාණ්ඩුකම්බල ශෛලාසනය ද, අඩුතුන් කෙලක් නාටක සත්‍රින් ද, දෙදෙව්ලොව දිව්‍යපෂීත් ද, **නන්දන වනය** ද, **චිත්‍රලතා වනය** ද, **පාරුෂක වනය** ද, ඒ ආදී වූ සියලු සම්පත්තිය බලා මාගේ මේ මහත් වූ සම්පත්තිය නස්නේ ඇ යි භයින් ත්‍රාසයට විය.

ඉක්බිත්තෙන් යමෙක් මාගේ හෘදය නිශ්‍රිත වූ ශොක ශල්‍යය උදුරා මේ ගිය සම්පත්තිය තරකරන්නට ශ්‍රමණයෙක් වත් බ්‍රාහ්මණයෙක් වත් බ්‍රහ්මයෙක් වත් මේ ලෙව්හි ඇද්දේ හෝ" යි පරීක්ෂා කරන්නේ අනික් එක් කෙණෙකුත් නොදැකැ සර්ෂයන් වහන්සේ සම්ඵබව දැනැ සර්ෂයෝ වනාහි අප වැනි දහසක් දෙනාට උපන්නාවූ ශොක දුරු කොවැ සම්පත්තිය ස්ථිර කරන්නට සමර්ථයෝ ඇයි සිතා සර්ෂයන් දැක්ම පිණිස උත්සාහ ඉපද වියැ යි දනයුතු.

මෙසේ සර්ෂ දර්ශනයෙහි සෞත්සාහ වූ ශක්‍රතෙමේ "සියලු සත්ත්වයාහට උපන් භය දුරුකරන්නට සමර්ථ වූ භගවත් වූ- අර්හත් වූ – සම්‍යක් සම්බුද්ධ වූ අනාවරණඥාන වූ යමන්තවක්ෂුස් ඇති සර්වාම්දරුවෝ දැන් කොයි වසන සේක් දෝ හෝ" යි පරීක්ෂා කරන්නේ මගධ මණ්ඩලයෙහි **රජගහාභුවරට** පැදුම් දිග **අම්බසණ්ඩ** නම් බ්‍රාහ්මණ ග්‍රාමයට උතුරුදිග **වෙදිය** නම් පර්වත යෙහි **ඉන්ද්‍රසාල** නම් ගුහාවෙහි වැඩ වසන සෙයෙකැ යි දැනැ දෙදෙව්ලොව දෙවතා හා කැවිවැ යන පිණිස **'නිදුක්නි! සියලු සත්ත්වයන්ට උපන් භය දුරු කරන්නට සමර්ථ වූ සර්ෂයන් වහන්සේ දක්නට යෙමි. තෙපි දු හැමදෙන මා හා කැවිවැ එව්**" යි කීය.

මෙයට පළමු කොවැ ශක්‍රදෙවෙන්ද්‍රතෙම සර්ෂයන් සැවැත් ග්‍රාමයෙහි වැඩවසන කල්හි තෙමේ හුදකලා වැ සර්ෂයන් දක්නා පිණිස ඇ යි ගියේ. සර්ෂයෝ ද මොහුගේ ඥානය තුළ පිරිපුන්වූ කුවූයේ. කීපදවසක් ගියකලැ **ඉන්ද්‍රසාල** ගුහායෙහි වාසය කරන කල්හි පඤ්චපූර්ව නිමිත්තන දැකැ මරණ භයින් බියට පැ

චාතුම්මහාරාජිකා ය, **තාවතිංසා** ය යන දෙදෙව්ලොව දෙවතාවන් හා සමඟ එළඹෑ ප්‍රඥා තුදුසක් විචාරා කෙළවරහි තුදුස් කෙළක් පමණ දෙවතාවන් හා සමඟ සෝවාන් පෙළෙහි පිහිටන්නේ යැ යි සිතා අවකාශ කොං කොටැ වදාළ සෙයෙක.

හෙතෙම එයෙයින් මා හුදකලාව ගිය හෙයින් සම්බුදුයෝ පළමු අවකාශ නො කොටැ වදාළදැ ය. එකානතයෙන් මාගේ මාගී ඵලයට උපනිශ්‍රයෙක් නැතිවන එක් කෙණෙකුන්ගේ මාගීඵල ප්‍රතිවෙධයට උපනිශ්‍රයෙක් ඇති කල්හි චක්‍රවාට පර්‍යන්ත කොටැ සිටි පෂ්දව ද සම්බුදුයෝ ධම්දෙශනා කෙටැ වදාරණසේ ය.

දෙදෙව්ලොව දෙවතාවන් අතුරෙන් නියත කොටැ ම කිසි කෙණෙකුන්ගේ උපනිශ්‍රය ඇති වන්නේය. සම්බුදුයෝ ඔහු නිසා ධම්දෙශනා කොටැ වදාරණ දැ ය. ඒ අසා මම මාගේ දෙම්නස් සංසිදුවම් යි සිතා තමාට සහාය භාවය පිණිස ඒ දෙවතාවන් කැඳවී යැ යි දතයුතු.

හේ දෙවතාවෝ ද "දෙවසිනි! සම්බුදයන් දක්නා පිණිස යම්හ. බුද්ධොත්පාදයෙක් නම් දුර්ලභ ය. යම් හෙයකින් නෙපි "පණිත ක්‍රීඩාවට යම්හ. නදී ක්‍රීඩාවට යම්හ" යි යනාදීන් නො කියා අප මෙ බදු වූ ස්ථානයෙහි යොදු ද එහෙයින් තොපට ඉෂ්ටයෙක් වේව" යි කියා ඒ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වචනය උත්තමාඞ්ගයෙන් පිළිගත්හ.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රතෙම පඤ්චශිඛ දිව්‍ය පුත්‍රයා වෙත ම උපසුක්‍රන කොටැ කැඳවා ගෙණැ **තාවතිංසා** වැසි දෙවියන් විසින් පිරිවරණ ලද්දේ බලවත් පුරුෂයක්හු දික්කළ අතක් වක් නො කරණතුරු වක් කළ අතක් දික් නො කරණතුරු තාවතිංසා භවනයෙන් අන්තර්හිතවා වෙදිස පර්වතයෙහි පහළ වී ය.

මෙහි පඤ්චශිඛ නම් ගන්ධර්වදිව්‍යපුත්‍රයා වෙන ම කුමක් පිණිස ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ කැඳවී ද? යත්:-

තමාට සම්බුදයන්ගේ අවකාශ කරණ පිණිස ය. ඒ ශක්‍ර දෙවෙන්ද්‍රතෙමේ දෙදෙව්ලොව දෙවතාවන් ගෙණැ තමා ම සම්බුදයන් වහන්සේ කරා එළඹෙන බව සුදුසු නො වෙයි. මේ **පඤ්චශිඛ** නම් ගන්ධර්ව පුත්‍ර වනාහි සම්බුදයන් වහන්සේ කෙරෙහි වල්ලභයහ. කැමැති කළට්ටු ගොසින් ප්‍රශ්න විචාරා බණ අසමි. එහෙයින් මොහු පළමු කොටැ සම්බුදයන් සමීපයට යවා මොහු විසින් කරවන ලද අවකාශ ඇත්තෙම් සම්බුදයන් කරා එළඹෑ ප්‍රශ්න විචාරම් යි සිතී ය මෙසේ අවකාශ කරණ පිණිස ඒ පඤ්චශිඛයා වෙන ම කැඳවියැ යි දත යුතු.

ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රයා දේවතාවන් නැති කොණි වෙදියපවිතයට වැද ගියකල්හි සියලු පිරිතෙහි එක පුබුදු කැඩිනි ගත් රුවන් මෙරක් සේ දිලිහි ගියේ. ඒ දවිතය සමීපයෙහි ගම්වල මිනිස්සු ද ආලෝකය දකිමින් ලොමුඩහැගෙන්නා වූ ශරීර ඇති වැ ඒ ආලොකොත්පත්තියට හෙතු සොයන්නාහු එකිනෙක හෙතුවක් කියා දූකැ "මහෙශාක්‍ය දෙවතාවක් හෝ මහාබ්‍රහ්මයෙක් හෝ අද සම්බුදුයන් ප්‍රශ්න විචාරණ පිණිස ද බණ අසන පිණිස ද ඇවැත්"යි සිතා අපට වූයේ මහත් වැඩලාභයෙක.

යම් හෙයකින් මේ දෙවතාවන් ශඞ්කා දුරුකරන්නා වූ සම්බුදුයෝ අප ගේ ග්‍රාමය සමීපයෙහි විහාරයේ වාසය කෙරෙද්ද ඇපි ද ඔවුන්ට උපස්ථාන කරන්නට ලබමෝ ද එහෙයින් අපට වූයේ මහා ලාභයෙකැ යි සිතා උපන්නා වූ සොම්නසින් ගත වූ රොමොදගම ඇත්තාහු දෙහොත් මුදුනෙහි තබා වැඳ සිටියහ.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍ර තෙම මරණ භයින් භය පත් වැ අවිහු දිනු දිනිඳු බුදුන් වහන්සේ වැඩහුන් තැනට නො විචාරා වැදූ පිය තොගේ පඤ්චසිඛ නම් ගන්ධර්ව පුත්‍රයා කැඳවා "පඤ්චසිඛය! තුන් ලොවට එකාචාර්‍ය්‍ය වූ එකස්වාමි වූ සම්බුදුයන් වහන්සේ වැඩහුන් තැනට අප සේ වූවන් නො විචාරා වැද්ද නො හැක්ක. තෝ ගොසින් සම්බුදුයන් වහන්සේ ගේ සිත් දූනැ පහදවා අප ආ බව දන්වා අවකාශ ඉල්වා එව"යි කියා යැවී ය.

ඒ අසා පඤ්චසිඛ ගන්ධර්ව පුත්‍ර තෙම තමා ගේ සුවර්ණමය වූ පුෂ්කරණී ඇති, ඉන්ද්‍රනීල මණිමය වූ දඬු ඇති, රජතමය වූ තත් ඇති, ප්‍රවාලමය වූ වෙළුක ඇති, තුන් ගවුවක් පමණ බේදඬු වීණාව[1] අල්වා ගෙණැ සම්බුදුයන් වහන්සේ වැඩහුන් ඉන්ද්‍රශාලා ගුහාවට එළඹැ මෙතැන මා සිව ගෙණැ වීණාව ගයන කලැ බුදුන් වහන්සේට නුදුරු නොව ලගැයි සිතා බලා සිටැ ගෙණැ වීණාව ගය ගයා බුද්ධ ගුණ යුක්ත වූ ද, ධර්ම ගුණ යුක්ත වූ ද, සඞ්ඝ ගුණ යුක්ත වූ ද තමා ගේ සිත ඇති කාම ගුණ යුක්ත වූ ද ගාථා කියා වීණාව ගයන්නට පටන්ගත.

ඔහු කී ගාථා මෙසේ දතයුතු.

"වන්දෙ තෙ පිතරං භද්දෙ – තිම්බරුං සුරිය වච්චසෙ!
යෙන ජාතාසි කල්‍යාණි – ආනන්ද ජනනී මම.

වාතොව සෙදතං කන්තෙතා – පාණිඝං ව පිපාසිතො,
අසිගිරසි! පියා මෙසි – ධම්මෙතා අරහතා'ම්ව.

---

1. බේලු ව පණ්ඩු — බෙලූ ව පාණ්ඩු

ආතුරසෙසව හෙසජ්ජං - හොජනං ව ජිඝච්ඡතො,
පරිනිබ්බාපය මං භද්දෙ - ජලන්ත'මිව වාරිනා

සීතොදකිං පොක්ඛරණිං - යුත්තං කිඤ්ජක්ඛරෙණුනා,
නාගො ඝම්ම'භි තත්තො ව - ඔගහෙ තෙ ථනුදරං.

අච්චඞ්කුසෝ'ව නාගෝ'ව - ජිතමෙම තුත්ත තොමරං,
කාරණං නපජානාමි - සම්මත්තෙනා ලකඛණූ'රුයා.

තයි ගථිත චිත්තෙනා'සම් - චිත්තං විපරිණාමිතං,
පටිගන්තුං න සක්කොමි - වඞ්ක ඝසෙනාව අම්බුජෙ.

චාමොරූ සජ මං භද්දෙ - සජ මං මන්දලොචනෙ,
පළිඝසජ මං කල්‍යාණි - එතමෙම අනිපත්තිතං.

අපපකො වත මෙ සන්තෙනා - කාමෙ වෙල්ලිත කෙසියා,
අතෙක භාවෙ සම්පාදි - අරහන්තෙ'ව දක්ඛිණා.

යමෙම අත්ථ කතං පුඤ්ඤං - අරහන්තෙසු තාදිසු,
තමෙම සබ්බඞ්ගකල්‍යාණි - තයා සද්ධිං විපච්චතං.

යමෙම අත්ථ කතං පුඤ්ඤං - අසමිං පුථ්වි මණ්ඩලෙ,
තමෙම සබ්බඞ්ගකල්‍යාණි - තයා සද්ධිං විපච්චතං.

සක්‍යපුත්තෙනාව ඛ්‍යාතෙන - එකොදී නිපතෙ සතො,
අමතං මුනි ජිගිංසානෙ - තමහා සුරිය වච්චසෙ.

ඡථා'පි මුනි නන්දෙය්‍ය - පත්වා සම්බොධිමුත්තමං,
එවා නන්දෙය්‍ය කල්‍යාණි - මිසසිභාවඞ්ගතෙ තයා.

සක්කොා ච මෙ වරං දජ්ජා - තාවතිංසානා'මිස්සරෙ,
නාහං භද්දෙ වරෙය්‍යානෙ - එවං කාමෙ දළෙහා මම.

සාලං'ව න විරූ ඵුල්ලං - පිතරං තෙ සුමෙධසෙ,
වන්දමානෙ නමස්සාමි - යස්සසෙ තාදිසි පජා.''

මෙසේ ඔහු ගී කියා ඉණා ගැයූ කල්හි ත්‍රිභුවනයෙහි ප්‍රඥා සම්පන්නයන් කෙරෙහි අග්‍ර වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ - ''පඤ්චසිඛ ඇ! තා ගේ ඉණායෙහි තත භඬ හා කණය මධුර තාදය හා දෙක හැනෙයි මේ රත්නත්‍රයයෙහි ගුණ හා කාම ගුණ හා එක් කොටැ ගාථා තවරෙක් බැන්දෙහිදැ''යි විවාළසේක.

ඒ අසා පඤ්චසිඛ ගන්ධර්ව දිව්‍යපුත්‍රතෙම ''සවාමීන් බුදු වැ උරුවෙලායෙහි නෙරඤ්ජරා නදීතීරයෙහි අජපාල නිග්‍රොධ මූල යෙහි වසන කලැ මම නිම්බරූ නම් ගන්ධර්ව පුත්‍රයාගේ දූ වූ නමින් භද්‍රා නම් වූ ශරීරප්‍රභායෙන් සුගන්ධීමණ්ඩලය වැනි වූ ගෙයින් සුමිය

වචවසා නම් වූ දිව්‍යසත්‍රිය කෙරෙහි සෙනහ ඇත්තෙමි. ඔ මා හැරැ පියා මාතලී නම් දිව්‍යපුත්‍රයාගේ පුත් වූ ගිඛණ්ඩි නම් දිව්‍යපුත්‍රයාට සෙනහ කෙරෙයි. මම ඇ කෙසේ ලැබ ගණිම් දෝ හෝ'' යි සිතා අනික් උපයානන්තරයක් නො දැකැ මම් ම මාගේ විණාව හැරැ ගෙණැ මා සිතෙහැ'ති තැනැත්තියගේ පිය වූ තිම්බරු නම් ගන්ධර්ව රාජයා කරා ගොස් විණාව ගයා මේ ගී බැඳැ ගෙණැ කිම් යි දුන්වීය.

මා මෙසේ නුඹවහන්සේගේ ගුණ කියා විණා ගැයූ කල්හි මා සෙනහකරන්නා වූ සුරියවචසා තොමෝ මා සිටි තැනට අවුත් ''තා ගුණ කියා විණා ගැයූ සර්ඳුයන් වහන්සේ ගේ නම් ඇසූ විරූ බවමුත් ඉදුරා නො දුටු විරිම්. තොප මෙබඳු වූ බුදුගුණයක් කියා මා සිත සතුටුකළ බැවින් මම ත් තා සිත සතුටු කෙරෙම් යි අද එක දවසක් මා හා කැටුව වැ වසව යි එස් වටෙක මා හා කම් සැප අනුභවකළා. එදු පටන් ගෙණැ අද දක්වා කැවත ඒ සුව නො ලද්දෙමි'' යි දුන්වී ය.

ඉක්බිත්තෙන් මෙසේ බුදුන් වහන්සේ හා පඤ්චසිඛයා හා බණ ත් බණ ත් ශක්‍රදෙවෙන්‍රතෙම මාගේ මෙහෙවර ගියා වූ පඤ්ච සිඛතෙම ඒ තබා පියා තමාගේ සිත ඇති දුක් බුදුන් වහන්සේට දන්වයි. විද්දතු නම් විළි කැත්තාහ. බැණැ බැණැ සිටැ අනික් විකාරයක් දැක්වී නමුත් නපුරු යි සිතා පඤ්චසිඛයා කැඳවාලා ''පඤ්චසිඛය! තෝ සර්ඳුයන් වහන්සේ කරා එළඹැ ''සවාමිනි! අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙන්‍රතෙම සවාමිදරු වන්ගේ ශ්‍රීපාද වඳි'' යි මාගේ හා' දෙවියන්ගේ වැදීමෙන් බුදුන් වහන්සේ වැඳ ගෙණැ හෝ'' යි කී ය.

ඒ අසා පඤ්චසිඛතෙම සර්ඳුයන් වහන්සේ කරා එළඹැ ''සවාමිනි! අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙන්‍රතෙම සවාමිදරුවන්ගේ ශ්‍රීපාද වඳි'' යි වැඳ ගෙණැ හොත්තේ ය. සවාමිදරුවෝ ඒ අසා ''දිව්‍ය මනුෂ්‍යාදී වූ සියලු සත්ත්වයෝ ම සුව කැමැත්තාහ. එහෙයින් අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙන්‍රතෙම සුවපත් වේව'' යි වදාළසේක.

ඉක්බිති ශක්‍රදෙවෙන්‍රතෙම සර්ඳුයන් විසින් අනුදන්නා ලද්දේ ඉන්‍රශාල ගුහාවට වැද සර්ඳුයන් වහන්සේ වැඳැ එකත් පස් වැ සිටියේ තවතිසා වැසි දෙවියෝ ද ඉන්‍රශාල ගුහාවට වැද සර්ඳුයන් වහන්සේ වැඳැ එකත්පස් වැ සිටියෝ.

එ සමයෙහි දෙවතාවන්ගේ ආනුභාවයෙන් සම නො සම වූ ඉන්‍රශාල ගුහාව එක පැහැරැ සම වැ ගියේ ය. හක වූ ඉන්‍රශාල ගුහාව මහත්වී ගියේ ය.

අදුරු වූ ඉන්ද්‍රශාල ගුහාව එක පැහැරැ ආලෝක වැ ගියේ. ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රයා එසේ සිටි සමයෙහි සම්බුදුහු වහන්සේ "බොහෝ වූ පඤ්චකාමානුභව ඇති, බොහෝ වූ දෙවතාවන්ගේ විභවය ඇති ශක්‍රදෙවෙන්ද්‍රයා අප කරා මනුෂ්‍යලෝකයට ආ බව ඉතා අශ්චර්‍ය යැ" යි වදළසේක.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම "ස්වාමීනි! මම ස්වාමීන්ගේ ශ්‍රීපාද දකින්ට එනු කැමති වැ හුන් තව්දුසු තව්තිසා වැසි දෙවියන්ගේ තොයෙක් කටයුත්තෙහි හි ගෙණැ ස්වාමීන් දක්නට එන්නට තො පොහොසත් විමි.

තව ද එක් සමයෙකැ ස්වාම්දරුවෝ **සැවැත් නුවර සරලා ගාරයෙහි** වැඩ වසන සෙයෙක. එ සමයෙහි මම ස්වාමීන් දක්නා පිණිස යැ යි **සැවැත් නුවර** හිසෙමි. එ සමයෙහි ස්වාම්දරුවෝ එක්තරා සමාදියකින් යුක්ත වැ වැඩහුන් සෙයෙක."

"එ සමයෙහි **වෛශ්‍රවණ** මහරජ්ජුරුවන්ට පාරිවාරිකා වූ **හූහූ** නම් දිව්‍යසත්‍රියක් ස්වාම්දරුවන් ශ්‍රීපාද වැඳ වැඳ එකත් පස්වැ සිටිය. ඉක්බිති මම ඒ හූහූ නම් දිව්‍යසත්‍රියට "නඟ! අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ ස්වාම්දරුවන්ගේ ශ්‍රීපාද හිස් තබා වදී" යි කියා මාගේ වැදීමෙන් වදුව" යි කියා කිමි. මා එසේ කී කල්හි හූහූ නම් දිව්‍යසත්‍රිය "සම්බුදු ස්වාම්දරුවෝ සමාධියකින් වැඩහුන් සේක එ වේලෙහි සම්බුදුහු වහන්සේගේ ශ්‍රීපාදය දක්නට කල් නො වේ" යි කිව.

"ඇ එසේ කී කල්හි මම ඇට "නඟ! එසේ වූවහොත් ස්වාමීන් සමාධියෙන් නැගී නිකම් හුන් වේලෙහි "අමාත්‍යයන් සහිත වූ පරිවාර හා සමග ශක්‍රදෙවෙන්ද්‍රයා ස්වාම්දරුවන්ගේ ශ්‍රීපාද තමා මුදුනෙහි තබා වදී" යි කියා මාගේ වැදීමෙන් වදුව" යි කිමි. ඇ මාගේ වැදීමෙන් ශ්‍රීපාදය වැඳිබව ස්වාම්දරුවන් සිහිකොටැ වදරන්නේ ඇද්දැ? යි දැන්වී ය.

ඒ අසා ස්වාම්දරුවෝ "ශක්‍රදෙවෙන්ද්‍රය! **ඒ හූහූවති නම්** දිව්‍යසත්‍රිය තාගේ වැදීමෙන් මා වැඳිබව සිහි කෙරෙමි. තව ද මම එදවස් තාගේ රථයෙහි නිම් වළල්ලෙහි හඬින් ම ඒ භාව තායෙන් තැනෙමි" යි වදළ සෙයෙක

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ "ස්වාමීනි! සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි උපන් කල්හි අසුරකාය පිරිහෙයි. දිව්‍ය ලොකයෙහි දෙවතාවන් විසින් පිරිහී යෙයි" කියා අපට ත් පළමු ව උපන් දෙවතාවන් අතින් ඇසූ විරිමි. දැන් ඒ මාගේ ඇසින් ම ප්‍රත්‍යක්ෂ කොටැ දිටිමි. ස්වාම්දරුවන් උපන්තැන් පටන් ගෙණැ අසුරකාය පිරිහී ගියේ. දෙවතාවන් විසින් දෙවිලොව පිරී ගියේ.

තව ද මෙම කපිලවාසතු පුරෙ ශාක්‍යකුලයෙහි උපන් **ගොජිකා**[1] නම් රාජකන්‍යාව බුද්ධ රතනයෙහි ධම් රතනයෙහි සඞ්ඝ රතනයෙහි පහත. ශීලය සම්පූණී කොටැ රක්‍ෂා කළා. හෝ තොමෝ ගැණු බැවිහි කලකිරි පුරුෂත්වයෙහි ලොභ කොටැ කාය භෙද මරණින් මත්තෙහි සුගති වූ සවර්ගලොකයෙහි තව්තිසා වැසි දෙවියන් කෙරෙහි උපත. එහි උපන්නා වූ ඔහු **ගොජක**[1] දිව්‍යපුත්‍ර යැයි කියා නම් ගෙයින් සියලු දිව්‍යපුත්‍රයෝ දත්හ. අනික් භික්‍ෂු තුන්දෙනෙකුදු සවාමීන්ගේ ශාසනයෙහි බඹසර රැකැ කාය භෙදයෙන් මරණින් මත්තෙහි **ඡඞ්ගම්** දෙව නිකායෙහි උපන්හ.

ඔහු ද "සිත්කලු වූ පඤ්චකාම සුඛානුභව කෙරෙමින් අතර තුරෙහි ඇ කරා උපස්ථානයට යන්නාහ. එසේ ආවා වූ ඒ දිව්‍ය පුත්‍රයන් තුන්දෙනා දැකැ **ගොජක**[1] නම් දිව්‍යපුත්‍රතෙම "කොල! තෙපි සම්බුදුයන් වහන්සේගේ බණ කවර දිසාවට මුහුණ ලා ලා හිඳැ ඇසූ ද? මාසේ වූ ගැණියක් පොවා තුණු රුවන්හි කළ ප්‍රසාද මාත්‍රයෙකින් ගැණු බැවින් මිදී පිරිමි වැ ශක්‍රදෙවෙන්ද්‍රයාට පුත් වැ උපන්මි. තෙපි වූ කලී සවාමිදරුවන්ගේ ශාසනයෙහි බඹසර වස් රැකැ පවා හීන වූ ගන්ධබ්බ නිකායයෙහි උපන්නව. තොප සේ වූවවුන් ඇසැ පහළ සේ ම නපුරු" යි කියා.

ඒ අසා "තුන්දෙනා කෙරෙන් එකෙක් එම දිව්‍යලොකයෙහි කාමානුභව කෙළේ ය. දෙදෙනෙක් ඔහුගේ බස් අසා සංවෙගයට පැමිණැ භාවනා වඩා බ්‍රහ්මපුරොහිත නම් බ්‍රහ්ම පුරයෙහි උපන්හ. ඉක්බිති ඒ **ගොජක** නම් දිව්‍යපුත්‍රතෙම "සවාමිනි, මනුෂ්‍යලොකයෙහි පඤ්චකාමයෙන් ඉක්මැ පැවැත්තා වූ ශාක්‍යසිංහ වූ සම්බුදු වූ සවාමිදරු කෙණෙක් ඇත. උන්ගේ දරු වූ මේ දෙවතාවෝ තුන්දෙන හීන වූ ගන්ධබ්බ නිකායයෙහි උපන්හ. එයින් දෙදෙනෙක් මාගේ බස් අසා සංවෙගයට පැමිණැ භාවනා කොටැ බ්‍රහ්ම පුරොහිත නම් බ්‍රහ්මලොකයෙහි උපන්හ.

මෙසේ ජාතියකින් ජාතියකට ගියවුන් පවා ඒ ධම්ය ඔහි කළ ඤාණයෙහි බ්‍රහ්මාත්මභාව ලබන කල්හි එම ජාතියෙහි ඔවුන් අභිමුඛයෙහි හිඳැ බණ අසන්නවුන්ට කවර නම් සැකයෙක් තිබේ ද? එසේ හෙයින් සතර ආශ්‍රවයන් දුරු කළා වූ සම්බුදුයන් සම්මාකාරයෙන් දත්තා වූ පඤ්චමාරයන් දිනුවා වූ සම්බුදුයන් වඳුම්හ" යි මට කිව.

---

1. ගොපිකා.

"මෙසේ වූ ධර්මයෙහි අනුසස් දත්තා වූ මම ඒ ධර්මයෙහි කළ හැදෑහිල්ලෙන් ඒ ධර්මය ම පසක් කෙරෙමි" යි යන සිතින් ආහ්. ඉදින් අවකාශයක් ලදිමි නම් ස්වාමිදරුවන් ප්‍රශ්න විචාරන්නා කැමැත්තෙමි" යි දැන්වී ය.

ඒ අසා ස්වාමිදරුවෝ "මේ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ සිත බෙහෝ කලක් ශුද්ධ වැ තුබුයේ. මේ තැන්හි ප්‍රශ්නයක් විචාරා නම් හිත කාරණයක් මුත් අහිත කාරණයක් නො විචාරයි. තමා විචාල ප්‍රශ්නය මා විසඳූ කලැ ද වහා දැන ගන්නී' යි සිතා වදාරා **මහෞෂධ කුමාර** කාලයෙහි ද **සමහව කුමාර** කාලයෙහි ද තමන් නගා වැ සිටැ විසඳූ ප්‍රශ්න තුන්ලෝවැසියන්ට උගහට හෙයින් **සකුණ ජාතකයෙහි** පක්ෂි වැ සිටැ විසඳූ ප්‍රශ්න අනුන් හෝ මහාබ්‍රහ්ම වැ සිටැ කියන්නට නො පිළිවන් හෙයින් සංශයක් නැති වැ –

"ශක්‍රදෙවෙන්ද්‍රය! තෝ කැමැති යම් ප්‍රශ්නයක් අප විචාරා ඇපි අපගේ සර්ව්ඥතාඥානයෙන් කිරා පියා ධර්මයට අර්ථයට අවිරුද්ධ කොටැ තා සිත් සතහා දුඃඛිතයන්ගේ දුක් නිවන්නා කැමැති අපගේ මනොරථය මසාකප්‍රාප්ත කොටැ විසඳම්හ" යි වදාළ සෙයෙක.

ඉක්බිති සර්ව්ඥ වූ ස්වාමිදරුවන් විසින් කරණලද්ද වූ අවකාශ ඇති ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ ප්‍රශ්න විචාරන්නේ:– "ස්වාමිනි! සමහර මනුෂ්‍ය කෙණෙක් වෛර සහිත වැ අනුන්ට දණ්ඩනය කෙරෙමින් බොහෝ සතුරන් ඇති වැ සවෙෂි වැ වසන්නාහු ද "වෛරයන් නැත්තම්හ. දණ්ඩනය නො කරම්හ. සතුරන් නැත්තම්හ. වෙෂ නැත්තම්හ යි සිතති. ඔහු කවර පාපධර්ම බලයෙකින් මෙසේ සිතත්ද" යි විචාළේ.

ඉක්බිති ස්වාමිදරුවෝ "දෙවෙන්ද්‍රය! එසේ වූ සත්ත්වයෝ ඊර්ෂ්‍යා හා මාත්සර්‍ය්‍ය බලයෙන් එසේ සිතන්නාහ යි වදාළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ "ස්වාමීන් වදාළ පරිදි ඉතා යහපත. මේ විෂය යෙහි මට සංශය දුරැ වී යැ යි සතුටු වැ වදාළ බණ මුදුනෙන් පිළිගෙණැ මත්තෙහිදු ප්‍රශ්න විචාරන්නේ නුඹවහන්සේ වදාළ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය දෙක කුමක් ඇති කලැ වේ ද? කුමක් නැති කලැ නො වේ ද" යි විචාළේ.

ඒ අසා ස්වාමිදරුවෝ "දෙවෙන්ද්‍රය! ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය යන මේ දෙක ප්‍රිය වස්තු අප්‍රිය වස්තු දෙක මුල් කොටැ වේ ද" යි වදාළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙම "ඒ ප්‍රිය අප්‍රිය දෙක ඡන්දය මුල් කොටැ ඇත්තේ ඇ" යි වදාළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර

තෙම "ඡන්දය තෙම කුමක් මූල් කොටැ ඇත්තේ ද" යි විචාළේ. ඒ අසා සවාම්දර වෝ! දෙවෙන්දය! ඡන්දය තෙම විතකීය මූල් කොටැ ඇත්තේ යැ" යි වදළ සෙයෙක. ශක්‍රදෙවෙන්ද තෙම "සවාමීනි! විතකීය කුමක් මූල් කොටැ ඇත්තේද යි විචාළේ

ඒ අසා සවාම්දරුවෝ "දෙවෙන්දය! විතකීය තාෂණා සම්ප්‍ර යුක්තවූ ද සංඥ කොටස මූල් කොටැ ඇත්තේ යැ" යි වදළ සෙයෙක. ඉක්බිති ශක්‍රදෙවෙන්ද තෙම "සවාමීනි' කවර ලෙසෙක පිළිපන්නා වූ මහණ තෙම තෘෂණාව සම්ප්‍රයුක්ත වූ සංඥවගේ අනුත්පත්තියට කාරණ වූ නිවන් මගට පිළිපන්නා තම් වේ ද" යි විචාළේ ඒ අසා සවාම්දරුවෝ සවී ධර්මයන් සවීඥතාඥනයෙන් අලළා අමෘතමහා නිර්වාණ මාගීය වදාරන්නට පටන් ගෙණ වදළ සෙයෙක කෙසේ ද යත්:—

"දෙවෙන්දය! යම් පුරුදු කවයුතු වූ සෞම්නස යැ යි දෞම්නස යැ යි සෞම්නස දෙකක් කොටැ කියම්. එහි යම් සෞම්නසක් පුරුදුකරන්නා ගව කුශල ධර්මයෝ වඩිද්ද, අකුශල ධර්මයෝ පිරිහෙද් ද, එසේ වූ සෞම්නස පුරුදු කවයුත්තේ ය. යම් සෞම්නසක් සෙවුනාහට අකුශල ධර්මයෝ වඩිද් ද, කුශල ධර්මයෝ පිරිහෙද් ද, මෙසේ වූ සෞම්නස නො සෙවිය යුත්තේ ය.

එහි සවිතකී සවිචාර සෞම්නස - අවිතකී අවිචාර සෞම්නස යන මෙයින් අවිතකී අවිචාර සෞම්නස ම උත්තම ය. තව ද යම් සේ දෞම්නසක් පුරුදු කරන්නාහට කුශලධර්මයෝ වඩිද්ද, අකුශල ධර්මයෝ පිරිහෙද් ද, මෙසේ වූ දෞම්නස සෙවිය යුත්තේ ය. තව ද යම් දෞම්නසක් සෙවුනාහට අකුශල ධර්මයෝ වඩිද් ද, කුශලධර්මයෝ පිරිහෙද් ද, මෙසේ වූ දෞම්නස නො සෙවිය යුත්තේ ය.

එහි සවිතකී සවිචාර දෞම්නස අවිතකී අවිචාර යන දෙකින් අවිතකී අවිචාර දෞම්නස ම උත්තම ය. යම් උපෙක්ෂාවක් පුරුදු කරණ කල්හි කුශල ධර්මයෝ වඩිද් ද, අකුශල ධර්මයෝ පිරිහෙද් ද, එසේ වූ උපෙක්ෂාව පුරුදු කවයුත්තේ ය. යම් උපෙක්ෂාවක් පුරුදු කරණ කල්හි අකුශල ධර්මයෝ වඩිද් ද, කුශල ධර්මයෝ පිරිහෙද් ද, එසේ වූ උපෙක්ෂාව නුපුරුදු කවයුත්තේ ය. සවිතකී සවිචාර උපෙක්ෂාය, අවිතකී අවිචාර උපෙක්ෂාය, යන දෙකින් අවිතකී අවි චාර උපෙක්ෂාව ම උත්තම ය.

'මෙලෙසින් නුපුරුදු කවයුතු ධර්මයන් නුපුරුදු කොටැ වසන්නා වූ සත්පුරුෂ තෙම තෘෂණා සම්ප්‍රයුක්ත වූ සංඥවගේ දුරු කිරීමෙහි පිළිපන්නා නම් වෙයි" වදළ සෙයෙක. මෙසේ වූ අසාධා රණ වූ බුද්ධඥත විලාසයෙන් යුක්ත වූ ප්‍රශ්න ව්‍යාකරණය ඇසුවා වූ

ශක්‍රදෙවෙන්ද්‍ර තෙම අධික වූ ධර්මප්‍රසාදයෙන් යුක්ත වැ "නැවත ද ප්‍රශ්න විචාරන්නට යැ" යි පවන්ගත්තේ:- "ස්වාමිනි! නුඹ වහන්සේගේ සස්නෙහි **ප්‍රාතිමොක්ෂ සංවරශීලය** රක්ෂා කරන්නට පවන් ගත්තේ නම් කෙසේ වූ මහණදැ" යි විචාළේ ඒ අසා ස්වාමිදරුවෝ ඔහුගේ ලය සතගමින් බුද්ධඥානයෙහි පිහිටා ඒ ප්‍රශ්නය ද මෙසේ විසඳන්නට පටන් ගත් සෙසෙකි.

ඒ කෙසේ ද යත්:-

"ශක්‍රදෙවෙන්ද්‍රය! මම කාය සමාචාරය ද පුරුදු කටයුත්තේ ද වෙයි නුපුරුදු කටයුත්තේ ද වෙයි" යි දෙලෙසකින් සිටියේ ය යි කියමි. වාක්සමාචාරය ද එසේ ම දෙලෙසකින් සිටියේ ය යි කියමි. පර්‍යේෂණාව ද එසේ ම දෙලෙසෙකින් සිටියේ ය යි කියමි. එහි යම් කාය සමාචාරයක්, යම් වචී සමාචාරයක්, යම් පර්‍යේෂණයක් පුරුදු කරන්නාහට අකුශලධර්මයෝ වඩිද්ද කුශල ධර්මයෝ පිරිහෙද්ද, එසේ වූ තුණ නුපුරුදු කටයුත්තේ ය. යම් කාය සමාචාරයක්, යම් වචිසමාචාරයක්, යම් පර්‍යේෂණයක් සෙවුනාහට කුශලධර්මයෝ වඩිද්ද, අකුශලධර්මයෝ පිරිහෙද්ද, එසේ වූ තුණ පුරුදු කටයුත්තේය. මෙසේ නුපුරුදු කටයුතු ධර්මයන් නුපුරුදු කොටැ පුරුදු කටයුතු ධර්මයන් පුරුදු කොටැ වසන මහණ තෙම **ප්‍රාතිමොක්ෂ සංවරශීලය** රක්ෂා කරන්නා නම් වෙ යි වදාළ සෙයෙක.

මෙසේ ස්වාමිදරුවන් වදාළ ධර්මය අසා සතුටු වූ ශක්‍රදෙවෙන්ද්‍ර තෙම වදාළ ධර්මය මුදුතෙන් පිළිගෙණැ නැවත ප්‍රශ්න විචාරන්නේ "ස්වාමිනි! ස්වාමින් වදාරන ධර්මය මා ඉතා ලගින්නී. එසේ හෙයින් මම ස්වාමින් නැවත ප්‍රශ්න විචාරන්නා කැමැත්තෙමි. ස්වාමින් ගේ සස්නෙහි වසන්නාහු මහණතෙම කෙසේ **ඉන්ද්‍රිය සංවර ශීලය** රක්ෂා කරන්නා නම් වේ ද 'යි විචාළේ. ඒ අසා ස්වාමිදරුවෝ "දෙවෙන්ද්‍රය! මම ඇසින් දක්කයුතු රූපය, කණින් ඇසියයුතු ශබ්දය, නාසයෙන් ආඝ්‍රාණය කටයුතු ගන්ධය, ජිව්හායෙන් විඳියුතු රසය, කයින් විඳියුතු ස්පර්ශය, මනසින් විඳියුතු ධර්මය යන මේ සය ම සෛක්ෂ - අසෛක්ෂ ය යි කියා දෙලෙසකින් සිටියේ ය යි කියමි"යි වදාළ සෙයෙක.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙම තමා යවැ ඇසූ ධර්මදෙශනාව වූ නියාවට අනුසාරයෙන් ම ඥානය මෙහෙයා "මෙසේ වුවමැනවැ"යි අනුමානයෙන් දැනැ "ස්වාමිනි! ස්වාමින් සංක්ෂෙපයෙන් වදාළා වූ මේ වචනයෙහි අර්ථ මට විස්තරයෙන් මෙසේ හැඟිනි. මේ රූපාදී ආලම්බණ සයින් යමක් සෙවුනාකල්හි කුශලධර්මයෝ පිරිහෙද්ද,

අකුශලධම්මයෝ වඩිද්ද, එසේ වූ රූපාදී ආලම්බණය නො සෙවිය යුත්තේය. යම් බඳු වූ රූපාදී ආලම්බණයක් සෙවනය කළ කල්හි අකුශලධම්මයෝ පිරිහෙද්ද, කුශලධම්මයෝ වඩිද්ද, එසේ වූ රූපාදී ආලම්බණය පුරුදු කටයුත්තේය, යනු ස්වාමීන් වදාළ දෙශනායෙහි අභිප්‍රාය මෙසේ හැඟෙයි. එහෙයින් ඒ විෂයයෙහිත් සංශය දුරු වී ය.

මෙබදු වූ මරණ භයකින් වියවුල් වැ ස්වාමිදරුවන් කරා නැඟී ආවා වූ මාගේ මනොරථය මසුනකප්‍රාප්ත වී ය. එහෙයින් වදාළ ධම්මයෙන් සතුටු වැ ගත්තෙමි. තව ද ප්‍රශ්නයක් විචාරන්නා කැමැත්තෙමි. "සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ම එක් අදහසක් ඇත්තෝ ද? එක ආචාර ඇත්තෝ ද? එක ම ලබ්ධි ඇත්තෝ ද" යි විචාළේ.

ඒ අසා ස්වාමිදරුවෝ සර්ඥතාඥතයෙන් කිරා සියලු ධර්මතත්ත්වය අලළා ඒ ප්‍රශ්නය විසඳ විචාළා වූ ඔහුගේ ලය නිවා මෙසේ බණ වදාරන්නට පටන් ගෙණැ වදාළ සෙයෙකි. "ශක්‍ර දෙවෙන්ද්‍රය! සියලු සත්ත්ව ලොකයෙහි සත්ත්වයෝ වෙන අදහස් ඇත්තාහ. එකක්හට අභිමත දෙයෙක් එකක්හට අභිමත නො වෙයි. යමක් යමෙක්හට අභිමත වී නම් ඒ තෙම එය ගෙණැ ව්‍යවහාර කරන්නේ – 'මේ මැ සැබෑ. සෙස්ස බොරු' යි කියයි. එහෙයින් සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ එක අදහසක් ඇත්තෝ නො වෙති" යි වදාළ සේක.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම "ස්වාමීනි! වදාළ සේ යහපත, තව ද ස්වාමීන් විචාරම්" යි සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ම නිර්ඉර්ණ නිෂ්ඨා කොටැ ඇත්තෝ ද" යි විචාළේය. ඒ අසා ස්වාමිදරුවෝ "දෙවෙන්ද්‍රය! යම් ශ්‍රමණබ්‍රාහ්මණ කෙණෙක් තෘෂ්ණාක්ෂය කරන්නා නිර්ඉර්ණ මඟියෙන් ගොසින් සංසාරයෙන් මිදී සිටියෝ ද එසේ වූවෝ නිර්ඉර්ණ නිෂ්ඨා කොටැ ඇත්තාහ. එහෙයින් ඒ හැම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නිර්ඉර්ණ නිෂ්ඨා කොටැ ඇත්තෝ නො වෙති" යි වදාළ සේක.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍ර තෙම සතුටු වැ "තෘෂ්ණාතොමෝ සත්ත්වයාගේ සිත ඇතුලෙන් දූෂණය කරණ හෙයින් ගඩක් සේ සිටියේ සත්ත්වයාහට තෘෂ්ණාව හා සමාන රොගයෙක් නැත. තෘෂ්ණාව හා සමාන ශල්‍යයෙක් නැත. ඒ ඒ භවයෙහි ගෙණැ ගොස් සත්ත්වයා උපදවන්නී ද තෘෂ්ණා ම ය. ස්වාමිදරුවන් කරා අවුත් මේ විචාළ ප්‍රශ්න විචාරන්නට ඇයි කියා සෙසු ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා ගියකලැ ප්‍රශ්න විසඳීම තබා අවකාශ මාත්‍රය කුත් නො ලැබෙයි එසේ වූ ප්‍රශ්න ස්වාමිදරුවෝ අද මට විසඳ වදාළ සෙයෙකැ" යි දැන්වී ය.

ඒ අසා සප්පුරුෂයන් වහන්සේ "දෙවෙන්දුය! තෝ ප්‍රශ්න අනුනුත් විචාළ විරිදු "යි වදළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙම "සවාමීනි! බොහෝ වල්හි වසන්නා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා ගොසින් මම මේ ප්‍රශ්න විචාරම් ඔහු මා විචාළ ප්‍රශ්නය කියා ගත නොහි තෝ කවරෙක්හිදු යි විචාරති. "මම ද ඔවුන්ට ශක්‍රදෙවෙන්ද්‍රයෙමි" යි කියමි. ඒ අසා ඔහු තෙපි කවර කුසලයක් කොටැ ශක්‍රදෙවෙන්ද්‍ර වැ උපනුදු යි විචාරා මා විසින් ම මා කළ කුසල් කි කළ තුමූ ඒ අසා සතුටු වැ ගෙණැ හිඳිනාහු මට ම අනවැසි වෙත්. මම ඔවුන්ට අනවැසි නො වෙමි" යි දැන්වී ය.

"මම සවාම්දරුවන්ගේ ප්‍රශ්න විසඳීම් අසා සෝවාන් වැ අමා මහනිවන් දුකැ මසතකප්‍රාප්ත වූ මනොරථය ඇතිවීමි" යි දැන්වී ය. ඉක්බිති සවාම්දරුවෝ "මෙබඳු වූ සතුටෙක් පෙර තට ඇති වූ විරිදු" යි විචාරා වදළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ "සවාමීනි! අතික් කුමක් දන්වම් ද? එක් සමයෙක්හි අසුරයන් හා මා හා බලවත් වූ යුද්ධයක් ඇතිවි ය.

ඒ යුද්ධයෙහි අසුරයන් ලුහුබඳවා පියා මම ජයගත්තෙමි. ඒ ජයගත්තා වූ මම දෙවතාවන්ගේ දිව්‍ය ඕජස ත්, අසුරයන්ගේ අසුර ඕජස ත් හැර මා අයති වී ය යි මහත් වූ සන්නොෂයට පැමිණ ඒ ජයමදයෙන් වූ සන්නොෂය මා සසරින් ගැළවිය නො වන හෙයින් ඉතා ලාමකය - දැන් සවාම්දරුවන්ගේ ධම්දෙශනාව අසා මට වූ සතුටු මා අමෘතමහා නිර්‍වාණයෙහි සිටුවාලී ය. එහෙයින් මේ ප්‍රීතියට වැඩි ප්‍රීතියක් නුදුටු විරිමි" යි දැන්වී ය.

නැවත ද සවාම්දරුවෝ ඔහු ලවා ප්‍රීති සිංහනාද කරවනු පිණිස "දෙවෙන්ද්‍රය! තෝ කෙතෙක් ප්‍රයෝජන සලකා මෙසේ සතුටුවේ ද" යි වදළසේක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම "සවාමීනි! මම ප්‍රයෝජන සයක් සලකා නුඹ වහන්සේගේ ධම්ය අසා මහත් වූ සන්නොෂයට පැමිණියෙමි" යි ඒ තමා ලද්දා වූ ප්‍රයෝජනය දක්වන්නට පටන්නතු. හේ කෙසේ ද යත්—

"සවාමීනි! ශක්‍රාත්මභාවයෙන් ගැළවී මියැ අපායෙහි හෙන්නට සිවියෙම් පළඳා පූජා නිමිත්තයන් දුකැ මරණ භයින් භයපත් වැ සවාමීන් ශ්‍රීපාදමූලයට හඬා වැදී හියෙමි බණ අසා ශ්‍රීපාදය වැඳැ ගෙණැ ගෙවැ මි ය. සවාමීන් "ආයු බොහෝ වෙව යි වදළ බසින් ම නැවත තුන්කෙළසැටලක්ෂයක් හවුරුද්දව ආයු ලදින් නැවත පිරිහුණා වූ ශක්‍රාත්මය ලදිමි. එහෙයින් මේ පළමු වන ප්‍රයොජනය සලකා සවාමීන් කෙරෙහි මහත් වූ සන්නොෂයට පැමිණියෙමි.

තව ද මේ තැන්හි බණ අසා මා සතර අපායෙහි හකුල් හෙළා සෝවාන් වූ හෙයින් හා මතු මෙයින් චුත වන සමයෙහි මනුෂ්‍යලොකයෙහි මව අභිමත වූ ක්ෂත්‍රියාදී වූ කුලයෙක්හි ඉපැද ගණිමි. එහෙයින් මේ දෙවෙනි ප්‍රයොජනය සලකා මහත් වූ සන්තොෂයට පැමිණියෙමි.

තව ද මේ තැන් පටන් හි ගෙණැ මා මහත් වූ නුවණ ඇති සවාමිදරුවන්ගේ පුතක්හු හෙයින් සිහිනුවණින් යෙදී ධම්යෙහි වහස කෙරෙමි එහෙයින් මේ තුන්වන ප්‍රයොජනය සලකා මහත් වූ සන්තොෂයට පැමිණියෙමි.

තව ද මෙසේ ධම්යෙන් වසන්නාවූ මම ඥන පරිපාකයට පැමිණැ කෙළවර සියලු කෙලෙසුන් නසා රහත් වැ අමා මහ නිවන් දකිමි. මේ සතරවන ප්‍රයොජනය සලකා ද මම මහත් වූ සන්තොෂයට පැමිණි යෙමි.

තව ද මතු මේ ජාතියෙන් චුත වැ මනුෂ්‍ය ලොකයෙහි උපදිම් නමුදු නැවත ද එයින් චුත වැ දිව්‍යලොකයෙහි දෙවතාවන්ට උත්තම වැ උපදිමි. මේ පස්වන ප්‍රයොජන සලකා ද මම මහත් වූ සන්තොෂයට පැමිණියෙමි.

තව ද සත් ජාතියක් දිව්‍යමනුෂ්‍ය ලොකයෙහි යවා පියා අන්තයෙහි උඩ්ඪංසොත අකනිට්ඨ ගාමි වැ අකනිටා බඹලොවැ සිටා නිරාමිස ප්‍රීතිසුඛය අනුභව කෙරෙමි. මේ සවෙනි ප්‍රයොජනය සලකා ද මම මහත් වූ ප්‍රීතියට පැමිණියෙමි.

"සවාමිනි! මම මෙතෙක් කල් අසම්පූණී වූ මනොරථ ඇති වැ සියලු ධම්යෙහි සැක ඇති වැ "මේ කෙසේ දෝ හෝ යි මේ කෙසේ දෝ හෝ" යි යන සැක ඇති වැ විසිමි. මා සිත ඇති සැකය දුරුකරණ පිණිස බොහෝ ශ්‍රමණ බ්‍රාහමණයන් කරා ගොසින් ප්‍රශ්න විවාළෙමි නම් ඔහු තුමූ මට ශිෂ්‍ය වන බව මුත් මා තමන්ට ශිෂ්‍ය කොවැ ගත නොහෙති.

දැන් සවාමිදරුවන් දැකැ සැකැ දුරු කොවැ ප්‍රශ්න විවාරා බණ අසා සවාමිදරුවන්ට උපස්ථාන කොවැ සංසාර භයින් හා මරණ භයින් හා මුකතවීමි. තෘෂ්ණා ශල්‍යය දුරුකළා වූ අප්‍රති පුද්ගල වූ මහා වීර්‍ය්‍ය වූ ආදිත්‍යබන්ධු වූ සවාමීන් ශ්‍රීපාද ම, මුදුනෙහි තබා වඳිමි. දෙවතාවන් හා සමග බ්‍රහමයාට කරන්නා වූ යම් ආදරයෙක් ඇද්ද එයට ගතසහස්‍ර ගුණයෙන් වඩා ආදර කෙරෙමි.

ලොකයෙහි සම්‍යක් සම්බුද්ධයෝ නම් නුඹ වහන්සේ ම ය; අනුත්තර ශාසනයහු නම් නුඹ වහන්සේ ම ය. දෙවියන් සහි තවූ ලොවැ නුඹට ප්‍රති පුද්ගලයෙක් නැතැ සි කියා මෙසේ බුදුන් වහන්සේට සතුති කොට බුදුන් වහන්සේ මැදයෙහි ම සිටැ **පඤ්චසිඛයා** කැඳවා "පඤ්චසිඛය! තෝ මට බොහෝ උපකාර කෙළෙහි." බුදුන් වහන්සේ කරා පළමු අවුත් මට අවකාශ ඉල්වා දිනි.

එහෙයින් තා මට අද පටන් ගෙණැ පිය නැන්හි තබම්. තා සියලු ගන්ධර්ව නිකායට රජ කෙරෙමි තට අභිමත වූ **"හද්‍රා නම් සුරිය** වවසාවන් තට දෙමි" සි ඔහුගේ මනොරථය මස්තකප්‍රාප්ත කොටැ බුදුන් වහන්සේ කෙරෙහි ඇති භක්තිය සිත පිරී ඉතිරෙත් ඉතිරෙත් ඉවසාගත නො හී අත බිමැ ගසාලා **"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"** යි තුන් විටකැ උදන් අනා බුදුන් වැඳැ පැදකුණු කොටැ තමාට වූ වරපලට සි පියා දෙව්ලෝ ගියේ.

මෙසේ **පඤ්ච පූර්ව නිමිත්ත** දැකැ මරණ භයින් භයපත් වැ ඔබා වන් ශක්‍රදෙවෙන්ද්‍රයා **කණ** හුනු කල්හි ඕහට අමා මහ නිවන් දුන්, නටුවා වූ තුන්කෙළ සැට ලක්ෂයක් ගවුරුදුවට ආයු පෙරළා දුන්, පිරිහුනා වූ දෙදෙව්ලොව දෙවියන්ට අධිපති වූ ශක්‍රත්වය සිරකළ ශක්‍රයා හා කැටි වැ තුදුස් කෙළක් දෙවියන්ට අමා මහ නිවන් දුන්, දුඃඛිතයන්ට සරණ වූ, සියලු සම්පත්නිසට මුල් වූ, සවිනේ ගෙවා දත් සවාමිදරුවන් වදාළ ධර්මරත්නය **සරණ** යෙමි යි **දහම් සරණ යා යුතු.**

15. සක්කපඤ්හ කථා.

---

16. පුනබ්බසුමානා කථා

තව ද මේ ධර්මය ඇසූ සත්ත්වයාගේ සියලු දුක් නිවන පිණිස ප්‍රේතයන් **කණ** හුන් කල්හි ද ඔවුන්ට අමා මහනිවන් හා සවඟී සම්පත්නිය සාධාරණ පරිදි එක් කථානන්තරයකින් දක්වමි. ධර්මයට සිතහැ'නි බුදුරුවන්හි සඟුරුවන්හි පහන් සිත් දී වසන සත්පුරුෂයන් විසින් හේ මෙතෙහි කොටැ ඇසිය යුතු. හේ කෙසේ ද? යත්:—

එක් සමයෙක්හි මාගේ සවාමි වූ බුදුරජානන් වහන්සේ **සැවැත් නුවර** නිසා **ජේතවන මහා විහාරයෙහි** වැඩවසන සෙයෙක. ධර්මයෙහි ලොභයෙන් තමන් වහන්සේ සිසාරා වැඩ හුන් මහණන් වහන්සේට නිර්‍වාණ ගුණයෙන් මිශ්‍ර වූ ධර්මයකට පටන් ගෙණැ වදාළ සෙයෙක. කවර වේලෙක්හි පටන් ගත් බණෙක් ද? යත්:— පසුබත් වේලෙහි නුවරැ වැසි මහජනයා

සින්හි ධම් සනෙතාෂ රස එවැ දෙශනායෙන් සතහා ඔවුන් සවා ප්‍රඥපනා වර බුද්ධාසනයෙහි පුළි ලොකධාතු බලා පළක් බැඳැ වැඩැ හිඳැ ගදකිළි පිරිවෙන්හිදී පවන් ගෙණැ වදුළ බණෙක.

බණ වදුරා සවාමිදරුවන් වූ නියා කියත්:- අමාවහන සඳ මඩුලු ඇතුළු කොපුල රැඳ වූ රාහු අසුරිදු සෙයින් මිහිරි වූ අමා මහ දහම් තමන්ගේ ශ්‍රී මුඛයෙහි අනතගීතකරවූ සම්බුදු සවාමි දරුවෝ ය. වදුරණ බණ කියත්:- බැමිණිවියා සාස වැනි හයක් නැතිවන සමයෙහි වදුල් බැඳැ ගෙණැ ලෝවැස්සන් සතහා වස්කා මහා මෙඝයක් සෙයින් බොහෝ කලක් පුරුදු වැ සංසාර වැසතයට ප්‍රතිපක්ෂ වූ සවභාව මධුර වූ අමා මහ නිවන් දෙන ධම්ය හෙයින්, අසන්නවුන් කියත්:- සිංහතෙල් වත්කළ කතක පාත්‍ර සේ ලෙහි හුනු ධම් නො නසා රක්ෂාකරන සහුරුවන්, වදුරණ බුදුරුවන්, එපැලඟ අසන සහුරුවන් එපැලඟ ගියහ. ඒ පිඬු වූ තුණුරුවනට කවර උපමායක් එළවම් ද? කවර මිළයක් කෙරෙම් ද? කවර වණ්නාවක් කෙරෙම් ද?

මේ තුණුරුවන් වණ්නාකරන්නා වූ මම ප්‍රතිරූපදෙශවාසයෙහි එල ලදිම් සි ගිය ජාතියෙහි පින් නො කළ එකෙකිම් - නො සිතම්. මධුර වූ මකරන්දයෙන් පිරුණා වූ තුන් බුමු රන් පියුමෙක්හි කුසුම ගර්භයෙන් කුසුම ගර්භයෙහි ඉඩා හිසග.

කෙළි කෙළනා මත් බමරුන් සෙයින් මධුර වූ ගුණ නැමැති මකරන්දයෙන් පිරුණා වූ තුණුරුවන් නැමැති තුන් බුමු පියුම්හි හී බුදුපියුමෙන් දහම් පියුමට දහම් පියුමෙන් සහුරුවන් මහපියුමට හී සතුති ගීත නැමැති ඉඩ පවත්වම්න්, ගුණ මුවරද උකා බොම්න් - එහි නිමා මුදු නො දක්නා මම ද නාපනියකට නොයෙම් සි මිහිරින් මිහිරි දක්ම් සි අමායෙන් අමා දක්ම් සි තුණුරුවන් එක් නැන් වූ සතක් ලදිම් සි තමා බොන පැන් මදවුව ද ඉඩාබස්නා මහගඟ දූකැ පිනා දිවන පිපාසිතයක්හු සෙයින් මා කියන ගුණ මද වුව ද මේ තුණුරුවන් දූකැ මහත් වූ අභිලාෂයෙන් දිවැ ගොස් වන්ම් සි තුණුරුවන්හි ගුණ බැමින් සත්පුරුෂයන් රැඳ වූ සභාවක් බැමින් සිනඟැති වැ ඒ සද්ධම්ය ඇසිය යුතු.

සැවැත් නුවර නිසා ජෙතවන මහාවිහාරයෙහි වැඩවසන් කාවූ සවාමිදරුවානන් වහන්සේ සවස් වේලෙහි ගඳකිළි පිරිවෙන්හි වැඩැ හිඳැ පිඬුවූ මහණුන් වහන්සේ වරුන්දූට බණ වදරන්නට පවන් ගත් සේකි. බලු වැ බුරණ බිරාම් ද දහම් කොටැ බුරනුවන් දහමට සැරහුන බුදුරජහු තුඹින් වදරන්නට පටන්ගත් බණ මෙබදු විලාසයෙකින් සිටියේ යැ සි කෙසේ

කියා නිමවමි ද? ඒ තුඹ ට සැරහුන ධර්මය ය, ඒ ධර්මයට ම සැරහුන ඒ තුඹය, ඒ ධර්මරත්නයට ම සුදුසු කොටැ සමතිස් පෙරුමෙන් සරහා නිමවූ ඒ රූපකායය, ඒ අනුපම වූ විලාසයෙන් වැඩ හුන් සවාමිදරුවෝ නිර්වාණය වර්ණනාකරන්නට පවන් ගත්හු ලු.

සාරාසඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි ඒ රසය ම ලොවට දෙන්නට වෙහෙසී ඇවිදුන් ඒ ලොවට වළඳවන්න දැ ය. එහි රස කෙලෙසකින් වදරන්නෝ නිවන් මිහිර වදරන්නෝ ද? තමන් ශ්‍රී බුදුසියට නැඟී මිහිර ම නො වළහා වදරද්දී ද? ඒ නිවන් මිහිර කවරලෙසකින් වදරා නිමවූ හෝ නිර්වාණ දෙශනා නම් සියලු ධර්මයෙහි අභිමෙක දෙසනායෙක.

බුදුහු නම් ධර්ම දෙශනා කරන්නවුන් කෙරෙහි අග්‍රප්‍රාප්ත වූ සවාමිදරු කෙණෙක. ඔහු වැඩ හිඳ වදරති නිවන් කි ඇම් ද? ධර්ම දෙශනා ශ්‍රියෙහි අස්තවන මහුල් කෙරෙහි සි කියමි. නිවන් මිහිරක් බැවින්, ඔවුන් බසක් බැවින්, ඒ තුඹවන් නිවන් අසනුවන් සිතට කෙසේ මිහිරි වැ වැටහිණි හෝ? පෙරැ නිවන් දුටුවන් ඒ නිවන් රස ම විඳුනා පරිද්දෙන් නිවන් නො දුටුවන් ඒ නිවන් රසයට කෙලඟලන පරිද්දෙන් බුදු වූ සවාමිදරුවෝ නිවන් වදරන්නට පවන් ගත්හු

සුවාසු දහසක් යොදුන් ඟැඹුරු මහ මුහුදෙහි ඇවිදගත් නිමිති මහුල් කෙළියක් සෙයින් ඒ ඒ ඟැඹුරු නිවණට වන් ඔවුන්ගේ දෙශනාව නො හැකිළී පෙලඹෙන්නට වන්ලු. නිවන් දෙති, ලෝවැස්සා අතින් තැකිවිලි ලත් බුදුහු තමන්ගේ දෙන නිවන් කවර මිහිරක සලකා වදරත් දෝහෝ අපී දුක්වීමෙහි අනුන් සිතට නැඟීම්හි, අසනුවන්ට උත්සාහ වැඩීම්හි, අසනුවන් සතුටුකිරීම්හි සිවි තැකි කොටැ මිහිරි තුබූ තුබූ තැනට වැදැ අළලා අසන්නවුන් මුහුණ බල බලා නො සතුටු මුහුණ සතුට ඕ මින් සතුටු මුහුණ දියුණු දියුණු සතුටු ඕමින් බණ වදරන්නට පවන් ගත්හු

ඉක්බිති පුනබබසුමාතා නම් ප්‍රේතියක් හඬන දරුවන් මෙහේ නලවන්ට පවන්ගත. ඕ එතනට කෙසේ ආ ඇකින්නක් ද? යත්:- එක් උකුළෙකින් ගත් දුවෙක, ඇඟිල්ලෙහි එලෙන පුතෙක, සෑ ගිනි ගත් කුසයෙක, බැඟැඟැපත් සිතෙක වෙවුලුම් ගත් ඇඟෙක, දුක් මුහුදෙහි ගසන රළ සියලු ප්‍රේත ලොකයෙහි දුක් නාක් පිඬු වැ මූනීතිමත් වැ ගත්තාක් බදු මහා විප්‍රකාරයට පැමිණි සෙයෙක. කන්නට බොන්නට සොයන්නේ මලමූත්‍ර මාත්‍රයෙක. හෙද අමා සේ දුර්ලභවන පරිද්දෙන් ඖය ජාතියෙහි පින් නො කළ පරිදි ය.

"එව, කව, බොව" යන බසක් ඇසුව තමන්ගේ පිනින් පහළ වූ සත්රුවන්හි හඬ ඇසූ සක්විත්තක්හු සේ සතුටු සතුටු වැ දිවැ ගොසින් නැවත 'නැත' යන බස් ඇසුවිට ලෙහි ඇවිල කටින් පලන ගිනි කඳ ය,

කම්බල ඇති හෙයින් දුක් විඳිනට තුබූ ඇට හා සම මිස තෙසු ශරීරය වුවමනා දෑ නැතිවැ වෙවුලන ඇහෙක, දුක් මුහුදෙහි ගසන රැළ සෙයින් ඉපිළී ගිය පරාලපතු පෙළ ය, පිට ඇලිගිය බඩසම ය, ලදනිය කන්නකුදු උදුරා නො කෑ දෙන දරුවෝ දෙන්නෙක. සංසාර කැමැති චිත්‍රකාරයා තමාගේ සිතියම්හි නිමාව පානට සරහා සිටුවා ලූ වාක් වැනි ප්‍රෙත රූපයෙක.

මෙබඳු වූ හෝ තොමෝ **ජෙතවන විහාර** පිටිපස්සෙහි අසුචි කෙල සොටු සෙම් සොඇමින් ක්‍රමයෙන් විහාරයෙහි දෙරටුවට අවුත් බුද්ධච්පි අභිමුඛයෙහි සිටිවී. බුදුන් වහන්සේ වැඩෑ හුන් ගඳකිළිය දුව, බුදුන් පිරිවරා හුන් මහණුන් දුව, බුදුන් දකුත් රැස් වූ මහණුන් දකුත් බණ අසම් සි සිතා ද? යත්. එසේ නො වෙයි. වැළි කුමක් සිතූ ද? යත්:- 'මේ තැන්හි රැස්වූවෝ බොහෝ මහණහ. එකානත යෙන් කන බොන දෑ බෙදන තැනක් වුව මැනව. එතැන්හි පාතු මුවවිටින් වැගිරී ගිය යම්තම් දෙයක් ලදහොත් යෙහෙකැ" සි ඇතුළු වෙහෙරට වදනට පවන්ගත.

විහාර රක්‍ෂායෙහි සිටිය දෙවතාවෝ ද "ගිය ජාතියෙහි කළ කුසල්මුල් ඇති යකින්නකැ" සි ඇතුළට වදිනිය නො වැළකුහු. ඇතුළට වත. බණ අසන මහණ පිරිස් ඇසට ලඟවුව. ඒ මිහිරි හඬ කණ වැපි හිත. ඇතුළට වන්නා සයින් ගොදුරු සොයාවුව බුදුන් වදුරන්නා සේ! බොව! යන බසක් නො වත්, ඒ හඬ අසා ඇට වූ අස්වසෙක් නැති වේ ද? යත්:- එසේ නො සිතිය යුතු ය.

සවාමි දරුවන්ගේ මිහිරි හඬ කණ හුනු විට ම හිවී ආදි බිඳෑ ගෙණෑ ගොස් ඇට මිදුලෙහි පැහැරී සඕඛය ඉතිරී සිත් නිවා සතහා සොම්නස් ඉතිරෙන්නට වන ඇට වූ සොම්නස් කියත් - ඒ දහමට සුදුසු ය. ඒ දහම් කියත් ඒ බුදුරැවනට ම සුදුසු ය. ඒ බුදුරැවන් කියත් - කප් සියයක ද දහසක ද යන හිමක් නැති කොටැ ද සාරාසඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි බෙහෙවින් බෙහෙව ගන්නා මතු පැමිණියා වූ සමතිස් පෙරුමට සුදුසු ය.

ලද කන බොන දෙයක් නැතිවැ ද ඒ මිහිරි හඬ කණැහුනු **ශක්‍රදෙවෙන්ද්‍රයා** අනුභව කරණ අමා වැළඳූ සුජාතා නම් අසුර කන්‍යාව සේ හෝ තොමෝ සා දුක් නිවෙත් නිවෙත් ප්‍රීතින් පිණා ගියා ල. ඒ සන්තොෂයෙහි මහත වෙන තො කියමි. සියලු සසරෙහි දුක්ගන්නා මා ඇතුළු වූ සියලු සත්ත්වයන්ට සිතව ද ඒ දුක් නිවා ගෙණැ මෙබදු සන්තොෂයෙක් ම වේවා සි කියා ප්‍රාර්ථනා කෙරෙමි.

එ දවස් අළුයම් වේලෙහි ඒ මහා කරුණාසමාපත්තීන් නැඟි ලොව බලන්නවුන්ගේ ඥානජාලයට හෝ ම අසු වූ වන. ඇ ම එන පෙරමඟ බලා හුන් වන් හ. ඇ නිසා ම ඒ බණට පවන් ගත වන්හ. තුමූ හුන්හු ල. හිඳිනුදු බණ කිය කියා හුන්හු ල. දුක්පත් කෙණෙක් ල ඔහු'ද එ තැනට ගොසින් වැද ගියේ ල දුක් තම් දෙයෙක් තුබූ පිටින් තිබේ ද? ලයෙක් තම් නො සැනහී තිබේ ද? වටින් සැට යොදුන් ප්‍රගාඤතවාතමෙඝ ධාරාවෙක්හි වැටී හුනු කතමැදිරියක සා ගිනි පුපුරක් සේ සම්‍යක්සම්බුදරුවන්ගේ මිහිරි හඬ කණ හෙත් ම ඒ දුක් නිවී ගියේ. ඒ ලය සැනහී ගියේ.

එ වැනි රුවක් ඇසින් දුට, එ වැනි ශබ්දයක් කණින් ඇසුව, ඇසින් විඳුමනා මිහිරක් සොයත්. **ශක්‍රදෙවෙන්ද්‍රයා** ද එතෙකින් වැඩියක් සොයා ගත තො හෙයි යන පරිද්දෙන් ම මිහිරි වූ බුදුරු දුටු කණින් වින්දමනා මිහිරක් සොයත් **සහම්පති මහා බ්‍රහ්මයා** ද එතෙකින් වැඩියක් සොයා ගත තො හෙයි යන පරිද්දෙන් ම මිහිරි වූ දහම් ඇසුව. ඒ යකින්නට වූ වර පල! ඇ ලද ඇඟ් ඇ ලද කන් මෙ මිහිර මා ඇතුළු වූ සියලු සත්ත්වයා හට අමා මහ නිවන් දක්නා වාසනා වේව සි දුක්පත් වැ ගොස් මුළු සක්වළෙහි දුක් වෙන වෙන ම නිවා පින්නට සමර්ථ වූ තුණුරුවන් එක් වූ මා හා සම්මම්බුල්ලව වැදූ ගිය මහ මුහුදට දමාපු ගිනි පෙණෙහෙල්ලක් සේ ඒ තුණුරුවනට දමා ලූ සිත නිවී සැනහී ගියේ.

අවීචි මහා නරකයට වැදූ ගිනි නිවා වැසි වස්වා වතුර හෙළවා පැසෙන සතුන් ලය අස්වසා සා දුක් නිවා එන මුඟලන් මහ තෙරුන් තමන් පාපිස්තා බිසි කළා වූ බුදුරජාණෝ හිඳ බණ වදරති. ඒ ලය නිවී ගියේ. සැනහී ගියේ. වඩදිය මුහුද යතා එන් එන් පිරී ඉතිරී ගිය කලපුවක් සෙයින් ඒ දම් යතා ගොස් වදුන් වදුන් ඒ ලය සොම්නසින් පිරී ගියේ. ආදී වූ දුක දුක් පමණින් ම ඇට මහත් අස්වස් වී.

ඉඹා, යමුනා දෙක එක් වූ තැන්හි දිය පිරුමක් සෙයින් ඒ රූප රසය හා ධම් රසය හා එක් වූ තන්හි සොම්නස් බොහෝ වී. මෙසේ මතු ලබන නිවන් සුව තබා ඇසූ කෙණෙහි ම

ප්‍රෙතයන් ලෙහි පහල පොවා එතෙක් දුක් නිවා මෙතෙක් සුර සරහා ලන්නා වූ ධම්මරත්නය සරණ යෙමි යි දහම් සරණ ඝා සුතු.

ඇ මෙසේ සද්ධම්මයට කන් යොමු කොටැ අසමින් සිටි සමයෙහි ඇඟිල්ලෙහි එලුනු පුතු හා ඇකයෙහි හුන් දුව හා සයින් අඩා ඇදූ පැදූ චිත්ත වික්ෂෙප කොටැ බණ ඇසිය නො දෙති. හෝ තොමෝ දරුවන්ට මෙසේ කියා සැනහූ ල.

පතාස්හි සිහිල් දිය හා කැටුව වදනා සජියන් තගුට ගෙණැ දුර ගසන්නා සේ බුදුන් වදුරණ මිහිරි වූ බණ වදනා කණට දරුවන් හඬනා හඬ නො වැද්ද දී දුරට ගැසූ ඕ තොමෝ "නො හඬව් දෙ දරුවෙනි! මේ විහාර සමීපයෙහි සොටු සෙම් ගොදුරු සොයා ඇවිදූ නො ලදින් ආ අපට දෙව් බඹුන් හා එක් වැ බුදුන් වහල් කොටැ බුදුහු දහම් අම ඔද වළඳවති. ඒ ඇපි කණ්පුවයෙන් උකහා බොමින් සිටියම්හ මේ හඬ ගිරිති ගන්න කලෙක් නො වෙයි."

"සින් සතහා මිහිරි විදිනා කලෙක් බැවින් නො හඬව් දරුවෙනි! ජාතිය මුළුල්ලෙහි වැල්මී වෙනෙන් වැල්මී කා වැඩී පුත්‍ර ප්‍රෙමයෙන් බුරුල්ලෙහි කිරිගැන් වූ දෙනක පුතුන් දකුත් කිරි සිඳින් ඉතිරූ වැගිරූ ගිය මිහිරි කිරෙක් සෙයින් සසර පමණින් ජාති පරම්පරායෙන් බොධිපාක්ෂික ධම් නැමැති වැල්මී වෙතෙහි ඇසිරූ ආ අපගේ බුදු වූ මැණියන් වහන්සේ කරුණා නැමැති බුරුල්ලෙහි පිරී සිටි සද්ධම් නැමැති ක්ෂීරය අපි විනෙය පුත්‍රයන් දකුත් පිරී ඉතිරෙන්නට වත. මම ඒ උකහා බොමින් සිටියෙමි. මා වියවුල් නො කර වූ. එහෙයින් නො හඬව් දරුවෙනි!"

"දෙව්ලොව අමා වළඳන්නනුදු මේ දහම්රස නො ලද්දවස් ඒ අමායෙහි අරුචි ගන්නා පරිද්දෙන් මිහිරි දහම් රසය අප කණ මැඩැ වත්කෙරෙමින් වැඩහුන් බුදුරජානන් වහන්සේගේ බුද්ධ විලාසය බලව! උන් වදුරණ බණට කන් දමව! නො හඬව්! දරුවෙනි!! වතුමධුර වත්කොටැ හැනූ ගද හැල්සාලෙහි බත් කන තැනැත්තහු ද හැනීගිය හකුරක් සෙයින් මෙමා විඳි දහම් රසය අතරතුරෙහි නොපගේ හඬ වැටී ගෙන්නා හා කණ සිරිහෙයිනි. එහෙයින් නො හඬව්. දරුවෙනි!"

"බඹුන් බඹලෙව්හි නො ලද සැනහුම් දෙවියන් නදුන් උයන්හි නොලද සැනහුම් තමා දෙරටුයෙහි එලිපත පිනුවිට ම සහමුලින් නමාලන වෙහෙර බුමකට වනුම්හ එහිදු එකතැන්හි මඩුලු බැඳ තුණුරුවන් දුටුම්හ. තුන් ලෝ වැස්සන් සිත් නිවන්නට

හැඬෙන තුණුරුවන් අප තුන්පුත මවුන් පමණක් ලය නිවන්නට අසමර්ථයැ යි නො සිතව්. නො හඬව් දරුවෙනි! කියන බණෙක මිහිරක් අසව්. වැඩැහුන් විලාසෙක මිහිරක් බලව්. අසා හුන් සඟ පිරිසෙහි සන්හුන් කමක් බලව්."

"මා වැනි ප්‍රේතියෙකුගේ පොවා ගොදුරු සන්න නැති වැ යන පරිද්දෙන් මිහිරි වූ බණක් අසා සිටියෙමි. ඒ අසන්නා වූ මා සිත ව්‍යවුල් නො කරව්. සියලු සසරදුක් තාක් දනන්නට ඇණි කොටැ ගත්තාක් වැනි වූ තුණුරුවන් එකතැනට රැස් වී ය. සමතිස් පැරැම් තළින් තුන්ලෙව්හි තුබූ මිහිර එකතැනට උරා ගත්තාක් බදු වූ බුදුරුවෙක් පැණෙයි ඔවුන් වදාරණ බණෙහි හඬක් හා තොප ගඩන බැගැ හඬක් හා දෙක එක තැනට නො යෙදෙයි නො හඬව් දරුවෙනි!

"අප විඳින දුක් වූ නියා විදිමින් සිටි අප තබා ප්‍රේතලොක යෙහි දුක් වූ නිසා මෙසේ ඇ යි ඇසුවනුදු විදිමින් සිටි චක්‍රවර්ති සම්පත් හැරැපියා දහම් සොයා වල්වදනා පරිද්දෙන් එබදු වූ දුක් විදිමින් සිටි ඇපි මේ දහම් පසක් කෙරෙමින් සිටියම්හ බඹ සැපත් විඳින්නනුදු ඒ සැපත් දුකැ යි සිතා සුවකොටැ තකා ගත් නිවන්හි ගුණ වුව. ඒ බුදුහු ම වදාරමින් වැඩහුන් සෙයෙක නිවන් නම් අප සේ වූ දුක්පතුන්ට ම කළ දෙයෙක් වන. බුදුහු නම් අප සේ වූවන් කෙරෙහි ම කරුණායෙන් ඇති වූ කෙණෙකුන් වැන්නාහ. දෙව්බඹුන් නිවන් පතන්නේ දෙව් බඹ සුව නො මිහි රින් නො වෙයි. වැළි කුමක් පිණිස ද? යත්:— ඉන් ගිලිනි ගිය දවස් අප උපන් ප්‍රේත ලොකයෙහි ඉපදූ සමෝ දෝ හෝ යන හයින් ය.

"මෙසේ හෙයින් නිවන් මිහිර අපට හැහෙයි. එසේ වූ නිවන් බුදුහු වදාරති. ඒ අසා සොම්නසින් මාගේ ලය පිරී ඉතිරෙයි. ගොදුරෙක යන බස් අසා පියා පොවා දිව විඛා වමිහ· නිවන ය යන නම අස අසා සිටිනාන්හි සිටැ නො අසත්. එහි අප ප්‍රිති නොවිඳුන් නො යෙදෙ යි ඔවුන්ට දරුවෝ ඉතා ප්‍රියයහ. ගැහැ ණුන්ට සැමියෝ ඉතා ප්‍රියයහ ඒ දෙපක්‍ෂයට වඩා මේ ධර්මය ම මට ඉතා ප්‍රිය ය. හෙද මට නිෂ්කාරණයෙහි ප්‍රිය නො වෙයි අප විඳිනා දුක් සියලු දුක් ගෙවන හෙයින් ප්‍රිය ය. සද්ධර්මය සේ දුක් නිවන්නට දරුවෝ ද අසමර්ථයහ.

"ඉදින් ප්‍රිය පුත්‍රයෝ දුකින් ගලවත් නම් තෙපි දෙදෙන මා කුමක් පිණිස දුකින් නො ගලවම් ද? තොප මට ප්‍රිය පරිදි අනිත් කෙසේ කියම් ද? මෙ වැනි සා දුකින් පෙළී පවා ලද නිය කනු පමණක් බෙදා නොදී වළකා නොකන පරිද්දෙන් ප්‍රියවත්

මාගේ ශරීරය තමහට බර වැ වැටහෙන පරිද්දෙන් දුර්ගන්ධවූව ද තොප උකුලෙහි ලා ඇදූ ගෙණැ ඇවිදිනා පරිද්දෙන් ප්‍රිය වූ දරුවෝ දුකින් ගල්වත් නම් තෙපි මා කුමක් පිණිස දුකින් නො ගලවව් ද? මෙසේ හෙයින් තා විසින්දු නිවිය නො හැකි දුක් මේ ධර්මය ඇසූ පමණින් නිවෙයි. ජරාමරණාදී වූ සියලු දුක් නිවන්නා වූ සද්ධර්මය අස අසා සිටියෙමි. තෙපි නො හඬව්.

මාගේ ලය සොම්නසින් ඉතිර ගිය සේ බලව්. දෙනුවන් නහවාගෙණ වැගිරෙන දළ සෝ කඳුලෙන් යුක්ත වූ මේ ඇසින් වැගිරෙන සතුටු කඳුලු බලව්. සියලු ශරීරය මැඩැගෙණැ පැනැ නැඟි ලොමුදහ බලව් මේ මිහිර විදැ මා සැනහෙන තෙක් නො හඬව්. තෙපිදු මේ මිහිර විඳුව''යි කිව.

ඒ අසා බණට කන් යොමා බුදුරුවෙහි ඇස් හෙළා ඒ මිහිරෙහි රස දන් පිලවා ආදී වූ මව හා කැවි වැ විළව බැසැ පැන් බී පුරුදුව ගත් මහත් මුවපොල්ලන් පසුව මවට පළමු දිවගන්නා සේ දැන් මවගේ නියෝගයෙන් බණ අසා බණෙහි මිහිර දැනැ ඒ රස විඳ තෙමේ මෙසේ කියා ''අම්ම! පිළිවෙත්හි නුමුළා භිතා භිත ය, අවීතපී ය, කතීව්‍යාකතීව්‍ය ය, කුශලා කුශල විභාග ය යන සියල්ල නොමුළාව දන්නා හෙයින් සියලු දෙවිමිනිසුන්ට ඥානාලොක දෙන සසරවැනි අපායෙක්හි පරතෙර දුටු ඥෙය මණ්ඩල වැනි මහතක් ශ්‍රීගර්භා තෙලෙහි රෙඛා සේ අයතනයෙන් බලන මේ භිමියාතෝ බණ වදරති. එවැනි බණ නො ඇසූ විරූ බැවින් ඇපි මෙබඳු වූ දුකකට පැමිණ ඇවිදුම්හ.

එසේ හෙයින් ඇපි තොප අසන බණට බාධා නො කරම්හ. තෙපි බණ අසව. බණ ඇසීමට වැඩි සුවයක් නැති බව අපටත් හැකෙ''යි කිව.

ඒ අසා මවු සමාධින් සිටැ බණ ඇසුව සමයෙහි බණ අසන සියලු පිරිස් මුහුණ බලා සිත් බල බලා සථාන දැනැ බණ වදරණ සම්බුදයන් වහන්සේ ඒ දෙපුතු මවුන් සෝවාන් වන්නට කුසල් ඇති බැව් දැනැ චතුස්සත්‍යය ප්‍රකාශ කොටැ වදරා මරණ භයින් දෙදෙව්ලොව දෙවතාවන් හැරැ ගෙණැ හඬා අවුත් වන් ශක්‍ර දෙවෙන්ද්‍රයාට දුන් තරමින් ම අමා මහ නිවන් දී වදළ සේක. ඕ සිටි පියෙහි ම සිටැ සෝවාන් වැ පුන්හට මෙසේ සතුති කෙරේ.

''තමා වැදූ දරුවන් නුවණැති බව ම ඉතා යහපතෙක. මපුතනුවෝ බුදුරජානන් වහන්සේ වදරණ බණ පිළිවිදැ විඳැ අසා සිටියාහ. ඇවිලෙන කුසගිනි නිවූ නියා බලත් අහර

සොයන්නට ම කලක් වැනි බව මුත් බණක් අසන්නට නො කල් ය. වයස් බලන් තෙමේ බාලයා සාදුක් නො බැලී ය. වයස් නො බැලී ය. බුදුන් වදරණ ධම්ය ම බැලී ය.

ඉදින් මේ මාගේ පිතත් අතර තුරෙහි හඬ හඬාලා නම් "අම්ම! එව'සි ඇදූ ඇදූ ලා නම් සයින් බිම කකුල් ගස ගසා හඬා නම් මව බණ ඇසීම් කොසි ද? දක්නා අමා මහ නිවන් කොසි ද? ම පුතනුවෝ එසේ වූ ඇවිටිලියක් නො ගෙණැ මා හා කැටි වැ බණ ඇසුහ එසේ වූ මාගේ පුතනුවෝ සුවපත් වෙත්ව සි අද මම මේ සසරින් එතරවිමි. චතුස්සත්‍ය ප්‍රතිවෙධ කෙළෙමි"සි පුත්හට සතුටු වැ උදන් අනුව.

පැවි ද බණ අසා සෝවාන් වැ අමා මහ නිවන් දිට. සෝවාන් වූ ක්ෂණයෙහි ම ප්‍රෙතාත්මය නැති වැ දිව්‍ය ශරීරය පහළ වි ය. ප්‍රෙතදුක් නැති වැ දිව්‍යසම්පත්හි පහළ වි ය. සෝවාන් වූ දෙදෙ නාගේ කුශල බලයෙන් උකුලෙහි හුන් දුවට ද එම දිව්‍ය ශරීරය ද දිව්‍ය සම්පත්තිය ද පහළ වි ය. තුන්දෙනා ම ගඳකිළියට නුදුරු තන්හි ම දිව්‍යවිමන් ලදින් දෙවේලෙහි තුණුරුවන් වැඳ යෙහෙන් විසූහ.

මෙසේ තමා කණ හුනු කෙණෙහි අමා මහනිවන් රස සිත්හි එව ප්‍රෙතාත්මභාවයෙන් ගළවා දිව්‍යාත්ම දී සත්ජාතියෙකින් මත්තෙහි සියලු බුදු පසේබුදු මහරහතුන් වහන්සේ අමාමහනිවන් පුරයට ගෙණැ ගොස් නිවා සතහා ලන්නට සමර්ථ වූ ධම්රත්නය සරණ යෙමි සි **දහම් සරණ යා සුතු.**

16. පුණ්ණඛත්තුමාතා කථා.

තව ද සද්ධම්ය තමා රක්ෂාකළවුන් රක්ෂාකරණ බව හඟවන පිණිස මාගේ සවාමිදරු වූ බොධිසත්වයන් වහන්සේව නොයෙක් ජාතියෙහි සම්ප්‍රාප්ත වූ උපද්‍රව ධම්

17. සසජාතක කථා. බලයෙන් නුවූ බව හඟවා සියලු සත්වයා සිතට ධම්යෙහි අනුසස් දක්වා දහම් සරණ යවන පිණිස මාගේ සවාමිදරු වූ බොධිසත්වයන් වහන්සේ ගේ ජාතිකාන්තාරය හැර දක්වමි.

හෙ ද සුවකැමැති සත්පුරුෂයන් විසින් සිතහැනි වැ ඇසිය යුතු. එහි පළමු කොටැ මාගේ සවාමිදරුවන් සාව උපන් කල්හි හින්නට වැදූ ධම්බලයෙන් වන් හින්නෙහි සිහිලවුන් ජාතකය දක්වමි. හෙ ද බොධිසත්ව වූ සවාමිදරුවන් ගේ ගුණ බැවින් සෙනෙහින් ඇසිය යුතු. හේ කෙසේද? යත්:—

අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රජකරණ සමයෙහි මාගේ බොධිසත්ත්ව වූ සඳාම්දරුවානන් වහන්සේ දීපඞ්කර පාදමූලයෙහි පටන් සමතිස් පෙරම් පුරා සම්මා සම්බුදු වැ "මූළුලෝ ගලවම්හ" යි කියා කළ ප්‍රතිඥව මස්තක ප්‍රාප්ත කරණ පිණිස ජාතියෙන් ජාතියෙහි ඇවිදිමින් මෙ සමයෙහි ලද වූ පලලවයෙන් හා සුපිපි මල් කැනින් හා මල් ගැබ[1] කෙළනා බඹරුන් විසින් හා අතු අගැ කෙළනා කෙවිල්ලන් විසින් හා වෙළෙප් අගැ කෙළනා මොණරුන් විසින් හා රුක්මුලැ කෙළනා මූව පොල්ලන් විසින් හා වැලිතලායෙහි කෙළනා තොයෙක් ජාතියෙහි වතුෂ්පදයන් විසින් හා විල්කෙළි[2] කෙළනා හංසයන් විසින් හා, සක්වාලිහිණියන් විසින්, සවයංජාත වූ හැල්කෙතට හඬා වැහිරෙන හිරවුන් විසින් හා ඇතින්නන් හා ඇත්පොවුවන් මැද මදුඹ වැ වනයෙහි සුඛවිහාර කරණ සතරවන දසායෙහි සතරවන සොහා යෙහි සිටි හද්‍රජාති හස්තීන් විසින් හා සථාන'සථානයෙහි පණ්ශාලා යෙහි වෘක්ෂමූලයෙහි පර්වතගුහාගෙහි නදීතීරයෙහි භිඳැ භාවනා කරණ තපස්වීන් විසින් හා මනොහර වූ එක් මහවනයෙක්හි සහ වැ උපන් සෙයෙක.

වනයෙහි එක් දිසාවෙක පර්වතයෙක, එක් දිසාවෙක නදී තීරයෙක, එක් දිසාවෙක ප්‍රත්‍යන්ත ග්‍රාමයෙක, එක් දිසාවෙක සවාම්දරුවන්ගේ වදුරෙක, කැණහිලෙක, මස්කාවෙකැ යි යන යහළුවෝ තුන්දෙනෙක් වූහ.

ශාස්තෘපණ්ඩිතයන් වහන්සේ ඇතුළු වූ පණ්ඩිතවරු සතරදෙන ම එක්ව වසන්නා වූ තම තමන් ගොදුරු ගන්නා තැනින් ගොදුරු ගෙණැ සවස්වේලෙහි එකතැනට රැස්වන්නාහ. එසේ රැස් වූ ඔවුන්ට ශාස්තෘපණ්ඩිතයන් වහන්සේ දන් දුන මැනැවැ. සිල්රැක්ක මැනැවැ. පෙහෙවුව මැනවැ යි අවවාද පිණිස ධර්ම දෙශනා කොටැ වදාරණ සෙයෙක.

ඉකිරි පණ්ඩිතවරහු තුන්දෙන බොධිසත්ත්වයන් වහන්සේගේ අවවාද ගිවිසැ දුශ්චරිතයෙන් දුරැ වැ තම තමන් වසන්නා වූ වනලැහැබට වැදූ ධර්මයෙන් දවස් යවන්නාහ. මෙසේ වසන කල්හි එක් දවසක් බොධිසත්ත්වයන් වහන්සේ ආකාශය බලා චන්ද්‍රමණ්ඩලය දැකැ වටු වැ උපන් කල්හි පවා මහාබ්‍රහ්මයා සේ වෙදත්‍රය දන්නා නුවණැති හෙයින් "සඳෙහි අද දවසට කලායෙන් අඩු ය. සෙට දවසට සොළොස් කලාව පිරී මැදිපොහොය ලැබෙන් නේය" යි නිශ්චය කොටැ අනික් පණ්ඩිතවරුන් තුන්දෙනා කැඳවා "සෙට මැදිපොහෝ දවස ය. තෙපි තුන්දෙනා ම සිල්

1. මල් අගැ. 2. විල් කෙළැ.

සමාදන් වෑ ගෙණ කියපත් වෑ ශීලය රක්ෂාකරව යි සිලයෙහි පිහිටුවා දුන්නා වූ දානයෙක් ඇත්නම් ඒ මහාඵල වන්නේ ය. එහෙයින් සාවකයන්හු ආ කල්හි තොප අනුභව කරණ ආහර යෙන් ශක්ති පමණක් දන් දී අනුභවකරව" යි වදාළ සේක.

තුන්දෙන ම සාමිදරුවන් වදාළ අවවාද ගිවිසෑ තමන් වසන තැන්හි වැසෑ උදාසනක් සේ ම මස්කාවා ගොදුරු සොයා යෙමි යි කියා නික්මෑ ගංතෙරව ගියේ. එසමයෙහි එක් බිලිවැද්දෙක් රේමසුන් සත්දෙනෙකු බාගෙණ වැලින් අමුතා ගංතෙර වැල්ලේ සහවාලා මස් ගෙණීමට යව ගහට ගියේ.

මස්කාවා ඉවගෙණ ලා වැලිපිරාලා පියා රේමසුන් සත්දෙනා දූකැ තහා ගෙණ බොධිසත්ත්වයන් වහන්සේගේ අවවාද මුදුතෙන් පිළිගත් හෙයින් අනුන් සතු දෙයක් නො ගණිම් යි සිතා තුන් වෙනෙකැ මෙහට හිමියෝ ඇද්දෝ හෝ නැද්දෝ හෝ යි හඬ ගහා හිමියන් නො දූකැ මස් ඇවිනු වැල බැහැගෙණ තමා වසන තැනට ගෙණ ගොස් වේලාවට වළඳම් යි වන ලැහැබෙහි මස් තබාලා තමා රක්ෂාකරණ ශීලයට ආදියෙන් මධ්‍යයෙන් අන්ත යෙන් කිසි ඛණ්ඩයක් වී දෝ හෝ නො වී දෝ යි කියා ශීල විරොධයක් නො දූකැ තමාගේ ගුරු වූ සසපණ්ඩිතයන්ගේ අවවාදයට විරොධයක් නො කොටැ මා ශීලය රක්ෂාකළ පරිදි ඉතා යහපත

සත්පුරුෂ සමාගමයෙහි බලයෙන් මා රක්ෂාකළා වූ ශීලය හෙතුකොටැ ගෙණ මේ තිරිසන් ආත්මභාවයෙන් ද ගැලවෙමි. මතු සුගතිමොක්ෂ සම්පත්හි ද ලැබෙයි. ශීලය ආවර්ජනා කොටැ හුන්නේ —

කැණහිල් ද නික්මෑ ගොදුරු සොයා ගොස් කුඹුරු රක්නා එතක්හුගේ පැලෑ තුමූ මස් හුල් දෙකක් හා එක් ගොයකු හා එක් දිගෙඩියක් දූකැ මෙහි හිමියෝ ඇද්දෝ හෝ නැද්දෝ හෝ යි තුන්විටෙක හඬ ගහා හිමි කෙණෙකුන් නැති හෙයින් දී ගෙඩි යෙහි උගය කරලා ගෙණ ගොයි හා මස් හා කටින් බැහැ ගෙණ තමා වසන වනලැහැබට ගොසින් වේලාවට කම් යි තබාලා තමාගේ ශීලය පරීක්ෂා කොටැ තමා රක්ෂා කළා වූ ශීලයට ඛණ්ඩයක් ශිද්‍රයක් සබලයක් කල්මාෂයක් නැති බව දැනැ තමාගේ ගුරු වූ සසපණ්ඩිතයන් වහන්සේගේ අවවාද මුදුතෙන් පිළිගෙණ මා මේ ශීලය රක්ෂාකළ පරිදි ඉතා යහපතැයි කියා ශීලය පරීක්ෂා කොටැ කොටැ හුන්නේ —

වදුරු ද වලව් වැද අඹකැනක් කඩා ගෙණැ අවුදින් වේලාවට කම් සි වත ලැහැබෙහි තබාලා තමාගේ ශීලය පරීක්ෂා කොටැ හුන්නේ —

බොධිසත්ත්වයන් වහන්සේ වූ කලි "මා බැහැරින් දුකින් සොයන අහර නැත. වළඳන වේලා ආසන්න වූ කලැ ලැහැබින් නික්මැ හිතණ කාලා සිල් රක්ෂාකෙරෙමි" යි සිතා ලැහැබ වැඩැහුන් සෙයෙක් අප සේ වූවනුදු නිවන් වැනි දුර්ලභ වස්තුවක් ලැබ ගණුම්ග සි සිතුවමනා කලැ සසර වැනි එතර වය නො හැකි තැනෙකින් තමන්ගේ ශබ්දය අසා හොත් මඬුන් පවා එතර වුව මනා කලැ, තමන්ගේ විහාරයට වන් ප්‍රෙතයන්ගේ ප්‍රෙත ශරීරය පෙරළී දිව්‍ය ශරීරයට පැමිණැ වුව මනා කලැ, පස්වාදහසක් මුළුල් ලෙහි තමන්ගේ තම කිය කියා යන්තවුන් හොත් මරණමඤ්චක යට ම කාමැති දෙව්ලොවකට අව මැනවැ යි තලව තලවා සිටින දිව්‍යස්ත්‍රීන් විසින් ගැවසී ගත්තා වූ රථසයක් සදිව්‍යලොකයෙන් අවුත් සිටිය මනා කල්හි ආභරණයක් නැති සඳමඬලව තමන්ගේ පිළිබිඹු වැනි විසිතුරු ආභරණයක් පැළැඳැ මනා කල්හි —

"මම අද පෙඟෙව ගෙණ හුන්නෙමි. දැනය තම් සීලයෙහි පිහිටා ගෙණැ දුන් කලැ මහා ඵල වන්නේ ය අද මා කරා යාචක කෙණෙක් අවු තම් මා කන තණ උන්ට දීලන්ට නො පිළිවන. අනිත් මිනිසුන් කන්නට සුදුසු ආහාරයෙකුදු මා කෙරෙහි නැත. බල! මාගේ ශරීර මස් එක යාචකයක්හු සය නිවා කන්නට ඇත.

මාගේ දැනයෙහි ලොල් වූ මනොරථය මුදුන්පත් වන්නට සුදුසු කුසලෙක් ඇත් තම් මා අත් බලා වසන්නා වූ මෙලොව සසරින් ගැළවෙන්නට සුදුසු භාග්‍යයෙක් ඇත් තම් මාගේ දැන පරමාර්ථ පාරමිතා ව මසකකප්‍රාප්ත වුවමනා වී තම් සියලු ලොව නිවා සතහැලුව මැනැවැ යන මාගේ මනදෙළ මුදුන් පත් වුවමනා වී තම් අද මා කරා යාචකයක්හු අවහොත් යහපත" යි ආවර්ජනා කොටැ වැඩැ හුන් සෙයෙක.

මෙසේ සිතුවා වූ බොධිසත්ත්වයන් වහන්සේගේ දැනාධ්‍යාශයෙහි බලයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පාණ්ඩුකම්බලසිලාසනය උෂ්ණාකාර දැක් වී ය. ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ මා නො කැමැති සේ මාගේ ආසනය හුණු වන්නට කාරණා කිම් දෝ හෝ යි ආවර්ජනා කරන්නේ සවාම්දරුවන්ගේ දැනාධ්‍යාශයෙන් හුණු වූ බව දැනැ මේ මහාතමයා සම්ප්‍රාප්ත වූ යාචකයක්හු හට ශරීරමාංශය දෙමි කියා සිතා හුන්නේය.

මේ සිතූ අදහස කෙසේ වූ අදහසක් දෝ හෝ මේ අදහස සාබැ වී නම් මෙසේ වූ වටුන් ලද ලොව සේ කුසල් කළෝ ඇද්ද? සියලු ලොකයෙහි ජීවිත ලද්දවුන් කෙරෙන් මෙසේ වූ ජීවිත ලද්දේ ඇද්ද? සසර දුකට මෙසේ වූ ඖෂධයෙක් ඇද්ද? අමා මහ නිවන් පුරයට මෙසේ වූ රජමහවතක් ගසන්නෝ ඇද්ද? තෘෂ්ණාවට මෙසේ වූ මුහුණ මිරිකුම් කරන්නෝ ඇද්ද? පරාභවයට මෙසේ අභිෂෙක කරන්නෝ ඇද්ද? ධර්මයට මෙසේ දිවි දුන් සිනහවන්නෝ ඇද්ද? මේ මුත් පරීක්ෂා කට යුතු දෙයක් ඇද්ද? මෙසේ වූ මහා පුරුෂයන් මුත් අනික් දුක්ක යුත්තෝ බිණිය යුත්තෝ ඇද්ද? මේ උපන් අදහස මා ගොස් පරීක්ෂා කළ මැනැවැ" යි සිතා —

පළමු කොවැ මස්කාවා වසන තැනට ගොස් බ්‍රාහ්මණවෙසයෙන් සිටැ කුමක් පිණිස අසිදැ යි විමාළ කල්හි "පණ්ඩිතයෙනි! අද පොහෝ දවස් පෙහෙවගන්නට සුදුසු ආහාරයක් නො ලදිමි. ඉදින් කිසි ආහාරයක් ලදිමි නම් ඒ වළඳා පෙහෙව ගන්නා කැමැත්තෙමි" යි කී ය.

ඒ අසා **මස්කා පණ්ඩිතයෝ** "මාගේ ගුරු වූ සසපණ්ඩිතයන් වහන්සේ යාචකයන්හු දුටු හොත් ශක්තිපමණින් දන් දෙව යි වදාළ සෙයෙක. මේ ද අවුත් සිටියේ යාචකයෙක. මෝහට මාගේ ඇති දෙය්‍යධර්මය නො වළහා දන් දුන මැනවැ" යි සිතා බ්‍රාහ්මණය, මාගේ රෙහෙමස්සු සත්දෙනෙක් ඇත. ඔවුන් වළඳා පෙහෙව ගෙණැ මේ වනයෙහි හිඳා යෙහෙන් මහණ ධර්ම කර'යි කිහ.

ඒ අසා ශක්‍රබ්‍රාහ්මණ තෙම "තව ඉතා ම උදාසන වුව. පසුව දන්නෙමි වේදැ" යි කියා **කැණහිල් පණ්ඩිතයන්** කරා ගොස් මෙසේ ම සිවැ කුමක් පිණිස අයි දැ යි කී කල්හි එපවත් කී ය.

ඒ අසා ශෘගාලපණ්ඩිතයෝ "බ්‍රාහ්මණය! මාගේ හුල්පැලහු මසක් හා ගොයකු හා දී ගෙඩියක් ඇත. ඒ ගෙණැ වළඳා යෙහෙන් වනයෙහි වැසැ තපස් කරව" යි කී ය. ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ ඔහුදු විමසා **වානර පණ්ඩිතයන්** කරා ගොස් මෙසේ ම සිටැ ඔවුන් විසින් විවාරණ ලද්දේ ඒ පවත් අසා **වානර පණ්ඩිතයෝ** ද "බ්‍රාහ්මණය! මාගේ අඹකැනක් හා ගඩොලයෙහි සිනිල් පැන් හා ඇත. අඹ කා පැන් බී හී ගෙණැ යෙහෙන් මහණ ධර්ම කරව" යි කිහ.

ඒ අසා ශක්‍ර බ්‍රාහ්මණ තෙම "පසුව දන්නෙමි වේ දැ යි කියා බොධිසත්ත්වයන් කරා එළඹ සිටියේ. සසර පමණින් යාචකයන් ම ස්නෙහයෙන් ම බලන්නට කළ දැසක් හා ඔවුන් හා මධුර කථා කරන්නට කළ තුඩක් ඇති හෙයින් බොධිසත්ත්වයෝ ශක්‍රයා මුහුණ බලා බ්‍රාහ්මණය! කුමක් පිණිස අයි දැ" යි

විචාරා වදාළ සේක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ "පණ්ඩිතයෙනි! ඉතා ම සයිමි. අද පෙහෙව ගන්නා කැමැත්තෙමි. අහරක් සොයා ආම්" යි කී ය.

ඒ අසා බොධිසත්ත්වයෝ සර්‍වඥයෙහි එක පැහැරැ කෙළින් සිටගත්තා වූ සියලු රෝම ඇති වැ එසේ වූ ප්‍රිය වචනයක් කී ඔහුගේ මුහුණ බල බලා ඇසින් වැගිරෙන සතුටු කඳුලෙන් යුකත වැ "බ්‍රාහමණය! ආ සේ ඉතා යහපත. දුටු දැක්ම ඉතා ප්‍රිය ය. අප සිතූ සිතක් හා තොප කී බසක් හා දෙක හැඟෙන පරිදි අපගේ දෙවයෙන් වූ බව මුත් අනික් ලෙසකින් නො වූ ය. සාම්ඝ යි කියා ආවා වූ තොපව අපගේ කවර ධාන්‍යයෙක් ඇත්තෙන් දෙමෝ ද? මිනිසුන් කන්නට සුදුසු වූ අපගේ ඇති වැ තුබූ යේ නම් අපගේ ඇඟමස් ම ය.

කිසිවක් නැති මේ ජාතියෙහි තබා මුළු ලොවට ඊශ්වර වූ දවසක් ඇත ත් දන් දී පියන්නා කැමැති ඇසෙක් හෝ ඉසෙක මසෙක් හෝ ය. ඉදින් තෙපි අප මරා ගන්ව යි කීමෝ නම් තොප අත ප්‍රාණවධය බැඳෙන්නේ ය. එහෙයින් තෙපි ගොස් එක් තැනෙක ගින්නක් දල්වා ලව. අප අපගේ මනදෙළ පුරා එහි හි පැලහී ගිය කලැ යෙහෙන් අනුභව කොවැ මහණ දම් පුරා" යි වදාළ සෙයෙක.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ අධික වූ විසමයට පැමිණැ එක් තැනකට ගොස් මහා අඟුරු රැසක් මවාලා බොධිසත්ත්වයන්ට දැන්වී ය. ඒ අසා සඬාම්දරුවෝ වැඩැහොත්තා වූ තණ ඇතිරියෙන් නැඟී සිටා පෙහෙවස් ගෙණැ අභිමෙක භූමියට නික්මැ ගත්තා වූ රාජකුමාරයන්ගේ සේ සතුටු සතුටු වැ නික්මැ අඟුරු රැස් බලා පියා තමන්ගේ ශරීරය ද බලා සසින් සිටි බ්‍රාහමණයා මුහුණ ද බලා ලොකයෙහි සත්ත්වයාගේ ප්‍රාණයට වඩා ප්‍රිය වූ දෙයක් නැත. මම ඒ ප්‍රාණයෙහි අපෙක්ෂාවක් නැති වැ මේ ගින්නෙහි හි පැලගි මස් දන් දෙමි.

මෙහි අනුහසින් මතු මාගේ ඇඟින් විසිරගිය උදු බිහලි මූං බිහලි තල ඇට සා ඇට ගෙණැ පූජා කළෝ ද සසර දුකින් මිදී අමාමහ නිවන් දක්ත්ව යි රාගාග්නීන් වෙහාග්නීන් මොහාග්නීන් තැවී දෙම්නස් පත් මුහුණක් මුලුලොව වැස්සනට තොපා වීම්ව යි රාජභය චොරභයා දී වූ කිසි භයකින් දුක්පත් වැ හඬන ලෝ වැස්සාගේ කඳුලු මුසු මුහුණක් දැක්ක නො හෙම්ව යි මා එක තැනැත්තහු ගැසූ නිවන් මඟ සුවිසි අසඛ්‍යයක් සත්ත්වයා නො ඇකිළී වදනා පරිද්දෙන් මහත් වේ වයි.

"මරහු හැරැ අනික් කෙණෙක් මා කරා අවුත් හසින් වෙව්ලා නො දිවෙත් වයි, මාගේ කරුණා ජාලයෙහි හසු වූ සතෙක් අමා මා නිවණට වැදූ මුත් සසරෙහි දුකට පාත්‍ර නො වේව යි, කී කී බසෙහි තැතු තැතු පියවරෙහි බැලූ බැලූ දිසායෙහි ලොකාඵ මුත් අතිකක් කට නො ගෙම් වයි, නිද නිදා සිහිනෙනුදු මාගේ නම සිහි කළ සත්ත්වයෙක් ඇත් නම් ඔහු මා වන් අමාමහ නිවන් පුරයට ගෙණැ ගොසින් මුත් නො නවති ව යි, මා මේ අහුරු රැසට පතන පිනුම ම මා වජ්‍රාසනයට නහා මුත් නො නවතීව යි.

"මෝ හට මා දෙන ශරීර මාංශය මතු මා මුළුලොවට අමාමහ නිවන් දෙන බවට පූර්විනිමිත්තා වේව යි, මේ ජාතියෙහි පවන් ගෙණැ බුදු වැ අමාමහ නිවන් දක්නා ජාති දක්වා මාගේ සුවයෙන් මුළුලොවට සුවපත් කට හෙම්ව" යි කියා මෙසේ සම්බුත්ත්වයෙන් කුළුගෙණැ ප්‍රාර්තනා කොටැ සිහලු සත්ත්වයන් කෙරෙහි පවත්නා වූ කරුණායෙන් මා ගින්නෙහි පැලහෙන කලැ මාගේ ශරීරයෙහි කිසි ප්‍රාණීන් කෙණෙකුන් දැ ගිය හොත් නපුරු යි කියා සිතා වදුරා තුන් විටෙක ශරීරය පොළා පියා පියුම් විලකට වදනා රාජහංස යක්හු සේ ගිණි ගෙණැ දිලිහෙන සාලගුරු රැසට පැනපී සෙයෙක.

සඟම්දරුවන්ගේ ධර්මාලයෙහි බලයෙන් අවිචි වහ්නියක් සේ දැනී වූ ඒ ගින්න ද ශරීරයෙහි රොමකූප මාත්‍රයකුදු හුණු කරන්නට අසමර්ථ වී ය. ලක්ෂයක් වටහා රත්පලස් මත්තෙහි හුන්නා වූ රාජ කුමාරයන්හු සේ, රත්ගල් තලෙහි හුන්නා වූ කෙශර සිංහරාජයන්හු සේ, වැඩැහිදැ ශක්‍රයා මුහුණ බලා කොල! තාගේ මේ ගිනි ඉතිරි ගිනි සේ නො වෙයි. හෙල්මැලි ගැබින් සදුන් පල්ලෙන් මඳ මාරු තයෙන් හිමකනිකායෙන් සිහිල් තාක් ගෙණැ පිඬු කොටැ වටා දැල් වූ ගින්නක් වැන්න. මේ කුමක්දැ" යි විවාරා වදාළ සෙයෙක.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ බ්‍රාහ්මණ වෙශය ඇරැ පියා ශක්‍රවෙශයෙන් සිටැ "මහාපුරුෂය! මම බ්‍රාහ්මණයෙක් නො වෙමි. දෙදෙව්ලොව දෙවතාවන්ට අධිපති වූ ශක්‍රදෙවෙන්ද්‍ර යෙමි. තොපගේ ගුණ මහිමාවෙන් මාගේ පණ්ඩුකම්බල සිලාසනය හුණු වැ ගිය හෙයින් තොපගේ දානාධ්‍යාශය පරීක්ෂා කරන්නට ආමි යි දැන්වී ය.

ඒ අසා සඟම්දරුවෝ සී පියා "තෝ නම් එකසක්වලෙක්හි එක ශක්‍රයෙක. තා තබා අනන්තාපරිමාණ සක්වළ අනන්තාපරි යන්ත ශක්‍රයෝ කැවි වැ ද මාගේ දානාධ්‍යාශයෙහි අඩුවක් දක්ක ගත නොහෙන්නා හ. ජීවිතයෙහි සෙනහයක් ඇත්තෙම් වීම් නම් සෙනහයෙන් ශරීරයක් රැක්ක මැනවැ යි සිතම් නම් මට සුවයෙක්

කැමැත්තෙම් වීම් තම් දුක්පත් මුළුලොව කෙසේ ගළවම් ද? මේ ලොවට කෙසේ සිතෙහැත්තෙම් සි සිතම් ද? මා ආශ්‍රය කළා වූ ලොව කෙසේ ගැළවෙද්දැයි වදාළ සෙයෙක.

මේ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ "සවාම්දරුවාතෙනි! තොප සේ වූ මහාපුරුෂයන්ත කෙණෙකුන්ගේ ගුණ මද දවසක් පවත්නා බව සුදුසු නොවෙයි. කල්පාන්තයක් දක්වා මුළුලොවට ප්‍රකට වුව මැනවැ"යි සිතා සඳමඬලෙහි බොධිසත්ත්වයන්ගේ රූපය හැඳැ බොධිසත්ත්වයන් වඩා ලෙහි හොවා ගෙණැ වසන්නා වූ වනලැහැබෙහි ම හොවාලා වැඳැ පැදකුණුකොටැ ජීවිත ඇත්තවුන්ට ඇස් ලද්දවුන්ට තොප සේ වූවන්ගේ දුක්ම වාසනා වේව"යි පතා දෙව්ලොවට ගියේ.

මෙසේ තිරිසන් වැ උපන් සවාම්දරුවන්ට පොවා ධර්මයෙහි බලයෙන් ඒ ගිනි සිහිල් වූ බව ඇසූ සත්පුරුෂයන් විසින් සියලු උපද්‍රවයෙන් ගැළවී අභිමත සම්පත්හි සාධා කයින් සිතින් සුව විඳිනා පිණිස සඬ්ඝමීය ම මෙතෙහි කොටැ **ධර්ම ය සරණ යා යුතු.**

17. සසජාතක කථා.

---

18. සඬ්ඛබ්‍රාහ්මණ කථා

තව ද සියලු බුදු පසේබුදු මහරහතන් වහන්සේ වරුන්දැ මුළුලොවට රක්‍ෂාවට තැකූ, සියලු දුඃඛයට ප්‍රතිපක්‍ෂ වූ, සියලු සත්ත්වයාහට ආවාහන මන්ත්‍ර වූ, සියලු ලොකාර්ථයට මූලප්‍රතිඥා වූ සඬ්ඝමීය තමා රක්නවුන් රක්‍ෂාකරණ පරිදි භාග්‍යවතු පිණිස මාගේසවාම්දරු වූ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ බොධිසත්ත්ව භූමියෙහි **සඬ්ඛබ්‍රාහ්මණ** කල්හි පරතෙරක් දැකගත නොහැක්කා වූ මහාසමුද්‍රයෙහි නැවු බිඳී පොවා ධර්ම බලයෙන් එහි පිහිට ලද්දා වූ **සඬ්ඛබ්‍රාහ්මණ චරිතය** දක්වා දහම් සරණ යාමෙහි සත්පුරුෂයන්ව උත්සාහ වඩවනු කැමැත්තෙම්. ධර්ම බලයෙන් සසර දුකින් ගැළවෙනු කැමැති සත්පුරුෂයන් විසින් බෝධිසත්ත්ව ගුණ මිශ්‍ර වූ ධර්ම මහත්ත්වය හඟවන්නා වූ මේ කථාව සිතෙහැති වැ ඇසිය යුතු.

හෙ කෙසේ ද? යත්:—

දීපඞ්කර පාදමූලයෙහි හස්තප්‍රාප්ත වූ නිර්‍වාණසම්පත්තිය හැරැ මා ඇතුළු වූ මුළුලොව ගලවන පිණිස සංසාර සාගරයට වන්නා වූ සවාම්දරුවානන් වහන්සේ ජාතියෙන් ජාතියෙහි ලොකාර්ථ කෙරෙමින් දිව්‍ය – මනුෂ්‍යලොකයෙහි සංසරණය කරණ සෙයෙක් මේ කප්හි **මෞලිනී** නම් නුවර **බ්‍රහ්මදත්ත** නම් රජ්ජුරුවන් රජ කරණ සමයෙහි තමන් වහන්සේ **සංඛ** නම් බ්‍රාහ්මණ වැ මහාධන

සම්පත්තීන් යුක්ත වැ සතර නුවර දෙරැ හා නගරමධ්‍යයෙහි හා තමන් වහන්සේගේ ගෙදොර හා මේ තැන්හි දන්හල් කරවා එකි එකි දන්හල්හි ලක්ෂයක් බැගින් සලක්ෂයක් ධන විසදම් කොටැ මහදන් දෙන සෙයෙක.

එසේ මහදන් දෙන සවාම්දරුවෝ එක් දවසක් "මාගේ ධන ය ඉතා මහත. ක්‍රමයෙන් මේ ධනය ක්ෂීණ වැ ගිය කල්හි දන් දී ගන්නට නො පිළිවන. එසේ හෙයින් ධනය ක්ෂීණ වන් නාව පළමුකොටැ නැවු යාත්‍රා කොටැ සවණ්හුම්යට ගොසින් ධනය ගෙණෙව මැනවැ"යි සිතා වදරා නැව ඉදිකරවා බඩු පුරවා ගමනට සැරහි වැඩැ සිවැ අඹුදරුවන් කැඳවා "මා එනතාක්කල් මාගේ ධනය අඛණ්ඩ කොටැ පවත්ව"යි අවවාද දී වදරා වහන් සඟලක් ශ්‍රීපාදයෙහි ලා ගෙණැ, කුඩයක් හිසට කරවා ගෙණැ, බොහෝ දාසකම්කාරයන් විසින් පිරිවරණලදුව නැවු නැඟී වදරන්නේ පටුන් ගම් අභිමුඛ වැ නික්මැ වදළ සෙයෙක.

එසමයෙහි ගදමහන් පව්වෙහි වසන්නා වූ එක් **පසේබුදු** කෙණෙකුන් වහන්සේ සමුද්‍රයාත්‍රාකරණ පිණිස නික්මැ ගත්තා වූ සවාම්දරුවානන් දිව ඇසින් දැකැ "දානයෙහි ලොල් වූ මේ **බුද්ධාඞ්කුරයා** යාත්‍රා පිණිස යැ යි නික්මින.

ඔහට සමුද්‍රයෙහි වන්නා වූ අනතරායෙක් ඇද්දෝ නැද්දෝ හෝ යි පරීක්ෂා කොටැ වදරණ සෙයෙක් පැමිණෙන අනතරායෙක් ඇතැයි කියා දැනැ වදරා මෙතෙම මා හිතහොත් තමා ගේ වහන් සඟළ හා කුඩය හා මට දන් දී එහි අනුසසින් මහා සමුද්‍රයෙහි නැවු බුන් තැන්හි සත්රුවන් පිරුනු මහා නැවු ලදින් පිහිට ලබන්නේයැ"යි "ඕහට මා අනුග්‍රහ කළ මැනවැ"යි සිතා වදරා ආකාශයෙන් අවුත් බොධිසත්වයනට නුදුරු තැනට බසැ ප්‍රවණ්ඩ වූ වාතා'තපයෙහි සාලහුරු ඇතිරියක් වැනි හුණුවැලි මැඩැ ගෙණැ වඩනට පවන්ගත් සෙයෙක.

බොධිසත්ත්වයෝ පසේබුදුන් වහන්සේ දැකැ "මේ මා දුටුයේ පුණ්‍යක්ෂේත්‍රයෙක. අද මා මේ පුණ්‍යක්ෂේත්‍රයෙහි කුසල් බීජ යක් වපුරණ බව සුදුසුයැ"යි සිතා වදරා පසේබුදුන් වහන්සේ කෘරා එළඹැ පසඟ පිහිටුවා වැඳැ "සවාමිනි! මට අනුග්‍රහ පිණිස මදක් මේ ගස මුලට වැඩැ සිටිය මැනවැ"හි ආරාධනා කොටැ රාක් මුලව වඩා ගෙණැ ගොස් එහි වැල් ගොඩක් කොටැ ඒ වසා උතුරුසළුවක් අතුරා පසේබුදුන් වහන්සේ එහි වඩා හිඳුවා වැඳැ සුවඳ කොටැ පෙරහා ගත්තා වූ පැනින් ශ්‍රීපාදය සෝදවා සුවඳ තෙල් පස ගල්වා තමන් වහන්සේගේ වහන් දෙක ගළවා

සුවඳ තෙලින් වකා ශ්‍රීපාදයෙහි ලාලා කුඩය ශ්‍රී හස්තයට පිළිගන්වා "සවාමිනි! මේ කුඩය හිසට කොටැ ගෙණැ මේ වහන් ශ්‍රීපාදයෙහි බහා ගෙණැ සුවසේ වැඩිය මැනවැ"යි වදාළ සෙයෙක.

පසේ බුදුන් වහන්සේ ද:—

"ඉච්ඡිතං පත්ථිතං තුයහං - ඛිපපමේව සමිජ්ඣතු,
සබ්බෙ පූරෙනතු චිත්තා සඛකපපා - වණ්ඩෙපණණරසී යථා"

යන ගාථායෙන් අනුමෙවැනි බණ වදාරා මදතැනක් ශ්‍රී පාදයෙන් වැඩැ "මෙසේ මෘඇඟි තැනකට වත මා දන් දුන්නේ" යයි බොධිසත්ත්වයන්ට ප්‍රසාද වඩන පිණිස බොධිසත්ත්වයන් බල බලා සිටියදී ම ආකාශයට පැනැ නැඟි **පඤ්චවණ්ණ** වලාහක **පඞ්කති** මැඩැ ගෙණැ **ඝණ්ඩමාදන පච්චතයව** ම වැඩි සෙයෙක.

බොධිසත්ත්වයෝ ද ඒ ආශ්චය්‍යීය දැක වදාරා "මා දුන්නා වූ දානය ඉතා සළුලයැ"යි මහත් වූ සනෙතාෂයට පැමිණි සෙයෙක. එසේ අධික වූ සනෙතාෂයට පැමිණි සවාමිදරුවෝ නැවු නැඟී සමුද්‍රයෙහි නික්මුණු සෙයෙක සත් දවසක් සමුද්‍රයෙහි ගියා වූ නැව දිය දැකැ පියා දිය ඉස ද උනු කොටැ පියන්නට අසමර්ථ වූ මහාජනයා මරණ භයින් තර්ජිත වැ තමන් ගේ ඉෂ්ටදෙවතා-වන්ගේ නම් කිය කියා හඬන්නට පටන් ගත්හ.

එ සමයෙහි සවාමිදරුවෝ ජාති ජාතියෙහි නැවු බිදුනු කලැ මුහුදෙහි දිය කෙළනා විලෙක්හි දිය හොරුවක් පෙරළී ගිය කල්හි ඒ විල පිහිනන්නවුන් භය නැති වැ පිහිනන්නා සේ මහා සමුද්‍රයෙහි පිහිනා පරිවය ඇති හෙයින් කිසි භයක් නො කොටැ තමන් වහන්සේ ගේ එක් අතවැස්සකු හැරැ ගෙණැ සර්ෂපයෙහි තෙල් ගල්වා ශකීරා හුනු හා එළෙහිතෙල් බඳ පුරා මෙහෙ නිමවා අතවැස්සා හා කැටි වැ මහා කුඹට නැඟි එවේලෙහි කිසි චකිතකමක් නැති හෙයින් කුඹ මත්තෙහි වැඩැ සිටැ "අපගේ හිමි නුවර මේ දිසාවේය යි දිසාව හිමි කොටැ ලා නැවුහි සෙසු ගිනවීය්‍ය සත්වයන් මවහි කවඡපයන්ට ගොදුරුවෙමින් සිටියදී ම මවහි කවඡපයන් විසින් වන්නා වූ උපද්‍රවයෙන් තමන් වහන්සේ ගළවා අතවැස්සා හා කැටි වැ ම ඉස්බක් තැන් පැනැ ගෙණැ ඇත වැටී ගි මුහුදු පිහිනන්ට පටන් ගෙණැ වදාළ සෙයෙක.

එසේ මුහුදු පිහිනන්නා වූ සවාමිදරුවන් වහන්සේට සත් දවසක් ඉක්ම ගියේ. එසේ වූ මහා සමුද්‍රයෙහි පිහිනන්නා වූ සවාමි දරුවන් වහන්සේ ද තමන් වහන්සේ දානසීලාදී වූ සුචරිත ධර්මයෙහි ලොල් වූ සිත් ඇති හෙයින් හා කුශල ධර්මයෙහි පමා නො වැ ලුණුදියෙන් ශ්‍රී මුඛය සොධා පියා පෙගෙ වැ වදාළ සෙයෙක.

එ සමයෙහි සතරවරම් මහරජ්ජුරුවන් විසින් "මහා සමුද්‍රයෙහි නැවු බිඳී නස්නා තෙසරණ ගිය කෙණෙකුන්වත්, මවු පියන් රක්‍ෂාකරණ කෙණෙකුන්වත් සෙප්‍ර ශීලාචාරසම්පන්න කෙණෙකුන්වත් ඇතහොත් රක්‍ෂාකරව" යි සිටුවන ලද්දු වූ මණිමෙඛලා නම් දිව්‍ය ස්ත්‍රිය තමාගේ ඓශ්වර්‍ය්‍ය මදයෙන් සත්දවසක් මහා සමුද්‍රය පරීක්‍ෂා නො කොටැ සත්වන දා බලන්නී පිහිනන්නා වූ බොධිසත්ත්වයන් දැකැ "මේ මහා පුරුෂයාතන් මුහුදෙහි හුනුයේ අදින් සත් දවසක් ය ඉදින් මුන්ට කිසි උපද්‍රවයෙක් වූයේ වී නම් වරම් රජ්ජුරුවන් විසින් මට මහා උදහස් වූයේ ය මම ද මහත් වූ ගර්‍හාවට පැමිණියේ වෙමි

එහෙයින් ඒ මහා පුරුෂයා පිනතා තැනට වෙලෙවිව ගිය මැනව" යි සිතා කාකා'ග්‍ර රස භොජනයෙන් පිරූ රන් පාත්‍රයක් හැරැ ගෙණැ වාත වෙගයෙන් ගොස් පිහිනන්නා වූ බොධිසත්ත්වයන් අභිමුඛයෙහි ආකාශයෙහි සිටැ "බ්‍රාහ්මණය! තෝ සත් දවසක් මුළුල්ලෙහි නිරාහාර වී මේ දිව්‍ය භොජනය අනුභව කරව" යි කිව.

ඒ අසා සවාමිදරුවෝ ආකාශය බලා ආකාශයෙහි සිටියා වූ දිව්‍යස්ත්‍රිය ද ඇ අත තිබූ දිව්‍යභොජනයෙන් පිරුණු සවණී පාත්‍රය ද බලා සත්දවසක් නිරාහාරවැ ද මුහුදු පිනා විඛා වැ ද දිව්‍ය භොජනය යත නම අස අසා ද ගෙණා දිව්‍යභොජනය දැකැ ද මට දිව්‍ය භොජනයට ද වඩා අවශ්‍යයෙන් මා රක්‍ෂා කරන්නා වූ ශීලය ඇ යි සිතා වදුරා "තිගේ දිව්‍යභොජනය හැරැ ගෙණැ යව. මම පෙහෙවීමි. මේ වේලා නොවෙ"යි වදුළ සෙයෙක.

ඒ අසා පස්සෙහි පිහිනන්නා වූ අතවැසි තෙම දෙවතා වූව තමාට නො පෙණෙන හෙයින් බණ වදාරන්නා වූ බොධිසත්ත්වයන් ගේ කවහඬ අසා "මාගේ සවාමිදරුවෝ ඉතා සුබුමාල හෙයින් සත් දවසක් මුහුදු පිනා විඛා වැ මරණ භයින් භයපත් වැ තන් දෙඛන වන්හ ඔවුන් අස්වැසූ වැ මැනවැ"යි සිතා, සවාමිනි! තෙපි බොහෝ ඇසූ විරූතැන් ඇත්තව, බොහෝ ධර්‍මයෙහි පුරුද්දව! බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන් දැකැ පරිචයව. එසේ වූ තෙපි නො හැඬුව මනා තැන ගඩව. මා මුත් අනික් තොප හා බණන කෙණෙකුන් නැත. "මම පෙහෙවීමි. බත් හැරැ ගෙණැ යව"යි කියා තොප තන් දෙඛන්නේ කා හා දැ යි කිය.

ඒ අසා බොධිසත්ත්වයෝ "දේවතා වූ මෝහට නො ණෙන වනැ යි සිතා වදුරා "කොල! මරණයෙහි භය ඇත්තෝ තම් කයින් – වචයින් – මනයින් අකුශලයක් කළ කෙණෙක් වෙද්ද?

මා මාගේ අවසථා දන්නා පවත් කොටැ මෙ තැන් දක්වා පසඳ ශීලය විරොධයක් කළ තැනක් නැත. දැනදි වූ සුවරිත ධර්මයෙහි යෙදී විසුව මම කුමක් පිණිස මරණයෙහි භය කෙරෙම් ද? මා තම් බිණ්ඩු දැ නැත.

මේ ආකාශයෙහි සිටියා වූ දෙව්දුනු බදු වූ බැමයෙන් හොබ නා වූ සර්‍වාඩගයෙන් ශොභන වූ දිව්‍යාභරණයෙන් විභූෂිත වූ දිව්‍ය සත්‍රියක් සවණී පාත්‍රයෙන් දිව්‍ය භොජන හැරැ ගෙණැ මට බත් කන්නට ආරාධනා කෙරෙයි මම මා පෙහෙ වූ හෙයින් මේ බත් කන වේලා නො වෙයි කියා බත් නො කමි. හැර ගෙණැ යා යි කිම්''යි වදාළ සෙයෙක

ඒ අසා අතවැසි තෙම ''සවාමිනි! මෙසේ වූ දුඃඛයකට පැමිණියා වූ තොපට දෙවතා කෙණෙක් පෙණුනෝ වී තම් උන්ට තමසකාර කොටැ අපට මේ දුකින් ගැලවීමෙක් ඇද්ද? නැද්ද යි කියා විචාරව''යි කීය. ඒ අසා බොධිසත්ත්වයෝ ''කී සේ යහ පත''යි සිතා වදාරා දෙවතා දුව මුහුණ බලා මා ප්‍රිය වසඳුසින් බල බලා සිට මේ දිව්‍යභොජනය අනුභව කරව යි කියන්නා වූ තෝ දිව්‍ය සත්‍රියෙක් හි ද? මනුෂ්‍ය සත්‍රියෙක් හි දැ යි විචාරා වදාළ සෙයෙක.

ඒ අසා මණිමෙඛලා තොමෝ ''සතරවරම් රජ්ජුරුවන් ගේ නියෝගයෙන් මහා සමුද්‍රයෙහි රක්‍ෂායෙහි සිටියා වූ මණිමෙඛලා නම් දිව්‍යසත්‍රි නම් මම ය. තොපට රක්‍ෂා පිණිස මෙ තැනට ආමි. තොප කැමති කැමති වසතුවෙක් ඇත්නම් ඒ ගන්ව යි කිව.

ඒ අසා බොධිසත්ත්වයන් වහන්සේ ''මේ දිව්‍යසත්‍රි තොමෝ කිසි කෙණෙකුන් නැත්තා වූ මේ සමුද්‍රයෙහි තොපට කැමති වසතුවක් දෙමි''යි කිය යි. මා කළ කුසලයක් නිසාදෝ හෝ තමා ගේ දිව්‍යානුභාවයෙන් දෝ හෝ සිතා වදාරා ''දිව්‍යසත්‍රිය! මා කළා වූ යම් කුසලයෙක් ඇත්නම් ඒ සියලු කුසලයට තෝ හිමියෙහි. මෙබඳු වූ මහා සමුද්‍ර මධ්‍යයෙක්හි තොප කැමැති යම් වසතුවක් ගෙණැ මේ දුකින් මිදී සුවපත්ව යි කියන්නේ මාගේ කවර කුශල කර්‍මයෙක්හි බලදැ යි විචාරා වදාළ සෙයෙක.

ඒ අසා දිව්‍යසත්‍රි තොමෝ ''බ්‍රාහමණය! මා තොපට මෙතෙක් සමපතනි දෙමි යි කියන්නේ අනික් තොප ගේ බලයක්වත් මාගේ බලයක්වත් සිතා නො වෙයි. තොප මේ තැවට කැමෙන දවස් හුණු වැල්ලෙහි වඩනා පසේබුදුන් වහන්සේ ගේ ශ්‍රීපාදයෙහි ලා පූ වහන් සඟලෙහි අනුසසින් මේ මහා සමුද්‍රයෙහි තොපට වහල් වැ සිටියේ ඒ දැනයැ''යි දැන්වූව.

ඒ අසා බොධිසත්ත්වයෝ තමන් වහන්සේ දුන් දානය සිහි කොට සතුටු වැ "ධර්මය නම් මෙසේ සත්ත්වයා හට වහල් දෙයෙක් වනැ"සි අධික වූ ප්‍රසාද උපදවා, තවද මා මාගේ නුවරට ගොසින් කුසල් කළ මැනවැ සි සිතා මණිමේඛලාවට "තෝ ඉදින් මාගේ කුසලබලයෙන් ම මට වහල් වන්නේ වී නම් මහ නැවක් මවා මා ඒ නැවට නඟා ගෙණැ ගොස් මාගේ නුවර ම සිටුව"සි වදාළ සෙයෙක.

ඒ අසා දෙවි දූ සතුටු වැ අටඉස්බක් පමණ දිග ඇති, සතර ඉස්බක් පමණ පළල ඇති, සත්රියන් පමණ ඇටින් විසියටක් පමණ පළල ඇති ඉන්ද්‍රනීල මණිමය වූ තුන් කුඹෙකින් හොබනා සවණිමය වූ යොත් හා රිටි හා පළුපත් හා ඇති නැවක් මවා දන් දෙන පිණිස වසතු සොයා යාත්‍රා කෙරෙ සි වේද?

මෙ වැනි මහා පුරුෂයක්හු මුහුදු හුනුයේ. එහෙයින් මේ ජාතිය මුළුල්ලෙහි අනික් තැනකින් ධන නො සොයා දන්දෙන පරිද්දෙන් නැව සත්රුවනින් පුරා බොධිසත්ත්වයන් සිප ගෙණැ ලෙහි හෙවා ගෙණැ නැවැ සිටුවා ලුව. පස්සෙහි යන්නා වූ අත වැස්සා වෙත කුසලයක් නො කළ හෙයින් මුහුණු නො බැලුව. බොධිසත්ත්වයෝ ඒ බව දැනැ නැව වැඩ සිටැ තමන් වහන්සේ කළ පින්කම් ඔහු අනුමෝදන් කරවා වදාළ සෙයෙක හෙ ද පින් අනුමෝදන් වි ය.

දෙවතා දූ ඔහු ද වඩා ගෙණැ ගොස් නැවැ සිටුවා බොධිසත්ත්වයන්ගේ **මෞලිනී** නම් රාජධානියෙහි ගෙණැ ගොස් සිටුවුව. ඉදිරියෙහි පිහිතන්නන් මෙම කපැ බුදුවන ජාතියෙහි **ගෞතම** නොත්‍රයෙහි උපන් සඞ්ඝාමිදරුවන් වුව. පස්සෙහි පිහිතන්නන් උපසථානකරන්නවුන් කෙරෙහි අගතැන් ලබන ජාතියෙහි දිවි පුදා දස්කම් කළ අනඳමහතෙරුන් වුව. අවුත් සිටැ නැවු මවන්නන් බුදුවන ජාති අග්‍රශ්‍රාවිකා වන **උපුල්වන්** මහතෙරනීන් වහන්සේ වුව.

මෙ වැනි ඥානසම්භාරයෙක් ඒ තැන්හි නො වැ කො තැන්හි වේ ද? එසින් සත්රුවන් නැවින් ගොඩ දැකැ තමන් වහන්සේ ගේ නුවරට වැඩියා වූ සඞ්ඝාමිදරුවෝ ඒම සත්රුවන් ගෙණැ දිවි පමණින් දානාදි වූ කුසල් කොටැ සඟලොක පරායන වූ සෙයෙක.

මෙසේ මැදැ මුහුදෙහි නැවු බුන් තන්හි පොවා ධර්මය ම සත්ත්වයාහට වහල් වන බව ඇසූ සත්පුරුෂයන් විසින් එළඹැ සිටියා වූ උපද්‍රව දුරුකොටැ සියලු සම්පත්තීන් යෙදී සියලු දුක්හි රස නො විඳැ පඤ්චේන්ද්‍රියයන් සංහිදුවා සුව විඳැ අනතයෙහි අමා මහනිවන් සුවයෙහි කුළුගන්නා පිණිස සැදැහැයෙන් හා නුවණින් යෙදී **දහම් සරණ යා යුතු.**

18. සඬබ්‍රාහ්මණ කථා.

තව ද මේ ධර්මය තමා රක්‍ෂා කළවුන්ට එළඹැ සිටියා වූ සියලු උපද්‍රව දුරුකොටැ ශාන්ති කරණ බව හඟවන පිණිස මාගේ සවාමිදරුවන් වටු වැ උපන් කල්හි උන්වහන්සේ වසන්නා වූ වනය එකහෙළා දවා ගෙණැ ආවා වූ ලැව්ගින්න ඔබගේ ධර්මබලයෙන් නිවුනු පරිදි කියා කුශලධර්මයෙහි සත්පුරුෂයන්ට උත්සාහ වඩවමින් ඒ කථාව ද බුදුගුණෙහි ප්‍රිය ඇත්තා වූ සුචරිතයෙහි ඇලුම් ඇත්තා වූ සත්පුරුෂයන් සෙනහ ඇති වැ ඇසිය යුතු ය. හේ කෙසේ ද? යත්:—

19. වට්ටක ජාතක කථා.

අතීතයෙහි **මගධරට** එක වන ලැහැබෙක්හි බොධිසත්ත්වයෝ වටු වැ ඉපද මවුකුසින් නික්මැ බිජුවට බලා ගෙණැ පිවත්වන සෙයෙක් ම රත්පලස් වටක් සා වැ නික්මුණු සෙයෙක. ඉක්බිති මවුපිය දෙපක්‍ෂයෙහි ඇත්තෝ බොධිසත්ත්වයන් කසල්ලෙහි හොවාලා තුවූ ගොසින් තුඩින් ගොදුරු ගෙණැ අවුත් බොධිසත්ත්වයන් රක්‍ෂා කරන්නාහ.

එ සමයෙහි බොධිසත්ත්වයෝ පියා හඬා ආකාශයෙහි යන්නට වත්, පසින් බිම යන්නට වත්, ශක්‍ති නැති සෙයෙක. එසමයෙහි සවාමිදරුවන් වැඩැ හොත්තා වූ කසල්ල ඇලයෙහි වන ලැහැබ මහත් වූ ලැව්ගින්නෙක් ඇවිල ගෙණැ දුම්න් හා ගිනි පුපුරෙන් හා සියලු ආකාශය පුරමින් සියලු වනලැහැබ මැඩැ ගෙණැ පවත්නා වූ "තට" "තට" යන අනුකරණයෙන් ඒ වනයට වදනා අග්නි දෙවතාවාගේ අභිමුඛයෙහි ගසන්නා වූ බලවත් හඬ සේ ක්‍රූර වූ නාද පවත්වමින්—

ගස් අගින් ගස් අගට දිවන්නා වූ වදුරන් ලුහුබදවා ගෙණැ යන්නා සේ ගසින් ගස ඇවිල ගනිමින් මරණභයයින් භයපත් වූ ව්‍යාඝ්‍රයන් හා මුවන් හා ඔවුනොවුන් කෙරෙහි විරොධ නැති වැ එක මඟැ ලුහුබඳවමින් ගිනි ගත්තා වූ කඳ ඇඟ කඩා ගෙණැ හෙත් හෙත් පුලුටු ගත්තා වූ ඇතුන් හා ඇතින්නන් හා ඇත්

පැටියන් හා දහ ඉවසා ගත නොහී මහහඬින් හඬව හඬවා සියලු වනයෙහි දිවමින් කලපානත වත්තියට සපඬිකෙරෙමින් බොධි සත්ත්වයන් වැඩ හොත්තා වූ කසල්ලට ආසන්න වී ය.

එ සමයෙහි සියලු පක්ෂිහු මරණභයින් භයපත් වැ ආකාශයට පැනැ නැඟී හිස් ලූ ලූ දිශායෙහි දිවගත්හ. බොධිසත්ත්වයන් වහන්සේගේ මවුපිය දෙපක්ෂයෙහි ඇත්තෝ ද අත්පත් නිවන් හැර තමන් ඇතුළු වූ ලොව රක්ෂාකරන්නට සඟරගින්නට වන්නා වූ සවාමිදරුවන් හැර පියා නිකම් ගින්නෙහි කළ භයින් වැඩැ හොත් සවාමිදරුවන් පෙරළා නො බලා ආකාශයට පැනැ නැඟී පලා ගියහ.

එ සමයෙහි සවාමිදරුවෝ වැඩැ හෙත් කසල්ලෙහි ම වැඩ හෙවැ "මේ කිමෙක්දෝ හෝ" යි කියා බලා වදුරණ සෙයෙක් සියලු වන ලැහැබ මැඩැ ගෙණැ ඒ ඒ ගස්හි විමන්හි වසන්නා වූ දෙවතාවන් ලුහුබඳවා පියන පිණිස බුරන්නා සේ මහත් කොටැ බුරා බස්නා වූ ලැව්ගින්න දැකැ "ඉතිරි පක්ෂීන් සේ පියා ඇතහොත් පියා හඬා ගෙණැ ආකාශයෙන් ගොස් ගැළවී යම්හ. පය ශක්තියක් ඇතහොත් පයින් ගොස් ගැළවී යම්හ. එසේ යන්නට පාදයෙහිදු ශක්තියෙක් නැත. අප වැදූ මවු පියෝ ද මරණ භයින් බියපත් වැ අප හැර පියා නැඟී ගියහ.

"මෙ තැන්හි අපට එක ද සරණෙක් නැත. අප කළමනා කිම් දෝ හෝ" යි සිතා වදුරණ සෙයෙක් එසේ ම වටු වැ උපන් කලෙක්හි මහා බ්‍රහමයා දන්නා පරිද්දෙන් වෙදත්‍රය ය ගෙවා දන්නා වූ ත්‍රුවණ තමන් කෙරෙහි ම ඇති හෙයින් මට පියායෙන් ප්‍රයොජන කිම් ද? පයින් ප්‍රයෝජන කිම් ද? මවුපියන් විසින් ප්‍රයොජන කිම් ද? මේ ලොකයෙහි ශීල ගුණ නම් දෙයෙක් ඇත. සත්‍යගුණ නම් දෙයෙක් ඇත.

අනිතයෙහි පාරමිතා පුරා බෝ මුල වැඩැ හිඳැ සවාසනා සඞ්කෙලශයන් නසා බුදු වූ **ශීල - සමාධි - ප්‍රඥා-විමුක්ති - විමුක්ති ඥානදර්ශන** සමපන්න වූ **දයා ය - සත්‍ය ය - ක්ෂාන්ති ය - කරුණා ය** යනාදී වූ සියලු සත්පුරුෂගුණයෙන් යුකත වූ සතුරෝ ය - මිතුරෝ ය - මධ්‍යස්ථයෝ ය යන සියලු ලොව තමන්ගේ ආත්මය හා නො වෙනස් කොටැ බලන්නා වූ **සර්ව්ඥ** වූ **සවාමිදරුවන්** ඇති බව සත්‍යය ය ඔවුන් විසින් වදුරණ අමාමහ නිවන් ගෙණැ දෙන **ධර්මරත්නය** ඇති බව සත්‍යය ය. ඒ ධර්මය වූ පරිද්දෙන් පවත්නා වූ **සඟරුවන්** ඇති බව සත්‍යය ය.

"මා ආකාශයට නැඟී යන්නට සුදුසු පියායක් නැති බව ද සත්‍යය ය. බිම නැඟී යන්නට සුදුසු පයක් නැති බව ද සත්‍ය ය ය. මාගේ මවුපියන් දෙදෙනා මා හැර පියා නැඟී ගිය බව ද සත්‍යය ය.

මා ද සෙසු පක්ෂියන්හු සේ ලාමක කොට වැ මාගේ එකලෙහි ගත් දහමින් මුළු ලොවකට දහම් බෙදා දෙන්නට සිටි එකකු බව ද සත්‍ය ය.

ඉදින් මා එක තැනැත්තහු ද ගිය කලැ මේ වනයෙහි සෙසු ප්‍රාණීහු ගැළවෙත් නම් පියුම් ගබකට වදනා රාජහංසයන්හු සේ නිවී සැනහී මේ ගින්නට වදනා බව සත්‍යය ය. මේ මුළුලොවට මා මුත් ලය ඇත්තන් නැතිබව සත්‍යය ය. වටු වැ හොත්තා වූ මාගේ ලෙහි ගත් ධර්මය මහා බ්‍රහ්මයන් ලෙහිදු නැති බව සත්‍යය ය. මේ සත්‍යයෙන් මේ ලැව්ගින්න පසුබසීව" යි කියා සත්‍යක්‍රියා කොටැ වදාළ සෙයෙක.

මෙසේ බොධිසත්ත්වයන් වහන්සේ සත්‍යක්‍රියා කරන් ම ඒ සා මහත් ලැව්ගින්න පසුබැස ගෙණැ ගොස් වැඩහොත් තැනට සිසාරා සොළොස් කිරියක් පමණ තැන් දුරු වැ ගියේ සවාමි-දරුවන්ගේ ධර්මයෙහි බලයෙන් එ වේලෙහි පවන් කප තස්තා දවස් දක්වා එ තැන්හි තණපතක් ද ගිනි නො ඇවිල ගත් විරිය මෙසේ සවාමිදරුවෝ සත්‍යක්‍රියායෙන් තමන් වහන්සේ කරා දිවූ ගිනි පසුබස්වා වදාළ සෙයෙක.

මෙසේ මේ කථාව ඇසූ සත්පුරුෂයන් විසින් ධර්මය නම් සියලු උපද්‍රව දුරුකරන්නා වූ රක්ෂා මන්ත්‍රයෙකැ යි නිශ්චය කොටැ සියලු උපද්‍රව දුරුකොටැ සියලු අභිමතාර්ථ සාධන පිණිස දහම් සරණ යම්හ යි **දහම් සරණ යා සුතු.**

19. වට්ටක ජාතක කථා.

තව ද සද්ධර්මය සේ සත්ත්වයාහට වහළක් නැති බව හඟවා සියලු සත්ත්වයා දහම් සරණ යවන පිණිස මාගේ සවාමිදරු වූ ගෞතම ගොත්‍රයෙහි උපන් සද්ධර්මවර චක්‍රවර්ති සවාමීන් වහන්සේ

20. මත්ස්‍ය ජාතක කථා.

වනයෙහි විලෙක්හි මස් වැ ඉපැද පොවා සියලු දඹදිව එකහෙළා රත් කබලකට හසු වූ මකුළුවක සේ දවන්නට පටන්ගත්තා වූ මහාගිම් තමන් වහන්සේගේ ධර්මබල යෙන් වැසිවස්වා මුළුලොව ශාන්ති කළා වූ මස්දෑයෙහි කථාව දක්වමි. ඒ බොධිසත්ත්ව චරිතය ද අසා ධර්මයෙහි අනුසස් දැනැ **දහම් සරණ යා සුතු.**

හේ කෙසේ ද? යත්:—

අතීතයෙහි කොසොල්රට එක් කඳුරෙක්හි බොධිසත්ත්ව යන් වහන්සේ මස් වැ උපන් සෙයෙක. මස් වැ ඉපැද සියලු මසුන්ට රජ වැ **මෛත්‍රී ය - කරුණා ය - මුදිතා ය - උපෙක්ෂා ය**

යන සතර බ්‍රහ්මවිහාරයෙන් යුක්ත වූ බ්‍රහ්ම විමානයෙක් හි බ්‍රහ්ම කුමාරයන් පිරිවරා ධ්‍යානරතියන් දවස් යවන මහා බ්‍රහ්මයක්හු සේ වසන සෙයෙක.

එ සමයෙහි මහනියහෙක් ඇති වී ය. එයින් ලොව පෙළන්නට පවන් ගත්හ. ආකාශයෙන් හෙන්නා වූ එක ද ජලබිඳුවෙක් නැති වූ හියේ. ඒ ඒ ස්ථානයෙහි වැවී අමුණු හෝ කඳුරු විල් ආදි වියලී වලල් ගැසෙන්නට පටන්ගත්. යම්තම් වළතැනෙක් සිටගත් ජලයක් ඇත් නමුදු හිරු රැසින් තැවී විරුවාපු ලොහොදිය සේ හුණු වූ හිය හෙයින් මස්කැස්බෝ සැලියේ ලා උදුනට නහා පත් ලෙහි ගිනිකල කල්හි එකහෙළා පැසී මියන්නවුන් සේ පැසී මියන්නට පටන්ගත්හ.

වලල් සිදුරට වත් මසුන් හඬුයෙන් රිදී කොදු අවුළුවා ඇද ගන්නා සේ කොකුන් හා කවුඩුවන් හා ඇදූ කන්නට පටන්ගත්හ. ගොයම් යන තමෙක් නැති වූ හියේ ය. වැසි නැති අහස බලා හඬන වැසි ලිහිණියන් හා පැන් නැති විල් බලා හඬන විල්ලිහිණි යන් හා වතය එක කොලාහල කරන්නට පටන්ගත්හ. මොණරු ය, හංසයෝ ය, වලිකුලෝ ය, යනාදි පක්ෂීහු සිහිල් සෙවනක් නො ලදින් ඔවුනොවුන්ගේ පියාඹට හිස් ලා ගෙණ වියලී වැගිරෙන් නව පවන්ගත්හ.

හුණුවැලි පිටැ පා ඔබාගත නො හෙන්නා වූ චතුෂ්පාදයෝ ඔබිනොබ දිවෙමින් දිවි එල්වා ගෙණ ආතමින් ගල් සෙවනෙහි හිස් ඇතැ ඇතැ සිටැ වෙවුලන්නට පටන්ගත්හ. හිමින් තැවී හිය හසුනිහු අනික් පැනක් නො ලදින් තමන්ගේ පොකුරහ පැන් ම ඉසැ සිට බමන්නට පටන්ගත්හ.

එ සමයෙහි සඟමිදරුවානන් වහන්සේ "මේ සත්ත්වලොක ඝාට වූ මහා දුක් සංහිදුවා ලන්නට මා මුත් අනික් සමර්ථයෝ නැතැ" සි සිතා වදුරා වැඩැ හොත්තා වූ කඳුරෙහිදු පැන් හිදී හිය හෙයින් මඩපලා ගෙණ ඉඳුනීල මණිසප්මහයක් සේ වැඩැ සිටැ යහපත් කොටැ ගිනිවර කළ මැණික් දෙකක් සේ දෙ ඇස දල්වා ආකාශය බලා වැසිවලා = දව්යා හට හඬගහා ගැත්තක් හට නියොග කරන්නා වූ සඟමිදරු කෙණෙකුන් සේ වැසි වස්වන්නවි ආරම්භකොට වදුරණ සෙයෙක් —

"කොල! වැසිවලා දෙවි ය! මාසේ වූ ධර්මිෂ්ඨ එකක්හු නැයන් හා කැටි වූ හිමින් තැවෙමින් සිටියදී තෝ දිව්‍ය විමානයෙහි දිව්‍ය සුව අනුභව කෙරෙහි දෑ තට වැසි වස්වන්නද නියොග කරන්නා වූ මම තාගේ ගුණයක් තකා නියොග නො කරම්. මාගේ මේ

ලෙහි පෙළෙඹෙන්නා වූ ගුණ ගෙණැ සත්‍යක්‍රියා කොටැ තා ලවා වැසි වස්වන්නට ප්‍රයෝග කෙරෙමි'' යි මා උපන්නා වූ මත්ස්‍ය යොනි තම් මහත් මස්හු කුඩා මසුන් අනුභව කොටැ ජීවත් වන්නාහ.

එසේ වූ ජාතියෙක උපන්නා වූ මම මා බිජුවට ගැබින් පිටත් වූ තැන් පටන් ගෙණැ අද දක්වා සුන්සාලැවක් සා ප්‍රාණියකුදු දිවි නො නසා දෙරින් දෙරැ පිඬු සිහා වළඳන ධුතඞ්ගධර තපස්වීවර කෙණෙකුන් සේ ඒ ඒ තන්හි සෙවෙල් වළඳ, ජීවත්වීමි.

''පඤ්ච දුශ්චරිතයෝ ම මට මහා සමුද්‍රයෙහි මෙතෙරට එතෙර දුරු සේ දුර ය. මාගේ ජීවිතය මට ඉතා ප්‍රිය සේ ම සියලු සත්ත්ව යාගේ ජීවිතය ද මට එසේ ම ප්‍රිය ය. මා වසන මේ කඳුරෙහි වසන්නා වූ මසුන්ට සුවයක් වූ ද සුවවුන් බව හා දුකක් වූ ද දුක් වුන් බව මුත් මම වෙන දුකෙක සුවයෙක යන දෙයෙක්හි රස නො දන්මි. බුදු වැ මුළුලොව ගළවම්හ යි යන සිත එක වටෙක්හි ද තොර නො කෙළෙමි. මේ සත්‍යයෙන් සියලු සත්ත්වයෝ සුවපත් වෙත්ව යි යන සංඥව මා සිත හා පුරුදු කෙළෙමි.

ආහාර සංඥා ය – භය සංඥා ය – මෛථුන සංඥා ය යන තුන් සංඥයෙන් යුක්ත වූ තිරිසන් යොනියෙහි ඉපිද ද **අනිත්‍ය ය – දුඃඛ ය – අනාත්ම ය** යන තුන් සංඥව ම මෙතෙහි කෙළෙමි. මේ සත්‍යයෙන් මේ ඍද්ධියෙන් පෙළී ගියා වූ සත්වයන් ගේ කන් නිවා ගම්භීර නාද පවතුවමින් වැසි වස්වා කවුඩු ආදී වූ වණ්ඩ සත්ත්වයන්ට ගොචර වූ මා හා මාගේ නැගන් හා ගළව'' යි කියා වදුළ සෙයෙක.

සබාම්දරුවන් සත්‍යක්‍රියා කළ ක්ෂණයෙහි ම වදුළ සුවරිත යට සාධුකාර දෙන්නා සේ ගම්භීර වූ නාද පවත්වමින් වැඩැ හොත්තා වූ පොකුණ ඉද්දෙහි අහස ඉද්දෙහි විදුලියෙන් රන් කම් කළා සේ මෙසපටල තැමැති වියන් අදිමින්' ඝන වූ දෙව් දුන්නෙන් ධර්‍ම පූජාවට තොරණ නඟමින්' දශදිශා භාගයෙහි දිවන්නා වූ බලාවැල තැමැති පුෂ්පාඤ්ජලී ලමින්'' ශත පටල සහස්‍රපටල මහාමේඝ නහා මුළුලොව නිවා සතහා බොහි සත්ත්වයන් ඇතුළු වූ සියලු සත්ත්වයාගේ ඔත් සතහා වැසැ වැව් අමුණු ආදි පුරමින් සියලු සත්ත්වයාගේ ඇස් ඉතිරි වැහිරෙණ සතුටු කඳුලු හා එක් වැ ම නොඑක් ජාති ජලධාරායෙහි වතුරු හෙළී ය. මුළුලොව නිවී සැනහී ගියේ ය.

"මෙසේ මාගේ සවාමි දරුවන් මස් වැ ඉදෑ ද පොවා තමන් වහන්සේගේ ධර්මබලයෙන් ගිම් නිවා වැසි වස්වා මුළුලොවට ත් තමන් වහන්සේට ත් ශාන්ති කළ පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් සියලු දුක් අස්වසා සියලු සුව ඵලවන්නට ධර්මය සේ වූ අනික් දිව්‍යෞෂධයක් නැතැ"යි නිශ්චය කොටැ ඉහලොවින් පර ලොවින් සියලු අභිමතාර්ථ සාධා නිවෙන සැනහෙන පිණිස ධර්මය ම සරණ යම්හ යි රැ පහන අප්‍රමාද වැ ලත් ලත් අවසර යෙහි එම ධර්මය ම සරණ යම්හ යි **දහම් සරණ** යා යුතු.

20. මහාසත්ත්ව ජාතක කථා.

තව ද ධර්මය රැස් කළ සත්ත්වයාහට ඒ ධර්මය කාලාතනර යෙකින් දෙන්නා වූ සවගී සම්පත්ති-

21. සිව්රාජ ජාතක කථා මොක්ෂ සම්පත්ති තබා ඉහජාතියෙහි ම දෙන්නා වූ ඉෂ්ට ඵල හඟවන පිණිස මාගේ සවාමිදරු වූ බෝධිසත්ත්වයන් වහන්සේ **සිව්රජ** වැ ඉපැදී අඹ වෙශයෙන් ආ ශක්‍රබ්‍රාහ්මණයාහට තමන් වහන්සේගේ මසැස් දෙක උදුරා දන් දී එහි අනුසසින් ඒ ජාතියෙහි ම දිවඇස් ලද්දා වූ **සිව්ජාතකය** දක්වා සත්පුරුෂයන්ට කුශල ධර්මයෙහි උත්සාහ වඩවයි — ඒ කථාව ද ස්නෙහ ඇති වැ ප්‍රසාද ඇති වැ අසා සවගී මොක්ෂ සම්පත්ති සැහිය යුතු.
හේ කෙසේ ද? යත්:—

අතීතයෙහි **සිව්රට අරිෂ්ඨපුර නුවර සිව්** නම් මහ රජ්ජු රුවන් රජකරණ සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කුසැ පිළිසිඳ ගෙණ ක්‍රම යෙන් ප්‍රසවයට පැමිණි සෙයෙක. පිය මහරජානෝ ද සවාමි දරුවාහන්ට **"සිව්කුමාරයෝ** යැ යි නම් තුබූහ.

සවාමිදරුවෝ ද ක්‍රමයෙන් වැඩී ශිල්ප උගන්නා වයසට ආ කල්හි **තක්ෂලා නුවරට** ගොස් උගතමනා සියලු ශිල්ප මනාක ප්‍රාප්ත කොටැ නැවත ඒ පියාහන් වහන්සේගේ රාජ්‍යයට අවුත් පියාහන් වහන්සේට ශිල්ප දක්වා යුවරජ තනතුරු ලදින් ක්‍රම යෙන් පියාහන් වහන්සේගේ ඇවැමෙන් මහරජ වැ අභිෂෙක කොටැ —

දශරාජ ධර්මයට විරෝධයක් නො කොටැ දවස දවස තමන් වහන්සේගේ සතුටු මුහුණ සියලු සත්ත්වයාහට සතුටු පඬුරු කොටැ දී උන්ගේ සතුටු මුහුණු තමන් වහන්සේගේ ඇස් පඬුරු කොටැ ලැබෙමින් අනික් තැනෙක්හි වූ වෙදකාවට ද කදුලු

ගන්නා ඇසක් සේ අනුන්ට වූ දුකට ද තමන් වහන්සේ දුක්පත් වෙමින් තමා අතින් ඉන් වූ පැලගොයමට ද, ගොවින් වපුල වප් ගොයමට ද, සම සිතින් දියපාතා ක්‍ෂෙත්‍ර සවාමි තැනැත්තක්හු සේ තමන් වැදූ දරුවන් කෙරෙහි ද, සියලු සත්ත්වයා කෙරෙහිද, සමකරුණා පවත්වමින් එක් ඇසක් රක්නා පිණිස අනික් ඇස උදුරා බලකමිනත නොකරන්නා සේ තමන් ගේ රාජ්‍යය රක්‍ෂා කරම්හ යි අනුන්ගේ රාජ්‍යයට පිඩාවක් නොකරමින් —

රා පූ ආරොහයකු නැඟි මතැතක්හු සේ නුවණ නැති උඩත වූ අමාත්‍යයන්ගේ බසින් ලෝවැස්සා නොනසමින් ගත් ගහටය යි නොතබා කරල් කඩා හැරගන්නා සේ ඉපැද වූ තැනැත්තනුවය යි නොතබා සත්ත්වයාගේ වසතු පැහැරි නොගන්මින් වැදූ මවුන්ගේ තණ්හවෙශය හා සමකොටැ පර සත්‍රින්ගේ තණ්හවෙශය නොබලමින් දහස්ගණන් අරළුයෙන් පිහිට ලත් මහ නුග ගසක් සේ මන්ත්‍රී ය- අමාත්‍යයෝ ය- යුවරජ්ජුරුවෝ ය- සෙනා පති ය යනාදි වූ උපයුක්ත පුරුෂවිශෙෂය හෙතුකොටැ ගෙණ රාජ්‍යයෙහි ස්ථිර ප්‍රතිෂ්ඨා ලැබෙමින් —

ධර්මයෙන් යුක්ත වූ කාරණයෙන් සප්තබොධ්‍යඞ්ග ධර්මයන් වඩන්නා වූ අපිස් යොගාවචර තපස්වී කෙණෙකුන් සේ දශ රාජ ධර්මය ම විරොධයක් නොකොටැ සවාම්‍යාමාත්‍යාදී වූ සප්තාඞ්ග සමෘඞ්ධට පමුණුවමින් ධර්මයෙන් රාජ්‍යය කොටැ වදුරණ සෙයෙක් තමන් වහන්සේගේ අධික වූ දුනාභිරතිය හෙතුකොටැ ගෙණ නුවර සතර වාසල්දොර හා නුවරමධ්‍යයෙහි හා මාලිගාදොර හා මේ සතැන්හි දන්හැල් කරවා දවස් පතා එකි එකි දන්හලට එකි එකි ලක්‍ෂයක් බැගින් සදන්හලට සලක්‍ෂයක් විසදම් කොටැ මහදන් දෙමින් අටවක්හි – තුදුස්වක්හි – පසළොස්වක්හි හා දන් හලට තමන් වහන්සේ ම වැඩැ දන් බලා වදුරණ සෙයෙක.

මෙසේ සියලු දඹදිවිහි නහුල් උඩබදවා මහදන් දෙන සවාම්දරුවානන් වහන්සේ එක් මැදි පොහෝ දවසක් උදෑසන ම නගනලද්දා වූ සෙතවජ්ත්‍ර ඇති සිංහාසනයෙහි වැඩ හුන්සේක. තමන් වහන්සේ විසින් දුන්නා වූ දනය ආවජ්නා කොටැ මා විසින් නුදුන් දෙයෙක් නැතැ යි කියා නිශ්චය කොටැ "මා විසින් බාහිර වසතුයෙන් නුදුන් දෙයක් නම් නැත. මට මේ දනින් අධික වූ ප්‍රියයෙක් නොඑළවයි, මම වූ කලි මාගේ ශරීරයෙහි ඇතුළත් දෙයෙකින් දනක් දෙන්නා කැමැත්තෙමි. මාගේ භාග්‍යයෙක් ඇත්නම් මා නිසා ගැළවෙන මුළු ලෝ වැස් සාගේ භාග්‍යයෙක් ඇත්නම් අද කිසි යාචකයෙක් අවුදින් මාගේ ශරීරයෙහි තමක් කිතම් ඉතා යහපත.

"ඉදින් කිසිවෙක් අවුත් මාගේ හදවත ඉල්වූයේ වී නම් මම් ම මාගේ ලය පලාපියා ප්‍රසන්න වූ ජලයෙන් නළ හා එක් කොටැ පියුමක් උදුරා ගන්නා එකක්හු සේ ලොහිත බිඳු වගුරුව වගුරුවා හදවත උදුරා දන් දෙමි. ඉදින් මාගේ ශරීරමාංශයක් ඉල්වූ එකෙක් ඇත් නම් හිසැ සිටැ දෙපත්ල දක්වා සර්ව්ඛඝ ඇට හෙළා ලියා පියා පැස්පුරා දන් දෙමි. ඉදින් කිසිවෙක් මාගේ ශරීරයෙහි ලෙහෙයෙහි නම කියේ වී නම් ඝනත්‍රයෙහි දී පෙළාපියා බදුන් පුරා ලෙහෙ දන් දෙමි. ඉදින් කිසිවෙක් මට ගැතිවා සි කියේ වී නම් මාගේ රාජ වෙශය හැර පියා හිසකේ බැඳා කැසපට ගන්වා මා ගැති බව මම් ම අස්වා ඔහුගේ ඉහි දුනැ ගැතිමෙහෙ කෙරෙමි.

"ඉදින් කිසිවෙක් මාගේ ඇස් ඉල්වූයේ වී නම් ප්‍රසන්න වූ ජලයෙන් පිරුණු විලෙකින් රතුපුල් මල් දෙකෙක් උදුරණ එකක්හු සේ දුනාතිලාෂයෙන් ප්‍රසන්න වූ මාගේ මුහුණින් දුස උදුරා ඇදු ගෙණැ දන් දෙමි" සි ඉටා වදුරා සොළොස් කලයක් සුවඳ පැනින් නහා මේ නිමවා සර්ව්ලඞ්කාරයෙන් භූෂිත වැ නානාග්‍ර රස හොජන අනුභව කොටැ උයන් කෙළියට යන්නා වූ ශක්‍රයාට සදු නිම වූ ඓරාවණයා සේ සදු ගෙණ අවුත් සිටු වූ මහුලැන්හු පිටට නැගී දුනශාලාවට නික්මැ වදුළ සෙයෙක.

ඉක්බිති සවාම්දරුවන්ගේ දුනාධ්‍යාශය බලයෙන් ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ **පණ්ඩුකම්බල ශිලාසනය** හුණු විය. ශක්‍ර දෙවෙන්ද්‍ර තෙම "මා නො කැමැති කරවා මාගේ ආසනය හුණු වන්නට කාරණා කිම් දෝ හෝ" සි කියා පරීක්ෂා කරන්නේ සවාම්දරුවන්ගේ දුනාධ්‍යාශය දැකැ අද දවස් මහතානන් වහන්සේ සම්ප්‍රාප්ත වූ යාවකාශක්හු ඇස් ඉල්ලුව හොත් ඇස් උදුරා දෙමි සි සිතුහ. ඔහු තමන්ගේ දුනාධ්‍යාශය බලවත් හෙයින් "මෙසේ සිතුව බව මුත් සිතු පරිද්දෙන් උදුරා දී ලන්නට සමර්ථයෝ දෝ හෝ සි අසමර්ථයෝ දෝ හෝ සි හොසින් පරීක්ෂා කෙරෙමි" සි සිතා ජරාප්‍රාප්ත වූ අන්ධ බ්‍රාහ්මණයකුගේ වෙසින් ශක්‍ර විලාසයෙන් දන්හලට වඩනා සවාම්දරුවන්ගේ අභිමුඛයෙහි හොඬෙහි සිටැ ගෙණැ අත නහා ජය ශබ්දය පවත්වා ආශීර්ද කෙළේ.

සවාම්දරුවෝ ඔහුගේ ශබ්දය අසා "නියතයෙන් වසතුවක් ඉල්වන යාවකයෙක් වී නම් දන්සලට හොසින් සිටගන්නී. මොහු අතරමග සිටැ උස්කොටැ ආශීර්ද දී සිටියේ අමුතු වසතුවක් ඉල්වන පිණිසය" සි සිතා වදුරා ඔහු කරා සතුටු සතුටු වැ ඇතු මෙහෙයා බමුණු කුමක් කිය සි දැ සි වවාරා වදුළ සෙයෙක.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ "මහරජ! තොපගේ දැනඋත්සාහය සියලු ලෙව්හි එකහෙළා පැතිරුණේ සිටී. එසේ වූ තොපගේ කීර්ත්‍යානුභාවය ඇසුවා වූ මම මා කණ හෙයින් මට අනික් වසතුවකින් ප්‍රයෝජන නැත. යි සිතා තොපගේ එක් ඇසක් මට ඉල්වා ආමි. ඉදින් ඇස දුන්නු නම් තොපට ත් එක් ඇසක් තිබෙ යි. මම ත් එක් ඇසක් ලබම්" යි දැන්වී ය.

ඒ අසා සවාමිදරුවෝ සුළං පිරූ තොලබෝ විනක් සේ ප්‍රීතින් පිරිගියා වූ සර්වාඞ්ග ඇති වැ "මාගේ දෛවය ඉතා මහත් සේ ය. මා සිතූ සිත මසනකප්‍රාප්ත වන පරිදි ඉතා ආශ්චර්‍ය්‍ය සේ ය බුදුවැ සර්වඥතාඥාන නැමැති ඇස ලබන්නට අද මාගේ ඇස උදුරා යාචකයාගේ අත තබා බිජුවට වපුරණ පරිදි ඉතා අවශ්‍යය. මා රක්මි යි සිතූ මුළුලොව එකාන්තයෙන් රක්නා වැනිමි"යි නිශ්චය කොට, අභිෂෙකයට වොටුනු වඩා ආවා වූ මහල් මෙහෙ තැනැත්තහු මුහුණ බලන සන්නොෂයට වඩා ශත සහස්‍ර ගුණයෙන් අධික වූ සන්නොෂයෙන් බමුණා මුහුණ බලා ඔහුගේ බස් අසන පිණිස "බ්‍රාහ්මණ කා විසිනුත් දීපිය නො හැකි ඇස ඉල්වා මා කරා එවුවෝ කවුරුදැ යි වදාළ සෙයෙක.

ඒ අසා බ්‍රාහ්මණ තෙම මහරජ මා එවුවෝ අනික් කෙණෙක් නො වෙති. මා කන බව හා තොප දන්සොඬ බව හා දත්තා වූ ශක්‍රදෙවෙන්ද්‍රතෙම තෝ ඇස් නැති වැ කුමට දුක් ගණී ද? සිව්රජ්ජුරුවන් කරා ගොසින් ඇසක් ඉල්වා ගණු යි කියා එවූ හෙයින් ආමි යි දැන් වී ය. ඒ අසා මා ඇතුළු වූ සියලු සත්ත්වයා ගේ ලෙඟි ශොකදුඃඛ නිවා අමා ගල්වන්නට පටන්ගත් තා වූ සවාමිදරුවන් වහන්සේ මාගේ දැනඋත්සාහය ශක්‍රදෙවෙන්ද්‍රයා ත් දත්වනු යි සතුටු වැ —

"බ්‍රාහ්මණය, ඇස් ඉල්ලා ආවා වූ තාගේ මනොරථය මසනක ප්‍රාප්ත වේව යි එක ඇසක් ඉල්වා ආවා වූ නට ඇපි දුස ම දෙම්හ"යි වදාරා අද මා දන්හලට ගොසින් සලඤ්ඡයක් වියදම් කොට දෙන්නා වූ මහාදානයෙන් ප්‍රයෝජන කිම්ද? රජගෙට ගොසින් ඇස් දන් දෙමි යි සිතා "බමුණ! තා ඇස් වුව මැනව යි කී විට ම අප දුස තා සතු වී ය.

ඉනිබ උදුරා දීලන තුරු තොප කෙරෙන් පිරිවුළු කොටැ ගෙණැ අප කෙරෙහි තුබූ ඇස් හා සම ය. මේ දුස ය, වරෝ රජගෙට යම්හ"යි බමුණා කැඳවා ගෙණැ ඇතු වප්‍රාඞ්කුඤයෙන් තමා තමන් පුරුදු වූ රජ ගෙයි මඟ පොවා වහා නො ගෙවෙන සියක් යොදුන් දහසක් යොදුන් කතරක් සේ සිතා වදාරා ශ්‍රී පාදයෙන් ම ඇතු

අවුලුවා ගෙණ හැරැ ගෙණ යන්නා සේ යුහුව මෙහෙයා ගෙණ ගොස් රජගෙට වැද සිංහාසනයේ වැඩහිඳ ශ්‍රී ශරීරයට පිළියම් කොවැ සිවි සිවසා නම් මහවෙදහත් කැඳවා මාගේ දැස උදුරා පියවයි වදාළ සෙයෙක.

එසේ වදාළ හඬ ඇස් උදුරා පියව යි වදාළ හඬ යි කුමට කියම්ද? මුළු ලොව ම තස්න මරහු කණ යහුල් ගසන හඬ යැ යි කියම්. සසර දුක් නසාගෙන සිහිල් ගෙන ගිගිරි හඬයැ යි සිතම්. නිවන් පුරෙහි දෙර හැරියිය හඬය යි සිතම්. සවඥ ලොකයට යන භිණි තෙරපන හඬ ය යි සිතම්.

එසේ සවාමීන් වදාළ බස ඇසූ සියලු නුවර වැස්සෝ "අපගේ සවාමි අද ඇස් උදුරා දෙන දා ල" යි අසා චණ්ඩාලයන් කෙරෙහි සිවැ රාජකුමාරයන් අන්තඃපුරස්ත්‍රීන් දක්වා රාජාඞ්ගණයෙහි වැගිරැ ගොස් "සවාමිනි, නුඹ ඇස් උදුරා දන් දුන් කලැ ඇස් කණ මවුන්ට බඹහැල්වා පානා දරුවන්ගේ දුක් මවට නො පැණෙන්නා සේ අපට වූ දුකක් කෙසේ පැ ගන්නමෝ ද?

"තෙල ඇස නැති මුහුණ බලා කෙසේ අපගේ ඇස් වහවා ගන්නමෝ ද? නුඹ වහන්සේගේ දැසට නොසිතන සෙයෙක් නමුදු නුඹ වහන්සේගේ ඇස් නැති මුහුණ දුටුවිට ම ශොකයෙන් ම මුලින් ඉපිරැ ගන්නා වූ අපගේ ඇසට සිතා වදාළ මැනව. ඉදින් නුඹගේ ඇස යහපත නුඹට නො පැණේ නම් පහසින් පනිනුත් නුඹගේ දැස බලාලුව මැනව.

මෙසේ වූ දැසක් නුඹට තරම් බව මුත් මේ කණුට තරම්ද? මේඇස දන්දීලා පස්කම්රස අනුභවයෙහි සෙවද බිඳු ගත්තා වූ ලිහිල් වැ වැගිරැ ගියා වූ හිසකෙහෙ ඇති, රසයෙන් රත් ව ගියා වූ නෙත්‍ර යෞවනසථ වූ අඹුවන් මුහුණු කවර ඇසින් බලන්නේ ද?

"නුඹගේ රුවින් ඔබා ලූ හස්වැනි නුඹ උරෙහි ද දරුවන් ගේ අලුත හටගන්නා දත් කොද කැකුලෙන් මනොහර වූ මුඛ මුහුණු කවර ඇසින්බලන්නේද? මිනී මස් කා දිවි රක්ෂා කරන්නා වූ යකඋහු සේ ලොව තසා තමා රක්ෂා කරන්නා වූ රජඋහු ඇස් උදුරතොත් මූ හිස නොදී ඇස් දෙන සේ ය යි කම්පාවන්නා වූ සත්ත්වයා අද නුඹ ඇස් දෙති යනු අසා නුඹ රජ්ජුරුවන් කෙණෙකුන්ගැ යි නො සිතා අපගේ පියානෝ ඇස් උදුරා දන් දෙත්ල. අපගේ මැනියෝ ඇස් උදුරා දන් දෙත්ලැ යි හඬා අවුත් නුඹගේ රාජාඞ්ගණයෙහි වැගිරැ හිඳහ.

"නුඹ ගේ එක දැසට සිතා කදුලු ගෙණැ මුහුණ සපණ අතින් ඉදිම ගියා වූ නුඹ ගේ ගැන්තන් ගේ ලක්ෂ කොටි ගණන් ඇස් බලා වදාළ මැනව. මේ එක් දිසාවෙක හඬා වැගිරෙන අන්තඃපුර සත්‍රීන් බලන්නේ. මැතින් හඬා වැගිරෙන නුඹ ගේ ප්‍රිය පුත්‍රයන් බලන්නේ. මේ හඬා වැගිරෙන කුරුන් කුදුන් බලන්නේ. අධම පක්ෂයෙන් නුඹ ගේ මැදිරියෙහි හුන් ගිරවුන් සැළලිහිණියන් පොවා හඬන වලාම් හඬ අසන්නේ. ඇස් ගණිමි යි කියන බමුණා හා ඇස් දෙන්මි යි කියන නුඹ වහන්සේ හා දෙන්නා ම සතුටු බව මුත් අනික් මේ රාජධානියෙහි සතුටු සතක්හු නැති වැ හැම එක වලාම් පැදුරෙහි පෙරළෙන පරිදි බලා වදාළ මැනව. සිතා වදාළ විට දෙන්නට හස්ති අශ්ව රතනාදී වූ සියලු සම්පත්ති ඇත්. ඒ දෙත් මුත් ඇස් නො දී වදාළ මැනවැ"යි කීහ.

ඒ අසා සවාමිදරුවෝ "කොල, අද මට සිතා හඬන්නා වූ තෙපි මා මරහු මුඛයෙහි හෙනකල වළකාගත හෙවුද? බුදු ව මුළුලොව ගලවන්නට සිතන්නා වූ මා දන් නො දෙවා නොපගේ ශකත්මත් බෝමැඩැ හිඳුවා බුදු කොටැ පියහෙවු ද? ඇස් වුව මැන වැ යි සිතා නම් දිව්‍ය චක්ෂුස ම වුව මැනවැ යි සිතන බව මුත් මේ ඇසෙහි ආසා නො කරව. අද දන් දිය නොදී වළකන්නා වූ තෙපි මා බුදුවිය නොදී වළකන්නවුන් හා සමයව. එසේ වූ කල නොපට සෙනහ ඇති නියාය නො වන්නේවේ ද? ඇස් ඉල්වා ආවා වූ යාචකයා හට ඇස් නො දෙමි. අනිකක් දෙමි යි යන බසක් කියම් ද?

"එහෙයින් මාගේ දැනයට අන්තරාය කරන්නට නොප එක් රටෙක ඇත්තවුන් තබා අනන්තාපරිමාණ සක්වළ අනන්තාපරිමාණ දිව්‍ය බ්‍රහ්මයන්ට ද නො පිළිවන. එහෙයින් සිසැ නො වෙහෙසී සිටුව" යි වළකා සිවක නම් මහා වෛද්‍යයා කැඳවා මට සිද්ධවන්නා වූ බුද්ධත්ත්වයට වඟල්වව. මා නිසා ගැළවෙන්නා වූ මුළුලොවට කරුණා කරව. මාගේ බුද්ධශ්‍රීන් සැරහෙන්නා වූ මුළු ලොවට ආභරණ සපයව නොප හා මා ඇසැ ඔබාලන්නා වූ සැත බුදුරු වැ ඇස් තබන තෙල්ලෙකැ යි සිතන බව මුත් සැතෙකැ යි නො සිතම්. එහෙයින් මාගේ ඇස් උදුරා දන් දෙව තෙපි ත් ඒ පින්හි සරිවව. මාගේ මනොරථය මස්තක ප්‍රාප්ත කරව" යි වදාළ සෙයෙක.

ඒ අසා සිවක නම් මහවෙදැනෝ:- "සවාමිනි, ඇස් දන් දීලීම් නම් ඉතා බැරි දෙයෙක. සී බුදුන් විමසා පියා පිළිවන් වුවහොත් කොටැ වදාළ මැනවැ" යි දැන්වූහ. ඒ අසා සවාමිදරුවෝ "සිවකය,

දානවිෂයෙහි මට පරීක්ෂා නම් දෙයෙක් නැත. තමා ඇසැ හෙළන සැතෙක් ඇත් නම් ඒ මා ඇස රසායන්ත ගල්වන කපුරු ලාවක් කොට සිතමි. තෝ මා නො විචාරා යාචකයාගේ මනොරථය මස්තකප්‍රාප්ත කරවැ" යි වදළ සේක.

ඒ අසා සිවක තෙම මාගේ සවාමීන් දන්හි කළ ලොභයෙන් "ඇස් දී මුත් නො නවත්මි" වදරත්. ඉනිබ මේ ඇසැ සැතක් හෙළාලන බව සුදුසු නො වෙයි සිතා නිල් මහතෙල් මලෙක්හි බෙහෙත් සුන්නක් බහාලා දකුණු කාසාපුවයෙන් මේ මල් හිඹැ වදළ මැනවැ යි දැන්වී ය. බොධිසත්ත්වයන් වහන්සේ මහතෙල් මල් හිඹුන් හිඹුන් ඖෂධයේ බලයෙන් ඇස සිටි තැනින් ඉහිල පෙරලි හියේ. බලවත් වූ වෙදනා පවත්වන්නට පටන්ගත.

වෙද තෙම "සවාමිදරුවෝ වේදනායෙහි රස නො දන් හෙයින් ඇස් දම් දෙම්හ යි සිතා වදළ සෙයෙක් වී නම්දු දැන් වේදනායෙහි රස දන් බැවින් වැළකිය සේක් වී නම් යහපතැ යි සිතා "සවාමිනි, පරීක්ෂා කොට වදළ මැනව. නැවත ඇස තුබූ පරිද්දෙන් තබාලන්නට මට නො බැරියැ යි දැන්වී ය.

ඒ අසා සවාමිදරුවෝ "කුමක් ද තා කියන්නේ? දෙරැ කප් රුක් හිඳුවන තැන තණ උදුරන්නෝ තණ ගසට බඹ කකිය වද්ද? මම සම්භාවනාඥන නැමැති ඇස පිහිටුවන්නට මේ ඇස උදුරන්නේ නම් එහි අපෙක්ෂාවක් කෙරෙම් ද? කල් නො යවා "උදුරා පියව" යි වදළ සෙයෙක.

ඒ අසා සිටි සිවක වෛද්‍ය තෙම නැවත බෙහෙත් ගල්වා හිඹි නට දින. හිඹුන් හිඹුන් ඇස තුබූ තැනින් ඉදිරි ඇසිපිය මත්ත දක්වා පලා ආ ය. සම්භාවය මැඩැ ගෙණැ බලවත් වූ වේදනාව පවත් නට පටන්ගත. නැවත සිවක තෙම "සවාමිනි, නැවත මේ ඇස තුබූ පරිද්දෙන් තබාලන්නට මට පිළිවනැ" යි දැන්වී ය.

ඒ අසා සවාමිදරුවෝ "ඇස සථිර කරමි යි කියන තාගේ බසින් මාගේ කණට දුක් දී එක් ඇසක් රක්ෂා කෙරෙමි යි දෙකණකට පිඩා නො කර ඇස උදුරා පියව" යි වදළ සෙයෙක. ඒ අසා සීවක තෙම බෙහෙත් ගල්වා මහතෙල් මල දින. එවිට හිඹුන් හිඹුන් ඇස ඉදිරි වැටී හින. නහරෙහි එලිගෙණැ දානපාරමිතාව ඇසිපියෙහි බැඳලා එල්වා ගෙණැ කෙළනා කෙළිපෙදක් සේ බමමින් සිටි හේ ය.

මහා පුරුෂයානන් වහන්සේ තුබූ ඇසින් ඒ ඇස බල බලා රන් ගලෙකින් හිඟුල් හැල්ලක් හෙන්නා සේ ලස තහවා ගෙණ වැහිරෙන ලෙහෙ බල බලා ඇස ඉල්වා ගෙණ සිටි යාචකයාගේ මුහුණ බල බලා ලය ලෙහෙයෙහි ගැලෙන් ගැලෙන් තමන් වහන්සේ සොම්නස් ගැලි ගැලී වැඩහුන් සේක. නැවත සිවක තෙම "සඞ්ගාමිනි, ඇස තුබූ පරිද්දෙන් තබා ලීම මට පිළිවත. පරික්ෂා කොටැ වදුළ මැනවැ" යි දැන්වී ය. ඒ අසා සඞ්ගාමිදරුවෝ "ඇස ඉල්වා ආවා වූ යාචකයා හා මා හා දෙන්නාගේ සොම්නස හා එක්කොටැ මේ නහර කපා හැරිපියව" යි වදුළ සෙයෙක.

අන්තඃපුර සත්‍රීන් හා අමාත්‍යයන් හා රාජකුමාරයන් හා රටවැස්සන් එක පැහැරි පාමුල්හි පෙරළෙන්නට පවන්ගත්හ. එකෙණෙහි සඞ්ගාමිදරුවෝ තුබූ ඇස දිසාවෙහි බැමය බිඳ රැහණි වැ වෙදහු මුහුණ බලා "කල් නො යව" යි වදුළ සෙයෙක. ඒ අසා වෙද තෙම වමන්ලෙහි ඇස රදවා ගෙණ දකුණතින් සැත අල්වා ගෙණ නහර කපාපියා ඇස ගෙණ ගොස් බොධිසත්ත්වයන් ශ්‍රී හස්තයෙහි තබා ලී ය.

මේ වේලෙහි මහා පුරුෂයානන් වහන්සේ තුබූ වමැසින් උදුරා පි දකුණැස බලබලා දුක්පත් සතුන් දුකින් මුදන්නා කැමැත්තෙමි. අසරණ වූ ලොව රක්‍ෂාකරන්නා කැමැත්තෙමි.

එසේ වූ මට මේ ඇස් දන් දී මා බුදු වැ කරන්නා වූ ලොකඕයට කාරණා බව "මුන් මට අනික් සම්පත්තියකට කාරණා නොවේ" යි සිතා වදුරා අන්ලෙහි තුබූ ඇස පෙරළ පෙරළා බලාපියා ඇස පැහැය නො මිරිකී යනතුරු බමුණාට දීලුව මැන වැ යි සිතා "මෙසේ එයි" බමුණ කැඳවාලා තමා අන්ලෙහි තුබූ ගිනිගෙණ දිලියෙන යවටක් අනුන් අත හෙළා පියන එකක්හු සේ යුහු යුහු වැ සතුටු සතුටු වැ හෙළන්නා සේ ලෙහෙයෙන් රුදිහිය ඇස බමුණා අතැ තබාලා.

"බ්‍රාහ්මණ ය, මේ මාගේ මුහුණ පිහිටි ඇස් දන් දෙන්නෙමි දිව්‍ය සම්පත්තියක් – මනුෂ්‍යසම්පත්තියක් නො පතමි. මේ ජාතියෙහි පවන් ගෙණ මා බුදුවන ජාති දක්වා සුවපත් සත්ත්වයෙක් මාගේ තම සිහිකෙළේවී නම් ඔහුගේ සුවය දියුණු කොටැ පිටිවතුරු ගැන් විය හෙම්ව යි දුක්පත් සත්ත්වයෙක් මාගේ තම සිහිකළේ වී නම් ඒ මා සිහිකළ සිත හා කැටි වැ කැටි වැ ම ඔහු විදිනා දුක් ම පෙරළී ඕහට පඤ්චේන්‍රියයන් සනහන්නා වූ සුව බවවයේව යි නිරුපධිශෙෂ පරිනිර්‍වාණ ධාතුයෙන් පිරිනිවෙන දවස් දක්වා මාගේ කණැ දුකින් හඬන සත්ත්වයක්හුගේ බහැ හඬෙක් නො වේව යි මාගේ දෙ ඇස ඇතිතාක් මානයෙහි දුක්පත් වූ සත්ත්වයක්හුගේ මිරිකී ගියා වූ මුහුණක් නො දකිම්ව" යි.

"ඇස් දන් දෙව, හිස් දන් දෙව, තොපගේ අඹුදරුවන් දන් දෙව යි එන්නා වූ තා සේ වූ යාචකයෝ මාගේ මිදුලෙන් නිතොර නො වෙත්වයි. රහ බොන අවණෙක පසු වැ ගිය බමණ මත්වලුවන් සේ මා සරණ ගිය ලොව සුවයෙන් මත් වැ අවසථා නො දනැ දුකෙක්හි රස නො දනැ නිවන් දක්වා සසරෙහි මිහිරි කෙළි කෙළිත්ව යි සිතූ ක්ෂණය හා කැටි වැ ම අභිමත වසතුවක් ලැබීමෙන් සතුටුවන බව මුත් කාමැති වසතු නො ලැබීමෙන් සත්ත්වයා දුක් නො ගණිත්ව යි.

"මූවරද පිරුණු පියුම්හි ලග්නා බමරුන් සේ අඹු දරුවන් ඇති යහන්හි මුත් එසලා යහන්හි දුක් ගෙණැ ගෝනා සත්ත්වයෙක් මාගේ කණ ඇතිනාක් කල් නො ඇසේව යි රජදරුවන්ට මෙහෙ ගත්තා වූ මාළුයෙහි රස බලන අරක්කැමියකු සේ බුදු වැ ලෝ වැස්සාට දෙන නිවන් සුවයෙහි ආදිකොට රස බැලිය හෙම්ව යි මෙතෙක් මුත් මා පතන අනික් සමපතතියෙක් නැත. ඇස තව සම සිතින් ම දින්මි. මා මුහුණෙහි තුබූ වමැසට වඩා තා අතව ගිය දකුණැසට ම සිතහැත්තෙමි"

"කොව ගෙයි තුබූ බිජුවටට වඩා කුඹුරෙහි ලූ බිජුවටුන් බොහෝ ප්‍රයොජන සිදුවන්නා සේ මා කෙරෙහි තුබූ ඇසට වඩා තා කෙරෙහි පිහිටුවා ලූ ඇසින් මට බුදුන්නය සිදුවන්නේය" යි සිතා වදාරා "තෙලෙ ගතැ" යි ඇස බමුණා අත තබාලූ සේක. බමුණු ඇස හැරගෙණැ තමාගේ කණ ඇසට ලඟ කොටැ පැලි ය.

එවේලෙහි ම ශක්‍රානුභාවයෙන් ඇස අධික වූ වණීයෙන් යුකත වැ සථිර වැ පිහිටා ගියේ. බොධිසත්ත්වයෝ වමැසින් බමුණා ගේ දකුණැස බලාලා මා වමැස'ත් එකවට උදුරා ගෙණැ නො දුන් නෙනි ලාබ ලදිමි. ඉනික්බ ඒ ඇස තිබී කුමක් කෙරේද? ඒ උදුරා දෙමි යි ලෝවැස්සන් හඬවා හඬවා ඒ ඇසත් උදුරා දන්දී වදාළ සෙයෙක.

ශක්‍රයා ඒ ඇස ත් තමාගේ ඇසැ පිහිටුවා ගත. එවිට සවාමිදරු වෝ ඔහුගේ මුහුණ බලන අනික් ඇසක් නැති හෙයින් ඇලයෙහි සිටියාහු විචාරා ඇස පිහිටා ගිය බව අසා සතුටු සතුටු වැ ලඝ සතහවා ගෙණැ වැගිරෙණ ලේ දිය කෙළි දවස් මුග්ධ වූ පුරසත්‍රීන් ලෙහි නමාපි කුඩකුම ජලයට වඩා අධික වූ ප්‍රීති කරණකොටැ සිත සිතා ඉනික්බ ය යි[1] බමුණාට සමුදී වදාළ සෙයෙක.

1. ඉනිබ යයි ඉනික්ම යයි.

බමුණු මහජනයා බල බලා සිටියදී නුවරින් නික්මෑ දෙව් ලොවට ගියේ. බොධිසත්ත්වයන් වහන්සේ ඇස් දන් දී වදුළ නොබෝ දවසකින් ම ඇස්වළ පුරා මස් පිරි ඇස සුව වැ ගියේ. සවාමිදරුවෝ කිප දවසක් මාලිගයෙහි වැඩ හිඳැලා "ඉනිඛ අඛ වූ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිමෙක් ද? අන් පා මෙහෙ කරණ එකක්හු මතු හැරැ ගෙණැ උයනට ගොස් මහණ වැ තපස් කෙරෙම්" සි අමාත්‍යයන්ට වදුළසේක.

අමාත්‍යයන් රන් සිවිගෙයකින් වඩා ගොස් මහුල් පොකුණු තෙරැ වඩා හිඳුවා සිසාරා රැකවල් ගෙණැ සිටියහ. බොධි සත්ත්වයෝ "දැස ඇතහොත් උයන්හි මධුර වසතු බලම්" සි සිත එකඟ නො වෙයි.

අද මා දුන් දන් එකඟ වැ සිහි කොටැ යන්නට ඇස් නැති සේ යහපතැ" සි සිතා තමන් වහන්සේ දුන්නා වූ දැනය ද ඒ හෙතු කොටැ ගෙණැ මතු සිද්ධවන්නා වූ බුද්ධත්ත්වය ද බුදු වූ පසු සිද්ධවන්නා වූ ලොකාර්ථය ද සලක සලකා ප්‍රීතියෙහි ගැළී නිවෙමින් සැනහෙමින් වැඩහුන්සේක. එකෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පණ්ඩුකම්බලසිලාසනය හුණු විය.

ශක්‍රතෙම ආවර්ජනා කරන්නේ ඒ කාරණය දැකැ "සිවිරජ්ජුරු වන්ට වරයක් දී ඔවුන්ට නැවත ඇස් දී අවමැනවැ" සි සිතා දෙව්ලොවින් ඇවිත් බොධිසත්ත්වයන් වැඩහුන් තැනට නුදුරු තැන ඇන් මැන් බලා සක්මන් කරන්නට පටන්ගත්හ. සවාමිදරුවෝ සක්මන් කරණ පියවර හඬ අසා "මේ කවරෙක් දැ"සි විචාරා වදුළ කල්හි ශක්‍රදෙවෙන්ද්‍රතෙම "මම දෙදෙව්ලොව දෙවතාවන්ට අධිපති වූ ශක්‍රදෙවෙන්ද්‍ර යෙමි. මා අතින් කැමති වරයක් ගනුව මහරජ' යි දන්වි ය.

ඒ අසා සවාමිදරුවෝ 'දෙවෙන්ද්‍රය, අපගේ කවර සම්පතක් නැති හෙයින් කුමක් ඉල්වමෝද? මෙතැන්හි අඛ හෙයින් මියන්නා කැමැත්තමිහ" සි වදුළ සේක.

ඒ අසා ශක්‍රතෙම "මහරජ, තෙපි මියන්නට ම සිතා වර නො කැමැත්තාද? ඇස් නැති හෙයින් මියන්නා කැමැත්තාදැ"සි විචාරා ඇස් නැති හෙයිනැ යි වදුළ කල්හි "මහරජ, දන් තම් දෙය පරලොව ම සුව දෙන බව මුත් ඉහලොව නො දෙයි කියා-නැවත පරලොවිනුත් ඉහලොවිනුත් ඛර්‍යතෙම අවි සිද්ධ කෙරෙයි. තෙපි එක ඇසක් ඉල්වා ආ යාචකයාට දැසක් දුන්හ. එහෙයින් සත්‍යක්‍රියා කොටැ ඇස් ලබව" සි දන්වි ය.

ඒ අසා සවාමිදරුවෝ "දෙවෙන්ද්‍රය, තෝ මට ඇස් දෙන්නා කැමැත්තෙහි නම් අනික් උපායක් නො කොටැ මා පිරූ ධර්මයෙහි අනුසසින් ම මට ඇස උපදනේ ය යි හිවිසැ වදුරා "ශක්‍රයා විසින් මහරජ, මම දිව්‍යරාජ වැ සිටැ ද දහසක් නුවණැස් ඇතිවැ ද ධර්මිඤ්ඤ කෙණෙකුන්ට ඇස් දී ගත නො හෙමි. එහෙයින් තොපගේ සුවරිත ධර්ම බලයෙන් ම සත්‍යක්‍රියාකරව" යි දැන්වී ය.

ඒ අසා බොධිසත්ත්වයන් වහන්සේ "යහපතැ"යි හිවිසැ මා ඇතිවූතාක් තැන් පටන් කොටැ අද දක්වා මා කරා තොයෙක් වසතු ඉල්වා එන්නා වූ යාචකයන් මුහුන බලන වේලෙහි සතුටු කඳුලෙන් රැඳී ගිය සනෙතාෂයෙන් පිරිගිය උතසවයෙන් තළල තටන්නා වූ ඇසින් බැලුයේ වීම් නම් මට ඇස් පහළවෙව" යි කියා සත්‍යක්‍රියා කොටැ වදාළ සෙයෙක.

එසේ වදුරා තුඩ ඇදූ නො ගන්නාතුරු ම හිරු රැස් හෙත් හෙත් පිපි විහිදී ගිය පඤ්චවණී පද්මයක් සේ පළමුවන ඇස පහළ විය.

ඒ ඇසින් සවාමිදරුවෝ නිදූ පුබුත් එකක්හු සේ සියලු වසතු බලමින් දෙවන ඇසට සත්‍යක්‍රියා කරණසේක් මා ඇස් ඉල්ලා ආවා වූ බ්‍රහමණයාහට ඇස් දන්දෙන්නට යැ යි උදුරණ වේලෙහි ත් ඇස නහර කපන වේලෙහි ත් ඇස ඔහට දී පි පස්සෙහි ත් මේ තුන් තන්හි ම දුක්පත් වූ මුළුලොවට වැඩ කෙරෙම්හ යි යන මනොරථය නිරනතර වැ පැවැත්තේ වී නම් ඇස් උදුරා මා අත තබාලූ වේලෙහි මා අත්ලෙහි පිරිගිය ලෙහ මතු මාගේ බුදුරුව පැහැගණ හිඟුල් වෛත්‍යයක් කොටැ සිතා විද විදා හුන්නෙම් වීම් නම් මේ සත්‍යයෙන් මට දෙවෙනි ඇස පහළ වේව යි සත්‍ය ක්‍රියා කොටැ වදාළ සේක.

ඒ ක්‍ෂණයෙහි මතු සවාමිදරුවන්ගේ පහළවීමට දෙවෙනු වැ ධර්මරත්නය ලොකයෙහි පහළවන බවට පූර්වනිමිත්තන පානා සේ දෙවන ඇස පැනී ගියේ. මෙසේ පහළ වූ දෑස මිනිස් ඇස ය යි නො දකිය හැක්ක. දිව ඇස ය යි නොද කිය හැක්ක. සවාමි දරුවන්ගේ සත්‍යයෙන් උපන් හෙයින් ඒ සත්‍ය පාරමිතා චක්‍ෂුස් නැමැති ඇස් දෙක පහළ වූ ක්‍ෂණයෙහි ම ශක්‍රදෙවෙන්ද්‍රයාගේ ආනුභාවයෙන් සියලු රාජපෂී ද එතැනට කැටි වැ ගියහ.

එසේ කෑ වූ මහජනයා මධ්‍යයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර තෙම ශක්‍රානුභාවයෙන් ආකාශයෙහි දිලිහි දිලිහි සිටැ බෝධිසත්ත්ව යන්ගේ ගුණයෙහි ප්‍රසන්න වැ "මහරජ! ලොකයෙහි දන් නම් තොප දුන් දන ය. සබා නම් තොප කියන සබා ම ය. දිවි නම් තොප ලත් දිවි ය, ගැත්තෝ නම් තොපගේ ගැත්තෝ ම ය. මසැසක් දිලා එම ජාතියෙහි ම පවුරු ය, පළිත ය, වෘක්ෂ ය, යනාදීන් විදගෙණ රාත්‍රියෙහි ඝනාන්ධකාරයෙහි සිසාරා සියක් යොදුනෙහි රූප දන්නා ඇස් ලදුව. දෙව්ලොව නන්දනොද්‍යානයකට ගිය ගමනකට වඩා මිනිස්ලොව වැ තොප වසන උයනට ආ බව ම මට සනෙහාෂයට කාරණ ය. සියක් යොදුනෙහි සිටැ ම කර බැඳලූ ශරවිල් කුණක් සේ දුගීන්ධ වූ මේ මිනිස් ලොවට ආයෙම් තොප දුටු ගෙයිනැ.

"ආකාශ ගඞ්ගායෙහි කලට පිපි ගිය රත් පියුමෙක්හි හුණු බමරක්හු සේ ඉතා සන්තුෂ්ටයෙමි. සත්පුරුෂයන්ට තොප වැන්න වුන්ගේ දැකුම් වාසනාවේව සි තොපි ද තො පමා වැ කුසල් කරව"සි අවවාද දී දෙව්ලොවට ගියේ.

ඉක්බිති බොධි සත්ත්වයන් වහන්සේ ඇස් ලද හෙයින් සතුටු වූ මහජනයා පිරිවරා අසුරයන් ලුහුබඳවා පියා ජයගෙණ ජය මදයෙන් මත් වූ දෙදෙව්ලොව දෙවතාවන් පිරිවරා දෙවි නුවරට වැදූ වෛජයන්ත ප්‍රාසාදයට නැඟෙන ශක්‍රදෙවෙන්ද්‍ර යා සේ නුවරට වැදූ සුචන්ද්‍රා නම් ප්‍රාසාදයට නැඟි – තමන් වහන්සේ ඇස් ලත් බව අසා සතුටු වැ නොයෙක් පඬුරු ගෙණ රාජාඞ්ගණයෙහි රටවැස්සෝ රැස්වූහ.

රැස් වූ බව අසා "ධර්මයෙහි අනුසස් සියලු සත්ත්වයාට පැව මැනවැ"සි රාජාඞ්ගණයෙහි මණ්ඩපයක් කරවා ඒ මණ්ඩපයෙහි වැඩහිඳ සියලු නුවර වැස්සන්ට තමන් වහන්සේ ලද ඇස් පැ "සුවරිත නම් මෙසේ කටයුතු දෙයෙක. දුතය නම් මෙසේ දියයුතු දෙයෙක. තෙපි හැම දෙන ම මා බලා මා ලද මේ ඇස් ම දෙවොනෙන කොටැ ගෙණ සුවරිත ධර්ම පුරා මෙලෝ පරලොවින් සුව අනුභව කරව"සි අවවාද දී වදාළ සේක.

මෙසේ සවාමිදරුවන් ඒ ජාතියෙහි කළ සුවරිත ධර්මයෙන් ඒ ජාතියෙහි ම ඇස් ලත් බව ඇසූ සත්පුරුෂයන් විසින් ධර්මය නම් පරලොවට ම විපාක දෙයි" නො සිතා ඉහලොව ත් පරලොව ත් සියලු අභිමතාර්ථ ධර්මයෙන් සාධා නිවී සැනසී කෙළවර අමාමහ නිවන් දක්නා පිණිස ධර්මය පුරා ධර්මය ම මෙතෙහි කොටැ දහම් සරණ යා සුතු.

21. සිව්රාජ ජාතක කථා.

තව ද ධම්ම පරලොව නො යන තුරු ඉහලොකයෙහිදී ම සියලු උපද්‍රව දුරුකොට සියලු

22. සීලානිසංස ජාතක කථා අභිමතාර්ථ සාධා දෙන බව හඟවන පිණිස මහාසමුද්‍රයෙහි කිසි සරණෙක් නැත්තා වූ සථානයෙහි ධම්බලයෙන් ධර්මිෂ්ඨයන් වහල් ලත් පරිදි හඟවා සීලානිසංස ජාතකයෙහි කථාව දක්වම්. හෙ ද තුණුරුවන්හි පහන් ලත් සත්පුරුෂයන් විසින් සිත් දී කත් දී නමා ඒ කථාව අසා රතනත්‍රය ය සරණ යා යුතු.
හේ කෙසේ ද? යත් :—

අතීතයෙහි කාශ්‍යප සම්මා සම්බුදුන් වහන්සේගේ බුද්ධරාජ්‍යයෙහි සෝවාන් වූ එක් උපාසක කෙණෙක් එක් කරණවැමියෙක්හු හා කැටි වැ මහා සමුද්‍රයෙහි යාත්‍රාකරණ පිණිස නැවු නැංගාහ. ඉක්බිති ඒ කරණවැමියාගේ අඹුතොම "සවාමිනි! මුන්ට වූ සුඛ දුඃඛයෙක් ඇත් නමුදු නුඹ වහන්සේ ම පිළිබඳ ය යි කරණවැමියා ඒ උපාසකයන්ට පාවා දුනැ යි.

ඉක්බිති නැව සත්වැනි දවස් බිඳී ගියේ. උපාසකයන් හා කරණවැමියන් හා දෙන්නා ද එක් පෝරුයෙක්හි හෙවැ පිහිනා ගෙණ එක් දිවයිනකට නැඟී ගියහ. ඒ කරණවැමියා පසින් මරා තෙමේ මස් කා උපාසකයන්ට ත් මස් දෙයි. "උපාසකයෝ මට ඉන් ප්‍රයෝජන නැතැ" යි නො කා මේ ලොවෙහි අප සේ වූ දුඃඛිතයන්ට තුණුරුවන් මුත් අනික් සරණෙක් නැතැයි සිතා —

එකපරාක්‍රමයෙන් සංසාර සාගරය පිහිනූ සරණ ගියවුන්ට නිවන්හි පහරවා සුව දෙන තෘෂ්ණා වසඟ වූ දුක් විඳිනා මවකට වඳ බෙහෙත් දුන් සියලු ලොව ගලන්නා වූ මරණ නැමැති රාක්ෂසයා මුව බාණෙහි හෙළූ මුළුලොවෙහි එකාලොක කරණ. ධම් නැමැති ප්‍රදීපයක් – කරුණා නැමැති තෙල් එව – ප්‍රඥා නැමැති වැටියෙහි අවුළුවා – මොහාන්ධකාර නසා – මුළුලොව එකාලොක කළ – මුලෙහි වත්කළ පැනට ලසනා වළඳන දලුවක් සේ ලෝවැස්සා ගේ සුවයට තමන් මුහුණ සතුටු කරණ – පා පියුම් සිහිකළ පමණින් සියලු සත්ත්වයාගේ හිසෙහිදු පා පියුම් කරණ – නෙළුම් පනින් වැගුරුණු දිය සේ ලෙහි නො හැල්වා කෙලෙසුන් දුරු කළ – බසින් මිහිරි රුවින් මිහිරි ගුණයෙන් මිහිරි බුදුරුවන් සරණ යෙමි යි බුත්සරණ ගියේ.

ඒ සවාමිදරුවන් විසින් වදුරන ලද හොත් දෙශයෙහි වූ ජාත ශකීරාවක් සේ ආදියෙන් මධ්‍යයෙන් අන්තයෙන් මිහිරි වූ මුහුදට වැද නිමායන මහ ගඟක් සේ – නිවනට වැද මුත් අතුරෙහි

නො රඳන ලියද්දෙහි පිහිටාගත් පැන ගොයම් සුහුඹුල් කරන්නා සේ – ලෙහි පිහිටා ගෙණැ සිලාදි ගුණ ධම්යන් සුහුඹුල් කරණ සියලු දුඃඛයට රක්ෂා මන්ත්‍ර වූ ධම් රතනය සරණ යෙමි යි දහම් සරණ ගියේ.

ඒ සම්බුදුයන් වහන්සේ ගේ ධම්පුත්‍ර වූ වෘෂභරාජයා පසුපස්සේ ක්ෂේම මාගීයෙන් ගියා වූ වෘෂභරාජයන් සේ ඒ සම්මා සම්බුදු රජාතන් වහන්සේ පස්සෙහි අෂ්ටාඞ්ග මාගී ප්‍රතිපත්තියන් ගොසින් නිවන්පුර වන් ශීල, සමාධි, ප්‍රඥා ආදි ගුණධම්යන් වපුළ මහ කෙතක් බඳු වූ සියලු දුඃඛයට අතලොඹු වූ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ ගියේ.

මෙසේ ඔහු රත්නත්‍රයෙහි ගුණ සිහිකරත් කරත් – තුණුරුවන් සිහිකිරීමෙහි අනුසසින් ඒ දිවයින්හි උපන්නා වූ නාගරාජ තෙම තමා ගේ ශරීරය සත්රුවන් මහ නැවක් කොටැ මැවි ය. මුහුදෙහි අරක්ෂාගත් දෙවතාවා නියමූ වෙස් ගත. නැව සත් රුවනින් පිරිණ. මහනැවුහි මැවුනා වූ තුන්කුඹ ඉඳුනිල මණිමය වි ය. රුවල සවණ්මය විය. යොත් කඹ රජතමය විය. පලු හා රිවි සවණ්මය වි ය.

සමුද්‍ර දෙවතා තොමෝ නියමූවෙසින් "නැවු සිටැ ගෙණැ නැවු නැඟී දඹදිව් යන්නෝ ඇද්ද"යි තුන් වරක් හඬගැවුව. උපාසකයෝ "ඇපි යම්හ"යි කියා කිහ. සමුද්‍ර දෙවතා "එසේවුව හොත් අව මැනවැ"යි උපාසකයන් අත අල්වා ගෙණැ නැවට නැංගාහ. උපාසකයෝ නැවැ සිටැ කරණැවැමියාට හඬගැවුව. සමුද්‍ර දෙවතාවා ඒ අසා "මේ නැව තොපට ම ලැබෙන බව මුත් කරණැවැමියා නො ලැබේ"යි කියා කිව ඒ අසා උපාසකයෝ "එයට කාරණා කිම්ද"යි විවාළහ.

සමුද්‍ර දෙවතා "රත්නත්‍රයෙහි ගුණ සිහිකළයෙන් ම මේ නැව මැවිත එහෙයින් සීලාදි වූ ගුණයන් හැති කරණැවැමියා මේ නැවට නැහෙන්නට නො පිළිවනැ"යි කිව. ඒ අසා උපාසකයෝ "මා ගිය තුණුරුවන් සරණෙහි කුසල් තෝත් අනුමෝ ව"යි කියා කරණැවැමියාට කිහ. හෙද දෙහොත මුදුනෙහි තබා ගෙණැ "අනුමෝ වෙමි සවාමිනි!" යි පින් අනුමෝ වි ය.

සමුද්‍රදෙවතාවා මිවිට ඔහුත් ගන්මි යි නැවට නඟාගෙණැ දෙදෙනා ගෙණැ ගොස් බරණැස් නුවර ලා දෙදෙනා ගේ ගෙහි ධන පුරා සත්පුරුෂ සමාගමයෙහි අනුසසින් සීලාදි ගුණයක් නැති කරණැවැමියා පොවා මුහුදු බත් නො වැ ගැළවිනැයි උපාසක ගන් ගේ ගුණ කියා නාගරාජයා තමාගේ විමානයට ම ගියේ.

උපාසකයෝ ද කරණවැම්යා ද කුසලයෙහි අනුසස් දුනැ දියුණ දියුණා කුසල් කළහ. මෙසේ රත්නත්‍රයෙහි සරණ ගමන තම් පරලොවට තොා යවා ඉහලෙවිහි ම සියලු දුඃඛ දුරු කොටැ සියලු සම්පත්හි සාධා දෙන්නේ යැ''යි දත්තා වූ සත් පුරුෂයන් විසින් තුණුරුවන් සරණ ගොස් ඒ සරණය ම මෙතෙහි කොටැ එම කුසලින් සියලු අභිමතාර්ථ සාධා එම ධර්මය ම වහල් කොටැ ගෙණැ මනොරථ සිද්ධකරණ පිණිස දහම් සරණ යෙමි යි **දහම් සරණ** යා යුතු.

22. සිලානිසංස ජාතක කථා.

මෙහි ධර්මය තමා රක්ෂා කළවුන් රක්ෂා කොටැ සියලු සම්පත්හි සාධා දෙන පරිදි දක්වන පිණිස තොයෙක් කථානන්තර දක්වන ලද.

මෙතැන්හි ඒ ධර්මය තමා රක්ෂා කළවුන්ට ආයුශකාහි සාධා දෙන පරිදි දක්වන පිණිස **ධර්මපාල** බොධිසත්ත්වයන් වහන්සේ ගේ චරිතය එළවා දක්වමි. ඒ කථාව කැමැති අමා බොන පිණිස සත්පුරුෂයන් විසින් කන් තමා සාවධාන වැ ඇසිය යුතු. ගේ කෙසේ ද යත්:—

23. මහාධම්පාල චරිත කථා. අතීතයෙහි **බාරාණසියෙහි බ්‍රහ්මදත්ත** නම් රජ්ජුරුවන් රජ කරණ සමයෙහි ඒ කසිරට **ධම්පාල** නම් එක් ගමෙක් ඇති වී ය. එහ ම **ධම්පාලකුලය** තමා එහි වසන හෙයින් ධම්පාල නම් ලද, එහි කුසල ධර්ම දශයක් රක්ෂාකරණ හෙයින් **ධම්පාල** කියා ය ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණයෙක් වෙසෙයි. ඒ බ්‍රාහ්මණයා ගේ කුලෙහි අධම පක්ෂයෙන් දුසකම්කාරයෝ ද දන් දෙති. සිල් රක්ෂා කෙරෙති. පොහෝ දවස්හි පෙහෙවෙති.

එ සමයෙහි මාගේ සවාමිදරු වූ බොධිසත්ත්වයන් වහන්සේ ඒ කුලෙහි පිළිසිඳ ගත් සේක. පෙර ම **ධම්පාල** වූ සවාමිදරුවන් දියුණා ධම්පාල කුලයෙහි පිළිසිඳ ගත්තවුන්ට **ධම්පාල** ය යි නම් කළහ.

ඉක්බිති සවාමිදරුවන් ශිල්ප උගන්නා වයසට පැමිණි කල්හි පියානන් වහන්සේ දහසක් දී ශිල්ප උගන්නා පිණිස **තක්ෂලා** නුවරට යවා වදාළ සෙයෙක සවාමිදරුවෝ ගුරුදක්ෂිණා දහසක් හැරැ ගෙණැ පියානන් වහන්සේ වැඳැ සමුගෙණැ ගොස් දිසාපාමොක් ආචාර්යයන් කෙරෙහි ශිල්ප උගන්නා සෙයෙක් පන්සියයක් **මාණවකයන්ට** ප්‍රධාන වූ සේක.

එ සමයෙහි දිසාපාමොක් ආචාර්‍යයන් ගේ වැඩිමහලු පුතනුවෝ මළහ. ආචාර්‍යයෝ මාණවකයන් පිරිවරා බොහෝ කැයන් හා කැවිවැ හඬමින් සොහොන්හි සිටැ පුතනුවන් දවති. එහි ආචාර්‍යයෝ ද නැයෝ ද රටවැස්සෝ ද එකහෙළා හඬති. ඒ ධම්පාල කුමාරයන් වහන්සේ ම නො හඬා පන්සියයක් මාණවකයන් එබඳු වූ බාල කුමාරයෝ තමන් ලද වයස්හි ම මවුපියන් කෙරෙන් වියෝ වැ මළහ යි කිය කියා හුන් කල්හි "දරුවෙනි! තෙපි බාල කුමාරයෝ මළෝ යැ යි කුමට කියව් ද? බාල කල්හි මිය යන බව සුදුසු නො වන්නේ වේදැ යි වදළ සේක.

ඒ අසා මාණවකයෝ "හැයි, කුමාරයෙනි! තෙපි සියලු සත්ත්වයන්ට මරණ එකාන්ත බව නො දනුදැ යි කිහ. ඒ අසා ධම්පාල කුමාරයන් වහන්සේ "සියලු සත්ත්වයන් මරණින් මැකෙන බව දනිම් ම ය. එතෙකුදු වුවත් මහලු කල මුත් ලදරු කලැ අපගේ කුලයෙහි මියන්නන් නුදුවු විරිමි. මේ අපගේ කුලධර්මයෙකැ යි වදළ සෙයෙක. ඒ අසා විස්මය පත් වූ අන වැස්සෝ එ පවත් හොත් දිසාපාමොක් ආචාර්‍යයන් සැළ කළහ.

ආචාර්‍යයෝ ද ධම්පාල කුමාරයන් වහන්සේ කැඳවා "දරුව! තොප ගේ කුලයෙහි බාලයන් නො මියන්නේ සැබෑදැ යි විචාරා සැබව" යි වදළ කල්හි මේ කුමාරයෝ ඉතා ම ආශ්චර්‍ය වචන යක් කියති. "මොවුන්ගේ පියානන් කරා හොත් විචාරා සබා වී නම් මා ත් ඒ ධර්මයෙහි පිහිටා ගත මැනවැ"යි සිතා පුතනුවන්ගේ ශරීර කෘත්‍යය කොටැ සත් අට දවසක් යවා ගෙණැ ධම්පාල කුමාරයන් වහන්සේ කැඳවා —

"පුත! මම් බැහැරට ගොසින් පියා එන්නා කැමැත්තෙම්. මා එන තුරු අතවැස්සන් ශිල්ප උගන්වව" යි නියොග කොටැ එක් එළුවක්හුගේ ඇට හැරැගෙණැ දෙවා පියා සුවඳ කොටැ පසිඹියෙහි ලා ගෙණැ, එක් අතවැස්සකු කැඳවා ගෙණැ තක්ෂලා නුවරින් නික් මැ ක්‍රමයෙන් එම ගමට ගොස් "ධම්පාල කුමාරයන්ගේ ගෙය කොයිදැ" යි කියා විචාරා ගෙණැ ගොස් දෙර සිටියහ.

ඔහු දුටුවහු ගොස් "ධම්පාල කුමාරයන්ගේ ගුරුන් වහන්සේ වැඩිදැ යැ"යි පියානන්ට කිහ. පියානෝ අවුත් ගෙට ගෙණැ ගොස් ආගනාතුක සත්කාර කොටැ කවා පොවා සුවයෙන් බැණ හුන් සමයෙහි "තොපගේ පුතනුවෝ ධම්පාල කුමාරයෝ ඉතා බුද්ධි සම්පන්නයහ. වෙදත්‍රයෙහි ද අෂ්ටාදශ විද්‍යාස්ථානයෙහි ද මහාකප්‍රාප්ත වූහ. එතෙකුදු වුව ත් එක් රොගයෙකින් මිය ගියහ"යි කිහ. සියලු සංඝකාර ධර්මයන් අනිත්‍ය වූව ශොක නො කළ මැන වැ" යි කිහ.

ඒ අසා මහා ධම්පාල බ්‍රාහ්මණයෝ අතින් අත්ගසා සී පියා මහත් කොටැ සෙන්තට පටන් ගත්හ දිසාපාමොක් ආචාර්‍යයන් "සෙන්නේ කුමක් පිණිසද" සි කී කලැ "මිනිස්ලොවැ මියන බාලයන් බොහෝ හෙයින් නොප වැනි කෙණෙකුන්ගේ දරු කෙණෙකුන් මියත් මුත් මාගේ පුතනුවෝ නො මියති" කිහ. ඒ අසා දිසාපාමොක් ආචාර්‍යයෝ "මේ තොපගේ පුතනුවන්ගේ ඇට දැක ත් නො හදහව්දැ"යි පසිඹියෙහි තුබූ ඇට ඇද එලියෙහි ලා ලූහ. මහ ධම්පාල බ්‍රාහ්මණයෝ "ඒ බල්ලකුගේ හෝ එළුවකුගේ හෝ ඇට මුත් මපුතනුවන් ඇඟ ඇට නො වෙයි කිහ.

ඇට හෙළියෙහි ලාලූ ඇසිල්ලෙහි එගෙහි සිටි මිනිසුන් කෙරෙන් අප්පිඩ ගසා නො සිපු කෙණෙක් නැත. ඒ දැකැ දිසාපාමොක් ආචාර්‍යයෝ කවර සුචරිතයෙක්හි බලයෙන් තොපගේ වංශයෙහි ඇත්තවුන් පරමායු වළඳන්නාහුදැ" සි විවාලේ සුචරිත ධර්‍ම කියන්නාහු "ආචාර්‍යයෙනි! අපි දශකුසලපථ ධර්‍මයන් නො ඉක්මවම්හ. [1] බොරු නො කියම්හ. පව් නො කරම්හ. සියලු දුශ්චරිතයෙක් ඇත්නම් ඒ පුරුදු නො කරම්හ. සත්පුරුෂ ධර්ම-අසත්පුරුෂ ධර්ම දෙක ම අසා පියා අසත්පුරුෂ ධර්ම දුරැ කොටැ සත්පුරුෂ ධර්මයෙහි හැසිරෙම්හ. දන් දෙන විට ත් දන් දෙන්නට පළමු ත් දන් දුන් පසු ත් තුන් තන්හි ම එකාකාරයෙන් සතුටු වම්හ. ශ්‍රමණ - බ්‍රාහ්මණ යාචකාදීන්ට ශක්ති පමණින් දන් දෙම්හ."

"ඇපි අපගේ අඹුවන් ඉක්මැ නො වතුම්හ. අපගේ අඹුවෝ ද අප ඉක්මැ නො පවතිති. අපගේ අඹුන් හැර සෙස්සවුන් කෙරෙහි බඹසර රකුම්හ. අපගේ කුලෙහි සුශීල වූ සත්‍රීන් බඹ පිළිසිඳගත් දරුවෝ නුවණැති වෙති. බහුශ්‍රැත වෙති. අපගේ සියලු කුටුම්බය පරලොව පිණිස කුසල් කරම්හ. අප තබා අපගේ කුලෙහි ගැහි මිඹියෝ ද පරලොව සිද්ධකරණ පිණිස ධර්මයෙහි හැසිරෙන්නාහ ධර්මය ම නමා රක්‍ෂා කළවුන් රක්‍ෂා කරන්නේ ය. යහපත් කොටැ පුරුදු කරණ ලද්දා වූ ධර්මය දුගතියට යා නො දී ඉහලොවින් - පරලොවින් සුව දෙන්නේ ය. එහෙයින් මාගේ පුතනුවෝ නිදුක් නිරෝගී සුවපත්හ. මේ අනික් කෙනෙකුන්ගේ ඇට යැ" සි කීහ.

ඒ අසා ආචාර්‍යයෝ විස්මයට පත් වැ "මා ආ සේ ඉතා යහ පතැ" සි නැඟී සිටැ ක්‍ෂමාකරවා මේ එළුවකුගේ ඇට ය. "තොපගේ පුතනුවෝ වූ කලී කිසි දුකක් නැති වැ නිරෝගී වැ හුන්නහ. තොප

1. ඉක්මෙම්හ.

රක්නා ධර්මය අපට නේ දෙව" යි පතෙකැ ලියා ගෙණැ **තක්ෂිලා** නුවරට ගොස් **ධර්මපාල** කුමාරයන් වහන්සේ සියලු ශිල්පයෙහි මස්තකප්‍රාප්ත කොටැ මහාපරිවාරයෙන් පියානන් වහන්සේ කරා තඟා ගවුහ.

මෙසේ ධර්මය නම් පරලොවට නො ගවා ඉහලෙව්හි ම මරණ දුඃඛ දුරුකොටැ සියලු උපද්‍රව දුරුකොටැ පරමායු වළඳවා සත්ත්වයා සුවපත් කරවන බව ඇසූ සත්පුරුෂයන් ධර්මයෙහි ම පිහිටා – ධර්ම ය ම මෙනෙහි කොටැ – සියලු අභිමතාර්ථ සාධන පිණිස දහම් සරණා යුතු.

23. මහා ධර්මපාල චරිත කථා

තව ද සත්පුරුෂයන්ට හස්තාභරණ වූ – බුදු පසේබුදු මහරහතන්ට අසාධාරණ ආභරණ වූ – සියලු ලොවට අමුතු පඬුරු වූ – සවා සතා සියලු කෙලෙසුන් නැසූ බුදුන් ලොවට ගෙණා මහ පඬුරු වූ – සියලු භවදුඃඛ නැමැති වහ්නිය නිවා වස්නා මහා මෙඝයක් බඳු වූ – සියලු අභිමතාර්ථ සිදියට අසාධාරණ කාරණා වූ සියලු අනර්ථ නැමැති වැදින්ගේ චිකිත්සා පිණිස සජීඳු නැමැති මහා වෛද්‍යරාජයන් වහන්සේ දුටු අෂ්ටාඞ්ග ආයුර්වේදතන්ත්‍ර වූ බැඟැරින් නො අවුත් ලෙහි ම පිහිටා ගෙණැ සියලු හිතයෙහි මුල් බස්වන්නා වූ බුදුන් නුපන් කප්හි අප්‍රකාශ වැ තිබී බුද්ධොත්පාදයක් දුටු දවස් ප්‍රකාශවන්නා වූ කරුණා ඇති ලෙහි ම හටගන්නා වූ දුර්නයන්ට අරුවි උපදවා —

24. මහා පදුම ජාතක කථා

සත්පුරුෂයන්ට ම මධුර වැ වැවිහුනා වූ පුරන්නවුන්ගේ ශරීරයට දුටුවිට ම මොහු ධර්මිෂ්ඨ කෙණෙකැ යි කියා හඟවන්නා වූ සද්ධර්මය තමා රැක්කවුන් රක්ෂාකරණ බව හඟවන පිණිස මාගේ සවාමිදරුවානන් මහා පඨිතයෙක්හි පොවා පිහිට ලද්ද වූ **මහා පදුම ජාතකයෙහි** කථාව දක්වා සත්පුරුෂයන්ට ධර්මයෙහි උත්සාහ වඩවම්. දුක් විඳිනා නො කැමැති – සුව විඳිනා කැමැති – නිවන් නැමැති අග්‍රඵලයක් ලබදවනු කැමැති – සත්පුරුෂයන් විසින් ඒ ධර්මකථාව අසා ධර්මයෙහි පිහිටා ඉහලොවින් පරලොවින් සුව වින්ද යුතු.

හේ කෙසේ ද? යත්:—

අතීතයෙහි බාරාණසියෙහි **බ්‍රහ්මදත්ත** නම් රජ්ජුරුවන් රජ කරණ සමයෙහි මාගේ සවාමිදරු වූ බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බඩැ පිළිසිඳැ ගත් සේක. එසේ උපන්නා වූ සවාමිදරුවානන් වහන්සේගේ මුහුණ පිපී ගියා වූ පද්මයක් සේ මනොහර වැ ශොභාවත් වැ තිබෙන හෙයින් **පද්මකුමාර**යෝ යැ යි නම් තුබූහ.

සඟම්දරුවෝ වැඩි සියලු ශිල්ප උගත් සෙයෙක. ඉක්බිති බොධිසත්ත්වයන් වහන්සේගේ මැනියන් වහන්සේ මළසේක. රජ්ජුරුවෝ අනික් බිසෝ කෙණෙකුත් අගබිසෝ තැන් තබා පුතණුවන්ට යුවරජ තැන් දුන්හ.

කාලානතරයෙකින් රජ්ජුරුවෝ ප්‍රත්‍යන්තය සංඝිදුවන්නට යන්නෝ බිසවුන් කැඳවා යුද්ධ භූමියෙහි ආදීනව ගහවා මා එනතුරු මෙහි ම වසව යි කියා බිසවුන් ඇතුළු වූ සියලු රාජ්‍යයෙහි රක්ෂාවට බොධිසත්ත්වයන් සිටුවා තුමූ හොස් සියලු සතුරන් ලුහුබඳවා ජනපද සාසථ කොටැ අවුත් සැරහි නුවර වදනා පිණිස නුවරින් පිටත කඳවුරු බැඳ හුන්හ.

බෝධි සත්ත්වයන් වහන්සේ පියරජ්ජුරුවන් ආ බව දැනැ සියලු නුවර සද, අතුළු රජගෙයි පිරිමසන සේක් හුදකලා බිසවුන් හුන් නැනට වැඩිසේක.

බිසවු බොධිසත්ත්වයන්ගේ රූපාග්‍රප්‍රාප්ත වූ ආත්ම භාවය දැනැ බොධිසත්ත්වයන් කෙරෙහි පිළිබඳ වූ සිත් ඇති වූහ. බොධි සත්ත්වයෝ බිසවුන් වැඳැ "අම්ම, නුඹවහන්සේව කටයුතු කිම් ද" යි විචාළහ ඒ අසා බිසවු කාමරාගය ඉවසාගත නොහී "මව අම්ම යයි තා කියන්නේ ය" යි නැඟී සිටැ අත අල්වා ගෙණැ තමන් සින ඇති අනුරාගය හඟවා යහනට ඇද්දහ.

බොධිසත්ත්වයෝ, "අම්ම, නුඹ මාගේ පියානන් වහන්සේගේ අඹුවන් තබා සෙසු පරසත්‍රී කෙණෙකුන්ගේ මුහුණ ද කෙලෙස වසඟ වැ නො බැලූ විරිමි. මෙ බදු වූ අනර්ථයක් කෙසේ කෙරෙම් ද"යි වළඳ සේක. බිසවු දෙවරෙක තුන්වරෙක ගිවිස්වා නො ගිවිස්නා "හැම නෝ මා කිවා නො ගිවිස්සෙහි නම් රජ්ජුරුවන්ට කියා තාගේ හිස කප්පවා ගන්මි" යි සැරසුනා.[1] ඒ අසා බොධි සත්ත්වයෝ "මාගේ ධර්මය මාගේ ලෙන් නො ගියේ වී නම් මාගේ හිස ගියේ නමුත් කිම් ද" යි වදරා පිටතට වැඩිසේක.

බිසවු "ඉදින් මේ පළමුකොටැ පියානන්ට දැන්වී නම් මාගේ දිවි නැත. මම ම පළමු කොටැ කියම්" යි බත් නොකා මලෙන් කිළිටි කඩක් හැඳැ ගෙණැ ශරීරයෙහි තඹවණකොටැ රජ්ජුරුවන් අවුත් මා විචාළ කලැ ලෙඩ බව කියව"යි රවා නිතොරවන ගැණුන්ට කියා නො බැණැ හොත.

රජ්ජුරුවෝ ද අවුත් නුවර පැදකුණු කොටැ ප්‍රාසාදයට නැඟී දෙවින් විවාරා "ලෙඩග" යනු අසා ශ්‍රී යහන් ගෘහයට වැදැ 'දෙවිනි! නුසුව කිම්දැ" යි විචාලෝ. බිසවු දෙතුන් විටෙක නො බැණ

1. සැහැසුනාය සැරසුනාහ.

පසුව "හැයි-රජ්ජුරුවෙනි! කුමක් විචාරා ද? සැමියන් ඇති අඹුවෝ නම් අප සේ වෙද්ද? අපාසු නො විචාරා තොප සතු අඹු කෙණෙකුන්ගේ අපාසු විචාරව"යි කිව.

ඒ අසා රජ්ජුරුවෝ "දෙවිනි! කුමක් තොප කියන්නේ ද. යම්කිහු කෙරෙන් තොපට පරිභවයෙක් වී නම් ඔහු හිස කපා උගුරෙහි ලෙහෙසින් මාගේ ක්‍රොධාග්නිය සන්හිදුවා ගන්නට වෙලෙහි ඔහුගේ නම කියව යි කීහ.

ඒ අසා බිසවු "නුඹ පසල් දනවු සාධන්නට යන කලැ නුවර රක්ෂාවට සිටුවා ගියේ කාදැ යි පද්මකුමාරයන් වේ දැ යි කි කල්හි ඌ මා වසන තැනට අවුත් මම තොපගේ මවු මි. මා හා අනාචාරයක් නො කරව යි කියව කියවා – මා මුත් අනික් රජෙක් ඇද්දැ යි නිව සැමියෙම් නම් මම් ය යි මාගේ හිසැ කෙහෙ ඇදැ හෙළා පියා ඇත් මැත් බලා හැදැ තමන්ගේ බස් නො ගිවිස්තා හෙයින් මෙතෙක් වියරු කොවැ ගියහ යි කිව.

ඒ අසා රජ්ජුරුවෝ පරීක්ෂා නො කොවැ ම දණෙඩන් ගසා ලූ ආශිවිෂයක්හු සේ කිපී පියා ක්‍රොධය ඉවසා ගත නොහී රාජ පුරුෂයන් කැඳවා "ගොස් පදුමකුමාරයන් බැඳලා මා කරා ගෙණෙව" යි කීහ. රාජ නියොග ලත් රාජපුරුෂයෝ බොහෝ දෙන රැස් වැ සියලු නුවර මැඩ ගෙණැ යන්නවුන් සේ ගොස් බොධිසත්ත්වයන්ට හෙනි දී පිටිතොල භයා බැඳැ වධ්‍යයන් ගෙණ යන පරිද්දෙන් කරැ රත්මල් බැඳලා මර මරා ගෙණැ යන්නට වන්හ.

බොධිසත්ත්වයෝ රාජපුරුෂයන්ට මම මාගේ පියාහන් වහන්සේට අපරාධයක් නො කෙළෙමි" යි වදාර වදාරා දේවීන් ගේ මේ දුෂ්ටකමෙකැ යි සිත සිතා වඩනා සේක. රජ්ජුරුවෝ ගැහැණියකගේ බස් ගෙණැ මහාපදුම කුමාරයන් මරවත් ල යි අවුත් බොධිසත්ත්වයන් පැමුල හි හඬන්නට වන්හ. මෙසේ ගෙණැ ගොස් බොධිසත්ත්වයන් රජ්ජුරුවන්ට දක්වූහ.

"රජ්ජුරුවෝ කුමාරයන් වැනි රූපයක් බලා ද, මේ මාගේ බිසවුන්ට අනාචාරකළ තැනැත්තෝ වේ දැ යි සිත සිතා ඉවසා ගත නොහී මේ මාගේ පුත්වැ සිටැ මාගේ අඹුවන් හා අනාචාර කෙළේ මොහු හැරැ ගෙණැ ගොස් සොරුන් හෙළන පර්වතයට නගා මහාප්‍රපාතයෙහි හෙළා ඇට රැරැ කොවැ පියව" යි කීහ.

ඒ අසා බොධිසත්ත්වයෝ "සවාමිනි, මම එබදු වූ අපරාධයක් නො කෙළෙමි. ගහැණියකගේ බස් ගෙණැ මා නො නසව"යි කියා රජ්ජුරුවන් ගිවිස්වා ගත නුහුනුවහ. ඉක්බිති සොළොස්

දහසක් අන්තඃපුර ස්ත්‍රීහු ද සෙසු අමාත්‍යයෝ ද රාජ කුමාරයෝ ද "දේවයිනි, පද්මකුමාරයෝ ඉතා ආචාරසම්පන්නය හ. තොපගේ රාජ්‍යයට දායාද වැ සිටියහ. ඔවුන් පරීක්ෂා නො කොටැ නො මරව. තමා දුටු දෙෂයක් නැති වැ අනුන් කි බස් ගිවිසැ දණ්ඩනය කරණ බව රාජධර්ම නො වෙයි. පරීක්ෂා නො කොටැ නිග්‍රහ කරන්නා වූ රජහට විනාශය නො බොහෝ කලකින් ම වන්නේ ය."

"දණ්ඩනය කළ මනාවුන් නො කළමනාවුන් නො ගදුනන්නා වූ රාජමාර්ගයෙහි සම විසමස්ථාන නො දැක පැකිළෙන්නා වූ ජාත්‍යන්ධයා සේ කටයුත්තෙහි පැකිළෙන්නේය. ගැත්තවුන් පරීක්ෂා නො කොටැ මේ මහත් වරද ය මේ කුඩා වරදය යි නිශ්චය කොටැ පරීක්ෂා කොටැ දණ්ඩනය කරන්නා වූ රජ ලොක රක්ෂාවට සුදුසු වන්නේ ය.

රජහු තම් හුදෙක් දැඩිත් නො වුව මැනව. හුදෙක් මොළොකුත් නො වුව මැනව. මධ්‍යම ප්‍රතිපත්තීන් ලොක රක්ෂා කළ මැනව. රාගයෙනුත් බොරු කියන්නෝ ඇත. වෙෂයෙනුත් බොරු කියන්නෝ ඇත. ගැහැණියකගේ බස් ගෙණැ කුමාරයන් නො මරව" යි ආරාධනා කළහ.

රජ නො ගිවිසැ සියලු නුවර හඬව හඬවා අනික් කෙණෙකුන් ලවා ගෙළුවහොත් නුවර වැස්සෝ එක්වැ වැළකූ නම් නපුරු යි තෙමේ ම ගොස් බොධිසත්ත්වයන් හිස බිම බල්වා පය උඩු බලවා අල්වා ගෙණැ මහාප්‍රපාතයෙහි හෙළුවාපි ය.

පර්වතයෙන් හෙත දෙ අතුරෙහි සවාම්දරුවෝ "මාගේ අකුසල් මූත් මේ මූන්ගේ වරද නො වෙයි. මව බොරු කී මැනියොත් ඒ බොරු ගිවිසැ මා ගෙළන්නා වූ පියාණොත් සුවපත් වෙත්ව යි. ඉහ ලොවින් පරලොවින් දුකඛයෙක රස නො විඳැ අනන්තයෙහි අමාමහ නිවන් දකිත්ව යි. අකාරණයෙහි මට භය කළ අනර්ථ කළ මැනියන් පියානන් ඇතුළු වූ සියලු සත්ත්වයානට මෙසේ වූ දුකෙක් නො වේව යි. මම ද මේ මෛත්‍රියෙහි අනුසසින් මෙමා තැසු මවුපිය දෙදෙනා ඇතුළු වූ සියලු සත්ත්වයා සංසාරසාගරයෙන් ගළවන පරිදිදෙන් බොධිපර්‍යාඞ්කාරූඪ වැ සර්ව්ඥතාඥතය සමධිගම කොටැ ගණිම්ව" යි මෙසේ මෛත්‍රී කොටැ වදාළ සේක.

සවාම්දරුවන්ගේ මෛත්‍රී බලයෙන් ම පර්වතයෙහි අධිෂ්ඨිත වූ දෙවතාවා "සවාමීනි! මා සිරියදී නො බව නො බව" යි කියමින් උඩ තහා ලූ පුතක්හු දෙකිසිල්ලට අල්වා ලෙහි හොවා ගන්නා මවක සේ දෙකිසිලි ලවා ගෙණැ ලෙහි හොවා ගත. සවාම්දරුවෝ ජලක්‍රීඩා දවස් විල් තෙරැ සිවැ දියට පැන්න එකක්හු සේ පර්වතයෙන් ගිළිහී දෙවතාවන්ගේ ලෙහි පිහිටා ගත් සේක.

මෙසේ ක්ෂණයක් කළා වූ මෛත්‍රී ධර්මය ද පවිතයෙන් හුනුවා වූ සවාම්දරුවන්ට වහල් වූ පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් සියලු සත්ත්වයන්ට දුඃඛයක් සමහ වූ කල්හි ධර්මය සේ වූ පිහිටෙක් නැත යි කියා දැනැ දුක්පත් කල්හිදු සුවපත් කල්හි දු අප්‍රමාද වැ මෛත්‍රී ආදි වූ ධර්මය මෙනෙහි කොටැ එම ධර්මයෙහි වහළින් සියලු ඉෂ්ටාර්ථ සාධන පිණිස **දහම් සරණ යා යුතු.**

මෙසේ මල්දමක් සේ බොධිසත්ත්වයන් තමාගේ ලෙහි හොවා හත්තා වූ දෙවතාවා පවිතපාදයට වඩා ගෙණැ ගොස් එහි නාගභවනයෙහි නාගරාජයාගේ පණ ගබැ වඩා හිදුවා ලුව. නාගරාජ තෙම බොධිසත්ත්වයන් වහන්සේ නාගභවනයට වඩා ගෙණැ ගොස් තමාගේ සමපපතනි දෙකක් කොටැ බෙදා පියා බොධිසත්ත්වයන්ගේ සුවරිතධර්මයට පූජා කොටැ එක් කොටසක් දින.

'සවාම්දරුවෝ එහි එක් හවුරුද්දක් වැසැ ශක්‍ර සමපතනි සමාන වූ සමපතනි අනුභව කොටැ මනුෂ්‍ය පථයට යන්නා කැමැත්තෙමි" කිහ. නාගරාජයා "මහාපුරුෂයානෙනි! තොප කොතනට වඩා ගෙණැ යෙම්දැ" යි කී කල්හි "මහණවන්නා කැමැත්තෙමි හිමාලයට ගෙණැ යව" යි වදළ සෙයෙක.

නාගරාජතෙමේ "ගහපතැ" යි කියා ගිවිසැ සවාම්දරුවන් හිමාලයයට ගෙණැ ගොස් වඩා සිටුවා පැවිදිවන්නට සුදුසු වූ පිරිකර දී සමුගෙණැ නාගභවනයට ගියේ. සවාම්දරුවෝ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වැ පඤ්චාභිඥ අෂ්ටසමාපතනි උපදවා ධ්‍යාන ක්‍රීඩායෙන් වසන සේක.

එ සමයෙහි බාරාණසියෙහි වසන්නා වූ එක් වැද්දෙක් වනයෙහි ඇවිදිනේ බොධිසත්ත්වයන්ගේ පණ්ණශාලාවට ගොසින් බොධිසත්ත්වයන් හැඳින "සවාමීනි! තෙපි **පද්මකුමාරයාව දැ**' යි කියා එසේ යයි වදළ කල්හි ශ්‍රීපාද වැඳ කිප දවසක් එහි වැසැ බරණැස් නුවරට ගොසින් "සවාමීනි! නුඹ වහන්සේ ගලින් හෙළාපි පුතනුවන් වහන්සේ හිමාලයෙහි තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වැ පඤ්චාභිඥ අෂ්ට සමාපතනි උපදවා හිමාලයයෙහි වසන සෙයෙක. මම ඔබගේ ආශ්‍රම පථයෙහි කිප දවසක් වැසැ ආමි" යි කිය.

ඒ අසා රජ්ජුරුවෝ විසමයපත් වැ මහාබලකාය පිරිවරා පණ්ණශාල සමීපයට ගොස් නුදුරු තැනෙක්හි කඳවුරු බැඳ අමාත්‍යයන් පිරිවරා පණ්ණශාලාවට වැද කාඤ්චන ප්‍රතිමාවක් සේ පණ්ණශාලාවාරයෙහි වැඩ හුන්නා වූ බොධිසත්ත්වයන් වහන්සේ දැකැ ශ්‍රීපාදය වැඳැ එකත්පස් වැ හුන්හ. බොධිසත්ත්වයෝ රජ්ජුරුවන් හා මියුරු හා කථාව කොටැ එලාඵලයෙන් ආමන්ත්‍රණය කොටැ වැඩ හුන් සෙයෙක.

ඉක්බිති රජ්ජුරුවෝ "පුත! මා තොප ශතපොරෂප්‍රපාතයෙහි හෙළාපුව. දිවි ලද්දේ කෙසේදැ" සි කියා විමාළහ. සවාමිදරුවෝ ඒ අසා තමන් වහන්සේ ධම්බලයෙන් ගැලවුනු පරිදි පිළිවෙළින් වදාළසේක. රජ්ජුරුවෝ ඒ අසා විසමය පත් වැ රාජ්‍යයෙන් පැවරුහ.

බොධිසත්ත්වයෝ පඤ්චකාම යෙහි ආදීනව දක්වා "මහරජ! මා සේ වූ ශුද්ධ සත්ත්වයක්හු ගේ ගුණ තොප නො දත්තේ මාගේ මැනියන් වහන්සේ නොසිතූ සිතක් කියා තොප සිතට නහා මට එබඳු අනර්ථයක් කෙළෙන් ගෘහසථ වැ සිටි හෙයින් වේද? එහෙයින් මට ගෘහසථ සම්පත්තීන් ප්‍රයොජනයෙක් නැත. යාවජ්ජීවයෙන් ධ්‍යාන ක්‍රීඩා කොටැ අනන්තයෙහි බ්‍රහ්මලොකයෙහි ඉපද ප්‍රීති සුව අනුභව කෙරෙමි" සි වදාරා "තෙපි වූ කලී මතු දශරාජ ධම්මයට විරොධයක් නො කොටැ රාජ්‍යය කරව" සි අවවාද දී වදාළ සේක.

රජ්ජුරුවෝ ද බොධිසත්ත්වයන්ගේ ශ්‍රීපාද වැඳ නමා වැලැපැ වැඳ සමුගෙණ රාජ්‍යයට සන්නෝ අතර මහදී ම "මාගේ එබඳු වූ ප්‍රිය පුත්‍රයාන කෙණෙකුන් කෙරෙන් වියෝ වූයේ ඒ දුෂට සත්‍රිය වේදැ" සි කියා අතර මඟ බිසවුන් ගෙන්වා ගෙණ ප්‍රපාතයෙහි හෙළා පියා නුවරට වැදැ බොධිසත්ත්වයන්ගේ අවවාද යෙහි සිටැ දශරාජ ධම්මයෙන් රාජ්‍යය කොටැ කම් වූ පරිද්දෙන් හියේ. බොධිසත්ත්වයන් වහන්සේ ද අපරිහීන ධ්‍යාන වැ බ්‍රහ්ම ලොක පරායන වූ සෙයෙක.

මේසේ මාගේ සවාමිදරුවන් පණිතයෙන් හුනුවන් දෙවතාවා ලෙහි හොවා ගත්තේ ද – ඔවුන්ගේ ලෙහි තුබූ ධම්බලයෙන් ම ය. ඉක්බිති තමාගේ ලෙන් ගෙණැ ගොසින් නාගරාජයාගේ පණ ගතියෙහි හිඳුවා හියේ ද ධම්මයෙහි බලයෙන් ම ය.

නාගරාජයා නාග භවනයට ගෙණැ ගොසින් තමාගේ දිව්‍ය සම්පත්තීන් දුන්නේ ද ධම්මයෙහි බලයෙන් ම ය. සවාමිදරුවන් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා අනන්තයෙහි බ්‍රහ්මලොකපරායන වූයේ ද ධම්මයෙහි බලයෙන් ම ය. මෙසේ ධම්මයෙන් තම් සියලු සත්ත්වයාගව සියලු උපද්‍රවයන් මිදෙන්නේ යැ සි දත්තා වූ සත් පුරුෂයන් විසින් රාජ භය චොර භයාදි වූ සියලු උපද්‍රවයන් සංහිදුවා සියලු සම්පත්ති සාධාදෙන්නා වූ ධම්මරත්නය සරණ යෙමි සි **දහම් සරණ** යා යුතු.

24. මහා පදුම ජාතක කථා.

තව ද ධම්ය තමා රැක්කවුන් රක්ෂා කරණ බව හඟවන පිණිස මාගේ සහෝදරු වූ බොධිසත්ත්වයන් වහන්සේගේ ධම් බලයෙන් මරහු මැවූ සහලහුරු

25. බදිරඛාර ජාතක කථා. වලෑ සත්බුමු පියුම් පිපියා වූ බදිරඛාර ජාතකයෙහි කථාව

ද දක්වම්. හෙ ද ධම්යෙහි සෙනහ ඇත්තා වූ සත්පුරුෂයන් විසින් සෙනහ ඇති වැ ඇසිය යුතු. හේ කෙසේ ද? යත්:—

අතීතයෙහි බාරාණසියෙහි බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රජ කරණ කල්හි බොධිසත්ත්වයන් වහන්සේ බරණැස් නුවර සිටු කුලයෙහි ඉපදී නානාප්‍රකාර වූ වයසට සුදුසු වූ අලඞ්කාරාදීන් දිව්‍ය කුමාරයන්හු සේ වැඩී සියලු ශිල්පයෙහි මස්තකප්‍රාප්ත වැ පියාගන් වහන්සේගේ අවැමෙන් සිටුතැන් ලදින් නුවර දෙර සතරැ හා නුවරැ මධ්‍යයෙහි හා තමන් වහන්සේගේ ගෙදොරෙහි හා සතැන්හි සදන්හලක් කරවා මහදන් දී වදරණසේක. පොහෝ දවස් පෙහෙ වැ වදරණ සේක.

එක් දවසක් බොධිසත්ත්වයන් වහන්සේට පෙරවරු වේලා පිණිස නානාග්‍ර රස හොජන ළඟ වූ කල්හි හිමාලයයෙහි වසන්නා වූ එක් පසේබුදු කෙණෙකුන් වහන්සේ සත්දවසකින් නිරෝධ සමාපත්තියින් නැගි වේලා සලකා "අද බරණැස් නුවර සිටානන්ගේ ගෙට යම්හ" යි නිශ්චය කොටැ නාලිය දෑවටු දඬු වළඳ, අනුනක් විලින් ශ්‍රී මුඛය සෝධා රත්ගල් තෙලෙක්හි සිටැ සිවුරු වැළඳැ ගෙණැ සෘද්මය වූ පාත්‍ර චීවර ධරා ආකාශයෙන් අවුත් බොධි සත්ත්වයන්ගේ ගෙදොරැ වැඩ සිටිසේක.

බොධිසත්ත්වයන් වහන්සේ බුදුන් වහන්සේ දැකැ වදරා ආසනයෙන් නැගී සිටැ අධික වූ ආදර දක්වා පාත්‍ර ගෙණෙන්නට ඇලයෙහි සිටි මෙහෙකරුවෙකුට නියොග කොටැ වදළසේක.

ඒ ඇසිල්ලෙහි ම පාපිෂ්ඨ වූ මාරතෙම ඊර්ෂ්‍යායෙන් නැගී තට තවා සිටැ "සත්දවසක් නිරාහාර වූ මේ පසේබුදුහු අද අහරක් නො ලද්දහු තම් මියෙති. මොහුනුත් නිරාහාර කොටැ මරම්. සිවානන්වත් දුනානන්තරාය කෙරෙම්" යි සිතා අවුත් සිවානන්ගේ ගෙදොරැ හා පසේබුදුන් වහන්සේ මධ්‍යයෙහි අවීචි මහානරකය ඉපිළ ගියාක් බඳු වූ මහත් වූ සාලහුරු වළක් මවා දුරැ සිටැ බැලුවන් ඇස් පිපිරැ පලායන පමණ රැසින් හා සියලු ආකාශයට නැඟෙන දුමින් හා භයඞ්කාර කොටැ දක්වා තෙමේ නො පෙණී ආකාශයෙහි සිටගත.

පාත්‍රය ගෙණෙන පිණිස නික්මුණු පුරුෂතෙම දෙරැ ගිනි වළ දකිමින් ම මහ හඬින් හඬා පසුබසැ හී බොධිසත්ත්වයන්ට එ පවත් දැන්වී ය. සවාමිදරුවෝ එ පවත් අසා අතිකකු යවා වදුළ සෙයෙක. හෙද එසේ ම හඬා පසුබට.

මෙසේ ක්‍රමයෙන් සියලු මිනිසුන් පසුබට කල්හි තමන් වහන්සේ "මේ නියතයෙන් මාගේ දනට අන්තරායක් කරන්නට සිතුවා වූ වසවත්තීමාරයාගේ විකාරයෙකැ" යි සිතා වදුරා මේ මාරතෙම තමාගේ වෙෂයට වෙෂය දන්නා බව මුත් තමා සේ වූ මරුන් කෙළ ලක්ෂයක් විසිනුත් මාගේ දනයට අන්තරායක් කොවැ ගත නො හැකි බව නො දනී" යි සිතා වදුරා මාගේ දානාධ්‍යාශය හා මරහුගේ ශක්තිය හා දෙකින් වැඩියක් බලමි යි.

තමන් වහන්සේට ඉදිකළ බත අල්වා ගෙණැ ගෙන් නික් මැ සඟලහුරු වළැ කෙළවරැ සිටැ ගෙණැ අකාශය බලා හයඬකර වෙෂයෙන් සිටියා වූ මරහු දැකැ "කොල! මේ සඟලහුරු වළ මැවූයෙහි තෝදැ" යි විචාරා "මම ය" යි කී කල්හි "කුමක් පිණිස මැවි දැ" යි විචාරා "තොපගේ දනයට අන්තරාය කරණ පිණිස හා පසේබුදුන් දිවිගන්නා පිණිස ය" යි කී කල්හි "කොල තා සිතූ දෙක ම අද සිද්ධ විය නො දෙමි. තාගේ ශක්ති ත් මාගේ ශක්ති ත් දෙක බලා සිට" යි වදුරා පසේ බුදුන් වහන්සේට "සවාමිනි, අද මම මේ සඟලහුරු වළ හිස බිම බල්වා පය උඩු බල්වා ලාගි ක්ෂණයෙහි මකුළු හුයක් සේ දැ මියෙමි නමුදු මා සිතූ දනට අන්තරායක් නො කෙරෙමි. නුඹ වහන්සේ අහර පිළිගත මැනවැ" යි කියා අහුරු වළ මත්තට ශ්‍රීපාද දික්කළ සේක.

ඒ ක්ෂණයෙහි ම අසූ රියනක් පමණ සඟලහුරු වළ පලා ගෙණැ සත්බුමු පියුමෙක් නැඟී ශ්‍රීපාදය පිළිගත. ශ්‍රීපාද පියුම්හි ඔබා වූ ක්ෂණයෙහි ම තැංගා වූ රේණු සවාමිදරුවන්ගේ රන්වන් වූ ශ්‍රී ශරීරය තවරා ගෙණැ නැඟී මරහු මුහුණ ගැසී ඇස්වසා ගෙණැ දුවන්නට පටන් ගත. බොධිසත්ත්වයෝ පියුම් මැඩැ ගෙණැ ගොස් පසේ බුදුන් වහන්සේගේ පාත්‍රයෙහි ආහාරය ඇවිසි සේක. පසේ බුදුන් වහන්සේ අහර පිළිගෙණැ අනුමෙවෙනි බණ වදරා හිමාලයයට වැඩි සේක. මර ද තමාගේ මනොරථය පුරා ගත නො හී දෙම්නසට පැමිණැ තමා වසන තැනට ම ගියේ.

මහා පුරුෂයානන් වහන්සේ ද එ දවස් ප්‍රාප්ත වූ පමණට ද "සුවරිත ධම් නම් ඉහජාතියෙහි ම මෙසේ අර්ථ සිද්ධියට කාරණ ය" යි ධම් දෙශනා කොවැ වදුරා ධම්යෙහි අනුසස් දක්වා

ගෙට වැඩි සේක. මෙසේ ධර්මිෂ්ඨයන්ගේ ධර්මයෙහි බලයෙන් මර දෙව් පුත්‍රයා මැවූ සහලහුරු වළ බිඳ ගෙණ බෝධිසත්ත්වයන් ගේ ශ්‍රීපාදය පිළිගෙණැ සත්ත්වයා පියුම් තැගි පවත් ඇසූ සත් පුරුෂයන් විසින් ධර්මය සේ සත්ත්වයාහට පිහිටයෙක් නැතැ" යි කියා නිශ්චය කොටැ ධර්මය මුල් කොටැ සියලු අර්ථසිද්ධිය කරණ පිණිස දහම් සරණ යා යුතු.

25. ඛදිරඞ්ගාර ජාතක කථා.

තව ද කරුණාවට හෙතු ගෙය වූ, දහමට ල ඇති වූ, අසන්-තවුන් කන්හි අමා තමන මධුර ධර්ම දෙශනා ඇති, බැලූ බැලූවන් ඇස් නිවන මනහර රූ ඇති,

26. වෙස්සන්තර ජාතක කථා සිතන්තන් සිත නිවන මනහර ගුණ ඇති, දෙව් – බඹුන් මුදුතෙහි කෙළතා පා පියුම් ඇති, ලොකස්වාමී වූ, ශාක්‍යසිංහ වූ, පරදුඃඛ දුඃඛිත වූ, අනුශාසක වූ, අර්හයවාදී වූ, ධර්මරාජ වූ, සමන්ත භද්‍ර වූ, ෂඩභිඥ වූ, ලයට සැනහැලි වූ, සසරට ප්‍රතිපක්ෂ වූ, නිවණට දෙර හළුවා වූ, සුගතියට හිණිපෙති පෙළ වූ, අපායට හකුල් හෙළූ, වියත්කම්හි අගතැන් පත් වූ —

මුළු සක්වළ සතුන් දැල් වූ ඇස්හි පැනී යන්නා වූ, සිතූ සිත්හි බැඳී යන්නා වූ' වැඩියක් ඇවිල යන්නා වූ, ඇස ලූලූ දිශාවට සියලු සැපත් දී ලන්නා වූ, ඒ සර්වාම්දරුවානන් වහන්සේගේ අතීත කාලයෙහි දානමය පුණ්‍ය ක්‍රියායෙන් යුක්ත මේ **විශ්වනගරජාතක කථාව** ගෙණ හැර දක්වමි. තමහට සිතැහැනි නිවන් පුර වදනා කැමැති සත්පුරුෂයන් විසින් සාවධාන වැ කන් තමා ඇසිය යුතු.

හේ කෙසේ ද? යත්:—

පෙර දඹදිවැ **සිවි** රට **ජයතුරා** නම් නුවරෙක් වී ය. එපුර සමපත් නැමැති මහමුහු ද මැද බිඳෙන රළපෙළ සේ නිරන්තර රසයෙන් දිවන්නා වූ පතන්නා වූ අශ්වයන්ගේ හෙෂාරවයෙන් එක කොලාහල ය. එසේ ම නානා ප්‍රකාර වූ සවණ්කම්බල අතුළා වූ කොයෙක් රථයෙහි චක්‍ර නාදයෙන් හා හස්ති නාදයෙන් හා ශඛ්ඛනාද යෙන් හා එකනාද ය. සතුටුවූ සත්ත්‍රී පුරුෂයන්ගේ නානා ප්‍රකාර වූ මඞ්ගලයෙහි හා නෘත්‍ය ගීත වාද්‍ය ප්‍රසඞ්ගයෙහි ගසන ලද මිහිඟු බෙරෙහි ගම්භීර ධීර නාදයෙන් ශ්‍රවණ රමණීය ය. ප්‍රවීණ වීණා කාරයන්ගේ වීණා සවරූපයෙන් සංඛ්‍රාම්‍ය.

නානා ප්‍රකාර වෙෂභූෂණයෙන් යුක්ත වූ සම්පත්තීන් හා අනූන වූ යෞවනයෙන් උද්දම වූ රූපයෙන් මනොහර වූ කුලයෙන් අනින්දිත වූ විද්‍යයෙන් පරිශුද්ධ ද සැරහුම්හි තන්වැසි වූ කෙළියෙහි විදග්ධ වූ අන්තරඛහ බාහිරඛහ වූ කාරියෙහි ප්‍රමාණයක් නැත්තා වූ ගැණුන් හා පිරිමින් විසින් ගැවසී ගත්තා වූ මෙසෙයින් සියලු සම්පත්තින් ගැවසී ගත්තා වූ සමෘද්ධි ඇති ඒ **ජයතුරා** නුවර රජ කරණ සඳ තම් රජෙක් විය.

හෙතෙම මහා කුලීන හෙයින් හා දෙවියා සත්‍යය යන මෙයින් හා අභිමානා වූ කායඝ්‍ය සාධාශැන්මෙහි දක්ෂ හෙයින් හා කිවා කරණ අමත්‍යයන් ඇති වැ දශරාජධම්මයෙන් කොප්‍ය නො වැ රජකරණ සමයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ තමාගේ පුරසන්‍රින් කෙරෙන් එක් සන්‍රියක් කැඳවා කියන්නේ "පෘථිවියෑ යම් වසතුයෙක් තිට ප්‍රිය ද ඒව දශවරයක් ගනැ" යි කිය. සන්‍රිය කියන්නී "දෙව්රජ! තට තමසකාර වේවා යි. පොළොවෙහි සිටි මහා වෘක්ෂයක් පහකරණ මහ පවණක් සෙයින් තොපගේ මේ දිව්‍යපුරයෙන් මා පහකරවනු ද? මා විසින් කවර පවක් කරණ ලද්දේ දූ" යි කිව.

සක් දෙව් රජ කියන්නේ "නී විසින් පව් කරණ ලද්දේ නො වෙයි. මට අප්‍රිය නො වෙයි. තිගේ පින් ද ආයු ද පිරිහුන. එහෙයින් කිම්. නී කෙරෙන් වියෝ වීමෙක් වෙයි. මාගෙන් දශවරයක් ගනැ" යි කී ය.

සියලු දෙවියන්ට ප්‍රධාන වූ සක් දෙව් රජ මට වර දෙනු කැමැත්තෙහි වී නම් නට වැඩෙක් වෙයි. නා කියන ඕවි රට සඳ මහරජුන්ගේ නෙවෙස්නෙහි වෙසෙම් වයි. එක් හැවිරිදි මුව පොල්ලන්ගේ දිගුනිල් පෑයෙන් යුක්ත වූ ඇස් බදු වූ තුන්වගස ම අති නිල වූ ඇස් ඇති වෙම්ව යි. දෙව් දුනු මෙන් බැමලිය ඇති වෙම් ව යි. **දුසනිදෙවි** ය යි යන නමෙක් ඇති වේව යි. සියලු රජුන් විසින් පූජිත කරන්නා වූ යශස් කීර්තින් පිරිවර ඇති වෙම්ව යි.

සියලු යාචකයන්ගේ අධ්‍යාශයට යොග්‍ය වූ නො මසුරු වූ ඇස් ආදී ඉල් වූ කලැ නො දෙමි යි නො කියන උතුම් වූ වසතු දෙනු වූ ගුණෙන් යුක්ත වූ රූපයෙන් යසසින් ප්‍රිය වූ පුතකු ලැබෙම්ව යි. මා ගර්භනී වූ කලැ සම කොටැ හා ගෙදූ දුනුම්ටක් සෙයින් මාගේ මධ්‍යමාඛගය නුඋස් නොමාත් වේව යි. දෙව්රජ! මාගේ පයොධරයෝ දෙදෙන නො හී උඩු බලා සිටිත්ව යි. මා හිසැ නර නො නැගේව යි. මා වෙරැ දැලි නො නීව යි. රාජ අපරාධ කළවුන් වධකයකුත් වූව මරණින් ගළවම් යි සිතූ කලැ මාගේ සවාමි ඔවුන් හරිත්ව යි.

මයූරයන් කොස් ලිහිණියන් රැව් පිළිරැව් දෙන ලද උත්තම සත්‍රීන් විසින් ගැවසී ගත් කුරුන් කුදුන් ලදරුවන් සසලා[1] බල තුන් අරක්කැමියන් හා කිලිහුන් විසින් වතන අවතන ලද සත් රුවනින් වෙසතුරු ආර කවුළුයෙන් හෙබි රාජමන්දිරයෙහි පසඟ තුරු රැවින් විදුනා ලද තෝ යෙක් මධුර පාන "කව! බොව! යන ජනයන් ඇති සඳමහා රජුන්ගේ මෙකී ගුණෙන් සමෘඩ වූ සිවි රට සඳමහරජුන්ට අගමෙහෙසුන් වෙම්ව" යි කියා මේ දශ වරය ගතු.

එසඳ සක්දෙව් රජ කියන්නේ "සම්භාඛයෙන් හොබනා වූ සුසනිදෙවියි! මා විසින් දුන්නා වූ දශවරය ගෙණැ සඳමහාරජුන්ගේ සමීපයෙහි වසව" යි දෙවි රජ සමුදින. ඉක්බිති ඒ දිව්‍යසත්‍රී දෙව් ලොවින් මියැ අවුත් මඳුරට ක්ෂත්‍රිය කුලයෙහි උපන. හෝ තොමෝ සඳමඬුලු වැනි මුහුණක් ඇත්තී ය. දිගු පුළුලු නුවන් ඇත්තී ය. කොඳ කැකුළු වැනි දත් ඇත්තී ය. රන්වන් වූ ශරීර ඇත්තී ය. මතාව වට වූ පයොධර ඇත්තී ය. යනාදීන් වණ්නා කරත් කරත් කියා ගෙවා ගත නොහැකි රූ ඇත්තී ය අලුත් වූ යෞවන ඇත්තී ය. මහත් වූ ඓශ්වර්‍යය ඇත්තී ය.

සාරාසඞ්ඛ්‍ය කප ලක්ෂයකින් මත්තේ බුදුන්ට මවු වෙමි පතා ආ මතු මහාමායාදෙවී වන එයින් ගොස් මානෘදිව්‍යපුත්‍ර වැ එහි සිටැ තිවත් පුර වදනාවුන් ඔවුන්ගේ ගුණ කවුරු කියා නිමවා ගණිද්ද? මෙසේ දෙවහතක මෙන් විය පැමිණැ වසන කල්හි සඳමහරජානෝ බිසවුන්නේ මහාරූප ශොභා අසා මහ පෙරහරින් ගෙන්වා තමාට අගමෙහෙසුන් කෙළේ.

මෙසේ දෙදෙනා සුවයෙන් වැසැ රජකරණ සමයෙහි පිරූ පාරමිතා ඇති ලොවට ඇසක් වැනි වූ මතු බුදුවන මහතාතෝ සියලු ලෝ වැසින් සසරින් මුදනු සඳහා දෙව්ලොවින් සැවැ අවුත් සුසනිදෙවින් බබැ පිළිසිඳැ ගත්හ. ඔවුන් පිළිසිඳ ගත් කෙණෙහි ම සැට දහසක් පමණ කුමාරවරු ඒ ඒ අමාත්‍යයන්ගේ ගෙහි පිළිසිඳ ගත්හ.

මහබෝසතාණෝ මවුකුසැ පිළිසිඳ ගණුත් ම මවු බිසවුන්ට මේ නියා දෙළෙක් උපනි. දවස සලක්ෂයක් වියදම් කොටැ සදන්හලක් කරවා දිළිඳු යාචකයන්ට දන් දෙන දෙළෙක් උපන. සහවැ ද පොවා තමන් කරා ආ යාචකයාහට ඛිනි මැදට පැකැ ඇඟැමස් පළහා දන් දෙන්නා වූ සිවි රජ වැ තමන් කරා ඇස්

1 කුඩා සලා බලවතුන්

ඉල්වා ආ ශක්‍ර බ්‍රාහ්මණයාහට නිලුපුල් මල් සඟළක් බඳු වූ තමන්ගේ දැස ලෝවැසියන් හඬව හඬවා සිය අතින් උපුටා දන් දෙන්නා වූ මහතාණන් දශපාරමිතාවන් මුදුන්පත් වැ සිටැ මවුකුසැ පිළිසිඳැ ගත්තාවුන් මී නියා දෙළෙක් උපදිති යනු කවර ආශ්චර්‍යයෙක් ද?

ඒ හිමියානන් මවුකුසැ පිළිසිඳ ගත් දවස් පටන් දඹදිවැ තොයෙක් රජයෙහි රජදරුවන් එවන සත්රුවන් ආදී තොයෙක් පඬුරෙන් අතුරැ නැති වැ සඳමහරජාතන් බිසවුන්ට උපන් දෙළ අසා නුවර සදන්හල් කරවා බිසවුන්ට උපන් දෙළ නිවා, ඇවක යන් සිත් නිවා, දන් දෙන කල්හි ක්‍රමයෙන් දසමස් පිරුණු සඳ බිසවුන් නුවර පැදකුණු කරණ දෙළෙක් උපත.

ඒ සඳමහරජාතෝ එ පවත් අසා ඇමැත්තන් කැඳවා නුවර සදවන්නාහු කළු වැලි පියා සුදුවැල්ලෙන් තවරා දෙරැ දෙරැ කෙහෙල් තොරණින් රන් තොරණින් රිදී තොරණින් සත්රුවන් තොරණින් පිළි තොරණින් සදැ කේල් නැඹිලි ධජ පතාකායෙන් සදැ තැන තැන පුන්කලස් තිරිකුඩම් තබා වට වටැ පහන් කැවා මෙසේ සියලු නුවර දෙවි නුවරක් සෙයින් සදැ මනහර කොටැ රථයක් සාදවා බිසවුන් එහි හිඳුවා මහත් ශ්‍රීන් මහත් වූ පෙරහරෙන් රාජවීථියට බටහ.

එවිට ම රන් කරඬු රිදී කරඬු රන් පැන රිදී පැන ගෙණැ සඳුව පළමුව ගමන්ගත් තරුකැල සේ දස මෙහෙතැන් පිරිවරා ගත්හ. එසේ ම දෙපසැ සිටැ සලන සුදු චාමර රන්තල් වැට රිදී තල්වැටින් වසන්තයා සිසුවෙසින් ආහ සි සිතම්. සරසුන් විසින් ගත් සුදු සේසතින් එදැ ඒ පුරය ඡත්‍රමය වැ ගියේසැ සි සිතම්.

කිරිමුහුදු ඔද වැඩී දිවන රළ සේ එපුර වේහි දුවන අස් පතරින් හා පඤ්චාංගොපම වූ හස්ත්‍යාලඞ්කාරයෙන් සැදුනු ඇත් කැල යෙන් හා රන් රිදීමය වූ පස්වණක් පැහැයෙන් හා දිලියෙන ධජ පතාකායෙන් විසිතුරැ වූ ඇතුන් අසුන් ගොන් ආදීන් අදනා මනහර රථ පෙළින් හා සත්රුවන්මය පිල් කඩපෙළින් හා ධජ පතාකා හා රන් රිදී කැටපත් පෙළින් හා රන්රුවන් කලස් පෙළින් හා එනුවර බලනුවන්ට අමෘතාඤ්ජනයක් වැන්නැ සි සිතම්.

ඒ සත්රුවන් මඩුයෙහි සිටැ නටන මනහර යොවුන් රූපත් සත්‍රීන් නට නටා නහන අතින් දිව්‍යශ්‍රීන් කැඳවනි සි සිතම් රැක වල් බලමින් ඒ ඒ අත දිවන කුරැ කුදු පෙළින් හා සහවාසී නපුංසකයන් විසින් පිරිවරණ ලද මෙහෙ තැනුන් විසින් මනහර ය.

බලතුන් ගසන බලත් හඬින් හා ඒ ඒ තැන මඩුලු බැඳ ගසන හෙරි තුයිහාදයෙන් හා අසුන්ගේ හෙෂාරවයෙන් හා ඇතුන් ගේ කුඤ්චනාදයෙන් හා එකනිඝෝෂ ය. මෙසේ මහත් පෙරහරින් බිසවුන් නුවර පැදකුණු කෙරෙමින් **ව්‍යාපාර වීටියට** වන් සඳ බිසවුන්ට විළි පහරින්නට පවන් ගත.

එ පවත් ඇසූ **සඳමහරජානන්** විසින් එ කෙණෙහි ම විසිතුරු මඩුවක් කරවා වටතිර බඳවා රුකවල් ලැවූ කල්හි ලොවට ඇසක් බඳු වූ, යාචකයන්ට ධනරාශියක් බඳු වූ, පිරූ පාරමිතා ඇති එ භිමියානෝ මවු කුසින් උපදම්න් ම මැනියන්ට "අම්ම! දන් දෙන්නට සුදුසු දෙයෙක් ඇද්ද"යි කියා අත් දික්කළහ. මෙසේ ඒ භූවතෙක ශෙඛර වූ **වෙසතුරු කුමාරයන්** කි තෙපුල් කවර නම් සතෙකුගේ කණට අමා නො වේ ද? කවර නම් සතෙක් සතුටු නො වෙද් ද? කාට නම් අප්‍රිය වෙද් ද?

එ බස් ඇසූ මැනියෝ දහසින් බැඳි පියල්ලක් මහතානන් දික් කළ අතැ තබාලූහ. එදවස ගෙණැ කිරිමවුන්ට දන් දුන්හ. ඒ ආශ්වයුජී පුරුෂ වූ මහතානන් උපන්දු ම ඔවුන් ගේ කුශල බල යෙන් කෛලාසකූටය සේ රිදී පළිතයක් සේ ද ඉතා ධවල වූ **පණ්ඩර** නම් මහුලැත් පොවිවකු දෙවියෝ තමන්ගේ ආනුභාවයෙන් ඇත්ගල්හි ලා ගියහ.

බොධිසත්ත්වයන්ගේ පිය මහරජානෝ පුතනුවන්ට නම් තබන්නා වූ වතුර්භේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා ව්‍යාපාරවීථියෙහි උපන් හෙයින් **වෙසන්තර කුමාරයෝයැ** යි නම් තබා මෙබදු උත්තම පුරුෂයන්හු හුදකලා ඉපදී ම නො වන්නේ ය. ඇමැත්තන් කැඳවා මුළුනුවර පරීක්ෂා කරවා එකදු උපන් කුමාරයන් සැටදහසක් දෙනා ගෙන්වා පුතනුවන්ට පිරිවර කොටැ ලක්ෂණ සම්පන්න කිරිමවුන් තෝරා ගෙණැ උන්ට මහා විභව තබා දුන්හ.

මෙසේ සැටදහසක් කුමරුවන් පිරිවරා කෙළනා බෝසතානන් තකත්තරු මැදැ බබලන පුන්සඳහු මෙන් කුමාරාභරණයෙන් සැදී රාජ්‍යශ්‍රීන් දිලිහි දිලිහී වඩනා කල්හි තමන් එක් හැවිරිදි වයස තමන් පැළැන්දු වූ ලක්ෂයක් වටතා ආභරණ කිරිමවුන්ට ම දන් දුන්හ.

පියමහරජානෝ ඒ පළඳනා දන් දුන් බව අසා සතුටු වැ මහ ඇඟි පළඳනා කරවා පළඳවති. බොධිසත්ත්වයෝ තමන් පැළඳ වූ පළ දනා අවුත් දන්ගත්නා වූ සිඟන්නන් නැත්තෙන් තව වරෙක කිරි මවුන්ට ම දන් දුන්හ. තුවූ වයසින් ලද බොලඳ එක් හැවිරිද්දේ ය. තව ම මුවෙන් නො හළ කිරි සුවඳ ය.

මේ තියා දානාදධ්‍යාශයෙන් මුළු ලොව කවුරු කෙරෙද් ද? මෙසේ වූ අද්භූතයක් දුටු විරුවෝ කවුරු ඇද් ද? මෙ වැනි ආශ්චර්‍යයක් ඇසූ විරුවෝ ඇද් ද? මෙසේ විසමය වූ දානසම්භාර ඇති ඒ මහතා තන් හා එක් වෙම්හ සි. ඒ උතුමා උපන් උපන් තන්හි ම උපදු මෝව සි මෙබඳු අදහසෙක් සියලු සත්ත්වයන්ට වාසනා වේවා.

මෙසේ දන් කෙළි ම කෙළි කොටැ දන් දී අව හැවිරිදි වයස් වූ කලැ **වෙසතුරු කුමාරයෝ** වෙසතුරු වූ ප්‍රාසාදයෙහි ශ්‍රී යහන් මසාකයෙහි පළක් බැඳැ වැඩහිඳැ සිතන්නාහු:- "මම ඉපැදූ දාන ක්‍රීඩායෙහි සුව නො විඳැ දවස් ගණනෙක් නිකම් ම ගියේ. ඒ දැන් අට හවුරුද්දෙක. තවත් දවස් මෙ සේ ම යේදෝ හෝ සි සිතන්නාහු මෙසේ මහ චතුරක් මෙන් මා දෙන රන් රිදී ආදී දාන ප්‍රවාහය කැට කැබිලිති සේ මා සිත් නො පිණවයි. ඉදින් යාචකයෝ ඇවිත් සිටැ "මහරජ! තාගේ ඇස් උදුරා දෙව සි කිවු නම් දිහු පුළුල් වූ නිල් වූ නුවන් දෙක තල් ලොදු දෙකක් සේ උදුරා අත තබා ලම්. ඉදින් මාගේ හෘදය මාංසය ඒල් වූ නම් තියුණු ශස්ත්‍රයෙන් මාගේ ලය පලා පියා හදවත දන් දෙමි.

එසේ ම යමෙක් ලේ ඉල්වී නම් තෙලියත්නි ලා පෙළා පියා මාගේ ශරීරයෙහි ලේ දෙම්හ. යමෙක් මස් ඉල්වී නම් මහුල් කඩු වෙන් ලිය ලියා පැස්පුරා මස් දන් දෙම් ම ය. යමෙක් අවුත් සිටැ මට ගැති මෙහෙ කරයි කි නම් මුළුරට මා මුන්ට ගැතිබව දනුව සි අස්වා කියා ගැති වෙම් ම ය" සි මෙසේ සිතත් සිතත් දෙලක්ෂ සතළිස් දහසක් ඝනකඩ මහ බොල් **පොළොව** අතෙක ගජිනා කෙරෙමින් අත් බමරක් සේ සතුටු වැ නටන්නට වන.

එක් ලක්ෂ අව සැවිදහසක් යොදුන් උස ඇති **මහාමේරු පර්වතය** ද ඒ මහතානන්ගේ දාන චෙතනා බලයෙන් තමාගේ කුළු අත් ඔසවා වදිමින් නටන්නට වන. ඒ මහතානන්ගේ මහත් වූ අධ්‍යාශය බලව සි කියන්නාක්හු මෙන් **සප්තකුලපර්වතයෝ** කුල් මතින් නටමින් ඔවුනොවුන් ඇහැ ගැසෙන්නට වන්හ.

සුවාසූ දහසක් යොදුන් ගැඹුරු ඇති **මහමුහුද** තමා ගේ රළ නැමිනි අතින් සත් රුවන් ඉසැ ඉසැ මහත් සොම්නසින් නටන් නියක මෙන් නටන්නට වන මේ ආශ්චර්‍යය දුටු වා වූ මිනිසුන් පටන් ගෙණැ මහබඹුන් දක්වා එක පැහැරැ රහ මඩලක් මෙන් කෙළිනව වන්හ.

මෙසේ මහපොළොව ගුගුරුවා දන් දෙන බෝසතාණෝ සඳුන් රුක අතු අහැ ලෙලෙන කළුවැල් ලියක් සේ තමන් රූප ශ්‍රී ප්‍රඥලතායෙන් ගොබවමින් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණෑ සූසැට ශිල්පයෙහි හා අෂ්ට දශ විද්‍යාස්ථානයෙහි නිපුණ වූහ. එ සමයෙහි පියමහරජාණෝ පුතනුවන්ගේ රූපශ්‍රී යශස් කීර්ති බලා පියා ප්‍රීති සාගරයාගේ උත්පාතික වෙශයෙන් මාගේ පුතනුවන්ගේ රාජ්‍ය ශ්‍රී මා ඇස් හමුයෙහි ම කොටැ මාගේ නුවන් දුරිද්‍රය හළ මැනවැ යි සිතා චෙතිය රට රජ්ජුරුවන් ගේ දූ වූ සියලු සත්‍රීන් ගේ රූප එක තැනට කැටි කොටැ මවාලූ රූපයක් බදු වූ සියලු රූපශ්‍රියෙන් දිලියෙන මද්‍රී දෙවින් ගෙන්වා මහුල් කොටැ මහබෝසතාණන්ට අග මෙහෙසුන් කොටැ පාවා දී වොටුනු පළඳවා රාජ්‍යය පාවා දුන්හ.

පිය මහරජාණෝ පුතනුවන් ගේ රාජ්‍යශ්‍රී බල බලා සතුටු වැ වසන්නාහ. මහා බොධිසත්ත්වයෝ ද සතර සඞ්ග්‍රහ වතින් දශරාජධර්මයෙන් වියෝ නොවැ ධර්මයෙන් රාජ්‍යය කොටැ සත තයෙන් මවුපිය දෙදෙනා වැඳැපුදැ උපස්ථාන කොටැ සියලු යාචකයන්ට සදන්හල් කරවා අනෙක ප්‍රකාරයෙන් දන් දී රාජ්‍යශ්‍රියෙන් දිලියෙමින් වසන්නාහු එසමයෙහි පුතනුකෙණෙකුන් හා දියනි කෙණෙකුන් ලදින් වතුර්දියෙහි නිපුණ වූ බමුණන් ගෙන්වා ගෙණැ පුතනුවන්ට ජාලිය කුමාරයෝ ය යි ද දියනියන්ට කිෂ්ණාජිනාවෝ ය යි ද නම් තබා මෙසේ සුවයෙන් රජකරණ කල්හි —

චෙතියරට රජුන් හා ජයතුරා නුවර රජුන් හා රටවැස්සන් හා මෙසේ සතුටු වැ දෙනුවර වැස්සන් හා නො වෙනස් වැ වසන සමයෙහි කළිඟුරට වැසි නැති වැ දුර්භික්ෂ භය වී ය. කළිඟු රට රජ්ජුරුවෝ තමන් ඇමැත්තන් කැඳැවා කියන්නාහු, "වැසි නැති, කුමක් කරමෝදැ"යි කීහ.

ඇමැත්තෝ කියන්නෝ කැමැති දෙයක් දන් දෙන්නෝ වෙස්සණතර රජ්ජුරුවෝ ය. උන්ගේ දෙවියන් විසින් දුන් සර්වශ්වෙතමය වූ, පණ්ඩර නම් වැසි වස්වන මහානුභාව ඇති හැලි ඇතෙක් ඇත. ඔහු ගෙන්වුවහොත් අප ගේ රට වැසි වැසැ දුර්භික්ෂ භය සංහිදෙ"යි කීහ.

එසඳ රජ්ජුරුවෝ වෙදනුයෙහි නිපුණ බමුණන් අටදෙනෙකු ගෙන්වා ගෙණැ කියන්නාහු :– "බමුණෙනි! වෙස්සණතර රජ්ජුරුවන් ගේ වැසි වස්වන හැලි ඇතෙක් ඇත. ඒ ඇතු ඉල්වා ගෙණැ එව"යි කීහ. බමුණෝ ද රජු අතින් සමුගෙණැ නො බොහෝ දවසින් ගොස් සිවිරටට වන්හ.

බුද්ධාඞ්කුර වූ ඒ වෙසතුරු මහරජාණෝ එ දවස් පොහෝ ද, සතර දෙරැ සතර දන්හල් විචාරන්නට යන්නාහු සුවඳ පැනින් නහා ඉස් සොඩා සළු පෙරලා සළු හැඳැ ගඳ විලවුන්ගෙන් සුසැට ආභරණයෙන් සැදී දෙවෙඳ විලාසයෙන් සිටැ "ඇතු ගෙණෙ සි" කිහ.

ඇතු ගෙණෙන්නාහු සතර පස සතර ලක්ෂයක් වටනා පළඳනා යෙන් සද, යට බඩ ලක්ෂයක් වටනා පලසකින් වසා, පිට රන්දැල් මුතු දැල් රිදී දැල් කිකිණිදැල් මිණි රස් පෙළින් හා මේ ආදී සත් රුවනින් ඇතු සද, එළවූහ.

රන් භිණින් ඇත් කදව පැන නැඟී දළපුඩු සෙසත් හිසට කරවා සත්රුවන් සෙමර සලවා රජ යුවරජ මහ ඇමැති මඩුලු පිරිවරා සිවුරඟ සෙනඟ පිරිවරා **ශක්‍රදෙවෙන්ද්‍රයා සෙයින්** පූර්ව දිශාවෙහි දන්හලට යන රජ්ජුරුවන් බමුණෝ දැකැ දනට රැස් වූ සිහන්තන් බොහෝ දෙනා සෙයින් දකිනට ගඟට ය සි. බමුණෝ අවදෙන දකුණු දිගැ දන්හලට යන මඟැ උස් ගොඩෙක සිටියහ.

රජ දකුණු දිගැ වාසල් සමීපයෙහි සිටි බමුණන් අවදෙනා දැකැ උන් සිටි දිශාවට ඇතු නැමූහ. බමුණෝ අවදෙන අත් නහා **"ජයතු භවං මහාරාජ! වෙස්සන්තර"!!** යනාදීන් ආශීර්වාද කළහ. **වෙසතුරු** මහරජ තෙම "මේ බමුණෝ මඳ දෙයක් ඉල්වති" සි ඇතු ආසන්නා කොවැ මෙහෙයා සිටැ "බමුණෙනි! තොපි කැමැති දනක් ගන්ව" සි කිහ.

ඉක්බිති බමුණෝ කියන්නාහු "සියලු සත්වයන්ට මවු පියන් බදු වූ රජ්ජුරුවෙනි! තෙල ඇතු අපට දන් දෙව" සි කිහ එබස් අසා රජ තෙම මේ බමුණෝ "මා ශරීරයෙන් භාගයක් නො ඉල්වූහ. ඇස් උපුටා දෙව සි නො කිහ. ඇඟින් මස් කපා දෙව සි නො කියා ඇතු ඉල්වති" සි මදක් දෙමිනස් වැ —

"යහපත! තොප කැමැති ඇතු තොපට දන් දෙමි" සි සතුටුවැ ඇතු සදන්නා වූ ලක්ෂයක් වටනා රන්පලසකින් පිට සද, ලක්ෂයක් වටනා මුතුදැල ය, ලක්ෂයක් වටනා මිණිරස්‌දම් පෙළ ය, ලක්ෂයක් වටනා රන්දැල ය, ලක්ෂයක් වටනා මැණික් දැලය, ඇලයෙහි බහාලන දෙලක්ෂ වටනා දෙමිණිය, ලක්ෂයක් වටනා කණිහරණය ය.

වටංසක නම් තුන්ලක්ෂ වටනා රන්මල් තුණ ය, කුඹසැදූ ආභරණ ලක්ෂයෙක, සුණඩයේ යට සොවැන්න ලක්ෂයක් වටනේ ය. දෙ දළ සැදූ ආභරණ දෙලක්ෂයෙක. සතර පස පළඳනා සතර

ලක්ෂණයෙක. වාලධිය සැදූ පළඳනා ලක්ෂණයෙක. යටිඹිස සැදූ පල්ලස ලක්ෂණයෙක. ගෙලෙහි මුතුදැල් ලක්ෂණයෙක. කුඹ එබූ මැණික හා මුදුනේ මැණික හා කණ්ඨයේ මැණික හා පිට මැණික හා මේ සතර මැණික අතඹී ය. ඇක් අකුස්ස දෙක අතඹී ය.

මෙසේ වෙසතුරු කොටැ ඇතු සදෑ තව ද ඇතු බත්කවන කටාරය ලක්ෂයක් වටනේ ය. ඇතු පිටට නැගෙන රන්හිණ ලක්ෂයක් වටනේ ය. මේ ආදි අතඹී පළඳනා හැරැ සුවිසිලක්ෂ යක් පළඳනායෙන් ඇතු සදෑ ඇත්වෙදුන් ඇත්රැටියන් ඇතුළු වැ පන්සියයක් කුලවාසීන් ද ඇතු නාවන ඝවන පොවන ඔහට සියලු කළමනා මෙහෙයට පරිවාරජනයන් දී බමුණන්ට ප්‍රසාද දී සිත් ගෙණැ රුවන් කෙණ්ඩියෙන් අතැ පැන් එව ඇතු බමුණන්ට දන් දුන්හ.

ඒ මහතානන් ඇතු දන් දෙන් ම මහමෙර නැමී නමස්කාර කෙළේ. මහපොළොව සතුටු වැ ගුගුළේ. ඉක්බිති බමුණෝ ඇතු නැඟී රාජ වීථියට බවහ. නගරවාසීහු කැටි වැ කියන්නාහු "නෙපි නො බා අපගේ දිව්‍ය ඇතු ගෙණැ යානු" යි කිහ. එබස් අසා බමුණෝ කියන්නාහු "**වෙස්සන්තර රජ්ජුරුවන්ගේ** මේ ඇතු දන් ලදුම්හ. තොප කෙසේ වළකුමෝදැ" යි තුඹවැඩි බැණැ ඇතු නැඟී ගෙණැ ගියහ.

එසඳ රජ-බමුණු-වෙළඳ-ගොවි ආදීහු හා අධිකාර සෙනෙවිරත් ඇපා මාපා මහලැන යන පසඳ ප්‍රධාන මහාමණ්ඩලිකයෝ ද මුළු මුළු වැ ගෙණැ රැස්වැ තතනමින්, පුපුරමින්, දන්කමින්, මුළු නුවර අලළා හොස් කිපි **වෙස්සනතර** මහරජානන්ගේ පියානන් **සඳමහරජානන්** කරා ගොස් හඬාපි "ස්වාමීනි! අප දන්වන්නක් ඇසුව මැනව.

සුවිසි ලක්ෂයක් වටනා ආභරණයෙන් සැදුනා වූ සියලු ඇත් ලකුණෙන් බබලන්නා වූ සඕඛ ධවල වූ වැසි වස්වාපියන පමණ මහත් වූ ආනුභාව ඇති දෙවියන් විසින් දුන්නා වූ මනුෂ්‍ය ලොක යට දුලීහ වූ හස්තිශ්‍රියෙන් දිලියෙන ඇත් රුවන තොප පුතනුවෝ බමුණන්ට දන් දුන්නෝ වේ ද?

"ස්වාමීනි! තමන් සැදුහැවැ සැරහී දන් දෙත් නෙසු ඇතුන් දීපිය නො හැකි ද? අසුන් දිය නො හැකි ද? නොයෙක් රන් රුවන් දිය නො හැකි ද? මීනියා ලොවට වැඩකරු වූ මේ ඇතු දන් දුන්නේ කුමකට ද? රටින් යන වෙළඳුන් සේ අපරීක්ෂා කෙරෙති. දැහැමින් සෙමින් රාජ්‍යය කොටැ අප රක්ෂා කෙරෙති.

සිතුනියා ගෙපත් නියාය" යි කියන්නා වූ නගරවාසීන් දැකැ සඳමහරජ "නගරවාසීන්ගේ රුහැණි බලවත; කළමනා කිම්දෝ හෝ" යි සිතා බාලයන් විසින් නො කළමනා දෑ කළවුන්ට තොප කී දුවුවමක් කරන්නෙමි වෙමිදැ" යි කීහ.

එසද නගරවාසීහු සංගිදී කියන්නාහු **වෙසසනතර** රජ්ජුරු වන් දඟගෙයි ලත් නො පිළිවන. දිවිගණුත් නො පිළිවන. අපගේ රට හිඳා අප කැසූ තැනැත්තන් රටින් දුරුකොටැ වංකගිරි පර්වතයට යවනු මැනව අද ම යැවිව මැනවැ"යි කීහ.

සඳමහරජානෝ සිතන්නාහු "දැන් මුන්ට මිහිරිකොටැ කියා යවාපියා පසුව දුටුවක් දකුම්හ" යි සිතා මහජනයන්ට කියන්නාහු "අද දවසට රදා අඹුදරුවන්ට සමුදී සෙට යන පරිද්දෙන් සිතව" යි කීහ. එ බස් ඇසූ නගරවාසීහු වැඳා **සවාමිනි!** "නුඹ වහන්සේට හැඟුනක් කළ මැනවැ"යි කීහ.

එසද **සඳමහරජ්ජුරුවෝ** මහාශොකී වැ "නගරවාසීන් කිපුණු බැව් මපුතුන්ට කියව" යි **කණහා** නම් ඇමැත්තා යවූහ. ඇමැති ගොස් ඒ වෙසතුරු **මහරජානන්** වහන්සේ දිව්‍යවිමාන යක් මෙන් සැදුනු ප්‍රාසාදයෙහි රාජ කුමාරයන් පිරිවරා ඇතු දන් දුන් සතුටු සොම්නසින් පිණ පිණා ගරත් කාලයෙක්හි කැඟි පූණී චන්ද්‍රමණ්ඩලයක් සෙසින් වැඩහුන් **වෙසතුරු** හිමියානන් දැකැ ගිය ඇමැති වැඳා පියරජ්ජුරුවන් කියා එවූ හසුන් හය ඇතිවැ නො කිය හී ශ්‍රීපාද වැඳා නැඟී නො සිටියේය. බොධි සත්ත්වයෝ අත අල්වා නඟා සිටුවා "කියව"යි වදළසේක.

ඇමැති කියන්නේ "**සවාමිනි!** ඇතු දන් දුන්හ යි නගරවාසීහු කිපී බොහෝ දෙන රැස් වැ නුඹවහන්සේගේ පිය මහරජානන් වහන්සේ වෙත පැමිණැ නුඹවහන්සේ මේ නුවරින් සෙට වංකගිරි පර්වතයට යවන්ට සම්මත කළහ"යි කීහ.

ඇමැත්තාගේ බස් අසා **වෙසතුරු මහරජානෝ** සී පියා වදාරන්නාහු "මා අතින් ඇස් ඉල්වා එත් මනා ම ය. ඉස් ඉල්වා එත් මනා ම ය. ලේ ඉල්වා එත් මනා ම ය. ඇඟින් අඬියක් ඉල්වුව මනා ම ය. සත්කඩක් කොට කපත් මනා ම ය. මාගේ ශරීරය වෙන් වෙන් කොටැ දෙම් නම් බාහිර වසනු වූ ඇතු දන් දුන්හ යි මව වරද කොටැ සිවිරට වාසිහු **රැහිණි** වූ නම් ඒ මව මැනවැ" යි සිතා මාගේ දෙන දන් නො නවත්මි. දුක් බොහෝ වූ ගළවන්නට දුර්ලභ වූ සංසාරයෙහි උපන්හට දන එල සුව **නැත්**

නම් අනික් තෙසු සුවයෙක් නම් නැත. පින් නො කටහැක්කැ යි නගරවාසිහු කිපුනහු නම් වනවාසයට යන බව ඉතා මැනව. නගරවාසීන් කිවා කරම්හ. උන් කිවා මුදුන්පත්වේව යි ඔහු බොහෝ කලක් ජීවත් වෙත්ව යි ඇසිල්ලකුත් මා පිණිස සියලු ජනයා කළකිරීමෙක් නොවේව" යි වදාරා —

"**ඛණනා** නම් අමාත්‍ය ය! බල එකෙක් මපියානන් වගන් සේට කියම්. නුවර වාසීන් කැමැත්හොත් සෙට **සත්ත සතක** මහදන් දී පියා අනික්දා වලට යනු කැමැත්තෙම්. එපවත් ම පියානන් වහන්සේට කියව"යි වදාරා **ඛණනා** නම් ඇමැත්තා යවා තමන් අස සිටි සෙනෙවිරදුන් කැඳවා දස්-දුස්සන්-ඇතුන් අසුන්-රථ සත්සියක් සත්සියක් බැගින් කැටිකරව යි නියොග කොටැ හුනස්නෙන් නැඟී සිංහවිලාසයෙන් මද්දෙවින්ගේ බිසෝ ගෙට ගොස් ශ්‍රී යහන් මසනකයෙහි වැඩහිඳ බිසවුන් කැඳවත් ම අවුත් ශ්‍රීපාද වැඳ නැඟී සිටි රන්ලියක් සේ සිටි මද්දෙවින්ට කියන්නාහු "බිසවුනි, තොපගේ දෙමවුපියන් ගෙන් ගෙණා නොයෙක් රන්රුවන් රක්ෂාකොට තබව"යි කිහ.

බිසවු කියන්නාහු "සවාමිනි! නුඹවහන්සේ පෙරැ දන් දෙන්නට කියත් මුත් නහා තබන්නට නො කියන සේක. දැන් කුමක් සඳහා මෙසේ වදාළදැ"යි සැක කොටැ පිළිවිසුයෙන් **වෙස්සන්තර** රජ්ජුරුවෝ කියන්නාහු 'සොඳුර! නහා තිබීම නම් දන් දීම ය, දන් නො දෙන්නාහු විලිකුන් පලයෙහි බැඳගත් දිම්නිල්ලක් වැන්නහ. තුම්ල නොද කති. අනුන් නොද කා දෙති. එසේ වූයේ පරලොවට වසතු නහා නොතබන්නාහු නම් වෙයි. එසේ හෙයින් නහා තබයි කියේ නම් දන්දෙන සඳහා ය. මහා තපස්වීන් අනාථයන් කැමැති කෙත්වතැ ධන කැමැති බිජුවට වපුට බොහෝ රැස්කරන්නට කියෙම් වෙම්දැ"යි කිහ.

බිසවු කියන්නාහු "නුඹවහන්සේ මා හැම වේලෙහි ම දන් දීමෙහි සිත් ඇති බව දනුත් මට අමුතු ව මෙබස් කියන්නට කාරණා කිම්දැ"යි කිහ. එසඳ වෙසතුරු මහරජානෝ සිත ඇත්ත කියන්නාහු "සොඳුර! අපගේ ඇතු අප දන්දුන්හ යි නගරවාසිහු කිපි අප මේ රට නො හිඳ දී වංකගිරි වනයට [1] යන්නට සමමත කළෝල. එසේ හෙයින් ඇපි වනයට යම්හ. අප වලට ගියහ යි දළ සෝ දුකින් නො තැවී සුවසේ ජීවත් වැ දරුවන් දෙබිහින්නන් කෙරෙහි බියපත් වැ තොප දිවි රැක්මෙහි [2] සිහි ඇතිවව. අප ගිය කලැ තොප රක්ෂා කරණ සවාමි කෙණෙකුත් ඇත. උන්ට කීකරු වැ අත් පා මෙහෙ කරව. තව ද දරුවන් කෙරෙහි බිය පත්ව"යි කිහ.

1. යවන්නට. 2. බියපත් වැ සොඳුර තොප දිවිරැක්මෙහි

කාමරතියට අනඛයා බඳු වූ, ශ්‍රියට විෂ්ණුහු බඳු වූ, සරසුනි යට බ්‍රහ්මයා බඳු වූ, රූපශ්‍රීන් දිලියෙන මද්දෙව්න්ම සවාමි වූ, ඒ වෙසතුරු රජුන් මෙසේ කියත් ම බිසවුන් ලෙහි පැනැ නැඟී ශොකයින්නෙන් තැවෙමින් කදුළු ඉසැ ඉසැ මඳ සුලඟින් වැනෙන්නා වූ රන් ලියක් සෙයින් වැනෙමින් ඉකිබිඳිමින් ලය අල්වා ගෙණැ "මේ තම් කුමන බසෙක්ද"යි සවාමිදරුවානෙනි, මෙසේ නො ඇසිය යුත්තක් මා කණ ත් හිනිද? නුඹ වහන්සේ හා වියෝ වැ වන ජීවත්විමට වඩා නුඹ හා කැටි වැ මියන මර ම උත්තම ය.

මේ නියා රාජ්‍යශ්‍රී කැටි වැ බෙදූ වළඳූ නුඹ කෙරෙන් අග මෙහෙසුන් ශ්‍රී ලදින් දැන් නුඹ වලට යාදී අපි මෙනුවර හිඳින්නන් කෙරෙම්දැ යි මාගේ දෙදරුවන් වඩාගෙණැ නුඹට පළමුකොටැ මා යන බව නොදන්දැ ද? සවාමිනි"යි කියමින්-

තම් ලෙහි ඇවිල ගත් ශොක ගින්න මහතානන් හා කැටි වැ යෙමි යන සිත් නැමැති දිය එවා නිවා පියා සිතන්නාහු "දන් නැමැති සත් ක්‍රියාව දෙමයැ යි කී නගරවාසීන් සිත් ගන්නට නො පිළිවන. නුඹ වහන්සේ වනානන්තර මැද වඩන මැනවැ"යි කියා බිසවු වන වණීනා කියන්නාහු "රජ්ජුරුවෙනි! මල්පිපී වැනිගිය රමණී වනමැද හඬා වැගිරෙණ හැලි කඳුරු මුහුලු බැඳ සිටිනා මුවදෙනුත් මැද මත රැව්දෙන වෙහෙල් මුවන් දක්නා වූ අපට රාජ්‍යශ්‍රී සඳහන් නො වෙයි.

සෙබවුන් මැද බැහැවී නැටුම් ගත් මොණරුන් දකුත් අපට රාජ්‍යශ්‍රී සිහි නො වෙයි. ඇතිති මුළු පෙරදැරි කොටැ සතසතහා යන මදුතුන් හා නොයෙක් මල්පල්ලෙන් ගැවසීගත් හෝ වැල්ලෙහි සිටැ ලැහැන් බැඳැ කෙළනා මස්කැල හා නොයෙක් වනමල් පැලඳ මඩුලු බැඳැ ලියගී නඟන ලියකින්නාරුවන් මැද නැටුම් ගත් කිංපුරුෂයන් දකුත් රජය සිහි නො වෙයි.

"ඉපි සිටිනා සපු-නා පනා-පුවහු-හොමුවහු-සල්-සළල-අහරු-දෙවිදුරු-නදුන්-සඳුන්-තුවරලා ආදි නොයෙක් රුක් රජුන් දක්නා අපට කවර නම් රාජ්‍යශ්‍රීයෙක් සිහිවේ ද? කවර නම් දුකෙක් සඳහන් වේ ද? වනමල් පැළඳ ගෙණැ රුක්සෙවනින් රුක් සෙවනට ගොස් කෙළනා දරුවන් දෙබිහින්නන් දකුත් අනික් කවර නම් දුකෙක් සිහිවේ ද? "සවාමිනි! නුඹවහන්සේ පන්සල්හි වඩා හිඳුවා වනමුල් ඵලා ඵල කඩාගෙණැ ඊම මට භාරයැ" යි කිහ.

එසඳ දුසනිදෙවි ද යෙහෙළිනියන් බස් අසා පුතනුවන් කෙරෙහි කළ ශොකයෙන් හඬමින් කියන්නාහු "සෙලින් හි මියෙම් ම ය. සිරිහි කා මියෙම් ම ය. හිනි වැදූ මියෙම් ම ය. මාගේ මද වරදකුත් නැති පුතනුවන් වනානතර යවන් නො හැම්මෙම්."

නගරවාසින්ගේ කියමන් ගෙණැ මපුතුන් දන් දුන් දෙමයට වනානතර යවා නම් මි සැලූ කල මැස්සන් පලන්නා සේ නොපගේ රාජ්‍යය නස්නේ වේ ද? නොප පුතනුවන් නො වැළකූ නම් මා දිවි නො තබම්" යි හඬන බිසවුන් දැකැ **සඳමහ රජ්ජුරුවෝ** ද ශොක පත් වැ නුවර වාසීන්ගේ ක්‍රොධ බලවත් බැව් දැන "පුතනුවන් දුන් වනානතරයට යවම්. තෝ දැන් රැහැණි නො වව. නොබෝ දවසෙකින් මාගේ පුතනුවන් වනානතර ගැවූ නගරවාසින් ලවා ම ගෙන්වා ගණිම්" යි කියා ශොක සංසිඳු වූහ.

වෙස්සන්තර රජ්ජුරුවන් දුක්පත් වූවා දැකැ "මම මේ දුක් නො බලම්" යි කියන්නකු මෙන් හිරුද හැඟවුනා. මෙසේ **එදු** රාත්‍රිය යවා අල්ලේ දවස් ඇමැත්තෝ අවුත් වැඳැ සිටැ "සාමීනි! **සතසතු මහදන්** සරහන ලදැ" යි දැන් වූහ.

එබස් ඇසූ මහබෝසතානෝ සිරුරු කිස නිමවා මෙහෙනිමවා රජ ගෙයි රැකවල් හරවා සියලු යාවකයන් රජමිදුලේ රැස්කරවා දානසම්භාර කැටි කොවැ ඇතුන් සත් සියයක් - අසුන් සත් සියයක් - රථ සත් සියයක් - මී ගොන් සත් සියයක් - මී දෙනුන් සත් සියයක් - ගොන් සත් සියයක් - කිරි දෙනුන් සත් සියයක් හා රාජ කන්‍යාවන් සත් සියයක් හා කම්මිත්තන් සත් සියයක් - කෙල්ලන් සත් සියයක් - කොල්ලන් සත් සියයක් හා මෙසේ එකී එකී දෙයින් සත් සියයක් සත් සියයක් බැගින් දන් දී රුවන් තුබූ ගබඩාවලැ දොර හරවා "තොප කැමැති වසතු ගණුව" යි නියෝග කළහ.

යාවකයෝ ද සුපිපි පියුමකට වදනා බමර කැලක් මෙන් රන් රිදී මුතු මැණික් තෝඩු ශංඛලා තිසර රුවන් මුදු රුවන් වළලු මේ ආදි වස්තු කැමැති කැමැති සේ උකහා ගන්නට වන්හ සමහරු පවකඩ පට්ටෝල දෙවාඟ පිඬාම් සළුපිළි මේ ආදි පිළිසඹඩම් ගෙණැ යන්නෝ සියක් දහස් ගණන. මෙසේ ඒ මහතානන් **සතසතු** මහ දන් දෙන කෙණෙහි මහ පොළොව ගුගුරා නැංගේ ය. මහාමේරු පර්වතය සතුටු වැ නටන්නාක් මෙන් සැලෙන්නට වන. **සපතකුල පර්වතයෝ** ද හුයාපි වෙයඟ බඩයක් සේ නැමී වැටුම් ගත්හ.

ඉක්බිති මද්‍රී දෙවී තමන්ගේ පළඳනා පෙරහර පාදංගුලි, පාදකටක, පස්රු, පස්පෙරහර, එක්වැටි, පාදමුදු, රන්මරවඩි, පාඩගම්, හිනි කෙස්වැල, සිරවළලු, දෙපටවිදහ, අහුල්ලාඝර, බාහුමුදු, වැලමුතු, ගළමුතු, මැණික්මාලා, කතපසෙවි, කන්දස, අගතිලක, මිණිදුම්, නිල්මාත්‍රක, ඔටුනු මේ ආදි පළඳනා ධන ධාන්‍ය සියලු යාව කයන්ට දන් දුන්හ. මෙසේ එ දවස් දන් දෙන්නෝ යාඟි අල්ලෙ දවස් වෙස්සන්තර රජ්ජුරුවෝ අඹුදරුවන් කැඳවා ගෙණැ පියා තන් – මැනියන් වැඳැ සමු ගෙණැ සිටියහ.

බොධිසත්ත්වයන් මැනියෝ මද්‍රී දෙවින් දැකැ දුක්පත් වැ කියන්නාහු "යෙහෙළිනියෙනි! දන් දුන් දෙඟයට මපුතුන් යා දෙව. තොපි තොයව. වනාන්තරයෙහි දුක් ඉතා බෙහෙව. ජාලිය කුමාර යක් හා කණ්හාජිනාවන් හා තොප හිය කලැ මහා බ්‍යසන ය. දරුවන් රක්‍ෂා කිරීම යම් පමණ ඉතා දුකැ' සි මද්‍රීදෙවී කියන්නාහු මාගේ සවාමින් හා වල වසන්නේ ගම්වසන්නාට වැඩි සුව ය. කැවි වැ ගමන් යන කලැ ගෙයි හුන්නා වැන්නැ" සි කිහ.

බොධිසත්ත්වයෝ මද්‍රී දෙවින් මුහුණ බලා කියන්නාහු "සොඳුර! වල වසන කලැ මහත් භය ඇත. ඒ හිමාලයයෙහි දුර පිඹුරෝ ය යන සත්ත්වකෙණෙක් තමන්ගේ දරණීන් යොදුන් – දෙ යොදුන් වල් පොවා වවා ගෙණැ තමන් මුඛයට පත් වූ සිංහ ව්‍යාඝ්‍රයන් ද ඇතුන් ද අල්වා ගෙණැ ගැල පී යෙති.

සොඳුර! එවල සෙල් පිටැ හිඳැ සිංහනාද කරණ සිංහයන්ගේ හඬින් කන් පැලී යන්නා වැන්න. ව්‍යාඝ්‍රයන්ගේ ගර්ජනා ල පැලී යන්නා වැන්න යක්‍ෂ රාක්‍ෂ ප්‍රෙතයන් විසින් ද භය ඇත. ශරීරයෙහි ඇව දක්වා විදූ ලේ බොන මදුරුවෝ ද ඉතා බෙහෙව. ඇතුන් පොවා ගසා ගෙණැ යන ඇත් ගිජු ලිහිණියෝ ද ඉතා බෙහෙව. ඇසතෙක දුට ද ගැළපී නො යා දෙන වලසුන් විසින් ගහණ ය. බොහෝ බැණැ කිම් ද? ඒ වෙනෙහි සත්‍රීන්ට වසන්නට බැරිය" සි කියෙන් මද්‍රී දෙවි කියන්නාහු "සවාමීනි! වදුළ හැම දුක් ගෙණැ වෙසෙම්" සි කිහ.

එසඳ බොධිසත්ත්වයෝ කියන්නාහු 'බාලදරුවන් කැට පහණ නො ඇවිදුවා සුවඟහන් හෝනවුන් ගල්පහණ පිටැ නොහොවා ධවලවාමරයේ පවන් විදුනවුන් අවුමුසු දැඩි සුළඟ ඇඟ නොගස්වා රාජ භොජනයෙන් බත් කැවුන් වනමුල් වන ඵල නො කවා දරුවන් ම පියානන් කෙරේ හිඳුවා එව" සි කියෙන් "සවාමීනි! මම නුඹ වහන්සේ නො දැකැ නො හැම්මෙමි; දරුවෝ මා නො දැකැ නො හැම්මෙති" කිහ.

මෙසේ දෙමාල්ලන් හා කථාකරණු ඇසූ සුසීමදේවි පුතනුවන් වෙතෙහි ගන්නා දුක් සිතමින් සෙහෙළනියන් හා දෙදරුවන් ගන්නා වැසන සිතමින් මහ හඬින් හඬා පෙරළෙන්නට වන්හ. සොළොස් දහසක් පුරාඬගනාවෝ ද නගරවාසිහු ද ප්‍රචණ්ඩ වාත යෙන් එක පැහැරි පොළොව වැගිරි ගිය සල්වනයක් මෙන් එක පැහැරි හඬා වැතිරි ගියහ. එකෙණෙහි ඇමතියෝ මනහර කොටැ රථයක් සදා වඩනා කල් දැන්වූහ. එසඳ මද්‍රී දේවි සමණන්ට පළමු කොටැ දියනියන් වඩා ගෙණැ පුතනුවන් ඇඟිල්ල අල්වා ගෙණැ ගොස් රථයට පැන නැංගහ.

පසුව මහ බෝසතාණෝ දෙමවුපියන් වැඳැ සමුගෙණැ පුර සන්‍රින්ට සමුදී සියලු ජනයාට අවවාද කෙරෙමින් ක්‍ෂමාකෙරෙමින් තමන් කළ පින් අනුමෝදන් කෙරෙමින්, මහජනයා හඬ හඬා සිටියදී රථයට පැනැනැඟි රථය පැදගෙණැ රාජවීථියෙහි යන් නාහු ආ ආවන්ට පින්දී "තෙපි හැමදෙන දානාදි පින් කරව. සියලු සංඝකාර ධර්මයන් අනිත්‍ය සේ දුඃඛ සේ අනාත්ම සේ සිතව. සම්පත් නම් අලපත - නෙලුම්පත ඔත් දිය සේ අස්ථිර සේ සිහිකරව. මරණ තමා කෙරේ එන බව සිහිකරව. ඔවුනොවුන් හා විවාද නො කොටැ ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරව. අප කළ බිණු දෙයක් ඇත. ක්‍ෂමා කරව" යි කියා මෙසේ ප්‍රිය නෙපුලෙන් අවවාද කොටැ නුවර වැස්සන්ට සමුදී වදුරා නුවරින් පිටත් වැ උතුරුදිග බලා ගමන් ගත්හ.

මෙසේ වඩනා බුද්ධාංකුර මහතානන් "නුවර පෙරළී බලමි" යි සිතූ ක්‍ෂණයෙහි ම මහ පොළොව පෙරළා ගෙණැ මුහුණු නුවර දිශාවට තිබී ය.

එසඳ බෝසතාණෝ තමන් මවුපියන් ගේ ප්‍රාසාදු දී පුරසමපත් බලා සතුටු වැ මෙසේ වඩනා කල්හි සුසීමදේවි සිතන්නාහු "මපුත නුවෝ වොටුනු මාලාදී රාජාභරණ ධන ධාන්‍ය සොළොස් වරෙක දන් දී මද්‍රීදෙවි හා දෙදෙන හුන් කලට වනාන්තරය වන. ම පුතුන් දෙන්නව ය" යි ධන ධාන්‍ය වස්ත්‍රාභරණයෙන් දහසක් ගැල් පුරා ඇවූහ. මැනියන් එවූ වසතු බලා සතුටු වැ "මද්‍රීදෙවිනි! රථය සිඟන්නන් කරා පදව" යි කියා රථය පදවා ඒ වසතු සිඟන්නන්ට දන් දෙවා වනාන්තරයට නික්මුණාහ.

එසඳ බමුණෝ දෙදෙනෙක් "වෙස්සන්තර රජ්ජුරුවෝ ඉවහා සේ දන්දෙන්ල" යන හඬ අසා නුවර වැදූ පිළිවිසෑ වංකගිරියට වැඩි බව අසා රැහැණි වැ අතසලා පියා "යන කල ගෙණැ ගිය දෙයෙක්

ඇද්ද" යි විචාරා "රථය මිස අනිකක් නැහැ" යි යනු අසා දිවෙමින් ගොස් ඇසසතක වඩන බෝසතුන් දැකැ "පිතැනි රජ්ජුරුවෙනි! සිටුව සිටුව" යි හඬලූහ.

බොධිසත්ත්වයෝ ඒ අසා සතුටු වැ මද්‍රිදෙවින් හා දරුවන් හා බිමැ සිටුවා සෙක්‍රිම අශ්වයන් දෙදෙනා බමුණන්ට දන් දුන්හ බමුණෝ බොධිසත්ත්වයන්ට ආ වඩා අසුන් ගෙණැ ගියහ. දෙවතාවෝ සතුටු වැ මල් වැසි වැස්වූහ.

ශක්‍රදෙවෙන්ද්‍ර තෙම දිව්‍ය පුත්‍රයන් සතර දෙනෙකු කැඳවා කියන්නේ "**වෙස්සන්තර රජ්ජුරුවෝ** තපසට යන්නෝ මගදී රථ අශ්වයන් බමුණන්ට දන් දී පයින් වඩිති තෙපි ගොස් ඒ රථය අදුව" යි නියොග කෙළේ. දිව්‍ය පුත්‍රයෝ සතර දෙන **රොහිත තම්** අස් වෙස් මවා ගෙණැ රථයෙහි ගෙදී දෙවියන් රථය අදිනා **කල්හි** අනික් බමුණෙක් පෙරසේ ම අවුදින් කියන්නේ **වෙස්සන්තර රජ්ජුරුවෙනි!** සිටුව" යි හඬලී ය.

එහඬ අසා මහතානෝ රථය නැවතූහ. බමුණු අවුත් කියන්නේ "රජ්ජුරුවෙනි! ඉතා වැඩියෙමි. රොගීමි ගමනින් මිරිකිනිමි. තෙල රථය දෙව" යි ආශිර්වාද කෙළේ බොධිසත්ත්වයෝ සතුටු වැ අඹුදරුවන් බහා බමුණාට රථය දන්දුන්හ. "ඛිසටු පයින් නො යාගෙති; දරුවෝ දුක්පත් වෙති" නො සිතා ඒ මහතානන් ඒ රථය දන් දෙත් ම රථය අදිමින් සිටි දෙවියෝ අන්තර්ධාන වූහ.

මද්‍රිදෙවි දරුවන් දෙබිහින්නන් අත් අල්වා ගෙණැ වනාන්තර යට නික්මුණාහ. බොධිසත්ත්වයෝ "**ජාලිය** කුමාරයන් මම වඩමි. **කිණ්හාජිනාවන්** තෙපි වඩව" යි කියා දෙදෙනා දෙදෙන වඩා ගෙණැ කටු පහණ ගල් බොරළු මඩිමින් හුණු වැල්ලෙහි ගොස් සෙවන වදිමින් දෙළන් හැලි වැදූ තහමින් ලිය මළුයෙහි වැදූ සැතැපෙමින් ඔවුනොවුන් හා කෙළිමින් යෙමින් තමන් දුන් දන් සිහි කෙරෙමින් සතුටු වැ සතුටු වැ වඩනා සතර දෙනා දුටු දුටුවන් විසින් ඔවුන්ගේ සියුමැලිකම් දැකැ "යන්නේ කොහිදූ"යි විචාරා "**වංකගිරි** පර්වතයට ය" යි යනු අසා කමපා වැ කදුලු මුසු මුහුණින් යුක්ත වැ හඬන්නවුන්ට අවවාද කෙරෙමින් වඩනා කල්හි මහත් පකා පැකී දැකැ දරුවෝ එයට ඇවිට ගෙණැ හඬති

බොධිසත්ත්වයන්ගේ අනුභාවයෙන් අඹ – දඹ – කෙසෙල් – හිවුළු – කටුඑරමිණිය – නාරත් – දෙඛම් මේ ආදි වූ වෘක්ෂ තෙමේ ම කැමී ඵලාඵල දරුවන් අත තිබෙයි.

මෙසේ බෝසතානෝ දරුවන් කැමැති කැමැති දෑ දෙමින් පොකුණු - පතැස් - විල් තෙරැ සැතැපෙමින් වැඩැ දෙවතානු භාවයෙන් මඟ ගෙවමින් ගොස් මද්දිදෙවින්ගේ දෙමවුපියන් ගේ චෙතිය රට ජයතුරා නුවර තිස් යොදුන් මඟ ගෙවා පස්වරු ශාලාවට වන්හ.

මද්දිදෙවි ශාලාව හැමදෑ බොධිසත්ත්වයන් නෝකා ආසනය පතවා වඩා හිදුවා පත්ලෙහි ධූලි පිස පියා දරුවන් දෙදෙනා අසැ ගොවා "නගරවාසීන්ට ද පැනුන මැනවැ" යි සිතා නුදුරු ව සිටියහ. බොධිසත්ත්වයෝ තමන් ගේ නුවර ආ නෙයින් "අප හැරැ ගියේ දෝ හෝ යි සිතුව හොත් සුදුසු නො වේ" යි සිතා බොධිසත්ත්වයන්ට පැනි පැනී සිටියහ

එසේ සිටියා වූ බිසවු යන එන්නෝ දැකැ වැඳැ නගර වාසීහු රැස් වැ සිටැ චෙතිය රජ්ජුරුවන්ට දැන්වූහ. චෙතිය රජහු ඇතුලු වැ සැව දහසක් රජදරුවෝ අවුත් බොධිසත්ත්වයන් පා පිට හඬා හුනුහ. හඬා නැවත සිටැ කියන්නාහු 'දෙවයිනි! කිමෙක් ද? තොපට ලෙඩදුක් නැද්ද? තොප පියාතන් සඳමහ රජ්ජුරුවන්ට දුක් නැද්ද? නුවර වාසීන්ට පිඩා නැද්ද? මේ නම් කුමන විසමයෙක් ද? කවර නම් විපත්තියෙක් ද? මේ නියා අනාථ ගමනක් තොපටත් වී ද? දෙවයිනි! තොප නැඟී ආ වාහන කොයි ද? ඇත් අස් රථ සෙනාව කොයිදැ" යි විවාළහ.

බොධිසත්ත්වයෝ කියන්නාහු "මාගේ දෙමවුපියන්ට ත් නගර වාසීන්ට ත් ලෙඩදුක් නැත. බල එකෙක් නම් කොලාහකුමය සේ සමීඛය ධවල වූ සුවිසිලක්ෂයක් පළඳනායෙන් හොබනා වූ පරිවාර සහිත මාගේ පිඩා නම් ඇළි ඇතු කළිඟු රට වැසි බමුණන්ට දන් දුන්හ යි සිව්රට ඇත්තෝ මපියාතන්ට ද මට ද කිපී මා රටින් ගිය මැනවැ යි කිහ. එසේ හෙයින් ආමි" යි කිහ.

රජ්ජුරුවෝ ඒ අසා "ආසේ ඉතා මැනවැ" යි සතුටු වැ "සිව් රට ඇත්තන් ආරාධනා කොවැ ගෙණැ යන තුරු අපගේ රට රජකළ මැනවැ" යි චෙතිය රජ්ජුරුවන් හා සැටදහසක් රජ දරුවෝ ආරාධනා කළහ.

බෝසතානෝ කියන්නාහු "රාජ්‍යය නො කෙරෙමි. තොපගේ රට මා රාජ්‍යය කරත් අප කෙරපු රජ්ජුරුවන් තුමූ නවතා ගෙණැ රාජ්‍යය කරවති යි තොප කෙරේ වසිර බැඳැ උනුන් හා යුද්ධ කොවැ දෙරට ඇත්තෝ විරොධ වෙති. එසේ නො කරමි.

වංකගිරි පර්වතයට තපස්සට යන බව මැනව. වලෑ විසිමට සුදුසු තැනක් වේව" යි කිහ. "විචාරා කියම්හ. රජගෙට වැඩිය මැනවැ"සි කිහ. බෝසතාණෝ "රජගෙට නො යම්හ" යි කිහ.

මෙසේ කියා ඇතුළු නුවරට නොවඩනෙන් එ ම සාලාව දිව්‍යවිමානයක් සේ සදා සැටදහසක් රජදරුවෝ සාලාව සිසාරා රැකවල් ගත්හ. බොධිසත්ත්වයන් සුවඳ පැනින් නහවා සළු පෙරළා සළු හඳවා රස භොජන වළඳවා රැ ලැගැ "පහන් වූ කලෑ වංකගිරි පර්වතයට යම්හ" යි කිහ.

එසඳ රජ්ජුරුවෝ කියන්නාහු "නුඹවහන්සේ වඩනා කලෑ පෙර ගමන් පසු ගමන් කරන්නට එන්නෝ බොහෝ දෙන ය. මහ වල් කප්පා මං හෙළිකරණතෙක් වැඩ හුන මැනවැ"සි වළකා සත් දවසක් එහි හිඳෑ "මං හෙළිකළ කලෑ වංකගිරියට යම්හ"සි කිහ. බොධිසත්ත්වයෝ නික්මුනාහ.

වෙතිය රජ්ජුරුවන් හා සැටදහසක් රජදරුවන් සමග ගෙණෑ සුළුවනය පසළොස් යොත්තක් ගෙවා ගොස් මහවනය පසළොස් යොත්තක් තැන් ඉදිරියෙහි තබා මහවනය සමීපයෙහි සෙනාපතියකු රැකවල් සිටුවා දකුණත ඔසවා මෙ කියන්නාහු :- "සවාමීනි! මෙතැන් සිටෑ ඉදුරා දකුණුදිග බලා ගියකල නහා සිටු වූ නිල් වලාකුළක් සේ තෙලෙ පෙණෙන ඵලාඵලයෙන් විපුල වූ **විපුල නම්** පර්වතය ය. ඒ පර්වතප්‍රාන්තයෙහි සිටෑ බැලූ කලෑ ඒ තොයෙක් සුගන්ධ ගන්ධයෙන් සමන්විත වූ **ගන්ධමාදන** පර්වතය ය.

"සවාමීනි! ඒ පර්වතය වටා නදුන් - සදුන් - කළුවැල් - කිණිහිරි - සපු - දුනුකේ - වැවකේ - නා- පනා ආදී තොයෙක් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිත ය. ඒ සැතැපී තොප අඹුදරුවන් ඵලාඵල කවා ගෙණෑ ගිරි උඟලෙන් බවෑ සිහිල් පැන් බී ශරීර කලාන්ත නිවා ගෙණෑ ඉන් ඔබ්බට වැඩි කල්හි ඉන්ද්‍රනීලමණි පර්වතයක් සේ බබලන මහත් නුග ගසෙක් ඇත. ඝකීරා පරයන මධුර රස ඇති නුගපත් අනුභව කොවැ ඒ නුගගස මුලෑ සැතැපී ගෙණෑ එයින් ඔබ්බට යන්නාහු සතරහුල් උස් ඇති රතිදු ගොව්වන් සහිත නිල් වූ මහත් තිතණ වනය"ය.

"සවාමීනි! ඒ ගෙවා වැඩිකල්හි පස් පැහැයෙකින් භින්නාවණී ඇති පියුමෙන් හා ඇඹුලු ඉපුල හෙල්මැල්ලෙන් හා හැවසිගත් නිල් වූ දියසළායෙකින් ඉදුනිල්මිණි අතල පාරයූ මී බී උදම් වූ බමරගණයා විසින් උදම් වූ හංසශ්‍රේණීන් විසින් විරාජමාන වූ සිවුරැස් පොකුණෙක් ඇත. ඒ පොකුණට දකුණු දිග ඵලාඵලයෙන්

අවඹක වූ වංකගිරි පර්වතය ය. එහල් පසක පන්සල් කොටැ ගෙණැ ධ්‍යාන සුවයෙන් දවස් යවමින් අඹු දරුවන් හා සමග වැ වාසය කළ මැනවැ"යි මහ කියා සැටදහසක් පමණ රජදරුවෝ වැඳැ සමුගත්හ.

එ දවස් ම ශක්‍රදෙවෙන්ද්‍ර තෙම තමා ගේ දහසක් නුවණැස් බහාලා මනුෂ්‍ය ලොකය බලන්නේ අප මහබෝසතාණන් සතසතක මහ දන් දී වංකගිරි පර්වතයට තපස් කරන්නට නික්මුනු බැවි දැකැ විශ්වකර්ම දෙව් පුත් කැඳවා කියන්නේ —

වෙස්සන්තර රජ්ජුරුවෝ ද මද්‍රී දේවි ද තපස්කරන්නට වංකගිරි පර්වතයට යෙති. තෝ ඒට ගොස් පන්සල් දෙකක් හා සක්මන් මළු දෙකක් හා කේළිවනයක් හා ඵලවෘක්ෂයන් හා මලාමැලි වෘක්ෂයන් හා අඳුන්දිවිසම් – රිටි සුඹුලු – තිදබු – කෙණඬි – සැරයටි – පෑස් – පුළුලුමල් – සුඹල්කරැ – යහුල් මේ ආදි නිමවා තපස් කරන්නවුන්ට කැපය යි භික්ෂුියේ අකුරු ලියා පන්සල වට තිස් ගවුවක් මානයෙහි වහුන් වලසුන් සිංහයන් අවලක්ෂණ යක්ෂ ප්‍රෙතයන් ලුහුබැඳැ එ යි කියා නියෝග කෙළේ. එසේ ගෙයින් ම විශ්වකර්ම දෙවිපුත් මේ කී ලෙස සියල්ල ම නිර්මිත කොටැ දෙව්ලොවට ගියේ.

බොධිසත්ත්වයෝ වෙනිය රටවැසින් කී තෑක් සලකුණෙන් ගොස් සැනපි හිඳිමින් සිවිමින් සතරැස් පොකුණට ගොස් පොකුණේ විසාර බලා "තෙපි මෙතැන සිටුව"යි මද්‍රිදෙවින් පොකුණුතෙරැ සිටුවා දකුණුදිග හසරක් දැකැ ඒ හසරින් ගොස් විශ්වකර්මියා නිම වූ පන්සල දැකැ මහතානෝ සිතන්නාහු "ශක්‍රයා අප ආ බව දන් වනැ"යි – තමන් වහන්සේ අත තුබූ රන් කඩුව ද දුන්න ද තබා පියා පන්සල ඇතුලට වැදැ භික්ෂුියෙහි ලියා තුබූ අකුරු දැක කියවා බලා කැප බැව් දැනැ —

එහි හිඳැ ජටා බැඳැ හන්සලු ගළවා හැරැ වල්කලා හැඳැ අඳුන් දිවිසම් ඇ හැඳැ පෙර වැ පාත්‍රයක් ගෙණැ සැරයටිත් අතින් ගෙණැ සක්මන් මළුයේ සක්මන් කෙරෙමින් සිටියදී මද්‍රිදෙවින් බොධිසත්ත්වයන් ලස්වූයෙන් සතරැස් පොකුණෙන් නික්මැ බොධිසත්ත්වයන් ගිය හසරින් අවුත් තාපස විලාස ගෙණැ සිටියා වූ සමණන් දැකැ ල පැළී යන පමණ ශොකයෙන් හඬා ගෙණැ ඕම හි සවාමිනි!

නුඹ පෙර සිව්රට ආදී වූ ජම්බුද්වීපයෙහි මිනිස්සුන් විසින් මුඹ සදමහරජ්ජුරුවන් පුතනුවෝ වෙස්සන්තර රජ්ජුරුවෝය සි කව කව නුඹගේ රූපශ්‍රී කියනු ඇසීමි."

"මාගේ සිය ඇසින් ම නුඹගේ රාජ්‍යශ්‍රී දිටිමි. සවාමිනි! දැන් මේ නියා තපස් වේසඟක් දිටිමි. පෙර නුඹ රජ්ජුරුවම්හ සි ප්‍රසිද්ධ වැ දැන් තපස්වීය යන නම් වී ය. පෙර මිණි කොඩලෙන් බබලන සහ වොටුනු පලන් තෙල හිස දැන් දළමඬුල්ලට පොවා සුදුසුවී වන පෙර දළ මුත්හර හා එකාවැළ පලන් තෙල උරය දැන් මුවසම් ලන්නට සුදුසු වී වන පෙර කසීසලු හන් තෙලෙ උකුළ දැන් නිය සහිත අදුන් දිවිසම් ගන්ට සුදුසු වී වන මේ නියා වේසඟක් මා දක්නට මා සතු වූ නියා ය

මෙසේ වූ දෙඟෙක් නුඹවත් වී වන. මේ නියා විලාසයක් දුටු මා ලඟ හැම්මෙන නියා"සි හඬා වැලප ශොක සංඝිදුවා ගෙණැ "මාගේ සමණන් ගත් තවුස් වෙස් මා ත් ගතමැනවැ"සි සිතා ජාලිය කුමාරයන් හා කණ්හජිනාවන් හා කැඳවා ගෙණැ අනිත් පන්සලට වැද තමන් හන්සළු ගලවා හැර අදුන්දිවිසම් රිවිසුඹුළු ආදී වල්කලා හැඳ පෙරවැ හිසැ ජටා බැඳැ ජාලිය කුමාරයන් හා කණ්හජිනාවන් හා දරු දෙන්නා අදුන් දිවි සම් රිවිසුහුළු හඳවා හිසැ ජටාමඬුලු බැඳැ තුන් පුතු මවුන් බෝසතාණන් කරා අවුත් වැඳැ නැගිසිටැ කියන්නාහු "වහන්ස! නුඹ අතින් මා ගන්නා වරයෙකැ"සි වර ඉල්වන්නාහු මම වනමුල් වනඵලා ගෙණෙන්නට යෙමි. මා ඵලාඵල සොයා යාදී පෙරවරු නුඹ වහන්සේ දරුවන් දෙදන රක්ෂා කළ මැනවැ"සි කිහ.

බෝසතාණෝ "යහපතැ" සි කියා උන්ට වරදී කියන්නාහු මසිදු තොප විසින් ගන්නා වරයෙක. "වේලේ මුත් නො වේලෙහි මාගේ පන්සලට නො වදුව" සි කියා ඔවු නොවුන් විසින් වරලදින් වසන කල්හි මද්‍රීදෙවි වනමුල් වනඵලා ආදි වූ ඵලාඵල ගෙණහැර බෝසතාණන් වළඳවා අත්පා මෙහෙ කොවැ සත්මසක් විසූ කලැ බෝධිසත්ත්වයෝ දන් ගන්නා සිහන්නන් නැත්තෙන් දුක්පත් වැ පරහට සුව දෙන්නට උපන් මහතාණෝ වනමුල් වනඵලා ඇද්ද? දන් ම මුත් සෙසු සුවයක් සුවැ කොවැ නො අමකන්නාහ.[1]

1. අමතන්නාහ.

මෙසේ වසන සමයෙහි කලිඟු රට වසන ජූජක නම් බමුණෙක් අවලොස් හැවිරිදි වයස සිට සිහන්නේ වෘද්ධ අවස්ථාව දක්වා සිඟා සිඟා සියක් කළුන් මසුරන් උපදවා අනාථ එක් බමුණකු කෙරේ තබලා ගියේ.

මෙසේ කල්යාමෙකින් බමුණු අවුත් "තමාගේ රන් දෙව" යි කියා. ඒ කියන්නේ "මා අනාථ විසින් රන් විකොවැ කැමි. තාගේ රනට මේ මාගේ දුව අමිත්තතාපනා නම් බැමිණිය තට අඹුකොවැ දෙමි ඇ ගෙණැ යා ය" යි කී ය.

ඒ බමුණු තමා අනික් ලැබෙන දෙයක් නැත්තෙන් බැමිණිය ගෙණැ දුන්නිමිත්තන නම් ගමට කැඳවා ගෙණැ ගොස් තමාට අඹු කොවැ වෙසෙයි සැමියාගට සුවසේ මෙහෙකොවැ සිත්සේ වෙසෙයි. මේ බලා එ ගම ලදරු බමුණෝ තම තමන්ගේ අඹුවන්ට රැහැණි වැ කියන්නාහු වෘද්ධ බමුණාට මෙවැනි සන්‍රියක් ඌ සිත් සේ මෙහෙ කොවැ වෙසෙයි. තෙපි අපට කවර මෙහෙකරාදැ" යි කියා තමන් තමන්ගේ අඹුවන්ට බොහෝ ගහට කෙරෙති.

එක් දවසක් අමිත්තතාපනා නම් බැමිණිය තොට දී දැකැ එගම තෙසු බැමිණියෝ කියන්නාහු "පවුකිළිය! තෝ ද දත් හුනු තර මහල්ලකුට මෙහෙ කෙරේදැ" යි මේ කඩදත් මහල්ලාට තී පාවාදුන් තිගේ දෙමවුපියෝ තිට සතුරෝ වන්හ. තෝ උන්ට අප්‍රිය යෙ යි වන්නී තෝ පින් තොං කළ තැනැත්තියක් වන්නෙහි, තෝ ගිය ජාතිවලහි කවුඩුවන්ට පිඬු දුන් කල තී ලැ බත් කැයේ මහළු කවුඩුයෙක් වත.

එසේ හෙයින් තී මෙ තර මහල්ලාට අඹු වූයේ ය යෙහෙළා මෙසේ වූ ජර හම් මහල්ලා හා එක් වැ පඤ්චකාම විෂයෙහි කවර නම් ඇල්මෙක් ද? ඌ කඩදත් දල්වා ගෙණැ සෙන වේලෙහි තිට කවර නම් සමාධියෙක් ද? කිඹුල් පිටක් සේ කොරසැඩි වූ ඌගේ ශරීරයේ ගැමී කවර අස්වසෙක් ද? "සොඳුර! තිගේ මොළොක් වූ ශරීර මිරිකා ඒ බමුණු කතවටුවාට මෙහෙ කොවැ දුක් නෙ ගෙණැ තී සේ වූ අභිරූප වූ ලදරු සැමියෙකු සොයා ගනුව" යි කිහ.

එසේ තමහට පරිහව බහින්නා වූ ගැනුත් හා බලා හඬා වැලැපෑ මියුඬුරු හුරුලා තමා පැනව ගෙණැ ගිය කළඟ ගල් කැවෙක පැහැරී බිඳ පියා අත පෙරවා ගෙණැ බමුණු මහල්ලාට තතනමින් දත්කමින් සපා කොද බෙණෙමින් ගෙට ගොස් "බමුණු මාල්ලා තා සේ වූ කෙලතොල්ලන් කෙරෙහි හුන්නේ විපාක අද ලදිමි. යාපත් සරණක මා ආයේ ය. අද මේ ගම් සඟක්[1] දැරියෝ එක් වැ ගෙණැ මා හිස බොල් කෙල ඔහා සේ මට උන් නො කී පරිහවයක් නැත. තා කෙරෙහි හිඳැ මෙසේ වූ බස් අසන්නාට වඩා කර වැල් ලා ගෙණැ මියයාම යහපත, සිඟිරිකා[2] මිය යාම යහ පතැ" සි කිව.

ඒ අසා බමුණු මහලු තමා දත් වැහිර ගියත් අඹුසොඬි හෙයින් ම කි බසැට කම්පා වැ "සොඳුර! නෙපි රැහැණි නොවව. දර ත් මම ම ගෙණෙමි. දිය ත් මම් ම ගෙණෙමි. සෙසු කළ මනා යම් මෙහෙයක් ඇත. මම් ම කෙරෙමි. අද පවන් නෙපි මේ මෙහෙ නො කරව" සි කිය

බැමිණි ඒ අසා "සැබව සැමියන් අහිත් අන් මෙහෙගන්න කුලෙක මා උපන්නා නැත. එම්බල තව උපායක් කියමි. මහ යසස් ඇති ගුණෙන් සම්පන්න වූ වෙස්සන්තර නම් මහරජ ඉවසා දන් දෙයි. උන්ගේ වස්තු ගෙණැ අනාථයක් සුව විඳින්නේ ය. දැන් ඒ උත්තමයා වංකගිරි පර්වතයෙහි තපස් කෙරෙයි. තෝ ඔබ ගොස් මට මෙහෙකරණ වහළක් ගෙණෙයි නම් හිඳිමි. නැත මාගේ දෙමවුපියන්ගේ ගෙට ම නැගී ගොස් අනික් මාසේ ම ලදරු වූ දැස් දසුන් විසින් සම්පන්න වූ පුරුෂයකු කෙරේ හිඳිමි. තා බල බලා සිටියදී ඌ හා මා කෙළනා කල මාල්ල තා සිතට සුවයෙක් නැත්තේවේදැ"සි කිව.

එ බස් අසන්නා ම බමුණා ලය ඉපිල හික. ල පිරුණු ශොක යෙන් මහත් කොටැ මියුඬුරු හුරුලා කියන්නේ "සොඳුර! මම ශක්ති නැත්තෙමි වෘද්ධයෙමි වංකගිරි පර්වතය ඉතා දුරු ය. නො යාහෙමි. ගෙයි කළමනා මෙහෙ මම් ම කෙරෙමි. නෙපි ඒට අසමාධි නො වව"සි කියා කී ය.

---

1. සුඟක්. 2 සරිභිකා.

ඒ අසා බැමිණි කියන්නී "තොප සඬ්ගාමභූමියට තෝ වැද මී පැරැදි එකකු වැන්නෙහි ය. ජඩ වූ නඹවිටිමැලි ය, මට කන්න ලවු නො පිරිවා ගොස් රජ්ජුරුවන් අතින් කෙල්ලන්-කොල්ලන් ගෙණෙ"යි කියා බමුණා වෙරමස්[1] කයි. උෂ හින්ද සිටිය නොදී ඇත් මැත් ගැසෙමින් හවමින්[2] වෙසෙයි.

බමුණු අඹුව කරණ ගහවයෙන් ඇ කෙරෙහි කළ හයින් "යහපත ගොස් වහල් ගෙණෙමි සි ගිවිස වලින් දරු ගෙය පුරාලා, දිය ඇදූ වලන් පුරාලා, ගෙය සිසාරා වැටකොට, ඇට බත් බුලත් තබලා, ගමනට සැරහී සිටැ අඹුව තුන්වටෙක සිසාරා පැදකුණු කොටැ වැඳා, පසුබැස සතර තැනෙක බැස හෙ වැ වැඳා, ඇ කෙරෙහි කළ හයින් හැකිළ හැකිළ සිපගෙණැ නිකට ගෙණැ ඇට කියන්නේ

"සොඳුර! මම ලස් තෝ වම එමි. තෙපි බියපත් නොව" යි සමුගෙණැ වහන්සඟළක් පයලා, කුඩමහල්ලක් අතින් ගෙණැ, කෙණ්ඩියෙකින් පැන් හා මඟට ගත් උපකරණ පයිය කරට නඟා ගෙණැ, අඹුදරු කර පෙරළී සිටැ බල බලා වදිමින් වංකගිරි පර්වතයට යන මගට ගොස් මගදී සිතා පියා "සිවිරටට වැදූ නො දිටිමි නම් පසුව වංකගිරි පර්වතයට යෙමි" කියා සිවිරට ගොස් වැදූ "වෙස්සන්තරයෝ කොයි දැ"යි විමසේ.

නගරවාසී ඒ අසා කිපී "තව දන් ගැන්මෙහි තෝ නවතුදැ"යි අපගේ සවාමීන් රවින් යවන පරිද්දෙන් කළුව. තව ද කුමට පිළිවිස්වාදැ යි කැටපහණ ගෙණැ ලුහුබැඳගත්හ බමුණු වැටිහෙව මින් පිරිහෙමින් තොල් බොල් සිඳැගෙණැ දනඋතු වැලම්ටි ලොළාගෙණැ දිවන්නේ උතුරුදිග බලා ම දිවගති. ඔහු මඟ තෝ හඳුන රුදු දේවතාවෝ බෝසතුන්ගේ දානපාරමිතාව පුරණු සඳහා වංකගිරි පර්වතයට මඟ පැහ.

බමුණු ක්‍රමයෙන් වනාන්තරයට ගොස් භිරමුදුන් වේලෙහි වෙතියපුත්‍ර නම් සේනාපතිහු සිටි රුකවලට ගියේ. ඒ සේනාපතිහුගේ දීනබල්ලෝ බමුණා දැකැ සිසාරා ගත්හ. බමුණු හඬ ඇති වැ මහත් කොටැ හඬා සඟලා පියා තජිණාපයිය ද, කුඩය ද

1. වෙරෙල්ලෙකයි. 2. ගැසෙමි හවමින්.

සැරයටිය ද, කෙණ්ඩිය ද, වහන් පතුල් ද හෙළා පියා හිසකේ උදුරා දිවගෙණ ගොස් ගසට පැනැ නැඟී ගස්පිට හිඳ හඬන්නේ මෙසේ කියා හඬයි.

"පඤ්චමහා ගඞ්ගාවන්ට මහාසාගරය බදු වූ, වැසිලිහිණියන්ට මහාමේඝයක් බදු වූ, පිපාසිතයන්ට මහා ගඟක් බදු වූ, රෝගීන්ට දිවබෙහෙදක් බදු වූ, ඝන වූ අඳුර පතරට ප්‍රදීපයක් බදු වූ, ශ්‍රාවකයන්ට කප්රුකක් බදු වූ, සිතූ සිතූ දෙයක් දෙන චින්තා මාණික්‍යයක් බදු වූ, මගින්ට සිහිල් සෙවනක් බදු වූ, හැම සත්ත්වයන්ට පින් පැන් මඩුවක් බදු වූ, ඉල් වූ දෙයක් නැනැයි නො කියන්නා වූ මහත් පඤ්චපදුමයෙන් සැදුනු පොකුණක් බඳු වූ සියලු සතුන්ට සම සිත් වූ **වෙස්සන්තර** රජ්ජුරුවෝ කොයිදැ"යි හඬලී ය.

වෙතියපුත්‍ර නම් සෙනාපති බමුණාගේ හඬ අසා අවුත් බමුණා දැක කියන්නේ — "තමන්ගේ රජය හැරපියා මේ හිමවත තපසට නැඟි ආ රජ්ජුරුවන් සොයා ආයේ බිසවුන්වත් දරුවන් නා කරා හේ ය"යි කිපී පිටිතොල දනින් කමින් මිටි සරහමින් වටපිට බලමින් අවුත් "දුෂ්ට වූ බමුණා දැන් දැන් නා දිවි ගණිමි"යි දුන්න හා විෂ පෙවූ කනුගීය තුඩයෙහි ලා ගෙණැ "සොර! දැන් දැන් තාගේ හෘදමාංශය ලේ වම්ව වම්වා කඩා ගෙණැ පළුසකුණයන්ට බිලිදෙමි.

දුෂ්ට බමුණ තාගේ බඩවැල් හැරගෙණ තුන්මංසුල පනක් සේ සිසාරා තාගේ පඤ්චමධුර මාංශයෙන් හා තාගේ ශ්‍රීවයේ ලෙහෙයෙන් දෙවියන්ට බිලි දෙමි. සල්ව සල්වා දැන් නා ඇඟමස් කප කපා තෙල බල්ලන්ට දී කවමි. වහා තෙලඟසින් බැසැ පිය"යි කිය

බමුණු මරණ භයින් භයපත් වූයේ අනික් වදනා නැනක් නැත්තේ මහඟඬින් අඩා "බොරුවක් කියා මා මූ අතින් ගැලවුන මැනවැ"යි සිතා කියන්නේ "මා එසේ මැරිය නොහැක්ක. මම දූනයෙකිමි. මද වරදකුත් නැත්තෙමි. මා දිවි නො ගන්ව. මද ඇසිල්ලක් මාගේ බස අසව

"සඳමහ රජ්ජුරුවන්, හා සිවිරට වාසින් සැදහැයෙන් වෙස්සන්තර රජ්ජුරුවන් ගෙණ මැතවැ" යි කී හෙයින් එක්වන් බිසවුන් වලප්නා හෙයින් මවුපිය දෙදෙනාගේ ශොක බලවතින් වංකගිරි පර්වතයට ගොස් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ සවරූප දන්නා සඳහා යව යි නගරවාසින් හා රජ්ජුරුවන් හා කී හෙයින් ආම්" කී ය.

ඒ අසා වැදිපුත් සතුටු වැ යමයන් සේ වටලාගත් දිනබල්ලන් ගසා බැඳ ජූජක තම් බමුණා ගසින් බාගෙණ පල වූ මස් හා අල මී හා මියුරු ආහාර කවා ගමන් ශ්‍රමදහ නිවා සතප්පා ගෙණ බමුණා නික්මුණු කල මඟට මී ලබුවක් පුරා දී, මස්පිඬියක් ද දී, පසු ගමන් කොටැ දකුණත ඔසවා බෝසතාණන් වසන දසාවට මඟ කියන්නේ "බමුණ! තෙල ගිය වලාකඩක් සේ දුරින් පෙනෙන ගඳමහන් පවුව ය. ඒ ගල පසෙකැ කිහිරි කුඹුක් නුග ඇසතු කෙලින් ද ගිවුළු බෙලි අඹ දඹ බක්මී එල්කෙල් කටුඵරමිණිය නදුන් සදුන් සපු දුනුකේ නා පතා සලල අගරු දෙවිදුරු මේ ආදි මල් පල්ලෙන් සැදුනේ ය.

හැලි ගසා දිවවන මතහර ගං හෝ ආදියෙන් සැදුම් ලද්දේ ය. මල්පල්ලෙන් හැවසිගත් ලියකිදුරු කෙවිල්ලන්ට ගෙයක් සේ සිත්කලු වූ ගලතෙලෙන් රමණීය ය. ඒ ඒ වනයෙන් නොයෙක් ඵලාඵල කමින් ගඩා වැගිරෙන නොයෙක් සිහිල් දියෙන් නහමින් පැන් බොමින් ගියකල ඔද්දේ පොකුණක් පඤ්චපදුමයෙන් සැදුනේ ය. තෙළුම් පත් සිවැ වගුල මල්රෙහෙණු වැල්මී ඝකීරා සෙයින් කමින් ගොස් මඟ ලැඟැ රාක්ෂයන් විසින් ගහන වූ වනාන්තරයේ විපුල් පර්වතයේ අච්චුත තම් තපස්වීන් වසන පන්සලට වැදූ සැතැපී උන් අතින් මඟ පිළිවිස්වාගතැ" යි කියා සුලුවනය විසතර කොටැ මඟ කියා නැවැත්ත.

බමුණු ඌ කී පරිද්දෙන් ම ගොස් විපුල තම් පර්වතය සමීප යෙහි පන්සලට ගොස් වැඳැ තපස්වීන් දැකැ සුවදුක් පිළිවිස්සේ කරුණු කිම ද? මැසි මදුරුවන් විසින් දුක් නැද් ද? දිවියන්-වලසුන්-සිංහ-ව්‍යාඝ්‍රයන් විසින් උපද්‍රව නැද්ද? ඵලාඵල ලැබේදැ"යි විවාරා සිවියේ "තපස්වී කියන්නාහු තා කී තාක් දෙයින් දුක් නැත. ඵලාඵල ලැබෙමි" යි කියා මොහුගේ ගමන් ශ්‍රමදහ නිවා ඵලාඵල කවා සැතපී හුන්කල කියන්නාහු "බමුණු වනාන්තරයට කුමක් සඳහා අයිදැ" යි විවාළාහ. බමුණු කියන්නේ "වෙස්සන්තර රජ්ජුරුවන් කරා ආම්" යි කී ය.

තපස්වී කියන්නාහු "රාජ්‍යය හැරපියා තපස්කොටැ වල අවුත් හුන්නන් කරා වසනු ඇත්තෙන් අසිදැ" යි කිහ. බමුණු කියන්නේ— "නාපසයෙනි! වසනු සඳහා ආයෙමි නොවෙමි. ඒ වෙසතුරු රජුන් බාලකල අතුරු කරවිමි. දැන් මා නොදක්නේ සත්මස ය. බලාපියන සඳහා ආමි" යි කිය.

මෙසේ කියා එහි ලැගැ පහන් වූ කල තපස්වී තමන් බොරු නොදන්නෙන් "මූ කී බස් සැබෑ දෝහෝ" යි සිතා මහපාතාහු "බමුණ! මෙසේ ගියකල දකුණත හසරින් ගොස් වංකගිරි පර්වතය ආසන්නයට ගිය කල චතුරශ්‍ර පොකුණෙක් ඇත. ඒ විල පස්පියුමෙන් සැදුනේ ය. ඒ පොකුණ සිසාරා අඹ දෙඹ කිත කුඹුකින් සජ්ජිත ය. නිල් මහමේ කල නැගූ වලාකඩක් බබලන්නා වැන්න. එතැන සුළඟින් පැහැරැ කඳුබැඳී තිබෙන මල් මුවරද ය. මල්කෙසුරු කඩා පුරා කා මත්වැ කුල්නා කෙවිල්ලන් ඇති ඒ ඒ පර්වත ශිඛර යෙහි ලිය ගී නහා නවත ලියකිදුරන් ඇති. ඒ ඒ දෙලන ලිය මඩුයෙහි රිසි සේ කෙලනා විද්‍යාධරයෝ ය.

බමුණ! රන්ගිරිකුළු මුදුනෙහි මුළු බැඳැ නවත මොනර කැන. මුව බැඳි යන ඇත්කුල ය. තොල්ලෙන් තොලු තබා ඔවුනොවුන් සතඟ සතහා යන නොයෙක් මිවරල ය. බමුණ! ඒ ඒ දෙලන විලිඤවැ තිබෙන ඇත්දළ පමණ පල ඇති කේල් වනය. මහදිය කළ සා පල ඇති කොස් වනය ය. විලිඤවැ ගී වැගිරෙන මිඅඹ කැන ය පුවක්කද සා මහත් දඬු ඇති උක් වනය ය. බමුණ! තෝ මේ වනයට වැදූ තා කැමැති ඵලාඵල අනුභව කෙරෙමින් සැතපෙමින් වංකගිරි පර්වතයට ගොස් පන්සලට වැදූ වෙස්සන්තර රජ්ජුරුවන් දකි" යි කිහ.

බමුණු ඒ අසා සතුටු වැ තුන්විටක් කොටැ ඍෂිත් වැඳැ සමුගෙණැ කී සලකුණෙන් ගොස් සතරැස් පොකුණ ද වනය ද දැකැ ඒ වනයෙහි එක් ගිරිගුහායක් දැකැ බමුණු සිතන්නේ මේ වේලෙහි වෙසතුරු රජ්ජුරුවන් හුන් තැනට ගියෙමි නම් වනමුල් වනඵලා ගෙණැ හැරැ වේලාවට වළඳති. සත්‍රීහු නම් දනට වාරණයහ. දනට බාධා කරන්නහුය යි සිතා මේ ගුහායෙහි අද ලැගැ ගෙණැ සෙට උදැසන මද්‍රී දෙවින් ඵලාඵල සොයා දී ගොස් දරුවන් දන් ගණිමි" යි සිතා ඒ ගුහායේ ලැගැ ගත.

එ දවස් මද්‍රී දේවීන් පාන්වන වේලෙහි නපුරු සිහිනයක් දැකැ භයානක වැ හිඳැ සිතන්නෝ "මේ මුළු පොළොව වෙසඟනන්ගේ රජ්ජුරුවන් සමාන සිරිත දන්නා වූ නැතැ" යි සිතා බොධිසත්ත්ව යන්ගේ පන්සල් මළුයෙහි පියවරසන් කොටැ සිටි කල්හි බොධි සත්ත්වයෝ "දෙරැ සිටියේ කවුරුදැ" යි විචාළහ. "වහන්ස! මම ය්‍යැ" යි කිහ.

"දේවිනි! තොගෙ වේලෙහි මා කරා නොඑන්නට වරලද්දේ මේ දැ" යි කිහ. දේවී කියන්නාහු "සවාමීනි! අන්‍යත්‍ර සිතෙකින් ආයෙම් නොවෙමි. මා දුටු සිරිත කියන්නට ආමි" යි කිහ. බෝසතා නෝ "කියව" යි වදාළහ. මද්‍රී දේවී කියන්නාහු "සවාමීනි! 'එක් කලු මිනිසෙක් එක් රතයක් හැදුගෙණැ, රතක් කරලා ගෙණැ, දෙකණ රත්මල් පැළැඳැ කඩුවක් හිසැ සිසාරමින් මා කරා අවුත් මට නොයෙක් තුඩුවැඩි බැණැ පියා මා හිසැ ජටාව අල්වා ගෙණැ ඇදැ බිමැ ගෙලා ගෙණැ මා හඬව හඬවා මාගේ දැස් උදුරා ගත්තව. සවාමීනි! මාගේ දැත ත් කපාගෙණැ හදවත ත් උදුරා ගෙණැ ලේ පහර පහරා හැරගෙණැ ගියේ නමැ" යි කිහ.

බෝසතාණෝ සීතය අසා සිතන්නාහු "මාගේ සත්මසක් පිරිහි ගිය දානපාරමිතාවෝ පරිපූර්ණ වෙති" යි සතුටු වැ "දරුවන් දෙන්නා ගෙණ යන්නට වනයට බමුණෙක් ආවනැ" යි සිතා බිසවුන්ට කියන්නාහු "පෙර තොප මියුරු ආහාර කා සුව යහන්හි හෝනා වූ තොපට දැන් වනඵලාඵල වළඳ සුව යහන් නොලදින් දඬුමැස්සෙහි හෝනෙන් පැණෙන සිහිනය" යි කියා සංහිදුවා බැණැ යවූදැ ය.

පාන් වූ කල මද්‍රී දේවී මළු හැමදැ දැහැටි පැන් තබා පන්සල් හැමදැ මල්පුදා දරුවන් දෙදෙනා කැඳවා මූනින් මූන තබා සිඹැ පියා "දරුයෙනි! මා රැ දුටු සිරිත නපුර. තලබිඳක් සා ද යහපතෙක් නැත. තොප පියානන් හැරැ බැහැරට නොයව. කෙළිනා තැන කියපත්වව"යි දරුවන්ට ඔවා දී බෝසතානන් කරා ගොස් වැඳැ "සවාමීනි! මෙවල මට නැයෝ නම් නුඹ වහන්සේ හා මාගේ දරුවෝ දෙකිහින්නෝ ම ය.

සවාමීනි! මම වලව පලවැල සොයා යෙමි. මා එනතෙක් නුඹගේ දරුවන් දෙදෙනා කෙරෙහි කියපත් වුව මැනව. නුඹ වහන්සේ ත් සිහි ඇති වැ වැඩහුන මැනව. සවාමීනි! මා යන බව මුත් මාගෙ ලය නුඹ වහන්සේ අත බවය යි දැන වදාළ

මැනවැ යි කියා දරුවන් පාවා දී මල්කරුව හා පෙව්ටිය හා හැරගෙණ වනමුල් වනඵල සොයා යන්නී ගඩමින් වලපමින් "මෙවල දෙවියනි! මා දරුවන් කෙරෙහි බියපත්වව"සි මා කම් කිළියගේ එකලා කම් බලව"සි දෙවියන්ට යදිමින් ගියහ.

බෝධිසත්ත්වයෝ බිසවුන් වලට යැදී සක්මන්මළු කෙළවර බමුණා එන පෙරමඟ බල බලා වැඩහුන්හ. දරු දෙදෙනා බෝධිසත්ත්වයන් පෙරමඟ වැලි කෙළෑ කෙළෑ හුන්නාහ. ඉක්බිති බමුණු මද්‍රිදෙවින් වනමුල් වනඵලයට මේ යන වේලා ය. උන් වලා සිටී නො එනතුරු දරුවන් ගොස් ඉල්වා ගෙණ එම් සිතා පන්සලට ගියේ.

බෝධිසත්ත්වයෝ ද එන්නා වූ බමුණා දුරදී දැකැ "සත්මසක් අප නුදුන් දන පාරමිතාවන් ඇති කරවන්නට එන කල්‍යාණ මිත්‍රයෙක සුළුවනය, තිස්යොදනක් මහවනය, තිස්යොදනක් තැන්හි නිකම් නො එයි. දරුවන් ඉල්වා එනවා වනැ"සි සතුටු වූ නියා ද දරුවන් කෙරේ කළ ප්‍රේමයට වඩා සිවිලේය.

බෝසතාණෝ **ජාලිය** කුමාරයන් කැඳවා කියන්නාහු "පෙර මගට ගොස් බමුණා අත පිරිකර ගෙණැ කැඳවා ගෙණැ එව" සි යැවූ ය **ජාලිය කුමාරයෝ** සතුටු වැ ගොස් පිරිකරට අත දික් කළහ. බමුණු සිතන්නේ "**වෙස්සන්තර** රජ්ජුරුවන් මට දන් දෙන දරුවෝය" සි සිතා දැන් මා මොළොක් වුවහොත් මට මෙහෙ නො කෙරෙති සිතා දැන් ම මුන්ට භය ගන්වා උරණවුව මැනවැ"සි සිතා කුමාරයන්ට උරණ වීය.

ජාලිය කුමාරයෝ භය ගෙණැ පලා අවුත් බෝධිසත්ත්වයන් කරා වන්හ. උන් පසුපස්සේ බමුණු ද අවුත් බෝධිසත්ත්වයන් දැකැ සතුති කොටැ සිටැ කියන්නේ "ශ්‍රීමන්තය! තොප ශරීරයට පීඩා කරණු නැද්ද? මැසි මදුරුවන් විසින් සිංහ ව්‍යාඝ්‍රයන් විසින් යක්ෂ ප්‍රෙතයන් විසින් දුක් නැද්ද? වනමුල් වනඵල ලැබේද් ද? තපසට අන්තරාය නැද්ද? දනට බාධා නැද්දැ"සි කීහ.

ඒ අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු "තා කී මෙතෙක් දෙයින් දුක් නැත. තපසට අන්තරාය නැත. දනට බාධා නැත. පින්වත් තාගේ ගමන් ශ්‍රමදැහ නිවා තිලින් අඹ දඹ කෙහෙල් කටුඵරමිණිය මී සේ රසවැන්න. ඒ ඵලාඵල කා පැන්

බී සැතපී හිඳ" යි වදළහ. බමුණු ද එසේයින් ම කා බී සැතපී හුන්කල බෝසතාණන් කියන්නාහු "තා ආ කාරිය කිමෙක්ද"යි පුළුවුන්හ.

බමුණු කියන්නේ "මහාපුරුෂය! පඤ්චමහාගඞ්ගාව පැන් යම් කෙණෙක් බොද්ද? ඒ පැන් උනුනොවන සෙයින් සියලු යාවක යන්ගේ සිත් මනදෙළ පුරණ උත්තමයානෙනි! අනික් වැඩි කට යුත්තකට ආයෙම් නො වෙමි. තොපගේ දරුවන් දෙන්නා මතු ඉල්වා ආම්"යි කීය.

මේ කපැ බුදුවන්නා වූ මුළුලොවට වැඩක් ම සිතන්නාහු ඒ මහතානන් වහන්සේ බමුණා කී බස් අසා දෙදරුවන් මුහුණු හා බමුණු මුහුණු හා බලා පියා පලවැලට ගිය බිසවුන් සිහිකොවැ ලා සිතා උපන් දළ සෝගිනි බමුණාට දන් දෙමි යන සිත් නැමැති ජලධාරාභිෂෙකයෙන් නිවා වදරා දන් දීමෙහි ම එක්සිත් වූ සේයෙක.

එසේ නො සිතුවහොත් බෝමැඩ පිටදී වජ්‍රාසනයෙහි වැඩ හිඳ මරසෙනඟ ප්‍රලයකොවැ කෙසේ නම් බුදුවන සෙයෙක්ද? මෙසසර අවුලෙහි බැඳුනු සත්ත්වයෝ කා මූත බලද්ද? මෙම සත්ත්වයා නිවන්පුරයට ගෙණැ යන්නෝ කවුරුද? එදා දරුවන් දීමෙහි පසුබටහොත් බුදු වැ ඒ මහතානන් කරා මෙහෙයූ **නාලාගිරි** නම් පරුෂ ඇත් ශ්‍රීපාදය කුමට වැදගෙණැ හොවි ද?

තව ද ඝොර වූ මරහු වැනි වූ **ආලවක** නම් යක්ෂයා මන්බිඳි කුමට ශ්‍රීපා ද වඳිද? එදා දන්දීමෙහි මසුරු වූ මිනීමරු වූ **අඟුලි මාලයා** දැන් තමන් සස්නෙහි කුමට කුලඟැති වේ ද? එදා දරුවන් නො දෙමි සිතුව දැන් **දෙවදත්තයා** හිසට පෙරලූ ගල් හෙන නො දී පොළොවින් ගල් දෙකක් නැගී කුමට පිළිගණිී ද?

තව ත් ඔහමෙර සත්දරණ පවෙකින් වෙළාගෙණැ තමන් වහන්සේට කිපී විෂතේජසින් දිලිහෙන්නා වූ **නාළාගිරි උපනන්දයා** දැන් කෙසේ නම් හික්මෙවන සේක් ද? එදා දරුවන්ට සිතෙහැති වැ බමුණාට දන් නො දෙමි කිව හෝ බ්‍රහ්මතේජසින් දිලිහෙන්නා වූ **සහම්පති මහාබ්‍රහ්මයා** දැන් ඒ සවාමිදරුවන් ගේ සිරසට තමා ගේ ඛවලච්ඡත්‍රය ධරා කුමට සරස් මෙහෙතැන සිටී ද? එදා දරුවන් නො දෙමි සි ඒ දරුණු බමුණා ම ගැවුවහොත් දෙවුලොව දෙව්යන්ට අගපති වූ **ශක්‍රදෙවෙන්ද්‍රයා** දැන් තමාගේ එක්සිය විසිරියන් ජයතුරා සක්රුවන දැන් තමා තුඩ පොපියන තෙක් කුමකට පිඹිද ?

එදු ඒ ලඳබොලඳ දරුවන් නො දෙම් සිතුව නම් දැන් පස්වා දහසක් මුළුල්ලෙහි නිවන් පුරයෙහි දොර හැරැ තබා තමන් පිරිනිවිසඳ ශ්‍රී ශරීරයෙන් දැහිය ඇවි ද වැළඳූ පාත්‍රය ද පිපි වහල් වූ ශ්‍රීබොධිය ද තමන් වදළ දහම ද වැඳැ පිදූ සියලු මිනිස් දෙවි බඹුන් කෙසේ නම් නිවන් පිහිටුවන සේක් ද?

මෙසේ ඒ බමුණා දරුවන් ඉල්වා ආමි කී බස බෝසතාණෝ තමන්ට රාජ්‍යයෙන් වොටුනු පළඳුව සි කී බසක් සෙයින් සතුටු වැ කියන්නාහු "බමුණ! තෝ මට පරලෝ අමුත්තෙහි නා සේ මට මිත්‍රයෝ නැත. සෙසු යාචකයෝ ඉල්වත් නම් ඇතකු හෝ ඉල්වති. අසකු හෝ ඉල්වති. රන්රුවන් හෝ ඉල්වති මෙවැනි මහවලව අවුත් අනිකක් නො ඉල්වා අප දරුවන් ඉල් වූ බව ඉතා ඝහපත.

ඒට මරුවැලක් සිහිනෙනුත් නො කියම්හ. දරුවන් දෙන්නා තව සමසිතින් ම පාවා දෙම්හ. බල එකක් කියම්. බමුණ! මේ ලඳබොලඳ කුමාරයෝ කිසි දුකක් නො දිටු විරූ ය. දැන් ම දරුවන් දෙබිහින්නන් ගෙණැ ගියෙම් නම් මේ දරු බිලිදු සා විඩාවෙති. එසේ හෙයින් බිසවුන් වල ගොසින් අවුදින් දරුවන් දෙදෙනා නහවා මල් පළඳවා වතමුල් වතඵලා කවා දරුවන් ඇඳ වැළඳැ සිපගෙණැ ලඳබොලඳ වූ සුරතල් බස් අස අසා ඇ ල නිවී සැනහුණු කල අද රැ ලැගැ පහන් වූ කල දරුවන් දෙදෙනා ගෙණ යව.

තව ද මේ දරුවන් ගේ එකලා මැනියෝ දරුවන් අපට පාවා දීලා වලට ගියේ ඝ. ඵලාඵල ගෙණැ අවුත් දරුවන් දෙදෙනා නුදුටුවෝ නම් උන් ලය පැලියෙති සිතම්. මාගේ ඉෂ්ට මිත්‍ර වූ බමුණ! තව ගැනිවෙන ම දරුවන් දෙදෙනා ඉතා ම සිවුමැලි රජකුමරුවෝ ඝ. ගැනි මෙහෙයෙහි නො හසළ විරූ ඝ. තදින් මොළොකින් මෙහෙ උගන්වා ගෙණැ ගැනි මෙහෙකම් ගෙණැ අද මෙවෙලා හැම්මේ සි වදුළහ.

එබස් ඇසූ බමුණු තෙම "රජ්ජුරුවෙනි! සත්‍රිහු නම් දැනයට බාධාකරණ සුල්ලඟ සුභ කම්නන නො දනිති. මම මෙහි ලඟින්ට නො පොහොසත්මි. දරුවන් දෙව් නම් මට කල් නො යවා දෙව. නො දෙව් නම් මම ආසේ නැගීයෙම්. තෙල තන්වැසිකම් තෙපි කෙසේ උගතුදැ"යි බිණී ය.

බෝසතාතෝ එබස් අසා "බමුණාට දරුවන් දෙමි කියාලා තැවත දරුවන් නො දෙමි කියා බොරුවක් නො කියමි. දනව පසු බස්නා එකෙකින් නො වෙමි. බිසවුන් එනතුරු නොනම්මෙකි[1] නම් මේ සිවුමැලි දරුවන් මහ තලව තලවා සතපමින් අස්වස මින් කැඳවා ගෙණැ දරුවන්ගේ මුතුන් මිත්තන්ගේ රටට ගෙණැ ගොස් සඳමහ රජාතන්ට මෙපවත් කී කල ම පියානන් වහන්සේ අප කෙරේ කළ ස්නෙහයෙන් මුනුබුරන් දුටු සතුටෙන් ඔවුන්ගේ මිහිරි බස් අසමින් නට කෙළි කොල්ලන් හා බොහෝ වසතුව දෙනි" යි කිහ.

බමුණු එබස් අසා හිස සලමින් යාපත මා දිවිගන්නට සිතූ නියාය – හිමි තෙපි මේ උපාය කොයින් උගතු ද? මුනුබුරන් දුටු සඳමහ රජානෝ මට කියවියක් කියති. බමුණ! තෝ අප දරුවන් ඇනිකොටැ ගෙණෙයි දැ යි කියමින් මා කන් නාසා කපා මා දිවි ගණිති වහල් තබා දිවි රැකගැනුම් යහපත. දරුවන් දෙව් නම් දෙව. නො දෙව් නම් නො දෙව. තෙල බස් අප රකුත්හොත් නො කියව" යි කියා

දරුවෝ දෙදෙන ද බමුණා කියන බස් ද පිය රජුන් හිඳ ගැනි කොටැ දෙමි කියන බස් ද අසමින් හයපත් වැ සිටගත නො හී දිවියා දැක මරණ භයින් දිවන මුව පැටවුන් දෙන්නකු සේ ඉහිලෙමින් බමුණා ලුහුබැඳැ එනි යි පසු බලමින් දිවන්නාහු පන් සල් පිටිපස්සට වැදැ භයින් එතන ද සිටගත නො හී වන ලැහැ බයකට වැදැ සැඟවුනාහ.

බැලූ බැලූ දිසාවෙන් බමුණා දිවන්නා සේ පැනෙන්නේ එතන ද භයින් සිටගත නො හී "අනේ අනේ නඟඩ කුමක් කරමෝදැ" යි කියමින් වෙවුලමින් හඬාගෙණැ දිවන්නාහු සතරැස් පොකුණට වැදැ "අපි සිටින තැන් ඔටුනොවුන් නො පාම්භ යි දෙන්නා බැණැ ගෙණැ උනුන් අත එල්බ ගෙණැ පොකුනේ කරපමණක් දියට බැසැ නෙලුම්පත් හිසලා ගෙණැ සැඟැවිගෙණැ කන්දී සොල්මන් අස අසා අද අම්මඬින් දුටු සීත තපුරු යි කිවි බැහැරට නො යන් නට කිවූ ය. බියපත්ව යි අපපඬිට බලන්නට පාවා දී ගියෝ ය අම්මඬි අප හා සිඹි කරව. අම්මඬි අප වැලි කෙළිනි සිතත්දෝ හෝ මෙවැනි දුක් වූ බව නො දනිද්දෝ හෝ අප හා පුරුදු වන දෙවි යෙනි! තෙපි වහා දිවැ ගොස් අප දෙදෙනා රැකැ අම්මඬිට කියා වහා හැරැගෙණැ එව. අපි උන් දැකැ පියා පා පිට හී හඬාපියා උන් කීවාක් කරම්හ" යි.

1. නොනැම්මමයි.

මෙසේ බැඟැපත් හඬින් හඬ හඬා වෙව්ලමින් කර පමණක් දියෙහි සැඟ වී සිටියහ. බොධිසත්ත්වයෝ දරුවන් සැඟවුහු බව නො දැනැ බමුණාට දන් දෙන්නටය යි කැඳ වූහ. දරුවන් නො බිඳු හෙයින් බමුණු සිටැ කියන්නේ "වෙස්සන්තර යෙනි! තොප සේ වූ බොරුවෝ මේ මුළුරට නැත. තෙපි හිහි ලාලා දරුවන් සඟවා පියා නො දත් වැනි වැ හිඳැ දරුවන් කැඳවා ද? මෙසේ තන්වැසිකම් දන් දෙන තොප සේ වූ කෙණෙකුන් නො දුටු විරි මි" යි කියා බිණී ය.

ඉක්බිති බොධිසත්ත්වයෝ "බොරු කියහ" යන බසට ලජ්ජා වැ හිඳැ කියන්නා බමුණ මා දන්සොඬ හෙයින් හා මැනියන් ඊ නැති වන්නා තාගේ රළුකම් සිතා භයපත් වැ පැලවන්හ. නෝ මඳක් හැල්මෙව" යි කියමින් නැඟී සිටැ.

පන්සල් පිටිපස්සට ගොස් වල් ලැහැබට වැදූ එහි නො දැකැ දරුවන්ගේ පියෙන් පියෙන් ගොසින් පොකුණට ගිය බව දැකැ මෙකප බුදුවන, මුළු ලොවට ශාන්ති එළවන, ඒ මහතාහෝ ලය වහවා ගෙණැ හඬගහන්නා වූ "මපුතුයෙනි! **ජාලිය කුමාරයෙනි!** හඬහාලූහ.

බුදුවන ජාතියෙහි **රහල්කුමාර** වන මහ පිණැති වූ ඒ රාජ කුමාරතෙම පියාහන් හඬ ගැ එක හඬ අසමින් බමුණු මා දිවි ගනුව යි මා ගැති කෙරෙව යි මපියාහන් වහන්සේ ලූ හඬ අසා නො සිටිමි යි සිතා "එම් අපපඬැ යි කියමින් දෙ අතින් තෙළඹුපත් පිඟිරා ගෙණැ පොකුණෙන් නැඟී අවුදු පියාහන් දකුණුපය වැදූ ගෙණැ හෙවැ හඬන්නට වන්හ.

බොධිසත්ත්වයෝ පුතනුවන්ගේ හඬ අසා ල කම්පා වැ සිත් සංසිඳුවා ගෙණැ කියන්නාහු "පුත! තොපගේ නැඟණියෝ කොයි දූ" යි විවාළහ. **ජාලිය** කුමාරයෝ පළමුව නො කියම්හ යි දෙන්නා බැණහත් හෙයින් "පියාහන් වහන්ස! **මරණ** භයින් පලායන මෘග ජාතිහු උනුන්ව කියාලා පලදී ද? අපව ද වූ දූ එ බන්දූක් වැන්නැ" යි කිහ.

බොධිසත්ත්වයෝ ඒ අසා මාගේ "දියණියනි! **කෘෂ්ණාජිනා වෙනි!**" යි හඬහා ලූහ. මතු බුදු වූ කල තමන් සස්නෙහි **උපුල්වන් මහාථෙරිනිය** යි ප්‍රසිද්ධ වන ඒ මහා පිණැති දියණියෝ පියාහන්

හඬගැ හඬ අසා "බමුණා මා දිවි ගණිව යි මා මිඩිකරව යි මපියා නන් වහන්සේ ලූ හඬ අසා සිවිමිදූ යි හිස ලූ කෙළේ පත් හැරැ පියා ශ්‍රී දෙව්දුවක නැංගාක් මෙන් අවුදු බොධිසත්ත්වයන් වම්පස වැඳැ ගෙණැ හඬන්නට වන්හ.

දරුවන් දෙන්නා හඬා වගුළ කඳුළු බෝධිසත්ත්වයන්ගේ කෙළේ පෙති වැනි දෙපත්ලෙහි වැගිරෙයි. බෝසතාතන් දරුවන්ගේ දුක් බලා හඬන්නාවූ කඳුළු රන්පිවාටු වැනි දරුවන් පිට වැගිරෙයි. මෙසේ හඬා වැලපැ සිතන්නාහු මා හැඬූ හෙයින් බුදුබව නොසැදෙයි. දරුවන් දෙම් සිතා හඬමින් හොත් දෙදරුවන් වඬා ලෙහි හොවා ගෙණැ සිඹැ සතහා පියා "මනහර වූ මාගේ දරුවෙනි! මා දන්සොඬ බව නොදනු ද? මේ සංසාර තැමැති සාගරයට තොප පසුරක් කොවැ ගෙණැ ගොඩ දක්මි. මම ගොඩ දැකැ තොප ඇතුළු වූ දෙව්බඹු තා ගුරුළු මිනිසුන් ගොඩ දක්වමි"යි කියා දෙදෙනා වටකා මිළකොට ලා පන්සලට කැඳවා ගෙණැ අවුදු කෙණ්ඩිකාවෙන් බමුණා අත පැන් එව. සිත්කළු වූ මේ දරුවන් දන් දුන් පිනින් ලොව්තුරා සම්මා සම්බෝධියට පැමිණෙම්වා"යි කියා දරුවන් අත් බමුණා අත පිටැ තබා දන් දුන්හ.

මෙසේ දරුවන් දන් දෙත් ම ලඝ කකියවා හඬන පක්ෂපාත මිඩියක සේ මහපොළොව හඬන්නට වන. මේරු මන්දරාදී පර්වත යෝ ද දරුශොකයෙන් හඬා වැනෙන්නෝ සේ සැලෙන්නට වන්හ දෙවියෝ ද සතුටු වැ මල්වැසි වස්වමින් සාධුකාර දෙන්ට වන්හ. මෙසේ දරුවන් දන් ගෙණැ නික්මැ ගෙණයෙමින් සිවි බමුණු සෙලෙකින් බස්නේ පාකි ලැ මුනින් වැටිහිනි.

බමුණු නැගී නොසිටිනාතෙක් දරුවෝ දෙදෙන දිව ගෙණැ අවුත් පන්සලට වැද බෝධිසත්ත්වයන් දෙපත්ලෙහි වැටී හී හඬ හඬා කියන්නාහු "සවාමීනි! අම්මා නපුරු සීතයක් දැකැ නුඹ වහන්සේට අප පාවාදී එකලා වල් යන්නවුන් කී බස් නුඹ ද දෙස් නොවේද? අපපඬ! දැන් සිහිනැද්ද අප නුදුටු අම්මඬින් ලඝ කෙසේ නිවී සැනහේද? අම්මත් ආකල උන් වැදැ ගෙණැ හඬාපියා අපගේ දුක් පැ පියන තුරු අප රැකගන්න නුඹ හැරැ පියා කොයි ගොස් ගැලී යමෝද? මදක් හැල්මෙන් නකට දන්වමි.

මේ මේ අවලක්ෂණ බමුණාට අප නොදී අනිකක් හට දෙන්නේ. මුගේ සිසුකේ තඹවණ. ඇස් පිඟයි ය. වම්පරුසි ය බැම රැඳු ය, බුන් නාසා ය, කන්රොඹුරු ය, දත් බොලු ය, පිටින් වක ය, බඩින් වක ය, උස ය, බඩ මහත ය, පා බකල ය, නිය මිරිනි ය, මෙසේ අවලක්ෂණ වූ යකුට අප නො දෙන්නේ. නො වැළකම් දන් දෙන බැවින් මා දෙන්නේ මා නැඟණියෝ ඉතා සිවුමැල්ලෝ ය. තමන් මොළකැටි හෙයින් මිඩි මෙහෙ නොකොටැ හෙති. මා නහඟට වැඩිමාලු හෙයින් මම දුක් ගත හෙමි. උන් කරණ මෙහෙ ද මම ම කෙරෙමි. ඣාෂ්ණජිනාව මිඩි වූ කල සිව්මහ රාජවංශයට පරිභව ය. ම නහුන් රැකැ මා ඌට ගැතිකොටැ දුනමැනව. අමමණින්ට මා දුන්බව කියා ම නැඟණි ලා බැණ අස්වසා අමමණින් රැක පියන්නැ"යි කියා හැඬුහ.

බොධිසත්ත්වයෝ මෙතෙක් දෑ කියතුත් නො බැණ හුන්නාහ. ජාලිය කුමාරයෝ කියන්නාහු "පියාණන්වහන්ස! මා මෙතෙක් දෑ කියතුත් නොබැණත දෑ ය. නුඹවහන්සේගේ ලය ඟලෙකින් කෙළේ ද? යපතින් මැසුයේ ද? මේ කුමත නම් දැඩිකමෙක්දේ හෝ නුඹ මියෙන් නොබැණ හිඳිනට කවර වරදක් කෙළෙම්දැ"යි කියා මෙසේ හඬමින් සිටි තැනට නිෂ්කරුණා වූ එ බමුණුරොද්දු තමා හුණ තැනින් සෙමින් නැඟී සිටැ දෙදන වැලමිට වැලිපිසැ ලේහුණු තැන් බලමින් දෙවැලමිට තලළ ලේ පිසමින් පිරිතොල් කමින් වැලක් දනින් කඩා හිපලක් හැරැගෙණැ යමයකු සේ අවුදින් වැදූ ගියේ. දරුවෝ ඌ දැකැ භයපත් වැ වෙවුලන්ට වන්හ.

මෙසේ සිටි දරුවන් හසුකරණකල ජාලිය කුමාරයන් ගතදී නැඟණියෝ හසු නො වෙති. නැඟණියන් හසුවුව ජාලිය කුමාරයෝ හසු නො වෙති. හසුකොටැ ගතකොනී රැහණි වැ බෝධිසත්ත්වයන් බල බලා හින්දදී දෙබිහින්නන් අසුකොටැ ගෙණ වැලකින් බදිනේ කුමාරයන් දකුණත හා එ ලදකුමාරිය වමත හා දැත එක්කොට බැඳැ ගෙණැ ඉපලකින් මර මරා කර අල්වා දම්මින් යමපලකු සේ ගෙණැ යන්නට වන.

බැනන් පිට ගැසූ පහර නැඟණියෝ පිට ලවා ගණිති. නැඟණියන් පිටට හිපල ගැසුව බැනෝ තමන් පිට ලවා ගණිති. රාහු විසින් ගැලනලද නො නැවත යන හිර සඳ සෙයින් යෙමින් යෙමින් සිටැ පෙරළි පියානන් බලමින් පියුම් පෙති වැනි අත්සුගින් වදිමින් "අප පිටින් වැගිරෙණ ලෙහෙබලන්නේ අතබැඳි අලුව

බලන්නේ මුගෙන් කොබැණ හිඳින්නේ අපපඬ! මේ යකු අප කා මරා පියනතුරු ද? අම්මඬිත්ට අප වැඳ සමුගත්බව කියන්න. අප සුවපත් බව ද, නැවත දැක්මක් කොවනබව කියන්නැ"යි මෙසේ කියා හඬමින් ගෙමින් සිටියඳ බෝධිසත්ත්වයෝ දරුවන් දෙදෙනාගේ දුක් බලා ලය කකියවා,

"අනේ! බමුණකු ඉතා දැඩි නියා ය. මා ඇස් සමුගෙහි මෙසේ දැඩි වැ මරන්නෝ ඔබ්බෙහි කුමක් නම් කොකෙරේ ද? එකකල අප දෙදෙනා ඔරින් ආ දරුවෝ දැන් කඳු බැවිල් කටු බොරළුයේ කෙසේ නම් යේ දෝ හෝ සසින් විඩා වූ දරුවන් කවුරු නහවා කිරි පොවන් දෝ පතුල් ඉදිමුනු දරුවන් කෙසේ කවුරු සතපා වඩාගණින් දෝ හෝ සුළං අවුකා වෙවුලන දරුවන් කවුරු සතහා තලවා ගණින් දෝ මැණියන් නන මැදූ සැනපුණු දරුවෝ අද රෑ කොතැනක වැදූ හෙව නිදන් දෝ දරු සෙනහයෙන් මා පා පිටහී හඬා පෙරළෙන බිසවුන් කෙසේ නම් කියා අස්වසම් දෝ හෝ යි මෙසේ මහත් වූ ශොකයෙන් සිතන්නාහු බමුණා බැඳ හෙවා පියා දරුවන් ගෙණෙව මැනවැ" යි සිතා නැවත ඒ ක්ෂණයෙහි සිතන්නාහු මතා කොටැ දන් දී තපස් රකින්නාහු සිත් කලකිරුවත් ද?

"පෙර බුදුවන උත්තමයෝ ද පළමුකොටැ දසපෙරුම්-දස උප පෙරුම්-දසපරමත් පෙරුම් යි සමතිස් පෙරුම් පුරා පඤ්චමහා පරිත්‍යාග කොටැ බුදුවූහ. මම ද එසේ ම බුදුවෙමි සිතා මහත් වූ ප්‍රඥා උපයා මා සිතූ සේ ඉතා නපුර. බුදුබවට හේතු වූ පාරමිතා නැමැති සාගරය පිනා ගොඩ දක්නා සඳ සිහිල් පොකුණෙක. දියෙහි ගැලුණු සෙයින් මා සිත වෙන් වෙන් කෙරෙම්දැ යි ඒ සිත් දුරුකොටැ මුළුලොව සතෙකුට නො පළිවන් වූ මී නියා දරුවන් දන් දින්මි. ඒකාන්තයෙන් මේ දානය බුදුබවට හෙතු වේවා" යි සිත සිතා සතුටු වැ ගස් සෙවනක වැද හුන්හ.

දරුවෝ දෙදෙන යෙමින් සිටැ තමන් කෙළ ඇවිදි වෘක්ෂ ඡේවනලු බලා කෙළි වලන් බලා ගල්ගුහා බලා මැටියෙන් හැඟූ ඇතුන් අසුන් බලා රථගොන් පෙතැල්ලන් ගිරවුන් වන මෘග ගන් සතරැස් පොකුණු දැකැ කියන්නාහු "මනහර වූ මල් පිපෙන වෘක්ෂයෙනි! තොප හා පුරුදු වැ තොප මුල්නි වැලි කෙළ අදින් වියෝ වූ දෙබිහින්නමු.

තොපට වැඳැ සමුගණුම්හ. පැහැනුදුල වැලිතලායෙහි අප දියකෙළනා මතහර ගඟුල් හැල්ලෙනි! තොප අතින් සමුගෙණැ ගැනිවී මෙහෙයට යම්හ. මිහිර හඬන කුරවි කෙවිල්ලෙනි! අත් වල ගස ගසා අප - ඉදිරියෙහි නටා බස්නා ලියකින්නරාවෙනි! අප දෙන්නා අපගේ අම්මඬිත්තට වැඳැ සමුගත් බව කියව.

අනේ! වන දෙවියෙනි!! අප හා පුරුද්දෙනි!!! අම්මඬිත්ට අපගේ පතුල් ඉදිම තොා යාගෙන බව කියව. අප විදිනා සුව කියා අම්මඬිත් එතොත් මේ මඟ හොත් සේ ගඹා දිවන්නට කියව සි. මෙසේ හඬමින් වලප්මින් කැටි වැ කෙළනා වනමෘග යෙනි! කෙළිවල නිදි සතරැස් පොකුණෙහි අදින් තොප කෙරෙන් වියෝවූම්හ" යි කියා සමූ දෙමින් යෙමින් සිටිසඳ.

අකුරු බොරළු මිශ්‍ර වූ මඟ ගොස් දරුවන් මිරිකුණු සේ බලා මඟ දෙපාර්ශ්වයෙහි පිනිගත් වෘක්ෂ වලප්නා වැන්න. වන වෘක්ෂයෙහි බොහෝ බර වැ බඹර රවට පිපෙන මල්මුව විවෘත කොටැ මද්‍රිදේවිත්ට දරුවන් ගිය බැවි කියන්නා වැන්න. ඒ වෙනෙහි පක්ෂි මෘගයෝ දෙබිහින්නන් කෙරෙන් වියෝ වූ ශොක යෙන් මහඟින් හැඬූහ.

ඉක්බිති වලට ගිය මද්‍රිදේවි සිතන්නාහු රෑ මම නපුරු සවප්න දිටිමි. මා දරුවෝ වහන්සේ කෙරෙන් පන්සලින් පිටත් වූ දෝ හෝ සි ලය කකියවමින් වනමූල් වනඵල ගෙනා සඳ අත යහුල වැටී යෙසි. පෙව්විය වැටී යෙසි. දෙව්විල්ල වැටී යෙසි. දකුණැස මස් සැලිණ. මා දෙපය වෙවුලයි. හෘදය කකියයි. එතකල හුනු වැළකිය.

මේ පව්තයෙහි දේවතායෙනි! මට කිමෙක්දෝ සි ලය කකිය වමින් පන්සලට එන සඳ ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම දිව්‍යපුත්‍රයන් තුන් දෙනකු කැඳවාලා කියන්නේ බොධිසත්ත්වයෝ දරුවන් දන් දෙමින් සිටියහ. එතනට බිසවු ගියේ නම් නපුර. තොපි ගොස් සිංහ ව්‍යාඝ්‍ර වලස්වෙස් මවාගෙණැ මඟ අවුරා වැදූ හොවයි සම්මතකෙළේ. දෙවියෝ එසේ ම වෙස් මවාගෙණැ මඟ අවුරා ගෙණැ වැදූ හොත්තහ.

බිසව් එන්නාහු මහහොත් භයඞකර රූ දැකැ කියන්නාහු "මම යම් දවසෙක් මේ මහ එතකල මෙසේ වූ සතුන් නුදුටු විරිමි. මා දක්නෝ මුවන් මොණරුන් වළිකුළන් වදුරන් දකුත් මුත් මෙසේ වූ සත් කෙණෙකුන් දුටු විරූ නැත. මේ වෙනෙහි වෘක්ෂ දෙවතාවෙති! පළිත සිඛරයෙහි දෙවියෙනි! යවව. රාමයන්ට සීතාවන් සේ මාගේ සවාමීන්ව පතිව්‍රතා වී නම් කුඛාවරිනි! මහින් ඇලව යව සි මහත් කොටැ හඩා ද නො යන හෙයින් අනික් යන මහක් නැත්තෙන් පෙරමඟට දරුවෝ අවු නම් නපුර. මම මේ මඟ හොත් සතුන් විසින් නොයා හෙමි.

ලය කකියවා තුමූ ම නැඟියෙත් දෝ සි සිතා සිටැ කියන්නාහු දරුවෙනි! තොප මැඬපිය කොටැ වනානතර ආ වෙසසන්තර රජ්ජුරුවන් අඹුයෙමි. තොපගේ මවුමි. තොප මුත් මාගේ කෑයෝ නැත. මා නුදුටු දරුවෝ නො හැම්මෙනි. රූ නො වෙන තුරු මා නැඟී යා දෙව" සි කිහ.

එසේ කිව ද නො යන හෙයින් වැලපැ මහත් කොටැ හඩා අත්පොළසන් දී "තොපට කුමන වරදක් කෙළෙම්ද"සි පතිව්‍රතා වන් එසේ කියත් ම මෘගජාතිහු භය ඇති වැ නිදා පුබුද්දන් සේ පිටට හැඹි හිර බට බව දැනැ නො පෙණී නැඟී ගියහ.

ඉක්බිති මද්‍රිදෙවි වනමුල් වනඵල ගෙණෙමින් මා දරුවන් මඟ මෙතන දකිමි දෝ මෙතන දකිමි දෝ හෝ සි සිතා මඟ නො දැකැ ඔබ්බට ගොස් මා දරුවන්ට කිමෙක් වී දෝ හෝ සි කියමින් මිහිරි බස් මා කණ නො හෙයි. සඳක් වැනි වූ මුහුණු නුදුටු යෙමි. පෙර කෙළනා වූ වෘක්ෂමූල නො දක්මි. ජාලිය කුමාරයෝ පෙරමඟට අවුදු අම්ම! පල කැද්දූ සි බලති. කෘෂ්ණාජිනාවෝ අවුදු තකය ගණිති.

මේ නුගරුක්මූල වැලි කැවි සෙංවැ කෙළනා තැන සි. හඬමින් ගොස් පන්සලට වැදූ තෙතෙහි කිරි ඉස්මින් සියලඟ වෙවුල්වමින් මුවය වියලී ල කකියා වහන්සේ කෙරෙන් නැත්නු සි කොතැනෙක නිදිගැන්වූදූ දෝ යම් රුකක් මූල හෙවැ නිදන් දෝ හෝ ඇත් ගිජුලිහිණියෝ ගෙණැ ගියේ දෝ මුතුන් මිත්තන්ගේ රටින් අවුදු ගෙණ ගියේ දෝ හෝ යක් බූ ප්‍රෙතයෝ ගෙණැ ගියේ දෝ ලද බොලඳ මියුරු බසක් කවර විටෙක අසමි දෝ හෝ ලද බොලඳ සිතාවක් හා ඇසියෙමි දෝ හෝ අම්මඬ! අපපඬැ" සි යන

බසක් හා ඇසිය හෙම් දෝ හෝ ලසඳක් වැනි මුහුණ දැකැ පියහෙම් දෝ හෝ සි කියා හඬම්න් වැලපැ බෝධිසත්ත්වයන් විචාරන්නාහු, සාමිනි! දරුවන් සිහන්තන්ට දන් දුන් දැ දැ සි විමාළහ.

බෝසතාණන් මියෙන් නො බැණැ හිදිනෙන් කියන්නාහු වහන්ස! මා දරුවන් නො දක්නා ශොක තබා නුඹ වහන්සේ නොබණන ශොක මට ඉතා බෙහෙව" සි හැඹුහ. මෙසේ හඬතුදු එක බසකුත් නො කියා වැඩහුන්හ.

ඉක්බිති බිසව් කියන්නාහු "වහන්ස! පෙරැ ගිනි දර පැන් ඇනි කොටැ හිදිනා දැ ය. අද මුයෙන් නො බැණැ ම හුන්දැය. මා එතතුරැ දරුවන් රකිමි සි මට වරදුන්දැ වේ ද? දරුසන්තව මා හඬා විචාරතුදු නො බැණ වැඩහිදිනාදැ ය. නුඹ මා දරුවන් කැඳවා ඵලාඵල වැළදුව මැනව. නුඹ නොබැණන දැ නම් නුඹ කෙරෙන් මාගේ ප්‍රාණය දුරා කෙරෙමි" සි කිහ.

එසඳ බෝධිසත්ත්වයෝ සිතන්නාහු "මොවුන් දරුවන්ට සෙනහ ඉතා බෙහෙව. දැන් ම දරුවන් දුන් බව කියම් නම් ල පැළී මළහොත් නපුරැ"සි සිතා කාලක්ෂෙප කොටැ කියන්නාහු "තෙපි වනමුල් වනඵල පිණිස එ වේලෙහි ගොස් මෙ වේලේ සඳපහන ආවව. අද ම දරුවන්ට සෙනහ බොහෝ වී ද? තෙපි පඤ්චකල්‍යාණයෙන් යුක්ත වූ රූපසම්පන්නයව. මේ වෙතෙහි මලදරුවෝ ද සෘෂිවරයෝ ද තපස්වී ද ඇත. මේ වනයෙහි මා අසැපයෙන් වසන බැව් තෙපි මතු දන්ව" සි වදාළහ.

එබස් අසා මද්‍රිදේවී "මා ලස්වූව සි නොබණන දැ වනැ" සි සිතා කියන්නාහු "සවාමිනි! මම වේලේ ම ආමි. මේ වෙතෙහි සතුන් මහත් කොටැ හැඹූ හඬ අසා මා දරුවන්ට කිමෙක් දෝ හෝ සි සිතා ල කකියවා එමින් සිවිසඳ වග - වලස් - සිංහ යන තුන්දෙනෙක් මා එන නොදී මඟ අවුරුවා හොත්හ. එයින් ලස්වීම්" සි කීහ.

මෙසේ කියතුදු නො බණන විසින් ල කකියවා වෙවුලමින් හඬාගෙණැ පන්සල සිටිපස්සට ගොස් හඬහඬන්නාහු "මාගේ ලඳක් වැනි ජාලිය කුමාරයෙනි! සිවුමැලි වූ කණ්හාජිනාවෙනි'සි මහත් කොටැ හඬහඬා නොප නහවන්නට වලින් කසා ගෙණාම්.

මාගේ කතකමය වැනි වූ කුමාරයෙනි! මා කම්කිළිය කරා නො එවුදැ" යි හඬලා මෙවන් බසක් නො ලදින් මාගේ දරුවන්ට නැස්මෙක් වී වනැ යි නියත කොටැ සිතා රාත්‍රියෙහි මහත් සෝ දුකින් හඬා ඇවිදිනාහු.

මා දරුවන් කෙළනා පොකුණුය යි පොකුණු බලා - මා දරුවන් හා එක්වැ කෙළනා මුවපොල්ලෝ ය යි මුවන් බලා - මා දරුවන් කෙළනා රුක්මුලය යි රුක්මුල් බලා - නො දැකැ මහත් කොටැ හැඬුහ. ඒ හඬ අසා වල පක්ෂීහු මෘගජාතීහු මා හඬින් හඬනැහුහ. ඉන් ඔබට ගොසින් මා දරුවන්ට නටන මොණරු ය යි මොණරුන් බලමින් මා පැවැත්තිය ලද දියණියන් බස් වැනි කුරවි කෙවිල්ලෝ ය යි කුරවි කෙවිල්ලන් බලමින්; මාගේ දියණියන් ඇස් වැනි යහපත් වූ ඇස් ඇති මෘගාඞ්ගනාවෝ ය යි රැළඟි යන මුවන් හා මුවදෙනුන් බලමින් "මා දරුවන් හා එක්වැ ඇවිදිනවුන් දක්මින් මාගේ දරුවන් නො දක්මි" යි බිසවු මහඬින් හඬා ගී සිසන් නැති වැ මදවිගසකින් සිසන් ලදින් —

මා දියනියන් කෙළනා කෙළිවලනැ යි කෙළිවලන් බලමින්, ම පුතනුවන් හා කෙළනා මැවියෙන් හැඹූ රථ අශ්වයෝ ය යි ඇතුන් අසුන් බලමින්, මා දියණියන් කෙළනා මැවියෙන් හැඹූ ගිරවු යයි ගිරවුන් බලමින්, හලාහලව බඹ අත් සපා හඬාගෙණැ බිම හී නොඑක් වාරයෙහි හඬා ගී රාත්‍රියෙහි ගල්කැවපහණ ගැසී හැල් දෙළින් කදුබැවිල් හා හෝ මේ ආදි සථාන බල බලා වංක පථිතයෙහි පසලොස් ගවුවක් මානයෙහි සඳපහණ තුන්විටක් වටකොටැ ඇවිදැ බිසවු දරුවන් සොයා ඇවිදී බෝසතානෝ ඇසිපිය නොබහා නිදි වියෝ වැ හුන්නාහු පහන් ව ගිරු අබස්පාමින් සිටි වේලෙහි බෝසතානන් පාමුල බළලකු හත් කිකිළියක සෙයින් වෙවුලා හඬාපී සිසන් නැති වැ හොත්හ.

බොධිසත්ත්වයෝ මද්‍රී දේවීන් හොත් විලස් දැකැ ල කකියවා මෙවෙනෙහි මා නැකෙණෙක් නැත. තොප නැකෙණෙක් නැත. තෙපි මේ වනාන්තරයෙහි මළාදැ"යි කියා කියා සිත් කැළඹී බෝසතානෝ මහා ශොක පත්වැ නැණ විශෙෂයෙන් ශොක දුරුකොටැ නෙළුම් පොකුණට ගොස් දිය ගෙණැ හැරැ සත්මසක් රැකි බ්‍රහ්මචරියායෙහි ඇලුම් නොකොටැ මද්‍රී දේවීන් උර හොවා ගෙණැ නෙළුම් පියුමක් වැනි අත්ලෙහි අත් තබා මුහුණ දිය ඉසැ අතින් ලෙහි දිය ගහා පිසපියා සිතන්නාහු සිවිරව හෙවැ මළා නම් - වෙකියරට හෙව මළා නම් - ම හාරාජපෙරහරින් දවන්නාහ.

මා හුදකලා වුව මේ වෙනෙහි කුම්කෙරෙම් දෝ හෝ සි මෙසේ මහත් වූ ශොකයෙන් තැවි තැවී හුන්කල බිසවුන් කල්‍යාමෙකින් සිසන්න ලදින් කියන්නාහු වහන්ස! "මා දරුවෝ කොයිදැ"යි කිහ.

එසඳ බෝධිසත්ත්වයෝ කියන්නාහු "දේවීනි! ඉතා වයෝ වෘද්ධ වූ මහළු බමුණෙක් තිස් යොදුනක් තැන් මග ගෙවා දන් පිණිස ආවුව දරුවන් දිනිමි"යි වදාළහ.

ඒ වේලෙහි ම මහපොළොව හඬා ගුගුළේ. සියලු දෙවියෝ සාධුකාර දුන්හ. මහාමේරු පර්වතය ද, සපතකුල පර්වතයෝ ද, රැව් පිළිරැව් දී නවන්නට වන්හ. "දේවීනි! දානපාරමිතාවන්ට යම් සිතක් කොසිතා පින් අනුමොවව"යි කිහ.

බිසවුන් කියන්නාහු "සවාමිනි! මෙසේ නොකියා මා හඬා ඇවිද්දදී නොබිහුණුදැනු"යි කියමින් දෙහොත් මුදුනෙහි තබාගෙණැ "සාධු සාධු පින් අනුමෝවිමි" සි කියා අනුමෝවැ ගෙණැ කියන්නාහු "සවාමිනි! දරුවන්ට වැනි දසයෙන් සියෙන් දහසින් ලක්ෂයෙන් බුදු බව වේ ද! උත්තම ය සි කියා සතුටු වැ බිසවුන් සිත් සංසිදුවා ගෙණැ කියන්නාහු "සවාමිනි! මට පින්කම් දෙනදැද? මුළු තුන්ලොව සියලු සතුන්ට ද පින් දුනමැනවැයි පින් දෙව"යි සිත් ප්‍රසන්නාකොටැ දානපාරමිතා මුදුන්පත් කළහ. සියලු දෙවියෝ සතුටු වැ සාධුකාර දී පින් ගෙණැ ඉල්වැසි වැස්වූහ.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රයා සිතන්නේ "බොධිසත්ත්වයෝ තමන් ගේ දරුවන් දෙදෙනා බමුණාට දන් දුන්හ. බිසවුනුදු යමකුට දුනහොත් නපුරැ"යි සිතා දිව්‍ය ශරීරය හැරැ මහළු බ්‍රාහ්මණ වෙශයක් මවාගෙණැ සැරයටියෙක් එල්බගෙණැ අවුදු ගමන මිරිකිනිමි. රජ්ජුරුවෙනි! කොයි! හුන්නාහුදැ" සි කිය කියා ලඟට ගොස් බෝසතාණන් දැකැ කියන්නේ කරුණු මදද? වනමුල් වනඵලාඵල ලැබේද් ද? වෙනෙහි සතුන් විසින් උපද්‍රව නැද්දැ" සි කියා පුළුවුත.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "තා කී හැම දෙයෙන් ම ගහට නැත. තොප අා කාර්‍යය කිමෙක් දැ"යි වදාළහ. බමුණු කියන්නේ "රජ්ජුරුවෙනි! ඉතා වෘද්ධයෙමි. ගමන මිරිකිනිමි. තොප අතින් රන් රිදී මුතු මැණික් ඉල්වා නොආයෙමි. මාගේ ගෙයි මෙහෙකරණ වහලක් නැත්තේල. බිසවුන් මට මෙහෙ කරන්නට පාවා දෙව"යි කීහ.

බෝසතාණෝ "කළමනා කිම් දෝ හෝ"යි සිතා බිසවුන් මුහුණ බැලූහ. බිසවුන් බෝධිසත්ත්වයන් සිත අභිප්‍රාය දැන කියන්නාහු "සවාමීනි! මවුපියෝ සත්‍රින්ට දෙස් වැස්සහ. නැයෝ තම් තමාගේ සවාමිහු ම ය. පින් සඳහා දන් දෙන් ම මනා ම ය. වසතු සඳහා විකුණන් මනා ම ය. සැමියන්ට ඉන් වන දෙෂයක් නැත. නුඹවහන්සේට අභිමතයක් කළ මැන වැ" යි කිහ. එසේ කියත් ම බෝසතාණෝ සතුටු වැ අත පැන් එවැ පියුමක් වැනි වූ බිසවුන් අත ගෙණැ "එකාන්තයෙන් සම්‍යක් සම්බොධියට පැමිණැ සියලු ලෝවැස්සන් නිවන් පුරෙහි පිහිටුවාලිය හෙම්ව" යි පතාගෙණැ බමුණාට දන් දුන්හ.

මෙසේ බිසවුන් දන් දෙන් ම මහපොළොව සතුටු වැ ගුගුළේ. මේරු මන්දරාදි සප්තකුල පර්වතයෝ සතුටු වැ නටන්නට වන්හ. දෙව්ලොව දෙවියෝ සාධුකාර දුන්හ.

බමුණු කියන්නේ "රජ්ජුරුවෙනි! තොප දන් දුන් බිසවුන් මා සන්තකයෝ ය. තොප සන්තක දෙයක්මුත් අනුන් සන්තක දෙයක් නො දිය හැක්කේ වේ ද? මා එතතුරු බිසවුන් තොපට ම පාවාදින්මි. තොපි මුන්ට සුදුස්සව. මූ තොපට සුදුස්සහ" යි කියා බිසවුන් බෝසතාණන්ට පාවා දී තමා **ශක්‍රදෙවෙඳු** බව හඟවා ශක්‍රවිලාසයෙන් සිටැ කියන්නේ "රජ්ජුරුවෙනි! තොප දරුවන් දන් දුන්විට දෙලක්ෂ හතළිස්දහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළොව මා හඬින් හඬා ගුගුළේ. එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහාමේරු පර්වතය ද සප්තකුලපර්වතයෝ ද සතුටු වැ නැටූහ. තලාටු බූමාටු දෙවතාවෝ ද සදෙව් ලොව දෙවියෝ ද සොළොස් බඹතෙලෙහි දෙවියෝ ද සාධුකාර දුන්හ.

තොපට ඒකාන්තයෙන් බුද්ධත්වය සිද්ධවෙයි. තොපගේ දරුවන් දෙදෙනා මුතුන් මිත්තන් කරා බමුණු ගෙණැ ගියේ ය. අනික් සත් දවසකින් තොප කරා එති. මාගෙන් ද අවවරයක් ගණුව" යි කිය.

බෝධිසත්ත්වයෝ ද අවවරයක්[1] ගන්නාහු "දෙවෙන්ද්‍රය! එසේ වී නම් මම රාජ්‍යයෙහි ප්‍රතිෂ්ඨිත වෙම්ව සි. දසරාජධර්මයින් වියෝ නොවෙම්ව සි. පුතුන් ලබම්ව සි සියලු සත්ත්වයන්ට උතුම් වූ කරුණා ඇති වෙම්ව සි. සියලු දෙන ම මගෙන් ජීවත් වනු ලබාවා සත්‍රිත්ගේ වසඟයට නොපැමිණෙම්වසි. මිථ්‍යාදෘෂ්ටි ගත්තවුන් සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටුවම්ව සි. කෙළවර නිවත් දකිම්ව" යි කියා වර ගත්හ.

---

[1]ජාතකට්ඨකථාවෙහි වර අට මෙසේ දක්වේ.

වරඤ්චේව මෙ දදෙ සක්‍ක – සබ්බභූතාන'මිස්සර
පිතා මං අනුමොදෙය්‍ය – ඉතෝ පත්තං සකං ඝරං
ආසඤ්ච නිමන්තෙය්‍ය – පඨමෝ'තං[1] වරං වරෙ.

පුරිසවසං[2] න රොවෙය්‍යං – අපි කිබ්බිසකාරකං[3]
වජ්ඣං වධමහා මොවෙය්‍යං – දුතියෙ තං වරං වරෙ.

යෙ වුඩ්ඪා[4] යෙ ච දහරා – යෙ ච මජ්ඣිමපොරිසා,
මමේ'ව උපජීවෙය්‍යුං – තතියෙ තං වරං වරෙ.

පරදාරං න ගච්ඡෙය්‍යං – සදාරපසුතෝ සියා,[5]
පිතං වසං[6] න ගච්ඡෙය්‍යං - චතුත්ථෙ තං වරං වරෙ.

පුත්තෝ මෙ සක්‍ක ජායෙථ – සෝ ච[7] දීඝායුකෝ සියා[8]
ඛමෙමත ජිනෙ පඨවිං – පඤ්චමෙ තං වරං වරෙ.

තතෝ රත්‍යා විවසනෙ – සුරියස්සුග්ගමනං පති,
දිබ්බා භක්ඛා පාතුභවෙය්‍යුං – ඡට්ඨමෙතං වරං වරෙ.

දදතෝ මෙ න ඛීයෙථ – දත්වා නානුතපෙය්‍ය'හං,[9]
දදං චිත්තං පසාදෙය්‍යං – සත්තමේ තං වරං වරෙ.

ඉතෝ චිමුච්චමානා'හං – සගගගාමේ[10] විසෙසගූ,
අනිබ්බත්තිං තතෝ අස්සං – අට්ඨමේ තං වරං වරෙ'ති.

JATAKATTAHAKATHA. Vol. VI. KATHA 547. GATHA. 640 - 647
V. FAUSBOLL - LONDON, 1896

1 පඨමං තං - ඉ. 2 පුරිසස්ස වධං - ඉ. 3 කිබ්බිසකාරිකං - ඉ. 4 යෙ ච වුඩ්ඪා - 5 සියං - සි - දහම් සරණ - මුද්‍රිත - 6. පිතා වරං - සි: මු: දහම් සරණ. 7. සෝ ච දීඝායුකෝ සියා - ඉ. 8 සියං - සි: මු: දහම් සරණ. 9. නානුතපෙය්‍ය'හං - ඉ. 10. සගගනාමී - ඉ.

මේ අවවරය දී ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම දෙව්ලොවට ගියේ. **ජූජක** නම් බමුණු දරුවන් දෙබිඹින්නන් ගෙණ යන්නේ භිරුහසායට යන වේලෙහි දෙවියන්ගේ ආනුභාවයෙන් එම දවස් සැවයොදුනක් තැන් ගොස් අදුරු වූ කල දරුවන් ගෙණ රුක්මුලකට වැද දරුවන් දෙදෙනා බැඳ වනමග ගසමුලා හොවා වගුන් වලසුන්ගේ භයින් තෙමේ ගසට නැඟී ගස්පිටැ හෙවැ නිදීය.

දෙවතාවෝ දෙදෙනෙක් අවුදින් මවුපියන් දෙදෙනා සෙයින් දරුවන් බැදුමෙන් උනා සුවඳ දියෙන් නහවා මල් පලඳවා බත් කවා මල් යහනේ හොවා බබදී හෙවැ නිදිගන්වා පහන් වූ කල පළමු බැඳි වන ම හොවා නොපැණි නැඟි ගියහ.

ඉක්බිති බමුණා පිබිදී පැන් වූ බව දැනැ ගසින් බැසැ පියා දරුවන් ගෙණ තමන්ගේ රටට යෙමි සිතා යන්නාහු **දෙවියෝ** තමන්ගේ ආනුභාවයෙන් සිවිරට ම ගෙණ ගියහ.

එදවස් ම **සඳමහරජානෝ** සවප්තයක් දක්නාහු "කලු මිනිසකු අවුත් පියුම් දෙකක් තමන් අතට දුන්නා දැක ඒ **කන්හි** පැලැන්දැ ද එහි රොන් ගිලිහී උරෙහි වැටෙයි" දැකැ පිබිදී පියා චතුවේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා ගෙණ තමන් දුටු සවපනය විවාළහ.

බමුණෝ කියන්නාහු "සවාමිනි! තොප සින් ප්‍රිතිවන දරුවෝ දෙදෙනෙක් එනවන්හ" යි කිය කියා බැණැ හුන් තැනට **"ජාලිය** කුමාරයන් හා **කෘෂ්ණාජිනාවන්** ගෙණ බමුණෙක් ආය" යි යනු අසා බමුණා ගෙන්වා ගෙණ දරුවන් දෙන්නා දැකැ සතුටු වැ "බමුණ! මේ දරුවන් දෙදෙනා කොයි සිටැ ගෙණෙයි දැ" යි විවාළහ. බමුණු "බොරුවක් කියා ගැළවුනු මැන වැ" යි සිතා **අනික් රජකු** නම් කියම් යි සිතූ සඳ දෙවතාවෝ නො කියාදී **"විශ්වන්තර** රජ්ජුරුවෝ මට දන් දුන්නෝය යි කිය වූහ.

ඉක්බිති බමුණු මේ කවර රටක් දෝ හෝ යි සිතා **සඳමහා රජානන්** ගේ රට බව දැනැ "එ තෙකින් මා දිවි තැත. **කුමී** කෙරෙම් දෝහෝ"යි සිතා වෙවුලන්නට වත. **සඳමහා රජ්ජුරුවෝ** පුතනුවන් වෙනෙහි හිඳ දන් දුන් බව සිතා මහත් කොටැ හඬා කඳුළු පිසැ දරුවන් දන් දුන් බව නගරවාසින්ට කිහ. නගරවාසිහු

අසෘ කියන්නාහු "සවාමීනි! ඒ උත්තමයා ලය ගල්තෙලේ දෝහෝ සි සපතකින් වැසූ දෝහෝ සි බමුණු මහල්ලකුට මෙවැනි දරුවන් දී පියා ඒ ලය කෙසේ වැහ වී නිවී දෝහෝ ඇපි ඔවුන් හැළි ඇතුදුන් සේ නපුරු සි රැහැණි වැ වංකගිරි පවීතයට යැවුම්හ.

දැන් මෙවැනි මනහර වූ ලඳ බොලඳ සියුමැලි දරුවනුදු දන් දුන්හ. මෙවැනි සිතක් ඇති උත්තමයාගේ ගුණ නො දැනූ නුගුණ කළම්හ. පෙර අප කළ නුගුණ පහ කොටැ ගොස් ගෙණෙම්හ" සි කිහ නුවරවාසින් බස් අසා **ජාලිය** කුමාරයෝ කියන්නාහු "අප දන් දෙන සවාමීහු බමුණා කෙරෙහි කරුණාගෙන් දුන් දැ"ය. මපියා නන් වහන්සේ දැනි යසි කුමට කියාදැ' සි කිහ.

එබස් අසා නුවර වාසිහු සතුටු සොම්නස් වැ "සවාම්දරුවෙනි! සියුමැලි කුමාරයන් වහන්ස! තොප පියානන් වහන්සේගේ නුගුණ නො කියම්හ. ඒ උත්තමයා යමකු විසින් නො කොටැ ගත හැකි තොප නියා දරුවන් දන් දුන් සේ ඉතා බැරිය" සි ඔවුන්ට සතුතිකළ බව මුත් නුගුණයක් නො කිවම්හ. "සවාමීනි! ඒට **ක්ෂමා** කරව" සි කියා සිටි සඳ **සඳමහ රාජානෝ** ඇසින් කඳුළු ගෙණැ කියන්නාහු "මපුතුන්ගේ මනහර දරුයෙනි! සියුමැලි මාගේ මුනු බුරෙනි! මෙසේ අවුත් මා කලවයෙහි හිඳුව" කිහ.

ජාලිය කුමාරයෝ මුත්තනුවන්ගේ බස් අසා කියන්නාහු "බමුණන්ගේ ගැත්තොත් රජ්ජුරුවන්ගේ ත් ඔර හිඳිද් ද? මෙසේ සිටුම්හ" සි කී සඳ නගරවාසිහු මහාශොක පත්වූහ. රජ්ජුරුවෝ ද වැලපැ වැලපැ හිඳා කියන්නාහු "**ජාලිය කුමාරයෙනි!** තොප දෙන කල තොපගේ පියානෝ කෙතෙක් මිළ කොටැ දුන්නුදැ" සි කිහ. **ජාලිය කුමාරයෝ** කියන්නාහු "මට දැසක් දෙන්නට කීදැ ය. මා නැගණියන්ට මිළ උන් භාරයේ වස්තු දෙන්නට කීදැය" සි කිහ.

සඳමහරජානෝ කුමාරයන්ගේ මිහිරි තෙපුල් අසා සතුටු වැ **ජාලිය** කුමාරයන්ට දැසක් දී **කණ්හාජිනාවන්ට** උන් භාරයේ රන් හා දැසි දැසාදීන් හා බොහෝ වසතු බමුණාට දී දෙබිහින්නන් ගලවා ගෙණැ ඉස් සොධා නහවා බත් කවා **ජාලිය** කුමාරයන් දකුණු කලවයෙහි හිඳුවා "**කණ්හාජිනාවන්** වම් කලවයෙහි හිඳුවා සතුටු වැ සිඹැ සනහා **සඳමහා රජ්ජුරුවන්** කියන්නාහු "ඒ උත්තමයා දන් දුන් ශ්‍රීවන්ත කුමාරයන් හා ශ්‍රීවන්ත නැගණියන්

හා මා කරා ම නැඟී ආ බව සිවිරට වාසින්ගේ හා මාගේ දෙව ය" යි කියා සතුටු වැ හිඳ බමුණා ඉස් සොධා තහවා තමන් කත පරිද්දෙන් රස බෝජනයෙන් බත් කැවූහ.

බමුණු තමා නො කෑ විරූ ආහාර බොහෝ කොටැ කා දිරවා ගත නොහී රෑ මිය ගියේ, මළකල නොයෙක් පෙරහරින් දවා "බමුණාගේ නැකෙණෙක් ඇත් නම් මේ වසතු ගන්ව" යි නුවර බෙර පියෝ කරවා තැ කෙනෙකුත් නො දූකැ ඒ වස්තු භාණ්ඩාරයට ම ගෙණ ගියේ. එසඳ **සඳමහරජානෝ** කියන්නාහු **"ජාලියකුමාර යෙනි!** තොපගේ මැණියත් හා පියානත් හා සුවයෙන් වෙසෙද් ද? ලෙඩදුක් නැද්ද" යි පුළුවුත්හ.

කුමාරයෝ කියන්නාහු "මුත්තනුවන් වහන්ස! අප ආ මෙදතු රෙහි අම්මඬින් යමක්හට දන් නුදුන්හ" යි නො සිතම්. මපියානන් වහන්සේ නුඹ කෙරෙන් වියෝ වූ දුක් හා තපස් කිරීමෙන් වහළ දූ ය. අම්මඬින් අවු පැහැර මලාගියේ නෙළුම් මලක් සේ මලානික ව ගියදූය" යි කිහ. ඒ ලද බොලඳ බස් අසමින් රජ්ජුරුවන් හා නුවර වැස්සන් හා මහත් වූ ශොකයට පැමිණියහ.

ඉක්බිති **ජාලිය කුමාරයෝ** කියන්නාහු "සියලු සත්ත්වයන් තමන් තමන්ගේ දරුවන්ට ප්‍රෙම ඇතැ"යි යෙති. "නුඹ වහන්සේ දරුවන්ට ප්‍රෙම මදවතැ"යි කිහ. "සැබව කුඩැනිවරුනි! කිසි මඳ වරදක් කැති මපුතනුවන් නුවරවාසින් ඔසින් තෙරපිම්"යි හඬා වැලපැ අමාත්‍යයන් කැඳවා කියන්නාහු **"වංකගිරි** පවිතයට ගන්නට සැරහෙව.

සද්දවසකින් ගමන"යි කියා නුවර බෙරලවා යොධයන් පන්දහසක් දෙනා රත් පිළී සුදු පිළී ආදී වූ නොයෙක් පිළී හැඳැ පලඳනායෙන් සැරහී පඤ්චායුධ ගෙණැ සැදී නොයෙක් ඇතුන් අසුන්පිට හිඳුවා සිවුරඟ සෙනඟ පිරිවරා මහත් වූ යසසින් දිලි යෙමින් නික්මුණාහ.

අමාත්‍යයෝ මඟ සදන්නා වූ කළුවැලි පියා සුදුවැල්ලෙන් තවරා කෙහෙල් තැඹිලි පුන් කලස් ධජ පතාකයෙන් මඟ සදා ක්‍රමයෙන් **වෙතියරට** ගෙණැ ගොස් වන්හ. **වෙතියරජ්ජුරුවෝ** ද දූකැ සතුටු වැ උපසථාන කොටැ සැවදහසක් රජදරුවන් ගෙණැ **සඳමහ රජානන්** හා එක්ව ම නික්මුනාහ.

ජාලියකුමාරයන් හා කණ්හාජිනාවන් හා දෙන්නා ඇත් පිටට නගාගෙණ මහත් වූ රාජ්‍යශ්‍රියෙන් දිලියෙමින් දරුවන් පළමුකොටැ තුමූ පසු වැ ගෙණැ ගොස් වංකගිරිපබ්භාරයට ආසන්නවූහ.

ඉක්බිති බෝධිසත්ත්වයෝ හෙරිසංඛනාද තුරඹී සෝණා හා ඇතුන්ගේ කුණ්ඩකාද හා අසුන්ගේ හෙණාරව හා රථචක්‍ර නාද හා මෙසේ මහත් සෝණා අසමින් කියන්නාහු "දේවිනි! මපියාණන් වහන්සේ මාළු විසින් අප මී වසන බව දැනැ අප කරා එන සතුරු කෙණෙක්දෝ හෝ වංකගිරිපබ්භාරයට නැඟී පරීක්ෂාකරව"යි කිහ.

දේවී පබ්භාරයට නැඟී මහාසෝණා අසා "ස්වාමිනි! නුඹට කවුරු සතුරු කෙණෙක් ඇද්ද? නුඹගේ පියවර මැඩැපියන සතුරු කෙණෙක් ඇද්ද? ස්වාමිනි! එදවස් ශක්‍රදෙවෙන්ද්‍රයා කියන්නේ අපගේ දරුවන් දෙදෙනා මුතුන්මිත්තන් කරා ගොස් වන්නැ"යි කිය. අදින් සත්දවසකින් නුඹවහන්සේ කරා එනී කියේ වේද? නුඹ පියාණන් වහන්සේ එන, ගමන් වන්නැ"යි කියා දෙදෙනා ඇවිත් පන්සල හුන්නාහ.

සදමහා රජ්ජුරුවෝ තැන්හි තැන්හි ඇතුන් අසුන් විහිදුවා වංකපබ්භාරයට ගොස් ඇඹෙනියන් වූ සත්‍යදේවීන්ට කියන්නාහු "දේවිනි! දරුවන් හා අප හා එකවිට දක්නා ශෝක බොහෝ වෙති. මා ගොස් පළමු වැ උන් දැකැ ශෝක සංහිදු වූ කල තෙපි එව"යි කියා දහසක් රථපොළොව රඳවා තුමූ ගොස් බෝසතාණන් පන්සල් කෙසරසිංහයකු සේ වැඩහුන්නන් දුටහ.

බෝසතාණෝ පියාණන් දැකැ හුනස්නෙන් නැඟී පෙර ගමන් කොටැ බැසැ හෙව වැඳැ හිඳිනා ආසන පනවා වඩා හිඳුවූහ. මද්‍රිදේවී ද මසිලනුවන් දැකැ බැස හෙ වැ වැඳැ සිට "ස්වාමිනි! මා දරුවන් ගෙණගිය බමුණා කොයිදී දුටු දැ දැ"යි කීහ. සදමහා රජාණෝ "ඇහෙලනියෙනි! මාගේ රටදී දැකැ බමුණාට රන්දී ගලවා ගනිමි"යි කියත් ම බිසවුන්ට මහම් සොම්නස් උපන.

ඉක්බිති බෝධිසත්ත්වයන්ගේ මැණියෝ මහත් පෙර හරින් පන්සල් වන්හ. බොධිසත්ත්වයෝ ද මද්‍රිදේවී ද වැඳැ ආසන පනවා හුන්කල ජාලියකුමාරයන් හා කණ්හාජිනාවන් හා ඇතුන් පිටට නගා ගෙණැ දෙදෙනා පෙරට කොටැ ලා වෙනිය රජ්ජු

රුවන් ඇතුළු වූ සැටදහසක් රජදරුවන් හා පන්දහසක් මහ යොධයන් හා හෙරි සංඛනාදයෙන් හා මහසෙනඟ පිරිවරා ගෙණ එන කුමාරවරුන් දෙදෙනා දැකැ මළුදේවි හඬා පෙරමහට ගිය-

මැණියන් දැකැ දෙබිහින්න ඇත් පිටින් බැසැ මැණියන් දෙපත්ලෙහි හිස් තබාගෙණැ හඬන්නට වන්හ. බිසවුන් තෙනෙන් කිරිධාරා දෙබිහින්නන් හිස් තෙමී ගියේ ය. දෙබිහින්නන් තඟා සිටුවා සිපැගෙණැ මඟත් වූ ශොකයෙන් හඬා හුන්හ. ඒ අසා සඳමහා රජ්ජුරුවෝ ද ඇඹෙනියෝ ද මහ හඬින් හඬා හුන්හ. චෙතිය රජ්ජුරුවන් ඇතුළු සැටදහසක් රජදරුවෝ ද මහහඬින් හඬා හුන්හ.

එදුක පන්දහසක් යෝධයන් හා මහසෙනඟ එකහෙළා මහ පවනින් වැගිරගිය සල්වනයක් සේ මහහඬින් හඬා හුන්හ. ඒ වෙසතුරු මහරජානන්ගේ අඹුවන්ගේ දුක්පත්කම් සිතා හඬන ජනයා සිසන්න නැති වැ හොත් සඳ ශක්‍රදෙවෙන්ද්‍රයා අවුත් මුන්හැම සිසන්න නැති වැ හොත් සේ බලා පොකුරු වැසි වැස්වී ය. ඒ වැස්සෙහි තෙමනු කැමැත්තෝ තෙමෙති. නො තෙමෙනු කැමැත්තෝ නො තෙමෙති.

මෙසේ පොකුරු වැස්සෙහි තෙමී සියලු ජනයා සිසන්න ලදින් විසමයට පැමිණැ කියන්නාහු "සවාමිනි! නුඹ ගුණ නො දනැ නුවරින් නඟා පියම්හ. එව ක්ෂමාකර අපගේ නුවරට අවුත් වොටුනු පැළඳැ අප රක්ෂාකළ මැනවැ සි කීහ. ඒ අසා බෝධි සත්ත්වයෝ "රටවැස්සෙනි! තව ද මා වොටුනු පළඳවාදූ සි කියා නො ගිවිසෙන් නගරවාසිහු සඳමහා රජ්ජුරුවන්ට කියන්නාහු සවාමිනි! අප කිව ද නො ගිවිස්නාදූ ය. නුඹවහන්සේ වදාළ මැනවැ" සි ආරාධනා කළහ.

ඉක්බිති සඳමහා රජානෝ බොධිසත්ත්වයන්ට කියන්නාහු "පෙර ද මා කියමන් ගෙණැ මෙවලට අවවද? දැනුත් මා කිය මන් ගෙණැ වොටුනු පැළඳැ රාජ්‍යය කරව, ගුරුන් කිවක් කරණ බව සත්පුරුෂ පුතුන්ට සුදුසු වේ දූ සි කීහ.

බොධිසත්ත්වයෝ "දෙමව්පියන්ගේ බස් මැඩැපීම මට සුදුසු නොවන්නේ වේදූ" සි සිතා වල්කල [1] හැර සුවඳ පැනින් ඉස් සොධා නඟා සළු හැඳැ සුසැට ආභරණයෙන් සැදී වොටුනු පැළඳැ දෙවෙන්ද්‍ර විලාසයෙන් සිටියහ. සියලු ජනයා මහත් වූ සනෙනාෂ

1. චිල්නලා.

යෙන් මද්දෙවින් ද ඉස් සොඬා තහවා දිව්‍යාඞ්ගනාවක මෙන් සරහා වොටුනු පැළඳවූහ. එසඳ වෙතෙහි වල් හා පබ්බත නැටූහ. ජය තෙපුල් හා මහත් ඝොෂා කොටැ හෙරි සඬ්ඛ තූර්‍යීනාදයෙන් හා එක කොලාහල කෙරෙමින් පිඬා නම් හැලිඇතු සදු ගෙණාහ.

බෝසතාණෝ ඇතු දූකැ රැහැණි වැ සිතන්නාහු "මපියා තන් වහන්සේ ද මා දන් දුන් ඇතු ගෙන්වා ගත්වනැ" සි සිතා ලජ්ජා ඇතිවූහ. ඒ බව දත් නගර වාසිහු "සවාමිනි! කාලිඞ්ගයේ රජ්ජුරුවෝ තමන් රට වැසි වැසැ බත් බුලත් සුලභ වූයෙන් තුමූ ම ඇතු එවාපූහ. ඇතු පිටට නැඟී වදුල මැනවැ" සි කීහ.

බොධිසත්ත්වයෝ ඇතු පිටට නැඟී වංකගිරි පර්‍වතයෙහි තපස් කළ සත්මසින් නුවරට නික් මැ කිප දවසක් මහ ලැගැ දෙව් නුවරක් මෙන් සැදූ නුවරට වන්හ. සියලු නුවරවාසී සතුටු වැ කෙළිමින් නටමින් පිළි ඝිසැ සිසාරමින් තොයෙක් කුහුලින් රජගෙට වඩාගෙණැ ගියහ. බොධිසත්ත්වයෝ ශ්‍රී සම්පත් අනුභව කරන්නාහු සදන්හල් කරවා දන් දෙමින් සියලු ජනයා කුසල්හි පිහිටුවා දසරාජ ධර්‍මයෙන් රාජ්‍යය කෙරෙමින් සහපිරිවරින් දෙව්ලෝ ගියේ.

මෙසේ ඒ මහතානන් අනෙක ජාතියෙහි රැකැ මුදුන් පත් කළ **සඳ්ධර්‍මය සරණ** යෙමි සි **දහම් සරණ** යා යුතු.

26. වෙස්සන්තර ජාතක කථා.

දහම් සරණ නිමි.